මහජන බැංකුව | மக்கள் வங்கி

PEOPLE'S BANK

# ...පුරෝගාමීව

වාර්ෂික වාර්තාව 2019

වර්තමානයේදී මහජන බැංකුව, ශ්‍රී ලංකාවේ බැංකුකරණ කර්මාන්තයේ සිය නිම්වළලු පුළුල් කර ගනිමින් පුරෝගාමීව කටයුතු කරයි. සිය ඉසුරුමත් උරුමයේ උපරිම පළ නෙලා ගනිමින්, මහජන බැංකුව තාක්ෂණික පරිණාමයන් හා නව නිපැයුම් සැපයුම්කරුවකු වශයෙන් කටයුතු කිරීම හේතුවෙන් දේශීය හා විදේශීය සම්මානයට හා සම්භාවනාවන්ට පාත්‍ර වීමට සමත් වී ඇත.

අන් කිසිදු ඒකකයකට සම කළ නොහැකි ශාඛා ජාලයකින් හා ගනුදෙනුකාර කළඹක් සමගින් මහජන බැංකුව, වෙනස් වෙමින් පවතින කාලය ඉදිරියේදී තිරසාර සංවර්ධනය පෙරදැරි කර ගනිමින්, තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ගනුදෙනුකරුවන් ප්‍රමුඛ කොට සලකමින් කටයුතු කරයි. සිය සාර්ථකත්වය තවදුරටත් වර්ධනය කර ගනිමින් කටයුතු කරන මහජන බැංකුව, ශ්‍රී ලංකාව තුළ පුරෝගාමීව කටයුතු කරන බැංකුවක් ලෙස හැඳින්විය හැක.

මහජන බැංකුව | மக்கள் வங்கி

PEOPLE'S BANK

## වාර්තාව කියවන ආකාරය




මෙය අපගේ පස්වන ඒකාබද්ධ වාර්ෂික වාර්තාවයි. එය අප ක්‍රියා කරන, ආර්ථික,පාරිසරික හා සමාජ සන්දර්භය තුළ බැංකුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සවිස්තරාත්මක සාකච්ඡාවකි. එය 2018 දී අප විසින් ප්‍රකාශයට පත් කරන ලද අපගේ ඒකාබද්ධ වාර්ෂික වාර්තාව මත පදනම් වේ.

මෙම වාර්තාව හරහා මූල්‍ය වාර්තාකරණය සඳහා මහජන බැංකුවට අදාළ වන අනිවාර්ය ප්‍රමිති අන්තර්ජාතික ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලය (IIRC) සහ ගෝලීය වාර්තාකරණ මූල පිරීම (GRI) වැනි සාමාන්‍යයෙන් පිළිගත් රාමු සහ ප්‍රමිති සමඟ සම්බන්ධ කිරීම අපගේ ඉලක්කයයි .

වාර්තාව කොටස් දෙකකින් ඉදිරිපත් කෙරේ.

### 1 වන පොත

ඒකාබද්ධ වාර්ෂික වාර්තාව ආරම්භ වන්නේ සභාපතිවරයාගේ ලිපියෙන් සහ පසුව ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනයෙනි. "ව්‍යාපාර ආකෘතිය" යන කොටසේ අපගේ ප්‍රාග්ධන හය ව්‍යාපාරයට ඒකාබද්ධ කිරීම, අපගේ ප්‍රධාන පාර්ශ්වකාර කණ්ඩායම් සමඟ අපගේ අන්තර්ක්‍රියා, අප ක්‍රියා කරන සන්දර්භය සහ බැංකුවට ප්‍රමාණාත්මක වන කරුණු දක්වා ඇත. මෙයින් පසුව අපගේ උපායමාර්ගය, එය ක්‍රියාත්මක කිරීම සහ ජයග්‍රහණ පිළිබඳ පුළුල් සාකච්ඡාවක් දැක්වේ.

මෙය කෙටිකාලීන, මධ්‍යම හා දිගුකාලීනව බැංකුවේ වටිනාකම් නිර්මාණ කිරීමේ කථාන්දරයට, එනම් වාර්තාවේ හදවතට තානය සපයයි. "කාර්ය සාධන වාර්තා" මගින් බැංකුවේ උපාය මාර්ගික දිශාවට ව්‍යාපාරික ඒකකවල දායකත්වය ඉස්මතු කර පෙන්වන අතර ඉන් අනතුරුව බැංකුවෙ ආයතනික පාලනය සහ අවදානම් කළමනාකරණ භාවිතයන් පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනයක් සිදු කරයි. එය අපගේ පාලන ව්‍යුහය, ආචාර ධර්ම හා අඛණ්ඩතාව පිළිබඳ අපගේ ප්‍රතිපත්ති කාවැද්දූ ආකාරය සහ අපගේ අවදානම් කළමනාකරණය කරන ආකාරය පිළිබඳ දළ විශ්ලේෂණයකි.

### 2 වන පොත

මූල්‍ය වාර්තා සහ පරිපූරක වාර්තා අංශ අතරට මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ සහ සමූහයේ විස්තරාත්මක මූල්‍ය කාර්යසාධනය සහ 2019 දෙසැම්බර් 31 වන දින වන විට මූල්‍ය තත්ත්වය පිළිබඳ කෙටි විස්තරයක් සහ අනෙකුත් අතිරේක තොරතුරු ඇතුළත් වේ.

GRI 102-51

අපගේ වඩාත්ම මෑත ඒකාබද්ධ වාර්තාව වන 2018 දෙසැම්බර් 31 දිනට වන වාර්තාවද, පසුගිය වසර හතර සඳහා වාර්තා ද අපගේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය : https://www.peoplesbank.lk

## ප්‍රාග්ධන හය

ජාත්‍යන්තර <IR> රාමුවට අනුව, අපගේ ප්‍රාග්ධන මූල්‍ය, නිෂ්පාදිත, බුද්ධිමය, මානව, සමාජ හා සම්බන්ධතා සහ ස්වාභාවික ප්‍රාග්ධනය ලෙස අර්ථ දක්වා ඇත. පහත දැක්වෙන අයිකන මෙම වාර්තාව තුළ මෙම ප්‍රාග්ධන හය හඳුනා ගත හැකි දෘශ්‍ය යොමුවක් ලෙස කටයුතු කරයි.

මූල්‍ය ප්‍රාග්ධනය

මානව ප්‍රාග්ධනය

නිෂ්පාදිත
ප්‍රාග්ධනය

සමාජ හා
සම්බන්ධතා ප්‍රාග්ධනය

බුද්ධිමය ප්‍රාග්ධනය

ස්වාභාවික ප්‍රාග්ධනය

## උපාය මාර්ගය

අපගේ උපායමාර්ගික තේමා පාර්ශ්වකරුවන්ගේ මැදිහත්වීමට ප්‍රතිචාර වශයෙන් සංවර්ධනය කර ඇති අතර අපගේ ව්‍යාපාරයට සහ පාර්ශ්වකරුවන්ට සැලකිය යුතු ලෙස බලපාන ප්‍රමාණාත්මක මාතෘකා සමඟ සම්බන්ධ වේ. අපගේ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) සම්බන්ධයෙන් අප ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳ සමාලෝචනයක් 55 වන පිටුවේ "උපාය මාර්ගික දිශානතිය" කොටස යටතේ ලබා දී ඇත.

අපගේ ප්‍රධාන උපායමාර්ගික අරමුණු වන්නේ :

- නව්‍ය වෙළඳපල ප්‍රමුඛ සේවාලාභී අත්දැකීම් ලබා දීම
- ස්ථාවර වර්ධන වේගයක් පවත්වා ගැනීම සහ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම
- අප කරන සෑම කටයුත්තකදීම ක්‍රියාකාරීව විශිෂ්ට වීම
- සෑම විටම නිවැරදි ආකාරයට ව්‍යාපාර සිදු කිරීම

GRI 102-45, 102-46, 102-48,102-49, 102-50, 102-52

## විෂය පථය සහ සීමාව

මෙම වාර්තාව අපගේ මූල්‍ය වාර්තාකරන චක්‍රයට සමගාමීව 2019 ජනවාරි 1 සිට 2019 දෙසැම්බර් 31 දක්වා කාලය ආවරණය කරයි. මෙම වාර්තාව මහජන බැංකුවේ සහ එහි පරිපාලිතයන් 2 වන පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සහ පීපල්ස් ට්‍රැවල්ස් (පුද්) සමාගමේ සමස්ත මෙහෙයුම් පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයයි. මෙම වාර්ෂික වාර්තාවේ මේවා සාමූහිකව "සමූහය" ලෙස හඳුන්වනු ලබන අතර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වේ. මානව ප්‍රාග්ධනය, පාරිසරික අංශ, පාරිභෝගික හා යටිතල පහසුකම් ආශ්‍රිත කරුණු බැංකුවේ සන්දර්භය තුළ සාකච්ඡා කෙරේ.

විෂයපථය හා සීමාවෙහි පෙර වාර්තාකරණ කාලපරිච්ඡේදවලින් සැලකිය යුතු වෙනස්වීම් නොමැති වූ අතර, පසුගිය වාර්තාකරණ වසරෙහි නිකුත් කරන ලද වාර්ෂික වාර්තාව හා සැසඳීමේ ප්‍රතිප්‍රකාශද නොවීය.

## ප්‍රමාණාත්මතාවය

ප්‍රමාණාත්මතාව තීරණය කිරීමේදී, අපගේ පාර්ශ්වකරුවන් සඳහා කෙටිකාලීන, මධ්‍යම හා දිගුකාලීනව වටිනාකම් නිරමාණය කිරීමට හා පවත්වා ගැනීමට ඇති හැකියාව කෙරෙහි බලපෑම් කිරීමේ හැකියාව ඇති ප්‍රමාණාත්මක දේ ප්‍රමාණතා ගැටළු ලෙස අපි සලකමු. GRI සම්මත සහ මෙම කොටසේ සඳහන් අන්තර්ජාතික <IR> රාමුව, අපගේ පාර්ශ්වකරුවන් විසින් සපයන ලද ආදානය භාවිතා කරමින් මෙන්ම බාහිර පරිසරය විශ්ලේෂණය කිරීම මත පදනම්ව මෙම ඒකාබද්ධ වාර්ෂික වාර්තාව සඳහා ප්‍රමාණාත්මක තේමා අපි අර්ථ දක්වා ඇත්තෙමු. අදාළ තොරතුරු 60 සිට 62 දක්වා පිටුවල "පාර්ශ්වකරුවන්ගේ මැදිහත්වීම" සහ 50 සිට 54 දක්වා පිටුවල "ප්‍රමාණාත්මතාවය" යන කොටසේ දක්වා ඇත.

GRI 102-12,102-54

## වාර්තාකරණ රාමු

මෙම වාර්තාව පිළියෙල කිරීමේදී අපි පහත සඳහන් දෑ වලින් සංකල්ප, මූලධර්ම සහ මග පෙන්වීම් ලබා ගත්තෙමු -

- ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලයේ (IIRC) රාමුව
- ගෝලීය වාර්තාකරණ මුලපිරීම (GRI) -
  (GRI ප්‍රමිති : අනුකූලතාව - මූලික විකල්පය)
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය
- ශ්‍රී ලංකා මහ බැංකුව
- එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්ක (SDGs)

GRI 102-11

## පූර්වාරක්ෂාව පිළිබඳ මූලධර්මය

අපගේ සමාජ හා පාරිසරික තිරසාරභාවය සම්බන්ධයෙන් පූර්වාරක්ෂාව පිළිබඳ මූලධර්මය ක්‍රියාත්මක වේ.

අපගේ මෙහෙයුම් සමාජයට හා පරිසරයට සෘජු හා වක්‍ර බලපෑමක් ඇති කරන බව අපට වැටහෙයි. බැංකුවක් ලෙස අපගේ මෙහෙයුම් සමාජයට හා පරිසරයට සෘජුවම අහිතකර ලෙස බලපාන්නේ නැතත්, අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සහ බලශක්ති පරිභෝජනය අඩු කිරීම සඳහා වන අපගේ මුලපිරීම් තුළින් අපගේ කාබන් විමෝචනය අඩු කිරීමට අපි පියවර ගෙන ඇත්තෙමු.

ණය ප්‍රතිපත්ති, අවදානම් කළමනාකරණය සහ කැපවූ හරිත නිෂ්පාදන මගින් අප ණය දෙන අපගේ ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස ඇතිවන සෘණාත්මක වක්‍ර බලපෑම වළක්වා ගැනීමට හෝ අවම කිරීමට අපි උත්සාහ කරමු. 101 සිට 109 දක්වා පිටුවන ප්‍රජා ප්‍රාග්ධනය සහ ස්වාභාවික ප්‍රාග්ධනය යටතේ මේවා සවිස්තරව දක්වා ඇත.

GRI 102-56

## සහතික වීම

මෙම වාර්තාවේ අඩංගු සියලු මූල්‍යමය හා මූල්‍යමය නොවන තොරතුරු සහ දත්තවල නිරවද්‍යතාව සහ විශ්වසනීයත්වය අපි අගය කරමු. ඒකාබද්ධ සහතික කිරීමේ ආකෘතියක් අනුගමනය කරමින් අපගේ ව්‍යාපාර මෙහෙයුම්වල විවිධ අංශ අපි තක්සේරු කර සහතික කර ඇත්තෙමු.

| අංශය | අභ්‍යන්තර සහතික වීම | බාහිර සහතික වීම |
|---|---|---|
| මූල්‍ය වාර්තාකරණය | අධ්‍යක්ෂ මණ්ඩලය, අභ්‍යන්තර විගණනය | විගණකාධිපති |
| තිරසාර වාර්තාකරණය | අධ්‍යක්ෂ මණ්ඩලය, අභ්‍යන්තර විගණනය, ව්‍යාපාර ප්‍රධානීන් | KPMG |
| ආයතනික පාලනය | අධ්‍යක්ෂ මණ්ඩලය, අභ්‍යන්තර විගණනය | විගණකාධිපති |
| අභ්‍යන්තර පාලනය | අධ්‍යක්ෂ මණ්ඩලය, අභ්‍යන්තර විගණනය | විගණකාධිපති |

## තත්ත්ව සහතිකය

පැහැදිලිකම සහ සංසන්දනය සඳහා පහසුකම් සැලසීම සඳහා ප්‍රස්තාර, වගු සහ තොරතුරු වැනි දෘශ්‍ය අංග භාවිතා කරමින් විශ්වසනීය තොරතුරු සැපයීමට අප සෑම උත්සාහයක්ම ගෙන ඇත. සංසන්දනය කිරීම පහසු කිරීම සඳහා අපි වර්තමාන කාල පරිච්ඡේදයේ සහ පෙර කාල පරිච්ඡේදයේ කාර්යසාධනය ඇතුළත් කර ඇත්තෙමු. සොයා ගත හැකි සහ සත්‍යාපනය කළ හැකි බව ඇති කරන ආවේණික අභ්‍යන්තර පාලන හරහා තොරතුරු සහතික කිරීම සහ සංගත බව පහසු කර ඇත. දෘශ්‍ය අංගයන්ගේ ආධාරයෙන්, වාර්තාවේ කියවීමේ හැකියාව සහ සංක්ෂිප්තය වැඩි දියුණු කර ඇත. බැංකුවේ සෘජු හා වක්‍ර ප්‍රමාණාත්මක බලපෑම් ඇතුළත් කිරීමෙන් වාර්තාවේ සම්පූර්ණත්වය සහතික කෙරේ. අවසාන වශයෙන්, ප්‍රමාණාත්මක අදාළ තොරතුරු පිළිබඳ සමබර සමාලෝචනයක් ඉදිරිපත් කිරීමට සෑම උත්සාහයක්ම ගෙන ඇති අතර බාහිර සහතිකයක් ලබා ගැනීමෙන් තොරතුරුවල විශ්වසනීයත්වය අපි සහතික කර ඇත්තෙමු.

## ඉදිරි දැක්ම ප්‍රකාශ

අනාගත සිදුවීම්වලට අදාළ ප්‍රකාශ සහ වාර්තාවේ අඩංගු මූල්‍ය ප්‍රක්ෂේපණ, දැනට පවතින තොරතුරු මත පදනම් වේ. මෙම සිදුවීම් රඳා පවතින තත්ත්වයන් හා සම්බන්ධ අවදානම් සහ අවිනිශ්චිතතාවයන් හේතුවෙන් මෙම අනාගත සිදුවීම් සාක්ෂාත් කර ගැනීමේ සම්භාවිතාව පිළිබඳව මහජන බැංකුව කිසිදු සහතිකයක් ලබා නොදේ. මෙම වාර්තාව පළ කිරීමෙන් පසු ඇති වූ වෙනස්කම් පිළිබිඹු කිරීම සඳහා බැංකුව මෙම තොරතුරු යාවත්කාලීන කර නොමැත.

GRI 102-53

## විමසීම් සහ ප්‍රතිචාර

මෙම වාර්තාව පිළිබඳ ඔබගේ අදහස් සහ විමසීම් අපි සාදරයෙන් පිළිගනිමු. ඒවා අප වෙත යොමු කිරීමට අපි ඔබට ආරාධනා කරන්නෙමු:

**කළමනාකරණ තොරතුරු දෙපාර්තමේන්තුව**
**මහජන බැංකුව,**
**නො 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 2.**

+94 11 232 7841, +94 11 244 6315, +94 11 248 1481
info@peoplesbank.lk
www.peoplesbank.lk

# අන්තර්ගතය


## අප පිළිබඳව

අපගේ බැංකුව 06
අපගේ සමූහය 08
අපගේ චාරිකාව 09

## විශේෂ තොරතුරු

14

## නායකත්වය

සභාපතිවරයාගේ පණිවිඩය 16
ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය 20
අධ්‍යක්ෂ මණ්ඩලය 24
ආයතනික කළමනාකරණය 28
විධායක කළමනාකරණය 36
ප්‍රධාන කළමනාකරුවන් 38

## ව්‍යාපාර ආකෘතිය

අපගේ වටිනාකම් නිර්මාණය කිරීමේ ආකෘතිය 40
මෙහෙයුම් පරිසරය 44
ප්‍රමාණාත්මතාව 50
උපාය මාර්ගික දිශාව 55
තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) වෙත දායකත්වය 56

## වටිනාකම් නිර්මාණය කිරීම සහ ප්‍රාග්ධනය ගොඩනැගීම

කොටස්කාර නියැලීම 60
මූල්‍ය ප්‍රාග්ධනය 63
නිෂ්පාදිත ප්‍රාග්ධනය 69
බුද්ධිමය ප්‍රාග්ධනය 73
මානව ප්‍රාග්ධනය 78
සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය 89
ගනුදෙනුකාර ප්‍රාග්ධනය - 89
ව්‍යාපාරික හවුල්කාර ප්‍රාග්ධනය - 96
ආයෝජක ප්‍රාග්ධනය - 99
ප්‍රජා ප්‍රාග්ධනය - 101
ස්වභාවික ප්‍රාග්ධනය 106

1

## අවදානම් කළමනාකරණය


110


## කාර්යසාධන වාර්තා


පාර්භෝගික බැංකුකරණය 140

ව්‍යවසාය බැංකුකරණය 144

ආයතනික බැංකුකරණය 146

භාණ්ඩාගාර ඒකකය 148

විදේශීය ගනුදෙනුකාර සේවා සහ ජාත්‍යන්තර බැංකුකරණය 150


## යහපාලන වාර්තා


ආයතනික යහපාලනය 153

අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වාර්තා 172

මූල්‍ය වාර්තාකරණය කෙරෙහි අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය 177

අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 179


2

## මූල්‍ය වාර්තා


මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම 182

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකාධිපතිගේ වාර්තාව 183

ආදායම් ප්‍රකාශය 185

විස්තීර්ණ ආදායම සම්බන්ධ ප්‍රකාශය 186

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 187

ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය - බැංකුව 188

ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය - සමූහය 190

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 192

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 193


## පරිපූරක වාර්තා


ආදායම් ප්‍රකාශය (එක්සත් ජනපද ඩොලර්) 298

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (එක්සත් ජනපද ඩොලර්) 299

දස වසරක සාරාංශය - බැංකුව 300

දස වසරක සාරාංශය - සමූහය 301

බාසල් III යටතේ වෙළඳපොළ විනය හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය 302

තිරසාරත්ව වාර්තාව පිළිබඳ බාහිර සහතිකය 315

ගෝලීය වාර්තාකරණ ප්‍රවේශය (GRI) අන්තර්ගත දර්ශකය - "අනුකූලතා" විකල්පය : මූලික 317

මූල්‍ය/බැංකුකරණ යෙදුම් (පාරිභාෂිත ශබ්ද මාලාව) 321

ආයතනික තොරතුරු 324

# අපගේ බැංකුව

## මහජන බැංකුව - ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ඩිජිටල් මූල්‍ය සේවා සැපයුම්කරු

මහජන බැංකුව යනු ශ්‍රී ලංකාව පුරා ශාඛා 739ක විශාලතම පියසටහන සහිත ප්‍රමුඛ රාජ්‍ය බැංකුවකි. 2019 දෙසැම්බර් 31 දිනට රුපියල් ට්‍රිලියන 1.873ක වත්කම් පදනමකට හිමිකම් කියමින්, බැංකු අංශයේ වත්කම් පරිමාව අනුව දිවයිනේ දෙවන විශාලතම වාණිජ බැංකුව අපයි. 8,000කට ආසන්න සංඛ්‍යාවක් වන අපගේ කැපවූ කාර්ය මණ්ඩලය දිවයින පුරා මිලියන 14කට අධික ගනුදෙනුකරුවන් සංඛ්‍යාවක් සිටින අපගේ විශාල පාරිභෝගික පදනමට සේවය කරයි.

1961 අංක 29 දරණ මහජන බැංකු පනත යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස පිහිටුවන ලද අප ශ්‍රී ලංකාවේ පද්ධතිමය වශයෙන් වැදගත් බැංකුවකි. දශක හයකට ආසන්න කාලයක් ජාතියට සේවය කරමින්, අප සෑම තරාතිරමකම ගනුදෙනුකරුවන්ට බැංකු විසඳුම් රාශියක් බිහි කර ඇති අතර, එය අප සැබවින්ම "ජනතාවගේ බැංකුව" බවට පත් කර ඇත

## අපගේ ඩිජිටල්කරණ එළඹුම

ඩිජිටල්කරණයේ ප්‍රතිලාභ මුළු ජාතියටම ගෙන ඒම සඳහා, ඩිජිටල්කරණය සහ ගනුදෙනුකරුවන් සම්බන්ධ කර ගැනීමේදී පුරෝගාමී කාර්යභාරයක් ඉටු කරමින් අපි 2015 දී ඩිජිටල් පරිවර්තන ගමනක් ආරම්භ කළෙමු. එතැන් සිට ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ අන්තර්ක්‍රියාකාරිත්වයේ සෑම අවස්ථාවකම ලෙහෙසිය, වේගය, කාර්යක්ෂමතාව සහ පහසුව ලබා දෙන විවිධාංගීකරණය වූ ඩිජිටල් බැංකු විසඳුම් රාශියක් දියත් කර ඇත. තොරතුරු, ආරක්ෂාව සහ සුරැකුම සඳහා ඉහළම ජාත්‍යන්තර ප්‍රතීතනය වන ISO/IEC 27001: 2013 සහතිකය ප්‍රතීතනය කළ ශ්‍රී ලංකාවේ පළමු සහ එකම බැංකුව අපයි;

76 සහ 77 පිටුවල වැඩිදුර කියවන්න

## සමාජ වගකීම් සහ තිරසාරභාවය පිළිබඳ අපගේ කැපවීම

අපගේ මෙහෙයුම් සඳහා වගකීම භාර ගැනීම සහ මූල්‍ය සේවා කර්මාන්තයේ යහපත් භාවිතයන් පිළිබඳ ආදර්ශයක් තැබීම සඳහා අප දැරූ උත්සාහය හඳුනාගෙන, අපට තිරසාර අනාගත සමූහය (SFG) විසින් Carbon Conscious® සහතිකය ප්‍රදානය කරන ලද අතර මෙම විශිෂ්ටත්වය ලද ආසියාවේ පළමු රාජ්‍ය බැංකුව අපය. "People's Green Pulse" මගින් පාරිසරික තිරසාරභාවය පිළිබඳ අපගේ කැපවීම සහ හරිත අනාගතයක් සඳහා වූ අපගේ පොරොන්දුව පෙන්නුම් කරයි.

පිටු 106 සිට 109 දක්වා වැඩිදුර කියවන්න.

## ඉහළ ශ්‍රේණිගත කිරීම

ෆිච් රේටින්ග්ස් ලංකා ලිමිටඩ් මගින් අපට "AA+(lka)" යන ඉහළ ජාතික දිගු කාලීන ඇගයීමක් ලැබී තිබේ. මෙය අපගේ ඉහළ පද්ධතිමය වැදගත්කම, අර්ධ-ස්වෛරී තත්ත්වය, රජයට ප්‍රධාන ණය දෙන්නන්ගෙන් කෙනෙකු ලෙස අපගේ කාර්යභාරය සහ පූර්ණ රාජ්‍ය හිමිකාරිත්වය මත පදනම් වේ.

## ප්‍රාග්ධනීකරණය

ප්‍රාග්ධන ප්‍රමාණවත් බව යනු බැංකුවේ යහපත් බව සහ ස්ථාවරත්වය විදහා දක්වන ප්‍රධාන මූල්‍ය දර්ශකයකි. බැංකුව විසින් සිදු කරනු ලබන විවිධ ක්‍රියාකාරකම් හේතුවෙන් අනපේක්ෂිත අලාභයකට මුහුණ දීමට බැංකුවට ඇති හැකියාව මෙයින් මනිනු ලැබේ.

302 සිට 314 දක්වා පිටුවල වැඩිදුර කියවන්න.

## ප්‍රධාන වෙනස් වීම්

- අපගේ ඉහළ කාර්යසාධනය සහිත පුද්ගලයින්
- අපගේ ඩිජිටල්කරණ නායකත්වය
- අපගේ නවෝත්පාදන එළඹුම
- අපගේ වඩාත්ම පුළුල් භූගෝලීය පිය සටහන
- අපගේ විවිධාංගීකරණය වූ පාරිභෝගික පදනම
- අපගේ තාක්ෂණය
- අපගේ මෙහෙයුම් විශිෂ්ටත්වය
- අපගේ අවංකභාවය සහ සාරධර්ම
- තිරසාරභාවය සඳහා අපගේ කැපවීම
- අපගේ විවිධාංගීකරණ කළඹ

## අපගේ දැක්ම

මූල්‍ය සේවා සැපයීම අතින් ශ්‍රී ලංකාවේ අසමසම, වෙළඳපොළ නියමුවා යන විරුදාවලිය ලැබීම අපගේ දැක්ම යි.

## අපගේ මෙහෙවර

- පහසුවෙන් දැරිය හැකි, පහසුවෙන් ඉටු කරවා ගත හැකි මෙන්ම කාර්යක්ෂමව සපයා දෙනු ලබන මූල්‍ය සම්පාදන විසඳුම් ලබා දී, ජනජීවිතයේ දියුණුවටත්, ව්‍යවසාය සංවර්ධනයටත් දායකත්වය සැපයෙන පරිද්දෙන් මූල්‍ය සේවා සපයාදීමේ ව්‍යාපාරයේ නියැළී සිටීමත්,
- අප ගනුදෙනුකාර භවතුන්ට සැලකීමටත් ඔවුන් රැකගැනීමටත්, කුසලතා ප්‍රවර්ධනයට දිරිදෙමින් අපගේ මානව සම්පත් ප්‍රවර්ධනය කරමින් හා බලගැන්වීමත්,
- තරඟකාරී අන්දමින් ලාභ උපයන අතරම, ජාතික ආර්ථික සංවර්ධනයට අපගේ දායකත්වය සැපයීමත්,
- අපගේ ව්‍යාපාර පරිචයන් අතින් තිරසාර බව රැකගනිමින්, අප බැංකු මෙහෙයුම් කටයුතු සපයා ප්‍රජාවන් වෙත ප්‍රතිඋපකාර ප්‍රදානය කිරීමත්,

අපගේ “මෙහෙවර” ලෙසින් ඉටු කෙරේ.

GRI 102-16

## අපගේ වටිනාකම්

- ජාතියේ හද ගැස්ම ලෙසින් ක්‍රියාත්මක වීමත්,
- ගනුදෙනුකාරභවතුන්ගේ අවශ්‍යතා කෙරෙහි මනා නැමියාවකින් යොමු වීමත්,
- කීර්තිනාමයේ ඒකාග්‍රතාව රැකගනිමින් වගවීමත්,
- අඛණ්ඩ උගැනුම් සංස්කෘතියක් පවත්වාගනිමින් කණ්ඩායම් හැඟීමෙන් සේවා සැපයීමත්,
- බලාත්මක වීම සහ විවිධතා ගරු කිරීමත්,

අපගේ වටිනාකම් වේ.



# අපගේ සමූහය

මහජන බැංකු සමූහය මහජන බැංකුව සහ පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී, පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම යන පරිපාලිත සමාගම්වලින් සමන්විත වේ. සමූහයට විශාලතම දායකත්වය සපයන්නේ මහජන බැංකුව වන අතර, එය මුළු වත්කම් වලින් 90% ඉක්මවන අතර, බදු පසු ලාභයෙන් 80% ක්ද ඉක්මවයි.

| | මහජන බැංකුව | පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම |
|---|---|---|---|
| | PEOPLE'S BANK | PLC PEOPLE'S LEASING | PEOPLE'S TRAVELS your trusted travel company |
| හිමිකාරිත්වය | | 75% | 99% |
| සංස්ථාපිත වර්ෂය | 1961 | 1995 | 1993 |
| ගනුදෙනුකාර අංශ | • තනි පුද්ගලයන්<br>• ක්ෂුද්‍ර ව්‍යවසාය<br>• කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර<br>• සංස්ථාපිත, රාජ්‍ය සහ රජය සතු ව්‍යවසාය | • තනි පුද්ගලයන්<br>• ක්ෂුද්‍ර ව්‍යවසාය<br>• කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර | • තනි පුද්ගලයන්<br>• ක්ෂුද්‍ර ව්‍යවසාය<br>• කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර |
| ප්‍රධාන නිෂ්පාදන සහ සේවා | • සිල්ලර බැංකුකරණය<br>• ව්‍යවසාය බැංකුකරණය<br>• ආයතනික බැංකුකරණය<br>• ජාත්‍යන්තර බැංකුකරණය | • කල්බදු සහ කුලී පිට ගැනුම්<br>• ක්ෂුද්‍ර මූල්‍යය<br>• තැන්පතු<br>• ණය | • අභ්‍යන්තර සංචාර<br>• විදේශ සංචාර<br>• ගමනාන්ත කළමනාකරණය |
| කාර්ය සාධනයේ විශේෂ අවස්ථා | වත්කම්: රු බිලියන 1,873<br>බදු පෙර ලාභය: රු බිලියන 19.7 | වත්කම්: රු බිලියන 187<br>බදු පෙර ලාභය: රු බිලියන 6.9 | වත්කම්: රු මිලියන 106<br>බදු පෙර ලාභය: රු මිලියන 6.7 |
| ශාඛා සංඛ්‍යාව | 739 | 103 | 3 |
| කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව | 7,836 | 3,374 | 27 |

# අපගේ චාරිකාව

## 1961



මහජන බැංකුව 1961 ජූලි 1වන දින ආරම්භ කරන ලදී. පළමු ශාඛාව කොළඹ ඩියුක් වීදියේ විවෘත කරන ලදී. වර්ෂය තුළ කොළඹ විදේශ ශාඛාවට අමතරව තවත් ශාඛා අටක් පොලොන්නරුව, හිඟුරක්ගොඩ, හම්බන්තොට, අනුරාධපුර, පුත්තලම, මාතලේ සහ මහනුවර විවෘත කරන ලදී. මුළු සේවක සංඛ්‍යාව 169ක් විය.

## 1962

ප්‍රධාන කාර්යාලය කොළඹ 2, යුනියන් පෙදෙසේ රත්නම් ගොඩනැගිල්ලට ගෙන යන ලද අතර තවත් ශාඛා 17ක් විවෘත කරන ලදී.

## 1963

බැංකුව සිය උකස් සේවා ආරම්භ කළේය.

## 1964

සමුපකාර ග්‍රාමීය බැංකු යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී.

## 1965

බැංකුවේ සමහර දෙපාර්තමේන්තු කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවතෙහි පිහිටි රජයේ ලිපිකරු සේවා සංගමයේ (ජීසීඑස්යූ) ගොඩනැගිල්ලට ගෙන යන ලදී. හොරණ, කැකිරාව, පදවිය, මන්නාරම, ඇඹිලිපිටිය, කහටගස්දිගිලිය, රාගල සහ තලවාකැලේ යන නව ශාඛා ඇතුළුව මුළු ශාඛා සංඛ්‍යාව 48 දක්වා ඉහළ ගියේය.

## 1967

සුළු පරිමාණ ගොවිපොළ ක්ෂේත්‍රයට පුරෝගාමී ණය දෙන්නා බවට පත්වෙමින් බැංකුව නව කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කළේය.

## 1970

අවිධිමත් අංශයේ ආර්ථික කටයුතු සඳහා මුදල් සම්පාදනය කිරීම සඳහා "අතමාරු" ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. නිතර ඉතිරි කරන්නන් ආකර්ෂණය කර ගැනීම සඳහා ණය සම්බන්ධිත ඉතුරුම් ක්‍රමයක් වන ආයෝජන ඉතිරි කිරීමේ යෝජනා ක්‍රමය දියත් කරන ලදී.




## 1971

බැංකුවේ සියවන ශාඛාව මරඳගහමුල විවෘත කරන ලදී

## 1973

නිෂ්පාදන හා පරිභෝජන ණය පහසුකම් සැපයීම සඳහා පුළුල් ග්‍රාමීය ණය ක්‍රමයක් දියත් කරන ලදී. බැංකුව "ගනු-දෙනු" පිළිවෙත ආරම්භ කළ අතර, සිංහල හා දෙමළ අලුත් අවුරුදු සම්ප්‍රදායන් සමඟ කටයුතු කිරීම සහ නැකැත් වේලාවට බැංකුව සමඟ ගනුදෙනු කිරීම සඳහා ගනුදෙනුකරුවන් දිරිමත් කරන ලදි.

## 1975

ආක්‍රමණශීලී ශාඛා පුළුල් කිරීමේ වැඩසටහනක් මගින් අපගේ මුළු ශාඛා ගණන 158 දක්වා ගෙන එන ලදි.

# අපගේ චාරිකාව

## 1977

අපේ 200වන ශාඛාව කොල්ලුපිටියේ විවෘත කරන ලදි. ප්‍රධාන කාර්යාලය කොටුවේ ගොඩනැගිල්ලකට ගෙන යන ලදී. මුළු සේවක සංඛ්‍යාව 5,000ක් විය. පළමු ධීවර බැංකුව කොරළවැල්ලේ විවෘත කරන ලදී

## 1981

අපගේ ශාඛා ජාලය 290 දක්වා වැඩි විය. පුළුල් කළ බාල වයස්කරුවන්ගේ ඉතුරුම් යෝජනා ක්‍රමය දියත් කරන ලදී.

## 1982

බැංකුවේ 300වන ශාඛාව ඉංගිරියෙහි විවෘත කරන ලදි මුළු සේවක සංඛ්‍යාව 10,000 ක් විය.

## 1984

බැංකුවේ පරිපාලිත සමාගමක් වන පීපල්ස් මර්චන්ට් බැංකුව ස්ථාපනය කෙරිණි කොම්පඤ්ඤවීදියේ අපගේ ශාඛාව ජාත්‍යන්තර අංශය හා කොටුව විදේශ ශාඛාව සමඟ ඒකාබද්ධ කරන ලදී.

## 1986

පරිගණකකරණ ක්‍රියාවලිය අපගේ ප්‍රධාන කාර්යාලයෙන් ආරම්භ වූ අතර තෝරා ගත් නගර ශාඛා සහ බිලක් ලයිට් පද්ධතියක් හඳුන්වා දෙන ලදී. එමඟින් ගනුදෙනුකරුවන් රඳවා ගැනීමේ කාලය සැලකිය යුතු ලෙස පහත වැටිණි.

## 1987

අපගේ මූලස්ථාන ශාඛාව බැංකුවේ පළමු පූර්ණ ස්වයංක්‍රීය ශාඛාව බවට පත්විය. ලංකා විදුලි බල මණ්ඩලය සමඟ සහයෝගීතාවෙන් ග්‍රාමීය විදුලිය ලබා දීම සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී.

## 1989

කම්කරු අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් සේවක අර්ථසාධක අරමුදල් ශේෂය ඇපයට තබා නිවාස ලබාදීමේ ණය ක්‍රමයකට බැංකුව සහභාගී විය. ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය සමඟ එක්ව විදේශයන්හි රැකියා අපේක්ෂකයින් සඳහා ණය ලබා දීමේ වැඩපිළිවෙළක් දියත් කරන ලදි. 1983 සිවිල් අර්බුධයෙන් පීඩාවට පත්වූවන් වෙත ණය ලබාදීම සඳහා ශ්‍රී ලංකා දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය (REPIA) මඟින් හඳුන්වා දෙන ලද යෝජනා ක්‍රමයකට බැංකුව සහභාගී විය. වසර තුළ ජනසවිය සම්බන්ධිත ණය ක්‍රමයක් හඳුන්වාදෙන ලදී. බැංකුව මඟින් ඉතුරුම් සහතිකපත් නිකුත් කිරීමද මෙම වසරේදී අරඹන ලදී.

## 1990

ඉතුරුම් තිළිණ තැන්පතු ක්‍රමයක් හඳුන්වාදෙන ලදී. පීපල්ස් වීසා කාඩ්පත වීසා ඉන්ටර්නැෂනල් සමඟ සහයෝගීතාවෙන් හඳුන්වා දෙන ලද අතර ශාඛා 24ක් සම්පූර්ණයෙන් පරිගණකගත කරන ලදි.

## 1991

පළමු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය අපගේ මූලස්ථාන ශාඛාවේ ස්ථාපනය කරන ලදී.

## 1992

රජයේ ඇඟලුම් කර්මාන්තශාලා 200 වැඩසටහනට බැංකුව සහාය දැක්විය. "මහජන ස්වයංක්‍රීය බැංකුකරණ පද්ධතිය" (PABS) නම් අභ්‍යන්තරව සංවර්ධනය කරන ලද බැංකු යෙදුමක් සජීවී මෙහෙයුම් ආරම්භ කළේය.




## 1993

රට පුරා බැංකු ශාඛා 330ක් ක්‍රියාත්මක වූ අතර ප්‍රධාන ශාඛා 35 ක් පූර්ණ වශයෙන් ස්වයංක්‍රීයකරණය කරන ලදි. "වනිතා වාසනා", නමින් කාන්තාවන් සඳහා ඉතිරි කිරීමේ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

## 1994

නව ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර අටක් ස්ථාපනය කරන ලද අතර, ස්වයංක්‍රියකරණ වැඩසටහන යටතේ ශාඛා 160ක් පරිගණකගත කරන ලදි.

## 1995

අධ්‍යාපන අමාත්‍යාංශයෙහි සහාය ඇතිව රජයේ ගුරුවරුන්ට සේවා සැපයීමට "ගුරුසෙත" නමින්, නව ඉතුරුම් සහ ණය යෝජනා ක්‍රමයක් දියත් කරන ලදි

## 1996

රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සේවකයින් වෙනුවෙන් "සුව සෙවණ" නමින්, ණය පහසුකම් පැකේජයක් දියත් කරන ලදී. පාසල් දරුවන්ට "සිසු උදාන" නමින්, නව තැන්පතු ක්‍රමයක් හඳුන්වා දෙන ලදි. කුඩා තේ කර්මාන්ත සංවර්ධන ව්‍යාපෘතිය සහ බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය යන ආසියානු සංවර්ධන බැංකු අරමුදල් මත ක්‍රියාත්මක ණය ක්‍රම දෙකකට බැංකුව සහභාගීත්වය දැක්විය. බැංකුවේ පූර්ණ හිමිකාරිත්වය සහිත පරිපාලිතයන් වන සීමාසහිත පීපල්ස් ලීසිං (පුද්ගලික) සමාගම සහ සීමාසහිත පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම මෙහෙයුම් කටයුතු ඇරඹිය. විමධ්‍යගත පරිපාලනය සවිමත් කිරීමේ සහ ගනුදෙනුකරුවන් වෙත වඩාත් යහපත් සේවාවක් සැලසීමේ අරමුණින් කලාප කාර්යාල විවෘත කෙරිණි.

## 1997

ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා සහාය වීමට "සුරතුර" ණය යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදි. බැංකුව ජාතික සංවර්ධන බැංකුව (NDB) මඟින් අරමුදල් සම්පාදිත සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහයෝගීතා ව්‍යාපෘතිය (SMEAP) යටතේ, බැංකුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත ණය පහසුකම් පිරිනැමීය.

## 1998

පෙට් කාඩ්පත් හිමියන් 125,000 කට අධික සංඛ්‍යාවක් වෙත සේවා සලසමින් මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 36 දක්වා ඉහළ නැංවිනි. ශාඛා 175 ක් පූර්ණ ස්වයංක්‍රීයකරණයට ලක් කරන ලද අතර, උකස් මධ්‍යස්ථාන සංඛ්‍යාව 188 දක්වා ඉහළ නැංවිනි. විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ එක්ව විගමනික සේවකයින්ගේ ප්‍රයෝජනය පිණිස "විදේශිකා" නමින් ණය සහ ඉතුරුම් ක්‍රමයක් හඳුන්වාදෙන ලදි.



# 1999

තම භාරයේ සිටින ලාබාලයන්ට ප්‍රතිලාභ ලබා දීම සඳහා දෙමව්පියන් සහ භාරකරුවන් දිරිගන්වමින් ''ඉසුරු උදාන'' තැන්පතු ක්‍රමය හඳුන්වාදෙන ලදී.

# 2000

"ජන ජය", ඉතුරුම් හා ණය ක්‍රමය දියත් කරන ලදි. අලුතින් හඳුන්වා දෙන ලද "ජය ශ්‍රී" දිනුම් ඇදීම මගින් තැන්පත්කරුවන්ට ආකර්ෂණීය ත්‍යාග පිරිනමන ලදි. දිවයින පුරා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය 74 ක් දක්වා ව්‍යාප්ත කෙරිණි. PABS ශාඛාවන් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සමග සම්බන්ධ කිරීම සඳහා මධ්‍යම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්විච්ය හඳුන්වා දෙන ලදි.



# 2001

පුද්ගලික බැංකුකරණ ක්ෂේත්‍රයෙන් ඇතැම් අංශ ප්‍රධානීන් බඳවා ගනිමින් බැංකුවේ සංස්ථාපිත කළමනාකරණ කන්ඩායම ශක්තිමත් කිරීමට පියවර ගන්නා ලදී. ක්‍රමෝපායික සැලසුමක් හඳුන්වාදීම ඔස්සේ බැංකුව ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ ලදී. මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 90 දක්වා වර්ධනය විය.

# 2002

PABS ස්වයංක්‍රීය ශාඛා සංඛ්‍යාව 218 දක්වා ඉහළ නංවන ලද අතර, ශාඛා 119 ක් මධ්‍යම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්විච්ය වෙත සම්බන්ධ කෙරිණි. භාණ්ඩාගාර ස්වයංකරණ පැකේජයක් දියත් කරන ලදි.

# 2003

බැංකුවේ 11 වැනි ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී අශෝක ද සිල්වා මහතා 2003 පෙබරවාරි මස 1 වැනි දින සිය ධුරයේ වැඩ භාර ගත්තේය. යංග් එක්සෙකටිව් සේවර් (YES) ගිණුම හඳුන්වාදෙන ලදී. බැංකුව අති නවීන ප්‍රමුඛ බැංකුකරණ පද්ධතියක් සහ වෙළඳ සේවා විසඳුමක් සඳහා මැලේසියාවේ සිල්වර් ලේක් සිස්ටම් SDV BUD සමග ගිවිසුමක් අත්සන් තැබීය. මෙම තාක්ෂණයන් ආධාරයෙන් මූලිකව ප්‍රධාන කාර්යාලය ඇතුළුව තෝරාගත් ශාඛාවන් 60 ක මෙහෙයුම් ශක්තිමත් කිරීම සිදුකෙරෙනු ඇත.

# 2004

2004-2008 ප්‍රතිව්‍යුහගතකරණ සැලසුමේ දෙවන අදියර එළිදක්වන ලද අතර, ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රතිප්‍රාග්ධනීකරණ සහයෝගී පද්නම මත එයට ශ්‍රී ලංකා රජයේ අනුමැතිය හිමි විය. බැංකුව විසින් ෆිච් රේටිං ලංකා වෙතින් ප්‍රථම පොදු තත්වාගණන ශ්‍රේණිගත කිරීම වන BBB+ හිමිකර ගන්නා ලදි. කේන්ද්‍රීය බැංකුකරණ ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදි.

# 2005

බැංකුවෙහි 15වන සභාපති ආචාර්ය පී ඒ කිරිවන්දෙණිය මහතා 2005 දෙසැම්බර් මුලදී රාජකාරී ආරම්භ කළේය. ඉන් අනතුරුව ශ්‍රී ලංකා රජය, ආසියානු සංවර්ධන බැංකුව සහ මහජන බැංකුව අතර අත්සන් තැබුනු ගිවිසුමකට අනුව, ශ්‍රී ලංකා රජය විසින් බැංකුව තුළ සිදුකරන ලද ස්කන්ධ ප්‍රාග්ධන ආයෝජනයෙහි පළමු වාරිකය වශයෙන් රුපියල් බිලියන 2 ක් මහජන බැංකුව වෙත හිමි විය. කේන්ද්‍රීය බැංකුකරණ ව්‍යාපෘතිය ශාඛා ජාලය පුරා තවදුරටත් ව්‍යාප්ත කෙරිණි. 2004 සුනාමි ව්‍යසනයෙන් පසු, නැවත ගොඩනැංවීම සඳහා රජයෙන් පිරිනමන ලද මූල්‍ය සහයෝගය තුළ බැංකුව ප්‍රධාන අතරමැදි ආයතනයක් වශයෙන් කටයුතු කලේය.

# 2006

ස්වකීය පූර්ව ශ්‍රේණිගත කිරීමේ මට්ටමින් තවදුරටත් ප්‍රගතිය විදහා දක්වමින් බැංකුව ෆිච් රේටිං ආයතනයෙන් A- ශ්‍රේණිය අත්පත් කරගැනීමට සමත් විය. මහජන බැංකුවට බැංකු හා මූල්‍ය සේවා අංශයේ 2006 සඳහා POP සම්මානය ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය විසින් ප්‍රදානය කරන ලදී. ශ්‍රී ලංකා රජය මගින් දෙවන ප්‍රාග්ධන වාරිකය වශයෙන් රුපියල් බිලියන 1ක් මහජන බැංකුව වෙත ලබාදෙන ලදී.

# 2007

බැංකුවේ 16 වන සභාපති ඩබ්ලිව්. කරුණාජීව මහතා 2007 මැයි මාසයේදී රාජකාරී භාර ගත්තේය. ෆිච් ශ්‍රේණිගත කිරීම්වලින් A - වර්ගීකරණ මට්ටම වර්ෂය තුළ පවත්වා ගෙන යනු ලැබීය. ශ්‍රී ලංකා රජය තෙවන ප්‍රාග්ධන වාරිකය වශයෙන් රුපියල් බිලියන 1.5 ක් මහජන බැංකුවට ලබා දෙන ලදි. මහජන බැංකුව අඛණ්ඩව දෙවන වසරේදීත් වසරේ බැංකුකරණ හා මූල්‍ය සේවා වෙළඳ නාමය වශයෙන් ජනතා සම්මානයෙන් පිදුම් ලැබීය. වසර 2007 දී බැංකුව මුළු තැන්පතු අතින් රුපියල් බිලියන 300 අභිබවා යාමට සමත් විය.

# 2008

එම්. වික්‍රමසිංහ මහතා බැංකුවේ 12 වන ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී ලෙස වැඩ භාර ගත්තේය. ශ්‍රී ලංකා රජය විසින් රුපියල් බිලියන 1.5ක සිව්වන ප්‍රාග්ධන වාරිකය නිකුත් කරන ලදි. වසර අවසානය වන විට බැංකුව 10.5% ක ප්‍රාග්ධන ප්‍රමාණවත්භාව මට්ටම කරා ළඟාවිය. තවද මෙම වසරේදී රුපියල් බිලියන 2.5ක් වූ බැංකුවේ ප්‍රථම ණයකර නිකුතුව සිදු කෙරිණි. බැංකුවේ ප්‍රේෂණ සේවාවන්හි කැපී පෙනෙන සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, නවීන තාක්ෂණය ඔස්සේ මිනිත්තු කිහිපයක් තුළ විදේශයන්හි සිට මුදල් ප්‍රේෂණයය කිරීමේ අන්තර්ජාලගත සේවාවක් වන "People's e-remittance" හඳුන්වාදෙන ලදී. නව විදේශ මුදල් තැන්පතු නිෂ්පාදන දෙකක් හඳුන්වා දෙන ලදි, එනම්, ළමයින් සඳහා විදෙස් මුදල් තැන්පතු නිෂ්පාදනයක් වන "දූ දරු එතෙර ඉසුර" සහ "විශේෂ විදේශ ආයෝජන ඉතුරුම් ගිණුමයි" [SFIDA].

# අපගේ චාරිකාව

## 2009

බැංකුවේ 13 වන ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී පී වී පතිරන මහතා 2009 ජනවාරි මාසයේදී රාජකාරි භාර ගත්තේය. වසර තුළදී බැංකුව රුපියල් බිලියන 2.5 ක් වූ සිය දෙවන ණයකර නිකුතුව සිදු කලේය. ශාඛා 214 ක් සහ සේවා මධ්‍යස්ථාන 236 ක් අන්තර්ජාලය ඔස්සේ සම්බන්ධ කෙරිණි. බැංකුව මගින් ක්‍රමෝපායිකව දිවයින පුරා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 300 කට අධික සංඛ්‍යාවක් ස්ථාපනය කරන ලදී . මුළු තැන්පතු රුපියල් බිලියන 400කට ළඟා විය. වාර්තාගත ඉහළම බදු පෙර ලාභය වන රුපියල් බිලියන 6.1 අත්පත් කර ගැනුනි . බැංකුවේ ඉතිහාසයේ ප්‍රථම වරට 2008 වාර්ෂික වාර්තාව දකුණු ආසියානු ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනයේ SAFA සම්මානයට පාත්‍ර කරනු ලැබීය.

## 2010

එච්. එස්. ධර්මසිරි මහතා 2010 ඔක්තෝබර් මාසයේදී බැංකුවේ 14 වන ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී ලෙස වැඩ භාර ගත්තේය. ශාඛා ජාලය සහ සේවා මධ්‍යස්ථාන 679ක් දක්වාත්. ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර 330ක් දක්වාත් පුළුල් කරන ලදි. 2010 ජූලි මස පීපල්ස් ඉන්ටර්නැෂනල් ඩෙබිට් කාඩ්පත හඳුන්වා දෙන ලදී. බැංකුව ෆිච් රේටිංග්ස් ලංකා සමාගම වෙතින් AA- ශ්‍රේණිගත කිරීමද, රැම් රේටිංග්ස් වෙතින් AAA ශ්‍රේණිගත කිරීමද, හිමිකර ගැනීමට සමත් විය. 2010 වසර තුළදී මුළු තැන්පතු ප්‍රමාණය රුපියල් බිලියන 462 ඉක්මවා යන ලදී. වාර්තාගත ඉහළම බදු පෙර ලාභය වන රුපියල් බිලියන 8.7 අත්පත් කර ගන්නා ලදි. නිව්යෝක්හි පැවති ARC සම්මාන උළෙලේදී මහජන බැංකු වාර්ෂික වාර්තාව ස්වර්ණ සම්මාන දෙකකින් පිදුම් ලැබීය. දකුණු ආසියානු ගණකාධිකාරිවරුන්ගේ සංගමය (SAFA) මගින් 2009 මහජන බැංකු වාර්ෂික වාර්තාව රාජ්‍ය අංශයේ ප්‍රථම ස්ථානය ලෙස සම්මානයට පාත්‍ර කරනු ලැබීය.

## 2011

එන් වසන්ත කුමාර් මහතා 2011 පෙබරවාරි 22 වන දින බැංකුවේ 15 වන ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී ලෙස වැඩ භාර ගත්තේය. බැංකුව 2011 ජූලි 1 වන දින ස්වර්ණ ජයන්තිය සැමරීය. දිවයිනේ සියළුම ප්‍රදේශ පාහේ ආවරනය කරමින් ශාඛා ජාලය 714 දක්වාද, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 382 දක්වාද ඉහළ නැංවිනි. බැංකුව වෙත ෆිච් රේටිං ලංකා සමාගම මගින් AA (stable) උත්ශ්‍රේණිගත කරනු ලැබීය. බැංකුවේ මුළු වත්කම්, මුළු තැන්පතු සහ මුළු ණය හා ලැබිය යුතු දෑ පිළිවෙලින්, රුපියල් බිලියන 663, රුපියල් බිලියන 539 සහ රුපියල් බිලියන 478 වශයෙන් වාර්තා විය. වාර්තාගත ඉහළම බදු පෙර ලාභය වන රුපියල් බිලියන 15.3 සහ බදු වලට පසු ලාභය වන රුපියල් බිලියන 10.2 අත්පත් කර ගැනුනි. 2011 SLIM වෙළඳ නාම විශිෂ්ටතා සම්මාන උළෙලේදී මහජන බැංකුව, ශ්‍රී ලංකා බැංකුකරණ හා මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ ජනප්‍රියතම බැංකුව සඳහා වන SLIM-Nielsen ජනතා සම්මානයද, වසරේ සේවා වෙළඳ නාමය සඳහා වන SLIM-Nielsen ජනතා සම්මානයද, සේවා කාණ්ඩය සඳහා වන ලෝකඩ සම්මානයද දිනා ගත්තේය.

## 2012

දිවයිනේ සියළුම ප්‍රදේශයන් පාහේ ආවරනය කරමින් ශාඛා ජාලය 728 දක්වාද, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 420 දක්වාද ඉහළ නැංවිනි. බැංකුව වෙත ෆිච් රේටිං ලංකා සමාගමෙන් අධිශ්‍රේණිගත AA + (stable) ශ්‍රේණිය පිරිනැමිනි. බැංකුවේ මුළු වත්කම්, මුළු තැන්පතු සහ මුළු ණය හා ලැබිය යුතු දෑ පිළිවෙලින්, රුපියල් බිලියන 873, රුපියල් බිලියන 683 සහ රුපියල් බිලියන 660 වශයෙන් වාර්තා වාර්තා විය. ජාත්‍යන්තර ARC සම්මාන උළෙලේදී මහජන බැංකුවේ 2011 වාර්ෂික වාර්තාව ජාතික කාණ්ඩයෙන් විශිෂ්ට සම්මානයකින් සහ ස්වර්ණ සම්මාන තුනකින් පිදුම් ලැබීය.



## 2013

2013 පෙබරවාරි මස බැංකුවේ 17 වැනි සභාපතිවරයා වශයෙන් ගාමිණී සෙනරත් මහතා වැඩ භාර ගත්තේය. දිවයින පුරා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන විසි තුනක් පිහිටුවන ලදී. ජාත්‍යන්තර වශයෙන් වීසා සහතිකලත් වෙළඳ ආයතන මිලියන 30 කට අධික සංඛ්‍යාවක් වෙත පිවිසුමක් ලබාදෙමින්, කාඩ්පත් මිලියනයක සන්ධිස්ථානය මෙම වසර තුළ අභිබවා යාමට බැංකුව සමත් විය. සංස්ථාපිත ගනුදෙනුකරුවන් සඳහා සේවක අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල් සහ රේගු බදු ගෙවීම් සඳහා අන්තර්ජාලගත තථ්‍ය කාල ගෙවීමේ පහසුකමක් සපයන ලදී. මහජන බැංකුව, ජාතික ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ස්විචය හා සම්බන්ධ වූ පළමු බැංකුව වශයෙන් ඉතිහාසයට එක් විය. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පරිශ්‍රයන් 460 දක්වා ඉහළ නැංවුනු අතර, ශාඛා ජාලය 735 දක්වා ව්‍යාප්ත කෙරිණි. බැංකුවේ මෙම වසරේදී සිව් වන ණයකර නිකුතුවේදී රුපියල් බිලියන 5 ක වටිනාකමින් යුතු ණයකර නිකුත් කරන ලදී.

## 2014

2014 දී ක්ෂේත්‍රයේ දෙවන විශාලතම බැංකුව වශයෙන්, මහජන බැංකුව රුපියල් ට්‍රිලියනයක වත්කම් පදනම අභිබවා යාමට සමත් විය. යුරෝපීය ගෝලීය බැංකුකරණ හා මූල්‍ය සම්මාන - ශ්‍රී ලංකාව 2014 ප්‍රදානය කල "2014 වසරේ බැංකුව" වශයෙන්ද, 2014 ලෝක මූල්‍ය බැංකුකරණ සම්මාන උළෙලේදී "ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම බැංකුකරණ සමූහය" වශයෙන් හා "ශ්‍රී ලංකාවේ වඩාත්ම තිරසාර බැංකුව" වශයෙන්ද සම්මාන ත්‍රිත්වයක් දිනාග ැනීමට මහජන බැංකුව සමත් විය.

## 2015

ස්වකීය ගනුදෙනුකරුවන්ගේ වටිනාකම ඉහළ නැංවීම, මෙහෙයුම් කාර්යක්ෂමතා උත්පාදනය සහ අවදනාම් කළමනාකරණ හැකියාවන් සවිබල ගැන්වීම අරමුණු කරගනිමින් බැංකුව මහත් අපේක්ෂා සහගත අයුරින් සිය ඩිජිටල්කරණ ව්‍යාපෘතිය ඇරඹීය. ඒ අනුව, බැංකුව මගින් ගනුදෙනුකරුවන් වෙත වැඩි සුරක්ෂිතතාවක් සහ විශ්වසනීය බවක් ලබාදීම උදෙසා ස්වකීය ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලය ව්‍යවසාය සවිබලකරණ දෘඩාංග පදනමක් වෙත උසස් කෙරිණි. ප්‍රමුඛ බැංකුකරණ පද්ධතිය, දත්ත ගබඩා කිරිමේ ධාරිතාවයන් සහ POS යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ආයෝජන සිදු කෙරිණි.

ස්වකීය තිරසාරත්ව කැපවීම විදහා දක්වමින් බැංකුව මගින් හරිත බැංකුකරණ සංකල්පය හඳුන්වාදෙන ලදී. වෙළඳපොල තත්ත්වය සවිමත් කිරීම සහ සිය පාර්ශ්වකරුවන් වෙත දිගු කාලීන වටිනාකම් ලබාදීම අරමුණු කරගත් බැංකුවේ 2016 - 2020 සඳහා වන ක්‍රමෝපායික සැලසුම වෙත සාර්ථකව පිවිසීම ද මෙම වසරේ සිදු විය.

## 2016

එක් වසරක් තුළ ට්‍රිලියන ද්විත්වයක් අත්පත් කරගැනීම් සිදුකල එකම මූල්‍ය සමූහය බවට පත් වෙමින්, මහජන බැංකු සමූහය වසර තුළදී තැන්පතු සහ අත්තිකාරම් යන අංශ දෙකෙන්ම රුපියල් ට්‍රිලියනයේ සන්ධිස්ථානය පසු කිරීමට සමත් විය. බැංකුව අඛණ්ඩව තෙවන වසරේදීද, ලෝක මූල්‍ය බැංකුකරණ සම්මාන උළෙලේදී "ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම බැංකුකරණ සමූහය" වශයෙන් හා "ශ්‍රී ලංකාවේ වඩාත්ම තිරසාර බැංකුව" වශයෙන්ද සම්මානයට

පාත්‍ර විය. එය ආසියාවේ 387 වැනි විශාලතම බැංකුව වශයෙන්ද තෝරා ගන්නා ලදී. ස්වකීය ඩිජිටල්කරණ ව්‍යාපෘතියට සමගාමීව, බැංකුව මගින් පහසු මූල්‍ය විසඳුම් සහ අවරහිරතා වලින් තොර බැංකුකරණ සේවාවන් සඳහා වන ඉහළ යන ගනුදෙනුකාර ඉල්ලුම මැනවින් සපුරාලමින්, කොළඹ නගරයේ ස්ථාන හතකදී මුදල් තැන්පතු යන්ත්‍ර, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර වලින් සමන්විත 'කියොස්ක්"ස්වයං සේවා මධ්‍යස්ථාන විවෘත කරන ලදී. නව ජාත්‍යන්තර ප්‍රවණතාවන් හා සමගාමීව ගනුදෙනුකරුවන්ගේ ශීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතින්නා වූ අපේක්ෂාවන් වෙත සේවා සැලසීම සංකේතවත් කරමින් බැංකුව මගින් නව ලාංඡනයක් එළිදක්වන ලදී.

# 2017

පසුගිය වසර 10 කාලය මුළුල්ලේ බදු, විශේෂ බදු සහ ලාභාංශ ගෙවීම් වශයෙන් ජාතික ආර්ථික සංවර්ධනය වෙත දක්වන ලද ඒකාබද්ධ දායකත්වය රුපියල් බිලියන 150 ඉක්මවා ගියේය. එයට අමතරව, පසුගිය වසර අට ඇතුළත පළමු වරට බැංකුව වෙත රුපියල් බිලියන 5 ක නව ප්‍රාග්ධන යෙදවුමක් හිමි විය.

කොළඹදී ප්‍රථම පූර්ණ ඩිජිටල්කරණය කරන ලද ශාඛාව විවෘත කරමින්ද, තොරතුරු සුරක්ෂිතතා කළමනාකරණය උදෙසා ISO/IEC 27001:2013 තත්ත්ව සහතිකය හිමිකර ගනිමින්ද, බැංකුව ඩිජිටල් සහ තොරතුරු තාක්ෂණ අංශයෙන් ප්‍රථම ජයග්‍රහන රැසක් වාර්තා කලේය. මෙය තොරතුරු ආරක්ෂණය සහ සුරක්ෂිතතාව වෙනුවෙන් පිදෙන ලොව ඉහළම සහතිකත්වය වන අතර, ශ්‍රී ලංකාවේ රාජ්‍ය බැංකුවක් මෙම සහතිකයෙන් පිදුම් ලද පළමු අවස්ථාවද මෙය වේ.

බැංකුව වෙත ආසියානු බෑන්කර් සඟරාව වෙතින් ආසියාවේ 400 වන විශාලතම බැංකුව යන ශ්‍රේණිගත කිරීමද, බෑන්කර් සඟරාව (එක්සත් රාජධානිය) මගින් ලොව විශිෂ්ටතම බැංකු 1000 අතරට ශ්‍රේණිගත කිරීමද හිමි විය. දේශීය වශයෙන්, බැංකුව ශ්‍රී ලංකා ව්‍යාපාර විශිෂ්ටතා සම්මාන උළෙලේදී "2017 දේශයේ විශිෂ්ටතම බැංකුව" වශයෙන්ද, ලෝක වෙළඳ නාම උපදේශන ඒජන්සිය - ඉන්ටර් බ්‍රෑන්ඩ් වෙතින් ශ්‍රී ලංකාවේ දෙවන වඩාත්ම වටිනාකමින් යුතු වෙළඳ නාමය වශයෙන්ද ඇගයීමට පාත්‍ර විය. අඛණ්ඩ 11 වැනි වසරේදීත්, 2017 SLIM-Nielson සම්මාන උළෙලේදී විශේෂිත "වසරේ ජනතා සේවා වෙළඳ නාමය" වශයෙන් හා "වසරේ ජනතා බැංකුකරණ සේවා සම්පාදක" සම්මානයෙන්ද මහජන බැංකුව පිදුම් ලැබීය.

# 2018

මෑත කාලයේදී ශ්‍රී ලංකාවේ ලැයිස්තුගත සමාගමක් සම්බන්ධ විශාලතම කේවල ගනුදෙනුව වශයෙන් වාර්තා වූ, සිංගර් ශ්‍රී ලංකා අත්පත් කරගැනීමට හේලීස් සමාගම වෙත රුපියල් බිලියන 10.9 ක හවුල්කාර ණය පහසුකමක් ප්‍රදානය කරන ලදී.

ඩිජිටල් වපසරිය තුළ බැංකුවේ ප්‍රමුඛත්වය තවදුරටත් සවිමත් කරමින්, ගනුදෙනුකරුවන්ගේ පහසුව උදෙසා 2018 දී විකල්ප ඩිජිටල් චැනල හයක් හඳුන්වාදෙන ලදී. ඒවා නම් වශයෙන්, පීපල්ස් වේව් (People's Wave) මොබයිල් බෑන්කින් ඇප්, පීපල්ස් වෙබ් (People's Web) ඉන්ටර්නෙට් බෑන්කින් පෝටල්, පීපල්ස් විස් (People's Wiz) එක්ස්ප්‍රස් බෑන්කින්, පීපල්ස් වින් (People's Wyn) ඉන්ටර්නෙට් බෑන්කින් සහ මොබයිල් ඇප්ල RLOS රීටේල් ලෝන් ඔරිජිනේටින් සිස්ටම් සහ CLOS කෝර්පරේට් ලෝන් ඔරිජිනේටින් සිස්ටම් වේ. මෙරට පවතින මූල්‍ය ඇප් බොහොමයක් අතුරින්, පීපල්ස් වේව් වැඩිම ඩවුන්ලෝඩ් කිරීමකට ලක් වූ ඇප් එක බවට පත්වූ අතරල Google play හි 4.7ක ශ්‍රේණිගත කිරීමක් ඇති එය මේ වන විට දිවයින පුරා ගනුදෙනුකරුවන් 300,000 ට අධික පිරිසක් භාවිත කරති.

අඛණ්ඩව 12 වන වරටත් බැංකුවට "වසරේ ජනතාවගේ බැංකු සේවා සැපයුම්කරු" සම්මානය හිමි විය. තවද 2018 ලංකාපේ ටෙක්නොවේෂන් සම්මාන උළෙලේදී, බැංකුව "පාරිභෝගික සේවා විශිෂ්ටත්වය වෙනුවෙන් වසරේ බැංකුව" වශයෙන් ප්‍රමුඛස්ථානය හිමිකර ගැනීමට සමත් විය. එයට අමතරව 2018 ජාතික ව්‍යාපාර විශිෂ්ටතා සම්මාන උළෙලේදී බැංකුව "දේශීය වෙළඳපොල ව්‍යාප්ති විශිෂ්ටත්ව" සම්මානයෙන් පිදුම් ලැබීය.

ජාත්‍යන්තර මට්ටමින් බැංකුව නැවත වරක් එක්සත් රාජධානියේ බෑන්කර් සඟරාව මගින් ලොව විශිෂ්ටතම බැංකු 1000 අතරට ශ්‍රේණිගත කරන ලද අතර, 2018 යුරෝපා ලෝක බැංකුකරණ හා මූල්‍ය සම්මාන උළෙලේදී "ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම බැංකුව" වශයෙන්ද සම්මානයට පාත්‍ර විය. තවද, ඩිජිටල්කරණ විශිෂ්ටත්වය කෙරෙහි වන අපගේ අප්‍රතිහත කැපවීම උදෙසා සාක්ෂි සපයමින්, 2018 ආසියානු බැංකුකරණ ව්‍යාපාර ජයග්‍රහන සම්මාන උළෙලේදී මූල්‍ය තාක්ෂණ නව හඳුන්වාදීම් වෙනුවෙන් ආසියා ශාන්තිකර කළාපයේ "විශිෂ්ටතම ශාඛා ඩිජිටල්කරණ සම්මානය" මහජන බැංකුව වෙත පිරිනැමිනි.




# 2019

මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත 2019 සැප්තැම්බර් මාසයේදී පාර්ලිමේන්තුවේදී සම්මත වූ අතර එමඟින් නියාමන ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා සාපේක්ෂව පහසුවෙන් ණයකර නිකුත් කිරීමට බැංකුවට හැකි වේ. සංශෝධනයෙන් පසුව, බැංකුව සාර්ථකව රුපියල් බිලියන 10.0 ක් බාසල් III, ස්තර II අනුකූලතා ණයකර නිකුත් කළේය.

ස්වයං බැංකු ඒකක (SBUs) පිහිටුවීම පසුගිය වසර දෙක තුළ වේගවත් වූ අතර 2019 අග වන විට 239 දක්වා ළඟා විය - එය හුදෙක් වසර තුනක ජයග්‍රහණයකි. පීපල්ස් වේව් යෙදුම රටේ වෙනත් බොහෝ මූල්‍ය යෙදුම් අභිබවා ගොස් ශ්‍රී ලංකාවේ වැඩිපුරම බාගත කළ මූල්‍ය යෙදුම්වලින් එකක් බවට පත්වී Google Play Store හි ආකර්ෂණීය ශ්‍රේණිගත කිරීමක් ලබා ගත්තේය. ඩිජිටල් වේදිකාවේ බැංකුවේ සාර්ථකත්වය, ඒෂියන් බෑන්කර් සඟරාව සහ ඒෂියා මනී යන දෙකෙන්ම හොඳම ඩිජිටල් බැංකුව 2019 ඇතුළු ජාත්‍යන්තර වශයෙන් ලැබුණු සම්මාන රාශියක් තුළින් සහ 2019 සඳහා ඒෂියන් බෑන්කර් සඟරාව විසින් හොඳම ජංගම බැංකුකරණ යෙදුම ලෙස පිළිගැනීම තුළින් පෙන්නුම් කරයි. 2018 ඒෂියන් බෑන්කර් මූල්‍ය තාක්ෂණ නවෝත්පාදන සම්මාන උළෙලේදී මහජන බැංකුවට හොඳම ඩිජිටල්කරණ ආරම්භක වැඩසටහනට සම්මාන හිමි විය.

තොරතුරු ආරක්ෂණය සහ ආරක්ෂාව සඳහා ඉහළම ජාත්‍යන්තර ප්‍රතීතනය වන - ISO/IEC 27001:2013 සහතිකය ලබාගත් ශ්‍රී ලංකාවේ පළමු සහ එකම බැංකුව ද මහජන බැංකුවයි.

2019 දී ඒෂියන් බෑන්කර් සඟරාව විසින් ශ්‍රී ලංකාවේ හොඳම පුද්ගල කේන්ද්‍රීය බැංකුව සහ ආසියා පැසිෆික්, මැදපෙරදිග සහ අප්‍රිකාවේ වඩාත්ම දියුණු පුද්ගල කේන්ද්‍රීය බැංකුව ලෙස බැංකුව පිළිගෙන තිබේ. ආසියානු සංවර්ධන බැංකුව සිය වෙළඳ මූල්‍ය මෙහෙයුම් සඳහා මහජන බැංකුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ හවුල්කාර බැංකුව ලෙස පිළිගෙන තිබේ.

විදේශීය බැංකුවලින් අරමුදල් රැස්කිරීමේ මිණුම් දණ්ඩක් තබමින් මහජන බැංකුව මේ දක්වා ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවක් විසින් ලබාගෙන ඇති විශාලතම හා දීර්ඝතම ද්වීපාර්ශ්වික අරමුදල් පහසුකමට අත්සන් තැබීය. මෙය අපගේ ජාතියේ සංකීර්ණ හා ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘති සඳහා මුදල් සැපයීම සම්බන්ධව බැංකුව කෙරෙහි ඇති ගෝලීය පිළිගැනීම සහ විශ්වාසය, බැංකුවේ පාලන ව්‍යුහය, විශේෂඥතාව සහ අපක්ෂපාතී බව පිළිබඳ පැහැදිලි පිළිබිඹුවකි.

# විශේෂ තොරතුරු

GRI 102-7

| | බැංකුව | | | සමූහය | | |
|---|---|---|---|---|---|---|
| | 2019 | 2018 | වෙනස % | 2019 | 2018 | වෙනස % |
| **මෙහෙයුම් කාර්ය සාධනය (රු. බිලියන)** | | | | | | |
| පොලී ආදායම | 184.0 | 166.4 | 10.6 | 217.2 | 195.6 | 11.1 |
| ශුද්ධ පොලී ආදායම | 58.5 | 55.4 | 5.6 | 75.9 | 71.2 | 6.7 |
| දළ ආදායම | 197.0 | 181.3 | 8.7 | 235.5 | 214.7 | 9.7 |
| එකතු කළ අගය මත බදු සහ ආදායම් බදු වලට පෙර මෙහෙයුම් ලාභය | 28.6 | 32.0 | -10.6 | 37.2 | 40.6 | -8.5 |
| බදු පෙර ලාභය | 19.7 | 24.4 | -19.4 | 25.7 | 31.2 | -17.7 |
| බදු | 6.7 | 7.3 | -7.8 | 9.5 | 9.7 | -2.0 |
| බදුවලට පසු ලාභය | 12.9 | 17.1 | -24.4 | 16.2 | 21.5 | -24.7 |
| ශ්‍රී ලංකා රජය වෙත ගෙවූ ලාභාංශ | 2.4 | 3.4 | -29.2 | 2.4 | 3.4 | -29.2 |
| රඳවා ගත් ලාභය | 10.5 | 13.7 | -23.2 | 13.8 | 18.1 | -23.9 |
| **මූල්‍ය තත්ත්වය (රු. බිලියන)** | | | | | | |
| මුළු වත්කම් | 1,873.4 | 1,734.7 | 8.0 | 2,049.8 | 1,908.5 | 7.4 |
| දළ ණය සහ ලැබිය යුතු දේ | 1,383.8 | 1,334.4 | 3.7 | 1,541.0 | 1,489.9 | 3.4 |
| මුළු තැන්පතු | 1,491.4 | 1,423.0 | 4.8 | 1,588.9 | 1,495.3 | 6.3 |
| කොටස් හිමියන්ගේ අරමුදල් | 95.0 | 91.2 | 4.1 | 130.0 | 123.5 | 5.3 |
| **කාර්ය සාධන අනුපාත (%)** | | | | | | |
| සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ (බදුවලට පෙර) | 1.1 | 1.5 | | 1.3 | 1.8 | |
| ස්කන්ධය මත ප්‍රතිලාභ | 13.9 | 20.3 | | 12.8 | 18.7 | |
| පිරිවැය/ආදායම් අනුපාතය | 64.2 | 61.3 | | 63.1 | 60.7 | |
| අක්‍රිය ණය අනුපාතය | 3.3 | 2.5 | | 3.7 | 2.7 | |
| ණය ආවරණ අනුපාතය | 60.0 | 72.3 | | 62.0 | 71.6 | |
| ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා අනුපාතය – දේශීය බැංකු ඒකකය | 29.5 | 23.0 | | | | |
| – අක්වෙරල බැංකු ඒකකය | 34.6 | 30.4 | | | | |
| ණය/තැන්පතු අනුපාතය | 92.8 | 93.8 | | 97.0 | 99.6 | |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය – ස්තරය 1 | 10.7 | 11.0 | | 11.6 | 11.7 | |
| – සමස්ථ | 14.7 | 14.5 | | 14.9 | 14.5 | |
| **කොටස් හිමිකාර අනුපාත (රු.)** | | | | | | |
| කොටසක ඉපැයුම | 12,926 | 17,095 | | 14,985 | 19,978 | |
| කොටසක ශුද්ධ වත්කම් වටිනාකම | 94,964 | 91,210 | | 130,016 | 123,513 | |

## පාරිභෝගික වටිනාකම

**එක් වූ නව ගනුදෙනුකරුවන් සංඛ්‍යාව**

| 2019 | 2018 | වෙනස (%) |
|---|---|---|
| 667,349 | 659,118 | 1.2 |

**ගෙවූ පොලී (රු. බිලියන)**

| 2019 | 2018 | වෙනස (%) |
|---|---|---|
| 125.5 | 111.0 | 13.0 |

**අන්තර්ජාල සහ ජංගම බැංකු ගනුදෙනුකරුවන් සංඛ්‍යාව**

| 2019 | 2018 | වෙනස (%) |
|---|---|---|
| 381,573 | 194,280 | 96.4 |

**බස්නාහිර පළාතෙන් පිටත ස්වයං බැංකුකරණ ඒකක**

| 2019 | 2018 | වෙනස (%) |
|---|---|---|
| 154 | 136 | 13.2 |

## සේවක වටිනාකම

**රඳවා ගැනීමේ අනුපාතය (%)**

| 2019 | 2018 | වෙනස (%) |
|---|---|---|
| 96.5 | 95.5 | 1.0 |

**බස්නාහිර පළාතෙන් පිටත සේවකයන්**

| 2019 | 2018 | වෙනස (%) |
|---|---|---|
| 4,716 | 4,903 | (3.8) |

**වසර 10කට වඩා වැඩි සේවා කාලයක් ඇති සේවකයන්**

| 2019 | 2018 | වෙනස (%) |
|---|---|---|
| 3,131 | 3,369 | (7.1) |

**කාන්තා සේවකයින්**

| 2019 | 2018 | වෙනස (%) |
|---|---|---|
| 4,778 | 4,909 | (2.7) |

## ව්‍යාපාර හවුල්කරුවන්

**ඇති කර ගත් නව සැපයුම්කරුවන් ගණන**

| 2019 | 2018 | වෙනස (%) |
|---|---|---|
| 58 | 128 | (54.7) |

## ජාතික දායකත්වය

**රජයට ගෙවූ බදු (රු. මිලියන)**

| 2019 | 2018 | වෙනස (%) |
|---|---|---|
| 17,397 | 16,395 | 6.1 |

**රජයට ගෙවූ ලාභාංශ (රු. මිලියන)**

| 2019 | 2018 | Change (%) |
|---|---|---|
| 2,420 | 3,420 | (29.2) |

## ප්‍රජාව

**ආයතනික සමාජ වගකීමේ ආයෝජන (රු. '000)**

| 2019 | 2018 | වෙනස (%) |
|---|---|---|
| 35,683 | 42,288 | (15.6) |

**ප්‍රජා පාදක ණය (රු. මිලියන)**

| 2019 | 2018 | වෙනස (%) |
|---|---|---|
| 71,927 | 42,511 | 69.2 |

## පරිසරය

**පුනර්ජනනීය බලශක්ති පරිභෝජනය (GJ )**

| 2019 | 2018 | වෙනස (%) |
|---|---|---|
| 6,499 | 6,787 | (4.2) |

**එක් සේවකයෙකු සඳහා බලශක්ති තීව්‍රතාව : ප්‍රධාන කාර්යාලය**

| 2019 | 2018 | වෙනස (%) |
|---|---|---|
| 12.7 | 12.5 | 1.6 |

**ප්‍රතිචක්‍රීකරණය කළ අපද්‍රව්‍ය කඩදාසි (KG)**

| 2019 | 2018 | වෙනස (%) |
|---|---|---|
| 36,117 | 18,207 | 98.4 |

# සභාපතිවරයාගේ පණිවිඩය



"පශ්චාත් COVID-19 යුගයක ඉදිරියේ ඇති අභියෝග පිළිබඳව පූර්ණ අවබෝධයෙන් සිටිමින් අපි අනාගතය දෙස යම් තරමක බලාපොරොත්තුවකින් හා ශුභවාදීව බලා සිටිමු. අපගේ අවධානය යොමු වී ඇත්තේ ව්‍යුහාත්මක පිරිවැය අඩු කරමින් බැංකුවේ සමස්ත ප්‍රතිරෝධය ශක්තිමත් කරමින් ඉහළ පාරිභෝගික අත්දැකීමක් ලබා දීම සඳහා අපගේ ඩිජිටල් ආයෝජන ඇතුළු අසමසම හැකියාවන් ප්‍රශස්ත කිරීමයි".

**සුජීව රාජපක්ෂ**
සභාපති

GRI 102-14

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, 2019 වර්ෂය සඳහා මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

## ශක්තිමත් කිරීම පිළිබඳ වසරක්

2019 වර්ෂය මහජන බැංකුව ශක්තිමත් කිරීමේ වසරක් වූ අතර දිගු කාලීනව තිරසාර වර්ධනයක් සඳහා බැංකුව ස්ථානගත කිරීම සඳහා වැදගත් පියවර ගන්නා ලදී. වර්ෂය තුළ අපගේ උත්සාහයන් වූයේ අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවය සඳහා වන ආයෝජන තුළින් ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම, ප්‍රාග්ධන පදනම වර්ධනය කිරීම සහ වෙනස් කළ පාරිභෝගික අත්දැකීමක්, කාර්යක්ෂමතාවයක් සහ ගුණාත්මක ඉපැයීම් වර්ධනයක් ලබා දීම සඳහා ඩිජිටල්කරණයේ අපගේ ආයෝජන ප්‍රාග්ධනීත කිරීමයි. මහජන බැංකු පනතට අදාළ සංශෝධන අවසන් කර ඇති අතර එමඟින් බැංකුවට සිය නියාමන ප්‍රාග්ධනය සාපේක්ෂව පහසුවෙන් වර්ධනය කර ගැනීමටත්, සම අවස්ථා තුළ ක්‍රියාත්මක වීමටත් හැකි විය. දිගු කාලීනව තිරසාර වර්ධනයක් සඳහා බැංකුව ස්ථානගත කර ඇති අතර, විශේෂයෙන් රාජ්‍ය නොවන අංශයේ ණය වර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීමට මෙම වේගය ඉවහල් වී තිබේ.

## තිරසාර බැංකුවක් ගොඩනැගීම

2020 වන විට ශ්‍රී ලංකාවේ වඩාත්ම ඩිජිටල්කරණය වූ හා තාක්ෂණිකව දියුණු බැංකුව බවට පරිවර්තනය කිරීම සඳහා මීට වසර තුනකට පෙර ආරම්භ කළ අපගේ ඩිජිටල්කරණ උපායමාර්ගයෙහි අප විශිෂ්ට ප්‍රගතියක් ලබා ඇත. ලෝකයේ කීර්තිමත් මූල්‍ය ආයතන කිහිපයක් සමඟ අපව සමපාත කරමින්, දිනාගත් බොහෝ පිළිගැනීම් අපගේ අභිලාෂිත ඩිජිටල් පරිවර්තන සැලැස්ම අනුමත කරන අතරම, එය අපගේ දැක්ම යුක්ති සහගත බවත්, අරමුණු හා ඉලක්ක වෙත අප ළඟා වීම කාලෝචිත බවත් අවධාරණය කරයි. කෙටි කාලීන කාල සීමාවක් තුළ ශ්‍රී ලංකාවේ විශාලතම ස්වයං බැංකු ජාලය දියත් කිරීම සහ ඩිජිටල්කරණයේ නව පියවරන් රැසක් ගැනීම හරහා ඉහළ ජාලයක් සහිත ලෝකයක අපගේ ගනුදෙනුකරුවන් ගෝලීය පුරවැසියන් බවට පත් කිරීම සඳහා විවිධ ජන කොටස් වල අපේක්ෂාවන් සපුරාලීමට අපව ස්ථානගත කර තිබේ. ව්‍යුහාත්මක පිරිවැය අඩු කරන අතරම වඩා හොඳ පාරිභෝගික අත්දැකීම් ලබා දීම සඳහා අපගේ ඩිජිටල් ආයෝජන සහ හැකියාවන් ප්‍රශස්ත කිරීම අපගේ අවධානයයි. එමෙන්ම දිගු කාලීනව අපගේ පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ වැඩිදියුණු කිරීම සඳහා බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමටත් අපගේ අවධානය යොමුව ඇත.

අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ පළපුරුදු කළමනාකරණ කණ්ඩායම අවධානය යොමු කර ඇත්තේ විශිෂ්ට නිෂ්පාදන නවෝත්පාදනය කරමින් සහ සැමවිටම කැපීපෙනෙන පාරිභෝගික අත්දැකීම් ලබා දීම තුළින් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය සේවා සැපයුම්කරු ලෙස මහජන බැංකුව සිටින බව සහතික කිරීම සඳහායි.අපගේ ගනුදෙනුකරුවන්ට වඩාත්ම වැදගත් වන ක්ෂේත්‍ර කෙරෙහි මෙම අවධානය යොමු වී ඇති අතර, එය අපගේ බැංකුව පැහැදිලි වෙළඳපල ප්‍රමුඛයෙකු බවට පත් කරන අතර හොඳම බැංකු අත්දැකීම් අවශ්‍ය පුද්ගලයින් සඳහා තෝරා ගැනීමකි.

## අභියෝගාත්මක මෙහෙයුම් පරිසරයක් ආරම්භ කිරීම

අපගේ පාලනයෙන් ඔබ්බට ගිය ආර්ථික, සමාජීය හා පාරිසරික පීඩනයන්ගෙන් යුතු වූ සාර්ව ආර්ථික වටපිටාව අභියෝගාත්මක වූ අතර එය සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. පාස්කු ඉරිදා ත්‍රස්ත ප්‍රහාරයේ අහිතකර ප්‍රතිවිපාක හේතුවෙන් තත්ත්වය තවදුරටත් උග්‍ර වූයේ ආර්ථික ක්‍රියාකාරකම්වල සෑම අංශයකම පාහේ දැඩි ප්‍රතිවිපාක ඇති කරමිනි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විශේෂයෙන් කෘෂිකාර්මික හා කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම්වල උපපාර්ශ්වීය වර්ධනයත් සමඟ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් අඩු විය.

එවැනි පසුබිමක් තුළ වියදම් පාලනය කර ගනිමින් අනාගත ප්‍රතිඵල ජනනය කරන තාක්ෂණ හා වැඩසටහන් සඳහා විශාල වශයෙන් ආයෝජනය කිරීම සඳහා සියුම් සමබරතාවක් අවශ්‍ය වේ. අපි එම සමබරතාව 2019 දී ප්‍රශංසනීය ලෙස අත්කර ගත් අතර අනාගතය සඳහා බැංකුව ස්ථානගත කිරීම සඳහා වන ප්‍රධාන ආයෝජන සිදුකරන ලදී. අනුවර්තනය වීමට හා නව්‍යකරණය කිරීමට අපගේ ඔප්පු කළ හැකියාව කෙරෙහි අවධානය යොමු කරමින්, අපි දුෂ්කර මෙහෙයුම් පරිසරය තුළ සාර්ථකව සැරිසැරුවෙමු. දශක හයකට ආසන්න කාලයක් තිස්සේ ගොඩනගා ඇති සාර්ථකත්වය අපගේ මූලික ව්‍යාපාරික ක්‍රියාශීලී බව සනාථ කරන අතර අත්දැකීම් සහ අපගේ අවබෝධය මගින් අභියෝග කළමනාකරණය කිරීමට සහ වෙනස් කිරීමට, එය මෙහෙයවීමට හා හැඩගැස්වීමට සහ අපගේ පාර්ශ්වකරුවන්ට ද එලෙසම කිරීමට ද උපකාර කිරීමට හැකි වී තිබේ. තවත් බොහෝ දේ කළ යුතු යැයි අප විශ්වාස කරන බැවින් අපගේ සාර්ථකත්වයන් ගැන අපි තෘප්තිමත් නොවෙමු. අපගේ අවධානය යොමු වන්නේ ඉදිරියට යාමේදී සාර්ථකත්වයේ සීමාවන්ට දැනුවත්ව හා ඉතා උනන්දුවෙන් අභියෝග කිරීමට ය.

COVID-19 ව්‍යාප්ත වීම නිසා ලොව පුරා පෙර නොවූ විරූ වෛද්‍ය, ආර්ථික හා මානව අභියෝගයන් ඉදිරිපත් වී ජීවිත, ජීවනෝපායන්, ප්‍රජාවන් සහ ව්‍යාපාර සඳහා බාධා ඇති වී ඇත. පශ්චාත් COVID-19 යුගයක ඉදිරියේ ඇති අභියෝග පිළිබඳව දැනුවත්ව, අපි අනාගතය දෙස බලන්නේ සුභවාදී බලාපොරොත්තුවෙනි. වසර 60 කට ආසන්න කාලයක් තිස්සේ අප විසින් ගොඩනගා ඇති විශේෂඥතාව, අපගේ ඩිජිටල් ආයෝජන, ශක්තිමත් ප්‍රාග්ධන පදනම සහ දූරදර්ශී පිරිවැය කළමනාකරණය අපගේ බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කර තිබේ.

ඉදිරියට යන විට, සමනය වන උද්ධමනකාරී වාතාවරණයක්, අඩු ණය අනුපාතිකයන් සහ ආයෝජකයින්ගේ ස්වභාවය වැඩිදියුණු වීම තුළින් ආර්ථිකය වර්තමාන මට්ටමෙන් යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## කාර්ය සාධනයේ පැතිකඩ

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා බැංකුව ඒකාබද්ධ පදනමක් මත සමස්ත ආදායමෙහි 9.7% ක සාමාන්‍ය වර්ධනයක් පෙන්වූ අතර, බදු ගෙවීමට පෙර ලාභය රුපියල් බිලියන 25.7 ක් වූ අතර, එය පසුගිය වසර සමග සසඳන කල 17.7% ක අඩුවීමක් පෙන්නුම් කරයි. මෙයට අනෙකුත් හේතු අතර, කර්මාන්තය පුරා අත්විඳින ලද වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීමේ ප්‍රවණතාව පිළිබිඹු කරන, සමනය කරන ලද සාර්ව ආර්ථික තත්වයන්, ශුද්ධ පොලී ආන්තිකයන් අඩුවීම සහ, විශේෂයෙන් ම, හානිකර වෙන්කිරීමේ වැඩි වීම හේතු විය.

ගනුදෙනුකරුවන්ගේ ණය පැහැර හැරීම් සඳහා වන පීඩනය වැඩිවීමත් සමඟ කර්මාන්ත අක්‍රිය ණය අනුපාතය 2018 දී 3.4% සිට 2019 දී 4.7% දක්වා ඉහළ ගියේය. කර්මාන්තය පුරා ඉහළ යාමක් තිබියදීත්, අපි අපගේ අක්‍රිය ණය අනුපාතය 3.31% මට්ටමේ කර්මාන්ත සාමාන්‍යයට වඩා පහළින් පවත්වා ගෙන ගියෙමු. බැංකු ක්ෂේත්‍රයේ 5.6% ක වර්ධනයකට සාපේක්ෂව, 2019 දෙසැම්බර් 31 වන විට 3.1% ක වර්ධනයක් අප වාර්තා කර ඇති අතර ඉන් වැඩි ප්‍රමාණයක් රාජ්‍ය අංශයෙනි. ඒකාබද්ධ ශේෂ පත්‍රය 7.4% කින් පුළුල් වී රුපියල් බිලියන 2,049.8 කරා ළඟා විය. කොටස් හිමියන්ගේ අරමුදල් පසුගිය වසර හා සසඳන කල 5.1% කින් ඉහළ ගොස් රුපියල් බිලියන 119.2 කරා ළඟා විය.

ආර්ථික පසුබෑමක්, අඩු ආයෝජන සහ අස්ථාවර පොලී අනුපාත පරිසරයක් ඇතුළත් සාමාන්‍ය තත්ත්වයන්ගෙන් බැහැර අභියෝගාත්මක පරිසරයක් තුළ මෙම සංඛ්‍යා ප්‍රශංසනීය ය.

## වටිනාකම් බෙදා හැරීම

අපගේ සියලු ප්‍රධාන පාර්ශ්වකරුවන්ට වටිනාකම බෙදා දීම අපගේ සාරධර්ම හා අපගේ සාර්ථකත්වයට අත්‍යවශ්‍ය වේ. අපගේ කර්මාන්ත නායකත්වය, පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය සහ ප්‍රජා ආයෝජන ක්‍රියාකාරකම් තුළින් අපි දිගටම ආර්ථික වශයෙන් ශක්‍ය, සමාජීය වශයෙන් වගවිය යුතු සහ පාරිසරික වශයෙන් වගකිව යුතු වෙමු.

> අපගේ සේවක ප්‍රජාව අපගේ කැපවීමේ වැදගත්ම සාධකය වන අතර ඔවුන්ගේ අධිෂ්ඨානය හා කැපවීම මහජන බැංකුවට සාර්ථකව මූල්‍ය, සමාජ හා පාරිසරික සාධක කළමනාකරණය කිරීමට ඇති හැකියාව පිටුපස ඇත.

ප්‍රාදේශීය ප්‍රජාවන්හි අපගේ ජනතාව සඳහා කුසලතා සහ අර්ථවත් රැකියා අවස්ථා වැඩි දියුණු කරමින් සියලු දෙනාගේම සමෘද්ධිය සඳහා දායක වීමට අපි සෑම සාධාරණ උත්සාහයක්ම ගෙන ඇත්තෙමු. අපගේ සාර්ථකත්වයේ ප්‍රධාන ක්‍රියාකාරීන් වන අපගේ සේවක කණ්ඩායම සවිබලගැන්වීම සඳහා අපි දිගටම ආයෝජනය කළෙමු.

අපගේ ණය දීමේ සහ ආයෝජන ප්‍රතිපත්තියේ පාරිසරික බලපෑම් තක්සේරු කිරීමෙන් සහ අපගේ මෙහෙයුම් සඳහා තිරසාර බව ඒකාබද්ධ කිරීමෙන්, දේශගුණික විපර්යාසයන්ට පිළියම් යෙදීමට සහ අපගේ කාබන් විමෝචනය අඩු කිරීමට අපි දායක වෙමු. කැපී පෙනෙන පාරිභෝගික අත්දැකීමක් ලබා දීම සඳහාත් පාරිභෝගික පහසුව වැඩි දියුණු කිරීම සහ ඔවුන්ගේ විකාශනය වන මූල්‍ය අවශ්‍යතා කඩිනමින් සපුරාලීම සඳහාත් වසර තුළ බොහෝ මුල පිරීම් සිදු කරන ලදී. ඩිජිටල්කරණයේ අපගේ ආයෝජන තුළින් අප පාරිභෝගික අත්දැකීම් වඩාත් බුද්ධිමත් හා ගනුදෙනුකරුටම විශේෂී වූ බවට පත්කර ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ රාජ්‍ය බැංකුව වශයෙන්, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රධාන මූල්‍යකරුවෙකු ලෙස සහ රාජ්‍ය හා රජය සතු ව්‍යවසායන් සඳහා ප්‍රධාන ණය දෙන්නෙකු ලෙස අපි ජාතික සංවර්ධනයට අඛණ්ඩව සහාය දැක්වුවෙමු. බදු සහ ලාභාංශ වශයෙන් සමස්ත ඒකාබද්ධ දායකත්වය රුපියල් බිලියන 25.1 ක් විය. සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සමූහයේ දායකත්වය පසුගිය වසර දහය තුළ දී රුපියල් බිලියන 181.7 ක් විය.

## කීර්තිමත් බැංකුවක්

බැංකුවේ සාර්ථකත්වයට පාදක වන්නේ ඵලදායී ආයතනික පාලනයක් සඳහා ඔබේ අධ්‍යක්ෂ මණ්ඩලය දක්වන කැපවීමයි. අඛණ්ඩ, ක්‍රියාකාරී අධීක්ෂණය, විනිවිදභාවය සහ වගවීම තුළින් අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සමතුලිත කිරීම හා ආරක්ෂා කිරීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු. සදාචාරාත්මකව ක්‍රියා කිරීම, අවංකව ක්‍රියා කිරීම සහ අපගේ අවදානම ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේ ශක්තිමත් සංස්කෘතියක් අප සතුව ඇත. අපගේ ශක්තිමත් පදනම ව්‍යුහයේ ස්වරූපයෙන් ශක්තිමත් කිරීම සහ දැඩි ප්‍රතිපත්ති හා ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීමට අපි දිගටම කටයුතු කරමු. ජාත්‍යන්තර ස්ථාවරයක පාලන පිළිවෙත් වලට අප අනුකූල වන බව සහතික කිරීම සඳහා සෑම සාධාරණ උත්සාහයක්ම ගනු ලැබේ. මේ සඳහා මුදල් අමාත්‍යාංශයෙන් ලැබෙන සහයෝගය දිරිගන්වන සුළුය.

## සාර්ථක අනාගතයක් හැඩගැස්වීම

අනාගතය අභියෝගාත්මකව පැවතුනද, අපගේ සියලු පාර්ශ්වකරුවන්ට වැඩි වටිනාකමක් ලබා දෙමින් සාර්ථක අනාගතයක් හැඩගස්වා ගැනීම සඳහා අපි අභියෝග හරහා ගමන් කිරීමට බලාපොරොත්තු වෙමු. ශ්‍රී ලංකාවේ මූල්‍ය සේවාවන්හි අවිවාදිත වෙළඳපල ප්‍රමුඛයා වීමට අපි කැපවී සිටිමු.

එම දැක්මෙන් පෙළඹවීමක් ලබා ගනිමින්, අපගේ පුළුල් භෞතික හා ඩිජිටල් ජාලය, පාරිභෝගිකයින්ට අදාළ නවෝත්පාදන, ඩිජිටල් හැකියාවන්, අපගේ ශක්තිමත් කුසලතා සංචිතය සහ ශක්තිමත් ශේෂ පත්‍රය සහ ප්‍රාග්ධන තත්ත්වය ස්ථාවර හා තිරසාර ඉපැයීම් වර්ධනයක් ඇති කිරීම සඳහා අපි දිගටම භාවිතා කරන්නෙමු. කර්මාන්තයේ විශාලතම ශාඛා ජාලය සතුව ඇති අපට, එය හරහා පාරිභෝගිකයින්ට ඉතා ඉක්මනින් ළඟා වීමට හැකිය. මෙය අපගේ ඩිජිටල් හැකියාවන් සමඟ සම්බන්ධ වී ඇත. ඉදිරියට යමින්, පුළුල් පාරිභෝගික පදනමක් කරා ළඟා වීමට, තැන්පතු වැඩි කිරීමට, ණය වර්ධනයට සහ අපගේ සේවාවන් තුළින් බොහෝ දෙනාගේ ජීවිත සවිබල ගැන්වීමට අපි අපගේ පුළුල් භෞතික හා ඩිජිටල් වේදිකාව උපයෝගී කර ගනිමු. අපගේ ඩිජිටල් හැකියාවන් සඳහා කර ඇති සැලකිය යුතු ආයෝජනයන් ප්‍රශස්ත කරමින්, ශ්‍රී ලංකාව තුළ මූල්‍යමය වශයෙන් අන්තර්ගෘහිතාවය ඇතිකිරීම සඳහා විවිධ ජන විකාස හා සමාජ-ආර්ථික පැතිකඩ සහ විවිධ ස්වභාවය, ප්‍රමාණය සහ විෂය පථය සහිත ව්‍යවසායන් හා පාරිභෝගිකයින්ට අපි දිගටම සේවය සපයන්නෙමු.

අවදානම් කළමනාකරණය සඳහා අපගේ ස්ථාවර හා විනයගරුක ප්‍රවේශය, නියාමන අනුකූලතාව කෙරෙහි අපගේ නොසැලෙන කැපවීම; ශක්තිමත් සේවක නියුක්ත වීම; බඳවා ගැනීම සඳහා දිගුකාලීන ආයෝජනයන්; දක්ෂ පුද්ගලයින් සංවර්ධනය කිරීම හා රඳවා ගැනීම; විශ්වාසදායක වෙළඳ නාමයක් යන දෑ ඇතුළුව අප කරන සෑම දෙයකම නැංගුරම් ලා ඇත.

ණයවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ අධීක්ෂණ හා එකතු කිරීම් වැඩි දියුණු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කෙරේ. අපි අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කර අවදානම් සවිඥානික සංස්කෘතියක් පෝෂණය කරන්නේ බැංකුවේ ඔරොත්තු දීමේ හැකියාව තවදුරටත් වර්ධනය කිරීමේ බලාපොරොත්තුවෙනි. අපි හරස් විකුණුම් විභවයන් වර්ධනය කර අපගේ ව්‍යාපාර ඒකක සහ විවිධ පාරිභෝගික කොටස් අතර සහසම්බන්ධය උපයෝගී කර ගනිමින් වර්ධනය ළඟා කර ගැනීම සඳහා බාහිරව සහ සමූහය තුළ පවතින සහයෝගී සේවා අවස්ථා උපයෝගී කර ගනිමු.

අපගේ පාලනය තුළ සෑම ශ්‍රී ලාංකිකයෙකුගේම ජීවන තත්ත්වය වැඩිදියුණු කරන අතර, සමාජ ආර්ථික සංවර්ධනයේ රාජ්‍ය ප්‍රයත්නයන් සඳහා සහාය වීමට සෑම සාධාරණ උත්සහයක්ම අප විසින් ගනු ඇත. තවද, අපගේ ගනුදෙනුකරුවන් සෑම විටම අපගේ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ ඉදිරියෙන්ම හා කේන්ද්‍රීයව තැබීමෙන් අපගේ සේවාවන්හි වටිනාකම වැඩි කරනු ඇත. අපගේ හැසිරීමේ සෑම අංශයකින්ම අපි විශ්වාසදායී බව සහ අවංකභාවය ආරක්ෂා කරමු.

අපගේ සේවකයින් නිසැකවම අපගේ ශක්තිමත්ම වත්කම වන අතර අපගේ සෑම සාර්ථකත්වයකම හරය වේ. ශක්තිමත් කණ්ඩායම් සංස්කෘතියක් පෝෂණය කරමින්, අපගේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩි දියුණු කිරීම සඳහා සේවක දැනුම අඛණ්ඩව වැඩි දියුණු කරන්නෙමු. අපගේ පුද්ගලයන් නව නිපැයුම් හා සේවාවන් තුළින් ඔවුන්ගේ නිර්මාණශීලිත්වය පිටතට ගෙන ඒමට බලගැන්වේ. අපගේ විවිධ ගනුදෙනුකරුවන් තේරුම් ගැනීමට සහ ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීමට අපට ඇති හැකියාව අනෙකුත් ව්‍යාපාරික සගයන් අතර අපව කැපීපෙනීමට හේතු වී තිබේ.

## ප්‍රශංසාව පළ කිරීම

අවසාන වශයෙන්, අතිගරු ජනාධිපතිතුමාට, ගරු අග්‍රාමාත්‍යවරයාට, ජනාධිපති ලේකම්වරයාට, භාණ්ඩාගාර ලේකම්වරයාට ඔවුන්ගේ වටිනා මග පෙන්වීම සහ සහාය ලබා දීම සඳහා සහ නියාමන ස්වභාවයේ කාරණා සම්බන්ධයෙන් උපදෙස් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ටද මාගේ අවංක ප්‍රශංසාව පළ කිරීමට කැමැත්තෙමි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින මගේ සගයින්ට සෑම විටම ඔවුන්ගේ නොසැලෙන සහයෝගය සහ උපදෙස් ලබා දීම උදෙසා සහ වසර ගණනාවක් තිස්සේ ආයතනයට ලබා දුන් දායකත්වය වෙනුවෙන් හිටපු අධ්‍යක්ෂ මණ්ඩලයට ද මම ස්තූතිවන්ත වෙමි.

අපගේ හිටපු ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී රසිත ගුණවර්ධන මහතා සහ අපගේ වත්මන් වැඩ බලන ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී බොනීෆස් සිල්වා මහතා සහ කළමනාකරණ කණ්ඩායම සහ අපගේ විශාලතම වත්කම වන සියලු කාර්ය මණ්ඩලය වෙත ප්‍රශංසාව පළ කරනු ලැබේ. ඔවුන්ගේ කැපවීම අපගේ සාර්ථකත්වයේ මූලික අඩිතාලමයි. අපගේ ගනුදෙනුකරුවන්ට සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ට ඔවුන්ගේ නොසැලෙන පක්ෂපාතිත්වය සහ අවසානයේ බැංකුවේ සාර්ථකත්වය වන ඔවුන්ගේ සාර්ථකත්වය පිළිබඳව මම බෙහෙවින් කෘතඥ වෙමි.

බැංකුවේ දිගුකාලීන සාර්ථකත්වය පිළිබඳව අපට විශාල විශ්වාසයක් ඇත. අප ස්ථිර පදනමක් දමා ඇත. අපගේ උපායමාර්ගය පැහැදිලිය, සේවකයින් නිරතව සිටින අතර අපගේ ප්‍රාග්ධන තත්ත්වය යහපත් ය. ශ්‍රී ලංකාවේ නිම් වළලු පුළුල් කිරීමේ බැංකුව ලෙස අපගේ ස්ථාවරය තවදුරටත් තහවුරු කර ගනිමින් අනාගතය ගැන ධනාත්මක හැඟීමක් ඇති කර ගැනීමට අපට ඕනෑ තරම් හේතු තිබේ.



**සුජීව රාජපක්ෂ**
සභාපති

2020 මාර්තු 25

# ප්‍රධාන විධායක නිලධාරි/ සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය



"යම් මූල්‍ය සේවා සැපයුම්කරුවෙකු සඳහා වන විශාලතම පාරිභෝගික පදනමක් ඇති ශ්‍රී ලංකාවේ පෙරටුගාමී බැංකුව ලෙස, තරඟකාරී ලෙස ලාභ ලබන අතරම රාජ්‍ය ප්‍රයත්නයන් සහ ජාතික සමාජ ආර්ථික සංවර්ධනයට සහාය දැක්වීමේ අපගේ ද්විත්ව කාර්යභාරය අපි දිගටම සමතුලිත කරමු".

**බොනීෆස් සිල්වා**
වැඩ බලන ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි

GRI 102-14

සාර්ව ආර්ථික අභියෝග රාශියක් මධ්‍යයේ, 2019 යනු මහජන බැංකුව ශක්තිමත් කිරීමේ වසරකි. අභියෝගයන් තිරසාර වර්ධනය සඳහා විශාල අවස්ථාවන් ලබා දුන්නද, අපගේ වර්ධන උපාය මාර්ගයෙන් අපගේ සියලු පාර්ශ්වකරුවන්ට වැඩි වටිනාකමක් ලබා දීමට අපි කටයුතු කළෙමු. අසමසම පාරිභෝගික අත්දැකීම් ලබා දීම සහ බැංකු කර්මාන්තයේ නව පදනමක් දැමීම පිළිබඳ අපගේ දර්ශනයේ නොසැලී සිටිමින්, අපි අපගේ මූලික ආයතනික ක්‍රියාදාමයන් වැඩිදියුණු කිරීම, ණය සඳහා අදාළ වන ඒවා ඇතුළුව අපගේ සමස්ත අවදානම් කළමනාකරන රාමුව ශක්තිමත් කිරීම සහ දශක කිහිපයක් පැරණි භාවිතයන් නැවත සලකා බැලීම යන දෑ කළෙමු. වැදගත්ම දෙය නම්, බැංකුවේ වර්ධනය වළක්වන දීර්ඝ කාලීන ගැටලුවකට අපි පිළියම් යෙදුවෙමු. එනම් එහි නියාමන ප්‍රාග්ධන අරමුණු සඳහා ණය වෙළඳපොළට ප්‍රවේශ වීමට තිබූ නොහැකියාවයි. සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය තුළ මෙම වැඩිදියුණු කිරීම්වල ප්‍රතිලාභ සංඛ්‍යාවලින් පිළිබිඹු නොවුනද, තිරසාර ස්පෘශ්‍ය ප්‍රතිලාභ මධ්‍යම හා දිගු කාලීනව අඛණ්ඩව ලැබෙනු ඇත.

## ප්‍රධාන සාර්ථකත්වයක්

යම් මූල්‍ය සේවා සැපයුම්කරුවෙකු සඳහා වන විශාලතම පාරිභෝගික පදනමක් ඇති ශ්‍රී ලංකාවේ පෙරටුගාමී බැංකුව ලෙස, තරඟකාරී ලෙස ලාභ ලබන අතරම රාජ්‍ය ප්‍රයත්නයන් සහ ජාතික සමාජ-ආර්ථික සංවර්ධනයට සහාය දැක්වීමේ අපගේ ද්විත්ව භූමිකාව සමතුලිත කරමු.

බාධක කිහිපයක් ජය ගනිමින් මහජන බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත 2019 සැප්තැම්බර් මාසයේදී පාර්ලිමේන්තුවේදී සම්මත වූ අතර එමඟින් නියාමන ප්‍රාග්ධනය ඉහළ නැංවීම සඳහා සාපේක්ෂව පහසුවෙන් ණයකර නිකුත් කිරීමට බැංකුවට හැකියාව ලබා දුනි. සංශෝධනයෙන් පසුව, බැංකුව සාර්ථකව රුපියල් බිලියන 10.0 ක් බාසල් III, ස්තරය II අනුකූලතා ණය නිකුත් කළේය. මෙම ණයකර නිකුතුවට පසුව, 2019 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු ප්‍රාග්ධන අනුපාතය බාසල් III අවම අවශ්‍යතාවයට වඩා ඉහළ විය.

## අපගේ ඩිජිටල් බැංකු නායකයත්වය

ශ්‍රී ලංකාවේ බැංකු හා මූල්‍ය සේවා අවකාශයේ ඩිජිටල්කරණ ගමනේ පෙරමුණ ගෙන, ඩිජිටල් සමාජයක් තුළ ජාතියේ පරිණාමයට සහය දැක්වීමේ දී කැපී පෙනෙන සාර්ථකත්වයක් වාර්තා කරමින් රටේ ග්‍රාමීය ප්‍රදේශවලට ඩිජිටල්-මූල්‍ය සේවා පහසුකම් ළඟා කිරීමේ කටයුත්තෙහි පෙරමුණෙහි අපි සිටිමු. අපගේ පුළුල් ඩිජිටල් ක්‍රියාවට නැංවීම අපගේ බොහෝ නාලිකා හරහා ඒකාබද්ධ අත්දැකීමක් ලබා දීමෙන් බැංකුවේ මෙහෙයුම් පරිවර්තනය කර ඇති අතර, ගනුදෙනුකරුවන්ට අද්විතීය පහසුකම් සහ වේගවත් බහුවිධ නාලිකා අත්දැකීමක් ලබා දෙයි. ඩිජිටල්කරණය හා බැඳුණු හරිත සාරධර්ම ඇති අතර, එය අපගේ ටෙලර් කාර්යක්ෂමතාව 50% ඉක්මවා, අලෙවිකරණ ප්‍රචාරණ කටයුතු සහ හරස් විකිණීම 30% කින් වැඩි කර ඇති අතර බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය කර ඇත.

පසුගිය වසර දෙක තුළ ස්වයං බැංකු ඒකක (SBUs) පිහිටුවීමේ ක්‍රියාකාරීත්වය වේගවත් වූ අතර එය 2019 අවසන් වන විට 239 දක්වා ළඟා විය. එය හුදෙක් වසර තුනකින් ළඟා කර ගත් ජයග්‍රහණයකි. මෙම ඒකක කවුන්ටර ගනුදෙනුවලට වඩා කාර්යක්ෂමතා මට්ටම 70% කින් පමණ ඉහළ නංවා ඇත. ග්‍රාමීය ප්‍රදේශවල පිහිටුවා ඇති ස්වයං බැංකු ඒකක (SBUs) ප්‍රශංසනීය ප්‍රගතියක් පෙන්නුම් කර ඇති බව ප්‍රකාශ කිරීමට ලැබීම සතුටට කරුණක් වන අතර, සියලු ජනකොටස් මට්ටම් අපගේ ඩිජිටල් බැංකුකරණ විසඳුම් භාවිත කරන බව එමගින් දැක්වේ. අපගේ ගනුදෙනුකරුවන්ගෙන් බහුතරයක් ස්වභාවිකවම තාක්ෂණික ලැජ්ජාශීලී, අඩු සහ මධ්‍යම ආදායම් ලබන අය බව සලකා බලන විට මෙය සැලකිය යුතු ජයග්‍රහණයකි. අපගේ ග්‍රාමීය ගනුදෙනුකරුවන්ගෙන් තුනෙන් එකක් පමණ දැන් විකල්ප බැංකු නාලිකා භාවිතා කිරීමෙන් පිළිබිඹු වන පරිදි ඩිජිටල් නාලිකා හරහා පාරිභෝගිකයින් දැනුවත් කිරීම සහ බඳවා ගැනීම සඳහා අප දරන උත්සාහයන් සාර්ථකව ඇත. උපයෝගීතා මට්ටම් තවදුරටත් ඉහළ නැංවීම සහ අපගේ පවතින හැකියාවන් ශක්තිමත් කිරීම අපගේ අරමුණයි.

“People's Wave” යෙදුම රටේ වෙනත් බොහෝ මූල්‍ය යෙදුම් අභිබවා ගොස් ශ්‍රී ලංකාවේ වැඩිපුරම බාගත කළ මූල්‍ය යෙදුම්වලින් එකක් බවට පත්වී Google Play Store හි ආකර්ෂණීය ශ්‍රේණිගත කිරීමක් ලබා ගත් බව මා සඳහන් කරන්නේ සාඩම්බරයෙනි.

ඩිජිටල් වේදිකාවේ අපගේ සාර්ථකත්වය Asian Banker සඟරාව සහ Asia Money යන දෙපාර්ශ්වයෙන්ම හොඳම ඩිජිටල් බැංකුව 2019 ඇතුළු ජාත්‍යන්තර වශයෙන් ලැබුණු සම්මාන රාශියකින් පෙන්නුම් කෙරේ. මීට අමතරව, 2019 සඳහා Asian Banker සඟරාව විසින් පිරිනමන ලද හොඳම ජංගම බැංකු යෙදුම සම්මානය ලබා ගත්තේ ද බැංකුවයි.

## දුෂ්කර වෙළඳපොල පරිසරයක සැලකිය යුතු කාර්ය සාධනයක්

බැංකුවේ ඒකාබද්ධ සමස්ත මෙහෙයුම් ආදායම පසුගිය වසරට සාපේක්ෂව 4.4% කින් රුපියල් බිලියන 93.8 දක්වා ඉහළ ගොස් තිබේ. සමාලෝචනයට භාජනය වූ වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ඒකාබද්ධ ලාභය රුපියල් බිලියන 16.2 ක් වූ අතර එය 2018 ට වඩා 24.7% ක අඩුවීමකි. මෙම අඩු වීමට හේතු වූයේ අභ්‍යන්තර වර්ධන අවස්ථා සීමා කිරීම, හානිකරණ ගාස්තු ඉහළ නැංවීම සහ සමූහයේ සමස්ත ශුද්ධ පොලී ආන්තිකයන් හැකිළීම යන සාර්ව ආර්ථික අභියෝගවල බලපෑමයි. එක් වරක් පමණක් ඇති වන අයිතමයක් සහ ණය ආපසු ගෙවීමේ බද්දෙහි එකතුව වන රුපියල් බිලියන 2.7 වූ සැලකිය යුතු වැඩි වීමක් හේතුවෙන් අනෙකුත් මෙහෙයුම් වියදම් 50% කින් වැඩිවීම ලාභයට තවදුරටත් බලපා ඇත.

2018 වසර අවසානයේ රුපියල් බිලියන 31.5 සමග සසඳන විට බැංකු මට්ටමින්, වර්ෂය තුළ නිරපේක්ෂ අක්‍රීය ණය (NPLs) රුපියල් බිලියන 43.6 දක්වා ඉහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, බැංකුවේ හානිකරණ වෙන්කිරීම් 121% කින් ඉහළ ගොස් තිබේ. අපගේ අක්‍රිය ණය ආවරණය 60% ඉක්මවන අතර එය බැංකු කර්මාන්තයේ ඉහළම අගයයි. එය අපගේ දූරදර්ශී ප්‍රතිපාදන ප්‍රතිපත්තිය සහතික කරමින් කර්මාන්තයේ සාමාන්‍ය වන 52.3% ට වඩා ඉහළ මට්ටමක පවතී.

2019 දී කර්මාන්තය පුරා අක්‍රීය ණය ඉහළ ගොස් තිබියදීත්, අපගේ බැංකු මට්ටමේ අක්‍රීය ණය අනුපාතය 3.3% ක් ලෙස පවත්වාගෙන ගිය අතර එය 2019 දෙසැම්බර් 31 වන විට කර්මාන්ත සාමාන්‍යය වන 4.7% ට වඩා බෙහෙවින් අඩු මට්ටමක පැවතුනි. මෙය අපගේ දැඩි ණය ඇගයීමේ ක්‍රියාවලිය, අපගේ ගනුදෙනුකරුවන්ගේ කළඹ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සහ අපගේ සංවිධානය පුරා පෝෂණය වූ අවදානම් සවිඥානික සංස්කෘතියේ ප්‍රබල සාක්ෂියකි. තවද, කාර්ය මණ්ඩල කාර්ය සාධන ඇගයීම් සමඟ අක්‍රිය ණය කළමනාකරණය සම්බන්ධ කිරීම සහ වැඩි බරක් පැවරීම මගින් අක්‍රිය ණය කළමනාකරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී. තව දුරටත් වැඩිදියුණු කිරීම සඳහා සෑම විටම ඉඩක් ඇති බව අප වටහාගෙන ඇති හෙයින් අපි අපගේ අක්‍රීය ණය (NPLs) වඩාත් ඵලදායී ලෙස තවදුරටත් කළමනාකරණය කරමු.

ණය වර්ධනය 3.1% දක්වා අඩුවී රුපියල් බිලියන 1,460.2 කරා ළඟා විය. එය වර්ෂය සඳහා වර්ධක ඉපැයීම් කෙරෙහි සෘණාත්මක බලපෑමක් 2019 දී ඇති කරන ලදී. ණය ලබා දීමේ ගුණාත්මක අංශයට වැඩි අවධානයක් යොමු කරන ලද අතර ණයවලින් වැඩි ප්‍රමාණයක් ප්‍රදානය කළේ රජයට අයත් ව්‍යවසායන් සඳහා ය.

# ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය

රාජ්‍ය ව්‍යවසායන් සඳහා දුන් ණය හැරුණු කොට, බැංකුවේ ණය කළඹ පෙර වසර සමග සසඳන විට 0.8%කින් සංකෝචනය විය. මුළු වත්කම් පදනම රුපියල් බිලියන 2,049.8 දක්වා වැඩි විය. පාරිභෝගික තැන්පතු අගය රුපියල් බිලියන 1,588.9 දක්වා 6.3% කින් ඉහළ ගොස් තිබේ.

සමූහයේ ජංගම හා ඉතුරුම් ගිණුම් (CASA) අනුපාතය 2019 දෙසැම්බර් 31 වන විට 35.9% ක් වූ අතර එය බැංකුවේ ඉලක්කයට වඩා අඩු විය. බැංකුවේ ජංගම ගිණුම් පදනම වැඩිදියුණු කිරීම සඳහා මුල පිරීම් ගණනාවක්ම සිදු කරන ලද අතර එය තවදුරටත් අවධානය යොමු කළ යුතු අංශයක් වනු ඇත. වත්මන් මට්ටම් වලින් ඔබ්බට ජංගම හා ඉතුරුම් ගිණුම් (CASA) වැඩි දියුණු කිරීම අඛණ්ඩ ප්‍රමුඛතාවයක් වනු ඇත.

වර්ෂය තුළ අපගේ ප්‍රාග්ධන ව්‍යුහය ශක්තිමත් විය. ඒකාබද්ධ ස්ථර I සහ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මක මට්ටම් 2019 අවසන් වන විට පිළිවෙලින් 11.6% සහ 14.9% විය.

## වඩා හොඳ පාරිභෝගික අත්දැකීම් ලබා දීම උදෙසා මෙහෙයුම්වල විශිෂ්ටත්වය

තාක්ෂණය හා ඩිජිටල්කරණය පිළිබඳ අපගේ සැලකිය යුතු ආයෝජන වඩා හොඳ පාරිභෝගික අත්දැකීම් සහ වඩාත් කාර්යක්ෂම ව්‍යාපාරික ක්‍රියාවලීන් සඳහා පහසුකම් සපයන වටිනාකමේ ප්‍රධාන ධාවක වේ. බැංකුව පුරා, අපි නව තාක්ෂණයේ ආධාරයෙන් අපගේ උපකාරක සේවාවන් විධිමත් කළ අතර, 2019 දී සැලකිය යුතු පිරිවැය ඉතිරියක් ලබා දෙමින් මනා පාලනයකින් යුතුව වියදම් කළමනාකරණය සඳහා වඩාත් අරපිරිමැස්මෙන් කටයුතු කළෙමු. දශකය පුරාවට අපගේ වර්ධනය වන ඵලදායිතා මට්ටම් පිළිබිඹු කරමින් ව්‍යාපාරික වර්ධනය මධ්‍යයේ අපගේ සේවක සංඛ්‍යාව එලෙසම පැවතී ඇත.

වෙන කවරදාකටත් වඩා අපගේ ස්වයං බැංකු ඒකක (SBUs) සහ සෘජු ඩිජිටල් නාලිකා වන වෙබය සහ ජංගම දුරකතන හරහා බැංකුකරණයේ නියැලී සිටින විවිධාකාර සමාජ හා ආර්ථික ස්ථරයන්හි ගනුදෙනුකරුවන්ගේ සංඛ්‍යාව වැඩිවීම තුළින් පෙන්නුම් කරන පරිදි, අපි බැංකුකරණය පහසු කර අපගේ ගනුදෙනුකරුවන්ගේ තේරීම් හා මනාපයන් සමඟ සමමුහුර්ත කර ඇත්තෙමු. සෑම විටම විශිෂ්ට පාරිභෝගික අත්දැකීමක් ලබා දීම උදෙසා අපි තාක්ෂණය සඳහා අඛණ්ඩව ආයෝජනය කළ අතර පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණය (CRM) පිළිබඳ අපගේ කාර්ය මණ්ඩලය පුහුණු කළෙමු. මෙම උත්සාහයන්හි සාර්ථකත්වය අපගේ වෙළඳ නාම ශ්‍රේණිගත කිරීම්, පාරිභෝගික පදනම වැඩි වීම සහ පාරිභෝගික තෘප්තිය පිළිබඳ ලකුණුවලින් පිළිබිඹු වේ. පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ (CRM) මෘදුකාංගය ක්‍රියාත්මක කිරීමත් සමඟ, වර්තමාන හා අනාගත ගනුදෙනුකරුවන් සමඟ අපගේ සියලු සම්බන්ධතා සහ අන්තර්ක්‍රියා වඩාත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට අපි අපේක්ෂා කරමු.

## අපගේ කාර්ය මණ්ඩලය බලගැන්වීම

සමස්තයක් වශයෙන්, බැංකුවේ සාර්ථකත්වයන්, ප්‍රගතිශීලී මුලපිරීම් සහ අපගේ දක්ෂ සේවක කණ්ඩායම හේතුකොට ලැබුණු බවට සැලකිය හැක. අපට කළ හැකි හොඳම ආයෝජනය අපේම ජනතාව තුළ බව අපි දිගටම විශ්වාස කරමු. එම නිසා, අපගේ ශ්‍රම බලකායට කුසලතා ලබා ගැනීමට සහ බැංකුවේ විකාශනය වන අවශ්‍යතා සහ අනාගත වර්ධනයට සහාය වීම සඳහා අවශ්‍ය දැනුම ලබා ගැනීමට සහාය වීම සඳහා වර්ෂය තුළ කාර්ය මණ්ඩල පුහුණුව සඳහා සැලකිය යුතු ආයෝජන සිදු කරන ලදී. පුහුණු අවස්ථා සඳහා සේවකයින් තෝරා ගැනීමේ විනිවිදභාවය වැඩි දියුණු කරන අතරම, අඛණ්ඩ පුහුණුව තුළින් මහජන බැංකු කණ්ඩායම තුළ ගැඹුරු ආයතනික දැනුම හා ප්‍රමුඛ පෙළේ හැකියාවන් වැඩි වැඩියෙන් සංයෝජනය කර ඇත. දිනෙන් දින වෙනස් වන බැංකු පරිසරයට අනුවර්තනය වීමට සහ අවශ්‍ය දක්ෂ හා පළපුරුදු නායකයින්ගේ කණ්ඩායමක් අප සතුව ඇති බව සහතික කිරීමට අපගේ අනුප්‍රාප්තික සැලසුම්කරණයේ ඉදිරි දැක්ම කෙරෙහි අපගේ අවධානය යොමු වී තිබේ. මහජන බැංකු කණ්ඩායමට ඔවුන්ගේ පූර්ණ හැකියාවන් කරා ළඟා වීමට හැකි වන පරිදි කාර්ය සාධනය-නැඹුරු සහ සියල්ල ඇතුළත් වැඩ පරිසරයක් අපි දිගටම නිර්මාණය කරමු.

## තිරසාර ලෝකයකට සහාය වීම

ආයතනික සමාජ වගකීම් සහ යහපත් පාරිසරික, සමාජීය සහ පාලන පිළිවෙත් අපගේ මෙහෙයුම් සඳහා ඒකාබද්ධ කිරීමට අපි කැපවී සිටිමු. අප ක්‍රියාත්මක වන ප්‍රජාවන්ට සහාය දැක්වීමේ දිගු ඉතිහාසයක් හා ශක්තිමත් සංස්කෘතියක් අප සතුව ඇත.

> අපගේ ව්‍යාපාර ක්‍රියාකාරිත්වය සහ සමාජයේ අපගේ භූමිකාව වෙන් කළ නොහැකි ලෙස බැඳී ඇති බව අපි තරයේ විශ්වාස කරමු. විශේෂයෙන් වරප්‍රසාද නොලත් දරුවන්ගේ අධ්‍යාපනය නංවාලීම සහ ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් සහ ආගමික සංවර්ධනය දියුණු කිරීම සඳහා ආයතනික සමාජ වගකීම් වැඩසටහන් ගණනාවක් සඳහා අපි දිගටම සහයෝගය සහ ප්‍රමුඛත්වය දෙමු.

වර්ෂය තුළ ආබාධිත ළමුන් සඳහා වූ ජාතික මධ්‍යස්ථානයක් වන “අයති” පිහිටුවීමට අපි අපගේ සහයෝගය ලබා දුනිමු. අපගේ ස්වයං බැංකු ඒකක (SBUs) හරහා ලංකා විදුලිබල මණ්ඩලයට සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගනුදෙනුකරුවන් විසින් කරනු ලබන සියලුම උපයෝගිතා ගෙවීම් අඛණ්ඩව නොමිලේ සිදු කරමු.

සමාජ ප්‍රගතිය ප්‍රවර්ධනය කිරීම සඳහා මූල්‍ය ව්‍යාප්ත කිරීම, රැකියා අවස්ථා සහ නිපුණතා සංවර්ධනය කිරීම තුළින් අපි ප්‍රජාවන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීමට කටයුතු කරමු. උදාහරණයක් ලෙස පරිසරය සඳහා වන කැපවීමට සහාය වීම සඳහා, “ජනතාවගේ හරිත ස්පන්දනය” පාරිසරික තිරසාර ප්‍රතිපත්තිය යටතේ අපි මුල පිරීම් කිහිපයක් දියත් කර ඇත්තෙමු. පසුගිය වසර තුනක කාලය තුළ අපගේ ශාඛා ජාලය තුළ අපගේ බලශක්ති භාවිතය මෙන්ම කඩදාසි යැපීම අඩු කිරීමෙන් ඒවා වඩාත් පාරිසරික වශයෙන් තිරසාර කිරීම සඳහා ආයෝජනය කරමින් සිටිමු. අපගේ පළමු පූර්ණ පරිසර හිතකාමී කලාපීය ප්‍රධාන කාර්යාලය යාපනයේ ඉදිවෙමින් පවතී. දිවයිනේ ප්‍රධාන ප්‍රදේශවල ගස් සිටුවීමේ ව්‍යාපෘතියක් ද අප විසින් දියත් කර තිබේ. 2019 වසරේදී ආයතනික සමාජ වගකීම් සඳහා අපගේ ආයෝජනය රුපියල් මිලියන 34 දක්වා ඉහළ ගියේය.

# ප්‍රධාන විධායක නිලධාරි/ සාමාන්‍යාධිකාරීගේ සමාලෝචනය

## පිළිගැනීම් - ආයතනය සඳහා පළමුවැන්නා වීම් ගණනාවක්

දේශීය හා ගෝලීය වශයෙන් අපට ලැබී ඇති ඉහළ සම්මාන පිළිබඳව අප නිහතමානී වන අතර එමඟින් අපගේ පුද්ගල කේන්ද්‍රීය හා ඩිජිටල් නැඹුරුව සහතික කරන අතර ශ්‍රී ලංකාවේ තාක්ෂණික නවෝත්පාදනයන්හි අපව පෙරමුණට යොමු කර ඇත. ගෞරවනීය සම්මාන මගින් බැංකුව පුරා සිටින අපගේ දක්ෂ සේවකයින්ගේ නිර්මාණශීලිත්වය, වෙහෙසී වැඩ කිරීම සහ කැපවීම තුළින් අප ලබා ඇති ජයග්‍රහණ හඳුනා ගනී.

2019 දී කීර්තිමත් කලාපීය බැංකු හා මූල්‍ය ප්‍රකාශනයක් වන Asian Banker සඟරාව මහජන බැංකුව ශ්‍රී ලංකාවේ හොඳම පුද්ගල කේන්ද්‍රීය බැංකුව, ශ්‍රී ලංකාවේ හොඳම ඩිජිටල් බැංකුව සහ ආසියා පැසිෆික්, මැදපෙරදිග සහ අප්‍රිකාව පුරා වඩාත්ම දියුණු පුද්ගල කේන්ද්‍රීය බැංකුව ලෙස පිළිගෙන තිබේ. මේ සියල්ල මහජන බැංකුවට පළමුවැන්නා වීම්ය. ඊට අමතරව, එය 2019 සඳහා ශ්‍රී ලංකාවේ හොඳම ජංගම බැංකු යෙදුම සහ හොඳම ජංගම සන්නම්කරණ මුල පිරීම් සම්මානයෙන් ද පිදුම් ලැබීය.

ආසියානු සංවර්ධන බැංකුව සිය වෙළඳ මූල්‍ය මෙහෙයුම් සඳහා මහජන බැංකුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ හවුල්කාර බැංකුව ලෙස පිළිගෙන තිබේ. ගෝලීය බැංකු හා මූල්‍ය සමාලෝචන සම්මාන උළෙලේදී ශ්‍රී ලංකාවේ වේගවත්ම වර්ධනය වන ආයෝජන බැංකුව ලෙස මහජන බැංකුවේ ආයෝජන බැංකු හස්තය පිළිගැනීමට ලක්විය.

මේ දක්වා ශ්‍රී ලංකාවේ ඕනෑම වාණිජ බැංකුවක් විසින් ලබාගෙන ඇති විශාලතම හා දීර්ඝතම ද්විපාර්ශ්වික අරමුදල් පහසුකම අත්සන් කිරීමෙන් විදේශීය බැංකුවලින් අරමුදල් රැස් කිරීමේ මිණුම් ලකුණ අපි තැබුවෙමු. මෙය අපගේ බැංකුව, අපගේ පාලන ව්‍යුහය, විශේෂඥතාව සහ අපේ ජාතියේ සංකීර්ණ හා ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘති සඳහා අපක්ෂපාතීව මුදල් සැපයීම සම්බන්ධව ඇති ගෝලීය පිළිගැනීම හා විශ්වාසය පිළිබඳ පැහැදිලි පිළිබිඹුවකි.

දේශීය වශයෙන්, අඛණ්ඩව 13 වන වරටත්, මහජන බැංකුව වසරේ SLIM Nielson ජනතා සේවා සන්නාමය සහ 2019 වසරේ ජනතාවගේ බැංකු සේවා සැපයුම්කරු ලෙස සම්මාන ලැබීය. මෙය වෙන කිසිවෙකුට ආඩම්බර විය නොහැකි කාර්යයකි. ලෝකයේ ප්‍රමුඛතම ස්වාධීන වෙළඳනාම තක්සේරු කිරීම සහ උපාය මාර්ගික උපදේශන පිළිවෙත් සඳහා වූ Brand Finance විසින් මනිනු ලබන ලද බැංකුවේ වෙළඳ නාම වටිනාකම, රුපියල් බිලියන 10.2 සිට රුපියල් බිලියන 45.5 දක්වා වැඩි විය. සමාලෝචනයට භාජනය වූ එම වර්ෂය සඳහා ඕනෑම බැංකු/මූල්‍ය සේවා සැපයුම්කරුවකුගේ වැඩි වූ ඉහළම අගය මෙයයි.

## අපගේ සංස්කෘතිය - අපගේ ආඩම්බරය - අපගේ ජයග්‍රහණය

අවදානම් කළමනාකරණය, පාලනය සහ නායකත්වය වැනි ශක්තීන් ඇතුළුව හොඳ ව්‍යාපාර විනිශ්චයක් ලබා දෙන අපගේ ශක්තිමත් විනය හා සංවිධානය කෙරෙහි ඇති පක්ෂපාතීත්වය පිළිබඳ අපගේ සංස්කෘතිය ගැන මම අතිශයින් ආඩම්බර වෙමි. මේ සියල්ල අපගේ පාර්ශ්වකරුවන්ට අප සතු වගකීම පිළිබඳ හැඟීම පිළිබිඹු කරයි. හවුල් දැක්මක් ඇතිව සහ එක් කණ්ඩායමක් ලෙස වැඩ කිරීමෙන් අපගේ ජනතාව නිරතව සිටින, අභිප්‍රේරණය වන සහ සවිබල ගැන්වෙන සංස්කෘතියක් අප විසින් වර්ධනය කර ගෙන ඇත.

## අනාගතය සඳහා හොඳින් ස්ථානගත වීම

අපගේ බැංකුව කර්මාන්තයේ ප්‍රමුඛ නවෝත්පාදනයන් ලබා දීමටත්, තිරසාර, ලාභදායී වර්ධනයක් ලබා දීමටත්, අප සේවය කරන පාර්ශ්වකරුවන්ගේ දිගුකාලීන විශ්වාසය අඛණ්ඩව උපයා ගැනීමටත් හොඳින් ඔරොත්තු දෙන, වේගවත් ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීමටත් අපි කටයුතු කරන්නෙමු.

පාරිභෝගික කේන්ද්‍රීය සංස්කෘතියක් අනුගමනය කිරීමෙන්, අපගේ පාරිභෝගික සබඳතා ගැඹුරු කිරීමෙන් සහ ඩිජිටල් බැංකුකරණයේ වර්ධන අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් ආදර්ශමත් පාරිභෝගික අත්දැකීම් ලබා දීමෙන් අපි මෙය සිදුකරන්නෙමු. අඛණ්ඩ පදනමක් මත අපගේ ආයතනික ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සහ අපගේ ව්‍යාපාර මෙහෙයුම්වල කාර්යක්ෂමතාව වැඩි කිරීම කෙරෙහි අපි අවධානය යොමු කරන්නෙමු. මානව සම්පත් සඳහා වන ආයෝජන තුළින් බැංකුව පුරා ඵලදායිතා මට්ටම ඉහළ නැංවීම කෙරෙහි අපි අවධානය යොමු කරමු. අක්‍රිය ණය (NPLs) කළමනාකරණය සහ බැංකුවේ ජංගම හා ඉතුරු ගිණුම් (CASA) පදනම වර්ධනය කිරීම ප්‍රමුඛතා ක්ෂේත්‍රයන් ලෙස දිගටම පවතිනු ඇත. අපගේ වෙළඳ නාම ශක්තිය සහ ප්‍රතිරූපය තවදුරටත් වර්ධනය කිරීම සඳහා පියවර ක්‍රියාත්මක කෙරේ.

COVID-19 වසංගතය වටා ඇති අර්බුදය සියල්ලන්ට බලපාන හෙයින් අප ජීවත් වන්නේ සමාජයට හා අපේ ආර්ථිකයන්ට දුෂ්කර කාලයක ය. අපගේ ගැඹුරු අවදානම් පිළිබඳ දැනුම, සමීප සේවාදායක සබඳතා සහ ඩිජිටල් ආයෝජනවලට ස්තූතිවන්ත වෙමින් මෙම අර්බුදය තුළ ධනාත්මක දායකත්වයක් ලබා දීමට හැකිවනු ඇතැයි අපට විශ්වාසයි. රැකියා ස්ථානයේ ආරක්ෂාව පවත්වා ගැනීමට සහ අපගේ සේවකයින්ගේ සහ ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීමට අප ප්‍රමුඛත්වය දී ඇති අතර, අපි අනාගතය ගැන සුභවාදීව සිටිමු.

අපගේ ඩිජිටල් ආයෝජන ප්‍රාග්ධනිත කර ගැනීම, අරමුදල් නොවන ආදායම වැඩි කිරීම සහ ආයතනික අංශයට වැඩි වටිනාකමක් ලබා දීම කෙරෙහි අවධානය යොමු කරමින් බැංකුවේ 2021 - 2027 කාල පරිච්ඡේදය සඳහා උපායමාර්ගික සැලැස්ම සංවර්ධනය කිරීමෙන් අපි අපගේ ඊළඟ අදියර ආරම්භ කරමු.

## මහත් ස්තුතියක්

මහජන බැංකුව යනු ශ්‍රී ලාංකික සම්ප්‍රදායන් සහ අසමසම විශ්වාසයකින් යුත් ආයතනයකි. අපගේ ගනුදෙනුකරුවන් විසින් අගය කරනු ලබන පුළුල් භූගෝලීය හා ඩිජිටල් සලකුණකින් අපි ප්‍රතිලාභ ලබන අතර ශක්තිමත් මූල්‍ය තත්වයක්, විශ්වාසවන්ත සේවකයින් සහ ජනතාවගේ බැංකුව ලෙස බලගතු වේදිකාවක පිටුබලය ඇත. අපගේ බැංකුව අනාගතය සඳහා සුවිශේෂී ලෙස ස්ථානගත වී ඇති බව මම විශ්වාස කරමි.

අවසාන වශයෙන්, අපගේ සභාපතිවරයාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ වටිනා මඟ පෙන්වීම සහ හෘද සාක්ෂියට එකඟව කටයුතු කිරීම පිළිබඳව මාගේ කෘතඥතාව පළ කරමි. රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන, රජයේ භාණ්ඩාගාරය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ට අදාළ සියලු කරුණු පිළිබඳව ඥානවන්තව උපදෙස් දීම පිළිබඳව මාගේ අගය කිරීම මෙලෙස ප්‍රකාශ කරමි. අපගේ හිටපු ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරී රසිත ගුණවර්ධන මහතා 2019 දුෂ්කර කාලයකදී ආයතනය මෙහෙයවීම සඳහා කළ වටිනා දායකත්වය පිළිබඳව විශේෂයෙන් සඳහන් කිරීමට මම අවස්ථාවක් කර ගනිමි. ආයතනික හා විධායක සාමාජිකයින්ට සහ සියළුම කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ වෙහෙස හා කැපවීම වෙනුවෙන් ස්තූති කරන අතර, විශේෂයෙන්ම අපගේ කොටස් හිමියන්ට සහ ගනුදෙනුකරුවන්ට අප කෙරෙහි තබා ඇති අඛණ්ඩ විශ්වාසය වෙනුවෙන් මහත් ස්තූතියක් පිරිනමමි.

වෙන කවරදාකටත් වඩා අපි අනාගතය දෙස බලන්නේ ශ්‍රී ලංකාවේ නිම් වළලු පුළුල් කිරීමේ බැංකුව ලෙස අපගේ ස්ථාවරය තහවුරු කර ගනිමිනි.



**බොනීෆස් සිල්වා**
වැඩ බලන ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි

2020 මාර්තු 25

# අධ්‍යක්ෂ මණ්ඩලය

GRI 102-22, 102-23



**කීර්ති ගුණතිලක මහතා**
අධ්‍යක්ෂ

**ඉසුරු බාලපටබැඳි මහතා**
අධ්‍යක්ෂ

**කුමාර් ගුණවර්ධන මහතා**
අධ්‍යක්ෂ

**සුජීව රාජපක්ෂ මහතා**
සභාපති

# අධ්‍යක්ෂ මණ්ඩලය



**මලිඳු රණසිංහ මහතා**
අධ්‍යක්ෂ

**මංජුල වෙල්ලාලගේ මහතා**
අධ්‍යක්ෂ

**කේ ඒ විමලේන්තිරරාජා මහතා**
අධ්‍යක්ෂ

**සුදර්ශන් අහංගම මහතා**
අධ්‍යක්ෂ

# අධ්‍යක්ෂ මණ්ඩලය

## සුජීව රාජපක්ෂ මහතා
සභාපති

සුජීව රාජපක්ෂ මහතා "BDO Partners" හි කළමනාකාර හවුල්කරුවෙකු වන අතර එය ලොව පස්වන විශාලතම ගිණුම්කරණ ජාලය වන BDO හි දේශීය නියෝජිතයා වේ. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකු මෙන්ම ශ්‍රී ලංකා වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයෙකු ද වේ. රාජපක්ෂ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයෙන් (PIM) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධියක් ලබා ඇත.

දශක හතරකට ආසන්න කාලයක් සිය වෘත්තීය ජීවිතය තුළ ඔහු ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (CA ශ්‍රීලංකා) සභාපති, උපසභාපති සහ කවුන්සිල සාමාජික (තේරීපත්වූ), CA ශ්‍රී ලංකාවේ විගණන ප්‍රමිති කමිටුවේ හිටපු සභාපති, ශ්‍රී ලංකාවේ ප්‍රායෝගික ගණකාධිකාරී සංසදයේ සභාපති, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ භාණ්ඩාගාරික, 2011 ලෝක කුසලාන ක්‍රිකට් භාණ්ඩාගාරික, දකුණු ආසියානු ගණකාධිකාරී සම්මේලනයේ (SAFA) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහ තාක්ෂණික උපදේශක, ආසියා පැසිෆික් ගණකාධිකාරීවරුන්ගේ සම්මේලනයේ (CAPA) තාක්ෂණික උපදේශක සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල කවුන්සිල සාමාජික යන ගෞරවනීය තනතුරු හෙබවීය.

ඔහු ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී, සොෆ්ට්ලොජික් ඉන්ෂුවරන්ස් පීඑල්සී, ඩිජ්ඩි ප්‍රොඩක්ට්ස් පීඑල්සී, හේකාර්බ් පීඑල්සී, ඩිවෙලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (පුද්ගලික) සමාගම, ලංකා හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම, එන්ඩීබී කැපිටල් සමාගම (බංග්ලාදේශය), ද ෆිනෑන්ස් සමාගම පීඑල්සී සහ යුනිඩිල් පැකේජින්ග් යන ආයතනවල සේවය කර ඇත.

ඔහුගේ විශේෂඥතාවයට සියලු ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන් සහ භාවිතයන්, මූල්‍ය විනය හා ආචාරධර්ම සම්බන්ධ රජයේ රෙගුලාසි, මානව සම්පත් කළමනාකරණය සහ පෞද්ගලික හා රාජ්‍ය යන අංශවල සමස්ත කළමනාකරණ භාවිතයන් සහ මූලධර්ම ඇතුළත් වේ.

## කුමාර් ගුණවර්ධන මහතා
අධ්‍යක්ෂ

කුමාර් ගුණවර්ධන මහතා විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස 2019 දෙසැම්බර් 26 දින මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී. ඔහුට බැංකුකරණයේ විවිධ ක්ෂේත්‍රයන්හි වසර 40 කට වැඩි පළපුරුද්දක් ඇත. 1979 දී කොමර්ෂල් බැංකුවෙන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කර ඇති ඔහු ඇම්ස්ටර්ඩෑම් රොටර්ඩෑම් බැංකුව (ඇම්රෝ බැංකුව), ABN ඇම්රෝ බැංකුව සහ අවසානයේ ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී (NDB) යන ආයතනවල සේවය කර ඇත. ඔහු වසර 20 කට වැඩි කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරුවල සේවය කර ඇති අතර 2000 වසරේදී ABN ඇම්රො බැංකුවේ සහකාර උපසභාපති ලෙස පළමු වරට පත් කර ඇත. ඔහුගේ විශේෂඥතා ක්ෂේත්‍ර පුළුල් හා විවිධාකාර වන අතර ශාඛා ජාල කළමනාකරණය, ආයතනික බැංකුකරණය, වෙළඳ මූල්‍ය, මෙහෙයුම්, පරිපාලනය සහ සේවා ඇතුළත් වේ.

ඔහු ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී (NDB) ඒකාබද්ධ හිමිකාරීත්වය දරන ඩිවෙලොප්මන්ට් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගමේ සහ අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ද සේවය කර ඇති අතර ශ්‍රී ලංකා ටෙනිස් සංගමයේ භාණ්ඩාගාරික වේ.

## සුදර්ශන් අහංගම මහතා
අධ්‍යක්ෂ

සුදර්ශන් අහංගම මහතා ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකු වන අතර පසුගිය වසර 15 ක කාලය තුළ සමූහ මූල්‍ය අධ්‍යක්ෂ ලෙස MAS Holding හි සේවය කරයි. ඔහු විවිධ කලාප වල රටවල් 17ක මූල්‍ය කටයුතු පිළිබඳ වගකීම් දරා තිබේ. ඒකාබද්ධ කිරීම සහ අත්පත් කරගැනීම්, දේශසීමා ගනුදෙනු, ව්‍යාපාර ප්‍රාග්ධන ආයෝජන සහ ආයතනික ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු, ඔහු ඔහුගේ මූල්‍ය භූමිකාවට අමතරව ඉටු කළ දේය. ඊට පෙර ඔහු ජෝන් කීල්ස් කොටස් තැරැව්කරුවන්ගේ ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂවරයකු වූ අතර විවිධ සමාගම් මූල්‍ය සේවා, අධ්‍යක්ෂ මණ්ඩල වලට සම්බන්ධ විය. ජෝන් කීල්ස් හි මෘදුකාංග බාහිර සැකසුම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීමේ වගකීම ද ඔහු සතු විය.

## ඉසුරු බාලපටබැඳි මහතා
අධ්‍යක්ෂ

ඉසුරු බාලපටබැඳි මහතා නීතිඥවරයකු වන අතර වර්තමානයේ සිවිල් හා වාණිජ නීතිය පිළිපැදීම සඳහා නීති කාර්යාලයක් පවත්වාගෙන යයි. ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ පෙන්සිල්වේනියා පිට්ස්බර්ග් විශ්වවිද්‍යාලයෙන් එල්එල්එම් උපාධියක් ද ලබා ඇත.

2008 සිට 2010 දක්වා නෙදර්ලන්තයේ හේග් හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට රාජ්‍ය තාන්ත්‍රිකයෙකු ලෙස පත් කිරීමට පෙර නීතිපති දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නීතිඥවරයෙකු ලෙස බාලපටබැඳි මහතා සේවය කළ අතර එම කාලය තුළ ඔහු ශ්‍රී ලංකාවේ නියෝජිතයා ලෙස සංවිධානයේ රසායනික අවි තහනම් කිරීම සහ පුද්ගලික ජාත්‍යන්තර නීතිය පිළිබඳ හේග් සමුළුව (HCCH) සඳහා සේවය කළේය. හෙග් හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ චාන්සරි ප්‍රධානියා ලෙස ද ඔහු පත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ ආයෝජන නීති හා ආයෝජන මණ්ඩලයේ නීතිමය කටයුතු සඳහා ඔහු 2012 දී ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයාගේ නීති උපදේශක ලෙස පත් කරන ලදී.

බාලපටබැඳි මහතා මහජන බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වීමට පෙර ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ, සෙලාන් බැංකුවේ සහ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලවල සේවය කර ඇත.

ඔහු ශ්‍රී ලංකාවේ නීතිඥ සංගමයේ විධායක කමිටු සාමාජිකයෙකු ලෙස සේවය කර ඇත. ඔහු 2007 දී කනිෂ්ට ජාතික නීති සම්මේලනයේ සභාපතිවරයා ලෙසත් 2020 ජාතික නීති සම්මේලනයේ කැඳවුම්කරු ලෙසත් පත් කරන ලදී.

## මලිඳු රණසිංහ මහතා
අධ්‍යක්ෂ

මලිඳු රණසිංහ මහතා එක්සත් රාජධානියේ මැන්චෙස්ටර් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධියක් ලබා ඇති අතර වර්තමානයේ සම්මානලාභී උසස් අධ්‍යාපනය ලබා දෙන පෞද්ගලික ආයතනයක් වන ඔක්ස්ෆර්ඩ් ව්‍යාපාර විද්‍යාලයේ අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ලෙස කටයුතු කරයි. ඔහුට කණ්ඩායම් නායකත්වය සහ අලෙවිකරණ නිෂ්පාදන හා සේවාවන් පිළිබඳ වසර 18 කට වැඩි පළපුරුද්දක් ඇත.

එපමණක් නොව, වැඩි වැඩියෙන් ඉල්ලුම් කරන වෙළඳපොලකට ප්‍රතිචාර වශයෙන් නම්‍යශීලීබව සහතික කිරීමට සහ උපාය මාර්ගික නැවත විකුණුම් සහ සැපයුම්කරුවන්ගේ සබඳතා අඛණ්ඩව වර්ධනය කිරීමට රණසිංහ මහතා දායක විය. විවිධාංගීකෘත වෙළඳපලවල ගනුදෙනුකරුවන්ගේ ඉහළ අපේක්ෂාවන් සපුරාලීම සහ ඉක්මවා යාම සඳහා මාර්ගගත සේවාවන් ගොඩනැගීම සහ ශක්තිමත් කිරීම පිළිබඳ විශිෂ්ට වාර්තාවක් ඔහු සතුව ඇත. ඔහුගේ සුවිශේෂී නායකත්ව ශෛලිය සහ පරිසර හිතකාමී ලෙස අවම වශයෙන් බලශක්ති කාර්යක්ෂම ද්‍රව්‍ය හා වටිනා සම්පත් සංරක්ෂණය කිරීමේ නව්‍ය ක්‍රම මගින් දේශගුණික විපර්යාසයන් ආමන්ත්‍රණය කරමින් තිරසාර හා ඔරොත්තු දෙන සේවාස්ථාන නිර්මාණය කිරීම සඳහා වූ අධිෂ්ඨාන සහගත උත්සාහය දේශීය හා ජාත්‍යන්තර වශයෙන් රාජ්‍ය හා පෞද්ගලික ආයතන විසින් හඳුනා ගෙන තිබේ.

## කීර්ති ගුණතිලක මහතා

අධ්‍යක්ෂ

කීර්ති ගුණතිලක මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය ලබා ගත් අතර විශේෂිත පරිගණක දෘඩාංග ඉංජිනේරු පිළිබඳව එක්සත් රාජධානියේ රීඩින්ග් විශ්වවිද්‍යාලයේ සයිබර් නෙටික්ස් අධ්‍යයනාංශයෙන් විශේෂඥතාවය ලබාගත්තේය. තොරතුරු තාක්ෂණය, ඩිජිටල් අධිකරණ විද්‍යාව, යටිතල පහසුකම් උපදේශනය, ව්‍යාපෘති කළමනාකරණය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ දශක තුනකට අධික අත්දැකීම් ඔහු සතුව ඇත.

එක්සත් රාජධානියේ ජාතික පොලිස් වැඩිදියුණු කිරීමේ නියෝජිතායතනයේ ජංගම දුරකථන අධිකරණ වෛද්‍ය විද්‍යාව, ජාල විමර්ශනය, දත්ත ප්‍රතිසාධනය සහ විශ්ලේෂණයන් ආවරණය කරන ජාත්‍යන්තර ව පිළිගත් වෘත්තීය සුදුසුකම් රාශියක් සමග ජපානයේ බහුමාධ්‍ය සන්නිවේදන ඉංජිනේරු KDDI කෝපරේෂන්, ජපානයේ විදේශීය තාක්ෂණික ශිෂ්‍යත්වයේ බහුමාධ්‍ය පද්ධති සංවර්ධනය, NEC මේන්ෆ්‍රේම් පරිගණක නඩත්තුව NEC, ජපානය, මිකැට්‍රොනික් සිස්ටම් ටෙක්නොලොජි, සිංගප්පූරුව ආවරණය කරමින් ජාත්‍යන්තර පිළිගත් වෘත්තීය සුදුසුකම් ඔහු ලබා ඇත. ගුණතිලක මහතා ජාතික අවශ්‍යතා පිළිබඳ ව්‍යාපෘතිවල උපදේශක/TEC සාමාජිකයෙකු සහ උපදේශකයෙකු ලෙස ප්‍රධාන කාර්යභාරයක් ඉටුකර ඇත. ආරක්ෂක අමාත්‍යාංශයේ eNIC ව්‍යාපෘතිය, ප්‍රවාහන අමාත්‍යාංශයේ පොදු ප්‍රවාහන බස් ලුහුබැඳීමේ පද්ධතිය, මොරටුව විශ්වවිද්‍යාලයේ ශ්‍රී ලංකා අන්තර්ජාල ව්‍යාපෘතිය ඒවාට ඇතුළත් වේ.

එක්සත් රාජධානියේ කැන්ටබරි ක්‍රයිස්ට් චර්ච් විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද සයිබර් අපරාධ අධිකරණ හා අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේ ජාත්‍යන්තර උපදේශක කමිටු සාමාජිකයෙකු ලෙස කීර්ති ගුණතිලක මහතා සේවය කර ඇති අතර උපදේශක, සම්බන්ධීකාරක, පරිගණක ක්‍රමලේඛක, පරිගණක උපදේශක, තාක්ෂණික පර්යේෂණ සහකාර, කමිටු සාමාජික යන තනතුරු දරා ඇත. කොළඹ විශ්වවිද්‍යාලයේ විවිධ වෘත්තීය කමිටුවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, බලශක්ති කළමනාකරු, වක්‍රප්‍රතිපාර්ශ්වකරු සහ ප්‍රාදේශීය ප්‍රතිපාර්ශ්වකරු තනතුරු දරා ඇත. ඔහු 1991 සිට ශ්‍රී ලංකාවේ පරිගණක සංගමයේ වෘත්තීය සාමාජිකයෙකි.

ඔහු ඩිජිටල් අධිකරණ වෛද්‍ය මධ්‍යස්ථානයේ නිර්මාතෘ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසලේ (යූසීඑස්සී) ඉංජිනේරු අංශයේ ආරම්භකයා මෙන්ම පරිගණක තාක්ෂණ ආයතනයේ සහ කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසලේ ආරම්භක සාමාජිකයා ද විය.

දශක තුනක කාලයක් තුළ කොළඹ විශ්වවිද්‍යාලයට ඔහු කළ කැපවීම වෙනුවෙන් කළ සේවය අගයමින් ඔහුට බොහෝ වාර ගණනක් සම්මාන ප්‍රදානය කර ඇත.

## මංජුල වෙල්ලාලගේ මහතා

අධ්‍යක්ෂ

මංජුල වෙල්ලාලගේ මහතා නීතිඥවරයෙකි. ඔහු දශක දෙකකට ආසන්න කාලයක් පෞද්ගලික නීතිඥ සංගමයේ ප්‍රායෝගිකව කටයුතු කරයි. නීතිඥයෙකු වීමට පෙර ඔහු අධිකරණ අමාත්‍යාංශයේ මූලිකත්වය ගත් ප්‍රජා පාදක නීති ආධාර ව්‍යාපෘතිය භාර සම්පත් හා පර්යේෂණ නිලධාරියා ලෙස සේවය කළේය. ඔහු අධිකරණ අමාත්‍යාංශයේ සම්පත්, පර්යේෂණ හා තොරතුරු මධ්‍යස්ථානයට (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු) සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු සඳහා සම්පත් නිලධාරී වශයෙන් ඔහු සිය රාජකාරි ඉටු කළේය.

අධිකරණ අමාත්‍යංශය වෙනුවෙන් ජාතික මට්ටමින් තීරණාත්මක නීතිමය ගැටලු විසඳීමට මැදිහත් වන අතරම, වෙල්ලාලගේ මහතා සිය කීර්තිමත් නීති වෘත්තිය තුළ ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ පිළිබඳ ව්‍යාපෘති හා වැඩසටහන් රාශියක් සංවිධානය කර ඇත.

## කේ ඒ විමලෙන්තිරරාජා මහතා

අධ්‍යක්ෂ

2020 ජනවාරි මාසයේ දී මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට භාණ්ඩාගාර නියෝජිත/මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයා ලෙස කේ ඒ විමලෙන්තිරරාජා මහතා පත් කරන ලදී. ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු වන අතර රාජ්‍ය සේවයේ වසර 25 කට වැඩි පළපුරුද්දක් ඇත. ඔහු මේ වන විට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස කටයුතු කරයි.

ඔහු නීතිඥවරයෙකි.

විමලෙන්තිරරාජා මහතා යාපනය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය, මොරටුව විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය සහ ශ්‍රී ලංකාවේ විවෘත විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධියක් ලබා ඇත. ඔහු සංවර්ධන අධ්‍යයන හා රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්, ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව සහ තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව ලබා ඇත.

මහා භාණ්ඩාගාරයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ධුරයට පත්වීමට පෙර ඔහු රාජ්‍ය සේවයේ විවිධ තනතුරු හොබවා ඇති අතර ඒවාට අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, පරිපාලන ප්‍රතිසංස්කරණ භාර ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධාන තොරතුරු නිලධාරී, චීනයේ බීජිං හි පිහිටි ශ්‍රී ලාංකික තානාපති කාර්යාලයේ අමාත්‍ය උපදේශක යන ඒවා ඇතුළත්ය.

විමලෙන්තිරරාජා මහතා සාර්ක් සංවර්ධන අරමුදලේ ශ්‍රී ලංකාවේ අධ්‍යක්ෂකවරයා සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ හිටපු නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂවරයා වේ. ඔහු ලංකා බැංකුව, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකාවේ ආයෝජන මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් වැඩිදියුණු කිරීමේ ආයතන වල අධ්‍යක්ෂ ලෙස සහ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සභාපති ලෙස මහා භාණ්ඩාගාරය නියෝජනය කර ඇත.

# ආයතනික කළමනාකරණය



ඉදිරිපෙළ වමේ සිට දකුණට:
අරුණි ගුණතිලක මහත්මිය, එස් වන්නිආරච්චි මහතා, බී එම් ප්‍රේමනාත් මහතා, ජී පී ආර් ජයසිංහ මහතා, කේ බී රාජපක්ෂ මහතා, එම් ඒ බී සිල්වා මහතා

පසු පෙළ වමේ සිට දකුණට:
එම් කේ ද එස් ගුණරත්න, එන් ආර් විජයරත්න මිය, පී එස් කුරුකුලසූරිය මිය, වී කේ නාරංගොඩ මිය, ඊ ඒ ඩී ප්‍රියශාන්ත මහතා



ඉදිරිපෙළ වමේ සිට දකුණට:
ජී බී ආර් පී ගුණවර්ධන මහතා, ආර් පතිරගේ මහතා, ක්ලයිව් ෆොන්සේකා මහතා, ජී ලයනල් මහතා, ආර් කොඩිතුවක්කු මහතා, අසාම් ඒ අහමට් මහතා

පසු පෙළ වමේ සිට දකුණට:
එම් ඒ ඩී මුදිතා කරුණාරත්න මිය, පී ආර් එස් ජයතිස්ස මයා, පී එම් ආර් විජේරත්න, ධම්මික දාස මහතා

## 01/ එම් ඒ බී සිල්වා මයා

වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

1987 වසරේ බැංකුවේ සේවයට එක් වූ සිල්වා මහතා වසර 32 කට අධික පළපුරුද්දක් සමගින් බැංකුකරණ මෙහෙයුම් පිළිබඳ මහත් වූ පරිචයක් සහිත වෘත්තිකයෙකි.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - බැංකු මෙහෙයුම් වශයෙන්, එක් එක් අංශයේ කාර්යයන් සම්බන්ධයෙන් වගකීම දැරීම සඳහා වෙන් වෙන් වශයෙන් පත් කළ අංශ ප්‍රධානීන් යටතේ ක්‍රියාත්මක වන ශාඛා කළමනාකරණ අංශය, 739 ක් වූ ශාඛා ජාලය සහ 500 ඉක්මවන ATM යන්ත්‍ර, CDM යන්ත්‍ර සහ KIOSK යන්ත්‍ර ආදියෙන් සමන්විත අතිරේක ජාලයේ නියමන අංශ, අලෙවිකරණ, තොරතුරු තාක්ෂණ හා සහායක සේවා අංශ යන ප්‍රධාන අංශ හතරේ කාර්යයන් අධීක්ෂණය කිරීමේ වගකීම සිල්වා මහතා උසුලනු ලැබීය.

ශාඛා කළමනාකාර තනතුරේ පටන් ප්‍රාදේශීය කළමනාකාර දක්වාත්, කලාප සහකාර සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරේ සිට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - බැංකු මෙහෙයුම් තනතුර දක්වා වූ විවිධ තනතුරු දරමින් ව්‍යාපාරික බැංකුකරණ කළමනාකරන කටයුතු හා සම්බන්ධ සියලුම මට්ටම්වල අත්දැකීම් රාශියක් සිල්වා මහතා ලබාගෙන ඇත.

ඔහු විශේෂඥතාව දක්වන විෂය ක්ෂේත්‍රය පිළිබඳව විස්තීර්ණ දේශීය හා විදේශීය පුහුණුව හා අත්දැකීම් ලබා ඇති අතර පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ (ශාස්ත්‍රවේදී) උපාධිධරයෙක් වේ. ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරණ ආයතනයේ සුදුසුකම් (AIB) ලබා ඇති සිල්වා මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද ලබා ඇත.

## 02/ ජී බී ආර් පී ගුණවර්ධන මයා

හිටපු ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී

ගුණවර්ධන මහතා 2019 අප්‍රේල් 15 දින සිට බල පැවැත්වෙන පරිදි මහජන බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී ලෙස පත් කරන ලදී.

බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරී ධුරයට පත්වීමට පෙර ඔහු ආයතනික හා ව්‍යවසාය ණය අධීක්ෂණය කළ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපාර බැංකුකරණය) ලෙස සේවය කළේය. බැංකුවේ සමස්ත ණය ප්‍රදානවලින් 50% කට වඩා සාමූහිකව දායක වන රාජ්‍ය ව්‍යවසායන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ණය මෙයට ඇතුළත් වේ.

ගුණවර්ධන මහතා 1987 දී මහජන බැංකුවට බැඳුණු අතර දශක හතරකට අධික කාලයක් පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ආයතනවල සේවය කර ඇති අතර ඉන් දශක තුනකට වැඩි කාලයක් බැංකු හා මූල්‍ය සේවාවන්හි සේවය කර ඇත.

එම මහතා මහජන බැංකුවේ මූල්‍ය, කාර්යසාධන කළමනාකරණය, ආයතනික හා වාණිජ ණය, භාණ්ඩාගාර මෙහෙයුම්, ණයපාලනය සහ අවදානම් කළමනාකරණය යන විවිධ අංශවල සේවය කර ඇත. ඔහු සතුව බැංකුවේ ආයතනික හා විධායක කලමනාකරණ නිලයන්හි වසර 10 කට අධික අත්දැකීම් පවතින අතර හෙතෙම 2012 සිට 2017 දක්වා ප්‍රධාන අවදානම් නිලධාරියා වශයෙන් කටයුතු කළේය. එම ධුරයේ ක්‍රියා කරන කාලසීමාවේදී බැංකුවේ සමස්ත අවදානම් කලමනාකරණ රාමුව හැඩගැස්වීමෙහිලා සහ 2012/2013 උකස් අර්බුදය නිරාකරණය කිරීමෙහිලා හෙතෙම කැපී පෙනෙන කාර්යභාරයක් ඉටු කළේය.

ගුණවර්ධන මහතා දැනට පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී, පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ්, ලංකා එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ් (බංග්ලාදේශය), පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී, පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී, පීපල්ස් ට්‍රැවල්ස් (පුද්) සමාගම, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය, ශ්‍රී ලංකා බැංකු සංගමය, ශ්‍රී ලංකාවේ ණය තොරතුරු කාර්යාංශය, ලංකා මූල්‍ය සේවා කාර්යාංශය, ජාතික ගෙවීම් සභාව සහ ලංකා ක්ලියර් හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද සේවය කරයි.

මහජන බැංකුවට බැඳීමට පෙර ඔහු පෞද්ගලික අංශයේ සේවය කළ අතර සංචාරක, වැවිලි හා ඉදිකිරීම් යන ක්ෂේත්‍රයන් හි තනතුරු රැසක් හෙබවීය.

හෙතෙම 1985 සිට වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (එක්සත් රාජධානිය) සාමාජිකයෙකි.

## 03/ කේ බී රාජපක්ෂ මයා

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -
පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය

රාජපක්ෂ මහතා බැංකුවේ පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය, ක්‍රියාවලි කළමනාකරණය, තත්ත්ව සහතික කිරීම සහ ඩිජිටල්කරණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා වේ. ඔහු කළමනාකරණ පුහුණුකරුවෙකු ලෙස 1987 දී බැංකුවට බැඳුණු අතර මහජන බැංකුවේ වසර 32 කට වැඩි පළපුරුද්දක් ඇත.

හෙතෙම බැංකුවේ ශාඛා ජාලය තුළ විවිධ කළමනාකරණ මට්ටම් වල මෙන්ම ආයතනික බැංකුකරණ අංශයේ සේවය කිරීමෙන් පෘථුල අත්දැකීම් ලබා ඇත. මේ වනවිට ඔහු බැංකුවේ ප්‍රධාන තැන්පතු කළඹ සහ මුළු කළඹින් 40% කට වඩා වැඩි ප්‍රමාණයක් වන පුද්ගල කේන්ද්‍රීය ණය කළඹ අධීක්ෂණය කරයි. ඔහුට ආයතනික හා විධායක කළමනාකරණ තනතුරු පිළිබඳ වසර 12 ක පළපුරුද්දක් ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ දෙවන පන්තියේ ගෞරව උපාධියක් ලබා ඇති ඔහු කැලණිය විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණ හා තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකයෙකු, නීතිඥවරයෙකු සහ ශ්‍රී ලංකාවේ ණය කළමනාකරණ ආයතනයේ ඩිප්ලෝමාවක් ද ලබා ඇත.

රාජපක්ෂ මහතා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස ද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙසද 2019 මැයි දක්වා ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙසද සේවය කර ඇත. වර්තමානයේ ඔහු ශ්‍රී ලංකාවේ වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ (APB) උපසභාපතිවරයා වේ.

## 04/ රොහාන් පතිරගේ මයා

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් සහ නීති

පතිරගේ මහතා 1995 දී මහජන බැංකුවට සම්බන්ධ විය. ඔහුට බැංකුවේ මානව සම්පත්, නෛතික හා පරිපාලනය පිළිබඳ වසර 25 කට වැඩි පළපුරුද්දක් ඇත.

පතිරගේ මහතා වසර 2003දී නවසීලන්තයේ මැසි විශ්වවිද්‍යාලයෙන් බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇත. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීති උපාධියක් ලබා ඇත. ඔහුට බැංකුකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ඇති අතර නීතිඥයකු ද වේ.

ඔහුගේ වර්තමාන කාර්යභාරය තුළ, ඔහු බැංකුවේ 7,500 කට වඩා වැඩි ශක්තිමත් ශ්‍රම බලකායක් අධීක්ෂණය කරන අතර එහි මානව සම්පත් අවශ්‍යතාවන්ට අනුකූලව එහි ජ්‍යෙෂ්ඨ විධායක බඳවා ගැනීම් කළමනාකරණය කරයි. ඊට අමතරව, ඔහු බැංකුවේ 75 දෙනෙක් වූ නීති කණ්ඩායමට නායකත්වය සපයයි. හෙතෙම ආයතනික හා විධායක කළමනාකරණ තනතුරු වල වසර 10 කට වැඩි කාලයක් සේවය සපයා ඇත.

මීට පෙර 2010 අගෝස්තු සිට 2019 මාර්තු දක්වා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස පතිරගේ මහතා බැංකුව හා අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි විවිධ අනුකමිටුවලට අදාළ සියලු පරිපාලනමය කටයුතු සඳහා සහාය ලබා දුන්නේය. සිය ධුර කාලය තුළ, පාලනය පිළිබඳ යහ ක්‍රියාකාරකම් රැසක් හඳුන්වා දුන් අතර, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී, පීපල්ස් ඉන්ෂුරන්ස් පීඑල්සී, පීපල්ස් ප්‍රොපර්ටි ඩිවෙලප්මන්ට් ලිමිටඩ් සහ පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ් ඇතුළු බැංකුවේ පරිපාලිත සමාගම් කිහිපයක් පිහිටුවීමට දායක වී තිබේ.

ඔහු පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි ස්වාධීන නොවන, විධායක නොවන අධ්‍යක්ෂක, බංග්ලාදේශයේ ලංකා එලායන්ස් ෆිනෑන්ස් ලිමිටඩ්, පීපල්ස් මයික්‍රෝ කොමර්ස් ලිමිටඩ්, පීපල්ස් ලීසිං ෆ්ලීට් මැනේජ්මන්ට් ලිමිටඩ් හි අධ්‍යක්ෂක සහ පීපල්ස් ලීසිං හැව්ලොක් ප්‍රොපර්ටීස් ලිමිටඩ්හි සභාපතිවරයා ද වේ.

## 05/ ජී පී ආර් ජයසිංහ මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -
ක්‍රියාවලි කළමනාකරණ සහ තත්ත්ව සහතිකකරණ

රේණුකා ජයසිංහ මහත්මිය 1987 දී කළමනාකරණ අභ්‍යාස ලාභියෙකු ලෙස බැංකුවට බැඳුණු අතර බැංකු ක්ෂේත්‍රයේ වසර 32 කට වැඩි පළපුරුද්දක් ඇත.

ඇය සිය වෘත්තීය ජීවිතය තුළ ශාඛා කළමනාකරු, කලාපීය ජ්‍යෙෂ්ඨ කළමනාකරු, ප්‍රාදේශීය කළමනාකරු සහ සහකාර සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපාර සහාය සේවා), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සමුපකාර හා සංවර්ධන) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පුද්ගල කේන්ද්‍රීය බැංකු) යන අංශවල ශාඛා බැංකු ක්ෂේත්‍රය ආවරණය කර ඇත. වර්තමානයේ ඇය ක්‍රියාවලි කළමනාකරණය සහ තත්ත්ව සහතික කරණය පිළිබඳ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කරයි.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී පළමු පන්තියේ විශේෂ උපාධියක් ලබා ඇති අතර වෘත්තීය බැංකු සුදුසුකම් (AIB - ශ්‍රී ලංකා ) ලබා ඇත. ඇය ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ යාවජීව සාමාජිකාවකි.

## 06/ ක්ලයිව් ෆොන්සේකා මයා

භාණ්ඩාගාර හා ආයෝජන බැංකුකරණ ප්‍රධානී

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි අධි සාමාජිකයකු වන ෆොන්සේකා මහතා, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙහි ව්‍යාපාර කළමනාකරණ විද්‍යාපති උපාධිධරයකු වේ. හෙතෙම ACI Dealing Certificate විභාගයේදී විශිෂ්ට සාමාර්ථයක් ලබා ඇති අතර භාණ්ඩාගාර කළමනාකරණය සම්බන්ධයෙන් වසර 26 කට අධික අත්දැකීම් ඔහු සතු වේ. එයට අමතරව, හෙතෙම ඕස්ට්‍රේලියාවේ කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සහතිකලත් සාමාජිකයෙකි. ඔහු 2018 ජූලි මාසයේදී ප්‍රාථමික ගනුදෙනුකරුවන්ගේ සංගමයේ සභාපති ලෙස පත් කරන ලද අතර වර්තමානයේ මෙම තනතුරේ කටයුතු කරයි. ඔහු ජාතික ගෙවීම් කවුන්සිලයේ, මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශන කමිටුවේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නව විකල්ප මිණුම් දණ්ඩක පොලී අනුපාත අධ්‍යයනය කිරීම හා සැලසුම් කිරීම සඳහා වූ කාර්යසාධක බලකායේ සාමාජිකයෙකි. තවද, ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ IABF/DABF විභාගවල ප්‍රධාන පරීක්ෂක ලෙස කටයුතු කර ඇත.

ඔහු 2002 දී මහජන බැංකුවට බැඳුණු අතර ඊට පෙර ඔහු ඇමරිකානු එක්ස්ප්‍රස් සහ ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් යන බැංකුවල සේවය කර ඇත. ඔහු 2011 නොවැම්බර් සිට මහජන බැංකුවේ ජ්‍යෙෂ්ඨ ආයතනික කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයෙකි.

## 07/ බී එම් ප්‍රේමනාත් මයා

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - බැංකු සහාය සේවා

ප්‍රේමනාත් මහතා 1987 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස මහජන බැංකුවට බැඳුණු අතර වසර 33 කට ආසන්න කාලයක් සේවය කර ඇත. ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී දෙවන පන්තියේ ඉහළ පෙළ උපාධියක් ලබා ඇති අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අන්තර් මාධ්‍ය පරීක්ෂණය (AIB Intermediate) සහතිකලත් වෘත්තිකයෙකි.

2011 සිට ඔහු නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බැංකු සහාය සේවා) තනතුර දරන අතර සැපයුම්, ප්‍රවාහන, ආරක්ෂාව, නඩත්තු ඉංජිනේරු, ගොඩනැගිලි ඉංජිනේරු සහ ඩෙස්ක්ටොප් ප්‍රකාශන යන අංශ හයක් භාරව සිටී. එහිදී ඔහු ප්‍රසම්පාදන, ඉදිකිරීම් සහ නඩත්තු කිරීම, ගබඩාකිරීම සහ තොග පාලනය, ප්‍රවාහන හා ආරක්ෂක ක්‍රියාපටිපාටිය පිළිබඳ මනා පළපුරුද්දක් ලබා ඇත.

ඔහුගේ බැංකු ජීවිතය තුළ ඔහු දේශීය හා ජාත්‍යන්තර වශයෙන් විවිධ කළමනාකරණ වැඩසටහන් වලට සහභාගී වී ඇති අතර ව්‍යාපාර බැංකුකරණය කළමනාකරණය පිළිබඳ මනා දැනුමක් ඇත.

# ආයතනික කළමනාකරණය

## 08/ ජී ලයනල් ගලගෙදර මයා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ශාඛා කළමනාකරණය

ලයනල් ගලගෙදර මහතා බැංකුවේ ශාඛා කළමනාකරණ දෙපාර්තමේන්තුව භාරව සිටී. ඔහු කළමනාකරණ අභ්‍යාස ලාභියෙකු ලෙස බැංකුවට බැඳුණු අතර බැංකුවේ වසර 32 කට වැඩි කාලයක් සේවය කරයි. ශාඛා කළමනාකරණය, පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය, ආයතනික බැංකුකරණය, ව්‍යාපෘති මූල්‍යකරණය, ණය පරිපාලනය සහ අය කර ගැනීම් යන ක්ෂේත්‍ර වල විවිධ අත්දැකීම් ලබා ඇත.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී (විශේෂ) උපාධියක් සහ ශ්‍රී ලංකාවේ විවෘත විශ්වවිද්‍යාලයෙන් (එල්එල්බී) උපාධියක් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහකාර සාමාජිකයෙකු වන අතර නීතිඥවරයෙකි.

## 09/ එස් වන්නිආරච්චි මයා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අය කිරීම්

කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස සුනිල් වන්නිආරච්චි මහතා 1987 දී මහජන බැංකුවට බැඳුණු අතර ශාඛා බැංකුකරණය, එස්එම්අයි ණයදීම, ජාත්‍යන්තර බැංකුකරණය, වෙළඳ මූල්‍යකරණය සහ ලීසිං ඇතුළු ක්ෂේත්‍ර කිහිපයක සේවය කර ඇත. ණය දීම සහ අක් වෙරළ බැංකු කටයුතු පිළිබඳ ඔහු විශාල අත්දැකීම් ලබා ඇත.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් ලබා ඇති අතර උපාධිය ලබාගත් විගසම එහි රසායන විද්‍යාව පිළිබඳ සහකාර කථිකාචාර්යවරයකු ලෙස සේවය කළේය. ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ගත්තේය. ඔහු ශ්‍රී ලංකාවේ බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි. මෑතකදී ඔහු පිළිවෙලින් ශ්‍රී ලංකාවේ බැංකුකරුවන්ගේ ආයතනයේ සහ බැංකුකරුවන්ගේ වෙළඳ මූල්‍ය සංගමය යන වෘත්තීය ආයතනවල සභාපති සහ ජ්‍යෙෂ්ඨ උපසභාපති තනතුරු හෙබවීය. ඔහු 2017 පෙබරවාරි 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි වසර තුනක කාලයක් ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු වන අතර එහි විගණන කමිටුවේ ද සාමාජික තනතුරක් දරයි. ඔහු ලංකා විදුලිබල මණ්ඩලයේ ගල් අඟුරු බලාගාර ව්‍යාපෘති මගින් ගල් අඟුරු මිලදී ගැනීමේ තාක්ෂණික කමිටුවේ සාමාජිකයෙකි. අභ්‍යන්තර වශයෙන් ඔහු බැංකුවේ දුක්ගැනවිලි හැසිරවීමේ කමිටුවේ සභාපති, දිස්ත්‍රික් ස්ථාන මාරු අභියාචනා කමිටුවේ සභාපති, ප්‍රසම්පාදන කමිටු සාමාජික, මිල ප්‍රමන්තණ කමිටු සාමාජික, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කළමනාකාරිත්ව ඇගයීම් කමිටු සාමාජික ආදි තනතුරු රැසක් දරයි.

## 10/ ආර් කොඩිතුවක්කු මයා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -
වාණිජ බැංකුකරණය සහ ඩිජිටල්කරණය

කොඩිතුවක්කු මහතා දැනට මහජන බැංකුවේ වාණිජ බැංකුකරණ සහ ඩිජිටල්කරණය පිළිබඳ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා වේ. පාරිභෝගික බැංකුකරණය, වාණිජ බැංකුකරණය, ආයතනික බැංකුකරණය, අක්වෙරළ බැංකුකරණය, ශාඛා බැංකුකරණය, ජාත්‍යන්තර බැංකුකරණය, ව්‍යාපෘති මූල්‍යකරණය, අයකර ගැනීම් සහ ඩිජිටල්කරණය යන අංශයන්හි පුළුල් පරාසයක වසර 37කට වඩා වැඩි බැංකු අත්දැකීම් ඔහු සතුව ඇත.

පුළුල් දේශීය හා ජාත්‍යන්තර පුහුණුව/අත්දැකීම් සහ විවිධ භූගෝලීය ස්ථානවල විවිධ මට්ටමින් සේවය කර ඇති ඔහු මේ වන විට අංශ දෙකක් මෙහෙයවයි. එනම් වාණිජ බැංකුකරණය සහ බැංකුවේ ඩිජිටල්කරණයයි.

බැංකුවේ ඩිජිටල්කරණ මුලපිරීමේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා වශයෙන්, ඔහුගේ විෂයපථයට මූලිකවශයෙන් ව්‍යාපාර අවශ්‍යතා ඩිජිටල් වේදිකාවක් සමග සිතියම් ගතකිරීම හා කර්මාන්තයේ හොඳම භාවිතයන් අනුගමනය කිරීම සහ ව්‍යාපාර ක්‍රියාවලීන් ප්‍රතිනිර්මාණය කිරීම ඇතුළත් වේ. ඩිජිටල්කරණය පිළිබඳ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස, ඒෂියන් බෑන්කර් සහ ඒෂියා මනී සඟරා විසින් ශ්‍රී ලංකාවේ හොඳම ඩිජිටල් බැංකුව ඇතුළු ජාත්‍යන්තර හා දේශීය වශයෙන් කීර්තිමත් සම්මාන/පිළිගැනීම් බැංකුව ලබාගෙන ඇත. ඔහු බැංකුවේ වාණිජ ණය දීමේ කළඹට නායකත්වය දෙයි.

ඔහු පීපල්ස් ඉන්ෂුවරන්ස් පීඑල්සී සහ බංග්ලාදේශයේ ලංකා බංග්ලා ෆයිනෑන්ස් ලිමිටඩ් හි අධ්‍යක්ෂවරයකු ලෙස ද, ශ්‍රී ලංකා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සහ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් මණ්ඩලයේ විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙසද සේවය කරයි.

කොඩිතුවක්කු මහතා කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය පිළිබඳ විශේෂ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධියත්, එක්සත් රාජධානියේ නිව් බකිංහැම්ෂයර් විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධිය ද (ගෞරව) ලබා ඇති අතර ශ්‍රී ලංකාවේ බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි.

## 11/ අරුණි ගුණතිලක මිය
ආයතනික බැංකුකරණ ප්‍රධානී

ගෝලීය බැංකුකරණ හා මූල්‍ය ක්ෂේත්‍රයන්හි වසර 20 කට අධික අත්දැකීම් ගුණතිලක මහත්මිය සතු වේ. ඇය දැනට ආයතනික බැංකුකරණ ප්‍රධානී වේ. මහජන බැංකුව හා සම්බන්ධ වීමට ප්‍රථම, ඇය විසින් සිංගප්පූරුවේ ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ සේවය කරමින් කලාපීය හා ජාත්‍යන්තර වශයෙන් ආසියාව, ඇමරිකාව, මැදපෙරදිග හා අප්‍රිකාව ආශ්‍රිතව කාර්යභාරයන් රැසක් ඉටුකරන ලදී. එයට ද පෙර ඇය ශ්‍රී ලංකාවේ ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරිනිය වශයෙන් කටයුතු කළාය. ANZ ග්‍රින්ඩ්ලේස් සහ ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවල සේවය කළ කාලය තුළ සිල්ලර බැංකුකරණ, ආයතනික සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය බැංකුකරණ, ශාඛා, අවදානම්, විගණන සහ විශේෂ වත්කම් කළමනාකරණය සම්බන්ධ ජ්‍යෙෂ්ඨ තනතුරු රැසක් හෙබ වූවාය.

එක්සත් ජනපදයේ හාවර්ඩ් නීතිවිද්‍යාලයේ නීතිවේදය පිළිබඳ විශේෂ උපාධියක්ද, කොළඹ විශ්වවිද්‍යාලයේ නීතිවේදී (ගෞරව) උපාධිය ද ඇය සතුවේ. ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ, නීති පීඨයේ සහ උපාධි අධ්‍යයන අංශයේ කථිකාචාර්යවරියක වශයෙන් සේවය කළාය.

ගුණතිලක මහත්මිය බැංකු ක්ෂේත්‍ර අවදානම් වෘත්තිකයින්ගේ සංගමයේ ආරම්භක සාමාජිකාවක, කාන්තා කර්මාන්ත හා වාණිජ මණ්ඩලයේ හිටපු කමිටු සාමාජිකාවක හා ලංකා වාණිජ මණ්ඩලයේ නියමු කමිටු සාමාජිකාවක වූවාය. සිංගප්පූරු අධ්‍යක්ෂවරුන්ගේ සංගමයෙහි සාමාජිකාවක වන ඇය, සිංගප්පූරුවේ හාවර්ඩ් ක්ලබ්හි හිටපු කමිටු සාමාජිකාවක්ද වූ අතර මේ වනවිට ඕවර් සීස් ස්කූල් ඔෆ් කලම්බු හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක් වශයෙන් කටයුතු කරයි.

## 12/ අසාම් ඒ අහමට් මයා
මූල්‍ය ප්‍රධානි

2017 ජනවාරි 3 වැනි දින මහජන බැංකුවේ සේවයට එක්වූ අහමට් මහතා සතුව, දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ක්‍රමෝපායික මූල්‍ය කළමනාකරණය, විකල්ප ආයෝජන හා ව්‍යවසාය අවදානම යන ක්ෂේත්‍රයන්හි වසර 18කට අධික පළපුරුද්දක් පවතී. බැංකුව සමග සම්බන්ධ වීමට පෙර හෙතෙම මහා පරිමාණ බහු ජාතික සමාගම් සහ මූලික ප්‍රාග්ධන සේවා සම්පාදකයින් රැසක් සමග කටයුතු කොට තිබිණි. ඒ මහතා වරලත් කළමනාකරණ ගණකාධිකාරී සංගමය (එක්සත් රාජධානිය), වරලත් සහතික ලත් ගණකාධිකාරී සංගමය (එක්සත් රාජධානිය) සහ ශ්‍රී ලංකා සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයෙහි අධිසාමාජිකයෙකි. හෙතෙම වරලත් සුරැකුම් හා ආයෝජන ආයතනය(එක්සත් රාජධානිය), සහතික ලත් සේවයේ නියුතු ගණකාධිකාරී ආයතනය (ඕස්ට්‍රේලියාව), අවදානම් කළමනාකරණ ආයතනය (එක්සත් රාජධානිය) සහ වරලත් ණය කළමනාකරණ ආයතනයෙහිද (එක්සත් රාජධානිය) සාමාජිකත්වය දරයි.

## 13/ ඊ ඒ ඩී ජේ ප්‍රියශාන්ත මයා
සමූහ ප්‍රධාන අභ්‍යන්තර විගණක

ජනිත ප්‍රියශාන්ත මහතා 1994 දී කළමනාකරණ අභ්‍යාසලාභියකු වශයෙන් මහජන බැංකුවේ සේවයට එක්විය.

ජනිත ප්‍රියශාන්ත මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙහි අධිසාමාජිකයකු, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකයකු සහ ඕස්ට්‍රේලියාවේ සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරී ආයයතනයෙහි සහතික ලත් සාමාජිකයකු වන අතර, හෙතෙම දෙවන පංතියේ ඉහළ සාමාර්ථ සහිත වාණිජවේදී විශේෂ උපාධිධරයෙකි.

බාහිර හා අභ්‍යන්තර යන දෙඅංශයේම බැංකු, මූල්‍ය හා විගණනය පිළිබඳ වසර 30 කට වැඩි පළපුරුද්දක් ඔහු සතුව ඇත.

## 14/ එම් ඒ ඩී මුදිතා කරුණාරත්න මිය
අතිරේක ප්‍රධාන නීති නිලධාරිනී

මුදිතා කරුණාරත්න මහත්මිය වසර 30 කට අධික පළපුරුද්දක් සහිත නීතිවේදිනියක වන අතර, “බැංකුකරණය හා රක්ෂණය සම්බන්ධ පශ්චාත් නීතිවේදී ඩිප්ලෝමාවක්” ඇය සතුවේ. ඇය 2007 වසරේ බැංකුකරණ නීති ත්‍යාගය දිනා ගැනීමට සමත්විය. නීති වේදිනියක වශයෙන් දිවුරුම් දීමෙන් අනතුරුව ඇය දිවංගත ජනාධිපති නීතිඥ ඒ පී දැරණියගල මහතා යටතේ සේවයට එක් වුනු අතර, ඉන් අනතුරුව බ්‍රවුන්ස් සමාගම් සමූහයේ සහකාර ප්‍රධාන නීති නිලධාරී සහ සමාගම් ලේකම් ලෙස කටයුතු කළාය.

1992 දී සහකාර නීති නිලධාරිනියක වශයෙන් මහජන බැංකුවේ සේවයට එක්වූ ඇය, කලුතර හා ගාල්ල කළාපය, ප්‍රධාන කාර්යාල නීති දෙපාර්තමේන්තුව සහ ඉඩම් නිරවුල් කිරීමේ අංශයෙහි ප්‍රධානියා වශයෙන් කටයුතු කළාය. 2006 වසරේදී ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිනියක වශයෙන් උසස්වීමක් ලද ඇය, ඉන් අනතුරුව නීති දෙපාර්තමේන්තුව, ප්‍රධාන කාර්යාලය සහ උතුරු හා නැගෙනහිර පළාත්වල නීති කටයුතු අධීක්ෂණය කිරීමේ නිරත විය.

වසර 2007 දී එතුමිය ශ්‍රී ලංකාවේ ඛණිජ තෙල් සහ ගෑස් සම්බන්ධ නියාමන අධිකාරිය වන, ඛණිජ සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලයේ නීති හා ඉඩම් අධ්‍යක්ෂ වශයෙන් සේවයට එක් විය. එම අවධියේ ඛණිජ තෙල් සම්පත් සංවර්ධන කමිටුවේ ලේකම් වශයෙන්ද ඇය කටයුතු කළාය. නීතිඥවරියක් ලෙස වසර 34ක සේවා කාලය තුළ කරුණාරත්න මහත්මිය දේශීය මෙන්ම විදේශීය පුහුණු වැඩසටහන්, වැඩමුළු ආදියට එක්වෙමින් හසළ අත්දැකීම් ලබා ඇත.

## 15/ වී කේ නාරංගොඩ මිය
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී - ව්‍යවසාය බැංකුකරණය

1987 දී කලමණාකාර අභ්‍යාසලාභියෙකු වශයෙන් මහජන බැංකුවේ සේවයට එක්වූ ක්‍රිෂාන්ති නාරංගොඩ මහත්මිය වසර 33කට අධික සේවා කාලයක් සපුරාලයි.

ඇය විසින් විවිධ කළමනාකාරීත්ව මට්ටම් යටතේ ශාඛා බැංකුකරණය, විදේශ ගනුදෙනුකාර සේවාවන්, අක්වෙරළ බැංකුකරණය සහ ආයතනික බැංකුකරණය යන ක්ෂේත්‍රයන් ආවරනය කරන ලද අතර, මේ වනවිට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, සංවර්ධන මූල්‍ය සහ ක්ෂුද්‍ර මූල්‍ය යන ක්ෂේත්‍රයන් ආවරනය කරමින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරෙහි සේවය කරනු ලබයි.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දෙවන පංතියේ ඉහළ සාමාර්ථයක් සහිත ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධිධාරිනියක සහ කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයේ ව්‍යාපාර අධ්‍යයනය සම්බන්ධ විද්‍යාපති උපාධිධාරිනියකි. ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය සහ ශ්‍රී ලංකා ණය කළමනාකරණ ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකාවකි. ඇය ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ පශ්චාත් උපාධි කළමනාකරණ ආයතනයෙන් පාරිභෝගික සබඳතා කළමනාකරණය පිළිබඳ උසස් සහතිකත්වයක්ද හිමි කරගෙන ඇත.

ඇය සිය බැංකු ජීවිතය තුළ දේශීය හා විදේශීය විවිධ බැංකු/ කළමනාකරණ වැඩසටහන් සඳහා සහභාගී වී ඇත. ඇය වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයෙහි කවුන්සිල සාමාජිකාවක වශයෙන්ද කටයුතු කරන අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පරීක්ෂිකාවක වශයෙන් ලියාපදිංචිය ලබා ඇත. ඇය 2019/20 වර්ෂය සඳහා මහජන බැංකු නිලධාරීන්ගේ සංගමයේ සභාපතිනිය ලෙස තේරීපත් වූවාය.

## 16/ පී ආර් එස් ජයතිස්ස මයා
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත්

ජයතිස්ස මහතා 1990 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු වශයෙන් බැංකුවේ සේවයට එක්වූ අතර, හෙතෙම ශාඛා ජාල මෙහෙයුම් සහ මානව සම්පත් අංශයන්හි කටයුතු ආවරනය කරමින් වසර 29කට අධික සේවා කාලයක් සපුරාලයි. මානව සම්පත් ක්ෂේත්‍රයට අදාළව වසර 19කට අධික ඒ මහතාගේ පළපුරුද්ද මනා කාර්මික සබඳතා කළමනාකරණය ඇතුළුව මානව සම්පත් පරිපාලනය සහ ක්ෂේත්‍ර සබඳතා කළමනාකරණය සම්බන්ධයෙන් ද දැනුමින් පරිපූර්ණ වේ.

# ආයතනික කළමනාකරණය

ඔහු දේශීය මෙන්ම විදේශීය මානව සම්පත් සම්බන්ධ පුහුණු වැඩසටහන්වලට සහභාගී වී ඇත. ජයතිස්ස මහතා මේ වනවිට බැංකුවේ මානව සම්පත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු අධීක්ෂණය කරමින් සිටී. හෙතෙම කොළඹ විශ්වවිද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධිධරයෙකි. ශ්‍රී ලංකා වෘත්තීයමය බැංකුකරණ සුදුසුකමද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි ආශ්‍රිත සාමාජිකත්වයද ඔහු සතුවේ. ජයතිස්ස මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ පරිපාලනමය සහ අධ්‍යයන අරමුණු සඳහා ඉංග්‍රීසි භාෂාව සඳහා උසස් ඩිප්ලෝමා ලාභියෙකි.

## 17/ පී එස් ජේ කුරුකුලසූරිය මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - උපාය මාර්ගික සැලසුම්, කාර්ය සාධන කළමනාකරණය සහ පර්යේෂණ

ජයන්ති කුරුකුලසූරිය මහත්මිය 1994 දී කළමනාකාර අභ්‍යාසලාභියෙකු වශයෙන් මහජන බැංකුවේ සේවයට එක්වූ අතර මේ වනවිට වසර 25 කට අධික සේවා අත්දැකීම් සපුරාලයි. ඇගේ අත්දැකීම් ප්‍රධාන වශයෙන් ශාඛා බැංකුකරණය, ණය, කාර්ය මණ්ඩල පුහුණුව, මානව සම්පත් සංවර්ධනය, ණය පරිපාලනය, නාලිකා කළමනාකරණය සහ පුද්ගල කේන්ද්‍රීය බැංකුකරණය යන අංශවලට අයත් වේ. බැංකුව සමග සම්බන්ධ වීමට පෙරාතුව ඇය, මාර්ග ඉදිකිරීම් හා සංවර්ධන සමාගමෙහි ජ්‍යෙෂ්ඨ සහකාර ගණකාධිකාරිනියක වශයෙන් සේවය කළාය.

ඇය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දෙවන පංතියේ ඉහළ සාමාර්ථයක් සහිත (ගෞරව) විද්‍යාවේදී (විශේෂ) ව්‍යාපාර පරිපාලන උපාධිධාරිනියක සහ කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලන විද්‍යාපති උපාධිධාරිනියකි. ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධිසාමාජික (FIB), AAT ශ්‍රී ලංකා සාමාජික, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආවසරික සාමාජිකයෙක් වන අතර මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමාවක්ද (Dip HRM) ලබා ඇත.

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ උපාධි ප්‍රදානෝත්සවයේදී (1997) රන් පදක්කම් 3 ක් දිනා ගනිමින් උපරිම කුසලතා ලබා ගැනීම, අඛණ්ඩව වසර දෙකක් තුළ විභාගය සම්පූර්ණ කිරීම සහ අතරමැදි හා අවසාන විභාගවලින් ඉහළම ලකුණු ලබා ගැනීම තුළින් බැංකුවේ ප්‍රතිරූපය ඉහළ නැංවීමට ඇයට හැකි විය. එය තවමත් නොපරදවන ලද වාර්තාවකි.

## 18/ පී එම් ආර් පී විජේරත්න මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් කළමනාකරණය

බැංකුවේ අවදානම් කළමනාකරණය සහ ණය පාලන කටයුතු භාරව කටයුතු කරන්නේ රෝෂිනි විජේරත්න මහත්මියයි. 1990 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු වශයෙන් බැංකුවේ සේවයට එක්වූ ඇය, බැංකු භාණ්ඩාගාරය ආශ්‍රිතව වසර 26 කට අධික සේවා කාලයක් සපුරාලයි. අවදානම් කළමනාකරණ අංශයට පිවිසීමට පෙරාතුව ඇය 2003 වසරේ සිට බැංකුවේ ප්‍රාථමික වෙළඳ ඒකකයද පසුව භාණ්ඩාගාරයේ ද නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනිය වශයෙන් සේවය කළාය. කොළඹ විශ්වවිද්‍යාලයේ දෙවන පංතියේ ඉහළ සාමාර්ථයක් සහිත විද්‍යාවේදී (භෞතික විද්‍යාව) උපාධියක් දරයි.

කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ (මූල්‍ය පිළිබඳ) පශ්චාත් උපාධියක් සහ භාණ්ඩාගාර හා අවදානම් කළමනාකරණ ඩිප්ලෝමාවක් IBSL වෙතින් ලබාඇත. ඇය ACI ඩීලින්ග් සහතිකය - ACI, මූල්‍ය වෙළඳපොළ සංගමය සඳහා විශිෂ්ට සාමාර්ථයක් ලබා ඇති අතර ශ්‍රී ලංකාවේ බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි.

ඇය ප්‍රාථමික වෙළෙඳුන්ගේ සංගමයේ හිටපු සභාපතිවරියක සහ ලේකම්වරියක වන අතර දැනට ශ්‍රී ලංකා ෆොරෙක්ස් සංගමයේ, වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ සහ බැංකු අංශයේ අවදානම් වෘත්තිකයන්ගේ සංගමයේ සාමාජිකාවක්ද වේ.

## 19/ එන් ආර් විජයරත්න මිය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - ගනුදෙනුමය බැංකුකරණ සහ මූල්‍ය ආයතන

1990 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු වශයෙන් බැංකුවේ සේවයට එක්වූ නිපුණිකා විජයරත්න මහත්මිය බැංකුකරණ ක්ෂේත්‍රය තුළ 29 වසරකට අධික අත්දැකීම් සපුරාලන අතර බැංකුවේ ගනුදෙනුමය බැංකුකරණ සහ මූල්‍ය ආයතන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලෙස කටයුතු කරයි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් කෘෂිකර්මය සම්බන්ධ විද්‍යාවේදී උපාධියක් සහ කොළඹ විශ්වවිද්‍යාලයෙන් මූල්‍ය අධ්‍යයන සම්බන්ධ ව්‍යාපාර පරිපාලනවේදී උපාධියක් ඇය සතුවේ.

වෙළඳ සේවාවන් සහ සංගත බැංකුකරණය සම්බන්ධ හසළ අත්දැකීම් සහිත ඇය බැංකුවේ සේවයට එක්වීමට පෙර පෞද්ගලික අංශයේ සේවයේ නියුතු විය. ඇය ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකාවකි. ඇය ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ විධායක කමිටු සාමාජිකාවක් ද වේ.

## 20/ ධම්මික දාස මහතා

ප්‍රධාන තොරතුරු නිලධාරී

ධම්මිකදාස මහතා 2019 අගෝස්තු මාසයේදී මහජන බැංකුවට ප්‍රධාන තොරතුරු නිලධාරී ලෙස සම්බන්ධ විය.

ධම්මික මහතා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වසර 24 ක අත්දැකීම් වලින් සමන්විත වන්නේ උපාය මාර්ගික කළමනාකරණය, වැඩසටහන් කළමනාකරණය, ව්‍යාපෘති කළමනාකරණය, යටිතල පහසුකම් තාක්ෂණ කළමනාකරණය, මෘදුකාංග සංවර්ධනය හා ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකාවේ, ඕස්ට්‍රේලියාවේ සහ නවසීලන්තයේ මූල්‍ය, රක්ෂණ, බැංකු, නිෂ්පාදන, කාර්ය සම්පාදන, අනෙකුත් ක්ෂේත්‍ර සමගය. තොරතුරු ආරක්ෂාව ක්‍රියාත්මක කිරීම පිළිබඳව ද ඔහුට පුළුල් දැනුමක් ඇත.

ඔහු කැලණිය විශ්වවිද්‍යාලයෙන් ගණිතය හා පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ලබා ඇත. බැංකුවට බැඳීමට පෙර ඔහු Aitken Spence සමූහයේ සහ KPMG ශ්‍රී ලංකාහි ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු කිහිපයක් දරා ඇත.

21/ **එම් කේ ද එස් ගුණරත්න මයා**
වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -
ව්‍යාපාර විශ්ලේෂණය සහ ප්‍රතිනිර්මාණය

එක් එක් කුළුණු සඳහා, ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPI) සැලසුම්කර ඇති අතර 2020 වනවිට ළඟා කර ගත යුතු ඉලක්ක අගයන් සකසා ඇත. මෙම කොටසේදී, අපි එක් එක් කුළුණු මත සිදුකළ ක්‍රියාකාරකම් සහ අපගේ අරමුණු පිළිබඳව අප ප්‍රගතියක් ලබා ඇති ආකාරය පිළිබඳ යාවත්කාලීන කිරීමක් ලබා දෙන්නෙමු.

## නව්‍ය වෙළඳපොල ප්‍රමුඛ සේවාදායක අත්දැකීම් ලබාදීම

මහජන බැංකුව වශයෙන්, අපි නිරන්තරයෙන් ගනුදෙනුකරුවන්වෙත ළඟාවීමට සහ ඔවුන්ගේ බැංකු අවශ්‍යතා සපුරාලීමට මාර්ග සොයා බලමු. මූල්‍යමය වශයෙන් ඇතුළත්කිරීම සහ රටේ සියලුම පුරවැසියන්ට බැංකුකරණයට ප්‍රවේශ විය හැකි බවට අපි විශ්වාස කරමු. මේ සඳහා අපි පාරිභෝගිකයින්ට සුවිශේෂී පරිශීලක අත්දැකීමක් ලබාදෙන අසමසම කාර්යක්ෂමතාව සහ සේවා ප්‍රමිතීන් ලබාදෙන ඩිජිටල් නිෂ්පාදන සංවර්ධනය කරන්නෙමු.

## ස්ථාවර වර්ධන වේගයක් පවත්වාගැනීම සහ ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම

ජනගහනයෙන් පුළුල් කොටසකට උසස් තත්ත්වයේ බැංකු පහසුකම් සහ සේවාවන් සඳහා ප්‍රවේශය ලබාදීමෙන් අඛණ්ඩව ආර්ථික ධාවකයෙකු ලෙස කටයුතු කරමින් සහ මූල්‍යමය දායකත්වය ලබාදීමෙන් ශ්‍රීලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා අපි වැදගත් කාර්යභාරයක් ඉටුකරමු. ශේෂපත්‍රය කළමනාකරණය කිරීම සහ ව්‍යාපාර වර්ධනයට සහායවීම සඳහා අපගේ ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීම මෙයට ඇතුළත්ය.

## අප කරන සෑම කටයුත්තකදීම ක්‍රියාකාරීව විශිෂ්ටවීම

සුවිශේෂී පාරිභෝගික අත්දැකීමක් ලබාදීම සඳහා වඩාත් පාරිභෝගික කේන්ද්‍රීය හා ඉලක්කගත සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ කාර්යක්ෂමතාව සහ සේවා ප්‍රමිතීන් පිළිබඳ නව සංස්කෘතියක් ක්‍රියාත්මකකිරීම.

## සෑම විටම නිවැරදි ආකාරයට ව්‍යාපාර කිරීම

ආයතනික පාලනය සහ විනිවිදභාවය සහ වගවීම ඇතුළු ආචාරධර්ම වලට ප්‍රමුඛත්වයදීම. බැංකුවේ අවදානම් කළමනාකරණය සහ පාලන ව්‍යුහය ශක්තිමත් කිරීම සඳහා දැඩි විගණන හා අනුකූලතා ක්‍රියාවලීන් ක්‍රියාත්මක කිරීම.

## උපායමාර්ගික සැලැස්මේ ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ මූල්‍ය සේවා සඳහා අවිවාදිත වෙළඳපල ප්‍රමුඛයා ලෙස පිළිගැනීමට ඇති අපගේ උපායමාර්ගික දැක්මෙහි ප්‍රගතිය පිළිබිඹුවන්නේ අපගේ 8,000 ශක්තිමත් කණ්ඩායම බැංකුව වෙළඳපල නායකත්වයේ පරමාර්ථය කරා මෙහෙයවීමෙනි. අපගේ මිලියන 10+ පාරිභෝගික පදනම ශ්‍රී ල රු ට්‍රිලියන 1, බැංකුව විසින් නිර්මාණය කර ඇති ශක්තිමත් මූල්‍ය පදනම ගැන කතා කරන තැන්පතු පදනම ඉක්මවා ළඟාකර ගැනීමට හැකි වී තිබේ. බැංකුවේ න්‍යායපත්‍රයේ පාලනය සහ හොඳම භාවිතයන් ඉහළින්ම පවතින අතර එය එහs AA+(lka) ෆිච් ශ්‍රේණිගත කිරීම තුළින් පිළිබිඹු වේ. මහජනබැංකුව බ්‍රෑන්ඩ් ෆිනෑන්ස් විසින් වඩාත්ම වටිනා වෙළඳනාම තුනෙන් එකක් ලෙස පිළිගෙන ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳනාම වටිනාකම 29% කින් රුපියල් බිලියන 45.5 දක්වා වර්ධනයවිය. 2019 දී වෙළඳනාම ශ්‍රේණිගත කිරීම AA සිට AA+ දක්වා ඉහළ නංවන ලදි.



# තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) වෙත දායකත්වය

බැංකුවේ දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා උපායමාර්ගික ප්‍රමුඛතා ක්‍රියාත්මක කිරීමේදී ලබා ඇති ප්‍රගතිය පහත කොටසින් ආවරණය කෙරේ. අපගේ පාර්ශවකරුවන්ට වටිනාකමක් ලබාදීම සඳහා එක්එක් උපායමාර්ගික කුළුණු හතර සඳහා අදාළ උපායමාර්ගික ප්‍රමුඛතා අපි හඳුනාගෙන ඇත්තෙමු. සිය උපායමාර්ගික ප්‍රමුඛතා ක්‍රියාත්මක කරන අතරම තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා දායකවීමේ වගකීමද බැංකුව දැනුවත්ය. උපායමාර්ග බැංකුවේ වටිනාකම් නිර්මාණය කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සපයන මූල්‍ය, නිෂ්පාදිත, මානව, බුද්ධිමය, ස්වාභාවික හා සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය යන ප්‍රාග්ධන හය අතර සමීප අන්තර්ක්‍රියා ද පවත්වාගෙන යයි.

| උපායමාර්ගික කුළුණු | ප්‍රමාණාත්මක මාතෘකා, ප්‍රාග්ධන සහ SDGs | 2019 උපායමාර්ගික ප්‍රමුඛතා | 2019 ප්‍රගතිය | අනාගත ප්‍රමුඛතා |
|---|---|---|---|---|
| <br>GRI 201 | **ප්‍රමාණාත්මක මාතෘකා**<br>• ගනුදෙනුකාර අත්දැකීම<br>• ඩිජිටල් නායකත්වය<br>• වෙළඳ නාම හිමිකම<br>• ගනුදෙනුකාර ප්‍රවේශය<br>**SDGs**<br><br><br>**ප්‍රාග්ධන**<br>නිෂ්පාදිත ප්‍රාග්ධනය<br>මානව ප්‍රාග්ධනය<br>බුද්ධිමය ප්‍රාග්ධනය | • පාරිභෝගික අවශ්‍යතා අවබෝධ කර ගැනීම සහ අගය එකතු කළ හා පිරිවැය ඵලදායී බැංකු විසඳුම් ලබා දීම<br>• පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම<br>• පාරිභෝගිකයින්ට අති නවීන තාක්ෂණය ලබා දීම<br>• පාරිභෝගිකයා සමඟ කල් පවත්නා සබඳතා ගොඩනඟා ගැනීම | • පාරිභෝගික අත්දැකීම් වැඩිදියුණු කිරීම සඳහා ආයතනික අන්තර්ජාල බැංකුකරණ (CIB) සහ ආයතනික ජංගම බැංකුකරණ (CMB) පද්ධති සාර්ථකව දියත් කරන ලදී<br>• බිල්පත් ගෙවීම, උකස් වාරික අඩ වශයෙන් ගෙවීම සහ උකස් භාණ්ඩ බේරා ගැනීම පහසු කිරීම සඳහා SBU හි කියොස්ක් යන්ත්‍ර ස්ථාපනය කරන ලදී<br>• පුද්ගල කේන්ද්‍රීය ණය මූලාරම්භ පද්ධති (RLOS) ඩිජිටල් අයදුම්පත මත කෙටි කාලයකින් පුද්ගලික ණය සැකසීමට දියත් කරන ලදී<br>• පාරිභෝගික සේවා ප්‍රමිති පිළිබඳව කාර්ය මණ්ඩලයට අඛණ්ඩ පුහුණුවක් ලබා දෙන ලදී<br>• අනාගත ගනුදෙනුකරුවන් ආකර්ෂණය කර ගැනීම සඳහා ආයතනික බැංකු හා වාණිජ ණය දෙපාර්තමේන්තු විසින් ගනුදෙනුකරුවන් කෙරෙහි අවධානය යොමු කරන ලද මුල පිරීම් වැඩසටහන් දියත් කරන ලදී<br>• සියලු බැංකු ගනුදෙනු පහසුවෙන් සිදු කිරීම සඳහා නවීන බැංකු තාක්ෂණය භාවිතා කරමින් ඩිජිටල් ශාඛා 1,216ක් ගනුදෙනුකරුවන්ට ලබා දී ඇත<br>• "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" වැඩසටහන හරහා ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බල ගැන්වූ අතර රජයේ ආර්ථික සංවර්ධන න්‍යාය පත්‍රයට සහාය විය. | • අපගේ ඩිජිටල් ජාල නායකත්ව තත්ත්වය ගොඩනඟා ගැනීමෙන් අපගේ ගනුදෙනුකරුවන් සඳහා කැපී පෙනෙන හා විවිධාංගීකරණය වූ බැංකු අත්දැකීමක් දිගටම ලබා දීම<br>• විවිධාංගීකරණය කළ සහ වෙළඳපල ප්‍රමුඛ බැංකු සේවා ඇති කිරීම සඳහා ඩිජිටල් ශාඛාවල ආයෝජනය කිරීම<br>• දිවයින පුරා SBUs පිහිටුවීම.<br>• පාරිභෝගික කේන්ද්‍රීය සංස්කෘතියක් පෝෂණය කිරීම දිගටම සිදු කිරීම<br>• ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබා දීමෙන් සහ ග්‍රාමීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ධාරිතාව වැඩි කිරීමෙන් මූල්‍ය ඇතුළත් කිරීම් ප්‍රවර්ධනය කිරීම |

# තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) වෙත දායකත්වය

| උපායමාර්ගික කුළුණු | ප්‍රමාණාත්මක මාතෘකා, ප්‍රාග්ධන සහ SDGs | 2019 උපායමාර්ගික ප්‍රමුඛතා | 2019 ප්‍රගතිය | අනාගත ප්‍රමුඛතා |
|---|---|---|---|---|
| | **ප්‍රමාණාත්මක මාතෘකා**<br>• මූල්‍ය කාර්ය සාධනය<br>**SDGs**<br>10 REDUCED INEQUALITIES<br>**ප්‍රාග්ධන**<br>මූල්‍ය ප්‍රාග්ධනය<br>බුද්ධිමය ප්‍රාග්ධනය | • ශක්තිමත් මූල්‍ය කාර්ය සාධනයක් ලබා දීම<br>• අවදානම සහ පාලනය ශක්තිමත් කිරීම<br>• පිරිවැය කාර්යක්ෂමතාව වැඩි කිරීම<br>• ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීම | • ආර්ථිකයේ මන්දගාමිත්වය නොතකා බැංකුව ඩොලර් බිලියන 12.9 ක බදු ගෙවීමෙන් පසු ලාභයක් 2019 න් අවසන් වූ වර්ෂය සඳහා වාර්තා කළේය.<br>• මුළු වත්කම් පදනම රුපියල් ට්‍රිලියන 1.9 දක්වා වැඩි වූ අතර දළ ණය සහ අත්තිකාරම් රුපියල් ට්‍රිලියන 1.4ට ළඟා වූයේ තැන්පතු පදනම රුපියල් ට්‍රිලියන 1.5 දක්වා 2019 දෙසැම්බර් 31 දිනට ඉහළ යන අතරතුරදීය.<br>• ණයකර නිකුතුවක් මගින් බැංකුවේ ස්ථායිතාව තවදුරටත් ශක්තිමත් කරන ලද අතර එය බැංකුවේ II ස්තරයේ ප්‍රාග්ධනය රුපියල් බිලියන 5.6කින් වැඩි කළේය. | • ස්ථාවර වර්ධන වේගයක් පවත්වා ගැනීම<br>• අවදානම් සහ ආයතනික පාලන ව්‍යුහ ශක්තිමත් කිරීමෙන් ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම<br>• ඩිජිටල්කරණය හරහා ශුද්ධ මෙහෙයුම් පිරිවැය අඩු කිරීමෙන් පිරිවැය කාර්යක්ෂමතාව ළඟා කර ගැනීම<br>• මනා ලෙස ප්‍රාග්ධනීකෘත සහ ද්‍රවශීලී වීම |
| GRI 410,402, 403, 404, 405 | **ප්‍රමාණාත්මක මාතෘකා**<br>• මෙහෙයුම් කාර්යක්ෂමතාව<br>• සේවක ඵලදායීතාව<br>• කුසලතා කළමනාකරනය<br>• මූල්‍ය කළමනාකරණය<br>• පුහුණුව සහ සංවර්ධනය<br>**SDGs**<br>4 QUALITY EDUCATION<br>9 INDUSTRY, INNOVATION AND INFRASTRUCTURE<br>13 CLIMATE ACTION<br>**ප්‍රාග්ධන**<br>ස්වාභාවික ප්‍රාග්ධනය<br>මානව ප්‍රාග්ධනය<br>බුද්ධිමය ප්‍රාග්ධනය | • මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම<br>• ඩිජිටල් නායකත්වය<br>• සේවක ඵලදායීතාව වැඩි දියුණු කිරීම<br>• ඵලදායී කුසලතා කළමනාකරණය<br>• ප්‍රබල අවදානම් සහ පාලන යාන්ත්‍රණය<br>• නිෂ්පාදන නවෝත්පාදනය, ක්‍රියාවලි සංවර්ධනය සහ බැංකු සේවා ඩිජිටල්කරණය කිරීමෙහි ඉදිරියෙන්ම සිටීම<br>• අඛණ්ඩ ක්‍රියාවලි වැඩි දියුණු කිරීම<br>• හරිත බැංකුකරණය<br>• සේවක සංවර්ධනයෙහි අයෝජනය කිරීම<br>• ඉගෙනුම් සහ සංවර්ධන සංස්කෘතියක් පෝෂණය කිරීම | • වැඩි දියුණු කළ සේවා සංස්කෘතිය සහ ශාඛා පරිසරය<br>• රුපියල් මිලියන 104ක් කාර්ය මණ්ඩල ධාරිතාව ඉහළ නැංවීමට පුහුණුව සඳහා ආයෝජනය කරන ලදී<br>• කාර්යක්ෂමතාව, නවෝත්පාදනය හා තාක්ෂණික දියුණුව තුළින් සේවා ගුණාත්මකභාවය පුළුල් කිරීම කෙරෙහි අඛණ්ඩව අවධානය යොමු කිරීම<br>• විධිමත් කළ ක්‍රියාවලි<br>• කාසි හා නෝට්ටු යන දෙකම තැන්පත් කිරීමට පාසල් දරුවන්ට පහසුකම් සපයන මුදල් තැන්පතු යන්ත්‍ර පාසල්වල සවි කරන ලදී | • වඩා යහපත් සහ එඩිතර බැංකු තාක්ෂණ පාරිභෝගිකයින්ට හඳුන්වා දීම<br>• විගණන ප්‍රමිති සහ අභ්‍යන්තර පාලන පරිසරය වැඩි දියුණු කිරීම සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම<br>• දිවයින පුරා SBUs පිහිටුවීම මගින් හරිත බැංකුකරණය ප්‍රවර්ධනය කිරීම. |

# තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) වෙත දායකත්වය

| උපායමාර්ගික කුළුණු | ප්‍රමාණාත්මක මාතෘකා, ප්‍රාග්ධන සහ SDGs | 2019 උපායමාර්ගික ප්‍රමුඛතා | 2019 ප්‍රගතිය | අනාගත ප්‍රමුඛතා |
|---|---|---|---|---|
| GRI 416, 417, 418<br>GRI 205<br>GRI 202, 203, 413<br>GRI 302, 305,306<br>GRI 204<br>GRI 416 | **ප්‍රමාණාත්මක මාතෘකා**<br>• අවදානම සහ පාලනය<br>• අනුකූලතාව<br>• වගකීම් සහගත ණයට දීම<br>• දූෂණ විරෝධී<br>• සමාජ ආර්ථික<br>• බලපෑම්<br>• ව්‍යාපාරයේ පාරිසරික බලපෑම්<br>• සැපයුම්කරු වටිනාකම නිර්මාණය<br>• ගනුදෙනුකාර යහපත සහ ආරක්ෂාව<br><br>**SDGs**<br><br><br>**ප්‍රාග්ධන**<br>සමාජ හා සම්බන්ධතා ප්‍රාග්ධනය<br>ස්වාභාවික ප්‍රාග්ධනය<br>මානව ප්‍රාග්ධනය<br>බුද්ධිමය ප්‍රාග්ධනය | • ECD සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් නියම කර ඇති ප්‍රමිතීන්ට සහාය දැක්වීම<br>• එක්සත් ජාතීන්ගේ ගෝලීය ගිවිසුම හා එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (UNSDG) යටතේ දක්වා ඇති මූලධර්ම 10ට සහාය දැක්වීම.<br>• සෑම මෙහෙයුම් අංශයක් සඳහාම මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති | • බැංකුවේ තිරසාර කැපවීමේ කොටසක් ලෙස හරිත බැංකු සංකල්පය ක්‍රියාත්මක කිරීම<br>• එක්සත් ජාතීන්ගේ තිරසාර ඉලක්කවලට අනුකූල වීම<br>• BASEL III සහ IFRS 9 රෙගුලාසිවලට අනුකූල වීම<br>• බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රමයේ සහ ආයතනික පාලන රාමුවේ තීරණාත්මක අංගයක් වන විස්ල්-බ්ලොවර් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වේ.<br>• ඵලදායී ඒකාබද්ධ අවදානම් කළමනාකරණ රාමුවක්<br>• සියලු සේවකයින් අනුගමනය කළ යුතු ආචාර ධර්ම පද්ධතිය<br>• මණ්ඩල අනුකමිටු සඳහා යොමු කිරීමේ කොන්දේසි<br>• දූෂණ විරෝධී පිළිවෙත් අනුගමනය කිරීම | • UNSDG සහ අදාළ ප්‍රමිතීන්ට දිගටම සහාය දැක්වීම<br>• සෑම මෙහෙයුම් අංශයක් සඳහාම මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම<br>• ශක්තිමත් අනුකූලතා සංස්කෘතියක් පවත්වා ගෙන යාම<br>• සංස්කෘතික ආචාර ධර්ම හා අවංකභාවය ප්‍රවර්ධනය කිරීම |




## පීප්ල්ස් විස්z (මහජන විස්කම)

දකුණු ආසියාවේ, අප්‍රිකාවේ හා මැද පෙරදිග කලාපයේ ප්‍රථම ඩිජිටල් ගනුදෙනුකාර සබඳතාවන්හි ආරම්භක හැසිරවීම සඳහා වූ ව්‍යවහාරිකයයි. මෙය 2017 වර්ෂයේ දියත් කළ දා සිට, පීපල්ස් විස් හරහා ගනුදෙනුකරුවන් 500,000 කට අධික සංඛ්‍යාවක සබඳතා ඒමගින් හසුරුවා ඇත. ගනුදෙනුකරුවෝ කෙටි සැකසුම් කාලය, මාර්ගගත තථ්‍ය-කාල ඩෙබිට් කාඩ්පත් ක්‍රියාගැන්වීම, අන්තර්ජාල බැංකු ප්‍රවිෂ්ටය, ජංගම බැංකු ගනුදෙනු, කෙටි පණිවුඩ සහ මුදල් තැන්පත් කිරීමේ සේවාවන්හි ඵල ලබති.

# වටිනාකම් නිර්මාණය කිරීම සහ ප්‍රාග්ධනය ගොඩනැගීම

60 කොටස්කාර නියැලීම
63 මූල්‍ය ප්‍රාග්ධනය
69 නිෂ්පාදිත ප්‍රාග්ධනය
73 බුද්ධිමය ප්‍රාග්ධනය
78 මානව ප්‍රාග්ධනය
89 සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය
106 ස්වභාවික ප්‍රාග්ධනය

# කොටස්කාර නියැලීම

GRI 102-40, 102-42, 102-43, 102-44

## කොටස්කාර නියැලීම

අපගේ කොටස් දරන්නෝ හෙවත් කොටස්කරුවෝ අපට කෙටි, මධ්‍යම හා දීර්ඝ කාලීන වශයෙන් තරගකාරී තිරසාර වටිණාකම උත්පාදනය කිරීමේ හැකියාව අපට ලබා දෙන අත්‍යවශ්‍ය සම්පත් ලබා දෙති. අපට මෙම කොටස්කරුවන් සමග කටයුතු කිරීම මගින් ඔවුන්ගේ දෘෂ්ටි කෝණ හා ඔවුන්ගේ අපේක්ෂණයන් හා අව ශ්‍යතා අවබෝධ කර ගැනීමට අපට හැකි වේ. ඔවුන්ගෙන් ලැබෙන ප්‍රතිපෝෂණය අපට වැඩිදියුණු කිරීමේ විභවය සහිත ක්ෂේත්‍ර සහ වෙනස් කිරීමේ ඉඩප්‍රස්ථා හඳුනා ගැනීමටත් වටිනාකම නිර්මාණය කිරීම සඳහා සඵලදායි උපායමාර්ග සංවර්ධනය කිරීමටත් අපට අත්‍යවශ්‍ය වේ.

## ප්‍රධාන කොටස්කරුවෝ

අපි අපගේ ප්‍රධාන කොටස් දරන්නන් හඳුනා ගනුයේ නියැලීමේ මට්ටම, අපගේ ව්‍යාපාරය මත ඔවන්ගේ බලපෑම සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි ඔවුන්ගේ සම්බන්ධය මත පදනම් කර ගෙනය.



පහත ඇති වගුව අපගේ මුඛ්‍ය කොටස්කරුවන් සහ අප ඔවුන් සමග කටයුතු කරන ආකාරය හඳුනා ගනියි:

| | **කොටස් හිමියෝ සහ ආයෝජකයෝ** | **ගනුදෙනුකරුවෝ** | **සේවකයෝ/වෘත්තීය සමිති** |
|---|---|---|---|
| **ඔවුන් අපට වැදගත් වන්නේ ඇයි** | අපගේ ව්‍යාපාරයේ දිගු-කාලීන කාර්යසාධනය සඳහා ප්‍රාග්ධනය වෙත අඛණ්ඩ ප්‍රවිෂ්ටය තිබීම අතිශයින් වැදගත්ය. | ගනුදෙනුකාර-කේන්ද්‍රික සංස්කෘතියක් නිර්මාණය කිරීම අපගේ ව්‍යාපාරයේ සාර්ථකත්වයට ඉතා වැදගත්ය. අපි නිෂ්පාදන කාර්යසාධනය හා වටිනාකම වැඩිදියුණු කරනු පිණිස සහයෝගිත්වයේ හා නව්‍යකරණයේ නියැලෙමු. | අප ජනතාවගේ අපේක්ෂණයන් අනුව කටයුතු කිරීම මගින් අපි ඔවුන්ගේ යහපැවැත්මට උර දෙන අතර ඔවුන්ට නිවැරදි ව්‍යාපාරික තීරණ ගැනීමට හැකි කරමු. එය අපට විශිෂ්ටතම දක්ෂයින් රඳවා ගනිමින් සංවර්ධනය කිරීමට උපකාරී වෙයි. |
| **ප්‍රධාන කාරණා/ අපේක්ෂණ** | • නියත ආර්ථික කාර්යසාධනය<br>• ආචාරධර්මානුකූල ක්‍රියාකලාපය - පාරිසරික හා සමාජීය<br>• තන්ත්‍රණය<br>• තිරසාර වර්ධනය<br>• පාරදෘශ්‍ය සංස්ථායික සන්නිවේදනය | • පර්යේෂණය හා නව්‍යකරණය<br>• සේවයේ ගුණාත්මකතාව<br>• සබඳතාව<br>• අනුකූලතාව<br>• සේවා වැය දැරිය හැකි බව<br>• පහසුව හා ප්‍රවිෂ්ට විය හැකි බව | • පාරදෘශ්‍ය, සාධාරණ හා ආකර්ෂණීය පාරිශ්‍රමිකය<br>• සේවක සංවර්ධනය<br>• සේවක නියැලීම<br>• දක්ෂතා ප්‍රවාහ මාර්ගය හා රඳවා තබා ගැනීම<br>• වෘත්තීය ඉඩප්‍රස්ථා<br>• විවිධත්වය හා සර්වග්‍රහණය |

**නියැලුම් මාර්ග හා සංඛ්‍යාතය**

| කොටස් හිමියෝ සහ ආයෝජකයෝ: සංඛ්‍යාතය | නියැලීම් විධිය | ගනුදෙනුකරුවෝ: සංඛ්‍යාතය | නියැලීම් විධිය | සේවකයෝ/වෘත්තීය සමිති: සංඛ්‍යාතය | නියැලීම් විධිය |
|---|---|---|---|---|---|
| වාර්ෂික | වාර්ෂික මහා සභා රැස්වීම | වත්මන් | ගනුදෙනුකාර සංතෘප්ත සමීක්ෂණ | වාර්ෂික | කාර්යසාධන ඇගයීම |
| වාර්ෂික | වාර්ෂික වාර්තාව | වත්මන් | ගනුදෙනුකාර ජාලකරණය | වත්මන් | සාමූහික කේවෙල්කරණය |
| ත්‍රෛමාසිකව | ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශය | වත්මන් | සංස්ථානික වෙබ් අඩවිය | වත්මන් | බහු-මට්ටම් කාර්ය මණ්ඩල |
| අඛණ්ඩ | සංස්ථායික වෙබ් අඩවිය | වත්මන් | සබඳතා කළමනාකරණය | වත්මන් | කාර්ය මණ්ඩල |
| වත්මන් | දුරකථන ඇමතුම්, විද්‍යුත් ලිපි, ලිඛිත සන්නිවේදන | වත්මන් | මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් | වත්මන් | පුහුණු වැඩසටහන් |
| | | වත්මන් | ගනුදෙනුකාර දුරකථන අංකය | වත්මන් | සමූහ අන්තඃජාලය, විද්‍යුත් තැපෑල |
| | | වාර්ෂික | වාර්ෂික වාර්තාව | ත්‍රෛමාසික | ස්පන්ද සඟරාව |
| | | ත්‍රෛමාසික | ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශ | වාර්ෂික | වාර්ෂික වාර්තාව |
| | | වත්මන් | දුරකථන ඇමතුම්, විද්‍යුත් ලිපි, ලිඛිත සන්නිවේදන | වත්මන් | සංස්ථානික වෙබ් අඩවිය |
| | | | | වත්මන් | දුරකථන ඇමතුම්, විද්‍යුත් ලිපි, ලිඛිත සන්නිවේදන |

| | **කොටස් හිමියෝ සහ ආයෝජකයෝ** | **ගනුදෙනුකරුවෝ** | **සේවකයෝ/වෘත්තීය සමිති** |
|---|---|---|---|
| **අපගේ උපායමාර්ගික** | අපි කාර්යසාධනය, නැගී එන අවදානම් හා දසුන පිළිබඳ සමබර යාවත්කාලීන වාර්තා, සමගින් අපගේ කොටස්හිමියන් සමග පාරදෘශ්‍ය හා අඛණ්ඩ සන්නිවේදනය පවත්වා ගනිමු. අපි දෘඪතර ප්‍රතිලාභ මෙන්ම දිගු-කාලීන තිරසාර අගය ලබා දීමට ඉලක්ක කරමු. | අපි ජාතියේ වඩාත් ව්‍යාප්ත සේවාවක් වන අපගේ විශේෂ බැංකු ඒකක 239 සහ ඩිජිටල්වාහිනී හරහා වේගය හා පහසුව කැටිව වඩාත් නිෂ්පාදන හරහා අපගේ පාරිභෝගිකයන් සඳහා විසඳුම් ලබා දෙමු. අපගේ පාරිභෝගික සේවා දුරකථන අංකය වෙත සතියේ දින 7 ම පැය 24 පුරාම පිවිසිය හැකිය. | අපගේ සාර්ථකත්වය උදෙසා සේවක නියැලීම තීරණාත්මකය. අපි සෑම සේවකයකුටම සිය පූර්ණ විභවයට එළඹ සිය උපරිමයට ළඟා විය හැකි වන විවිධත්වයෙන් යුතු හා සර්වග්‍රාහී සේවා ස්ථානයක් ඇති කිරීමට කටයුතු කරමු. |

# කොටස්කාර නියැලීම

| | නියාමකයෝ/ ව්‍යවස්ථා සම්පාදකයෝ | | සැපයුම්කරුවෝ | | ප්‍රජාවෝ හා පරිසරය | |
|---|---|---|---|---|---|---|
| ඔවුන් අපට වැදගත් ඇයි? | අපි ආචාරධර්මානුකූල මෙහෙයුම් සහතික වීම, වෙළඳපල සඳහා හැකියාව ඇති කිරීම හා තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම උදෙසා නියාමකයින් හා ව්‍යවස්ථා සම්පාදකයින් සමග කටයුතු කරමු. | | අපගේ බාහිර සැපයුම් දාමය හා අපගේ සැපයුම්කරුවෝ අපගේ කාර්යසාධනය සඳහා අතිශය වැදගත්ය. | | අපි අප ක්‍රියාත්මක වන ප්‍රදේශවල ප්‍රජාවන් සමග සාධනීය සබඳතා ගොඩනැගීම හා පරිසරය සුරැකීම සම්බන්ධයෙන් ඇප කැප වී සිටිමු. | |
| මුඛ්‍ය කාරණා/ අපේක්ෂණ | • තන්ත්‍රණය හා පාරදෘශ්‍යභාවය<br>• අවදානම් කළමනාකරණය<br>• කර්මාන්ත උපකාරක ප්‍රතිපත්ති<br>• ක්ෂුද්‍ර මූල්‍යනය හා කුඩා හා මධ්‍යම ව්‍යවසාය සංවර්ධනය<br>• පර්යේෂණය හා නව්‍යකරණය<br>• තිරසාරභාවය පිළිබඳ කාර්යසාධනය<br>• නියාමන පිළිපැදීම | | • ශක්තිමත් සබඳතා පවත්වා ගැනීම<br>• හැකියාව හා විශේෂඥතාව ගොඩනැගීම<br>• වගකීමෙන් යුතු ප්‍රසම්පාදනය, විශ්වාසය හා ආචාරධර්ම<br>• මෙහෙයුම් වැඩිදියුණු කිරීම<br>• ඩිජිටල් විසඳුම් ඇතුළු තාක්ෂණික ප්‍රගමණයන්<br>• සේවා ගුණාත්මකතාව | | • අනාගත දක්ෂතා ප්‍රවාහ මාර්ගය<br>• ප්‍රාදේශීය මෙහෙයුම් බලපෑම<br>• සෞඛ්‍යය, ආරක්ෂාව හා පරිසරය පිළිබඳ කාර්යසාධනය<br>• වගකීමෙන් යුතු මූල්‍යනය<br>• ප්‍රජා සංවර්ධනය කෙරෙහි ඇපකැප වීම | |
| නියැලීම් මාර්ග හා සංඛ්‍යාතය | **සංඛ්‍යාතය** | **නියැලීම් විධිය** | **සංඛ්‍යාතය** | **නියැලීම් විධිය** | **සංඛ්‍යාතය** | **නියැලීම් විධිය** |
| | සතිපතා<br>මාසික<br>ත්‍රෛමාසික<br>වාර්ෂික | නියාමනීය වාර්තාකරණය | වත්මන් | සැපයුම්කාර සමීක්ෂණ | වත්මන් | මාධ්‍ය නිවේදන, මාධ්‍ය සාකච්ඡා |
| | වත්මන් | ස්ථානගත ආවේක්ෂණය | වත්මන් | සැපයුම්කාර සබඳතා | වත්මන් | ආයතනික වෙබ්අඩවිය |
| | වත්මන් | කර්මාන්ත සංසද හා රැස්වීම් | වත්මන් | ස්ථානගත රැස්වීම් හා චාරිකා | වත්මන් | ප්‍රසිද්ධ අවස්ථා |
| | වත්මන් | මාධ්‍ය නිවේදන | වාර්ෂික | වාර්ෂික වාර්තාව | වාර්ෂික | වාර්ෂික වාර්තාව |
| | වාර්ෂික | වාර්ෂික වාර්තාව | ත්‍රෛමාසික | ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශ | ත්‍රෛමාසික | ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශ |
| | ත්‍රෛමාසික | ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශ | අඛණ්ඩ | ආයතනික වෙබ්අඩවිය | අඛණ්ඩ | ආයතනික වෙබ්අඩවිය |
| | අඛණ්ඩ | ආයතනික වෙබ්අඩවිය | වත්මන් | දුරකථන ඇමතුම්, විද්‍යුත් ලිපි, ලිඛිත සන්නිවේදන | වත්මන් | දුරකථන ඇමතුම්, විද්‍යුත් ලිපි, ලිඛිත සන්නිවේදන |
| | වත්මන් | දුරකථන ඇමතුම්, විද්‍යුත් ලිපි, ලිඛිත සන්නිවේදන | | | | |
| අපගේ උපායමාර්ගික ප්‍රතිචාරය | අපි අඛණ්ඩව සිදුවන සංවාදය හා නිසි කලට අදාළ තොරතුරු හා වාර්තා ඉදිරිපත් කිරීම හරහා රාජ්‍ය බලධාරීන් සමග මනා කාර්ය සබඳතා පවත්වා ගෙන යමු. | | අපි දෙපාර්ශවයටම අන්‍යෝන්‍ය වශයෙන් ඵලදායක විශ්වාසවන්ත සබඳතා ගොඩනගනු පිණිසත්, ඔවුන් අපගේ ප්‍රමිතීන්ට අනුව ක්‍රියා කරන හා අපේ අපේ අපේක්ෂණයන්ට අනුව ව්‍යාපාර කටයුතු සිදුකරන බව වගබලා ගනු පිණිසත් ඔවුන් සමග කටයුතු කරමු. | | අපි ප්‍රාදේශීය හා අපගේ මෙහෙයුම්වලට අදාළ ජනප්‍රජාවන්ට හා කණ්ඩායම්වලට උරදීම "විශේෂයෙන් අධ්‍යාපනික බැහැර-අවතීර්ණය"සිදුකරමු. | |

# මූල්‍ය ප්‍රාග්ධනය

ණය හා ස්කන්ධ මූල්‍යයද ඇතුළත් මූල්‍ය ප්‍රාග්ධනය අපගේ ව්‍යාපාරයට තීරණාත්මක ලෙස වැදගත්ය. අපි තිරසාර සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම හා දේශීය බැංකු කර්මාන්තය තුළ අපගේ ස්ථාවරත්වය පවත්වා ගෙන යන්නේ අපගේ මූල්‍ය ප්‍රාග්ධනය ණයකරණය කිරීමෙනි. මූල්‍ය ප්‍රාග්ධනයේ වටිනාකම වැඩිකිරීම මගින් අපට අපගේ කොටස්කරුවන්ට වැඩි වටිනාකමක් ලබා දිය හැකි වේ. මූල්‍ය ප්‍රාග්ධනයේ අගය වැඩි කරනුයේ අපගේ ලාභ උත්පාදනය වැඩි කිරීම, පිරිවැය කළමනාකරණය කිරීම හා ස්කන්ධ හා ණය ඉහළ දැමීම මගිනි.

## විශේෂතා

ළඟා කර ගත් ඒකාබද්ධ දළ ආදායම
**රු. බිලියන 235.5**

වාර්තා කර ගත් ඒකාබද්ධ බදු-පෙර ලාභය
**රු. බිලියන 25.7**

**6.3%** ඒකාබද්ධ පාරිභෝගික තැන්පතුවල වැඩිවීම

පවත්වා ගත් දළ අක්‍රීය ණය අනුපාතය
**3.7%**

ඒකාබද්ධ දළ ණය හා අත්තිකාරම් වැඩිවීම **3.4%**

**රු. බිලියන 25.1**
රජය වෙනුවෙන් නිර්මාණය කරන ලද මුළු අගය

## ආදායම් ප්‍රකාශ විශ්ලේෂණය

### දළ ආදායම

වර්ෂයෙන් වර්ෂයට වැඩිවීම 9.7% ක් වාර්තා කරමින් මහජන බැංකුවේ 2019 වර්ෂයේ ඒකාබද්ධ දළ ආදායම රුපියල් බිලියන 235.5 ට ළඟා විය. දළ ආදායම වැඩිවීමට දායක වූ ප්‍රධාන සාධක වූයේ පොළී ආදායම, ගාස්තු කොමිස් ආදායම සහ වෙනත් අරමුදල් සම්පාදිත නොවන ආදායමයි.

### සමස්ත මෙහෙයුම් ආදායම

| රුපියල් බිලියන | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| සමස්ත මෙහෙයුම් ආදායම | 93.8 | 89.8 | 77.5 | 68.4 | 67.6 |
| – ශුද්ධ පොළී ආදායම | 75.9 | 71.2 | 62.7 | 53.6 | 54.3 |
| – පොළී නොවන ආදායම | 17.9 | 18.7 | 14.8 | 14.8 | 13.3 |

| ශු. පොළී ආන්තිකය – % | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| – ඒකාබද්ධ | 3.8 | 4.0 | 4.0 | 3.9 | 4.5 |
| – බැංකු | 3.2 | 3.5 | 3.5 | 3.5 | 4.0 |

ඒකාබද්ධ මුළු මෙහෙයුම් ආදායම 2019 වර්ෂය තුළ 4.4% ක වර්ෂයෙන් වර්ෂයට වර්ධනයක් වාර්තා කරමින්, 2018 වර්ෂයේ වාර්තා කළ රුපියල් බිලියන 89.8 ට සාපේක්ෂව රුපියල් බිලියන 93.8 ට ළඟා විය. බැංකුවේ මෙහෙයුම් ආදායම සමූහයේ මෙහෙයුම් ආදායමෙන් 75.8% ක් විය.

# මූල්‍ය ප්‍රාග්ධනය







## ශුද්ධ පොළී ආදායම

සමූහයේ කේන්ද්‍රික මෙහෙයුම් නියෝජනය කරන ශුද්ධ පොළී ආදායම මුළු මෙහෙයුම් ආදායමෙන් 81.0% ක් විය.ශුද්ධ පොළී ආදායම 2018 වර්ෂයේ රු. බිලියන 71.2 ට සාපේක්ෂව 2019 වර්ෂයේ රු. බිලියන 75.9 ක් දක්වා 6.7% කින් වර්ධනය විය. ශුද්ධ පොළී ආදායමේ එක් එක් අංගයන් පිළිබඳ විශ්ලේෂණයක් පහත දැක්වේ:-

## පොළී ආදායම

පොළී ආදායම සමාලෝචිත වර්ෂය තුළ රු. බිලියන 217.2 දක්වා 11.1 කින් වර්ධනය විය. මෙයට විශාල වශයෙන් හේතු වූයේ ක්‍රමක්ෂිත පිරිවැයට මනින ලද රජයේ සුරැකුම්වල 38.6% ක හා ගනුදෙනුකාර අත්තිකාරම්වල 3.1% ක වර්ධනය වීමයි.

ගනුදෙනුකාර අත්තිකාරම් මුළු පොළී ආදායමෙන් 82% ක් වූ අතර ඉතිරිය රජයේ සුරැකුම්වලින් සමන්විත වෙනත් ආයෝජන විය.

## පොළී වියදම්

ප්‍රධාන වශයෙන් 2019 වර්ෂයේ සජීවීකරණය කරන ලද අධි-පිරිවැය කාල තැන්පතුවල විශාල පරිමා හේතුවෙන් පොළී වියදම් 13.5% කින් වර්ධනය විය. සමූහයේ කාල තැන්පතුවලින් 90% ට වඩා එක් අවුරුද්දට අඩු කල්පිරීමේ කාලයක් ඇති ඒවාය.තැන්පතු ආශ්‍රිත වියදම් සමස්ත පොළී වියදම්වලින් 88% ක් වූ අතර ඉන් 70% ට වැඩි ප්‍රමාණයක් කාල තැන්පතුවලින් සමන්විත විය. වර්ෂ 2019 තුළ සමූහය ශුද්ධ පදනමින් රු. බිලියන 93.6 ක් වූ නව තැන්පතු සාර්ථකව සජීවීකරණය කළ අතර ඉන් රු. බිලියන 64.4 ක් ස්ථිර තැන්පතු විය.

අත්තිකාරම් අනුපාතිකයන්හි අඩුවීමේ ප්‍රවණතාව හේතුවෙන් සමූහයේ ශුද්ධ පොළී ආන්තිකය 2018 තිබූ 4.0% සිට 2019 දී 3.8% දක්වා අඩු විය. බැංකුව මට්ටමින්, පොළී ආන්තිකය 2018 තිබූ 3.5% සිට 2019 දී 3.2% දක්වා පහත වැටුණි. 2019 තුන්වන කාර්තුව තුළ පොළී අනුපාතික අඩු කිරීමට මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පැනවීම හා මන්දගාමී ආර්ථික පරිසරය තුළ ණය පොත මන්ද වීම මෙයට හේතු විය.

## පොළී නොවන ආදායම

පොළී නොවන ආදායම ගාස්තු හා කොමිස් ආදායම, වෙළඳ ආදායම හා වෙනත් මෙහෙයුම් ආදායම යන ඒවායෙන් සමන්විත වෙයි. බැංකුව හා සමූහය සිසාරා තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා අවධානය යොමුකළ යුතු ක්ෂේත්‍රයක් ලෙස මෙය පවතී.

සමූහයේ ශුද්ධ පොළී නොවන ආදායම 2018 වර්ෂයේ රු. බිලියන 18.7 සිට 2019 වර්ෂයේ රු. බිලියන 17.9 ක් දක්වා 4.4% කින් අඩු විය. මින් පොළී නොවන ආදායමෙන් 3 න් පංගුවකට වගකියන ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම 2018 රු. බිලියන 7.4 ට සන්සන්දනාත්මකව 2019 වර්ෂයේ රු. බිලියන 8.2 දක්වා 9.6% කින් වර්ධනය විය.

මෙම වර්ධනය 2019 වර්ෂය තුළ අභ්‍යන්තර ක්‍රියාවලි දියුණු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ජංගම හා ජංගම නොවන යන දෙවර්ගයේම තැන්පතු සුමට වීම, ඉහළ වෙළඳ මූල්‍ය පරිමා, බැංකුවේ ටෙලර් යන්ත්‍ර භාවිතය වැඩිවීම හා ස්වයං-බැංකු වාහිනීවල ජනප්‍රියත්වය වැඩිවීම ඇතුළු සාධකවල සංයුක්තයක් නිසා විය.

මුළු පොළී නොවන ආදායමෙන් 15% ක් වන ශුද්ධ ලාභය පෙර මූල්‍ය වර්ෂයේ රු. බිලියන 4.4 සිට 2019 රු. බිලියන 2.7 දක්වා 40% කින් අඩු විය.

වෙනත් මෙහෙයුම් ආදායම 2018 රු. බිලියන 6.8 සිට 2019 වර්ෂයේ 7.0 දක්වා 3.7% කින් වර්ධනය විය. සමූහය මුළුල්ලේ රක්ෂණ ව්‍යාපාරයේ ශුද්ධ ඉපැයූ වාරිකවලින් හා බොල් ණය ආපසු අයකර ගැනීම්වලින් වෙනත් මෙහෙයුම් ආදායම සමන්විත වේ.

## හානිවීම් ගාස්තු

හානිවීම් ගාස්තු අයකිරීම් පෙර මූල්‍ය වර්ෂයේ රු. බිලියන 4.1 ට සාපේක්ෂව වර්ෂයෙන් වර්ෂයට අගය 2019 වර්ෂයේ රු. බිලියන 9.0 ක් දක්වා 117.8% කින් වර්ධනය විය. 2019 වර්ෂයේ හානිවීම් ගාස්තු අයකිරීම් සාපේක්ෂ ලෙස ඉහළ පැවතියේ වර්ෂය තුළ පැවති අහිතකර ආර්ථික තත්ත්වයන්හි බලපෑම සහ අක්‍රීය අත්තිකාරම් වැඩි වීම හේතුවෙනි.

බැංකුව මට්ටමේදී, මුළු ණයවලට දළ අක්‍රීය ණය දරන අනුපාතිකයෙන් මනිනු ලබන වත්කම් ගුණාත්මකතාව 2019 දී 3.3% ක් ව පැවති අතර, එය සමූහය මට්ටමේදී 2018 වාර්තා වූ 2.7% සිට 2019 වර්ෂයේ 3.7% දක්වා වර්ධනය විය.

බැංකුවේ මෙන්ම සමූහ මට්ටමේදී සම්පාදන ප්‍රතිපත්තිය ආරක්ෂාකාරී එකක් වූ අතර එමගින් 2019 මූල්‍ය වර්ෂය අවසානය වන විට පිළිවෙළින් 60.0% ක හා 62.0 ක ආවරණ මට්ටම් අත්කර ගත හැකි විය.




## පිරිවැය කළමනාකරණය

සමස්ත මෙහෙයුම් පිරිවැය 2018 රු. බිලියන 45.1 සිට 2019 වර්ෂයේ රු. බිලියන 47.6 දක්වා 5.5% කින් වර්ධනය විය.

### සේවක මණ්ඩල පිරිවැය

මුළු මෙහෙයුම් පිරිවැයෙන් ආසන්න වශයෙන් 50% ක් සාදන පිරිස් පිරිවැය 2018 වර්ෂයේ තිබූ මට්ටමෙන්ම පවත්වා ගෙන යන ලදී.

### වෙනත් මෙහෙයුම් පිරිවැය

වෙනත් මෙහෙයුම් පිරිවැය 2018 රු. බිලියන 21.3 සිට සමාලෝචිත වර්ෂයේදී රු. බිලියන 23.6 දක්වා 11.4% කින් වර්ධනය විය. දළ වශයෙන් එම වැඩිවීමෙන් 3 න් පංගුවක් ක්ෂය/ක්‍රමක්ෂය, තොරතුරු තාක්ෂණ පද්ධති නඩත්තුව සහ දිවයින පුරා සිදුකෙරෙමින් ඇති ස්වයං-බැංකුකරණ මධ්‍යස්ථාන ඇති කිරීම ආශ්‍රිත අලෙවිකරණ හා ප්‍රවර්ධන පිරිවැය හේතුවෙන් බව දැක්විය හැකිය.

ඒ අනුව, සමූහයේ ආදායමට පිරිවැය අනුපාතය 2018 60.7% සිට සමාලෝචිත වර්ෂයේ 63.1% දක්වා වර්ධනය විය. බැංකු මට්ටමේදී ආදායමට පිරිවැය අනුපාතය 2018 61.3% සිට 2019 වර්ෂයේ 64.2% දක්වා වර්ධනය විය.

### එකතු කළ අගය මත බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද සහ ණය ආපසු ගෙවීම මත බද්ද

ඉහත බදු මුදල් 2018 රු. බිලියන 9.4 සිට 2019 වර්ෂයේ රු. බිලියන 11.5 දක්වා 21.9% කින් වර්ධනය විය.

## ලාභදායිත්වය

සමූහයේ බදු-පෙර ලාභය 2019 වර්ෂය තුළ 17.7% ක වර්ෂයෙන් වර්ෂයට පහළ යාමක් වාර්තා කරමින්, 2018 වර්ෂයේ වාර්තා කළ රු. බිලියන 31.2 ට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල් බිලියන 25.7 ට අඩු විය.

මේ අතර සමූහයේ කොටස් ස්කන්ධය මත ආදායම 2018 18.7% ට සාපේක්ෂව මෙවර 12.8% දක්වා පහත බැස ඇත. බැංකුව මට්ටමේදී, මෙම අනුපාතිකය පෙර වර්ෂයේ 20.3% ට සාපේක්ෂව 2019 වර්ෂයේදී 13.9% ක් විය.

සාමාන්‍ය වත්කම් මත බදු-පෙර ලාභ මගින් මනිනු ලබන වත්කම් මත ප්‍රතිලාභය 2019 වර්ෂයේ 1.3% ලෙස පවත්වා ගෙන ඇත.

බද්දෙන් පසු ලාභය 2018 රු. බිලියන 21.4 ට සන්සන්දනාත්මකව රු. බිලියන 16.2 දක්වා 24.7% කින් අඩු විය.




## ශේෂ පත්‍ර විශ්ලේෂණය

### තැන්පතු වර්ධනය

| රු. බිලියන | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| ජංගම හා ඉතිරිකිරීමේ ගිණුම් | 571 | 543 | 525 | 484 | 432 |
| කාලීන තැන්පතු | 1,007 | 943 | 771 | 633 | 497 |
| වෙනත් | 11 | 10 | 9 | 3 | 4 |
| **එකතුව** | 1,589 | 1,495 | 1,306 | 1,120 | 933 |
| ජංගම හා ඉතිරිකිරීමේ ගිණුම් % | 35.9 | 36.3 | 40.2 | 43.2 | 46.3 |
| **මුදල්** | | | | | |
| දේශීය | 91.8% | 93.4% | 90.6% | 88.7% | 89.0% |
| විදේශීය | 8.2% | 6.6% | 9.4% | 11.3% | 11.0% |
| **එකතුව** | 100.0% | 100.0% | 100.0% | 100.0% | 100.0% |

# මූල්‍ය ප්‍රාග්ධනය

2018 අගදී රු. බිලියන 1,495.3 ක් ව තිබූ සමූහයේ ගනුදෙනුකාර තැන්පතු 2019 වර්ෂයේ අග වන විට රු. බිලියන 1,588.9 දක්වා 6.3 කින් ඉහළ ගියේය.

මුළු බැංකු/සමූහ අරමුදල්වලින් දළ වශයෙන් 78% ක් වන තැන්පතු රටේ සැමතැන පැතිර ඇති කර්මාන්තයේ විශාලතම ජාලයේ පිටුවහල ලබන ශක්තිමත් තැන්පතු පදනමක් පිළිබිඹු කරයි.

මේ අතර, ජංගම හා ඉතිරිකිරීමේ ගිණුම් අනුපාතය 2018 පැවති 36.3% ක සිට 2019 වර්ෂයේ 35.9% ක් දක්වා පහළ වැටුණේ එළඹෙන වර්ෂය තුළ එම අනුපාතය දියුණු කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට සංඥා කරමිනි.

මුළු තැන්පතුවලින් දේශීය මුදල් තැන්පතු 91.8% ක් වූ අතර, විදේශීය තැන්පතු 8.2% ක් දක්වා වර්ධනය විය.










## ගනුදෙනුකාර අත්තිකාරම්වල වර්ධනය

| රු. බිලියන | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| මුළු අත්තිකාරම් (දළ) | 1,541 | 1,490 | 1,209 | 1,076 | 933 |
| **වර්ගය අනුව** | | | | | |
| අයිරා | 145 | 126 | 116 | 58 | 86 |
| වෙළඳ මූල්‍ය | 234 | 281 | 141 | 177 | 191 |
| උකස් ගැනීම් | 163 | 150 | 137 | 114 | 104 |
| කෙටිකාලීන ණය | 877 | 808 | 700 | 618 | 453 |
| අයවිය යුතු බදු කුලී | 88 | 95 | 89 | 84 | 79 |
| වෙනත් | 34 | 30 | 26 | 24 | 20 |
| **එකතුව** | 1,541 | 1,490 | 1,209 | 1,076 | 933 |
| **ක්ෂේත්‍රය අනුව** | | | | | |
| කෘෂිකාර්මික | 160 | 139 | 125 | 119 | 106 |
| නිෂ්පාදන | 47 | 39 | 31 | 21 | 14 |
| සංචාරක | 31 | 22 | 15 | 7 | 4 |
| ප්‍රවාහන | 86 | 78 | 58 | 26 | 15 |
| ඉදිකිරීම් | 314 | 375 | 331 | 278 | 210 |
| යටිතල පහසුකම් | 271 | 224 | 94 | 147 | 199 |
| වෙළඳුන් | 145 | 152 | 108 | 110 | 102 |
| නව ආර්ථික | 12 | 10 | 10 | 10 | – |
| වෙනත් | 475 | 450 | 438 | 357 | 282 |
| **එකතුව** | 1,541 | 1,490 | 1,209 | 1,076 | 933 |

පසුගිය මූල්‍ය වර්ෂයේ රු. බිලියන 1,489.9 ට සාපේක්ෂව 2019 වර්ෂයේ දළ ණය පාලිත 3.4% කින් රු. බිලියන 1,541.0 දක්වා වර්ධනය විය. ණය වර්ධනයෙන් බොහොමයක් රාජ්‍ය/රජයට අයත් ව්‍යාපාර වෙත දෙන ලද ණයවලින් ඇති විය.

ක්ෂේත්‍රයන් අනුව වූ නිරාවරණයන් විවිධාකාරී වූ අතර 2019 වර්ෂයේ මුළු ගනුදෙනුකාර අත්තිකාරම්වලින් 20.4% ක් ඉදිකිරීම් නිරාවරණයන් විය. මේ අතර, ඉදිකිරීම් නිරාවරණයෙන් 2/3 ක් පමණ දේපළ උගස්කර මත නිවාස ණය විය.

අභියෝගී වෙළඳපල තත්ත්වයන් නොතකා දළ අක්‍රීය ණය අනුපාතය 3.7% ක පවත්වා ගනු ලැබූ අතර එය කර්මාන්තයේ සාමාන්‍ය අගයට වඩා අඩු අගයකි. 2019 වර්ෂයේ බැංකුවේ අක්‍රීය ණය අනුපාතය 3.3%ක් විය.

**ක්ෂේත්‍රය අනුව ගනුදෙනුකාර අත්තිකාරම්**




**වර්ගය අනුව ගනුදෙනුකාර අත්තිකාරම්**




## නියාමන ප්‍රාග්ධනය

2018 අගදී රු. බිලියන 123.5 ක් ව තිබූ මුළු කොටස්හිමි ස්කන්ධය 2019 වර්ෂයේදී රු. බිලියන 130.0 දක්වා 5.3 කින් ඉහළ ගියේය.

## ප්‍රධාන කාර්යසාධන කාර්යයන්

බාසල් III ස්ථර අංක I සහ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණවත් මට්ටම් නියාමන අවශ්‍යතාවන්ට වඩා ඉහළින් පවත්වා ගැනුණු අතර 2019 දෙසැම්බර් 31 දිනට එම අගයන් පිළිවෙළින් 11.6% ක් හා 14.9% ක් විය.

- 2018 අවසන, ස්ථර අංක I සහ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණවත් මට්ටම් පිළිවෙළින් 11.7% ක් හා 14.5% ක් විය. බැංකුව මට්ටමේදී, 2018 අවසන, ස්ථර අංක I සහ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණවත් මට්ටම් පිළිවෙළින් 11.0% ක් හා 14.5% ක් වූ අතර 2019 අවසන, ස්ථර අංක I සහ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණවත් මට්ටම් පිළිවෙළින් 10.7% ක් හා 14.7% ක් විය.

# මූල්‍ය ප්‍රාග්ධනය

- අනෙකුත් බාසල් III කාර්යයන්

(අ) දින 30 ක ශුද්ධ මුදල් බැහැර ප්‍රවාහය මුළුල්ලේ උසස් තත්ත්වයේ ද්‍රවශීලී වත්කම් මගින් මනිනු ලබන ද්‍රවශීලතා ආවරණ අනුපාතය අවම අවශ්‍යතාව වන 100% ට වඩා ඉහළින් පවත්වා ගනු ලැබූ අතර, රුපියල් මෙන්ම සියලු මුදල් වර්ග වාර්තා වූයේ පිළිවෙළින් 160.9% 132.2% ලෙසය.

(ආ) ස්ථර අංක I මගින් මුළු දළ නිරාවරණයන් සඳහා මනිනු ලබන ණයකරණ අනුපාතය 2019 දෙසැම්බර් 31 දිනට 4.0% ක් වූ අතර එමගින් වර්ෂය තුළ පාලිත වත්කම් වර්ධනයේ ප්‍රමාණය පිළිබිඹු විය. 2019 ජනවාරි 1 දින සිට අවම අවශ්‍යතාව 3.0% ක් විය.

## කොටස්හිමියන්ගේ වටිනාකම් නිර්මාණය කිරීම

මෙම බැංකුව සෘජු හා වක්‍ර බදු, ලාභාංශ හා විශේෂ ගාස්තු ගෙවීම හරහා රජයට සැලකිය යුතු ආදායම් දායකයෙක් වෙයි. පසුගිය වර්ෂ 10 තුළ මෙම සමූහය රජයට රු. බිලියන 180 කට අධික ප්‍රමාණයක් නිර්මාණය කර දී ඇත.

2018 වර්ෂයේ රු. බිලියන 24.1 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ රජය වෙනුවෙන් නිර්මාණය කර දුන් මුළු අගය ප්‍රමාණය රු. බිලියන 25.1 කි. මින් 78% ට වැඩි ප්‍රමාණයක් බැංකුව විසින් උත්පාදනය කරන ලදී.



# නිෂ්පාදිත ප්‍රාග්ධනය

බැංකුවේ නිෂ්පාදිත ප්‍රාග්ධනය අපට අපගේ කොටස්කරුවන් වෙනුවෙන් වටිනාකම් නිර්මාණය කිරීමේ හැකියාව ලබා දෙන භෞතික වත්කම්වලින් සමන්විත වෙයි. මෙයට අපගේ ශාඛා ජාලය, වාහන, තොරතුරු තාක්ෂණ උපකරණ හා ගෘහභාණ්ඩ මෙන්ම ඩිජිටල් යටිතල පහසුකම් ඇතුළත්ය. නිෂ්පාදිත ප්‍රාග්ධනය කාර්යක්ෂමව භාවිතයෙන් අපට ගනුදෙනුකාර අවශ්‍යතාවන්ට ප්‍රතිචාරී වීමටත්, අපගේ නිෂ්පාදන හා සේවාවන් සඵලදායී ලෙස ඔවුන්ට ලබා දීමටත් හැකි වෙයි. විශේෂයෙන්ම, ඩිජිටල් යටිතල පහසුකම් අපට සම්පත් භාවිතය අඩු කළ හැකි කරවන අතර එමගින් අපගේ මානව සම්පතට ණය විශ්ලේෂණය, උපදේශක සේවා හා වෙනත් එවැනි කාර්යන් සඳහා සිය දැනුම හා කුසලතා උද්දීපනය කරන ක්‍රියාකාරකම්වල නියැලීමට අවකාශ ලැබේ.

## සුවිශේෂතා

ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රයෙහි **ප්‍රථම නවීකරණ මධ්‍යස්ථානය** විවෘත කිරීම

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMs) සඳහා **රුපියල් මිලියන 203 ක** ආයෝජනය

භෞතික යටිතල පහසුකම් තුළ **රුපියල් බිලියන 2.6 ක** ආයෝජනය

දේශය පුරා ස්වයං-බැංකු ඒකක **239**

තොරතුරු තාක්ෂණ පද්ධති තුළ ආයෝජනයෙහි **33.7% ක** වැඩිවීමක්

**"වර්ෂයේ විශිෂ්ටතම හවුල් ටෙලර් යන්ත්‍ර ප්‍රතිග්‍රාහකයා"** ලෙස විරුදාවලිය ලැබීම

## නිෂ්පාදිත ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම

"මූල්‍ය සේවාවන්හි අවිවාදාත්මක ප්‍රමුඛයා වශයෙන් පිළිගැනීමට ලක් වීම" සඳහා අප උපායමාර්ගික දැක්ම සාක්ෂාත් කර ගැනීමේ හැකියාව ආරක්ෂා කර ගනු පිණිස නිෂ්පාදිත ප්‍රාග්ධනය තුළ ආයෝජනය කිරීම අඛණ්ඩ හා වර්තමානයේ ක්‍රියාත්මක ක්‍රියාවලියකි. එම නිසා වගකීමෙන් යුතු ආයතනික භාරකරුවකු වනු පිණිස වූ අපගේ ඇපකැප වීම පිළිබිඹු කරන තාක්ෂණික වශයෙන් උසස් වත්කම් සමුදායක් ඇති කරනු පිණිස නිෂ්පාදිත ප්‍රාග්ධනය තුළ ආයෝජනය සම්බන්ධයෙන් සවිඥානක සිතුවිලි ක්‍රියාවලියක් ක්‍රියාත්මක වෙයි.

දිවයින පුරා ගනුදෙනුකරුවන් වෙත සර්වග්‍රාහී හා පහසු සේවාවක් පිරිනමනු පිණිස, අපගේ දිගු-කාලීන වර්ධන අපේක්ෂණයන්ට සුවිශේෂී තරගකාරී වාසියක් ලබා දෙන උසස් ගණයේ වත්කම් සමුදායක් සංවර්ධනය කරනු පිණිස අපි නොනවත්වා ආයෝජනය කරමු. අපි සුමට මෙහෙයුම් සහතික වීමටත්, ආරම්භක කාලය ඉවත් කිරීමටත්, කොටස්කාර අගය ප්‍රේරණය කිරීමටත් අපගේ සියලුම භෞතික වත්කම් ප්‍රශස්ත මට්ටමෙන් පවත්වා ගැනීම හා තත්වයෙන් උසස් කිරීම කරමු.

## නිෂ්පාදිත ප්‍රාග්ධන සංඛ්‍යා දත්ත

| | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| ශාඛා සංඛ්‍යාව | 739 | 738 | 737 | 737 | 740 |
| ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව | 755 | 716 | 572 | 506 | 492 |
| ශාඛා සංවර්ධනය සඳහා වූ ආයෝජනය (රු. මිලියන) | 1,378 | 1,391 | 1,091 | 1,176 | 1,128 |
| ටෙලර් යන්ත්‍ර සඳහා ආයෝජනය (රු. මිලියන) | 203 | 299 | 396 | 21 | 3 |
| තොරතුරු තාක්ෂණ පද්ධති සඳහා වූ ආයෝජනය (රු. මිලියන) | 430 | 322 | 987 | 397 | 692 |

# නිෂ්පාදිත ප්‍රාග්ධනය




## ප්‍රාග්ධන සබඳතා හා හුවමාරු

- වැඩි ආදායම හා බදු-පූර්ව ලාභය
- පිරිවැය අඩු කිරීම හරහා මෙහෙයුම් කාර්යක්ෂමතා

- අතිරේක රැකියා ඇති කරන ධාරිතා ව්‍යාප්ති
- නව/වැඩිදියුණු කළ තාක්ෂණය හා ක්‍රියාවලි පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණුව

- විශේෂ බැංකු ඒකක හා හරිත බැංකු සංකල්පය හරහා වැඩි වූ සන්නාම දෘශ්‍යතාව
- දියුණු තාක්ෂණය හරහා වඩා කාර්යක්ෂම ක්‍රියාවලි

- ඩිජිටල් මාර්ග හරහා කඩදාසි රහිත බැංකුකරණය
- හරිත ශාඛා පිහිටුවීම

- ශක්තිමත් ගනුදෙනුකාර සබඳතා
- ඩිජිටල්කරණය හරහා වර්ධිත ගනුදෙනුකාර සේවා මට්ටම්

## තිරසාර සංවර්ධන පරමාර්ථ (SDGs) සමග දිශාගත වීම

**යහපත් රැකියා හා ආර්ථික වර්ධනය** - අපගේ සේවකයින් සඳහා ආරක්ෂාකාරී හා හිතකාමී සේවා ස්ථානයක් සහතික කිරීම

**කර්මාන්ත, නව්‍යකරණය හා යටිතල පහසුකම්** - තිරසාරභාවය විසින් මෙහෙයවනු ලබන නව්‍යකරණය, ඩිජිටල්කරණය හා පද්ධති දියුණුව හරහා මෙහෙයුම් ප්‍රමුඛතා ප්‍රගමණය

**අඩු අසමානතා** - සමාජයේ සෑම කොටසකටම ජගත් මට්ටමේ බැංකු විසඳුම් දෙනු පිණිස බස්නාහිර පළාතෙන් පිටත උපායමාර්ගික බැංකු ඒකක 154 ක් සථානගත කරන ලදී.

**වගකීමෙන් යුතු පරිභෝජනය හා නිෂ්පාදනය** - අප ඩිජිටල් බැංකු මාර්ග හරහා කඩදාසි රහිත බැංකුකරණය ප්‍රවර්ධනය මගින් පාරිසරික තිරසාරභාවයට සහාය වූ අතර, කාර්යක්ෂම සම්පත් උපයෝගිතාව සඳහා ප්‍රසම්පාදන කාර්යය ක්‍රියාත්මක කොට ස්වයංක්‍රීය කරන ලදී.

**දේශගුණ ක්‍රියාමාර්ගය** - අප ඩිජිටල් බැංකු මාර්ග හරහා කඩදාසි රහිත බැංකුකරණය ප්‍රවර්ධනය මගින් පාරිසරික තිරසාරභාවයට උපකාර විය.

## අපගේ ගනුදෙනුකාර ස්පර්ශ ලක්ෂ්‍ය

අපි මූල්‍යමය සර්වග්‍රාහිත්වය හා මෙරට සියලු පුරවැසියන්ට බැංකුකරණයට ප්‍රවිෂ්ටය ඇති කළ යුතු බව අදහමු. අපගේ ගිණුම් සබඳතා මිලියන 17.7 සඳහා දීපව්‍යාප්ත ටෙලර් යන්ත්‍ර 755 කට යා වූ ශාඛා 739 ක විශාලතම ජාලය හරහා සේවය සැලසේ. 2019 දෙසැම්බර් 31 දින වන විට සමස්ත වශයෙන් ශාඛා 348 ක ඩිජිටල් හැකියාව ඇති කරන ලදී.

රජය සතු බැංකුවක් ලෙස අපි මෙරට ග්‍රාමීය පෙදෙස් තුළට ඩිජිටල් මූල්‍ය සේවා පිවිසවීම පහසු කරවීමෙහි ඉදිරියෙන්ම සිටින අතර ජාතිය ඩිජිටල් සමාජයක් බවට පරිනාමණය වීමේදී අසම සාර්ථකත්ව මට්ටම් වාර්තා කර ඇත. අපගේ සැමදා පුළුල් වන ඩිජිටල් පියසටහනට ස්වයං-බැංකුකරණ ඒකක 239 ක් සහ දින 365 පුරාම සතියේ දින 7 පැය 24 ම තථ්‍යකාල ප්‍රවිෂ්ටය පිරිනමන ස්වං-සේවා ස්වයංක්‍රීය යන්ත්‍ර 1,247 ක් ඇතුළත් වේ. සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ අපි දිවයින පුරා උපායමාර්ගික ස්ථානයන්හි ස්වයං-සේවා කුටි 28 ක්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 39 ක් හා මුදල් තැන්පතු යන්ත්‍ර 32 ක් ස්ථාපිත කළෙමු. පාරිසරික තිරසාරභාවය කරා අපගේ ඇපකැප වීම අපගේ "මහජන හරිත හෘද ස්පන්දනය" (පීප්ල්ස් ග්‍රීන් පල්ස්) යන පාරිසරික තිරසාරභාව ප්‍රතිපත්තිය තුළ පිළිබිඹු වේ.

දේශය පුරා සෑම තැනැත්තකුටම බැංකු හා මූල්‍ය සර්වග්‍රාහකත්වය සළසුවම පහසු කරවීමේ අපගේ ප්‍රයත්නයන් පිළිගැනීමට ලක් කරමින් 2019 "ලංකා පේ ටෙක්නොවේෂන්" සම්මාන උළෙලේදී "වර්ෂයේ විශිෂ්ටතම ටෙලර් යන්ත්‍ර ප්‍රතිග්‍රාහක" වශයෙන් සම්භාවනාවට ලක් විය.

## අපගේ ගනුදෙනුකාර ස්පර්ශ ලක්ෂ්‍ය

සෑම පළාතකම විහිදුනු ශාඛා 739

ටෙලර් යන්ත්‍ර 755

මුදල් තැන්පතු යන්ත්‍ර 270

ස්වයං-බැංකු ඒකක 239

ගනුදෙනු කුටි 222

GRI 102-4, 102-6

## අප ජාලයේ භූගෝලීය ව්‍යාප්තිය




| උතුර | |
|---|---|
| ශාඛා | 49 |
| ටෙලර් යන්ත්‍ර | 46 |
| විශේෂ බැංකු ඒකක | 12 |
| කුටි | 11 |
| මුදල් තැන්පතු යන්ත්‍ර | 12 |

| උතුරු මැද | |
|---|---|
| ශාඛා | 52 |
| ටෙලර් යන්ත්‍ර | 56 |
| විශේෂ බැංකු ඒකක | 19 |
| කුටි | 16 |
| මුදල් තැන්පතු යන්ත්‍ර | 21 |

| වයඹ | |
|---|---|
| ශාඛා | 75 |
| ටෙලර් යන්ත්‍ර | 73 |
| විශේෂ බැංකු ඒකක | 20 |
| කුටි | 20 |
| මුදල් තැන්පතු යන්ත්‍ර | 24 |

| නැගෙනහිර | |
|---|---|
| ශාඛා | 61 |
| ටෙලර් යන්ත්‍ර | 56 |
| විශේෂ බැංකු ඒකක | 16 |
| කුටි | 14 |
| මුදල් තැන්පතු යන්ත්‍ර | 17 |

| බස්නාහිර | |
|---|---|
| ශාඛා | 215 |
| ටෙලර් යන්ත්‍ර | 228 |
| විශේෂ බැංකු ඒකක | 85 |
| කුටි | 78 |
| මුදල් තැන්පතු යන්ත්‍ර | 102 |

| සබරගමුව | |
|---|---|
| ශාඛා | 56 |
| ටෙලර් යන්ත්‍ර | 56 |
| විශේෂ බැංකු ඒකක | 16 |
| කුටි | 16 |
| මුදල් තැන්පතු යන්ත්‍ර | 19 |

| දකුණ | |
|---|---|
| ශාඛා | 86 |
| ටෙලර් යන්ත්‍ර | 90 |
| විශේෂ බැංකු ඒකක | 29 |
| කුටි | 28 |
| මුදල් තැන්පතු යන්ත්‍ර | 30 |

| මධ්‍යම | |
|---|---|
| ශාඛා | 96 |
| ටෙලර් යන්ත්‍ර | 97 |
| විශේෂ බැංකු ඒකක | 28 |
| කුටි | 25 |
| මුදල් තැන්පතු යන්ත්‍ර | 31 |

| ඌව | |
|---|---|
| ශාඛා | 49 |
| ටෙලර් යන්ත්‍ර | 53 |
| විශේෂ බැංකු ඒකක | 14 |
| කුටි | 14 |
| මුදල් තැන්පතු යන්ත්‍ර | 14 |

# නිෂ්පාදිත ප්‍රාග්ධනය

## දේපළ පිරියත හා යන්ත්‍රෝපකරණ තුළ ආයෝජනය

2019 වර්ෂය තුළ දේපළ, පිරියත හා යන්ත්‍රෝපකරණ අත්කර ගනු පිණිස රු. බිලියන 2.6 ක් ආයෝජනය කිරීම මගින් අපගේ භෞතික යටිතල පහසුකම් ශක්තිමත් කරන ලදී. මෙයට අප බැංකුවේ අගය නිර්මාණය කිරීමේ ක්‍රියාවලියට උපකාරක වන සින්නක්කර ඉඩම්, ගොඩනැගිලි, මෝටර් වාහන, කාර්යාලීය උපකරණ හා යන්ත්‍රෝපකරණ ඇතුළත්ය.



නවීකරණය කරන ලද මුලස්ථාන ශාඛාව විවෘත කිරීමට සමගාමීව සිදු වූ චෙක්පත් තැන්පතු කුටිය හා මුදල් ප්‍රතිචක්‍රීකරණ යන්ත්‍රය



බැංකුවේ අග්‍රගණ්‍ය ගනුදෙනුකරුවන්ට සුවිශේෂී ලෙස සේවය සලසනු පිණිස නවීනතම පීප්ල්ස් එලිගන්ස් (මහජන විභූතිය) බැංකු ශාඛාව විවෘත කිරීම

අපගේ ජවසම්පන්න ඩිජිටල්කරණ පරිශ්‍රමය සමග සමපාත වන සේ අපගේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා ඉහළ නැංවීම පිණිසද සැලකිය ආයෝජන යොදවන ලදී.

**දේපළ, යන්ත්‍ර හා උපකරණවලට එකතුවීම්**




| | 2019 | 2018 | 2017 |
|---|---|---|---|
| ගොඩනැගිලි | 495 | 729 | 850 |
| මෝටර් වාහන | 45 | 84 | 143 |
| කාර්යාලීය උපකරණ | 149 | 54 | 47 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 1,872 | 1,978 | 1,492 |

## තොරතුරු තාක්ෂණවේදය

අපගේ ඩිජිටල්කරණ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරනු පිණිස අපි පරිමාව ඉහළ නැංවීමේ හැකියාව ඇති, අප බැංකුවේ අනාගත ව්‍යාප්තිය සඳහා වූ ධාරිතා අවශ්‍යතා සපුරන, වඩාත් දියුණු තාක්ෂණ වේදිකාව යොදා ගෙන ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට හඳුන්වා දෙන මෙම තාක්ෂණය අපට බැංකු ක්ෂේත්‍රය තුළ පෙර නොවූ විරූ වාසිදායක තත්ත්වයක් ලබා දී ඇත. මෙම ඩිජිටල් වේදිකාව ගිණුම් විවෘත කිරීම, ණය මූලාරම්භය, ජංගම බැංකුකරණය හා අන්තර්ජාල බැංකුකරණය තුළ ඉක්මන හා පහසු ඩිජිටල් බැංකු අත්දැකීමක් සඳහා පහසුකම් සැලැස්වීම මගින් සමස්ත බැංකු මෙහෙයුම් ක්ෂේත්‍රයම වෙනස් කර ඇත.

අපගේ ආවරණය ව්‍යාප්ත කිරීමට සහ විශ්වාසය තැබිය හැකි බව, පහසුව හා වේගය වැඩිදියුණු කිරීමට අපි තොරතුරු තාක්ෂණවේද යටිතල පහසුකම් තුළ ආයෝජනය අඛණ්ඩව කරමු. මෙම ශක්තිමත් හා වෙනස් ජාල තත්ත්වය මගින් ඩිජිටල් වාහිනී හරහා අපගේ ගනුදෙනුකරුවන්ට අනගි අත්දැකීමක් ලබා දීමට හැකියාව ලැබෙන අතර ගනුදෙනුවලින් 85% ක් ඩිජිටල් මාර්ග ඔස්සේ සිදුවනු ඇත. අප ගනුදෙනුකරුවන්ට පිරිනැමෙන ලොව ඉහළ මට්ටමේ බැංකු පහසුකම් රාශිය පිළිබඳ විස්තර මෙම වාර්තාවේ 76 වන පිටුවේ දක්වා ඇත.



අභිනවයෙන් හඳුන්වා දුන් පාරිභෝගික ණය ආරම්භ කිරීමේ පද්ධතිය හරහා පහසුකමකට ඉල්ලුම් කරන ගනුදෙනුකරුවෙක්

## අනාගත දසුන

ශ්‍රී ලංකාවේ තාක්ෂණික වශයෙන් වඩාත් ඉදිරියෙන් සිටින බැංකුව බවට පත්වීම අපේ අභිලාෂයයි. අපගේ අරමුණ අපගේ ගනුදෙනුකරුවන්ට ලෝකයේ උසස්ම මට්ටමේ පහසුකම් ලබා දීම හා අපගේ ඩිජිටල්කරණ පරිශ්‍රමය හරහා අපට මෙහෙයුම් විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීමට ඉවහල් වීමයි.

අපි අඛණ්ඩව අපගේ ඩිජිටල්කරණ පරිශ්‍රමය ඉදිරියට ගෙන යමින්, අප ජාතිය වෙත ඩිජිටල් බැංකුකරණය ගෙන එන්නෙමු. අපගේ උන්නතිකාමී ඩිජිටල්කරණ පරිශ්‍රමය අපගේ ගනුදෙනුකරුවන්ට අඛණ්ඩ, සමෝධානිත ඩිජිටල් අත්දැකීමක් ලබාදීමේත්, ශ්‍රී ලංකාවේ බැංකු සේවාවන් බැංකු හා මූල්‍ය සේවාවන් ජාත්‍යන්තර ඩිජිටල් තලයකට එසවීමේත් හැකියාව අපට ලබා දෙනු ඇත. ප්‍රමුඛයා වශයෙන් අපගේ තත්ත්වය පවත්වා ගනු පිණිස අපි අඛණ්ඩව අපගේ ජාලය ඉහළ නැංවීමත්, නව වෙළඳපල ප්‍රමුඛ තාක්ෂණයන් ක්‍රියාවට නැංවීමත් ඉටු කරන්නෙමු.

# බුද්ධිමය ප්‍රාග්ධනය

**මහජන බැංකුවේ බුද්ධිමය ප්‍රාග්ධනය ගොඩනගා ඇත්තේ අප සතු වටිනාකම් උත්පාදන ක්‍රියාවලියේ සහක්‍රියාකාරී පැතිකඩ කිහිපයම ඔස්සේය. අප සතු අසහාය අස්පෘශ්‍ය වත්කම් වන අපටම ආවේණික දැනුම් සම්භාරය, සන්නාම කීර්ති නාමය, ආයතනික සංස්කෘතිය, අප දිනා ඇති සම්මාන හා සම්භාවනාවන් සහ අපගේ ව්‍යාපාරික ආචාර ධර්මවලටම ආවේණික පද්ධති හා ක්‍රියාවලීන් ඊට ඇතුළත් වෙයි.**

## වැදගත් කරුණු

**94%** පාරිභෝගික තෘප්තිමත්භාවය

**98%** සන්නාම දැනුම්වත්භාවය

**AA+** සන්නාම මූල්‍යකරණය

**4.1** ක සන්නාම හිමිකම් දර්ශකයක් සහිත සවිමත් සන්නාමය

**වටිනාකමින් ඉහළම සන්නාමයක්** ලෙස මහජන බැංකුව පිළිගැනීමට ලක් විය

**රු. බිලියන 45.5 ක** සන්නාම වටිනාකම

**European Awards** හිදී 'වසරේ බැංකුව' සහ **ශ්‍රී ලංකාවේ හොඳම ආයතනික බැංකුකරණ සේවා සැපයුම්කරු** ලෙස මහජන බැංකුව පිළිගැනීමට ලක් විය

ගනුදෙනුකාර භවතුන් වෙත අති නවීන මූල්‍ය විසඳුම් ලබා දීම වෙනුවෙන් තොරතුරු තාක්ෂණය ආශ්‍රිත නිරන්තර ආයෝජනයන් සිදු කිරීම, පද්ධති හා ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම, සවිමත් අනුකූලතා සංස්කෘතියක් වර්ධනය කරගැනීම, ආයතනික සන්නාමය වැඩිදියුණු කිරීම, ආයතනික දැනුම ඉහළ නංවා ගැනීම සහ නවෝත්පාදනාත්මක නව සේවා හා නිපැයුම් තිළිණ කිරීම තුළින් අප සතු බුද්ධිමය ප්‍රාග්ධනය වර්ධනය කරගැනීමට අපි නිරන්තරයෙන් කටයුතු කරන්නෙමු.

## ප්‍රාග්ධන සබඳතා හා සමබරතාව

- අප සතු සවිමත් මූල්‍ය ප්‍රාග්ධනය හා ලාභය වර්ධනය වීම නිසා ක්‍රියාවලි හා සන්නාම සංවර්ධනය හා ඩිජිටල්කරණය වෙනුවෙන් ආයෝජන කිරීමට අවස්ථාව හිමි වී ඇත.
- හරිත සංකල්පය කෙරෙහි සවිඥානික ආයතනික සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම අපගේ සන්නාම ව්‍යාප්තියට උපකාරී වී ඇත.
- ශක්‍යතා සංවර්ධනය සහ පුහුණු හා සංවර්ධන අරමුණු විෂය කරගත් ආයෝජන නිසා අපගේ ආයතනික දැනුම හා සඵලදායීතාව ඉහළ නංවයි.
- ඩිජිටල්කරණය, පද්ධති හා ක්‍රියාවලි ආශ්‍රිත අයෝජනයන් මගින් නිෂ්පාදිත ප්‍රාග්ධනය බිහි කෙරේ.
- අප සතු සවිමත් ආචාර ධර්ම, පාරිභෝගික කේන්ද්‍රීය සංස්කෘතිය හා ආයතනික වටිනාකම් නිසා අපගේ සන්නාම ප්‍රතිරූපය වර්ධනය වන අතරම බැංකුව කෙරෙහි ඇති විශ්වාසයද ඉහළ නැංවේ.

## තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සමග අනුගත වීම

සවිමත් ආයතනයක් ගොඩනැගෙන්නේ ශක්තිමත් පාලන යාන්ත්‍රණය, අනුකූලතාව හා ආචාර ධාර්මික චර්යාව යන සාධක වලිනි.

නවෝත්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ ඩිජිටල්කරණය හා යටිතලපහසුකම් සංවර්ධනය වෙනුවෙන් ආයෝජනය කිරීම.

# බුද්ධිමය ප්‍රාග්ධනය

## සම්මාන හා පිළිගැනීම්

විවිධ සම්මාන හා පිළිගැනීම් රැසක්ම හිමි කර ගැනීමට අප සමත් වී ඇති අතර මෙය අප සතු බුද්ධිමය ප්‍රාග්ධනය හරහා අප විසින් නිර්මාණය කර ඇති වටිනාකමට කදිම සාක්ෂ්‍යයකි.

**2019 SLIM NIELSON ජනතා සම්මානය**

- අඛණ්ඩව 13 වන වසර සඳහාද මහජන බැංකුව "වසරේ මහජන සේවා සන්නාමය" ලෙස සම්මානයට පාත්‍ර විය.
- අඛණ්ඩව 13 වන වසරේදීද "මහජන බැංකුකරණ සේවා සැපයුම්කරු" ලෙස සම්භාවනාවට ලක් විය.

**LANKAPAY TECHNOVATION AWARDS 2019**

- ජනප්‍රියම ඉලෙක්ට්‍රොනික් ගෙවීම් නිපැයුම – ස්වර්ණ සම්මානය
- Best Common ATM Acquirer of the Year – ස්වර්ණ සම්මානය
- මූල්‍ය අන්තර්ගෘහිතතාව සහිත වසරේ බැංකුව – ස්වර්ණ සම්මානය
- අන්තර් බැංකු ගෙවීම් සඳහා විශිෂ්ඨතාව සහිත සමස්ථ ජයග්‍රාහකයා - කුසලතා සම්මානය




**ASIA MONEY AWARDS 2019**

හොඳම ඩිජිටල්කරණය වූ බැංකුව

**THE ASIAN BANKER AWARDS 2019**

- ශ්‍රී ලංකාවේ හොඳම පුද්ගල කේන්ද්‍රීය බැංකුව
- ශ්‍රී ලංකාවේ හොඳම ඩිජිටල් බැංකුව
- ආසියා පැසිෆික්, මැද පෙරදිග හා අප්‍රිකාව යන කලාපවල අතිශයින්ම වැඩිදියුණු වූ පුද්ගල කේන්ද්‍රීය බැකුංව
- හොඳම ඩිජිටල් සම්මාන ක්‍රියාදාම, යෙදුම් හෝ වැඩසටහන් සම්මානය
- හොඳම ජංගම දුරකතන ක්‍රියාදාම, යෙදුම් හෝ වැඩසටහන් සම්මානය

**ADB TFP AWARDS 2019**

ශ්‍රී ලංකාවේ පුරෝගාමී හවුල්කාර බැංකුව

**EUROPEAN GLOBAL BANKING AND FINANCE AWARDS 2019**

ශ්‍රී ලංකාවේ ශීඝ්‍රයෙන්ම වර්ධනය වන ආයෝජන බැංකුව

## සන්නාම හිමිකම

අප සෑම කල්හිම මෙරට ජනතා හදගැස්ම හා අවශ්‍යතා මනාව වටහා ගනිමින් ජන ජීවිතවලට අතිශයින් සමීපව දිගු කලක් මුළුල්ලේ සවිමත්ව නැගී සිටින ආයතනයකි.

ගත වූ දශක හයක අති සාර්ථක අතීතය තුළ විවිධ මූල්‍ය සේවා සපයමින් විවිධ සමාජ මට්ටම්වල ජන ප්‍රජාවන් රැසක් සවිබල ගැන්වීමට අපි දායක වී ඇත්තෙමු. 2019 දෙසැම්බර් 31 දිනට වත්කම් අතින් ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම වාණිජ බැංකුවද ලාභදායීතාවය අතින් ඉහළම වාණිජ බැංකුවද වශයෙන් නැගී සිටීමට අපට හැකි වීම අභිමානයකි. දීප ව්‍යාප්ත ශාඛා 739 කින්, ATM යන්ත්‍ර 755 කට අධික ප්‍රමාණයකින් හා වසරේ සෑම දිනකම පැය 24 පුරාවටම තථ්‍ය කාලීන ප්‍රවේශය ලබා දෙන ස්වයං-බැංකුකරණ ඒකක 200 කටත් අධික ප්‍රමාණයකින් සමන්විත අපගේ අති පුළුල් සේවා ජාලය ඔස්සේ අප හා රැඳී සිටින මිලියන 10 කට අධික ගනුදෙනුකාර ප්‍රජාව වෙත මූල්‍ය සේවා ලබා දෙනුයේ මෙරට බැංකු ක්ෂේත්‍රයේ විශාලතම ඉතුරුම් ගිණුම් පදනමට අභිමානවත්ව හිමිකම් කියමිනි.

2019 වසරේදී අපගේ සන්නාම හිමිකම් දර්ශකය 4.1 දක්වා ඉහළ නැගි අතර AA+ සන්නාම ශ්‍රේණිගත කිරීමක් හිමි වීමද අප කෙරෙහි ඇති ඉහළ පාරිභෝගික පාක්ෂිකත්වය, අප සේවාවන් පිළිබඳව ගනුදෙනුකරුවන් අතර ඇති දැනුම්වත්භාවය හා අවබෝධය, පිළිගැනීම, සන්නාම සබැඳීම හා මහජන බැංකු සන්නාමයේ ගුණාත්මකභාවය පිළිබඳව ප්‍රචලිත හැඟීම ප්‍රත්‍යක්ෂ කරයි. Brand Finance විසින් අප බැංකුව වටිනාකමින් ඉහළම සන්නාම තුන අතරින් එකක් ලෙස පිළිගත් අර අපගේ සන්නාම වටිනාකම 29% කින් රු. බිලියන 45.5 දක්වා වර්ධනය වීමද සුවිශේෂී කරුණකි. එපමණක්ද නොව, මහජන බැංකුවේ සන්නාම සවිමත්භාවයද 2019 වසරේදී 71 සිට 75 දක්වා වර්ධනය විය.



*Brand Finance විසින් මහජන බැංකුව 2019 වසරේ ශ්‍රී ලංකාවේ වටිනාකමින් ඉහළම සන්නාම 03 අතරට ශ්‍රේණිගත කරන ලදි.*

විවිධ වයස්වල පසුවන ගනුදෙනුකාර භවතුන්ගේ ප්‍රයෝජනය පිණිස විවිධාංගීකරණය කරන ලද ඩිජිටල් බැංකුකරණ විසඳුම් මාලාවක්ම හඳුන්වා දීම වෙනුවෙන් අප විසින් තබන ලද දැවැන්ත පියවර හේතුවෙන් ඔවුන් අප හා කරන සෑම ගනුදෙනු කටයුත්තකදීම අසමසම පහසුවක්, වේගයක් හා ඵලදායීතාවක් ලබා දීමට අපට හැකි වී ඇත.

## සන්නාම කාර්යසාධනය

2019 වසර තුළදී මහජන බැංකු සන්නාමය සෑම අංශයකින්ම වර්ධනය වී ඇත.

| සන්නාම කාර්යසාධනය | 2019 | 2018 |
|---|---|---|
| සන්නාම වටිනාකම (රු. බිලියන) | 45.5 | 35.3 |
| සන්නාම ශ්‍රේණිගත කිරීම | AA+ | AA |
| සන්නාම හිමිකම් දර්ශකය | 4.1 | 3.5 |
| සන්නාම දැනුම්වත්භාවය (%) | 98 | 32 |
| පාරිභෝගික තෘප්තිමත්භාවය (%) | 94 | 91 |
| සන්නාම සවිමත්භාවය (%) | 75 | 71 |

## සන්නාම සංවර්ධනය

මහජන බැංකු සන්නාමය වනාහි අප සතු අමිල වටිනාකම් මෙන්ම ඩිජිටල් පුරෝගාමීත්වය, නවෝත්පාදනය, ආයතනික යහපාලනය, පාරිභෝගික සේවා විශිෂ්ටතාව, කාර්යක්ෂම පාරිභෝගික සබඳතා කළමනාකරණය, සවිමත් වෙළෙඳපොළ ව්‍යාප්තිය හා ස්ථායීතාව මනාව ප්‍රකට කරන්නක්ද වේ. සන්නාමයක් සවිමත් ලෙස ස්ථාපිත කිරීමේදී විශ්වාසය, සේවා විශිෂ්ටතාව, පහසුදායීතාව හා නවීන තාක්ෂණය යන සාධක ප්‍රමුඛ භූමිකාවක් දරන බව අපගේ විශ්වාසයයි. අප සතු ඩිජිටල් බැංකුකරණ විසඳුම් ඔස්සේ මේ ප්‍රතිලාභ සියල්ලම ලබා දෙන අතර ශ්‍රී ලංකා රජයේ නිරන්තර සහාය හිමි ආයතනයක් වීමද බැංකුවක් වශයෙන් අප කෙරෙහි ඇති විශ්වාසය තවදුරටත් ඉහළ නැංවීමට හේතු වෙයි.

දිවයින පුරා සෑම ගනුදෙනුකාර ප්‍රජාවක්ම වෙත ඩිජිටල් බැංකුකරණයේ ප්‍රතිලාභ අත්කර දීමේ සුභවාදී ප්‍රතිඵලයක් වශයෙන් 2019 වසරේදී අප කෙරෙහි ඇති පාරිභෝගික තෘප්තිමත්භාවය 94% ක් තරම් ඉහළට වර්ධනය වී ඇත. විස්තීර්ණ සන්නිවේදන උපායමාර්ග හරහා ඩිජිටල් බැංකු සේවා පිළිබඳව ගනුදෙනුකරුවන් අතර ඇති අවබෝධය ඉහළ නැංවීමට හැකි වීමේ ප්‍රතිඵලයක් ලෙස 2019 වසරේදී අපගේ ගනුදෙනුකරුවන් අතරින් වැඩි පිරිසක් ඩිජිටල් ක්‍රමවේද වෙත යොමු වීමද ප්‍රකට විය. කලින් කලට සමීක්ෂණ සිදු කිරීම තුළින් සන්නාම හිමිකම හා දැනුම්වත්භාවය සහ පාරිභෝගික තෘප්තිමත්භාවය යන කාරණා විෂයිකව අපගේ සන්නාමයේ යහපැවැත්ම තහවුරු කිරීම කෙරෙහි සමීප අවධානයකින් අප කටයුතු කරන්නෙමු. ගනුදෙනුකරුවන් හා කරනු ලබන සන්නිවේදනයන්හි ගුණාත්මකභාවය වැඩිදියුණු කරනු පිණිස ඔවුන් අතර ඇති මිලදී ගැනීමේ හා මාධ්‍ය භාවිත හුරුපුරුදු සමීපව නිරීක්ෂණය කරමින් අපගේ සන්නිවේදන මාධ්‍ය පාදක ප්‍රචාරණ වැඩසටහන්ද වෙනස් කිරීමට පියවර ගත්තෙමු.

## ආයතනික සංස්කෘතිය

"මහජනතාවගේ බැංකුව" වශයෙන් අප සෑම විටම නැගී සිටින්නේ පාර්ශ්වකරුවන් වෙනුවෙන් නිරන්තර හා තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීම අරමුණු කරගත් වටිනාකම් පාදක සංස්කෘතියක් මත ය. අපගේ සංස්කෘතියේ ප්‍රධාන පැතිකඩ තුනක් වෙත අපි නිරන්තර අවධානය යොමු කරන්නෙමු:

ආයතනික සංස්කෘතිය - විවෘතභාවය, විනිවිදභාවය, වගවීම, පාරිභෝගික කේන්ද්‍රීයතාව, ඉලක්ක කේන්ද්‍රීයතාව හා කණ්ඩායම් කේන්ද්‍රීයතාව

දැනුම් සංස්කෘතිය - දශක හයක් පුරාවට උකහාගත් දැනුම හා විශේෂඥතාව

නවෝත්පාදන සංස්කෘතිය - පහළ සිට ඉහළට ප්‍රවේශය හා සේවා මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු වෙනුවෙන්ම විවෘත අවස්ථාවලින් පිරී ඇති ප්‍රතිඵලදායී සංස්කෘතිය.

## ආයතනික දැනුම

මහජන බැංකු දැනුම් පදනම සමන්විත වන්නේ දිගු කාලයක් පුරාවට බැංකුව තුළ සිය සේවා කාලය තුළදී අපගේ සේවක මහත්ම මහත්මීන් විසින් උකහා ගන්නා ලද පළපුරුද්ද හා විශේෂඥතාව කෙරෙනි. මෙය හුදෙක්ම ඔවුන්ට හිමි දෙයක් වන අතර වචනවලට ලඝු කළ නොහැකි අමිල වත්කමක්ද වේ.

අද අප සතුව පවතින දැවැන්ත පළපුරුද්ද හා විශිෂ්ටතාව බිහි කරනු වස් මහජන බැංකුව මෙහෙයුම් අරඹා ගත වූ වසර 58 ක කාලය පුරාවට බැංකුව හා රැඳී සිටි සේවකයන්ගේ දායකත්වය වෙනුවෙන් අප ආයතනය කටයුතු කර ඇත. මෙය අප සතු බුද්ධිමය ප්‍රාග්ධනය සවිබල ගන්වන සාධකයක්ද වේ.

අපගේ කාර්ය මණ්ඩලයෙන් 20% කටත් වැඩි පිරිසක් මේ වන විට වසර 20 කට අධික කාලයක් අප බැංකුවෙහි සේවය කරන අතර අතිශයින්ම විශේෂිත බැංකුකරණ විශේෂඥතාවක්ද ඇතුළත් පළපුරුද්දක් හා අත්දැකීම් සම්භාරයකට ඔවුහු හිමිකම් කියති. මෙම දැනුමෙන් අපගේ මෙහෙයුම් සඳහා ප්‍රයෝජනයක් ගනු පිණිස දැනුම් හුවමාරු සැසි, පුළුල් මට්ටමේ පුහුණු හා මානව ප්‍රාග්ධන කළමනාකරණ ක්‍රමවේද ඔස්සේ විවිධ ක්‍රමවලින් එකී තොරතුරු ලේඛනගත කොට සේවකයන් අතර බෙදාහදා ගැනීමටද අපි පියවර ගන්නෙමු. සුදුසුකම් හා පළපුරුද්ද මෙන්ම දැනුම විෂයිකව අපගේ සේවකයන් පළ කරන විවිධත්වයද ඉතාම වටිනා වත්කමක් වේ. අපගේ කාර්ය මණ්ඩලයෙහි සුදුසුකම්වල විවිධත්වය පහත වගුවෙන් දක්වා ඇත:

| සුදුසුකම | සේවක සංඛ්‍යාව |
|---|---|
| MSc/MBA/පශ්චාත් උපාධි | 414 |
| BA/BSc/BBA/BCOM/BIT | 1,507 |
| CIMA/CFA/CMA/ICASL/DBF/CIM | 1,534 |
| නීති විෂයෙහි සුදුසුකම් ලාභීන් | 82 |
| තොරතුරු තාක්ෂණ සුදුසුකම් ලාභීන් | 176 |
| ඩිප්ලෝමා හා වෙනත් සුදුසුකම් | 3,972 |
| **එකතුව** | 7,685 |

96.5% ක් ලෙස වාර්තා වන සේවකයන් රැඳී සිටීමේ අනුපාතිකයෙන් පෙන්නුම් කෙරෙන්නේද ගනුදෙනුකාර භවතුන් වෙත අසමසම සේවාවක් ලබා දීමේ ශක්‍යතාව සහිත පළපුරුදු හා දැනුමින් සන්නද්ධ සේවකයන් ආයතනය තුළ රඳවා ගැනීමට අප සතු කුසලතාවයි.

GRI 102- 16

## ව්‍යාපාරික ආචාරධර්ම

ව්‍යාපාරික ආචාරධර්ම හා සුපිළිපන් බව පිළිබඳ ඉහළම ප්‍රමිතීන් අනුගමනය කිරීමට අපි සෑම විටම පියවර ගන්නෙමු. මෙහිදී ආචාරධර්ම, සුපිළිපන් බව, විනිවිදභාවය හා වගවීම යන මූලධර්ම ප්‍රධාන භූමිකාවක් දරන පරිසරයක් ස්ථාපිත කොට පවත්වා ගැනීම උදෙසා අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය නායකත්වය ලබා දෙයි. මේ අතරම, අදාළ සියලුම නීති හා නියාමන රෙගුලාසිවලට අනුකූලතාව දක්වමින් ස්වකීය වෘත්තීය කටයුතු ඉටු කිරීමේ වගකීම අපගේ සේවකයන් විසින් දරනු ලැබේ.

අප දැඩි විගණන හා අනුකූලතා ක්‍රියාවලියකට අනුගත වන අතර අප ලබා ඇති ඉහළ ශ්‍රේණිගත කිරීම්වලින්ද සපථ වන්නේ එයයි. අපගේ විස්තීර්ණ පාලන රාමුව පිටු අංක 153 හි "ආයතනික පාලන වාර්තාවෙහි" සවිස්තරව දක්වා ඇත.

## නවෝත්පාදනය

අපගේ දැක්ම සාක්ෂාත් කරගැනීම සවිබල ගන්වන ප්‍රධාන සාධක බවට නවෝත්පාදනය හා තොරතුරු තාක්ෂණය පත්ව තිබේ. වඩා වැඩි වශයෙන් ගනුදෙනුකරුවන් වෙත සමීප වී ඔවුන්ගේ බැංකුකරණ අවශ්‍යතා ඉටු කිරීම වෙනුවෙන් මහජනතාවගේ බැංකුව වශයෙන් මහජන බැංකුවේ අපි නිරන්තරයෙන්ම ප්‍රයත්න දරන්නෙමු. මූල්‍යමය වශයෙන් අන්තර්ග්‍රාහී පසුබිමක් උදා කරමින් බැංකු සේවා සකළ ශ්‍රී ලාංකිකයන් වෙත විවෘත කිරීම කෙරෙහි අපි නිරන්තර විශ්වාසය තබන්නෙමු. පූර්ව ක්‍රියාකාරී වීම හා ලෝකයේ නව ප්‍රවණතා පිළිබඳ මනා අවබෝධයෙන් පසු වීම තුළින් අප බැංකුව ප්‍රමුඛ ගෝලීය බැංකු හා සම තත්ත්වයේ පිහිටුවනු පිණිස පුරෝගාමී සේවා හා නිපැයුම් සකස් කිරීම හා ඒ ඔස්සේ අපගේ පාර්ශ්වකරුවන්ද ජාත්‍යන්තර මට්ටමේ බැංකු පුරවැසියන් ලෙස සවිබල ගැන්වීම කෙරෙහි අප විසින් අවධානය යොමු කොට ඇත.

සාර්ථක නවෝත්පාදනය යනු පහළ සිට ඉහළට යොමු වන එළැඹුමක් වන අතර නවතම සේවකයන් පවා නව අදහස් සම්මාදම් කිරීමට දිරිගන්වමින් කුඩා සේවක කණ්ඩායම් සමග අපි කටයුතු කරන්නෙමු. එමගින් සෑම මට්ටමකදීම නවෝත්පාදනය සහතික කෙරෙන අතරම සියලුම සේවකයන් වෙනුවෙන් අවස්ථා උදා කරන හා වර්ධනීය අභිලාෂ ජනිත කරවන ප්‍රතිලාභී සේවා සංස්කෘතියක් බිහි කිරීමටද එය හේතු වේ.

ඩිජිටල්කරණය ශ්‍රී ලාංකේය බැංකු ක්ෂේත්‍රයේ කරළියට ගෙන එමින් අපගේ නවෝත්පාදනීය හා ඩිජිටල් ක්‍රියාදාමයන් තවදුරටත් සවිගන්වනු පිණිස ශ්‍රී ලංකාවේ පළමු නවෝත්පාදන මධ්‍යස්ථානය දියත් කිරීමේ පෙරමුණ ගන්නා ලද්දේද අප විසිනි.

## අපගේ ඩිජිටල්කරණ නැඹුරුව

"2020 වන විට අතිශයින්ම ඩිජිටල්කරණය වූ බැංකුව" බවට පත් වීමේ දැක්ම සාක්ෂාත් කරගනු පිණිස අපගේ ඩිජිටල්කරණ ප්‍රයත්නයන් කාර්යක්ෂම කරගැනීමටද පියවර ගන්නා ලදි. මේ වන විට සමස්ථ ශ්‍රී ලාංකේය ජාතියම වෙත ඩිජිටල්කරණයේ ප්‍රතිලාභ අත්කර දෙමින් ඩිජිටල් නවෝත්පාදනයේ ඉදිරියෙන්ම සිටින බැංකුව බවට පත් වීමට අපට හැකි වීම නිසාම ලොව පෙරමුණේම සිටින මූල්‍ය ආයතන සමග කරට කර නැගී සිටීමට අපට හැකි වී තිබේ.

අපගේ ඩිජිටල්කරණ න්‍යායපත්‍රය වේගවත් කිරීමේ පියවරක් වශයෙන් 2018 වසරේදී තාක්ෂණික වශයෙන් ඉතාම දියුණු හා පහසුකම් රැසකින් සමන්විත අපගේ ජංගම දුරකතන යෙදුම දියත් කිරීමට අප කටයුතු කළ අතර ජංගම දුරකතන පාදක ගනුදෙනු කටයුතු තුන් ගුණයකින් වැඩි කිරීමට එය හේතු විය.

මීට අමතරව, ඩිජිටල් බැංකුකරණ, අන්තර්ජාල බැංකුකරණ මෙන්ම ජංගම දුරකතන පාදක බැංකුකරණ පහසුකම් මෙන්ම පුද්ගලික හා ආයතනික ගනුදෙනුකරුවන් වෙනුවෙන් ණය ක්‍රියාවලි පද්ධතිද අප විසින් හඳුන්වා දෙන ලදි. ශාඛා හා බහුවිධ නාලික ඩිජිටල්කරණ ක්‍රියාදාමයන්ද දියත් කරන ලද අතර වැඩිදියුණු කර ලද අන්තර්ජාල බැංකුකරණ පහසුකම් හා ඊ-ප්‍රේෂණ (e-remittance) විසඳුමක්ද ඊට ඇතුළත් විය.

## ස්වයං බැංකුකරණ ඒකක (SBUs)

ගනුදෙනුකරුවන්ට වසරේ දින 365 පැය 24 පුරාවටම බැංකු සේවා ලබා ගැනීමේ පහසුව උදා කරමින් ATM යන්ත්‍ර, මුදල් තැන්පතු යන්ත්‍ර හා Kiosk යන්ත්‍ර ආදියෙන් සමන්විත අපටම ආවේණික සංකල්පයක් වූ ස්වයං බැංකුකරණ ඒකක දියත් කිරීමේ පුරෝගාමියා බවට පත් වූයේද අප වීම විශේෂයකි. දෙසැම්බර් 31 දින වන විට අප විසින් ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක්ම ආවරණය කරමින් ස්වයං බැංකුකරණ ඒකක 239 ක් පිහිටුවන ලද අතර සාමාන්‍යයෙන් ලෙස ගත් විට ATM යන්ත්‍ර හරහා රු. බිලියන 52.7 ක වාර්තාගත ගනුදෙනු අගයයක්ද මාසිකව රු. බිලියන 82.3 ක වටිනාකමින් යුතු ගනුදෙනු ප්‍රමාණයක්ද වාර්තා කිරීමට මගපෑදූ ක්‍රියාදාමයක්ද විය.

## People's Wave

මෙරට බැංකුකරණ ක්ෂේත්‍රයේ පෙරළියක් සනිටුහන් කරමින් වැඩියෙන්ම භාගත කෙරුණු මූල්‍ය යෙදුම වන People's Wave ජංගම දුරකතන බැංකුකරණ යෙදුම 2018 වසරේ දියත් කිරීමෙන් පසුව ගත වූ ඉතාම කෙටි කලක් තුළ Google Play Store හි 4.3 ක ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීමට සමත් වූ අතර 570,000 ක භාගත කිරීම් ප්‍රමාණයක් වාර්තා කර ඇත. People's Wave යනු මෙරට තුළ ක්‍රියාත්මක ඊට සමාන අනෙකුත් මූල්‍ය යෙදුම් සියල්ලම අභිබවන්නට සමත් වූ යෙදුමක් වීමද සුවිශේෂී කරුණකි. වෙනත් ගිණුම්වලට මුදල් මාරු කිරීම්, අන්තර්ජාලය හරහා ණය ගෙවීම, මහජන බැංකුවේ නොවන ගිණුම් හිමියන් වෙත රු. 10,000 දක්වා මුදල් ප්‍රේෂණය කිරීම සහ තවත් සේවා බොහොමයකින් සමන්විත මූල්‍ය ගනුදෙනු කටයුතු 50 කට අධික ප්‍රමාණයක් මෙම යෙදුම හරහා ඉටු කර ගැනීමට පහසුකම ගනුදෙනුකරුවන් වෙත උදා කර ඇත.

මෙම යෙදුමෙහි අන්තර්ගත අති විශිෂ්ට පහසුකම් වෙනුවෙන් තිළිණ හා සම්මාන කිහිපයක්ම හිමි වෙමින් ජාත්‍යන්තර මට්ටමේ පිළිගැනීමක්ද හිමි විය.

## People's Wiz

මෙය, පෙරදිග ආසියාව, අප්‍රිකාව හා මැද පෙරදිග කලාප ආශ්‍රිත ඩිජිටල් බැංකුකරණ ගනුදෙනුකරුවන් ඒකාබද්ධ කරන පළමු යෙදුම වේ. ඩිජිටල් නියෝජිතයන් හා ගනුදෙනුකරුවන් මිනිත්තු 10 කටත් වඩා අඩු කාලයකින් අන්තර්ජාල අවකාශයක් තුළ ඒකාබද්ධ කිරීමේ හැකියාව මෙම ඩිජිටල් මෙවලම සතුව පවතී. ඉතාම කෙටි මෙහෙයුම් කාලයකින් ගනුදෙනුකරුවන් හට ඩිජිටල් ගිණුම් විවෘත කර ප්‍රතිලාභ ලබා ගැනීමේ අවස්ථාවද මෙය ඔස්සේ ලබා දේ. මෙම ඩිජිටල් මෙවලම හරහා අන්තර්ජාලය ඔස්සේ තථ්‍ය කාලීනව ඩෙබිට් කාඩ්පත් සක්‍රීය කිරීම, අන්තර්ජාල බැංකු ප්‍රවේශය, ජංගම බැංකුකරණ ප්‍රවේශය, SMS ඇලර්ට්ස් හා මුදල් තැන්පතු සේවා ආදී අවශ්‍යතා රැසක් ඉටුකර ගැනීමේ පහසුව සලසා තිබේ.

2017 වසරේදී People's Wiz ඩිජිටල් මෙවලම දියත් කිරීමෙන් අනතුරුව මෙහි සමාලෝචිත කාල පරිච්ඡේදය වන විට ගනුදෙනුකරුවන් 500,000 කට අධික පිරිසක් මේ ඔස්සේ ඩිජිටල් ගිණුම් වෙත සම්බන්ධ

කරන්නට අපට හැකි විය. 2019 වසර තුළදී අපගේ ප්‍රධාන ශාඛා 248 ම මෙමගින් ආවරණය කරන්නට අපට හැකි වූ අතර ඉදිරි වසර තුළදී මෙය මහජන බැංකුවේ සියලුම සේවා මධ්‍යස්ථාන වෙත ව්‍යාප්ත කිරීම අපගේ සැලැස්මයි.

## People's Wyn

ආයතනික ගනුදෙනුකරුවන් සඳහාම සුවිශේෂයෙන් සකස් කරන ලද මොඩියුලයක් වන මෙය අන්තර්ජාල බැංකුකරණ පෝර්ටලයක් මෙන්ම ජංගම දුරකතන යෙදුමක්ද ලෙස ලබා ගත හැකි වේ. ආයතනික බැංකුකරුවන් හට සිය බැංකු ගනුදෙනු කටයුතුවලදී සුවිශාල පහසුවක්, වේගයක් හා නම්‍යශීලීතාවක් මෙන්ම ඉහල රහස්‍යතාවක්ද මෙමගින් ලබා දේ. 2018 ජූලි මාසයේදී දියත් කරන ලද මෙම මොඩියුලය ගනුදෙනුකරුවන් 3,500 කට අධික ප්‍රමාණයක් විසින් භාවිතයට ගනිමින් තිබේ.

## People's Web

2018 මැයි මාසයේදී දියත් කරන ලද අපගේ අන්තර්ජාල බැංකුකරණ මොඩියුලය People's Wave ජංගම දුරකතන යෙදුම සමග යාවත්කාල කර ඇත. අසමසම අත්දැකීමක් ගනුදෙනුකරුවන් වෙත උදා කරන වැඩිදියුණු කරන ලද පහසුකම්ද සමගින් මෙම පෝර්ටලය 350,000 කට අධික ගනුදෙනුකරුවන් පිරිසක් විසින් භාවිත කරමින් පවතී.

## අපගේ ඩිජිටල් නාලිකා යොදාගැනීම වේගයෙන් ඉහළ යමින් ඇත -

**දිවයින පුරා ඩිජිටල් ගනුදෙනුකරුවන් 500,000 කට අධික පිරිසක්**

**ගතානුගතික බැංකු ගනුදෙනුවලින් 85% කට අධික ප්‍රමාණයක් ඩිජිටල් නාලිකා ඔස්සේ සිදු කෙරේ.**

**People's Wave හි මාසික සාමාන්‍ය භාගත කිරීම් ප්‍රමාණය 25,000**

**2019 දෙසැම්බර් අවසානය වන විට රු. බිලියන 90 කට අධික ඩිජිටල් තැන්පතු පදනමක්.**

**සාමාන්‍යයක් ලෙස ගත් විට රු. බිලයන 6 ක මාසික ඩිජිටල් තැන්පතු වටිනාකමක්.**

**සතිපතා ජංගම බැංකුකරණ යෙදුම ඔස්සේ මූල්‍ය ගනුදෙනු 75,000 කට අධික ප්‍රමාණයක්.**

**සිල්ලර ණය ඇරඹුම් පද්ධතිය ශාඛා 37 ක් ආශ්‍රිතව දියත් කරන ලදි.**

## ඉදිරි දැක්ම

2020 වසර වන විට වෙළෙඳපොල ආධිපත්‍යය අත්කර ගැනීම සඳහා ශක්තිමත් ගමන් මගක ස්ථානගතව සිටින අප මේ වන විටත් ශ්‍රී ලංකාවේ විශාලතම හා මූල්‍යමය වශයෙන් අතිශයින්ම විශේෂිත බැංකුවක් බවට ඉහළ පිළිගැනීමකට ලක්ව ඇත. අපගේ ආයතනික සන්නාමය තවදුරටත් සවිමත් කරගනිමින් මහජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට උපකාරී වන නිපැයුම් සහ ඉහළ ප්‍රවේශයක් සහිත හා කාර්යක්ෂම ලෙස ලබා දෙන විසඳුම් ඔස්සේ ව්‍යවසායික සංවර්ධනය වෙනුවෙන් දායක වීම තුළින් අපගේ වටිනා ගනුදෙනුකාර භවතුන් වෙත වැඩිමනත් වටිනාකමක් ප්‍රදානය කරන අතරම ඉහළ සන්නාම හිමිකමක් පවත්වා ගැනීම වෙනුවෙන් අපි ඉදිරියටත් ඇපකැප වී කටයුතු කරන්නෙමු. අසමසම වර්ධනය අරමුණු කරගනිමින් අපගේ බැංකුව හා ගනුදෙනුකාර භවතුන් සවිමත් කරනු පිණිස අපි ඉදිරියටත් අපගේ ඩිජිටල්කරණ ප්‍රයත්නයන් දියත් කරන්නෙමු. අපගේ ආයතනික ණය ඇරඹුම් පද්ධතිය 2020 ජනවාරි මාසයේදී දියත් කිරීමට කටයුතු සැලසුම් කර ඇත.

අපගේ මූලික අවධානය යොමුව පවතින්නේ මෙරට මූල්‍ය සේවා කර්මාන්තය තුළ අනභිබවනීය වෙළෙඳපොල පුරෝගාමියා ලෙස අපට හිමි ස්ථානය තවදුරටත් සවිමත්ව නගා සිටුවීම වන අතර අපගේ ආර්ථිකයටත් පාර්ශ්වකරුවන් සියලුම දෙනා වෙතත් තවදුරටත් වටිනාකමක් එකතු කිරීමට සමත්, අතිශයින්ම ඩිජිටල්කරණය වූ හා තාක්ෂණික වශයෙන් පෙරමුණේම සිටින බැංකුව බවට පරිවර්තනය වීම කෙරෙහිද සුවිශේෂී අවධානයකින් අපි කටයුතු කරන්නෙමු.

# මානව ප්‍රාග්ධනය

7800 කට අධික කෘතහස්ථ සේවක පිරිසකින් පොහොසත් මහජන බැංකුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය තුළ සිටින විශාලතම සේවායෝජකයෙකුද වේ. අපගේ සේවකයන් හා සේවාවන් දිනපතාම ගනුදෙනුකරුවන්ගේ ජීවිත හා සමීප වන්නේ ඔවුන්ගේ දිනෙන් දින වෙනස් වන අවශ්‍යතා ඉටු කිරීම උදෙසා බැංකු විසඳුම් රැසක් ලබා දෙමිනි. මේ නිසා අපගේ සාර්ථකත්වය යනු අප සතු මානව සම්පත ආකර්ෂණය කරගන්නා, ඔවුන් සංවර්ධනය කරන හා ඔවුන් සමග කටයුතු කරන ආකාරය මෙන්ම අපගේ මෙහෙයුම් ක්‍රියාත්මක වන ආකාරය සකස් කිරීමට පාදක වන ආයතනික සංස්කෘතිය කෙරෙන්ද සුගම්‍ය වන්නකි.

## වැදගත් කරුණු

සේවකයන් **7,836**

කාන්තා සේවිකාවන් **61%**

සේවකයන් අතරින් **29.7%** ක්ම මේ වන විට වසර 15 කට අධික කාලයක් මහජන බැංකුවේ සේවය කරන්නන් වේ.

සේවකයෙකුට ලාභය **රු. මිලියන 1.6**

සේවකයෙකුට පුහුණු පැය **22**

පුහුණු අරමුණු සඳහා ආයෝජනය **රු. මිලියන104**

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී අපගේ ප්‍රධාන මානව සම්පත් අරමුණ කේන්ද්‍රගතව පැවැතියේ බැංකුවේ උපායමාර්ගික ඉලක්ක සාක්ෂාත් කරගැනීම උදෙසා අවශ්‍ය හොඳම නිපුණතා, සංස්කෘතිය හා ආයතනික ව්‍යුහයක් මෙන්ම ශ්‍රම බලකායයක්ද අප සතු බව සහතික කරගැනීම වෙතයි.

## අපගේ මානව ප්‍රාග්ධනය කළමනාකරණය කරගැනීම

සේවක සම්පත අප සතු විශිෂ්ටතම වත්කම වේ. අප සතු ශක්‍යතාවලින් ඵල නෙළා ගනිමින් අපගේ දැක්ම සාක්ෂාත් කරගන්නා අතරම උපායමාර්ග ක්‍රියාවේ යොදවන්නේද එකී මානව සම්පත හරහා ය. අප වෙනුවෙන් වටිනාකම් නිර්මාණයෙහි නියමුවන් වන සේවක මහත්ම මහත්මීන් සවිබලගන්වමින් හා ඔවුන් හට සහාය දක්වමින් හිතකර සේවා පරිසරයක් බිහි කිරීම වෙනුවෙන් අපි නිරන්තරයෙන් කැප වී සිටින්නෙමු.

බැංකුවේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කරගැනීමේදී මානව සම්පත් කළමනාකරණ කාර්යයන් ඉතාම වැදගත් භූමිකාවක් දරයි. අප ලබා ඇති සාර්ථකත්වය වනාහි වසර ගණනාවක ඇවෑමෙන් අපගේ කුසලතා පිරිපුන් සේවක මණ්ඩලය විසින් උකහා ගන්නා ලද දැනුම් හා අත්දැකීම් සම්භාරයෙන් ගම්‍ය වන්නකි. සපලදායී ලෙස මහජන බැංකු කාර්ය මණ්ඩලය කළමනාකරණය කරගනු සඳහා මානව සම්පත් සැලසුම්කරණය, පරිපාලනය, නඩත්තුව, වෘත්තීය ප්‍රගතිය, පුහුණුව හා සංවර්ධන මෙන්ම සේවක සුභසාධනය ආදී විවිධ මානව සම්පත් කාර්යභාරයන් වෙනුවෙන් වෙන වෙනම දෙපාර්තමේන්තු අප සතුව පවතී. අපගේ ශ්‍රම බලකායය දිරිමත් කරන හා ඔවුන්ට සහයෝගී වන අන්තර්ග්‍රාහී සේවා සංස්කෘතියක් පවත්වා ගැනීම වෙනුවෙන්ද අපි නිරතුරුව කැප වී සිටිමු.

## ප්‍රාග්ධන සබැඳියාවන් හා හිලව් වීම්

- පුහුණු හා සංවර්ධන ක්‍රියාදාම ඔස්සේ පුද්ගල ශක්‍යතා වැඩිදියුණු කිරීම වෙනුවෙන් ආයෝජනය නිසා මූල්‍ය ප්‍රාග්ධනය වෙත කෙටිකාලීනව ඍණාත්මක බලපෑම් එල්ල විය හැකිය.
- එහෙත් සේවක ඵලදායීතාව වර්ධනය වීම නිසා දීර්ඝ කාලීනව මූල්‍ය ප්‍රාග්ධනය ඉහළ යාමට එය හේතු වෙයි.

- තිරසාරතාව ඉලක්ක කරගත් මෙහෙයුම්වලට සේවකයන් සහභාගී වීම නිසා හරිත පරිසරයක් බිහිකර ගැනීමට දායකත්වය ලැබේ.
- හරිත සංකල්පය ගරු කරමින් ගොඩනැගිලි ඉදිකිරීම තුළින් හිතකර සේවා පරිසරයක් නිර්මාණය කිරීමද හරිත පරිසයක් පවත්වා ගැනීමට හේතු වේ.

- ඩිජිටල්කරණය හා මානව සම්පත් ක්‍රියාවලීන් ආශ්‍රිත ආයෝජනයන් තුළින් නිෂ්පාදිත ප්‍රාග්ධනය බිහි කෙරේ.

- නිරන්තර ඉගෙනුම තුළින් දැනුම ඉහළ නැංවීම.
- පුහුණු හා සංවර්ධන වැඩසටහන් ඔස්සේ කාර්යක්ෂමතාව ඉහළ යාම.

- ගනුදෙනුකරුවන් සමග සමීපත් සබඳතා
- පුහුණුව හා පාරිභෝගික සබඳතා කළමනාකරණය තුළින් ගනුදෙනුකරුවන් වෙත ලබා දෙන සේවා තත්ත්වය වැඩිදියුණු වීම.

## තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සමග අනුගත වීම

| | |
|---|---|
| 1 NO POVERTY | රැකියා අවස්ථා උදා කිරීම තුළින් දරිද්‍රතාව තුරන් කිරීමට දායක වීම. |
| 2 ZERO HUNGER | සේවකයින්ගේ ජීවන තත්ත්ව ඉහළ නැංවීම. |
| 4 QUALITY EDUCATION | පුහුණු හා සංවර්ධන ක්‍රියාකාරකම් ඔස්සේ සේවක ශක්‍යතා ගොඩනැගීම. |
| 10 REDUCED INEQUALITIES | හිතකර සේවා පරිසරයක් බිහිකිරීම හා කාන්තා සේවිකා සහභාගීත්වය ඉහළ නැංවීම. |

## මහජන බැංකුවේ සේවක කණ්ඩායම

ගත වූ වසරට සාපේක්ෂව 2019 දෙසැම්බර් 31 දිනට අපගේ සේවක මණ්ඩලය 7,836 ක් වූ අතර 2020 වසර වන විට අතිශයින්ම ඩිජිටල්කරණය වූ බැංකුව බවට මහජන බැංකුව පරිවර්තනය කිරීමේ ප්‍රයත්නයෙහි පියවර වශයෙන් අපගේ ක්‍රියාවලි ව්‍යුහයන්, ආයතනික සංස්කෘතිය හා සංවිධානය මෙන්ම මානව සම්පත ආශ්‍රිතව සිදු කරන ලද වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස කාර්ය මණ්ඩලය අඩුවීමක් පෙන්නුම් කරයි. මෙය හුදෙක්ම දින දින වෙනස් වන ගනුදෙනුකාර අවශ්‍යතා සාර්ථක ලෙස ඉටු කිරීම වෙනුවෙන් අප බැංකුව සූදානම් කිරීමේ පියවරක් විය.

## අපගේ මානව සම්පතට අදාළ සංඛ්‍යාන තොරතුරු

| | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| පිරිමි සේවකයන් | 3,058 | 3,184 | 3,402 | 3,367 | 3,443 |
| කාන්තා සේවිකාවන් | 4,778 | 4,909 | 5,052 | 4,882 | 4,925 |
| **සේවක මණ්ඩලයේ එකතුව** | 7,836 | 8,093 | 8,454 | 8,249 | 8,368 |
| එක් සේවකයෙකු සඳහා ලාභය (රු. '000) | 1,650 | 2,112 | 2,159 | 1,818 | 1,505 |
| එක් සේවකයෙකු සඳහා ආදායම (රු. '000) | 25,145 | 22,400 | 19,182 | 14,804 | 12,368 |






GRI 102-8

## සේවා ගිවිසුම් හා ස්ත්‍රී පුරුෂභාවය අනුව මුළු සේවකයන්

| | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | පුරුෂ සංඛ්‍යාව | ස්ත්‍රී සංඛ්‍යාව | එකතුව සංඛ්‍යාව | පුරුෂ සංඛ්‍යාව | ස්ත්‍රී සංඛ්‍යාව | එකතුව සංඛ්‍යාව |
| ස්ථිර සේවකයන් | 2,901 | 4,659 | 7,560 | 2,829 | 4,608 | 7,437 |
| කොන්ත්‍රාත් සේවකයන් | 157 | 119 | 276 | 355 | 301 | 656 |
| එකතුව | 3,058 | 4,778 | 7,836 | 3,184 | 4,909 | 8,093 |

### ස්ත්‍රී පුරුෂභාවය අනුව මුළු සේවකයන්




GRI 102-8

## භූගෝලීය ව්‍යාප්තිය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව මුළු සේවකයන්

| | පුරුෂ සංඛ්‍යාව | | ස්ත්‍රී සංඛ්‍යාව | | එකතුව සංඛ්‍යාව | | එකතුව % | |
|---|---|---|---|---|---|---|---|---|
| පළාත | 2019 | 2018 | 2019 | 2018 | 2019 | 2018 | 2019 | 2018 |
| බස්නාහිර | 1,150 | 1,183 | 1,970 | 2,007 | 3,120 | 3,190 | 39.8 | 39.4 |
| දකුණ | 283 | 298 | 531 | 548 | 814 | 846 | 10.4 | 10.5 |
| මධ්‍යම | 294 | 309 | 516 | 545 | 810 | 854 | 10.3 | 10.5 |
| උතුර | 221 | 185 | 297 | 201 | 518 | 386 | 6.6 | 4.8 |
| උතුරු මැද | 182 | 230 | 207 | 304 | 389 | 534 | 4.9 | 6.7 |
| ඌව | 202 | 221 | 249 | 263 | 451 | 484 | 5.7 | 6.1 |
| සබරගමුව | 192 | 209 | 339 | 348 | 531 | 557 | 6.8 | 6.8 |
| වයඹ | 248 | 256 | 384 | 385 | 632 | 641 | 8.1 | 7.9 |
| නැගෙනහිර | 286 | 293 | 285 | 308 | 571 | 601 | 7.3 | 7.3 |
| එකතුව | 3,058 | 3,184 | 4,778 | 4,909 | 7,836 | 8,093 | 100.0 | 100.0 |

GRI 405-1

## සේවක කාණ්ඩය, ස්ත්‍රී පුරුෂභාවය හා වයස් කාණ්ඩය අනුව මුළු ස්ථිර සේවකයන් - 2019

| | ආයතනික කළමනාකාරිත්වය | | විධායක කළමනාකාරිත්වය | | නිලධාරීන් (3–III-1 ශ්‍රේණිය) | | කාර්ය මණ්ඩල සහායක ශ්‍රේණි | | වෙනත් කාණ්ඩ | | කළමනාකරණ පුහුණුලාභීන් | | ගනුදෙනුකාර සේවා සහායකයන් | | වෙනත් කොන්ත්‍රාත් සේවකයන් | | මුළු එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වයස | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| 18-25 | | | | | | | | | 18 | 9 | | | | | 33 | 3 | 51 | 12 |
| 26-45 | 1 | | | | 644 | 1,498 | 812 | 1,869 | 498 | 463 | 2 | 3 | 25 | 68 | 62 | 37 | 2,044 | 3,938 |
| 46-55 | 4 | 3 | 5 | 2 | 412 | 538 | 71 | 10 | 277 | 136 | | | | | | | 769 | 689 |
| 56 ට වැඩි | 8 | 4 | 7 | 8 | 88 | 95 | 9 | 2 | 74 | 30 | | | | | 8 | | 194 | 139 |
| මුළු එකතුව | 13 | 7 | 12 | 10 | 1,144 | 2,131 | 892 | 1,881 | 867 | 638 | 2 | 3 | 25 | 68 | 103 | 40 | 3,058 | 4,778 |

## දෙපාර්තමේන්තු අනුව මුළු සේවකයින් - 2019

| | සේවක සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | ස්ථිර | කොන්ත්‍රාත් | එකතුව |
| ශාඛා | 5,485 | 167 | 5,652 |
| ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාල | 824 | 35 | 859 |
| භාණ්ඩාගාරය සහ ප්‍රාථමික ගනුදෙනු අංශය | 35 | 2 | 37 |
| ආයතනික හා අක්වෙරළ බැංකු ඒකකය | 164 | 9 | 173 |
| විතෙර ගනුදෙනු සේවා | 77 | 2 | 79 |
| පීපල්ස් කාඩ් මධ්‍යස්ථානය | 48 | 9 | 57 |
| ප්‍රධාන කාර්යාලය | 927 | 52 | 979 |
| **එකතුව** | 7,560 | 276 | 7,836 |




## වයස සහ ස්ත්‍රී පුරුෂභාවය අනුව මුළු සේවකයින්

| | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| වයස | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව |
| >56 | 139 | 194 | 333 | 185 | 255 | 440 |
| 46 – 55 | 689 | 769 | 1,458 | 709 | 763 | 1,472 |
| 26 – 45 | 3,938 | 2,044 | 5,982 | 3,959 | 2,084 | 6,043 |
| 18 – 25 | 12 | 51 | 63 | 56 | 82 | 138 |
| **එකතුව** | 4,778 | 3,058 | 7,836 | 4,909 | 3,184 | 8,093 |

GRI 401-1

## බඳවාගැනීම

නිපුණතා හා පළපුරුද්ද ආකර්ෂණය කරගැනීමේ අනාගත කේන්ද්‍රීය සැලැස්මක් තිබීම අපගේ සාර්ථකත්වය අඛණ්ඩව පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය සාධකයකි. බැංකුවේ මානව සම්පත් අවශ්‍යතා ඉටුකර ගනු පිණිස හොඳම නිපුණතා හා ශක්‍යතාවලින් හෙබි අයදුම්කරුවන් සේවයට බඳවාගැනීම සඳහා අපි සෑමවිටම විධිමත් බඳවාගැනීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නෙමු.

සියලු බඳවාගැනීම් සිදුකරනු ලබන්නේ රාජ්‍ය ආයතනවලට අදාළ නියාමන රෙගුලාසිවලට අනුකූලව ය. අපගේ අතිශය විනිවිදභාවයෙන් යුතු බඳවාගැනීමේ ක්‍රියාවලියට හැකියාවන් පරීක්ෂාවක් සහ විධිමත් සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලියක්ද ඇතුළත් වේ. කිසිදු පුද්ගලයෙකු වෙනස් කොට නොසලකා සේවායෝජකයෙකු වශයෙන් සේවා පරිසරය ආශ්‍රිතව විවිධත්වය පවත්වාගෙන යාමට අපි සම්පූර්ණයෙන්ම කැප වී සිටින්නෙමු. මේ අනුව, වෘත්තීමය ප්‍රගතියක් අත්කර ගැනීමට හා ඉහළ යන වගකීම් නිසි ලෙස ඉටු කිරීමට සමත් සුදුසුකම් සැපිරූ පුද්ගලයන් අපගේ කාර්ය මණ්ඩලය වෙත බඳවාගැනීමට අපි පියවර ගන්නෙමු.

## සේවක කාණ්ඩය හා සේවා වර්ෂ සංඛ්‍යාව අනුව මුළු සේවකයින් - 2019

| | සේවා වර්ෂ සංඛ්‍යාව | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| කාණ්ඩය | <2 | 3-10 | 11-20 | 21-30 | 31-35 | >36 | එකතුව |
| ආයතනික කළමනාකාරීත්වය | – | – | – | 6 | 8 | 1 | 15 |
| විධායක කළමනාකාරීත්වය | – | – | 2 | 7 | 12 | – | 21 |
| නිලධාරීන් (3–III- I ශ්‍රේණිය) | 210 | 668 | 799 | 1,532 | 19 | 47 | 3,275 |
| කාර්ය මණ්ඩල සහායක ශ්‍රේණිය | | 2,535 | 120 | 118 | – | – | 2,773 |
| වෙනත් කාණ්ඩ | 188 | 658 | 21 | 425 | 9 | 4 | 1,505 |
| ආයතනික කළමනාකාරීත්වය - කොන්ත්‍රාත් | 3 | 1 | 1 | – | – | – | 5 |
| විධායක කළමනාකාරීත්වය - කොන්ත්‍රාත් | 1 | – | – | – | – | – | 1 |
| කළමනාකරණ පුහුණුලාභීන් | 5 | – | – | – | – | – | 5 |
| ගනුදෙනුකාර සේවා සහායකයන් | 93 | – | – | – | – | – | 93 |
| වෙනත් කොන්ත්‍රාත් සේවකයන් | 122 | 21 | – | – | – | – | 143 |
| **එකතුව** | 622 | 4,083 | 943 | 2,088 | 48 | 52 | 7,836 |

GRI 202-2

අපගේ බඳවාගැනීමේ උපායමාර්ගයට අනුව බඳවාගැනීම්වලින් බහුතරයක් පිවිසුම් මට්ටමේදී සිදු කෙරෙන අතර නිරන්තර පදනමක් මත කළමනාකරණ පුහුණුලාභීන් හා ගනුදෙනුකාර සේවා සහායකයින් බඳවා ගැනේ. බැංකුවේ අනුප්‍රාප්ති සැලැස්මට අනුව කළමනාකරණ පුහුණුලාභීන් කළමනාකරණ තනතුරු සඳහා සූදානම් කෙරේ. බැංකුව තුළ ක්‍රියාත්මක වන උසස්වීම් ප්‍රතිපත්තියට අනුකූලව ගනුදෙනුකාර සේවා සහායකයින්ටද නිලධාරී ශ්‍රේණිය දක්වා උසස්වීමට අවස්ථාව ඇත. මේ අතර, බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු සියල්ලම හොබවනු ලබනුයේ ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසිනි. 2019 වසර තුළදී කිසිදු සේවකයෙකු අලුතින් බඳවාගනු නොලැබිණ.

GRI 404-1, 404-2

## සේවක කුසලතා කළමනාකරණය

### පුහුණුව හා සංවර්ධනය

පුද්ගල සම්පත විෂයික ආයෝජන සිදු කිරීම අපගේ කුසලතා ආකර්ෂණ හා රඳවාගැනීමේ උපායමාර්ගයෙහි ප්‍රධානතම සංඝටකයකි. 2019 වසර තුළදී අප විසින් සේවකයින්ගේ ඉගෙනුම් කටයුතු හා සංවර්ධනය උදෙසා රු. මිලියන 104 ක් ආයෝජනය කර ඇති අතර 171,045 කට අධික සමස්ත සේවක පුහුණු පැය සංඛ්‍යාවක් ලබා දීමටද පියවර ගෙන ඇත. අපගේ මානව සම්පත් උපායමාර්ගයේ වැදගත්ම අරමුණක් සාධකයක් වන්නේ බැංකුකරණ කර්මාන්තයෙහි පෙරමුණ ගැනීමට අපට හැකි හැකියාවයි. වැඩිදුරටත් වර්ධනය වෙමින් බැංකුවේ අනාගත සාර්ථකත්වයට දායක වීමේ අවස්ථාව සේවකයින් වෙත උදා කිරීමට අපි නිරතුරුව කටයුතු කරන්නෙමු.

බැංකුවේ උපායමාර්ගික අරමුණු ඉටුකර ගැනීම උදෙසා පවත්වනු ලැබෙන පුහුණු සමීක්ෂණය පාදක කරගනිමින්, සෑම වසරකම ආරම්භයේදී පිළියෙළ කරනු ලැබෙන පුහුණු දින දර්ශනයට අනුකූලව සේවකයින් සඳහා වූ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. මෙහිදී සේවකයින් සඳහා වෙන් කෙරෙන පුහුණු පැය ගණන් තීරණය කරනු ලැබෙන්නේ බැංකුව තුළ පවතින නිපුණතා හිඩැස් සැලකිල්ලට ගනිමිනි. අභ්‍යන්තර හෝ බාහිර පුහුණු වැඩසටහන් සුදුසු පරිදි සකස් කෙරෙන අතර පිරිවැය ව්‍යුහය මත පදනම්ව අදාළ සම්පත් වෙන් කිරීම සිදු කෙරේ. එකී වැඩසටහන්වල සඵලදායීතාව මිනුම්ගත කරනු පිණිස සෑම පුහුණු වැඩසටහන්කම අවසානයේදී සේවකයන් වෙතින් ලබා ගන්නා පසුප්‍රතිචාර පෝරම ඇසුරින් පශ්චාත් පුහුණු ඇගයීමක්ද සිදු කෙරේ. අභ්‍යන්තර, බාහිර, රැකියා සමගාමී හෝ විදේශ පුහුණු වැඩසටහන් මගින් නිශ්චිත කාල සීමාවක් තුළ සියලුම සේවකයන් සඳහා අදාළ පුහුණුව ලබා දීමට නිරතුරුව පියවර ගැනේ. මෙහිදී බැංකුවෙහි ඩිජිටල් පරිවර්තන ක්‍රියාදාමය වෙත සහාය වීම සඳහා ශ්‍රම බලකායයෙහි ශක්‍යතා වර්ධනය කෙරෙහි නිරන්තර අවධානය ලබා දේ. මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී ඩිජිටල් බැංකුකරණ නිපැයුම් හා සේවාවන් ආශ්‍රිත දැනුම වැඩිදියුණු කරගැනීම උදෙසා අපගේ සේවක මණ්ඩලය වෙනුවෙන් පුහුණු පැය 12,152 ක් වෙන් කරන ලදි.

අනාගතයේදී වඩා ජ්‍යෙෂ්ඨ හා සංකීර්ණ නායකත්ව භූමිකා දැරීමේ හැකියාවක් ප්‍රකට කරන සේවකයන් විවිධ වෘත්තීය මට්ටම් ආශ්‍රිතව හඳුනාගැනීමටද 2019 වසරේදී අපි කටයුතු කළෙමු. කෙටි, මධ්‍ය හා දීර්ඝ කාලීන වශයෙන් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු සඳහා ඔවුන් සූදානම් වීම වේගවත් කරනු පිණිස නායකත්ව ලක්ෂණ සහිත සේවක සංචිත සැලසුම් කරන ලදි. ඒ අනුව මෙහි සමාලෝචිත වසර තුළදී අප විසින් අනාගත නායකත්ව හැකියා සහිත සේවක කාණ්ඩ තුනක් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදි. එසේම, වංචාකාරී ක්‍රියා හඳුනාගෙන ඒවා වැළැක්වීම සම්බන්ධයෙන් සේවක ශක්‍යතා වර්ධනය කිරීම අරමුණු කරගත් ව්‍යවහාරික පුහුණු වැඩසටහන්ද අප විසින් පවත්වන ලදි.

### සේවකයින්ට අදාළ පුහුණු සංඛ්‍යාන තොරතුරු

| | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| පුහුණු පිරිවැය (රු. මිලියන) | 104 | 74 | 72 | 71 | 66 |
| පුහුණු පැය ගණන | 171,045 | 161,378 | 199,956 | 183,460 | 180,849 |
| සේවකයෙකු සඳහා වූ පුහුණු පැය සාමාන්‍යය | 21.83 | 19.07 | 23.6 | 22.2 | 21.6 |
| ඩිජිටල් පුහුණුව සඳහා කැප කළ පැය ගණන | 34,480 | 26,480 | – | – | – |

**සේවකයෙකු සඳහා වූ පුහුණු පැය සාමාන්‍යය**




**පුහුණු පිරිවැය**



## 2019 දී පවත්වන ලද පුහුණු වැඩසටහන්

| පුහුණු කාණ්ඩය | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූවන් සංඛ්‍යාව | පුහුණු පැය |
|---|---|---|---|
| අභ්‍යන්තර පුහුණු වැඩසටහන් | 473 | 22,930 | 159,727 |
| බාහිර පුහුණු වැඩසටහන් | 165 | 811 | 7,966 |
| විදෙස් පුහුණු වැඩසටහන් | 24 | 81 | 3,352 |
| එකතුව | 662 | 23,822 | 171,045 |

## සේවක කාණ්ඩය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව පුහුණු පැය ගණන් - 2019




▼ GRI 404-3

## කාර්යසාධන ඇගයුම

පූර්වනිශ්චිත ඇගයීම් නිර්ණායක මාලාවක් පදනම් කරගනිමින් සියලුම සේවකයන්ගේ කාර්යසාධනය වාර්ෂිකව ඇගයීමට ලක් කෙරේ. අදාළ සේවකයන් හා ඉහළ නිලධාරීන් සමග එක්ව පිහිටුවන ලද ප්‍රධාන කාර්යසාධන දර්ශක මාලාවක් පාදක කරගෙන විධායක නිලධාරීන්ගේ හා ආයතනික කළමනාකරණ නිලධාරීන්ගේ කාර්යසාධනයද ඇගයීමට ලක් කෙරේ. මෙකී කාර්යසාධන ඇගයීම් සිදුකරනු ලබන්නේ ඒ ඒ සේවකයාට අදාළ ආසන්නතම අධීක්ෂණ නිලධාරී විසිනි. ස්වකීය වෘත්තීය සංවර්ධනය වැඩිදියුණු කරගනු පිණිස අදාළ වෘත්තීය සුදුසුකම් සපුරාගන්නා ලෙස සේවකයන් දිරිමත් කිරීමටද පියවර ගැනේ. අභ්‍යන්තර උසස්වීම් ලබා දීමේදී එකී වෘත්තීය සුදුසුකම් සලකා බලනු ලැබේ.

## උසස්වීම් හා සේවක ස්ථාන මාරුකිරීම්

සේවකයන්ට අදාළ සියලුම උසස්වීම් හා ස්ථාන මාරුවීම් සිදුකරනු ලබන්නේ විධිමත් උසස්වීම් හා ස්ථාන මාරු කිරීමේ ප්‍රතිපත්තියකට අනුකූලව, ඉතාම විනිවිදභාවයෙන් යුතු ක්‍රමවේදයකට වේ. මහජන බැංකුව හමුවේ වෘත්තීමය වශයෙන් වර්ධනය වත්ම විස්තීර්ණ භූමිකා භාරගන්නා ලෙස සියලුම සේවකයන් දිරිමත් කෙරෙන අතර ස්ථාන මාරු කිරීමේ හෝ උසස්වීම් අවස්ථා කලින් කලට උද්ගත වේ. ජ්‍යෙෂ්ඨ කළමනාකාර (11 ශ්‍රේණිය) මට්ටම දක්වා වන උසස්වීම් ලිඛිත පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් හරහා සිදු කෙරේ. සියලුම විධායක හා ආයතනික කළමනාකරණ තනතුරු සඳහා වූ උසස්වීම් සිදු කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවත්වනු ලැබෙන සම්මුඛ පරීක්ෂණයක් හරහා ය. පොදුවේ ගත් කල වෘත්තීය ශ්‍රේණි බහුතරයක් සඳහා උසස්වීම් අවස්ථා විවෘත වන අතර පුරප්පාඩු බිහි වන විට ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු සඳහාද උසස්වීම් සිදු කෙරේ. අදාළ කලාපය තුළ මෙන්ම ඉන් පරිබාහිරවද මෙකී ස්ථානමාරු බලාත්මක වේ. ස්ථාන මාරුවීමක් සම්බන්ධයෙන් කිසියම් සේවකයෙකු සෑහීමට පත් නොවන්නේ නම් ඒ සම්බන්ධයෙන් සලකා බලන ලෙස ඉල්ලමින් ඔහුට හෝ ඇයට ස්ථාන මාරුකිරීමේ ප්‍රතිපත්තිය යටතේ පිහිටුවන ලද අභියාචනා කමිටුව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමටද අවස්ථාව සලසා ඇත.

## සේවක විවිධත්වය හා සමාන වෘත්තීය අවස්ථා

විවිධත්වයෙන් යුතු ශ්‍රම බලකායක් සහ සමාන අවස්ථා සලසන අන්තර්ගෘහිත සේවා සංස්කෘතියක් බිහි කිරීම වෙනුවෙන් අපි කැප වී සිටින්නෙමු. අපගේ මානව සම්පතට උපරිම කාර්යසාධනය ප්‍රකට කළ හැකි පරිසරයක් බිහි කිරීමට නම් අන්තර්ගෘහිත සේවා සංස්කෘතියක පැවතීම අතිශයින්ම වැදගත් බව අපගේ විශ්වාසයයි. සමාන වෘත්තීය අවස්ථා ලබා දෙන සේවායෝජකයෙකු වශයෙන් කාර්යක්ෂම ශ්‍රම බලකායක් ප්‍රවර්ධනය කෙරෙන හිතකර සේවා පරිසරයක් නිර්මාණය කරන අතරම නවෝත්පාදනාත්මක චින්තනයෙන් ඵල නෙළා ගනිමින් ස්ත්‍රී පුරුෂභාවය, වාර්ගිකත්වය, ජාතිය, ආගමික විශ්වාස හා වයස වැනි සාධක අතින් විවිධත්වයෙන් යුතු සේවක පිරිසක් පවත්වා ගැනීමට අපි පියවර ගන්නෙමු. මේ නිසා, මහජන බැංකුවේ වෘත්තීය අවස්ථා සඳහා අයදුම් කිරීමේදී ස්ත්‍රී පුරුෂභාවය, වාර්ගිකත්වය, ජාතිය, ආගම, වයස ආදී කිසිදු සාධකයක් සැලකිල්ලට නොගනිමින් සියලුම අයදුම්පත් සමාන පදනමක් මත සලකා බැලීම අප අනුගමනය කරන ක්‍රියාපිළිවෙතයි.

මෙම විවිධත්වය අපගේ ආයතනික සංස්කෘතිය පොහොසත් කරන්නට නිසැක වශයෙන්ම දායක වෙයි. ශ්‍රී ලංකාවේ බැංකු කර්මාන්තය තුළ 61% ක් වූ ඉහළම කාන්තා ශ්‍රමික සහභාගීත්වය සහිත බැංකුවක් බවට පත් වීමට හැකි වීම අපට අභිමානයක් දනවන කරුණකි.

▼ GRI 405-2

## පුරුෂයන්ට සාපේක්ෂව කාන්තා සේවිකාවන්ගේ මූලික වැටුප් හා පාරිශ්‍රමික අනුපාතිකය

අපගේ බැංකුව තුළ සේවය කරන පුරුෂ සේවකයන්ට සාපේක්ෂව කාන්තා සේවිකාවන්ගේ මූලික වැටුප් හා පාරිශ්‍රමික අනුපාතිකය 1:1 ක් වශයෙන් පවත්වා ගැනීමට අපට හැකි වී තිබේ. ස්ත්‍රී පුරුෂභාවය හා සබැඳි කිසිදු පක්ෂග්‍රාහී පියවරක් අපගේ බැංකුව තුළ අනුගමනය නොකෙරෙන අතර කාන්තා සේවිකාවන්ටද පුරුෂ සේවකයන්ට සමානවම සලකනු ලැබේ. කෙසේ වෙතත්, සපුරා ඇති විවිධ සේවා කාල හා නිශ්චිත වැටුප් ශ්‍රේණිවලට අදාළව මෙකී අනුපාතය වෙනස් වීමට ඉඩ තිබේ. ප්‍රසූත නිවාඩු ගන්නා ලද කාන්තා සේවිකාවන් සියලුම දෙනා අදාළ නිවාඩු කාල සීමාව අවසානයේදී පෙරළා බැංකුවේ සේවයට වාර්තා කිරීම තුළින් මෙකී අපක්ෂපාතීත්වය මනාව පිලිඹිබු වේ.

| වයස් කාණ්ඩය | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|
| ආයතනික කළමනාකාරිත්වය | 1 | 0.88 |
| විධායක කළමනාකාරිත්වය 1 | 1 | 1.00 |
| නිලධාරීන් (3 – III - 1 ශ්‍රේණිය) | 1 | 1.04 |
| කාර්ය මණ්ඩල සහායකයන් | 1 | 0.76 |
| වෙනත් රැකියා කාණ්ඩ | 1 | 1.07 |

GRI 401-3

## ප්‍රසූත නිවාඩු

2019 වසරේදී සේවිකාවන් 510 දෙනෙකු ප්‍රසූත නිවාඩු රැගෙන තිබුණු අතර ගත වූ වසර 5 ක කාලය මුළුල්ලේ ප්‍රසූත නිවාඩු රැගෙන ගිය සේවකයන් නැවත සේවයට වාර්තා කිරීමේ හා ආයතනය තුළ රඳවා ගැනීමේ ප්‍රතිශතය 100% ක් ලෙස පවත්වා ගැනීමට අපට හැකි වී තිබේ.

| | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| ප්‍රසූත නිවාඩු සඳහා හිමිකම් කී සේවිකාවන් සංඛ්‍යාව | 4,778 | 4,893 | 4,611 | 3,690 | 3,430 |
| ප්‍රසූත නිවාඩු ලබා ගත් සේවිකාවන් සංඛ්‍යාව | 510 | 517 | 230 | 536 | 566 |
| ප්‍රසූත නිවාඩුවෙන් පසුව නැවත සේවයට වාර්තා කළ සේවිකාවන් සංඛ්‍යාව | 510 | 517 | 230 | 536 | 566 |
| නැවත සේවයට වාර්තා කිරීම (%) | 100 | 100 | 100 | 100 | 100 |

GRI 406-1

## වෙනස් කොට නොසැලකීමේ ප්‍රතිපත්තිය

ජාතිය, ආගම, ස්ත්‍රී පුරුෂභාවය හෝ සමාජ තත්ත්වය ආදී කවර හෝ හේතුවක් පදනම් කරගනිමින් වාචික හෝ ශාරීරික හිංසනයන් හෝ වෙනස් කොට සැලකීමක් සිදු නොවන සේවා ස්ථානයක් පවත්වා ගැනීම වෙනුවෙන් අපි නිරතුරුව කැප වන්නෙමු. සේවකයින් බඳවා ගැනීම, පිළිගැනීමට ලක් කිරීම හෝ උසස්වීම් ආදී කිසිදු ක්‍රියාවලියකදී ඉහත කී සාධක පදනම්ව කිසිවෙකුට වෙනස් කොට නොසැලකීමේ ප්‍රතිපත්තියක්ද අපි අනුගමනය කරන්නෙමු. බැංකු කර්මාන්තය තුළ ඉහළම කාන්තා ශ්‍රම බලකායයක් අප සතු වීම මහජන බැංකුව තුළ ක්‍රියාත්මක වන වෙනස් කොට නොසැලකීමේ සංස්කෘතියට මනාව සාක්ෂ්‍ය දරයි. මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී බැංකුව තුළ වෙනස් කොට සැලකීමේ සිදුවීම් කිසිවක් වාර්තා නොවීය.

GRI 403-1

## වෘත්තීය සෞඛ්‍යය හා සුරක්ෂිතතාව

සේවා ස්ථානයේ සුරක්ෂිතතාව හා සෞඛ්‍යමත්භාවය අපගේ මානව සම්පත, ගනුදෙනුකාර ප්‍රජාව මෙන්ම පොදුවේ ව්‍යාපාරික සාර්ථකත්වය උදෙසා අතිශය වැදගත් බව අප පිළිගන්නා අතර සෑම අයෙකුම සඳහා යෝග්‍ය පරිසරයක් ගොඩනැගීමේදී විය මුඛ්‍ය කාරණාවක් වේ. ඒ අනුව බැංකුවේ මෙහෙයුම් පුරාවටම සෞඛ්‍ය හා සුරක්ෂිතතා විධිවිධාන වෙත නිසි ප්‍රමුඛතාව ලබා දීමට පියවර ගැනීම තුළින් අපගේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් සුරක්ෂිත සේවා පරිසරයක් පවත්වා ගැනීම සහතික කරන්නෙමු. අපගේ සේවා ජාලය පුරාවටම අදාළ සියලු සුරක්ෂිතතා ප්‍රමිතීන්ට අනුකූලතාව දක්වනු ලැබෙන අතර සුරක්ෂිතතා සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් අපි දැඩි කැපවීමෙන් කටයුතු කරන්නෙමු. ගින්නෙන් ආරක්ෂාකාරී වීම හා ආපදා අවස්ථාවන්හිදී යථා තත්ත්වයට පත් වීම අරමුණු කරගත් වෙනම දෙපාර්තමේන්තුවක්ද මහජන බැංකුව සතු වේ. මේ අතරම බැංකුවේ සෑම දෙපාර්තමේන්තුවක්ම සඳහා වූ වෙනම ආපදා නිවාරණ සැලසුමක්ද සකස් කොට තිබේ. මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළ සේවකයන් අතර දැනුම්වත්භාවය ඉහළ නංවමින් අපදා සිදුවීමකදී ඔවුන් දක්වන සූදානම වැඩිදියුණු කිරීම උදෙසාද අප විසින් පියවර ගෙන ඇත. 2019 වසරේදී කිසිදු සේවකයෙකු දැඩි අනතුරකට මුහුණ පෑ සිදුවීමක් වාර්තා නොවීය.

## 2019 දී සේවාස්ථාන සෞඛ්‍යය හා සුරක්ෂිතතාව උදෙසා දරන්නට සිදු වූ වියදම්

| සෞඛ්‍ය හා සුරක්ෂිතතා වියදම් | රු. මිලියන |
|---|---|
| වෛද්‍ය වියදම් | 1,802 |
| ගිනි හා ආරක්ෂණ | 146 |
| එකතුව | 1,948 |

## සේවක තෘප්තිමත්භාවය

### සේවක සහභාගීත්ව සමීක්ෂණ

අපගේ සහභාගීත්ව ක්‍රියාකාරකම්හි සාර්ථකත්වය මිනුම්ගත කිරීමටත් බැංකුවේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා සේවක අභිප්‍රේරණය ඉහළ නංවමින් ඔවුන්ගේ දායකත්ව අභිලාෂය වැඩිදියුණු කිරීමටත් අපගේ වාර්ෂික සේවක සහභාගීත්ව සමීක්ෂණය උපකාරී වේ.

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී සමස්ථ බැංකු කාර්ය මණ්ඩලයම නියෝජනය වන පරිදි අහඹු ලෙස තෝරාගන්නා ලද අපගේ සේවකයන් මෙම සමීක්ෂණයට සහභාගී වූ අතර ඒ අනුව සමස්ථ සේවක සහභාගීත්ව ප්‍රතිශතය 80% ක් ලෙස වාර්තා විය. අපගේ සේවක මණ්ඩලය මහජන බැංකුවේ වටිනාකම් කෙරෙහි තබන විශ්වාසය හා ඉහළ කාර්යසාධනයක් ප්‍රකට කිරීමට දක්වන රුචිකත්වය 2019 වසරේ සමීක්ෂණ ප්‍රතිඵල කෙරෙන් මනාව ප්‍රකට වේ.

## අනුප්‍රාප්තික සැලසුම

අපගේ ගනුදෙනුකරුවන් හා මානව සම්පත වෙත අසමසම සේවාවන් ලබා දීම සඳහා අවශ්‍ය මීළඟ නායකත්ව පරපුර ගොඩනැගීම වෙනුවෙන්ද අපි නිරන්තර ආයෝජන සිදු කරන්නෙමු. මහජන බැංකුව ඊළඟ වර්ධන මට්ටම වෙත නගා සිටුවීමට දායක විය හැකි එකී අනාගත නායකයන් සවිබල ගැන්වීමේ අරමුණින් බැංකුව පුරාවට ක්‍රියාත්මක වූ නායකත්ව පුහුණු වැඩසටහනක්ද අප විසින් දියත් කරන ලදි. මෙහි සමාලෝචිත වසර තුළදී සහකාර කළමනාකාරවරුන් හා නියෝජ්‍ය කළමනාකරුවන් 394ක් එකී පුහුණු වැඩසටහන සඳහා සහභාගී වී ඇත.

GRI 401-2

## පාරිශ්‍රමික හා ප්‍රතිලාභ

සේවකයින් ප්‍රකට කරන කාර්යසාධනය මත පදනම්ව ප්‍රතිලාභ සලසන අපක්ෂපාතී පාරිශ්‍රමික ක්‍රමවේදයක් මහජන බැංකුව තුළ පවතී. මෙහිදී ස්ත්‍රී පුරුෂ සේවක දෙපක්ෂයම වෙත සමාන ප්‍රතිලාභ උදා කරන සමාන ගෙවීම් ප්‍රතිපත්තියක් අප විසින් අනුගමනය කරනු ලැබේ. අපගේ සේවකයන් සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් ප්‍රතිලාභ සඳහාද හිමිකම් කියයි. මෙහි සමාලෝචනයට ලක් වන මූල්‍ය වර්ෂය තුළදී අප විසින් රු. මිලියන 1,124 ක මුදලක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙතද, රු. මිලියන 281 ක් සේවක අර්ථසාධක අරමුදල වෙතද දායක කර ඇත.

විවිධ සේවක කාණ්ඩ මත පදනම්ව සෑම ස්ථිර සේවකයෙකුම සඳහා ප්‍රතිලාභ මාලාවක් හිමි වේ. මෙලෙස අපගේ සේවකයන් සඳහා ලබා දෙන ප්‍රතිලාභ අතරට වාර්ෂික ප්‍රසාද දීමනා, නිශ්චිත සේවක ශ්‍රේණි සඳහා ලබා දෙන ප්‍රවාහන දීමනා, නිවාඩු නිකේතන පහසුකම්, කාර්ය මණ්ඩල ණය පහසුකම්, වෛද්‍ය ප්‍රතිලාභ, මරණ පාරිතෝෂිකය, පුද්ගලික හදිසි අනතුරු රක්ෂණාවරණ ක්‍රමවේදය, ආබාධිතතා හා අවලංගු ආවරණය, මාතෘත්‍යතා ආවරණය හා විශ්‍රාමික ප්‍රතිලාභ ආදිය ඇතුළත් වේ.

## සේවක යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම

සේවක යහපැවැත්ම කෙරෙහි උපකාරී වන සේවා පරිසරයක් බිහි කිරීමට සහ යහ චර්යාවන්ට බාධා පමුණුවන සාධක ඉවත් කරමින් සේවකයන් සෞඛ්‍යමත් ජීවන රටා වෙත යොමු කිරීම තුළින් ඔවුන්ගේ සේවා ප්‍රමිතීන් ඉහළ නැවීම අරමුණු කරගත් පියවර ගැනීමද අපගේ අරමුණක් වේ. සියලුම ව්‍යායාම් උපකරණවලින් සමන්විත ශාරීරික අභ්‍යාස මධ්‍යස්ථානයක් සහ යෝගා අභ්‍යාස ආදී ක්‍රියාකාරකම් තුළින් සේවකයන්ගේ ශාරීරික යෝග්‍යතාව ඉහළ නැංවීම අරමුණු කරගෙන අපගේ සේවකයන් වෙනුවෙන් විවිධ උපකාරී වැඩසටහන් මාලාවක්ම අප විසින් ක්‍රියාත්මක කර තබේ. මේ අතරම, මහජන බැංකු ක්‍රීඩා සංගමය, කලා සංගමය හා අනෙකුත් සමාගමික සංවිධාන හා සමාජ ආදිය මගින් සංවිධානය කරනු ලැබෙන විවිධ ක්‍රියාකාරකම්වලට සහභාගී වීමේ අවස්ථාවද සේවක මණ්ඩලය වෙත සලසා තිබේ. සේවකයන්ගේ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් අති නවීන පුස්තකාලයක්ද ස්ථාපිත කොට ඇති අතර MBA සහ අනෙකුත් වෘත්තීය සුදුසුකම් සාර්ථක ලෙස සපුරා සහතිකපත් ඉදිරිපත් කිරීම තුළින් අදාළ පාඨමාලාවල විභාග ගාස්තු බැංකුවෙන් අයකර ගැනීමට අවස්ථාව සැලසීම ඔස්සේ උසස් අධ්‍යාපන අවස්ථා හඹා යාම කෙරෙහිද සේවකයන් දිරිමත් කිරීමට පියවර ගැනේ.

මීට අමතරව, කුඩා දරුවන් සිටින මව්වරුන් සඳහා පැය දෙකක දරුවන් රැකබලා ගැනීමේ විවේක කාලයක්ද නියමිත සේවා කාලයට කලින් පිටව යාමේ අවස්ථාවක්ද හිමි වේ. සම්මත සේවා පැය ගණන් ඉක්මවමින් සේවය කිරීමට අපගේ කිසිදු සේවකයෙකු පෙළඹවීමට අප කිසි විටෙකත් කටයුතු කරන්නේ නැත. මේ අතර, ආතති කළමනාකරණ පුහුණුවක් ඔස්සේ සේවකයන්ගේ මානසික යහපැවැත්ම ඉහළ නංවා ගැනීමටද අප සහාය වන අතර බැංකුව විසින් සංවිධානය කරනු ලැබෙන සේවක සහභාගීත්ව වැඩසටහන්හි නියැළීමටද නිසි අවස්ථා සේවක මණ්ඩලය වෙත ලබා දීමට අපි කටයුතු කරන්නෙමු.

## සේවක සහභාගීත්වය

සේවකයන්ගේ සුහසිද්ධිය ඉහළ නංවමින් ඔවුන්ගේ අභිප්‍රේරණ මට්ටම වැඩිදියුණු කිරීම සඳහා සේවක සහභාගීත්ව වැඩසටහන් කිහිපයක්ම වාර්ෂිකව පවත්වනු ලැබේ. 2019 වසර තුළදී පවත්වන ලද එවැනි වැඩසටහන් පහතින් දැක්වේ:



*බැංකුව තුළ වසර 25 ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයන්ට උපහාර පිදීමේ උත්සවය*



*මහජන බැංකුවේ සුපිරි තරු අගයමින් Achievers Award සම්මාන ප්‍රදානය*



*පොසොන් භක්ති ගී වැඩසටහන*



*ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන*




*බැංකු සංවත්සර සැමරුම*



නත්තල් සැමරුම හා කැරොල් ගී ප්‍රසංගය

GRI 401-1

## සේවක පිරිවැටුප

අපගේ සේවක පිරිවැටුප සතුටුදායක මට්ටමක පවතින අතර 2019 මූල්‍ය වර්ෂය තුළදී සේවකයන් 18 දෙනෙකු සේවයෙන් ඉවත් වී තිබේ.




### වයස් කාණ්ඩය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව සේවක පිරිවැටුප - 2019

| වයස් කාණ්ඩය | පුරුෂ | ස්ත්‍රී | මුළු එකතුව |
|---|---|---|---|
| වයස අවු. 18-25 | – | – | – |
| වයස අවු. 26-35 | 6 | 21 | 27 |
| වයස අවු. 36-45 | 3 | 7 | 10 |
| වයස අවු. 46 -55 | 21 | 15 | 36 |
| වයස අවු. 56 ට වැඩි | 109 | 90 | 199 |
| එකතුව | 139 | 133 | 272 |

### ප්‍රදේශය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව සේවක පිරිවැටුප

| ප්‍රදේශය | පුරුෂ | ස්ත්‍රී | එකතුව | පුරුෂ % | ස්ත්‍රී % |
|---|---|---|---|---|---|
| අම්පාර | 2 | – | 2 | 100.00 | – |
| අනුරාධපුර | 3 | 3 | 6 | 50.00 | 50.00 |
| බදුල්ල | 13 | 7 | 20 | 65.00 | 35.00 |
| මඩකලපුව | 5 | 1 | 6 | 83.33 | 16.67 |
| කොළඹ | 9 | 27 | 36 | 25.00 | 75.00 |
| ගාල්ල | 5 | 1 | 6 | 83.33 | 16.67 |
| ගම්පහ | 6 | 9 | 15 | 40.00 | 60.00 |
| හම්බන්තොට | 6 | 3 | 9 | 66.67 | 33.33 |
| යාපනය | 3 | 3 | 6 | 50.00 | 50.00 |
| කළුතර | 9 | 7 | 16 | 56.25 | 43.75 |
| මහනුවර | 6 | 8 | 14 | 42.86 | 57.14 |
| කෑගල්ල | 2 | 3 | 5 | 40.00 | 60.00 |
| කුරුණෑගල | 6 | 1 | 7 | 85.71 | 14.29 |
| මාතලේ | 6 | 6 | 12 | 50.00 | 50.00 |
| මාතර | 7 | 6 | 13 | 63.85 | 46.15 |
| මොනරාගල | 1 | – | 1 | 100.00 | – |
| නුවර එළිය | 1 | 1 | 2 | 50.00 | 50.00 |
| පොළොන්නරුව | 3 | 1 | 4 | 75.00 | 25.00 |
| පුත්තලම | 1 | 4 | 5 | 20.00 | 80.00 |
| රත්නපුර | 4 | 6 | 10 | 40.00 | 60.00 |
| වන්නි | 2 | 1 | 3 | 66.67 | 33.33 |
| ත්‍රිකුණාමලය | 1 | 2 | 3 | 33.33 | 66.67 |
| ප්‍රධාන කාර්යාලය | 38 | 33 | 71 | 53.52 | 46.48 |
| එකතුව | 139 | 133 | 272 | 51.10 | 48.90 |

## වයස් කාණ්ඩ, ස්ත්‍රී පුරුෂභාවය හා සේවක කාණ්ඩය අනුව සේවක පිරිවැටුප - 2019

| | වයස අවු. 18-25 | | වයස අවු. 26-35 | | වයස අවු. 36-45 | | වයස අවු. 46-55 | | වයස අවු. 56 සහ ඊට වැඩි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| ආයතනික කළමනාකාරිත්වය | – | – | – | – | – | – | – | – | – | 2 |
| විධායක කළමනාකාරිත්වය | – | – | – | – | – | – | – | – | 4 | 3 |
| නිලධාරීන් (3-111- 1 ශ්‍රේණිය) | – | – | – | 4 | 1 | 4 | 5 | 11 | 71 | 75 |
| කාර්ය මණ්ඩල සහායක ශ්‍රේණිය | – | – | 4 | 7 | – | 1 | 3 | – | – | – |
| වෙනත් රැකියා කාණ්ඩ | – | – | – | – | – | 2 | 8 | 4 | 26 | 10 |
| කළමනාකරණ පුහුණුලාභීන් | – | – | 1 | 4 | – | – | – | – | – | – |
| ගනුදෙනුකාර සේවා සහායකයින් | – | – | – | 4 | – | – | – | – | – | – |
| වෙනත් කොන්ත්‍රාත් සේවකයින් | – | – | 1 | 2 | 2 | – | 5 | – | 1 | – |
| **එකතුව** | – | – | 6 | 21 | 3 | 7 | 21 | 15 | 109 | 90 |

## සේවක සන්නිවේදනය, ආචාරධර්ම හා ඒකාග්‍රතාව

▼ GRI 402-1

### සේවක සන්නිවේදනය

අපගේ සේවකයන් සමග සම්බන්ධ වීමට, ඔවුන් වෙත සවන් දීමට හා ඔවුන් සමග කටයුතු කිරීමටම වෙන් වු සන්නිවේදන නාලිකා රැසක් පවතී. විධිමත් මෙන්ම අවිධිමත් සන්නිවේදන නාලිකා ඔස්සේ බැංකුවට පුරාවටම සේවක සහභාගීත්වය ඉහළ නැංවීම අපි නිරතුරුවම දිරිමත් කරන්නෙමු. මේ අනුව පවත්වනු ලැබෙන සේවක ෆෝරම හා කණ්ඩායම් දැනුම්වත්කිරීම් ආදී ක්‍රියාකාරකම් සේවකයන්ට ප්‍රධාන සංවර්ධනයන් හා ව්‍යාපාරික කාර්යසාධනය සම්බන්ධයෙන් සාකච්ඡාවන්හි නියැළී සිය මත ඉදිරිපත් කිරීමට අවස්ථාව උදා කරයි.

| සන්නිවේදන නාලිකා | අන්තර්ගතය | පවත්වන වාර ගණන |
|---|---|---|
| ප්‍ර.වි.නි. - සාමාන්‍යාධි-කාරීගේ ප්‍රධාන දැනුම්වත් කිරීමේ රැස්වීම | බැංකුවේ කාර්යසාධනය, ශාඛා/සේවක ජයග්‍රහණ හා අනෙකුත් වැදගත් සිදුවීම් ඇතුළත් ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීගේ පණිවුඩය ශාඛා කළමනාකාර විසින් සිය කණ්ඩායම වෙත දැනුම් දේ. | මාසිකව |
| ආයතනික කළමනාකරණ රැස්වීම් | ආයතනික කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයන් විසින් සමාගමේ උපායමාර්ගික ක්‍රියාමාර්ග, මෙහෙයුම් ගැටළු ආදිය සාකච්ඡා කරනු ලැබේ. | මාසිකව |
| ප්‍රාදේශීය කළමනාකාර-වරුන්ගේ සම්මන්ත්‍රණය | ව්‍යාපාරික ප්‍රගතිය, අයකර ගැනීම්, සේවක දුක්ගැනවිලි, ස්ථාන මාරුකිරීම්, ව්‍යාපාරික ඉලක්ක සාක්ෂාත් කරගැනීම සහ විවිධ චක්‍රලේඛ ප්‍රකාර උපදෙස් හා බැඳි තොරතුරු ආදිය සාකච්ඡා කෙරේ. | මාසිකව |
| අභ්‍යන්තර ජාලය | | අවශ්‍ය අවස්ථාවලදී |
| "Pulse"සඟරාව | මෙය, වැදගත් සිදුවීම්, ජයග්‍රහණයන් සහ බැංකුවේ කාර්යසාධනය සම්බන්ධයෙන් සේවකයන් දැනුම්වත් කිරීම අරමුණු කරගත් සෑම දෙපාර්තමේන්තුවක්ම කරා ළඟා වන පුවත් ලිපියකි. | කාර්තුමය වශයෙන් |

## මෙහෙයුම් වෙනස්කම් සඳහා වූ අවම දැනුම්දීමේ කාලය

සිදු කරනු ලබන සියලුම මෙහෙයුම් වෙනස්කම් හා ඒවා නිසා ඇති විය හැකි බලපෑම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාලයකට පෙරාතුව සේවකයන් දැනුම්වත් කිරීමට පියවර ගැනේ. මේ නිසා එවැනි වෙනස්වීම් හා පරිවර්තනයන් හේතුවෙන් සේවකයන්ගේ චිත්ත ධෛර්යය කෙරෙහි ඇතිවිය හැකි අහිතකර බලපෑම් සැලකිය යුතු තරමින් අවම කෙරේ.

මෙහෙයුම් වෙනස්කම් සඳහා වූ අවම දැනුම්දීමේ කාලසීමාවන් පහතින් දැක්වේ:

| වෙනසෙහි ස්වභාවය | දැනුම්දීමේ කාල සීමාව |
|---|---|
| ස්ථාන මාරු කිරීම් | සති 2 |
| ඉල්ලා අස්වීම් | මාස 1 |
| විශ්‍රාම ලැබීම් | මාස 3 |
| සේවය අවසන් කිරීම් | මාස 1-3 |

## දුක්ගැනවිලි කළමනාකරණය

සිය වෘත්තීය සබඳතාවන්හිදී සේවකයන් මුහුණ පාන විවිධ දුෂ්කරතා හේතුවෙන් මතු වන සේවක දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉතාම පැහැදිලි හා විනිවිදභාවයෙන් යුතු කාර්ය පරිපාටියක් තිබේ. මෙහිදී සෑම සේවකයෙකුම වෙත සාධාරණ, අපක්ෂපාතී හා කාලීන වශයෙන් සැලකීමක් සිදු වන බව සහතික කරනු පිණිස හා ඉස්මතු වන පැමිණිලි අදාළ අංශ වෙත යොමු කිරීමට ක්‍රියාපිළිවෙතක් පවතී.

කවර හෝ සේවකයෙකු හට දුක්ගැනවිල්ලක් වේ නම් පළමුව එය අදාළ ආසන්නතම අධීක්ෂක වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඒ අනුව ගැටළුවට විසඳුමක් ලබා ගැනීමට නොහැකි වූයේ නම් එකී දුක්ගැනවිල්ල බැංකුවේ මානව සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ හැකි වේ. සේවකයන්ගේ දුක්ගැනවිලි ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී වෙත ඉදිරිපත් කිරීම තුළින් ඒවාට පිළියම් යෙදීමේ ක්‍රමවේදයක්ද මහජන බැංකුව තුළ ක්‍රියාත්මක වේ. එහිදී ආයතනික කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් විසින් එකී දුක්ගැනවිලි සමාලෝචනයට ලක් කෙරෙන අතර එම සමාලෝචනයෙහි ප්‍රතිඵල මත

# මානව ප්‍රාග්ධනය

පදනම්ව ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී විසින් නිසි පිළියම් යොදනු ලැබේ. මෙහි සමාලෝචනය වන වසර තුළදී ඉදිරිපත් කෙරුණු මුළු දුක්ගැනවිලි 20 ක් වෙනුවෙන් නිවරදකරණ ක්‍රියාමාර්ග ගෙන තිබේ.

▼ GRI 102-41

## සාමූහික කේවල්කරණය

වෘත්තීය සමිති සමග විධිමත් සාමූහික කේවල්කරණ ගිවිසුමක් බැංකුව සතු වන අතර සේවකයන්ට සිය දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම සඳහා විවෘත ප්‍රතිපත්තියක්ද වේ. බැංකුවේ සමස්ථ සේවක පිරිසෙන් 99% ක් නියෝජනය වන පරිදි ප්‍රධාන කළමනාකාර කාණ්ඩය දක්වා සේවකයන් එකී සාමූහික ගිවිසුමෙන් ආවරණය වේ.

| සේවක වෘත්තීය සමිති | සාමාජික සේවක සංඛ්‍යාව |
|---|---|
| ලංකා බැංකු සේවක සංගමය | 6,659 |
| නිලධාරීන්ගේ සංගමය | 357 |
| ශ්‍රී ලංකා නිදහස් බැංකු සේවක සංගමය | 61 |
| ජාතික සේවක සංගමය | 434 |
| සමස්ථ ලංකා බැංකු සේවක සංගමය | 37 |
| එකතුව | 7,548 |

▼ GRI 102-16, 102-17, 102-26, 205-2, 205-3

## දූෂණ විරෝධී පිළිවෙත්

සවිමත් දූෂණ විරෝධී සංස්කෘතියක් අපගේ බැංකුව තුළ පෝෂිතව පවතින අතර ප්‍රගාමී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ, අභ්‍යන්තර විමර්ශන හා පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ අවදානම් කළමනාකරණ ඒකකයෙහි සහයෝගය එය වෙත නිරතුරුවම හිමි වේ. දූෂණය හා වංචාකාරී චර්යාවන් තුරන් කිරීම සම්බන්ධයෙන් සියලුම සේවකයන් සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීමට විමර්ශන හා පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත දූෂණ විරෝධී ප්‍රතිපත්තිය බැංකුවේ සියලුම කාර්ය මණ්ඩල වෙත සන්නිවේදනය කර තිබේ. අල්ලස් හා දූෂණ සිදුවීම් සම්බන්ධයෙන් දැඩි නිවාරණ ප්‍රවේශයක් අප විසින් අනුගමනය කරනු ලැබෙන අතර එවැනි සිදුවීම් සම්බන්ධයෙන් දැඩි විනය ක්‍රියාමාර්ග ගැනීමට අපි පසුබට නොවන්නෙමු. මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළ දූෂණ විරෝධී පිළිවෙත් සම්බන්ධයෙන් පැය 14,520 ක පුහුණුවක් අපගේ සමස්ථ සේවක මණ්ඩලය වෙනුවෙන් වෙන් කළෙමු.

| | සංඛ්‍යාව | % |
|---|---|---|
| සමාගමේ දූෂණ විරෝධී ප්‍රතිපත්ති හා ක්‍රමවේද සම්බන්ධයෙන් දන්වන ලද මුළු පාලක මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව හා ප්‍රතිශතය | සියලුම සේවකයන් | 100 |
| සමාගමේ දූෂණ විරෝධී ප්‍රතිපත්ති හා ක්‍රමවේද සම්බන්ධයෙන් දන්වන ලද මුළු සේවක සංඛ්‍යාව හා ප්‍රතිශතය | සියලුම සේවකයන් | 100 |
| දූෂණ විරෝධී පිළිවෙත් සම්බන්ධයෙන් පුහුණුව ලැබූ මුළු සේවක සංඛ්‍යාව හා ප්‍රතිශතය | 1,815 | 23.2 |
| තහවුරු කරන ලද දූෂණ සිදුවීම් හා ප්‍රතිශතය | 93 | අදාළ නොවේ |
| දූෂණ චර්යා හේතුවෙන් සේවයෙන් ඉවත් කරන ලද හෝ විනය ක්‍රියාමාර්ගවලට යටත් කරන ලද තහවුරු කරන ලද මුළු සේවක සංඛ්‍යාව | 237 | අදාළ නොවේ |

සමාගමේ සුපිළිපන් බව අගයමින් ඉහළම ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා අපි නිරතුරුවම අපගේ සාමාජිකයන් වෙත සහාය වන්නෙමු. නිවැරදි තීරණ ගැනීම තුළින් යහපත් සේවා චර්යාවක නිරත වීමට ඔවුන්ට සහාය වනු පිණිස පහත සඳහන් ප්‍රතිපත්ති පිහිටුවා තිබේ:

- **සාංගමික යහපාලන සංග්‍රහය** - සමූහය තුළ ආචාරධාර්මික හැසිරීම හා සුපිළිපන් බව තහවුරු කරන මෙන් සියලුම සේවකයන් පොළඹවාලන වටිනාකම් හා චර්යා පිළිවෙත් අඩංගු නිල ලේඛනයකි.
- **සේවකයන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය** - සමූහයේ සෑම සේවකයෙකුම ආයතනික චර්යා ධර්ම සංග්‍රහයට අනුකූලතාව දක්වන බව අපේක්ෂා කෙරෙන අතර සමූහයෙහි සේවයේ පිහිටුවීමේදී ඔවුන් විසින් මෙකී පිළිවෙත් සංග්‍රහයට අත්සන් තැබිය යුතු වේ.
- **විනය නීති සංග්‍රහය** - විෂමාචාරයක් ලෙස සලකනු ලැබෙන්නේ කුමක්ද යන්න නිර්වචනය කෙරෙන හා විෂමාචාර ක්‍රියා සම්බන්ධයෙන් අනුගමනය කෙරෙන විධිමත් විනය ක්‍රියා පටිපාටිය දැක්වෙන නිල ලේඛනයකි.
- **දූෂණ-අක්‍රමිකතා දැනුම් දීමේ ප්‍රතිපත්තිය** - දූෂණය කිසිදු ලෙසකින් අනුමත නොකිරීමේ ප්‍රතිපත්තිය පිළිබිඹු කෙරෙන, විෂමාචාර හා දූෂණ ක්‍රියා සම්බන්ධයෙන් අනුගමනය කෙරෙන වැඩිමනත් පියවරකි. ඕනෑම සේවකයෙකුට පහත සිදුවීම් සම්බන්ධයෙන් සිය ආසන්නතම අධීක්ෂණ නිලධාරී හෝ සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත වාර්තා කළ හැකිය. මෙහිදී අදාළ සේවකයාගේ/සේවිකාවගේ සුරක්ෂිතතාව වෙනුවෙන් රහස්‍යභාවය ආරක්ෂා කිරීමට බැංකුව සහතික වේ.

  i. විනය නීති සංග්‍රහය කඩ කිරීම

  ii. නෛතික/නියාමන බැඳීම් වෙත නිසි අනුකූලතාව දැක්වීමට අපොහොසත් වීම

  iii. සාධාරණය ඉටු නොවීමේ සිදුවීම්

  iv. මූල්‍යමය අක්‍රමිකතා

# සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

**සමාජ හා සබඳතා ප්‍රාග්ධනය අප සතු ඉතාම වටිනා වත්කමකි. සෑම පාර්ශ්වයක් වෙතම සමානව සලකමින් අන්‍යෝන්‍ය වර්ධනය ඔස්සේ විශ්වාසය ගොඩනගා ගන්නා අතරම ගනුදෙනුකරුවන්, ව්‍යාපාරික හවුල්කරුවන්, ආයෝජකයන් හා විවිධ ප්‍රජාවන් සමග ඇති අපගේ සබඳතා දශක ගණනාවක් පුරාවට ගොඩනගා ගන්නා ලද ඒවා වේ.**

## අපගේ සමාජ හා සබඳතා ප්‍රාග්ධනය කළමනාකරණය කරගැනීම

මෙරට බැංකු කර්මාන්තය තුළ දැවැන්තම ගනුදෙනුකාර පදනම අප සතු වේ. අපගේ විශිෂ්ටත්වය රඳා පවතිනුයේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා මනාව හඳුනා ගනිමින් ඔවුන් වෙත නවෝත්පාදනාත්මක විසඳුම් ලබා දීම තුල බව අපි වටහා ගෙන සිටින්නෙමු. විවිධ පාර්ශ්වකාර කාණ්ඩ වෙත ඉහළම වටිනාකමක් නිර්මාණය කරනු පිණිස අපගේ මානව සම්පත, තොරතුරු තාක්ෂණය, නිෂ්පාදිත වත්කම් හා කාර්යක්ෂම ක්‍රියාවලීන් හා පද්ධති ආදිය විෂයික ආයෝජන ඔස්සේ අපගේ සේවා ශක්‍යතාව වැඩිදියුණු කරගැනීමට අපි නිරතුරුව කටයුතු කරන්නෙමු. අප සතු තියුණු මූල්‍යමය නිපුණතාව ගනුදෙනුකාර අවශ්‍යතා සමග මුසු කිරීම තුළින් ඔවුන් වෙනුවෙන් බිහිකරනු ලැබෙන වටිනාකම ඉහළ නැංවීමට හේතු වන නවෝත්පාදනාත්මක හා කර්මාන්තයේ පෙරමුණ ගන්නා නිපැයුම් ලබා දීම අපගේ අරමුණයි. සවිමත් සමාජ යහපාලනයක් හා සාධාරණ ප්‍රතිපත්තියක් තුළින් අපගේ සේවා හා නිපැයුම්වල තිරසාරතාව සහතික කිරීමට අපි පියවර ගන්නෙමු. ගනුදෙනුකාර සබඳතා, නවෝත්පාදනය, ඩිජිටල්කරණය සහ මෙහෙයුම් හා සේවා විශිෂ්ටතාව ආදිය අප සුවිශේෂී කරණ සාධක වේ.




### ගනුදෙනුකාර ප්‍රාග්ධනය

**වැදගත් කරුණු**

ශ්‍රී ලංකාව පුරාවට **මිලියන 14** ඉක්මවන ගනුදෙනුකාර ප්‍රජාවක්

2019 වසරේදී නව ගනුදෙනුකරුවන් **600,000** කට අධික පිරිසක් සම්බන්ධ කරගන්නා ලදි.

ජංගම හා අන්තර්ජාල බැංකුකරණ විසඳුම් ඔස්සේ **රු. බිලියන 80** කට ආසන්න ගනුදෙනු වටිනාකමක්.

ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථාන **2000** කට ආසන්න ප්‍රමාණයක්

## තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) වෙත අනුගත වීම

| | |
|---|---|
| 1 NO POVERTY | කාන්තාවන් හා පුරුෂයන් සියලුම දෙනා සවිබල ගැන්වීම සහ ආර්ථික හා මූල්‍ය සේවා ලබා ගැනීමට ඔවුන්ට ඇති හිමිකම සහතික කිරීම. |
| 10 REDUCED INEQUALITIES | ස්ත්‍රී පුරුෂභාවය, වයස, ආබාධිතතා, ජනවර්ගය, ආගම හෝ ආර්ථික තත්ත්වය යන කවර සාධකයක් හෝ විශේෂ කර නොගනිමින් ගනුදෙනුකරුවන් සියලුම දෙනා සමාජ හා ආර්ථික වශයෙන් අන්තර්ගත කරගැනීම ප්‍රවර්ධනය කරන ලදි. |

දීප ව්‍යාප්ත ශාඛා ජාලය හා ඩිජිටල් බැංකුකරණ නාලිකා ඔස්සේ ශ්‍රී ලංකාව පුරාවට මිලියන 10 ඉක්මවන අපගේ ගනුදෙනුකාර ප්‍රජාව වෙත සමීප වීමට අපි කටයුතු කරන්නෙමු. මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී අපගේ ගනුදනෙුකාර පදනම සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත්තේ අපගේ බැංකුව හා අප සතු සවිමත් සන්නාම කීර්ති නාමය කෙරෙහි ඔවුන් තබන විශ්වාසය තහවුරු කරමිනි. අප සතු විවිධත්වයෙන් යුතු ගනුදෙනුකාර පදනම මගින් දේශීය ආර්ථිකයේ සෑම වයස් කාණ්ඩයක්ම හා අංශයක්ම ආවරණය කෙරේ.

## භූගෝලීය බෙදීයාම අනුව ගනුදෙනුකාර පදනම - 2019

අපගේ ගනුදෙනුකාර පදනමේ භූගෝලීය නොහොත් ප්‍රාදේශීය බෙදීයාම තුළින් පෙන්නුම් කෙරෙන්නේ බස්නාහිර පළාතෙන් පරිබාහිරව සතුටුදායක වර්ධනයක් පවතින බවයි. රටෙහි ආර්ථිකය හා ධනය විෂයික සම්පත් අති බහුතරය බස්නාහිර පළාත තුළට ඒකරාශී වී ඇති පසුබිමක් තුළ මුළු ගනුදෙනුකරුවන්ගේ හතරෙන් තුනක්ම වෙනත් පළාත් කෙරෙන් ඒකරාශී වීම සතුටුදායක තත්ත්වයකි. සාපේක්ෂ වශයෙන් පසුගාමී පළාත් ඇසුරින් පවා අපගේ ගනුදෙනුකරුවන් ඉතාම සතුටුදායක ලෙස බෙදී යාමක් පෙන්නුම් කෙරේ.




GRI 102.2, 206-1

## අපගේ සේවා හා නිපැයුම්

අත්තිකාරම්, තැන්පතු සහ කාඩ්පත් වැනි අනෙකුත් නිපැයුම් අපගේ සේවා හා නිෂ්පාදන කළඹට ඇතුළත් වේ. ගනුදෙනුකාර භවතුන්ගේ අවශ්‍යතා ගැඹුරින් වටහා ගැනීම තුළින් ඔවුන්ගේ ජීවිත කාල පුරාවටම නවෝත්පාදනයෙන්, නම්‍යශීලීතාවෙන් හා පිරිවැය කාර්යක්ෂමතාවෙන් සවිගැන්වුණු සේවා හා නිපැයුම් ලබා දීමට අපි කටයුතු කරන්නෙමු. මූල්‍ය සේවා සඳහා ශ්‍රී ලංකාවේ අසමසම වෙළෙඳපොල පුරෝගාමියා වශයෙන් අපටම ආවේණික පළපුරුද්ද, සේවා කේන්ද්‍රීයතාව හා තාක්ෂණික ප්‍රවණතා කෙරෙහි දක්වන නිරන්තර නිරාවරණය පාදක කරගනිමින් සෑම ගනුදෙනුකාර අංශයක්ම ඇතුළත් වන පරිදි ගතිකත්වයෙන් යුතු නිපැයුම් හා සේවා මාලාවක් ලබා දීමට අප විසින් පියවර ගනු ලැබේ. අපගේ නිෂ්පාදනවල සවිමත්භාවය හා ගනුදෙනුකරුවන් සඳහා ඒවායෙහි ඇති අදාළතාව සනිටුහන් කරන හොඳම සාක්ෂිය වන්නේ ස්ථිර නැගී යාමක් ප්‍රකට කරන අපගේ ගනුදෙනුකාර පදනමයි.

පවතින වෙළෙඳපොල ප්‍රවණතා හා රටෙහි මූල්‍ය ප්‍රතිපත්තිය වෙත අනුකූල වන පරිදි අපගේ සේවා හා නිපැයුම් සඳහා මිල නියම කිරීම සිදු කෙරෙන අතර තරගකාරීත්වය පළුදු කෙරෙන, විශ්වාසය කඩ කෙරෙන හා ඒකාධිකාරී ව්‍යාපාරික පරිචයන්හි අපි කිසිවිටෙකත් නිරත නොවන්නෙමු. වාර්තාකරණ වසර තුළ ප්‍රමාද ගෙවීම් හා දඩ මුදල් කිසිවක් බැංකුව විසින් ගෙවීමට සිදු වී නොමැත.




“එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා” ණය යෝජනා ක්‍රමය - කිරිඳිවැල ප්‍රදේශය



“RLOS” ණය ප්‍රවර්ධන වැඩසටහන - සිද්ධායුර්වේද ප්‍රදේශය

## අපගේ නිෂ්පාදන හා සේවා

### සිල්ලර බැංකුකරණය

**තැන්පතු නිෂ්පාදන**

i. ජංගම ගිණුම්
ii. ඉතුරුම් ගිණුම්
- ඉසුරු උදාන
- සිසු උදාන
- Yes
- වනිතා වාසනා
- ජන ජය
- අස්වැන්න
- පරිණත
- පීපල්ස් රිලැක්ස්
- සාමාන්‍ය ඉතුරුම්

iii. ස්ථාවර තැන්පතු
iv. ඇමතුම් තැන්පතු
v. විදේශ මුදල් තැන්පතු

**අත්තිකාරම්**

i. පුද්ගලික ණය
ii. කාලින ණය
iii. නිවාස ණය
iv. උකස් සේවාව

**වෙනත්**

i. ක්‍රෙඩිට්/ඩෙබිට් කාඩ්පත්
ii. තෑගි වවුචර
iii. මොබයිල් හා SMS බැංකුකරණය
iv. අන්තර්ජාල බැංකුකරණය

### ව්‍යවසායික බැංකුකරණය

i. ජංගම ගිණුම්
ii. ඉතුරුම් ගිණුම්
iii. ස්ථාවර තැන්පතු
iv. අයිරා
v. කාලින ණය
vi. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායික ණය
vii. සංවර්ධන හා ක්ෂුද්‍ර මූල්‍ය ණය
viii. වෙළෙඳ මූල්‍ය

### තොග බැංකුකරණය

i. ජංගම ගිණුම්
ii. ඉතුරුම් ගිණුම්
iii. ස්ථාවර තැන්පතු
iv. අයිරා
v. කාලින ණය
vi. වෙළෙඳ මූල්‍ය
- ආනයන/අපනයන මූල්‍යකරණය
- නැව්ගත ප්‍රවාහන හා බැංකු ඇපකර
- ජාත්‍යන්තර වෙළෙඳ ගෙවීම් සඳහා පහසුකම් (ණයවර ලිපි හා ප්‍රතිග්‍රහණයන්)

### භාණ්ඩාගාරය සහ ආයෝජන බැංකුකරණය

i. මුදල් වෙළෙඳපොල ක්‍රියාකාරකම්
ii. රජයේ සුරැකුම්පත් ආශ්‍රිත වෙළෙඳ කටයුතු
iii. රජයේ සුරැකුම්පත් ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු
iv. විදේශ විනිමය ගනුදෙනු
v. ව්‍යුත්පන්න ගනුදෙනු
vi. ආයෝජන බැංකුකරණය, ණය ව්‍යුහගත කිරීම, උපදේශන සේවා, භාරකාරත්ව සේවා

### ජාත්‍යන්තර මෙහෙයුම්

i. වෙළෙඳ සේවා
ii. විදේශ ගනුදෙනුකාර සේවා
iii. විදේශ මුදල් ප්‍රේෂණ
iv. විදේශ මුදල් තැන්පතු
v. ජාත්‍යන්තර ගෙවීම් හා පියවීමේ සේවා



විශිෂ්ට දක්ෂතා සහිත සිසුන් "සිසු උදාන විශිෂ්ටයෝ" හි දී මහජන බැංකුවේ සම්මානයට පාත්‍ර විය.



ජාත්‍යන්තර කාන්තා දින සැමරුම




YES ගිණුම සමගින් මහජන බැංකුව ජාත්‍යන්තර තරුණ දිනය සමරන ලදි.

## ගනුදෙනුකාර අත්දැකීම කළමනාකරණය

අපගේ ගනුදෙනුකරුවන් අප හා සිදු කරන සෑම ගනුදෙනු කටයුත්තක්ම වටිනාකමකින් යුතු හා ඔවුන්ගේ අපේක්ෂා ඉක්මවා යන අත්දැකීමක් බවට පරිවර්තනය කරනු පිණිස ඔවුන්ගේ සියලුම මූල්‍ය අවශ්‍යතා සඳහා ඒකාබද්ධ හා සාකල්‍යවාදී විසඳුම් ලබා දීම අපගේ නිරන්තර අරමුණයි.

නිසි සමාජ හා පාරිසරික නියාමන ප්‍රමිතීන්ට අනුකූලතාව දක්වමින් ඉහළම තත්ත්වයේ තිරසාර නිපැයුම් හා සේවාවන් ලබා දීම උදෙසා අපගේ පද්ධතීන් හා ක්‍රියාවලීන් නවෝත්පාදනයට ලක් කිරීම තුළින් එකී අරමුණ ඉටුකර ගැනීමට අපි කටයුතු කරන්නෙමු. දිවයිනේ සෑම ස්ථානයක්ම ආවරණය කෙරෙන පුළුල් සේවා මධ්‍යස්ථාන ජාලය ඔස්සේ පමණක් නොව වසරේ දින 365 පැය 24 පුරාවටම සේවය සඳහා විවෘත අතථ්‍ය සේවා අවකාශද හරහා අපගේ සේවාවන් වෙත ප්‍රවේශ වීමේ හැකියාව වැඩිදියුණු කිරීම වෙනුවෙන්ද අපි නිරන්තරයෙන්ම කටයුතු කරන්නෙමු.  අභ්‍යන්තර ක්‍රියාවලීන් කාර්යක්ෂමකරණය තුළින් දෝෂ හා ප්‍රමාදවීම් අඩුකර ගැනීමටත්, ගනුදෙනුකරුවන් වෙත සේවාව ලබා දීම සඳහා උපරිම කාලයක් කැප කිරීමේ අවස්ථාව අපගේ සේවක මණ්ඩලය වෙත ලබා දීමටත් අප විසින් පියවර ගෙන තිබේ.ගනුදෙනුකාර සේවාව වැඩිදියුණු කරනු පිණිස සහාය දක්වමින් ඉහළ ස්වාධීනත්වයකින් යුතුව ශාඛා මට්ටමින් ක්‍රියාත්මක වීමට ඉඩකඩ සලසනු පිණිස අපගේ පාලන අධිකාරීත්වයද විමධ්‍යගත කරන ලදි.

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී ගනුදෙනුකරුවන් වෙත ලබා දෙන සේවාව තවදුරටත් ඉහළ නැංවීම උදෙසා ලොබි කළමනාකාරවරයෙකු පත් කිරීමට අප පියවර ගත් අතර අපගේ වටිනා ගනුදෙනුකාර ප්‍රජාව වෙත අසමසම සේවාවක් ලබා දීමේ අරමුණින් Elegance Centre සේවා මධ්‍යස්ථානයක්ද විවෘත කරන ලදි. ගනුදෙනුකරුවන් සඳහා පුද්ගලීකරණය වූ හා අගය එකතු කළ ගනුදෙනුකාර සේවාවක් ලබා දීම සඳහා දොරින් දොර ගොස් ඔවුන් වෙත සමීප වීමටද අපි කටයුතු කරන්නෙමු.

GRI 471-1, 417-2, 417-3

## නිෂ්පාදන හා සේවා ලාංඡනකරණය සහ අලෙවිකරණ සන්නිවේදනය

සාධාරණ හා නිවැරදි තොරතුරු දැනගැනීමට ගනුදෙනුකරුවන්ට ඇති අයිතියට ගරු කරමින් අපගේ නිෂ්පාදන හා සේවා සම්බන්ධ පැහැදිලි, නිවැරදි, කාලීන වශයෙන් යාවත්කාල වූ සහ අදාළතාවයෙන් යුතු තොරතුරු සන්නිවේදනය කිරීමටද අප විසින් පියවර ගැනේ. මෙමගින් සිය මූල්‍ය අවශ්‍යතා සම්බන්ධයෙන් සබුද්ධික තීරණ ගැනීමට සහායක් අපගේ ගනුදෙනුකාර භවතුන් වෙත ලැබේ. මේ සඳහා උපකාරී වන බැංකුවේ ගනුදෙනුකාර ප්‍රඥප්තිය සකස් කර ඇත්තේ ශ්‍රී ලංකා මහබැංකුව විසින් නිර්ණය කර ඇති අවශ්‍යතාවන්ට නිසි අනුකූලතාව දක්වමිනි. අපගේ නිෂ්පාදන හා සේවාවන්ට අදාළ වන නියමයන් හා කොන්දේසි සියල්ලම පහසුවෙන් වටහාගත හැකි පරිදි ඉතාම සරල හා පැහැදිලි ලෙස නිකුත් කර ඇත. තැන්පතු හා අත්තිකාරම්වලට අදාළ පොලී, විනිමය අනුපාත හා අනෙකුත් අදාළ වන ගාස්තු අපගේ ආයතනික වෙබ් අඩවියෙහි පළ කර ඇති අතර එකී තොරතුරු දෛනිකව යාවත්කාල කෙරේ. අපගේ නිෂ්පාදන හා සේවාවන් සම්බන්ධ තොරතුරු සහ ඒවාට අදාළ නියමයන් හා කොන්දේසි සියල්ලම සිංහල, දමිළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම මුද්‍රණය කර සියලුම ශාඛාවලින් ලබාගත හැකි පරිදි ස්ථානගත කර තිබේ. එසේම, අපගේ නිෂ්පාදන හා සේවාවන්ට අදාළ තොරතුරු ගනුදෙනුකරුවන් වෙත නිවැරදිව ලබා දීමට මහජන බැංකුවේ ඇමතුම් මධ්‍යස්ථානය නිරතුරුව කටයුතු කරයි.

අපගේ සියලුම අලෙවිකරණ සන්නිවේදන කටයුතු සැලසුම් කරනු ලබන්නේ බැංකුවේ ආයතනික සන්නිවේදන ප්‍රතිපත්තියට අනුකූලව වන අතර භාෂා තුනෙන්ම එකී වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. මහජන බැංකුවේ සන්නාමකරණ මාර්ගෝපදේශනයන්ට අනුකූලව ආචාරධාර්මික හා වගකීම්සහගත අලෙවිකරණ මූලධර්ම ගුරුකොට ගනිමින් සිදු කරනු ලබන අපගේ අලෙවිකරණ සන්නිවේදනයන් මගින් මහජනතාව නොමග යැවීමක් සිදු නොවන බව සහතික කිරීමට අපි සෑමවිටම වගබලා ගන්නෙමු. සියලුම අලෙවිකරණ සන්නිවේදනයන් ප්‍රකාශනයට පෙරාතුව සියුම් සන්නිරීක්ෂණයකට ලක් කොට දැඩි අනුමත කිරීමේ ක්‍රියාවලියකට ලක් කරන්නේ එබැවිනි.

මෙහි සමාලෝචනය වන වසර තුළ නිෂ්පාදන හා සේවා ලාංඡණකරණය, අලෙවිකරණ සන්නිවේදනයන් හෝ නිසි ස්වේච්ඡා පිළිවෙත් හෝ වෙනත් මාර්ගෝපදේශනයකට අදාළව කිසිදු අනනුකූලතාවක් වාර්තා නොවීය.

## භූගෝලීය ව්‍යාප්තිය

අපගේ බැංකු මෙහෙයුම් දිවයිනේ සෑම පළාතක් වෙතම ව්‍යාප්ත වී තිබීම නිසා මෙරට ජන සමාජයේ අඩු සංවර්ධනයක් ප්‍රකට කරන හා අවවරප්‍රසාදිත ප්‍රජාවන් වෙත සාර්ථකව සේවා ලබා දීමට අපට හැකියාව ලැබී තිබේ. අපගේ ගනුදෙනුකරුවන් අතරින් 73.7% ක් ම බස්නාහිර පළාතෙන් පරිබාහිර පළාත් නියෝජනය කරන්නෝ වෙති. විස්තීර්ණ නිපැයුම් හා සේවා කළඹක් ඔස්සේ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට අමතරව රටෙහි ආර්ථිකය කෙරෙහි ධනාත්මක  බලපෑමක් ඇති කිරීමටද අපි දායක වන්නෙමු. අපගේ නිෂ්පාදන හා සේවාවන් සියලුම ප්‍රධාන ආර්ථික අංශ ආවරණය කරන අතර අප ලබා දෙන පහසුකම් ඔස්සේ ගනුදෙනුකරුවන් හා අදාළ අංශ වෙනුවෙන් ආදායම් උත්පාදනය කිරීමටද සහායක් ලබා දෙනු ලැබේ.

## ගනුදෙනුකරුවන් විසින් අපගේ සේවා ජාලය භාවිත කිරීම

ගනුදෙනුකරුවන් හට අපගේ සේවාවන් හා නිපැයුම් පහසුවෙන් ලබා ගැනීමට හැකියාව ඇති බව සහතික කිරීම මහජන බැංකුවේ ප්‍රධානතම ප්‍රමුඛතාවක් ලෙස අපි සලකමු. එම අරමුණ ඉටුකර ගනු පිණිස අපගේ ව්‍යාප්තිය ශාඛා 739 ක් දක්වා වැඩිකර ගැනීමට අපට හැකි වූ අතර දිවයින පුරා ATM යන්ත්‍ර 755 ක්, මුදල් තැන්පතු යන්ත්‍ර 270 ක් හා කියෝස්ක් යන්ත්‍ර 222 ක් දක්වා එකී ව්‍යාප්තිය තහවුරු කරගැනීමට අප විසින් පියවර ගෙන තිබේ. වාර්ෂිකව මහජන බැංකුවේ ගිණුම් හිමියන් නොවන ගනුදෙනුකරුවන් විසින් මිලියන 15 කට අධික ගනුදෙනු ප්‍රමාණයක් අපගේ ATM ජාලය ඔස්සේ සිදු කර තිබේ.

ප්‍රධාන කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අපගේ නාලිකා කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ශාඛා ජාලයේ කාර්යසාධනය නිරීක්ෂණය කරනු ලැබෙන අතර ඉහළම කාර්යසාධනයක් ප්‍රකට කරන ශාඛා ඇගයීමට ලක් කෙරේ. සෑම ශාඛාවකම ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණ විධිවිධානවල කාර්යක්ෂමතාව සහතික කිරීමට බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව පියවර ගනියි.

අපගේ ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථානවල භූගෝලීය ව්‍යාප්තිය පිළිබඳ විස්තර සඳහා 71 පිටුවේ දැක්වෙන නිෂ්පාදිත ප්‍රාග්ධනය කොටස බලන්න.

GRI 203-2

## අන්තර්ගෘහිත බැංකුකරණය

ශ්‍රී ලංකාවේ ආර්ථිකමය වශයෙන් අඩු වරප්‍රසාද භුක්ති විඳින පිරිස් වෙත දොරටු විවෘත කළ මෙරට පළමු මූල්‍ය ආයතනය මහජන බැංකුව වන අතර වසර 57 ක් මුළුල්ලේ උතුරු හා නැගෙනහිර පළාත්වල අපගේ සේවා ව්‍යාප්තිය ඊට කදිම සාක්ෂියකි. වඩා අන්තර්ගෘහිත සේවාවක් ලබා දීම උදෙසා මෙකී පළාත්වල සේවය කරන අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයන් භාෂා තුනම චතුර ලෙස හසුරුවන්නට සමත් අය වීම විශේෂයකි. අපගේ අලෙවිකරණ සන්නිවේදනයන් සියල්ලමද භාෂා තුනෙන්ම සිදු කෙරේ. එකී අන්තර්ගෘහිත සේවා සංස්කෘතියට නව මානයක් එක් කරමින් අපගේ ශාඛා වෙතින් විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සඳහා පහසු ප්‍රවේශ අවස්ථා හා සේවා ලබා දීමටද කටයුතු සම්පාදනය කර ඇත.

මෙතෙක් අඩු අවධානයකට ලක් වූ ගනුදෙනුකාර පිරිස් වෙත සේවා ලබා දීමේ අපගේ අරමුණ පෙරදැරි කරගෙන කාන්තාවන් හා බාල වයස්කාරයන් උදෙසා සුවිශේෂිත සේවා හා නිපැයුම් ලබා දීම අතින්ද අපි පෙරමුණ ගෙන සිටිමු. කෙසේ වෙතත්, මේ වන විට එම පිරිස අතිශයින්ම තරගකාරී වෙළෙඳපොළ කාණ්ඩයක් නියෝජනය කරන අතර සැලකිය යුතු වෙළෙඳපොළ කොටසක් ඒ ආශ්‍රිතව අත්කර ගැනීමට අපට තවදුරටත් හැකියාව ලැබී තිබේ.

## බහුනාලිකා බැංකුකරණය

දිවයින පුරා ප්‍රධාන ස්ථාන කරා සේවා මධ්‍යස්ථාන ව්‍යාප්ත කිරීමෙන් ඔබ්බට යමින් මොබයිල් බැංකුකරණය, අන්තර්ජාල බැංකුකරණය, Facebook, Viber, Instagram සහ WhatsApp ආදී නව ඩිජිටල් අවකාශ හරහාද ව්‍යාප්තිය පුළුල් කරගැනීමට අප පියවර ගෙන තිබේ. ගනුදෙනුකරුවන්ට පහසුදායී බව හා අන්තර්ක්‍රියාකාරී බව ඉහළ නැංවීම සඳහා අපගේ වෙබ් අඩවියද නවීකරණය කරන ලදි. නිරන්තරයෙන්ම ඉහළ යන අපගේ ගනුදෙනුකරුවන් සඳහා මෙකී ප්‍රවේශ මාර්ග විශිෂ්ට සේවා අවකාශ බවට පත් වන බව අපගේ විශ්වාසයයි.

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | 2019 | 2018 | වෙනස % |
|---|---|---|---|
| මොබයිල් හා අන්තර්ජාල ගනුදෙනුකරුවන් | 381,573 | 194,250 | 96.4 |
| Facebook ප්‍රජාව | 205,000 | 186,141 | 10.1 |
| මාසිකව People's Web වෙත පිවිසෙන සංඛ්‍යාව | 57,406 | 46,580 | 23.2 |

මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී ස්වයං-බැංකුකරණ නාලිකා වෙත අපගේ ගනුදෙනුකරුවන් යොමු කිරීමටද සැලකිය යුතු ප්‍රයත්නයන් දරන ලදි. ඒ අනුව වැඩි ගනුදෙනුකරුවන් පිරිසක් ආකර්ෂණය කරගැනීමට හැකි වන පරිදි අපගේ ස්වයං-බැංකුකරණ ඒකකවල පෙනුම නවීකරණය කරන ලද අතර එකී මධ්‍යස්ථානවල කාර්යක්ෂමතාවද උපරිමය දක්වා ඉහළ නංවන ලදි. ඒ අනුව දවසේ පැය 24 පුරාවට සිදු කරනු ලබන සමීප නිරීක්ෂණයන් ඔස්සේ එකී යන්ත්‍රවල ක්‍රියාකාරීත්වය 99.9% ක් ලෙස පවත්වා ගැනීමට අපට හැකි වී තිබේ. අවම කාලයකින් චෙක්පත් නිශ්කාෂණ කටයුතු ඉටු කළ හැකි පරිදි අති නවීන චෙක්පත් තැන්පතු යන්ත්‍රද ස්ථාපනය කරන ලදි. එපමණක්ද නොව, බැංකු ණය පහසුකම් හැර අන් සියලුම ගනුදෙනු පහසුවෙන් ඉටුකර ගැනීමට ගනුදෙනුකරුවන්ට අවස්ථාව උදා කරමින් කවුන්ටර රහිත ශාඛා දෙකක්ද විවෘත කරන ලදි. ගනුදෙනුකාර අත්දැකීම අසමසම මට්ටමක් දක්වා ඉහළ නැංවීමට එකී ශාඛාවන් හේතු වී තිබේ.

## ඩිජිටල් බැංකුකරණ නාලිකා යොදාගැනීම

අපගේ ගනුදෙනුකරුවන් ස්වයං-බැංකුකරණ නාලිකා පරිහරණයට යොමු වීම ආශ්‍රිත සවිමත් වර්ධනයක් පෙන්නුම් කරන අතර ගත වූ වසර හා සැසඳීමේදී 2019 දී ඩිජිටල් ගනුදෙනු වටිනාකම 100%කටත් වඩා ඉහළ යාමක් වාර්තා කරයි. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිත අපගේ ගනුදෙනුකරුවන් අතරින් 70% ක් ම ස්වයං-බැංකුකරණ නාලිකා පරිහරණයට පෙළඹී ඇත.

**ගනුදෙනුකරුවන් සංඛ්‍යාව - මොබයිල් හා අන්තර්ජාල බැංකුකරණ නාලිකා**




**මූල්‍ය ගනුදෙනු සංඛ්‍යාව - මොබයිල් හා අන්තර්ජාල බැංකුකරණ නාලිකා**






## අපගේ ඇමතුම් මධ්‍යස්ථානය

කාර්යබහුල වේලාවන් තුළදී ඇමතුම් මධ්‍යස්ථානයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම තුළින් ගනුදෙනුකරුවන් වෙත ඉහළ සේවාවක් ලබා දීමේ අභිලාෂය සවිමත් කිරීම මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදීද සිදු කෙරිණ. විවිධ ඩිජිටල් නාලිකා ඔස්සේ අපගේ ව්‍යාප්තිය පුළුල් ලෙස ඉහළ ගොස් තිබුණද ඇමතුම් මධ්‍යස්ථානය සතු වටිනාකමද ඉහළ මට්ටමක පැවතිණ. වසරේ දින 365 පැය 24 පුරාවටම ඕනෑම මොහොතක අප හා සම්බන්ධ වීමට ගනුදෙනුකරුවන් හට අවකාශ තිබේ.

2019 වසරේදී අපගේ ඇමතුම් මධ්‍යස්ථානය විසින් හසුරුවන ලද ඇමතුම්වල සාමාන්‍යය දිනකට ඇමතුම් 3094 ක් ලෙස වාර්තා වන අතර ඇමතුම් කළමනාකරණය සඳහා ගතව ඇති සාමාන්‍ය කාලය මිනිත්තු 02 තත්පර 43 කි.

## ගනුදෙනුකරුවන්ගේ දැනුම්වත්භාවය

මනාව ව්‍යුහගත කරන ලද ගනුදෙනුකාර අධ්‍යයන වැඩසටහන් හා ගනුදෙනුකාර සහභාගීත්ව වැඩසටහන් ඔස්සේ බැංකුකරණය සඳහා ඇති සමාජ හා ඩිජිටල් බාධක ඉවත් කිරීමට අපි පියවර ගන්නෙමු. මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළ දිවයින පුරා විසිරී සිටින අපගේ ගනුදෙනුකාර ප්‍රජාව වෙත වටිනාකමක් එක් කරනු වස් බහුශික්ෂණාත්මක වැඩසටහන් රැසක් ක්‍රියාවට නංවන ලදි.

### 2019 වසරේදී පවත්වන ලද ගනුදෙනුකාර දැනුම්වත් කිරීමේ වැඩසටහන්.

| වැඩසටහන/ ක්‍රියාදාමය | අරමුණ/විස්තරය | ප්‍රදේශය/ දිස්ත්‍රික්කය | සහභාගී වූ පිරිස |
|---|---|---|---|
| "මවක මහිම" (වනිතා වාසනා වැඩමුළුව) | දරුඵල අපේක්ෂිත මව්වරුන් සඳහා මානසික සහන වැඩසටහන | මහනුවර | 250 |
| | | අනුරාධපුර | 250 |
| | | පොලොන්නරුව | 250 |
| | | ත්‍රිකුණාමලය | 250 |

## ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි හා දුක්ගැනවිලි හැසිරවීම

අසමසම ගනුදෙනුකාර අත්දැකීමක් ලබා දෙනු පිණිස ඔවුන්ගේ පැමිණිලි සාධාරණව, කාර්යක්ෂමව හා කඩිනමින් විසඳීමට අපි සෑම විටම ප්‍රයත්න දරන්නෙමු. මේ සඳහා මනාව ව්‍යුහගත කරන ලද ගනුදෙනුකාර පැමිණිලි හා දුක්ගැනවිලි ක්‍රමවේදයක් ක්‍රියාත්මක වන අතර ශාඛා ජාලය හා ආයතනික වෙබ් අඩවිය ඔස්සේ එය අපගේ ගනුදෙනුකරුවන් සියලුම දෙනා වෙත සන්නිවේදනය කිරීමට පියවර ගෙන ඇත. කිසියම් ගනුදෙනුකරුවෙකු අපගේ දුක්ගැනවිලි විසඳීමේ ක්‍රියාවලියෙන් සෑහීමට පත් නොවන්නේ නම් එකී පැමිණිල්ල සෑම ශාඛාවකම ප්‍රදර්ශනය කර ඇති ඇමතුම් විස්තර ඔස්සේ මූල්‍ය ඔම්බුඩ්ස්මන් වෙත ඉදිරිපත් කළ හැක.

මීට අමතරව, අපගේ පැය 24 ම විවෘත ගනුදෙනුකාර සේවා ක්ෂණික ඇමතුම් අංකය හා ගනුදෙනුකාර පැමිණිලි හැසිරවීමේ ඒකකය මගින් සියලුම දුක්ගැනවිලි වාර්තා කොට නිශ්චිත කාල සීමාවක් ඇතුළත ඒවාට ප්‍රතිචාර දක්වනු ලබන බව සහතික කෙරේ. අදාළ දුක්ගැනවිලි විමර්ශනය කොට ප්‍රතිචාර දැක්වීමේ වගකීම ප්‍රාදේශීය කළමනාකාර වෙත පැවරේ. බැංකුවේ සේවකයන් සම්බන්ධයෙන් පුන පුනා ඉදිරිපත් වන පැමිණිලි හෝ දුක්ගැනවිලි වේ නම් ඒවා සමාලෝචනය හා නිසි පියවර ගැනීම උදෙසා අභ්‍යන්තර විමර්ශන හා පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කෙරේ. ගනුදෙනුකරුවන් වෙතින් ලැබෙන පැමිණිලි මාසික ශාඛා කළමනාකාරවරුන්ගේ සම්මන්ත්‍රණයේදී සේවකයන් වෙත දැනුම් දෙන අතර අදාළ සිදුවීම් නැවත නැවත සිදු වීම වැළැක්වීම සඳහා අනුගමනය කළ යුතු නිවරදකරණ පියවර එහිදී නිර්දේශ කෙරේ.

ටෙලර් යන්ත්‍ර බිඳවැටීම් සම්බන්ධයෙන් ඉදිරිපත් වන පැමිණිලි විමර්ශනය කිරීම මධ්‍යම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පාලන දෙපාර්තමේන්තුව විසින් සිදු කෙරේ. සෑම බිඳවැටීමක්ම අදාළ ශාඛාව වෙත දැනුම් දීමෙන් අනතුරුව සාධාරණ කාලයක් ඇතුළත නිසි පියවර ගැනීම සහතික කිරීම සඳහා කඩිනම් යාන්ත්‍රණයක් පිහිටුවා තිබේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2019 වසරේදී බිඳවැටුණු මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාවෙහි කැපී පෙනෙන අඩුවීමක් දක්නට ලැබේ.

මෙහි සමාලෝචිත වසර තුළදී ගනුදෙනුකරුවන්ගෙන් ඉදිරිපත් වන පැමිණිලි අවම කිරීම උදෙසා නිෂ්පාදන හා සේවා සම්බන්ධයෙන් සේවකයන් 1361 දෙනෙකු පුහුණු කරන ලදි.

### 2019 වසරේදී ගනුදෙනුකරුවන් වෙතින් ලැබුණු පැමිණිලිවල විස්තර

| විස්තර | සංඛ්‍යාව |
|---|---|
| ගනුදෙනුකරුවන් වෙතින් ලද පැමිණිලි සංඛ්‍යාව | 316 |
| විසඳන ලද ගනුදෙනුකාර පැමිණිලි සංඛ්‍යාව | 204 |
| **විසඳීමට ඇති පැමිණිලි** | |
| විමර්ශන අවසන් නොමැති | 09 |
| නීතිමය කටයුතු සිදුකෙරෙමින් පවතින | 04 |
| සිදුකෙරෙමින් පවතින | 99 |

GRI 416.1, 416.2

## ගනුදෙනුකරුවන්ගේ සෞඛ්‍යය හා සුරක්ෂිතතාව

අප නියැළී සිටින ව්‍යාපාරයේ ස්වභාවය හේතුවෙන් ගනුදෙනුකරුවන් වෙත සිදු විය හැකි බලපෑම් පහසුවෙන් තක්සේරු කිරීමට නොහැකි වුවද ඔවුන්ගේ සෞඛ්‍යය හා සුරක්ෂිතතාව කෙරෙහි සිදු විය හැකි කවරාකාරයක හෝ අහිතකර බලපෑම් අවම කළ හැකි පරිදි අපගේ සේවා හා නිපැයුම් සැලසුම් කිරීමට හැකි උපරිම උත්සාහය දැරීමට අපි කිසිවිටෙකත් පසුබට නොවන්නෙමු. ආයුධ සහිත හා රහිත ආරක්ෂක නිලධාරීන් විසින් ආරක්ෂාව ලබා දෙන අපගේ සියලුම ශාඛාවන්හි ගිනිගැනීම් වැනි සිදුවීමකදී ප්‍රයෝජනයට ගැනීමට හදිසි පිටවීමේ මාර්ග ඇති අතර ගිනි අනතුරු හඟවන නලා පද්ධති සවිකොට ඇත.

ගනුදෙනුකරුවන් විසින් අපගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, ස්වයං-බැංකුකරණ ඒකක හෝ අන්තර්ජාලය පාදක බැංකුකරණ අවකාශ යන මේ කවර මාර්ගයක් හෝ ඔස්සේ සිය ගනුදෙනු කටයුතු සිදු කිරීමේදී ඔවුන් සඳහා සුරක්ෂිත පරිසරයක් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියලුම විධිවිධාන අප විසින් ක්‍රියාත්මක කොට තිබේ. ගනුදෙනුකරුවන් භෞතික වශයෙන් ගැවසෙන අපගේ සේවා මධ්‍යස්ථානවලද ජාතික ආරක්ෂක රෙගුලාසිවලට අනුකූලව සුරක්ෂිතතා විධිවිධාන සලසා තිබේ. මේ සියලු විධිවිධාන සලසා ඇත්තේ පැය 24 පුරාවටම නිරීක්ෂණ කටයුතු සඳහා යොදා ගැනෙන සීසීටීවී නිරීක්ෂණ කැමරා පද්ධතිවලද අමතරව වේ.

## වංචා වැළැක්වීම

වංචාකාරී ක්‍රියා වැළැක්වීම උදෙසා අප විසින් ද්විත්ව පාලන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කර ඇති අතර ඒයට අනුව සෑම ගනුදෙනුවක්ම යටත් පිරිසෙන් ස්වාධීන කළමනාකාරවරුන් දෙදෙනෙකු විසින් පරීක්ෂා කොට අනුමත කිරීමකට ලක් කෙරේ. සෑම ශාඛාවකටම අදාළ විගණන දෙපාර්තමේන්තු හා බැංකුවේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ඒවායෙහි කටයුතු විගණනය කරනු ලැබෙන්නේ වාර්ෂිකව සිදු කෙරෙන බාහිර හා ශ්‍රී ලංකා මහ බැංකුවේ විගණනයට වැඩිමනත් වශයෙනි.

නිරන්තරයෙන් වර්ධනය වන අන්තර්ජාල පාදක ගනුදෙනු සංඛ්‍යාව නිරීක්ෂණය කරනු පිණිස සේවකයන් 200 කට අධික කාර්ය මණ්ඩලයකින් යුතු වෙනම විගණන අංශයක් පිහිටුවා තිබේ.

GRI 418.1

## ගනුදෙනුකරුවන්ගේ රහස්‍යභාවය

ඉතාම පුළුල් පරාසයක ගනුදෙනු ඔස්සේ ඒකරාශී වන සංවේදී තොරතුරු අති සම්භාරයක් සමග කටයුතු කරන්නට අපට සිදු වන අතර මෙය සැලකිල්ලට ගනිමින් ගනුදෙනුකරුවන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරමින් ඉහළම රහස්‍යතා ප්‍රමිතීන් පවත්වා ගනු පිණිස දැඩි විධිවිධාන අප විසින් ක්‍රියාත්මක කොට ඇත. ගනුදෙනුකරුවන්ගේ රහස්‍ය දත්ත නිරතුරුවම සුරක්ෂිත කෙරෙන බව සහතික කිරීම උදෙසා අපගේ තොරතුරු තාක්ෂණ හා සයිබර් ආරක්ෂණ ක්‍රමවේදය සවිමත් කිරීම වෙනුවෙන් තවදුරටත් ආයෝජන සිදු කිරීමට අපි කටයුතු කරන්නෙමු. කලින් කලට තොරතුරු තාක්ෂණය ආශ්‍රිත අවදානම් තක්සේරු කිරීම්, ජාල වැඩිදියුණු කිරීම්, තුන්වැනි පාර්ශ්ව හරහා සිදු කරනු ලැබෙන තොරතුරු තාක්ෂණ විගණනයන් සහ තොරතුරු තාක්ෂණ ආරක්ෂාවට අදාළව සේවකයන් පුහුණු කිරීම ආදිය මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කර ඇති පාලන ක්‍රමවේද අතරට ඇතුළත් වේ. මෙහි සමාලෝචනයට ලක් කෙරෙන වසරේදී ගනුදෙනුකරුවන්ගේ රහස්‍යතාව කඩ කිරීම හේතුවෙන් කිසිදු අනුකූලතාවක් වාර්තා වී නොමැත.

## තහනම් කර ඇති හෝ ආරාවුලට තුඩුදුන් නිෂ්පාදන අලෙවිය

ශ්‍රී ලංකා මහ බැංකුවේ විධිවිධානවලට දැඩි අනුකූලතාව දක්වමින් ක්‍රියාත්මක වන මහජන බැංකුව කිසිවිටෙකත් වෙළෙඳපොළෙහි තහනම් කර ඇති හෝ පාර්ශ්වකරුවන් හෝ මහජනතාව අතර ආරාවුලට හේතු වී ඇති නිෂ්පාදන හෝ සේවාවන් කිසිවක් අලෙවි කිරීමෙහි හෝ ලබා දීමෙහි නිරත වන්නේ නැත. අපගේ ණය ප්‍රතිපත්තිය තුළ නීතිවිරෝධී ලෙස සඳහන් කර ඇති කිසිදු නීති විරෝධී නිෂ්පාදනයක් සඳහා මූල්‍ය පහසුකම් සැලසීමෙන්ද අපි වැළකී සිටින්නෙමු. තහනම් කරන ලද හෝ ආරාවුලට තුඩුදුන් නිෂ්පාදන අලෙවිය හේතුවෙන් අනුකූලතා මතු වූ කිසිදු සිදුවීමක් මෙහි සමාලෝචිත වසර තුළදී වාර්තා නොවීය.

## ඉදිරි දැක්ම

අපගේ සියලු ගනුදෙනුකරුවන් ඩිජිටල් බැංකුකරණ නාලිකා වෙත හුරු කිරීම සඳහා අපි ඉදිරියටත් ප්‍රයත්න දරන්නෙමු. ශ්‍රී ලංකාව තුළ ඉහළම ගනුදෙනුකාර පදනම සහිත බැංකුව වශයෙන් ඩිජිටල් තාක්ෂණයෙන් සවිගැන්වුණු මූල්‍ය විසඳුම් ඔස්සේ මෙරට පුරවැසියන් මූල්‍යමය වශයෙන් දැනුම්වත් කිරීම හා සවිබල ගැන්වීම අපගේ නිරන්තර උත්සාහයයි. සෑම කල්හිම අසමසම ගනුදෙනුකාර අත්දැකීමක් තිළිණ කිරීම තුළින් පාරිභෝගික සේවා කඩයිම් ඉක්මවා සාර්ථක වීමට අපි ඉදිරියටත් කටයුතු කරන්නෙමු.

## ව්‍යාපාරික හවුල්කාර ප්‍රාග්ධනය

### වැදගත් සිදුවීම්

අනුරූප බැංකු 29 ක් සහ වොස්ට්‍රෝ නියෝජිතයන් **40** ක් සමග වසර 20 කට අධික සවිමත් සබඳතාවන්

සැපයුම්කරුවන් සඳහා නිර්මාණය කළ වටිනාකම රු. බිලියන **12.2** ක්

දේශීය සැපයුම්කරුවන් සඳහා නිර්මාණය කළ වටිනාකම් ප්‍රතිශතය **90.5%**

අපගේ බැංකුවේ වටිනාකම නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය සඳහා අත්‍යවශ්‍ය අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ අපගේ නිරන්තර සහභාගිත්වය සහ ශක්තිමත් සම්බන්ධතා අපි අගය කරමු.

### අපගේ ව්‍යාපාරික සහකරුවන්

| | |
|---|---|
| ව්‍යාපාරික වර්ධන හවුල්කරුවන් | • අනුරූප බැංකු<br>• වොස්ට්‍රෝ නියෝජිතයන්<br>• වෙළෙඳ හවුල්කරුවන්<br>• රාජ්‍ය ආයතන |
| සැපයුම්කරුවන් | • උපයෝගිතා සේවා සපයන්නන්<br>• අමුද්‍රව්‍ය සපයන්නන්<br>• ස්ථාවර වත්කම් සපයන්නන්<br>• ප්‍රවාහන සැපයුම්කරුවන් |
| නඩත්තු සහකරුවන් | • මෘදුකාංග සැපයුම්කරුවන්<br>• අපද්‍රව්‍ය කළමනාකරණය<br>• සන්නිවේදනය<br>• මානව සම්පත් සැපයුම්කරුවන් |
| වෙනත් | • කොන්ත්‍රාත්කරුවන්<br>• පරිශ්‍ර සැපයුම්කරුවන්<br>• වෙනත් |

### ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධන සංඛ්‍යාලේඛන

| දෙසැම්බර් 31 දිනට | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| ලියාපදිංචි සැපයුම්කරුවන් සංඛ්‍යාව | 242 | 383 | 662 | 363 | 217 |
| අනුරූප බැංකු සංඛ්‍යාව | 42 | 43 | 46 | 49 | 49 |
| වොස්ට්‍රෝ නියෝජිතයන් සංඛ්‍යාව | 71 | 73 | 72 | 70 | 71 |
| සැපයුම්කරුවන්ට ගෙවීම් (රු. බිලියන) | 12.2 | 12.8 | 11.2 | 8.6 | 7.2 |

### තිරසාර සංවර්ධන අරමුණු සමග (SDGs) පෙළ ගැසීම

| | |
|---|---|
| 5 GENDER EQUALITY | විවිධ ස්ථරවල තීරණ ගැනීමේදී නායකත්වය ලබා දීමට කාන්තාවන්ට එලදායීව සහභාගි වීමට අපි අවස්ථාව සලසා දෙන්නෙමු. |
| 8 DECENT WORK AND ECONOMIC GROWTH | පරිසරයට හානි ඇති නොකරන ආර්ථිකය උත්තේජනය කරන සුදුසු රැකියා ඇති කිරීම සඳහා ජනතාවට ඉඩ ලබාදෙන කොන්දේසි අපි නිර්මාණය කරමු. |
| 11 SUSTAINABLE CITIES AND COMMUNITIES | නිෂ්පාදකයාගේ සිට අවසන් පාරිභෝගිකයා දක්වා සියලුම දෙනා සම්බන්ධ කරන තිරසාර සැපයුම් දාම අපි ක්‍රියාත්මක කරමු. |
| 17 PARTNERSHIPS FOR THE GOALS | අපගේ පාර්ශ්වකරුවන් සඳහා හුවමාරු වටිනාකම නිර්මාණය කිරීමට විවිධ ව්‍යාපාර හවුල්කරුවන් සමඟ අපි සහයෝගයෙන් කටයුතු කරමු. |

GRI 204-1

### අපගේ ව්‍යාපාර හවුල්කාර ප්‍රාග්ධනය කළමනාකරණය

ව්‍යාපාර හවුල්කරුවන් අපගේ ව්‍යාපාර මෙහෙයුම්වල පහසු ක්‍රියාකාරිත්වය සඳහා අත්‍යවශ්‍යය. වසර ගණනාවක් පුරා, අපගේ වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය තුළ වැදගත් කාර්යභාරයක් ඉටුකරන ව්‍යාපාර හවුල්කරුවන් රාශියක් සමඟ දීර්ඝ කාලීන සම්බන්ධතා අපි සාර්ථකව පෝෂණය කර ඇත. කර්මාන්තයේ සියලුම රෙගුලාසිවලට, අපගේ ව්‍යාපාර ක්‍රියාපටිපාටිවල විනිවිදභාවය, සදාචාර ව්‍යාපාර ව්‍යවහාරවලට දැඩිව අනුකූල වීම තුළින් සහ කාලීන ආකාරයකින් අපගේ ණය බැඳීම් මුදාහැරීම තුළින්, අපි අඛණ්ඩවම හුවමාරු වටිනාකම නිර්මාණය කරමු. වසර තුළ, 355කට වැඩි ව්‍යාපාර හවුල්කරුවන් සමඟ අපි සහයෝග යෙන් කටයුතු කළ අතර, ඇස්තමේන්තුගත රු.බි.12.2ක වටිනාකම අපි නිර්මාණය කළෙමු. 2019 වසර තුළ දේශීය සැපයුම්කරුවන්ට බෙදාහැරි මුළු වටිනාකම රු.බි. 11.0ක් වන අතර නිර්මාණය කළ වටිනාකමින් 90% කටත් වැඩිපුර ප්‍රමාණයක් දේශීය මූල්‍ය සහිත සැපයුම්කරුවන් සඳහා විය.

GRI 102-9

## සැපයුම් දාම කළමනාකරණය

පිරිවැය ප්‍රශස්ථකරණය තුලින් සහ උසස් තත්ත්වයේ ප්‍රමිති පවත්වා ගනිමින් ආර්ථිකය සහ ප්‍රසම්පාදනයේ කාර්යක්ෂමතාව උපරිම කිරීමට අපි උත්සාහ ගනිමු. සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමත ටෙන්ඩර් ක්‍රියාපටිපාටියක් අනුගමනය කරමු. සෑම වසරකදීම, තත්ත්වය, විශ්වාසනීයත්වය සහ අනුකූලතා අවශ්‍යතා ඇතුළත් දැඩි නිවාරක ක්‍රියාවලියක් මගින් අනුගමනය කරන ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවමින් නව සැපයුම්කරුවන් ලියාපදිංචි කෙරේ. මෙයට, අනෙකුත් කරුණු අතර පාරිසරික සහතික කිරීම් සහ මධ්‍යම පරිසර අධිකාරියේ (CEA) රෙගුලාසි, ළමා ශ්‍රමය සහ බලහත්කාර ශ්‍රමය පිළිබඳ අවදානම සඳහා අනුකූලතාව ඇතුළත්ය. වසර තුළ, ළමා ශ්‍රමය/බලහත්කාර හෝ අනිවාර්ය ශ්‍රමය හා සැලකියයුතු අවදානමක් තිබූ සැපයුම්කරුවන් මෙහෙයුම් තුළ අපි හඳුනා ගෙන නොමැත.

වසර තුළ අපගේ සැපයුම් දාමය වැඩිදියුණු කිරීම් කිහිපයක් සිදුකරන ලදී. යන්ත්‍ර නඩත්තු කිරීම ඇතුළුව සියලුම ස්ථාවර වත්කම් කළමනාකරණය කිරීම සඳහා නව ස්ථාවර වත්කම් තොග ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. ස්ථාවර වත්කම් නඩත්තුව තුළ වැඩිකළ කාර්යක්ෂමතාව ඉදිරියට ගෙන යමින් අපගේ සමස්ත ශාඛා ජාලය මෙම ක්‍රමයට සම්බන්ධ කෙරේ. ප්‍රවාහන භාවිතය ප්‍රශස්ථකරණය සඳහා GPRS තාක්ෂණය භාවිතය තුළින් මෝටර් රථ පසුවිපරම් ක්‍රමයක්ද ක්‍රියාවට නංවන ලදී.

හඳුනාගනු ලබන වැදගත් මාතෘකා පාර්ශ්වකාර බැඳියාවන්ට සිදුවියහැකි ව්‍යාපාර බලපෑමේ තත්ත්වයට අදාළව ඒවායේ ස්ථානය පහත අනුකෘති මත සිතියම්ගත කෙරේ. මෙම මාතෘකා එකිනෙකට සම්බන්ධ වන බැවින් සහ එකක වෙනසක් අනෙකට බලපෑමක් තිබිය හැකි බැවින් හුදකලාව සමාලෝචනය නොකළ යුතුය.




## ව්‍යාපාර හවුල්කාර සම්බන්ධතා

අනුරූප බැංකු 29ක් සහ වෙස්ට්‍රෝ නියෝජිතයින් 40ක් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ශක්තිමත් සම්බන්ධතා අපි පවත්වා ගෙන ඇත. මෙවැනි සම්බන්ධතාවයන්ගෙන් බොහෝමයක් අන්‍යෝන්‍ය විශ්වාසය මත පදනම් වී වසර 22කට වැඩි කාලයක් පුරා පවතී.




| | සම්බන්ධතාවයේ කාලසීමාව (අවුරුදු) | | | | |
|---|---|---|---|---|---|
| | <1 | 1-5 | 5-10 | 10-20 | >20 |
| අනුරූප බැංකු ගණන | 0 | 1 | 5 | 7 | 29 |
| වෙස්ට්‍රෝ නියෝජිතයින් ගණන (බැංකු/හුවමාරු සමාගම්) | 3 | 10 | 2 | 16 | 40 |

GRI 102-13

## ක්ෂේත්‍රයේ සංවිධාන සමඟ සාමාජිකත්වය:

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ රාජ්‍ය බැංකුවක් ලෙස, ගැටළුසහගත ක්ෂේත්‍ර හඳුනාගනිමින් සහ විසඳුම් සොයමින් අපගේ ජාතියේ සමාජීය සහ ආර්ථික වර්ධනය උදෙසා අපි අඛණ්ඩව කටයුතු කරමින් සිටිමු. ප්‍රතිපත්ති සම්පාදකයින්ට නිර්දේශ සහය ලබාදීමට සහ ක්ෂේත්‍රයේ සහ ජාතික සංවර්ධනයට සහයවීම සඳහා අධ්‍යයන සහ විශ්ලේෂණ සිදුකිරීම පිළිබඳ අපගේ වගකීම අපි භාරගනිමු.

මෙම අදහස පෙරදැරිව, අපි පහත සඳහන් ආයතනවල සාමාජිකයින් වෙමු:

- ආසියා ශාන්තිකර ග්‍රාමීය සහ කෘෂිකාර්මික ණය සංගමය
- ශ්‍රී ලංකාවේ බැංකු අනුකූලතා නිලධාරීන්ගේ සංගමය
- සීමාසහිත ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් (සහතිකත්ව) සමාගම
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- ලංකා වාණිජ මණ්ඩලය
- සීමාසහිත ශ්‍රී ලංකා බැංකු (සහතිකත්ව) සමාගම
- ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ අවදානම් වෘත්තිකයින්ගේ සංගමය
- බැංකුකරුවන්ගේ නිශ්කාෂණ සංගමය
- ශ්‍රී ලංකා සේවය සම්මේලනය
- ප්‍රාථමික වෙළඳ සංගමය

# සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

## සදාචාර ව්‍යාවහාර

රජයේ රෙගුලාසිවලට අනුව අපගේ ප්‍රසම්පාදන සංග්‍රහයට අනුකූලව විනිවිද ටෙන්ඩර් ක්‍රියාපටිපාටියක් අපි අනුගමනය කරමු. අපගේ සැපයුම්කරුවන් ට අදාළ වන්නා වූ සියලුම තොරතුරු උපරිම රහස්‍යතාවයෙන් සලකනු ලැබේ. පාරිසරික සහ සමාජීය ගැටළු අපගේ ප්‍රසම්පාදන ක්‍රියාවලියට එකතු කරනු ලැබ ඇත. එමෙන්ම අපගේ සැපයුම්කරුවන්,  කොන්ත්‍රාත්කරුවන්, සහ උපදේශකවරුන් ඉහළ තත්ත්වයේ සදාචාර ප්‍රමිති පවත්වා ගැනීම අවශ්‍යවන අතර අපගේ සැපයුම්කරුවන්ට නියමිත වේලාවට ගෙවීම් කරන බවට අපි සහතික වෙමු.

## අනාගත දැක්ම

අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ සම්බන්ධතා ශක්තිමත් කිරීම අපි තවදුරටත් සිදුකරන අතර සදාචාර ව්‍යාපාර ව්‍යවහාර අපි අනුගමනය කරමු. විමධ්‍යගත ලිපිද්‍රව්‍ය පාලන ක්‍රමයක් සහ දේපල කළමනාකරණය සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් ඉදිරි වසරේදී හඳුන්වා දෙනු ලැබේ. එමෙන්ම බැංකුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට අපගේ ප්‍රසම්පාදන සංග්‍රහය සමාලෝචනය කිරීමට අපි සැලසුම් කරමු. අපගේ සැපයුම්කරුවන් සමඟ අපගේ සම්බන්ධතා හඳුනාගැනීමට සහ ඉහළ නැංවීමට සැපයුම්කාර දිනයක් කැඳවනු ලැබේ.

## ආයෝජක ප්‍රාග්ධනය

### වැදගත් සිදුවීම්

කොටස්හිමියන්ට ගෙවූ ලාභාංශ රු.මි. **2,420**

**4.1%** කින් කොටසකට ශුද්ධ වත්කම් වැඩිවී ඇත

### ආයෝජන ප්‍රාග්ධන සංඛ්‍යා ලේඛන

| දෙසැම්බර් 31 දිනට | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| කොටසක ඉපයීම් (රු) Net | 12,926 | 17,095 | 18,250 | 14,995 | 12,598 |
| කොටසකට වත්කම් (රු) | 94,964 | 91,210 | 77,457 | 59,649 | 49,495 |
| වත්කම් මත ඉපයීම (%) | 1.1 | 1.5 | 1.9 | 1.7 | 1.8 |
| ස්කන්ධය මත ඉපයීම (%) | 13.9 | 20.3 | 26.6 | 27.5 | 27.1 |

**වත්කම් මත ඉපයීම සහ ස්කන්ධය මත ඉපයීම්**




## ආයෝජක ප්‍රාග්ධනය කළමනාකරණය

ආයෝජකයින් විසින් බැංකුවේ වටිනාකම නිර්මාණ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය ලබා දෙන අතර ඔවුන් බැංකුවේ වැදගත් පාර්ශ්වකරුවන් වෙති. ඔවුන්ගේ ආයෝජනය සඳහා ප්‍රශස්ථ ප්‍රතිඵල ඔවුන් අපේක්ෂා කරන අතර, තිරසාර සහ විචක්ෂණ වර්ධනය මගින් වැඩිකළ ප්‍රතිඵල ලබාදීමට අපි අඛණ්ඩව උත්සාහ ගනිමු. එමෙන්ම බැංකුවේ මෙහෙයුම් ප්‍රතිඵල, මූල්‍ය තත්ත්වය සහ මුදල් ප්‍රවාහ පිළිබඳ කාලීන, අදාළ සහ සමබර දැක්මක් ඉදිරිපත් කරමින් අපගේ මෙහෙයුම් තුළ ඉහළ තත්ත්වයේ අවංකකම සහ විනිවිදභාවය අපි පවත්වා ගනිමු. බැංකුව කෙරෙහි ආයෝජන විශ්වාසය ඉහළ නැංවීමට මෙය අපට සහය වේ.

## කොටස් හිමියන්ගේ විස්තර

අපගේ ප්‍රධාන කොටස්හිමියා වන්නේ කොටස්වලින් 92.3%ක් දරන ශ්‍රී ලංකා රජය වන අතර ඉතිරිය වන 7.7% සමූපකාර සමිති විසින් දරනු ලබයි.

2005 සිට 2006 දක්වා කාලය තුළ සහ 2017 දී, මුදල් අමාත්‍යංශයේ මහා භාණ්ඩාගාරය නව ප්‍රාග්ධනය ලෙස මහජන බැංකුව තුළ රු.මි. 12,152ක එකතුවක් ඇතුළත් කරන ලදී. මෙම ප්‍රමාණ නව කොටස් නිකුත් කිරීමට සහ ප්‍රාග්ධන ගිණුම තුළ ගෙවූ කොටස් මාරු කිරීමට අදාළවන නියමයන් පිළිබඳ බැංකුවේ ප්‍රාග්ධනය අපේක්ෂිත වෙන්කිරීම/පවරන ප්‍රාග්ධන ගිණුම් අපේක්ෂිත තීරණය තුළ දරන ලදී. එහි තීරණය මත, මුදල් අමාත්‍යංශයේ මහා භාණ්ඩාගාරය මහජන බැංකුවට 99.97%ක් අයත්වන අතර සමූපකාර සමාගම්වලට 0.03%ක් අයිති වේ.

## එකතුකළ ආර්ථික වටිනාකම (EVA)

එකතුකළ ආර්ථික වටිනාකම යනු සමාගමේ කොටස්හිමියන් සඳහා අවශ්‍ය ප්‍රතිඵල ඉක්මවන සැබෑ ආර්ථික ලාභයයි. ප්‍රාග්ධනයේ කාර්යක්ෂම භාවිතය සහ වඩා ඉහළ ලාභ උත්පාදනය තුළින් අපගේ කොටස්හිමියන්ට ප්‍රශස්ත වටිනාකම ලබාදීමට අපි තවදුරටත් බැඳී සිටිමු. 2019 දී නිර්මාණය කළ එකතුකළ ආර්ථික වටිනාකම රු.බි. 32.7ක් විය.

| දෙසැම්බර් 31 දින අවසන් වූ | 2019 රු. '000 | 2018 රු. '000 | වෙනස % |
|---|---|---|---|
| **ආයෝජන ස්කන්ධ** | | | |
| ආයෝජිත ස්කන්ධ | 94,964,440 | 91,209,925 | 4.1 |
| එකතු කළා: ණය අලාභ සඳහා සමුච්චිත වෙන්කිරීම/හානිකරණය සඳහා වෙන්කිරීම | 73,640,997 | 68,752,793 | 7.1 |
| **එකතුව** | 168,605,437 | 159,962,718 | 5.4 |
| **ඉපැයුම්** | | | |
| බදු වලින් පසු ලාභය | 12,925,683 | 17,094,922 | -24.4 |
| එකතු කළා: ණය අලාභ සහ වෙන්කිරීම්/හානිකරණය සඳහා වෙන්කිරීම | 5,798,646 | 2,623,970 | 121.0 |
| අඩු කළා: කපා හරින ලද ණය | (95,638) | (160,306) | -40.3 |
| **එකතුව** | 18,628,691 | 19,558,586 | -4.8 |
| ස්කන්ධ වල පිරිවැය (මාස 12 බර තබන ලද සාමාන්‍යය භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකය අවදානම් වාරිකය සඳහා + 2%) | 8.6% | 10.9% | |
| **සාමාන්‍යය ස්කන්ධ පිරිවැය** | 14,095,574 | 16,296,829 | -13.5 |
| **එකතු කරන ලද ආර්ථික අගය** | 32,724,265 | 35,855,415 | -8.7 |

# සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

GRI 201-1

## උත්පාදනය කරන ලද සෘජු ආර්ථික වටිනාකම සහ බෙදාහැරීම

උත්පාදනය කරන ලද සෘජු ආර්ථික වටිනාකම සහ බෙදාහැරීම මගින් බැංකුව විසින් පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් නිර්මාණය කරන ලද ආකාරය නිරූපනය වේ. පහත දැක්වෙන වගුව මගින් පසුගිය වසර පහ ඇතුළත ශ්‍රී ලංකා ආර්ථිකය වෙත බැංකුවේ දායකත්වය ඉදිරිපත් කෙරේ.

| දෙසැම්බර් 31 දින අවසන් වූ වසර සඳහා | 2014<br>රු. '000 | 2015<br>රු. '000 | 2016<br>රු. '000 | 2017<br>රු. '000 | 2018<br>රු. '000 | 2019<br>රු. '000 | වර්ධනය % 2019 vs 2018 |
|---|---|---|---|---|---|---|---|
| **ආදායම් මූලයන්** | | | | | | | |
| පොළිය | 84,479,961 | 92,485,979 | 109,970,256 | 149,184,471 | 166,441,208 | 184,024,838 | 10.6 |
| හුවමාරු | 1,598,506 | 3,050,646 | 2,572,743 | 2,119,499 | 6,016,099 | 800,416 | -86.7 |
| කොමිස් හා ගාස්තු | 3,820,242 | 3,712,146 | 3,948,052 | 5,132,907 | 6,956,292 | 7,336,594 | 5.5 |
| ප්‍රාග්ධන ලාභය | 1,042,108 | 305,011 | 531,921 | 125,763 | 162,923 | 329,071 | 102.0 |
| වෙනත් | 5,436,664 | 4,095,182 | 5,091,388 | 4,272,751 | 1,707,356 | 4,548,686 | 166.4 |
| **එකතුව** | 96,377,482 | 103,648,964 | 122,114,360 | 160,835,391 | 181,283,878 | 197,039,605 | 8.7 |
| **ආදායම් භාවිත කිරීම** | | | | | | | |
| තැන්පත්කරුවන් වෙත පොලී වශයෙන් | 54,362,126 | 48,731,974 | 66,845,869 | 98,718,636 | 111,034,922 | 125,507,699 | 13.0 |
| සේවකයින් හට පාරිශ්‍රමික වශයෙන් | 14,005,555 | 17,377,025 | 13,633,514 | 14,738,069 | 19,504,835 | 19,226,233 | -1.4 |
| භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් වෙත | 7,414,998 | 7,160,999 | 8,588,379 | 11,168,408 | 12,822,211 | 12,153,293 | -5.2 |
| මූල්‍ය වත්කම් මත ශුද්ධ හානිකරණ අලාභය | (1,430,440) | 3,739,914 | 1,246,748 | 1,348,460 | 2,623,970 | 5,798,646 | 121.0 |
| රජය වෙත- බදු, විශේෂ බදු හා ලාභාංශ | 14,125,646 | 16,834,192 | 20,515,560 | 20,522,887 | 19,814,596 | 19,817,027 | 0.0 |
| ප්‍රජාව වෙත | 24,675 | 39,461 | 40,269 | 56,317 | 42,288 | 35,683 | -15.6 |
| වර්ධනය සඳහා රඳවාගත් | 7,874,923 | 9,765,398 | 11,244,022 | 14,282,614 | 15,441,056 | 14,501,024 | -6.1 |
| **එකතුව** | 96,377,482 | 103,648,964 | 122,114,360 | 160,835,391 | 181,283,878 | 197,039,605 | 8.7 |

*සටහන ෑ ඉහත දැක්වෙන සංඛ්‍යා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS) මත පදනම්ව පිළියෙල කරන ලද විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ගෙන් උපුටා ගන්නා ලදී.*

## ලාභාංශ ගෙවීම සහ ලාභාංශ ප්‍රතිපත්තිය

බැංකුවේ ලාභාංශ ප්‍රතිපත්තිය කොටස්හිමියන්ගේ ප්‍රතිඵල සහ බැංකුවේ දිගුකාලීන ව්‍යාපාර පුළුල්කිරීම යන දෙකටම සහය වේ. අපගේ කොටස්හිමියන්ට අඛණ්ඩ ලාභාංශ ප්‍රවාහයක් ගෙවීමට අපි උත්සාහ ගනිමු. 2019 වසර සඳහා ලාභාංශ ගෙවීම රු.මි. 2,420ක් විය.

## අනාගත දැක්ම

වැඩිකළ ලාභාංශ උත්පාදනය කරමින්, ආකර්ෂණීය මූල්‍ය ප්‍රතිඵල ලබාදෙමින් සහ රජයට වර්ධනය සඳහා දායක වෙමින්, තිරසාර සහ විචක්ෂණ වර්ධනය තුළින් කොටස්හිමියන්ගේ ධනය අපි අඛණ්ඩව නිර්මාණය කරමු.

## ප්‍රජා ප්‍රාග්ධනය

### වැදගත් සිදුවීම්

ප්‍රජා සංවර්ධනය සඳහා ලබාදුන් අරමුදල රු.මි.

**35.7**

**දේශීය ආර්ථික සංවර්ධනය** සඳහා යටිතලපහසුකම් සංවර්ධනය, අධ්‍යාපනය, කලාව සහ සංස්කෘතිය සහ පාරිසරික ව්‍යාපෘති තුළින් ප්‍රජා සංවර්ධනය

ලබාදෙන ලද ප්‍රජා-පදනම් සංවර්ධන ණය රු.බි.

**8.4**

ශ්‍රී ලංකාව තුළ ප්‍රමුඛ රාජ්‍ය බැංකුවක් ලෙස, ප්‍රජාව ආර්ථිකමය වශයෙන් ශක්තිමත් කරමින් සහ ස්ථාවරත්වය ගොඩ නගමින් ඔවුන්ගේ සමාජ ආර්ථික ප්‍රගතියට අපි සහය වෙමු.

### ප්‍රජා ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම

අපගේ තිරසාර ප්‍රතිපත්තිය අනුව ගමන් කරමින්, අපගේ ආයතනික සමාජ සත්කාරක (CSR) වැඩසටහන් තුළින් දේශිය ප්‍රජාවන්ගේ ජීවිත ස්පර්ශ කිරීමට මූල්‍ය අන්තර්කරණය කරා අපි ලඟා වෙමු. අපගේ ව්‍යාපාරයේ අරමුණු ව්‍යාපාර සාර්ථකත්වය අත්කර ගනිමින් වටිනාකම නිර්මාණය කිරීමට සමාජ සත්කාරක වැඩසටහන් තුළින් සමාජීය සහ පාරිසරික ප්‍රතිෂ්ඨාවන් සමඟ සම්බන්ධ කෙරේ. මෙවැනි වැඩපියවර තුළින්, දේශිය ප්‍රජාවන්ට එලදායී බලපෑමක් සහ ප්‍රමාණනය කළහැකි දායකත්වයක් සිදු කිරීමට අපි උනන්දු වෙමු. මුදල් ලබාදෙමින්, රැකියා අවස්ථා ඇතිකරමින් සහ පුහුණු සහ සංවර්ධනය තුළින් හැකියාවන් සංවර්ධනය කිරීම මගින් ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වයන් අපි නගා සිටවමු. වරප්‍රසාද අඩුවෙන් ඇති ප්‍රජාවන් නගා සිටුවීම සඳහා අපගේ බැඳීම කලාව සහ සංස්කෘතිය, සෞඛ්‍යාරක්ෂව සහ අධ්‍යාපනය සංවර්ධනය කිරීම මගින් කරගෙන යනු ලබයි.

### ප්‍රජා ප්‍රාග්ධනය පිළිබඳ සංඛ්‍යා ලේඛන

| දෙසැම්බර් 31 දිනට | 2019 | 2018 | 2017 |
|---|---|---|---|
| CSR හි ආයෝජනය (රු.මි.) | 35,683 | 42,288 | 56,317 |
| ප්‍රජාව පදනම් සංවර්ධන ණය (ගණන) | 71,927 | 42,511 | 51,375 |
| ප්‍රජාව පදනම් සංවර්ධන ණය (රු.මි.) | 8,382.7 | 9,017.6 | 10,479.2 |

### තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සමඟ පෙළගැසීම

| | |
|---|---|
| 1 NO POVERTY | මූල්‍යකරණය. අධ්‍යාපනය, සහ රැකියා අවස්ථා නිර්මාණය |
| 2 ZERO HUNGER | සුළු පරිමාණ ගොවීන් සඳහා මූල්‍යකරණය ලබාදීම තුළින් කෘෂිකාර්මික ඵලදායිතාව වැඩි කිරීම |
| 3 GOOD HEALTH AND WELL-BEING | කාර්යක්ෂම මූල්‍යකරණය තුළින් සහ ක්‍රීඩා උත්සව තුළින් ප්‍රජාවන්ගේ සෞඛ්‍ය සහ සුභසාධනය වැඩි කරමින් සෞඛ්‍ය ක්‍රම වැඩි කිරීම |
| 4 QUALITY EDUCATION | පාසල් ළමුන් අතර කියවීමේ පුරුද්ද ඇති කිරීම සහ පාසල් සැපයුම් පරිත්‍යාගය සහ යටිතලපහසුකම් සංවර්ධනය තුළින් අධ්‍යාපනයට සහයවීම |
| 13 CLIMATE ACTION | සූර්ය බලශක්ති සහ අනෙකුත් පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන් සඳහා අඩු පිරිවැය මූල්‍යකරණය ලබාදෙමින් පුනර්ජනනීය බලශක්තිය වෙත ගනුදෙනුකරුවන් යොමු කිරීම |
| 17 PARTNERSHIPS FOR THE GOALS | SDGs අත්කර ගැනීමට දැනුම, තාක්ෂණය, ප්‍රවීනත්වය සහ මූල්‍ය සම්පත් හුවමාරු කර ගැනීම |

GRI 413-1

### සෘජු ප්‍රජා සහයෝගය

ව්‍යුහගත සමාජ සත්කාරක වැඩසටහන් තුළින් අප වටා ප්‍රජාවන් අපි නගා සිටවමු. 2019 වසර තුළ, රු.මි. 35.7ක් බැංකුවේ සමාජ සත්කාරක අයවැය තුළින් සුභසාධන වැඩපියවර තුළ ආයෝජනය කරන ලදී. මෙම වැඩපියවර තුළින් අරමුණු කරනු ලැබුවේ කලාව සහ සංස්කෘතිය, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ අනෙකුත් සමාජ ක්‍රියාකාරකම් ඉහළ නැංවීමයි. එහි විස්තර පහත වගුව තුළ දැක්වේ.

# සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

2019 දී සමාජ සත්කාරක (CSR) ව්‍යාපෘතිවල ආයෝජනය –

| **වර්ගය** | **එකතුව රු. '000** |
|---|---|
| කලාව සහ සංස්කෘතිය | 23,445 |
| අධ්‍යාපනය | 7,275 |
| සෞඛ්‍ය සහ | 1,167 |
| අනෙකුත් සමාජ ක්‍රියාකාරකම් | 3,795 |
| **එකතුව** | 35,682 |

## කලාව සහ සංස්කෘතිය



මහනුවර ඇසළ පෙරහැර සහ නවම් පෙරහැර ප්‍රධාන අනුග්‍රාහක.



චන්න-උපුලි රංග කලා ආයතනයේ සංස්කෘතික උත්සවයක් වන – "දිදුලන තරු රාත්‍රියක්" තුළින් සිංහ සමාජ ජාත්‍යන්තර දිස්ත්‍රික්ක 306 ඒ 1 අරමුදල් රැස්කිරීම සඳහා අපි අනුග්‍රහය දැක්වූවෙමු. රැස්කරන ලද අරමුදල් සෙල්ල කතරගම සහ බණ්ඩාරගම වැනි ප්‍රදේශ ආවරණය කරමින් ජාතිය තුළ මහ පරිමාණ ප්‍රජා සේවා ව්‍යාපෘති 11ක් සඳහා යොමු කරවන ලදී.

## අධ්‍යාපනය



කැලණිය විශ්ව විද්‍යාලය විසින් පවත්වන ලද ආයති ට්‍රස්ට් ශ්‍රී ලංකා වෙත අනුග්‍රහයග



ලෝක ළමා දිනය සැමරීමට අනුරාධපුර බුලන්කුලම පාසලේ සිසුන් වෙත සිසු උදාන සන්නාමයේ පාසල් බෑග් 200ක් පරිත්‍යාග කිරීම.

කියවීම ඇති කිරීම සඳහා වරප්‍රසාද නොලත් ළමුන්ට ලබාදීමට දිවයින පුරා පොත් පරිත්‍යාග වැඩසටහනක් දියත් කරන ලදී.

බදුල්ල කුමාරපට්ටිය අඹගස්දෝව රාජකීය විද්‍යාලයේ 1,000කට වැඩි සිසුන් වෙත "පැතුමත් තෑගි කරමු" වැඩසටහන යටතේ පොත් සහ ලිපිද්‍රව්‍ය අයිතම ලබාදෙන ලදී.

අධ්‍යාපන දෙපාර්තමේන්තුව, සංස්කෘතික දෙපාර්තමේන්තුව, රුහුණු විශ්ව විද්‍යාලය. තරුණ සේවා සභාව සහ එක්සත් ජාතීන් සමඟ සහයෝගිත්වයෙන් ගාල්ල සිංහ සමාජය විසින් සංවිධානය කළ සාහිත්‍ය උත්සවය, පොත් ප්‍රදර්ශනය සහ එක්සත් ජාතීන්ගේ (UN) ආදර්ශ දිනය සඳහා අනුග්‍රහය ලබා දෙන ලදී. මෙම වැඩසටහනේ අරමුණ වූයේ ළමුන් සහ ජනතාව අතර කියවීමේ පුරුද්ද දිරිගැන්වීම සහ ළමුන් සහ තරුණයන් අතර එක්සත් ජාතීන්ගේ කටයුතු පිළිබඳ දැනුවත්කම ඇති කිරීමයි.

ලෝක ළමා දිනය සැමරීම සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුව සමඟ සහයෝගිත්වයෙන් බලපිටිය, අම්බලන්ගොඩ සහ අහුන්ගල්ල පාසල් ළමුන් සඳහා වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී.

අ.පො.ස සාමාන්‍ය පෙළ අපේක්ෂකයින් සහ ඔවුන්ගේ දෙමව්පියන් 200ක් සඳහා සිසු නියාමන වැඩසටහනකට අනුග්‍රහය ලබාදෙන ලදී. මෙම වැඩසටහන් කීර්තිමත් අභිප්‍රේරණ සහ අනුප්‍රාණ කථිකයෙක් විසින් පවත්වන ලද අතර ශ්‍රද්ධා මාධ්‍ය ජාලයෙන් විකාශනය කරන ලදී.



*ග්‍රාමීය ප්‍රදේශවල පාසල් සිසුන්ගේ ඉංග්‍රීසි දැනුම වැඩි කිරීම සඳහා පවත්වන ලද වැඩසටහනක් වන INSPIRE 2.0 ව්‍යාපෘතියට අනුග්‍රහය ලබාදෙන ලදී. මෙය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය විසින් සංවිධානය කරන ලදී.*



*වරප්‍රසාද නොලත් ළමුන්ට කියවීමේ ද්‍රව්‍ය සම්පාදනය කිරීමේ අරමුණ ඇතිව සාහිත්‍ය මාසය තුළ දියත් කරන ලද "පැතුමක් තෑගි කරමු" වැඩසටහන.*



*මහජන බැංකුවේ බෞද්ධ සංගමය 2019 වසර තුළ එහි වාර්ෂික පාසල් පොත් ව්‍යාපෘතිය පවත්වන ලදී. බෞද්ධ සංගමය ඔවුන්ගේ ගුරුවරුන් ඇතුළුව දිවයින පුරා සිසුන් 4,075කට පාසල් පොත් ප්‍රදානය කරන ලදී. මෙම ව්‍යාපෘතිය එක් එක් කලාපයේ ප්‍රාදේශීය කළමනාකරුවන්ගේ අනුග්‍රහය යටතේ පවත්වන ලද අතර තෝරාගත් පාසල් දිවයිනේ දුෂ්කර ප්‍රදේශවල පිහිටා ඇත. ව්‍යාපෘතියේ පිරිවැය රු.මි. 3.6 ක් විය.*

## පරිසරය



*වැලිමඩ පීපල්ස් ECO උද්‍යාන රුක් රෝපන ව්‍යාපෘතිය.*

හරිත පරම්පරාව විසින් ගල්කිස්ස මුහුදු වෙරළ පිරිසිදු කරන ලදී.

# සමාජ සහ සම්බන්ධතා ප්‍රාග්ධනය

## සෞඛ්‍ය



බැංකුවේ 58 වැනි සංවත්සරය සමරමින්, අපගේ සේවකයින්ගේ සහභාගිත්වය ඇතිව ලේ දන්දීමේ කඳවුරක් සංවිධානය කරන ලදී.



රාගම රෝහලේ මාතෘ වාට්ටුවට රාගම ශාඛාවේ කාර්ය මණ්ඩලය විසින් සිදුකළ ජල පෙරහන් පරිත්‍යාගය.



රත්නපුර ශාඛාවේ කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් රත්නපුර මහ රෝහලට සිදුකළ පරිත්‍යාගය.

ප්‍රජාවගේ සෞඛ්‍ය සහ සුහසාධනයට සහයවීම පිණිස, 1,000ක සහභාගිකයින් සහිත මෙගා ක්‍රීඩා දිනය සඳහා අපි අනුග්‍රහය ලබාදුන් අතර ආසන්න වශයෙන් 20,000ක් පමණ නරඹන්නන් සහභාගි වූ මෙය මිලියන හතරකට වැඩි පිරිසක් විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය හරහා නරඹන ලදී.

පිළිකා රෝගීන්ට සහයවීමට "දිරිය හල" අරමුදල් රැස්කිරීමට දායක වීම.

## අනෙකුත් සමාජ ක්‍රියාකාරකම්



71 වැනි නිදහස සැමරීමට නිදහස් සතිය තුළ උපත ලද ළමුන් සඳහා ත්‍යාග සහිතව "නිදහසේ උපත" වැඩසටහන.

කාන්තාවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා කාන්තා කටයුතු අමාත්‍යංශයේ සහයෝගිත්වයෙන් පානදුර සහ මාතර වැඩමුළු කිහිපයක් පවත්වන ලදී. මෙම වැඩසටහන් ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීමට සංවිධානය කරන ලදි.

පාස්කු ඉරිදා ප්‍රහාරවල පීඩාවට පත්වූවන්ට පරිත්‍යාග.

## ප්‍රජා-පදනම් සංවර්ධන ණයදීම

GRI 203-1

රාජ්‍ය නොවන සංවිධාන (NGOs) සහ රාජ්‍ය සංවිධන සමඟ හවුල් වෙමින් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම තුළින් විශේෂ කර්මාන්ත අංශ වෙත මූල්‍ය සහයෝගය අපි ලබා දෙමු. ප්‍රධාන වශයෙන් බැංකුවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) සංවර්ධන ඒකකය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඒකකය විසින් මෙම පහසුකම් ලබා දේ. 2019 වසර තුළ, රැකියා උත්පාදනය, ගෘහ කර්මාන්තවලට සහය වෙමින් සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය සංවර්ධනය කරමින් කර්මාන්ත කිහිපයකට මෙම ණය ලබාදෙන ලදී. ආසන්න වශයෙන් ණයවලින් 65%ක් පමණ ආර්ථික කටයුතුවලට මූල්‍යකරණය සඳහා ප්‍රදානය කරන ලදී.

| | 2019.12.31 දිනට | | | |
|---|---|---|---|---|
| | බැංකුව මගින් අරමුදල් ලබාදෙන | | ප්‍රතිමූල්‍ය යෝජනා තුළින් අරමුදල් ලබාදෙන | |
| | ණය ගණන | හිඟව ඇති මුදල් රු.මි. | ණය ගණන | හිඟව ඇති මුදල් රු.මි. |
| වාණිජ | 1,762 | 72.93 | 817 | 150.40 |
| මූල්‍ය | 63 | 0.01 | 9 | 1.75 |
| කෘෂිකාර්මික | 33,186 | 5,058.21 | 3,405 | 537.72 |
| කර්මාන්ත | 1,948 | 37.23 | 865 | 98.85 |
| සංචාරක | 25 | 56.83 | 11 | 4.55 |
| නිවාස සහ දේපල සංවර්ධනය | 627 | 4.18 | 23 | 0.78 |
| පරිභෝජනය | 242 | 16.29 | 11 | 0.38 |
| සේවා | 164 | 20.24 | 510 | 47.61 |
| අනෙකුත් ආර්ථික ක්‍රියාකාරකම් | 26,332 | 2,069.51 | 1,927 | 205.29 |
| **මුළු එකතුව** | 64,349 | 7,335.43 | 7,578 | 1,047.34 |

## අනාගත දැක්ම

අපගේ මෙහෙයුම්වලට ක්‍රමෝපායිකව වැදගත්වන ප්‍රමුඛතා ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමු කරමින් අප ක්‍රියාත්මක දේශීය ප්‍රජාවන්ගේ අවශ්‍යතා ඉටුකිරීම කෙරෙහි අපගේ අවධානය අපි අඛණ්ඩව තියුණු කරමු.

# ස්වභාවික ප්‍රාග්ධනය

ස්වභාවික ප්‍රාග්ධනයට පරිසරයෙන් ලබාගන්නා සියලුම පුනර්ජනනීය සහ පුනර්ජනනීය නොවන සම්පත් ඇතුළත් වේ. යහපත් ස්වභාවික ප්‍රාග්ධන කළමනාකරණ ක්‍රමෝපායක් දිගුකාලීන තිරසාර වටිනාකම් නිර්මාණය සඳහා අත්‍යවශ්‍යය. පරිසරය කෙරෙහි අපගේ ව්‍යාපාර මෙහෙයුම්වල බලපෑම කළමනාකරණය කිරීමට සහ ස්වභාවික සම්පත් තිරසාරාත්මකව භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීමට අපි බැඳී සිටිමු.

## වැදගත් සිදුවීම්

**කාබන් දැනුවත් සහතිකපත** ආසියාව තුළ ලබාගත් පළමු රාජ්‍ය බැංකුව

ඩිජිටල් ගිණුම් **568,495** විවෘතකිරීම

**හරිත ගොඩනැගිලි ප්‍රතිපත්තිය** හඳුන්වාදීම

**ඒකක 79,806** කින් විදුලි පරිභෝජනය අඩුකිරීම

ඉවතලන කඩදාසි කි.ග්‍රෑ **36,117** ප්‍රතිචක්‍රීයකරණය කිරීම

## අපගේ ස්වභාවික ප්‍රාග්ධනය කළමනාකරණය

අපගේ සමස්ත හරිතාගාර වායුවල (GHG) බලපෑම අවම කිරීමට විස්තීර්ණ කළමනාකරණ ක්‍රමයක් අපි ක්‍රියාත්මක කර ඇත. කාලගුණ ක්‍රියාවන් සඳහා අපගේ බැඳීම නැවත වරක් ප්‍රකාශ කරමින්, සමස්ත පාරිසරික පියසටහන අවම කිරීම සඳහා අපගේ උත්සාහය තුළ යහපත් බලශක්ති සහ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ විවිධ ක්‍රියාමාර්ග හඳුන්වා දී ඇත. එමෙන්ම, අපගේ ණයදීමේ සහ ආයෝජන ප්‍රතිපත්තිය තුළ පාරිසරික බලපෑම පිළිබඳ ඇගයීමක් අපි යොදා ගනු ලැබූ අතර, විශේෂිත "හරිත බැංකුකරණ" නිෂ්පාදන මාර්ගයක් අපි ක්‍රියාත්මක කරන ලදී. පරිසරයට අවම හානිකර බවක් ඇති ව්‍යාපාර පවත්වාගෙන යාමේ නව්‍යකරණ ක්‍රම අපි අඛණ්ඩව සොයා බලමු. මෙවැනි උත්සාහයන් අපගේ මෙහෙයුම්තුළට තිරසාරභාවය ඒකාබද්ධ කිරීම සඳහා නොනැවති ක්‍රියාකරන අපගේ බැඳීම පෙන්වා දේ.

බලශක්තිය, ජලය සහ කඩදාසි පරිභෝජනය සහ අපද්‍රව්‍ය ඵලදායීව කළමනාකරණය සඳහා අපගේ සෘජු පාරිසරික බලපෑම සීමිත වේ.

## ප්‍රාග්ධන සම්බන්ධතා සහ විභව සමතුලිතතාව

- පුනර්ජනනීය බලශක්තිය ස්ථාපනය සහ පාරිසරික තිරසාරාත්මක ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම දීර්ඝ කාලීනව බලශක්ති පිරිවැය අඩුකිරීමට දායක වේ.
- ආයතනික තිරසාර වැඩසටහන් සේවක සහභාගිත්වය සහ සේවකයින්ගේ රැකියා-ජීවිත තුලනය ඉහළ නංවයි.
- කාබන් උදාසීන ගොඩනැගිලි ඉදිකිරීම සහ පුනර්ජනනීය බලශක්ති ස්ථාපනය කිරීම නිෂ්පාදිත ප්‍රාග්ධනයට දායක වේ.
- පාරිසරික තිරසාර වැඩසටහන් ඒකාබද්ධ කිරීම අපගේ සන්නාම කීර්තිනාමය අපගේ බැංකුව කෙරෙහි විශ්වාසය සහ භක්තිය වර්ධනය කරයි.
- පාරිසරික තිරසාරභාවය කෙරෙහි අවධානය ගනුදෙනුකාර විශ්වාසය සහ අදාළ පාරිසරික රෙගුලාසිවලට අනුකූලතාව ගොඩ නගයි.

## තිරසාර සංවර්ධන අරමුණු සමඟ (SDGs) පෙළ ගැසීම

| | |
|---|---|
| 6 CLEAN WATER AND SANITATION | ජල සංරක්ෂණ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම සහ ජාලය පුරා වගකීම්සහගත පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම |
| 7 AFFORDABLE AND CLEAN ENERGY | හරිත ශාඛා ගොඩනැගීම සහ ශාඛාවන්හි සූර්ය බලශක්ති ස්ථාපනය කිරීම |
| 11 SUSTAINABLE CITIES AND COMMUNITIES | අපගේ මෙහෙයුම්වලට පාරිසරික තිරසාරභාවය ඒකාබද්ධ කරමින් තිරසාර නගර සහ ප්‍රජාවන් ගොඩනැගීම |
| 12 RESPONSIBLE CONSUMPTION AND PRODUCTION | ඩිජිටල්කරණය තුළින් කඩදාසි රහිත බැංකුකරණය ප්‍රවර්ධනය කිරීම සහ විද්‍යුත් සන්නිවේදනය සහ ලේඛණගතකරණය තුළින් ජාලය පුරා කඩදාසි රහිත සන්නිවේදනය |
| 13 CLIMATE ACTION | හරිත ගොඩනැගිලි තුළ ආයෝජනය, අපගේ කාබන් පියසටහන අගයකිරීම සහ අවම කිරීම, ආයතනය තුළ වගකීම්සහගත ජලය, අපද්‍රව්‍ය සහ බලශක්ති කළමනාකරණය |
| 14 LIFE BELOW WATER | සම්පත්වල තිරසාර භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ ජලයට පහළ ජීවිතයට සහයවීම සඳහා පාරිසරික සංරක්ෂණ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම |
| 15 LIFE ON LAND | ස්වභාවික සම්පත් මත ජිවිතය පවත්වා ගැනීම සහ තිරසාර භාවිතය සහ පාරිසරික සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |

GRI 103-3

## "පීපල්ස් ග්‍රීන් පල්ස්" පාරිසරික ප්‍රතිපත්තිය

අපගේ පාරිසරික බලපෑම අගය කිරීම, කළමනාකරණය සහ අවම කිරීම මගින් අවධානය යෙමුකළ පාරිසරික කළමනාකරණ වැඩසටහන් තුළින් වඩා හරිත අනාගතයක් සඳහා අපගේ බැඳීම අපගේ පාරිසරික ප්‍රතිපත්තිය මගින් දැක්වේ. මෙම ප්‍රතිපත්තිය මගින් අපගේ පාර්ශ්වකරුවන් වෙත වඩා තිරසාර මූල්‍ය ආයතනයක් කරා අපගේ ආයතනික චින්තනය සන්නිවේදනය කරන අතර, තිරසාර සංවර්ධන අරමුණු උදෙසා අපගේ බැඳීම සවිබල ගන්වයි. මෙයට  ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල සහ සමස්ත ශාඛා ජාලය ඇතුළුව බැංකුවේ සෑම අංශයක් කරා විහිදෙන අපගේ තිරසාර රාමුව ඇතුළත්ය. එමෙන්ම එයට බැංකුවේ පාරිසරික සහ සමාජීය මූලාරම්භයන් කළමනාකරණය කිරීමේ සියලූම ප්‍රධාන මෙහෙයුම් කාර්යයන් හි තිරසාරාත්මක කණ්ඩායම් නිර්මාණය කිරීම ද ඇතුළත්ය.




**ගොඩනැගිලි**

- කාබන් උදාසීන ගොඩනැගිලි ලෙස තෝරාගත් ශාඛා සහතික කිරීම
- ගොඩනැගිලි 100කට සූර්ය බලශක්ති උත්පාදන ක්‍රම හඳුන්වාදීම
- සියලූම නව ගොඩනැගිලි LEED/ GREENSL/CIOB අනුව ඉදිකිරීම
- කොන්ත්‍රාත්කරුවන් LEED/GREENSL/CIOB Green Mark සහතික කිරීම අනුගමනය කළයුතු වීම

**ක්‍රියාවලි**

කඩදාසි රහිත මෙහෙයුම් හඳුන්වා දීම -

- මුදල් හා චෙක්පත් තැන්පතු යන්ත්‍ර
- උපයෝගිතා ගෙවීම සඳහා කිඔස්ක්
- පුළුල් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර
- කඩදාසි රහිත ගිණුම් විවෘත කිරීම සහ ගිණුම් සඳහා ඉ-ප්‍රකාශන
- කඩදාසි රහිත ණය පිරිසැකසුම් පරිසරය
- අන්තර්ජාල, මොබයිල් සහ වෙබ් පදනම් බැංකුකරණය
- හරපත් සහ ණයපත්
- පැය 24 පුරාවට ක්‍රියාත්මක වන මහජන බැංකු ඇමතුම් මධ්‍යස්ථානය

**ගනුදෙනුකරුවන්**

පහත දක්වා ඇති හරිත බැංකුකරණ සංකල්ප ප්‍රවර්ධනය -

- කඩදාසි රහිත මෙහෙයුමක් වන වේගවත් බැංකුකරණය තුළින් ගිණුම් විවෘත කිරීම
- ඉල්ලීම මත සියලූම ගිණුම් හිමියන් වෙත ඉ-ප්‍රකාශන නිකුත් කිරීම
- කෙටි පණිවිඩ ක්‍රම සහ අන්තර්ජාල බැංකුකරණය වේගවත්ව ප්‍රවර්ධනය
- හරපත් නිකුත් කිරීම - මුදල් රහිත සමාජය
- නව ගනුදෙනුකරුවන් සඳහා වේගවත් බැංකුකරණය ක්‍රියාත්මක කිරීම
- සීඩීඑම් - මුදල් තැන්තු යන්ත්‍ර, ඒටීඑම් - මුදල් ලබාගැනීමේ යන්ත්‍ර,
- කිඔස්ක් - බිල්පත් ගෙවීම්

**සමාජය**

ශ්‍රී ලංකාව තුළ වඩාත් කාබන් දැනුවත් බැංකුව/හරිත බැංකුව ලෙස මෙහෙයුම් ප්‍රතිලාභ සමස්ථයක් ලෙස සමාජයට පිරිනැමීම

**සේවකයින්**

- පාරිසරික තිරසාර දැනුම ඇති කිරීම
- සූර්ය බලශක්ති පද්ධති, හයිබ්‍රිඩ් කාර් සහ ඉලෙක්ට්‍රික් කාර් මිලදී ගැනීමට සහනශීලි සේවක ණය පහසුකම් ලබාදීම
- විද්‍යුත් සන්නිවේදනය සහ ලේඛණගතකිරීම ව්‍යවහාරයේ යෙදවීමට සේවකයින් දිරිගැන්වීම

## හරිත ශාඛා විවෘත කිරීම

පාරිසරික තිරසාරභාවය කෙරෙහි අපගේ බැඳීම අනුව, අපගේ සියලුම අළුත් ශාඛා හරිත ශාඛා ලෙස ඉදිකරන අතර, සියලුම නව්‍යකරණ සහ ප්‍රතිසංස්කරණ බැංකුවේ හරිත ගොඩනැගිලි ප්‍රතිපත්තිය මගින් මෙහෙයවනු ලබයි. ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි සභාවේ (GBCSL) ප්ලැටිනම් ලයිෆ් සාමාජිකයෙක් ලෙස, අපගේ සියලුම ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි සභාවේ GreenSL® ශ්‍රේණිගතකරණ ක්‍රමය යොදා ගනු ලබයි.

ඉදිකිරීම, ක්‍රියාවට නැංවීම සහ නඩත්තුව යන අදියර තුන සඳහා හරිත සහතික කිරීම ලබාගැනීමේ ක්‍රියාවලියක අපි නිරත වෙමු. කාබන් උපදේශන සමාගම (CCC) විසින් කාබන් දැනුවත් බැංකුව - 2019 අප වෙත ප්‍රදානය කරන ලද අතර, අපගේ සියලුම ශාඛා ශ්‍රී ලංකා පැවරීම් මණ්ඩලයේ (SLAB) පැවරීම - ISO 14065 and GHG 002-01 ලබාගෙන ඇත.

## කාබන් පියසටහන

2016 දී දියත්කළ වසර තුනේ කාබන් කළමනාකරණ වැඩසටහනේ අවසන් වසර අවසන් කිරීමෙන් පසු, SFG විසින් කාබන් දැනුවත් කිරීම සහතික කිරීම අප වෙත ප්‍රදානය කරන අතර, ඒ තුළින් මෙම ගෞරවය අත්කරගත් ආසියාවේ පළමු රාජ්‍ය බැංකුව බවට අප පත්විය. මෙම සහතික කිරීමේ අවශ්‍යතාවයේ කොටසක් ලෙස, අපගේ සමස්ත GHG බලපෑම අවම කිරීම සඳහා අරමුණු ස්ථාපිත කිරීමට සහ වැඩපිළිවෙළ හඳුනා ගැනීමට විස්තීර්ණ කළමනාකරණ සැලැස්මක් අපි තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී.



*ආසියාවේ පළමු කාබන් දැනුවත්® සහතික ලත් රජයට අයත් බැංකුව ලෙස තිරසාර අනාගත කණ්ඩායම විසින් පිළිගැනීම.*

## කඩදාසි ප්‍රතිචක්‍රීයකරණය

අපගේ පුළුල් ස්වයං-බැංකුකරණ ඒකක, මොබයිල් සහ අන්තර්ජාල බැංකුකරණ මාර්ග තුළින් කඩදාසි රහිත බැංකුකරණය ප්‍රවර්ධනය කරමින් සහ අපගේ සියලුම සම්ප්‍රදායික ශාඛා ඩිජිටල්කරණයෙන් ශක්තිමත් ශාඛා බවට පරිවර්තනය කරමින් කඩදාසි පරිභෝජනය අපි සැලකිලිමත් ලෙස අඩුකර ඇත. පුළුල් ගනුදෙනුකාර හුරුපුරුදුකම තුළින්, කඩදාසි රහිත ගනුදෙනු වෙත දායක වෙමින් සම්ප්‍රදායික ගනුදෙනුවලින් බහුතරය ඩිජිටල් මාර්ග හරහා සිදුකරනු ලබයි. ජාලය පුරා ස්ථාපිත ප්‍රතිචක්‍රීයකරණ ස්ථාන හරහා, කඩදාසි කිලෝ ග්‍රෑම් 36,117ක් 2019 දී ප්‍රතිචක්‍රීයකරණය කරන ලදී.

## අපද්‍රව්‍ය කළමනාකරණය

ඝණ අපද්‍රව්‍ය වගකීම් රහිත ආකාරයෙන් බැහැර කිරීමේ දැඩිකම සහ ජෛව විවිධත්වය සහ මානව සෞඛ්‍ය කෙරෙහි එහි ප්‍රතිවිපාක හඳුනාගනිමින්, අපගේ ජාලය පුරා වගකීම්සහගත අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලියක් අපි ක්‍රියාත්මක කර ඇත. අපගේ සේවකයින්ගේ, අදාළ මහ නගර/නගර සභා සහ මධ්‍යම පරිසර අධිකාරියේ අනුමත තෙවැනි පාර්ශ්ව ප්‍රතිචක්‍රීයකරණ සේවා සැපයුම්කරුවන්ගේ සහයෝගය ඇතිව උත්පාදනය වන අපද්‍රව්‍ය කාණ්ඩ කිරීම අපි ක්‍රියාවේ යොදවමු. ඇතිවන අපජලය ජාතික ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයේ මාර්ගෝපදේශ පරිදි මුදා හැරේ. අපගේ මෙහෙයුම් තුළ උත්පාදනය වන ප්‍රධාන උවදුරක් වන තොරතුරු තාක්ෂණය පදනම් (IC) ඉ-අපද්‍රව්‍ය නැවත භාවිතය සඳහා ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය යටතේ වගකීම්සහගත අයුරින් මුදා හැරේ.

## ජලය සංරක්ෂණය

බැංකුව තුළ ජල පරිභෝජනය ප්‍රශස්ථ කිරීම වෙනුවෙන් ගෙවතු වගාව සහ සෝදා හැරීම සඳහා අපජලය ප්‍රතිචක්‍රීය කිරීමට අපජලය පිළියම් පිරියතක් ඉදිකරනු ලැබ ඇත. ද්විත්ව ක්‍රියාකාරී ජල බේසම් සහ ස්වයංක්‍රීය වැසිකිළි ක්‍රම සහ සේදුම් කාමරවල ස්වයංක්‍රීය පැටි කරාම ස්ථාපිත කිරීම තුළින් ජල භාවිතය අවම කිරීමට ක්‍රියාමාර්ග ගණනාවක් හඳුන්වා දී ඇත.

▼ GRI 302-1, 302-2, 302-3, 302-4

## බලශක්ති සංරක්ෂණය සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම්

අපගේ මෙහෙයුම් බලශක්ති තීව්‍රතා නොවුවද, කාර්යක්ෂමතාව වැඩි කිරීමට, බලශක්ති පරිභෝජනය අඩු කිරීමට සහ අපද්‍රව්‍ය තුරන් කිරීමට අපි නිරන්තරයෙන් මාර්ග සොයමු. අපගේ ප්‍රධාන පරිභෝජන මූලාශ්‍රය විදුලිය වන අතර ඉන්පසුව අපගේ ව්‍යාපාරයට අදාළ සංචාර තුළින් ඇතිවන ප්‍රවාහනය පවතී. 2018 දී මූලස්ථාන ගොඩනැගිල්ලේ මුළු බලශක්ති පරිභෝජනය කිලෝ වොට්ස් 1,805,370ක් වාර්තා වූ අතර සංරක්ෂණය සඳහා අපගේ බැඳීම හේතු කොට ගෙන විදුලි පිරිවැය තුළ රු.මි. 2.0ක ඉතුරුම් සඳහා දායක වෙමින්, 2019 දී, අපගේ බලශක්ති පරිභෝජනය කිලෝවොට්ස් 79,806කින් අඩුවී ඇත. මූලස්ථාන කාර්යාලයේ බලශක්ති තීව්‍රතා අනුපාතය (වර්ෂයකට සේවකයෙකුට විදුලි පරිභෝජනය) කිලෝ වොට්ස් 1,78ක් විය.

වසර තුළ, සෑම ශාඛාවකම සූර්ය බලශක්ති පද්ධති සවිකිරීම තුළ පුනර්ජනනීය බලශක්ති සඳහා සියලුම ශාඛා පරිවර්තනය කරමින් සූර්ය බලශක්තිය වැනි පුනර්ජනනීය බලශක්ති කෙරෙහි අපගේ විශ්වාසය වැඩි කිරීම පිළිබඳ අපගේ උත්සාහයන් යොමු කරන ලදී

බලශක්ති පරිභෝජනය අඩුකිරීමට ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කිහිපයක් පහත දැක්වේ -

- බැංකුවේ බලශක්ති පරිභෝජනය ප්‍රශස්ථ කිරීමට අප විසින් මිලදී ගන්නා යන්ත්‍ර සහ විද්‍යුත් උපකරණවල "බලශක්ති කාර්යක්ෂමතා අනුපාතය" පිළිබඳ නිසි සැලකිල්ල යොමු කිරීම
- ශාඛා සහ ප්‍රධාන කාර්යාලයේ සියලුම ආලෝක උපකරණ වෙනුවට බලශක්ති කාර්යක්ෂම LED බල්බ සවිකිරීම
- බලශක්ති කාර්යක්ෂමතාව සඳහා තරු ශ්‍රේණිගතකරණයක් ඇති තොරතුරු තාක්ෂණ උපකරණ ප්‍රසම්පාදනය

- සියලුම ගොඩනැගිලිවල අපවර්තක තාක්ෂණය සහිත බලශක්ති කාර්යක්ෂම වායු සමීකරණ යන්ත්‍ර සවිකිරීම සහ කාලින සේවා සහ අළුත්වැඩියා කිරීම් තුළින් වැලැක්වීමේ නඩත්තු කරගෙන යාම
- පරිසර හිතකාමී ශීතකරණ භාවිතය
- දුරස්ථ නියාමන පහසුකම සහිත ඉන්ධන කාර්යක්ෂම, අඩු අංශු විමෝචනය කරන ශබ්ද රහිත විදුලි උත්පාදක යන්ත්‍ර ස්ථාපිත කිරීම

## මහජන බැංකුවේ බලශක්ති පරිභෝජනය - ප්‍රධාන කාර්යාලය

| බලශක්ති මූලාශ්‍රය | බලශක්ති වර්ගය | පරිභෝජන මට්ටම (GJ) | |
|---|---|---|---|
| | | 2019 | 2018 |
| පුනර්ජනනීය | විදුලිය | 6,499.3 | 6,786.6 |
| පුනර්ජනනීය නොවන | ඉන්ධන | 5,888.0 | 5,559.2 |
| එකතුව | | 12,387.3 | 12,345.8 |
| බලශක්ති තීව්‍රතාව (එක් සේවකයෙකුට) | | 12.7 | 12.5 |

## ඉන්ධන සහ විමෝචන කළමනාකරණය

බලශක්ති පරිභෝජනය යටතේ අපගේ ගමන් සහ ව්‍යාපාරයට අදාළ සංචාරවල ප්‍රවාහනය තුළ ඉන්ධන පරිභෝජනය සඳහා අප දායක වී ඇත. GHG අඩුකිරීම සඳහා ඵලදායී මාර්ග සැලසුම්කරණය, හරිත මෝටර් රථ භාවිතය සහ අමුද්‍රව්‍ය තොග ප්‍රවාහනය තුළින් ඉන්ධන භාවිතය අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග යොදා ගෙන ඇත.

## වගකීම්සහගත මූල්‍යකරණය සහ හරිත මූල්‍යකරණය ප්‍රවර්ධනය කිරීම

අපගේ ණයදීම සහ ආයෝජන ප්‍රතිපත්තිය තුළ පාරිසරික බලපෑම් වෙත නිසි සැලකිල්ල යොමු කිරීම මගින් හුදෙක් මුදල් ප්‍රතිලාභවලට පමණක් නොව දීර්ඝ කාලින වාසි අත්කර ගැනීමට අපට හැකියාව ලබා දේ. ණය දීමේ සමාජීය සහ පාරිසරික බලපෑම ඇතුළත් වගකීම්සහගත ණයදීමේ සදාචාර පිළිබඳව අළුතින් බඳවාගත් සහ දැනට සිටින සේවයින් දැනුවත් කරමින් අපි වගකීම්සහගත ණය ප්‍රවර්ධනය කරමු. ණයදීමේ තීරණයක් ගැනීමට පෙර, මෙම අංග දෙක තක්සේරු කෙරේ. ඒ අනුව, අපගේ සේවාදායකයින් සම්බන්ධ CEA බලපත්‍රය සහ අපගේ මෙහෙයුම්වලින් පරිසරයට වන බලපෑම් ඇතුළුව අදාළ සියලුම පාරිසරික රෙගුලාසිවලට අනුකූලතාව අනුමැතිය පෙර තක්සෙරු කෙරේ.

සූර්ය බලශක්ති පද්ධති මිලදී ගැනීමට සහ හයිබ්‍රිඩ් සහ ඉලෙක්ට්‍රික් කාර් මිලදී ගැනීමට පරිසර හිතකාමී ණය යෝජනා ක්‍රමයක් අපි ලබා දෙමු. කඩදාසි රහිත බැංකුකරණ ලක්ෂණ සහිතව නව ඩිජිටල් ගිණුම් 403,242ක් 2019 දී විවෘත කරන ලදී.

## පීපල්ස් පරිසර උද්‍යාන ව්‍යාපෘතිය

පාරිසරික තිරසාර ප්‍රතිපත්තිය යටතේ, කාබන් පියසටහන අඩු කිරීම සඳහා පැල 200 කට වැඩි ප්‍රමාණයක් සිටුවමින් පරිසර උද්‍යාන ව්‍යාපෘතියක් වැලිමඩ ආරම්භ කරන ලදී. කෘෂිකාර්මික විශේෂඥයින් කණ්ඩායමක් විසින් මෙම පැල පෝෂණය කරමින් පවතී. ඉදිරි වසරේදී විල්ගමුව සහ පොලොන්නරුව තවත් පරිසර උද්‍යාන දෙකක් ආරම්භ කිරීමට අපි අරමුණු කරමු.

## අනුකූලතාවය

වසර තුළ සියලුම නීති සහ රෙගුලාසි සමඟ අපි අනුකූල වී ඇති අතර, පාරිසරික නීති සහ/හෝ රෙගුලාසිවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් පනවන ලද කිසිදු දඩයක් හෝ මූල්‍ය නොවන අනුමැති කිසිවක් නොමැත.

## අනාගත දැක්ම

තිරසාර අනාගතයක් සුරක්ෂිත කිරීම උදෙසා කාලගුණ වෙනසේ සියලුම බලපෑම් මැඩ පැවැත්වීමට පරිසර හිතකාමී වැඩසටහන් අපි යොදා ගනිමු. අපගේ හරිත බැංකුකරණ සංකල්පය සහ ඩිජිටල් බැංකුකරණ මාර්ගය තුළින්, පාරිසරික තිරසාරභාවය අපි අඛණ්ඩව ප්‍රවර්ධනය කරන්නෙමු.

# අවදානම් කළමනාකරණය

GRI 102-15,102-30

බැංකුවේ සම්ප්‍රදායික සහ ගතානුගතික ව්‍යාපාර ආදර්ශයන් ගෝලීයකරණය, ඩිජිටල්කරණය, සුදුසු පරිගණක වැනි ඝාතීය තාක්ෂණයන්. රොබෝවරු, ටෙක්ෆින් සහ ෆින්ටෙක්වලින් සම්මතයට එකඟ නොවන තරඟය සහ ජනවිකාශ වෙනස්වීම් වැනි ඇතිවන සමහර විශාල ප්‍රවණතාවන් මගින් තර්ජනයට ලක් කරනු ලබයි. වර්ධනය වන නියාමන සංවර්ධනය සහ වැඩි වන ප්‍රාග්ධන අවශ්‍යතාවන් බැංකුවේ ලාභදායිත්වයට සහ ආකර්ෂණයට අභියෝග කරමින් සිටී. තවද, ආර්ථික කාර්යසාධනය හැර ඉහළ මට්ටමේ සේවය සහ නව්‍යකරණය සඳහා සහශ්‍රයේ ඉල්ලුම තුළින් වැඩිවන ඉල්ලුම සහ සමාජ සහ ආර්ථික අංශ කෙරෙහි සමාන බලපෑම ඇතිවීම තුළින් වර්තමානයේ බැංකුවේ තිරසාරභාවයට දැඩි බලපෑමක් ඇත.

ශ්‍රී ලංකාව තුළ දෙවන විශාලතම වාණිජ බැංකුව ලෙස, අවදානම් හඳුනාගැනීම, ඇගයීම, මැනීම, අවම කිරීම, නියාමනය සහ වාර්තා කිරීම සඳහා යහපත් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ වැඩරාමුවක් මහජන බැංකුව සතු වේ. බුද්ධිමය අවදානම් කළමනාකරණය අවස්ථා නිර්මාණය කිරීමට සහ අපගේ කාර්යසාධනය පවත්වා ගැනීමට අත්‍යවශ්‍යය. තත්ත්වය සහ අවංකකම සඳහා ඉහළ ප්‍රමිති සමඟ, අපගේ සන්නාමය සහ කීර්තිනාමය සඳහා සහ අපගේ පාර්ශ්වකරුවන් සඳහා කල්පවත්නා බලපෑමක් ඇති කිරීමට මෙය අවශ්‍ය වේ. අපගේ නිරතුරුව වෙනස්වන වෙළෙඳපොල අවකාශය තුළ, නව ව්‍යාපාර අවස්ථා හඹායාමට, තාක්ෂණය තුළ ආයෝජනය කිරීමට සහ අවදානම සහ අපගේ කීර්තිනාමය කළමනාකරණය කරගැනීමට අපි සක්‍රීයව කටයුතු කරමු. තිරසාර ප්‍රගතිය බැංකු කළඹ තුළ ප්‍රත්‍යස්ථිතිය වර්ධනය කිරීම කරා සිදුකරනු ලැබ ඇත.

ඒ අනුව, අපගේ වත්කම් සහ වගකීම්වල අවදානම් ප්‍රතිඵල කළමනාකරණය කර ගනිමින් බැංකුවේ ආයතනික කළඹ අපි තවදුරටත් නැවත ස්ථානගත කරන අතර අපගේ මෙහෙයුම්වලට බලපෑමක් ඇති පුළුල් භූගෝලීය අවිනිශ්චිතතා පිළිබඳ අපි අවදියෙන් සිටිමු. සක්‍රීය පදනමක් මත ඇතිවිය හැකි දුර්වලතාවන් කළමනාකරණය කරගැනීමට අපගේ සියලුම කළඹ තුළ ඇතිවන අවදානම් කලින් හඳුනාගැනීම කෙරෙහි අපි අඛණ්ඩව අවධානය යොමු කරමු. බැංකුවේ කළඹ ක්ෂේත්‍රය, භූගෝලය සහ නිෂ්පාදන වැනි හරස් මානයක මනාව විවිධාංගීකරණය කෙරේ.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ වැඩරාමුවේ පරමාර්ථ -

- බැංකුවේ අවදානම් නිරාවරණ ඇගයීම සහ සුදුසු පරිදි කළමනාකරණය
- බැංකුවේ අවදානම් නිරාවරණ නියාමනයට ඵලදායී ක්‍රමයක් සංවර්ධනය කිරීම සහ ඒවා බැංකුවේ ප්‍රාග්ධනයට සම්බන්ධ කිරීම
- අභ්‍යන්තර ප්‍රතිපත්ති විශේෂයෙන් අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් බැංකුවේ අනුකූලතාව නියාමනයට යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම
- අදාළ සියලුම ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි බැංකුව පුරා ඵලදායිව සන්නිවේදනය කිරීම
- ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් යොදාගෙන ශක්තිමත් කිරීම
- බැංකුව තුළ ශක්තිමත් අවදානම් සංස්කෘතියක් ස්ථාපිත කිරීම

## බැංකුවේ අවදානම් කළමනාකරණ වැඩරාමුව

බැංකුවේ සියලුම අවදානම් නිරාවරණ කළමනාකරණය කිරීම සඳහා ආරක්ෂක මාර්ග ත්‍රිත්ව ආදර්ශය මත පදනම් වී ශක්තිමත් අවදානම් කළමනාකරණ වැඩරාමුවක් ක්‍රියාත්මක පවතී. මෙය අන්තර් සම්බන්ධ සහ සාකල්‍ය ක්‍රමයක් වන අතර, ඉන් පැහැදිලිව වෙනස හඳුනාගත් ආරක්ෂක මාර්ග ත්‍රිත්වය තුළින් අවදානම ඵලදායිව කළමනාකරණය කරයි.

## ආරක්ෂණ මාර්ග ත්‍රිත්වය

| පළමු ආරක්ෂක මාර්ගය | දෙවන ආරක්ෂක මාර්ගය | තෙවැනි ආරක්ෂක මාර්ගය |
|---|---|---|
| **ව්‍යාපාර මාර්ග/ ආයතනික කාර්ය** | **අවදානම් කළමනාකරණය සහ පාලනයන** | **සහතිකය** |
| අවදානම කළමනාකරණය සඳහා අවදානම හඳුනාගැනීම සහ හිමිකාරත්වය, අවදානම් බැංකුවේ පිළිගත් ණය රුචිය සහ අවදානම කළමනාකරණ ප්‍රතිපත්ති තුළ ඇති බව සහතික කිරීම. | අවදානම කළමනාකරණය සහ අනුකූලතාව සඳහා අපදෙස් ලබාදීම, ඵලදායී අවදානම කළමනාකරණ ප්‍රතිපත්ති රාමුවක් පවත්වා ගැනීම සහ අවදානම කළමනාකරණ රාමුව ඵලදායිව ක්‍රියාත්මක කිරීම සඳහා ස්වාධීනව නියාමනය කිරීම. | ක්‍රියාත්මක අවදානම් රුචිය ක්‍රියාවලි සහ ව්‍යවහාර මත ස්වාධීන සහ විෂයමූලික සහතිකය ලබාදීම සහ ඉහළම මට්ටමේ පාලනය සහ අනුකූලතාවය සහතික කිරීම. |
| සිල්ලර, තොග සහ ව්‍යවසාය බැංකුකරණය<br>භාණ්ඩාගාරය<br>ශාඛා මෙහෙයුම්<br>තොරතුරු තාක්ෂණය | අවදානම් කළමනාකරණ ඒකකය<br>අනුකූලතා ඒකකය<br>මූල්‍ය අංශය<br>මානව සම්පත් අංශය | අභ්‍යන්තර විගණන<br>බාහිර විගණන<br>නියාමන අනුකූලතා |

## අවදානම් රුචිය

අවදානම් රුචිය යනු ව්‍යාපාර පරමාර්ථ අත්කර ගැනීම පිණිස සමූහය එහි අවදානම් ඉවසුම් මට්ටම තුළ පිළිගැනීමට එකඟවන මුළු අවදානම් මට්ටමයි. අවදානම ඉවසීම යනු පාර්ශ්වකරුවන් වෙත නියාමන සංරෝධක සහ එහි බැඳීම් කඩකිරීමට පෙර සමූහයට පිළිගතහැකි උපරිම අවදානම් මට්ටමයි. අවදානම් රුචිය මගින් සියලුම ද්‍රව්‍යවල අවදානම් වර්ගීකරණයන් තුළ මැනියහැකි ඉලක්ක සහ ඉවසුම් සීමාවන් ලබා දේ.

සම්බන්ධ අවදානම් සමඟ ප්‍රශස්ථ වර්ධන විකල්ප අගය කිරීම මගින් තිරසාර කාර්යසාධනය ඉදිරියට ගෙනයාමට වැඩරාමුවක් මින් නිර්මාණය කරයි. සමූහයේ ක්‍රමෝපාය, ව්‍යාපාර පරිසරය සහ පාර්ශ්වකාර අවශ්‍යතා සමඟ ගැලපීම සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව අවදානම් රුචිය සමාලෝචනය කර අනුමත කරයි.

අවදානම් රුචියට සාපේක්ෂව 2018 දෙසැම්බර් 31 දිනට සහ 2019 දෙසැම්බර් 31 දිනට බැංකුවේ අවදානම් පැතිකඩ පහතින් දැක්වේ:

| ණය අවදානම | ණය අවදානම් රුචිය | | | පහත සඳහන් දිනට තත්ත්වය | |
|---|---|---|---|---|---|
| | ඉහළ අවදානම | මධ්‍යම අවදානම | අඩු අවදානම | 2019 දෙසැම්බර් 31 | 2018 දෙසැම්බර් 31 |
| අක්‍රීය/මුළු අත්තිකාරම් (උකස් හැර) % | >6 | 2.5 - 6 | <2.5 | 3.72 | 2.76 |
| කල් ඉක්මවූ | >10 | 5 - 10 | <5 | 8.64 | 11.88 |
| වෙන්කිරීම් ආවරණය % | <75 | 75 - 90 | >90 | 60.00 | 72.30 |
| ලාභ සහ අලාභ අයකිරීම් % | >15 | 5 - 15 | <5 | 29.49 | 10.74 |
| සංකේන්ද්‍රණය (HHI ක්‍රමය) | >0.25 | 0.25 - 0.15 | <0.15 | 0.21 | 0.18 |
| අයකරගැනීම් % | <10 | 10 - 20 | >20 | 26.00 | 31.00 |
| TOD අතිරික්තය % | >20 | 10 - 20 | <10 | 18.21 | 11.56 |
| අක්වෙරළ නිරාවරණය (OBU)% | >15 | 10 - 15 | <10 | 1.43 | 0.88 |

| වෙළෙඳපොල අවදානම | අනුමත සීමාව | 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය |
|---|---|---|
| FX net විවෘත තත්ත්වය | ඇ.එ.ඩො මි. + 10<br>ඇ.එ.ඩො මි. - 25 | අනුකූලවිය |
| අවදානමේදී වටිනාකම (VaR) (සහතික මට්ටම 99%, දින1) | ඇ.එ.ඩො 250,000 | අනුකූලවිය |
| සමුච්චිත අලාභ | | |
| - FX වෙළෙඳාම | ඇ.එ.ඩො 175,000 | අනුකූලවිය |
| - FIS වෙළෙඳාම (උපලබ්ධි වූ) | ශ්‍රීලංරු.මි. 25 | අනුකූලවිය |
| (උපලබ්ධි නොවූ) | ශ්‍රීලංරු.මි. 500 | අනුකූලවිය |
| ඉදිරි FX පරතර සීමාව | ඇ.එ.ඩො 600 මාසික මිලියන | අනුකූලවිය |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් - වෙළෙඳාම | ශ්‍රීලංරු.බි. 150 | අනුකූලවිය |
| ආයෝජනය | ශ්‍රීලංරු.බි. 300 | අනුකූලවිය |
| AFS | ශ්‍රීලංරු.බි. 10 | අනුකූලවිය |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (SLDB) | ඇ.එ.ඩො මි. 750 | අනුකූලවිය |
| අන්තර් බැංකු ණය ගැනීම් - මුළු සීමාව | ඇ.එ.ඩො මි. 668 | අනුකූලවිය |
| - කෙටි කාලීන සීමාව | ඇ.එ.ඩො මි. 191 | අනුකූලවිය |
| කොටස් වෙළෙඳ කළඹ තුළ ආයෝජන වටිනාකම | ශ්‍රීලංරු.බි. 1,000 | අනුකූලවිය |
| නැවතුම් අලාභ සීමාව (කොටස් වෙළෙඳාම) | 40% | අනුකූලවිය |
| S&P SL20 දර්ශකය මත කොටස්වල ප්‍රතිශතය | අවම 25% | අනුකූලවිය |
| රන් ඒකක භාරය | ශ්‍රීලංරු.බි. 2.5 | අනුකූලවිය |
| ණයකර | ශ්‍රීලංරු.බි. 5 | අනුකූලවිය |
| පොළී අනුපාත අවදානම (DGap+VaR on Fwd FX) | ශ්‍රීලංරු.බි. 8.5 | අනුකූලවිය |

# අවදානම් කළමනාකරණය

| මෙහෙයුම් අවදානම | මෙහෙයුම් අවදානම් රුචිය | | | වසර සඳහා තත්ත්වය | |
|---|---|---|---|---|---|
| | ඉහළ අවදානම | මධ්‍යම අවදානම | අඩු අවදානම | 2019 | 2018 |
| මෙහෙයුම් අලාභ - අභ්‍යන්තර වංචා | >25 | 10 - 25 | <10 | 1 | 6 |
| මෙහෙයුම් අලාභ - බාහිර (ලක්ෂ) | >1,000 | 400 - 1,000 | <400 | 281 | 250 |
| මුළු මෙහෙයුම් වියදමට මුළු මෙහෙයුම් අලාභ | >1.0% | 0.5% - 1.0% | <0.5% | 0.21% | 0.48% |
| පද්ධති ලබාගැනීමේ හැකියාව | | | | | |
| ඉතා වැදගත් | <97.5% | 97.5% - 99.9% | >99.9% | 99.87% | 99.83% |
| සාමාන්‍යයෙන් වැදගත් | <95% | 95% - 97.5% | >97.5% | 99.06% | 99.89% |
| අඩුවෙන් වැදගත් | <87% | 87% - 90% | >90% | 99.98% | 100% |
| තෘප්තියට වඩා අඩුවෙන් ප්‍රමාණනය කළ ශාඛා විගණනයේ ප්‍රතිශතය | >15% | 0 - 15% | Nil | 26% | 21% |

## අවදානම් වර්ගීකරණ

ණය අවදානම, වෙළෙඳපොළ අවදානම, මෙහෙයුම් අවදානම, ද්‍රවශීලතා අවදානම, අරමුදල් අවදානම, අනුකූලතා අවදානම, කීර්තිනාම අවදානම, නෛතික අවදානම සහ ක්‍රමෝපාය අවදානම මහජන බැංකුවේ ප්‍රධාන අවදානම් වර්ගීකරණ වෙති.

## මහජන බැංකුව සඳහා අවදානම් සංගහනය

මහජන බැංකුව සඳහා අවදානම් සංගහනය ව්‍යාපාර මාර්ග, කාර්යයන්, භූගෝලීය ස්ථාන සහ නෛතික ආයතනවල සියලුම අවදානම් වර්ගීකරණයන්ගෙන් සමන්විත වේ.

මහජන බැංකුව සඳහා අවදානම් සංගහනය

**බැංකුව මගින් කළමනාකරණය**

| කටයුතු | ණයදීම | අරමුදල් | වෙළෙඳ | මෙහෙයුම් | තරඟය | නියාමනය |
|---|---|---|---|---|---|---|
| අවදානම් | **ණය අවදානම**<br>පැහැරහැරීමේ අවදානම සංකේන්ද්‍රණ අවදානම | **ද්‍රවශීලතා අවදානම**<br>ස්කන්ධ අවදානම<br>පොළී අවදානම | **වෙළෙඳපොළ අවදානම**<br>වෙළෙඳ ද්‍රව්‍ය අවදානම<br>හුවමාරු අනුපාත අවදානම | **මෙහෙයුම් අවදානම**<br>සේවක අවදානම<br>IT අවදානම අනුකූලතා අවදානම ව්‍යාපාර | **ක්‍රමෝපාය අවදානම**<br>කීර්තිනාම අවදානම | **අනුකූලතා අවදානම** |

**බලපෑම ඇගයීම සඳහා බැංකුව විසින් නියාමනය කරන ලදී**

| අවදානම් | භූගෝලීය | සාර්ව ආර්ථික | නියාමන |
|---|---|---|---|

## අවදානම් රුචි රාමුව

**සමූහ අවදානම් කළමනාකරණ රාමුව**

- ණය අවදානම් කළමනාකරණ රාමුව
- වෙළෙඳපොළ අවදානම් කළමනාකරණ රාමුව
- මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව
- ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව
- අනුකූලතා අවදානම් කළමනාකරණ රාමුව

**පීඩන සහ සිදුවීම්පෙළ පරීක්ෂණ රාමුව**

**ප්‍රාග්ධන කළමනාකරණ රාමුව**

නියාමන ප්‍රාග්ධනය | ආර්ථික ප්‍රාග්ධනය

- ක්‍රමෝපායික සැලැස්ම (2016-2020)
- Basel III යටතේ ICAAP
- කාර්යසාධන කළමනාකරණය
- ක්‍රියාවලි තත්ත්ව කළමනාකරණය

## අවදානම් පාලනය

මෙය අවදානම් කළමනාකරණ වැඩරාමුවේ අත්‍යවශ්‍ය අංගයක් වන අතර එය අවදානම් කළමනාකරණය ආයතනික පාලනය තුළ මනා පරිචයන්ගේ යෙදුම වේ. අවදානම් පාලනය සඳහා ඉහළම වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරන අතර ඔවුන්ගේ ප්‍රමුඛතාවන්ට අවදානම් රුචි මට්ටම් තීරණය කිරීම, අවදානම් ප්‍රතිපත්ති සකස් කිරීම සහ අවදානම් නිරාවරණවල එලදායි කළමනාකරණය ඇතුළත්ය. අවදානම් කළමනාකරණයට අදාළව එහි කාර්යයන් මුදාහැරීමේදී අනු කමිටු සහ විධායක කමිටු විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වේ. මේ තුළින් අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ පාලනය සහ අවදානම් ඇතිවීම අතර පැහැදිලි බණ්ඩනය සහ අවදානම් නිරාවරණ අනුමත කිරීම සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය සහ අවදානම් කමිටු ඔවුන්ට අදාළ ප්‍රඥප්තිවල උපදෙස් යටතේ ක්‍රියාත්මක වේ.

මහජන බැංකුවේ අවදානම් පාලන රාමුව පහත විස්තර කෙරේ.



# අවදානම් කළමනාකරණය

## බැංකුවේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ වැඩරාමුවේ කාර්යය ව්‍යුහය




### අවදානම් සංස්කෘතිය

අවදානම සහ ප්‍රතිඵල කළමනාකරණය සඳහා සාකල්‍ය ප්‍රවේශයක් දිරිගන්වමින් ප්‍රත්‍යස්ථිතිය සවිබලගැන්වීමට සමූහය තුළ ශක්තිමත් අවදානම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට අපි උත්සාහ ගනිමු. සෑම මට්ටමකම සේවකයින් අවදානම කළමනාකරණය සහ වැඩි කිරීම සඳහා වගකීමට බැඳී සිටින අතර ශක්තිමත් අවදානම් සංස්කෘතියකට සහයවන හැසිරීම ප්‍රදර්ශනය කිරීම ඔවුන්ගෙන් බලාපොරොත්තු වේ. ශක්තිමත් අවදානම් සංස්කෘතියක් සංවර්ධනය කිරීම සඳහා, අවදානම පිළිබඳ දැනුම් මට්ටම වැඩි කිරීම සඳහා සේවකයින් නිරන්තරයෙන් පුහුණු කරනු ලබන අතර තමන්ගේ කාර්යභාරයට අදාළ අවදානම් කළමනාකරණය කිරීමට අවශ්‍ය දැනුම සහ පළපුරුද්ද ලබා දේ.

සමූහය තුළ අවදානම් සංස්කෘතිය තහවුරු කරන මූලධර්මවලට පහත දෑ ඇතුළත් වේ:

- සමූහය විසින් ගනු ලබන අවදානම් සඳහා නිශ්චිත අවදානම් රුචි
- සෑම අවදානමක්ම අවදානම් කළමනාකරණ රාමුව තුළ අනුමත කළයුතු අතර ප්‍රමාණවත්ව ගෙවිය යුතුය
- අවදානම් පිළිබඳ අඛණ්ඩ නියාමනය සහ කළමනාකරණය

### පීඩන පරීක්ෂණය

පීඩන පරීක්ෂණය යනු විවිධ මූල්‍ය අවස්ථාවන්ට වත්කම් සහ වගකීම් කළඹ තුළ ප්‍රතිචාරය තීරණය කිරීමට යොදා ගනු ලබන විඩම්බන තාක්ෂණයකි. පීඩන පරීක්ෂණ වරින්වර සිදුකරනු ලබයි. අනපේක්ෂිත අලාභ සහ ගිවිසුම්ගත බැඳීම් සපුරාලීමට ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාව පිළිබඳ ප්‍රමාණවත් ස්වාරක්ෂක සමූහයට ඇති බව සහතික කරයි.

පීඩන පරීක්ෂණය සමූහයේ අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා ඇගයීම් ක්‍රියාවලියේ (ICAAP) අත්‍යවශ්‍ය අංගයකි. ඉපයීම්, ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාව කෙරෙහි සිදුවියහැකි බලපෑම ඇතුළුව සමූහයේ අවදානම් පැතිකඩ සහ මූල්‍ය තත්ත්වය මත සාර්ව ආර්ථික සහ වෙළෙඳපොළ විචල්‍යතාවල බලපෑම අපි තක්සේරු කරමු. සියලුම වැදගත් අවධානම් වර්ග පීඩන පරීක්ෂණ අභ්‍යාසය තුළට ඇතුළත් කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) සමූහයේ පීඩන පරීක්ෂණ ප්‍රතිඵල සහ එය තහවුරු කරන ප්‍රධාන උපකල්පන පිළිබඳව කලින් කල සමාලෝචන පවත්වනු ලබයි. ICAAP ක්‍රමෝපායික සැලසුම්කරණය, අවදානම් රුචි නියම කිරීම, අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය සහ නිශ්චිත පරාමිති තුළ අවදානම කළමනාකරණය කිරීම සඳහා ප්‍රාග්ධනය සැලසුම්කරණයට පීඩන පරීක්ෂණ ක්‍රියාවලියේ ප්‍රතිඵල අත්‍යවශ්‍ය යෙදවුමකි.

සමූහයේ පීඩන පරීක්ෂණ ක්‍රියාවලි පහතින් දැක්වේ.

**පීඩන පරීක්ෂණය**

| ණය අවදානම | වෙළෙඳපොල අවදානම | ද්‍රවශීලතා අවදානම |
|---|---|---|
| • වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීම<br>• අක්‍රිය ණය වර්ගීකරණවල විතැන්වීම්<br>• ඇපවල වටිනාකම පහත වැටීම<br>• ඉහළ ණය ගැණුම්කරුවන්ගේ අක්‍රිය ණයවල වැඩිවීම | • වෙළෙඳපොල පොළී අනුපාතය තුළ වෙනස්වීම්<br>• වෙළෙඳපොල හුවමාරු අනුපාතය තුළ වෙනස්වීම්<br>• වෙළෙඳපොල ස්කන්ධ මිල ගණන්වල වෙනස්වීම් | • චකිත මුදල්වල/පාරිභෝගික අරමුදල් ඉවත්කර ගැනීම්වල බලපෑම<br>• SLAR සහ LCR මත බලපෑම |

**අඩු, මධ්‍යස්ථ සහ ඉහළ පීඩන සිදුවීම්**

**මධ්‍ය ප්‍රාග්ධනය, මුළු ප්‍රාග්ධනය සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය කෙරෙහි බලපෑම**

## මහජන බැංකුවේ අවදානම් කළමනාකරණය තුළ නව සංවර්ධනයන්

2019 දී බැංකුවේ අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් වර්ධනයන් සිදුකරන ලදී.

- II වන ස්ථර ප්‍රාග්ධනය ඉහළ දැමීම සඳහා ණයකර නිකුතුව සිදු කිරීම පිණිස මහජන බැංකුවේ පනත සංශෝධනය කරන ලද අතර ඒ තුළින් බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාතක්මතා අනුපාතය වැඩි කරනු ඇත.
- ණය අවදානම් කළමනාකරණ කාර්යය ශක්තිමත් කිරීම සඳහා කළමනාකරණ කමිටුවක් වන ණය අවදානම් කළමනාකරණ කමිටුව (CRMC) පිහිටුවන ලදී.
- කල්පැනගිය ණය අත්තිකාරම් බුද්ධිමය කළමනාකරණය තුළින් පහත හෙලන ලදී
- ශාඛා ජාලයේ සහ දෙපාර්තමේන්තුවල පදනම් රේඛා සහ අරක්ෂක ප්‍රමිති ඉදිරියට යන පදනමක් මත ශක්තිමත් කරන ලදී.

අවවාදය නොමැතිව මතුවිය හැකි අවදානම සමඟ කටයුතු කිරීමට සමූහයේ සූදානම ශක්තිමත් කරන ලදී. එකී මතුවන අවදානම් සමඟ කටයුතු කිරීමට පහත සඳහන් ක්‍රියාමාර්ග ගනු ලැබිය.

- වැලැක්වීමේ ක්‍රියාමාර්ගයක් ලෙස පහත සඳහන් ආරක්ෂක තක්සේරු කිරීම් පවත්වන ලදී.

| ආරක්ෂාව තක්සේරු කිරීම | 2019 දී පවත්වනු ලබන තක්සේරු කිරීම් ගණන |
|---|---|
| බාහිර උවදුරු තක්සේරු කිරීම් | 4 |
| අභ්‍යන්තර උවදුරු තක්සේරු කිරීම් | 2 |
| වෙබ් ඇප්ලිකේෂන් ආරක්ෂක තක්සේරු කිරීම් | 1 |
| සත්කාර ගවේශන තක්සේරු කිරීම් | 1 |
| රැහැන් රහිත ආරක්ෂක තක්සේරු කිරීම් | 1 |
| ෆයර්වෝල් ආරක්ෂක තක්සේරු කිරීම් | 1 |

- ඉහළින් සුරක්ෂිත සහතිකලත් දත්ත මධ්‍යස්ථාන තුළ සියළුම වැදගත් ක්‍රියාත්මක සහ ආපදා පිළියම් සර්වර් සවිකිරීම.
- සියලුම වැදගත් පද්ධති විධිමත් විවේක කාල සඳහා ආපදා පිළියම් පරීක්ෂණ පවත්වන ලදී.
- අඛණ්ඩව තුන්වන වරටත් ISO 27001:2013 සහතිකය (තොරතුරු ආරක්ෂණ කළමනාකරණ ක්‍රමය) පවත්වා ගැනීම.
- අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ ප්‍රගතිය නියාමනය කිරීමට සියලුම පරිපාලිත සමාගම් සඳහා අවදානම් උපකරණ පුවරුවක් ස්ථාපිත කරන ලදි.
- වඩා යහපත් නියාමනය සඳහා BIRMC වෙත වාර්තාකරණ වාරගණන කාර්තුමව විවේක කාලයන සිට මාසික විවේක කාලයක් දක්වා පහත හෙලන ලදී.

# අවදානම් කළමනාකරණය

## 2020 සඳහා අවධානය

2020 දී, මතුවන අවදානම්වලට වැඩි අවධාරණය ලබාදීම ඇතුළුව සමූහයේ අවදානම් කළමනාකරණ රාමුව තවදුරටත් වැඩි කිරීමට අපි සැලසුම් කරමු. ශාඛා කාර්ය මණ්ඩලයට අවදානම් කළමනාකරණයේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීමට සහ සමූහය තුළ අවදානම් කළමනාකරණය ප්‍රවර්ධනය කිරීමට විස්තීර්ණ පුහුණු වැඩසටහනක් අපි දියත් කරන්නෙමු. ශාඛාවන් හි ණය ඇගයීමේ ක්‍රියාවලිය ඒ සමඟම තවදුරටත් ශක්තිමත් කරන්නෙමු.

| අවදානම | ප්‍රධාන පාලනයන් (පාලන ආයතන) | 2018 සිට අවදානම් මට්ටම තුළ වෙනස්වීම් (වැඩිවීම/ අඩුවීම/ස්ථාවර* | 2020 සඳහා අවධානය |
|---|---|---|---|
| ණය අවදානම | • අධ්‍යක්ෂ මණ්ඩලය<br>• BIRMC<br>• BECC<br>• BIBC<br>• ALCO<br>• CRMC<br>• අවදානම් කළමනාකරණය සහ ණය පාලන දෙපාර්තමේන්තුව (RM&CC)<br>• ණය සමාලෝචන ඒකකය | වැඩිවිය | බැංකුවේ සමස්ථ කාර්යසාධනය ශක්තිමත් කිරීමට ණය ලබාදීමේ ව්‍යවහාරවල වැඩිකළ ආයතනික පාලන නියමයන් සමඟ ණයවල ගුණාත්මතභාවය මනාව කළමනාකරණය කිරීම |
| ණය සංකේන්ද්‍රණ අවදානම | • අධ්‍යක්ෂ මණ්ඩලය<br>• BIRMC | ස්ථාවර | ක්ෂේත්‍රයට අදාළ සාධකවල වෙනස්වන අවදානම් අංග සමඟ සංකේන්ද්‍රණ නිරාවරණය කෙරෙහි අවධානය සහ ඒ අනුව බැංකුවේ නිරාවරණය පවත්වා ගැනීම |
| වෙළෙඳපොල අවදානම | • අධ්‍යක්ෂ මණ්ඩලය<br>• BIRMC<br>• BIBC<br>• ALCO | අඩුවිය | නියමිත පරාමිත තුළ සීමාවන් පාලනය |
| පොළී අනුපාත අවදානම | • BIRMC<br>• ALCO | අඩුවිය | රජයේ වෙළෙඳ කළඹ මනාව කළමනාකරණය කිරීම මගින් විචක්ෂණශීලී සීමාවන් තුළ පොළී අනුපාත අවදානම පවත්වා ගැනීම |
| ස්කන්ධ අවදානම | • BIRMC<br>• BIBC<br>• ALCO | වැඩිවිය | ස්කන්ධ වෙළෙඳපොල තුළ වෙනස්වීම් සමීපව නියාමනය කෙරෙහි වැඩි අවධානය සහ ඒ අනුව ආයෝජන කළමනාකරණය කිරීම |
| විනිමය හුවමාරු අවදානම | • BIRMC<br>• ALCO | ස්ථාවර | විනිමය හුවමාරු අනුපාතය සහ රුපියල උච්ඡාවචනයේ කළමනාකරණය වැඩි කිරීම් |
| ද්‍රවශීලතා අවදානම | • BIRMC<br>• ALCO | ස්ථාවර | ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL)/බාසල් මාර්ගෙ ්පදේශවලට අනුකූලවීම |
| මෙහෙයුම් අවදානම | • BIRMC<br>• BAC<br>• ORMC<br>• CBSL | ස්ථාවර | මෙහෙයුම් අවදානමේ අංග පිළිබඳව සේවකයින්ගේ දැනුම වැඩි කිරීම සහ නව ව්‍යවසාය පාලන අවධානම සහ අනුකූලතාව (EGRC) මගින් මෙහෙයුම් අවදානමේ අලාභ අවස්ථා ග්‍රහනය කිරීමේ ක්‍රියාවලිය වැඩි කිරීම |

| අවදානම | ප්‍රධාන පාලනයන් (පාලන ආයතන) | 2018 සිට අවදානම් මට්ටම තුළ වෙනස්වීම් (වැඩිවීම/අඩුවීම/ස්ථාවර* | 2020 සඳහා අවධානය |
|---|---|---|---|
| සේවක | • BHRMC<br>• HR දෙපාර්තමේන්තුව | ස්ථාවර | මානව සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යයන් ක්‍රමෝපායික ආකාරයකින් වැඩි කිරීම |
| තොරතුරු තාක්ෂණ අවදානම | • අධ්‍යක්ෂ මණ්ඩලය<br>• BIRMC<br>• BITC<br>• IT මෙහෙයුම් කමිටුව<br>• තොරතුරු ආරක්ෂණ නියාමන කමිටුව (ISSC)<br>• තොරතුරු ආරක්ෂණ මෙහෙයුම් කමිටුව (ISOC)<br>• IT දෙපාර්තමේන්තුව<br>• CBSL | වැඩිවිය | CBSL විසින් පනවනලද තොරතුරු තාක්ෂණ අනුකූලතා අවශ්‍යතාවන් කෙරෙහි වැඩි අවධානය |
| අනුකූලතා අවදානම | • අධ්‍යක්ෂ මණ්ඩලය<br>• BIRMC<br>• BAC<br>• ORMC<br>• අභ්‍යන්තර විගණන කාර්යය<br>• නීති දෙපාර්තමේන්තුව<br>• අනුකූලතා දෙපාර්තමේන්තුව<br>• සමාගම් ලේකම් | ස්ථාවර | AML සහ ශක්තිමත් අනුකූලතා ක්‍රමය |
| ක්‍රමෝපායික | • අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රමෝපායික සමාලෝචන කමිටුව (BSPRC)<br>• ක්‍රමෝපායික සැලසුම් දෙපාර්තමේන්තුව | වැඩිවිය | ඝාතීය තාක්ෂණය කෙරෙහි විශේෂ අවධානය ඇතිව ගනුදෙනුකාර හැසිරීම සහ වෙනස්වන බැංකුකරණ ව්‍යාපාර ආදර්ශ කෙරෙහි වැඩිකළ අවධානය |
| කීර්තිනාම | • අධ්‍යක්ෂ මණ්ඩලය<br>• BIRMC | ස්ථාවර | සන්නාම කීර්තිනාමය වැඩි කිරීම සහ වෙළෙඳපොල කොටස වැඩි කිරීම |

## ණය අවදානම

ණය අවදානම යනු ගනුදෙනුකරුවෙකුට හෝ ඔවුගේ ඇපකරුට බැංකුවේ බැඳීම් සපුරාලිමට අසමත්වීම තුළින් ඇතිවිය හැකි අවදානමයි. මෙය ණය සහ අත්තිකාරම් කළඹ, මූල්‍ය සහතික, ගනුදෙනුකරුවන් වෙනුවෙන් නිකුත්කළ ණයවර ලිපි සහ ප්‍රතිග්‍රහනයන්ගෙන් ඇතිවන සමූහයේ ප්‍රධාන අවදානම් නිරාවරණයකි. ණය අවදානම පැහැර හැරීමේ අවදානම සහ ඇපකරුවන්, ව්‍යාපාර අංශ හෝ භූගෝලීය කලාපවල සංකේන්ද්‍රණ අවදානම වැනි ආකාරයක් ගනී.

## ණය අවදානම කළමනාකරණයේ පරමාර්ථ

- ණය වත්කම් කළඹ තුළ විචක්ෂණ කළමනාකරණය තුළින් මනාව විවිධාංගීකරණය කළ කළඹක් පවත්වා ගැනීම
- ප්‍රතිඵල උපරිම කිරීම සහ ප්‍රශස්ථ අවදානම් ප්‍රදාන ගෙවීම් නිදහස්විමක් අත්කර ගැනීම
- අක්‍රීය ණය අවම කිරීම සහ ඉහළ ගුණාත්මකභාවයේ කළඹක් පවත්වා ගැනිම
- වෙනස්වන සාර්ව ආර්ථික සහ ක්ෂේත්‍රයේ සාධක සමඟ වියහැකි ණය අවදානම මුලිකම හඳුනාගැනීම

# අවදානම් කළමනාකරණය

## ණය අවදානම කළමනාකරණය සඳහා ආයතනික ව්‍යුහය




ණය අවදානම් කළමනාකරණයේ සහ පාලනයේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව :ඊෑකක* වෙත පවරනු ලැබ ඇත. මෙම කමිටුවේ වගකීමට පහත දෑ ඇතුළත් වේ:

- BIRMC සහ ව්‍යාපාර ඒකක සමඟ උපදේශකත්වයෙන් ණය ප්‍රතිපත්ති සකස් කිරීම සහ යාවත් කිරීම
- වඩා විශාල සහ ඉහළ ණය නිරාවරණ ඵලදායි ආකාරයෙන් හැසිරවීමට ව්‍යුහ ස්ථාපිත කිරීම
- අවිධිමත් ණය සංකේන්ද්‍රණ තුරන් කිරීමට තනි පුද්ගල ණය නිරාවරණ සහ සමස්ථ කළඹ පිළිබඳ කලින් කල සමාලෝචන පැවැත්වීම
- වඩා ඉහළ ණය නිරාවරණ පිළිබඳ වෙන්කිරීම්වල ප්‍රමාණතාව සහ ඵලදායී කළමනාකරණය සහතික කිරීම
- ණය ශ්‍රේණිගතකරණ ක්‍රම සංවර්ධනය කර පවත්වා ගැනීම
- පෙර නිශ්චිත සීමාවන්ට ඉහළ ණය යෝජනා  අනුමත කිරීම හෝ පහත දැමීම

## ණය අවදානම කළමනාකරණය

ණය අවදානම බැංකුවේ අවදානම බරතබන ලද වත්කම්වලින් 80%කට වැඩිකොටසක් සඳහා දායක වේ. එම නිසා, අඛණ්ඩ පදනමක් මත අපි ණය අවදානම කළමනාකරණය කරන අතර එය හුදෙක් නියාමන අවශ්‍යතාවයට වඩා ඉදිරියට යාමකි. ණය අවදානම් කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ණය අවදානම් කළමනාකරණ රාමුව යටතේ පවත්වනු ලබයි. මෙයට ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, බලතල බෙදීම, අවදානම් ශ්‍රේණිගතකරණ, ඇප කළමනාකරණය, සහ ණය නියාමනය ඇතුළු අවදානම් පාලන ව්‍යුහයක් ඇතුළත්ය.

### ශක්තිමත් අවදානම් ප්‍රතිපත්ති සහ පාලන රාමුව

වෙනස්වන මනා ව්‍යවහාර සහ මතුවන අවදානම් සහ අවස්ථා මත පදනම් වී BECC විසින් කලින් කළ ණය අවදානම කළමනාකරණ වැඩරාමුව සකස්කිරීම, සමාලෝචනය, සහ යාවත් කිරීම සිදුකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ණය ප්‍රතිපත්තිය මගින් බැංකුවේ ණය සංස්කෘතිය, නිශ්චිත අවදානම් රුචියට අනුව විචක්ෂණ සීමාවන් සහ පිළියම් සහ ප්‍රතිසාධන ක්‍රියාමාර්ග නියම කරනු ලබයි.

### වගකීම් සහගතවීමේ සංස්කෘතිය

අවදානම පිළිබඳ දැනුවත් සංස්කෘතියක් සහ වගකීම්සහගත ණයදීම පෝෂණය කිරීමට සමූහය උත්සාහ ගනී. මෙය අත්කර ගැනීමට විස්තීර්ණ අභ්‍යන්තර සන්නිවේදන ක්‍රියාවලියක් සහ කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. ගනුදෙනුකරුවන් ණය පිරිනැමීම පිළිබඳ ප්‍රමාණවත් පැහැදිලි කිරීම් ලබාදෙන අතර, ණය පහසුකම් පිරිනැමීමට හෝ ණය සීමාව වැඩි කිරීමට  පෙර ගනුදෙනුකාර ණය ඇගයීමක් පවත්වනු ලැබේ. අභ්‍යන්තර ණය ශ්‍රේණිගතකරණ ආදර්ශ විවිධ ණය සාධක නියෝජනය කරන අතර ගෙවීම පැහැර හැරීම හෝ අලාභයේ සම්භාවිතාව පුරෝකථනය කරයි.

### බලතල බෙදීම

අධ්‍යක්ෂ මණ්ඩලයට සියලුම ණය අවදානම් නිරාවරණ සඳහා අවසාන බලය සහ වගකීම සතු වේ. ණය බලතල සීමා සඳහා අනුමැතිය අධ්‍යක්ෂ මණ්ඩල විසින් ප්‍රධාන විධායක නිලධාරී වෙත පවරනු ලැබ ඇත. ණය කමිටු සහ ව්‍යාපාර මාර්ග වෙත  අනුමත සීමා නැවත පැවරීමේ බලය ප්‍රධාන විධායක නිලධාරී සතුය. එක් එක් ව්‍යාපාර මාර්ගය වෙත අවදානම පිළිගැනීමේ නිර්ණායක සහ විවිධ මට්ටම්වල දී ණය අනුමත කිරීමේ බලය පැහැදිලිව සම්බන්ධ කර අනුමත කර ඇත.

ණය පහසුකමට යම් පශ්චාත් බෙදාහැරීමේ වැදගත් වෙනස්වීම් (කාලය, ගිවිසුම් හෝ ඇප ව්‍යුහය වැනි) සිදුකිරීමේදී අනුමැතිය අවශ්‍යය. අවදානම් තක්සේරුව සඳහා සහ පශ්චාත් නියාමනය සඳහා වගකිම ණය අනුමත කිරීමේ මාර්ගෝපදේශ සහ දක්ෂතාවන් හි පිරිවිතර ඵලදායි ක්‍රියාත්මක කිරීම තුළින් පැහැදිලිව බෙදා ඇත.

පුද්ගලයින්ට අදාළ ශ්‍රේණියට අනුකූලව ඔවුන් වෙත ණය අනුමත කිරීමේ බලතල බැංකුව විසින් පවරනු ලබන අතර කලින් කල සමාලෝචන පවත්වනු ලබයි.

### බන්ධන්දායියන්ගේ අවදානම් ශ්‍රේණිගතකරණය, විචක්ෂණ සීමා සහ අවම බලතල මට්ටම

බැංකුව විසින් ණය වටිනාකම ඇගයීම සහ ණය ගැණුම්කරුවන්ට ශ්‍රේණිගතකරණ පැවරීම සඳහා අභ්‍යන්තර ඇගයීම් ක්‍රමවේද, ලකුණු කාඩ් සහ බැංකුවේ ලකුණු නවයේ ශ්‍රේණිගතකරණ පරිමාව යොදා ගනු ලබයි. විවිධ අවදානම් ශ්‍රේණිගතකරණ ලකුණු කාඩ් එක් එක් ණය ගැණුම්කරුවන්ගේ වර්ගය සඳහා සංවර්ධනය කර ඇත. මෙම ශ්‍රේණිගතකරණ ලකුණු කාඩ් BIRMC විසින් කලින් කල සමාලෝචනය කර වලංගු කරනු ලැබේ. ඒ සමගම, තනි ණයගැණුම්කරු සීමා (SBL) ණයගැණුම්කරුගේ අවදානම් පැතිකඩ මත පදනම් වී සකස් කර ඇති අතර බැංකුව මෑතදී අවදානම් ශ්‍රේණි මත ගනුදෙනුකාර ණය පැතිකඩ මත පදනම් වී ණය අනුමැතිය සඳහා බෙදාහැරී ණය බලතලවල (DCA) අවම මට්ටම නියම කර ඇත.

### ණය අවදානම අවම කිරීම සහ ඇප කළමනාකරණය

යම් දෙන ලද ගිණුමකින්, ගනුදෙනුකරුවෙකුගෙන් හෝ කළඹකින් වියහැකි ණය අලාභ අවම කිරීමට බැංකුව විවිධ ක්‍රම යොදා ගනී. මෙයට ප්‍රතිඋපලේඛණගත කිරීම, ප්‍රතිව්‍යුහගතකරණය, ඇප ගිවිසුම් මෙන්ම ණය රක්ෂණය, ණය ව්‍යුත්පන්න, සහ ඇප ඇතුළත්ය. බැංකුවේ ඇප ප්‍රතිපත්තිය පරිදි බැංකුව ඇප ලබාගන්නා අතර ප්‍රධාන වර්ගයේ ඇපවලට ජංගම සහ ජංගම නොවන දේපල උකස්කරණ, මුදල් තැන්පතු, පිරියත සහ යන්ත්‍ර, ගබඩාවක උකස්කරණ පොත් ණය ආයතන සහ පුද්ගල ඇප ඇතුළත්ය.

### ණය නියාමනය සහ සමාලෝචනය

ඉදිරියට යන පදනමක් මත අපි අපගේ ණය අවදානම් කොටස් සක්‍රියව නියාමනය කර කළමනාකරණය කරමු. ණය පාලන දෙපාර්තමේන්තුව සමඟ සමීප සහයෝගිත්වයෙන් ව්‍යාපාර ඒකකවල නිලධාරීන් විසින් ණය නියාමනය සිදු කරනු ලැබේ. ණය නිලධාරීන්ට ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ට අදාළ ණය අවදානම කළමනාකරණය කිරීමට අදාළ ප්‍රවීනත්වය සහ පළපුරුද්ද ඇත. සෑම නිලධාරියෙක්ම ඔවුන්ට අදාළ ණය ගැණුම්කරුවන්ගේ කළඹේ ණය අවදානම අඛණ්ඩව නියාමනය කිරීමට වගකිමට බැඳි සිටි.

BIRMC විසින් අභ්‍යන්තර ගැණුම්කරුවන්ගේ ණය ශ්‍රේණිගතකරණය පවත්වනු ලබන අතර වාර්ෂිකව ශ්‍රීලංරු. 500,000 ඉක්මවන සියලුම නිරාවරණ සමාලෝචනය කෙරේ. පරිහානියට පත් ණය හඳුනාගෙන ණය කමිටු වෙත ඉදිරිපත් කරන කාර්තුමය වාර්තා සමඟ සමීපව නියාමනය කෙරේ. සුදුසු පිළියම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා කළමනාකරණයට පහසු කරමින් අක්‍රීය වත්කම් පළමු අදියරේදී හඳුනා ගනී.

### හානිකරණය

ගෙවීම පැහැරහැරි ගනුදෙනුකරුවන් මත අපේක්ෂිත/දරන ලද අලාභ හඳුනා ගැනීමට සම්පූර්ණ හානිකරණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මකව පවති. එකී අලාභ සඳහා හානිකරණ වෙන්කිරීම් ආදායම් ප්‍රකාශනය තුළ සිදු කෙරේ. සමුච්චිත හානිකරණ වෙන්කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ ණය කළඹේ ධාරණ අගයේ අඩුකිරීමක් ලෙස වාර්තා කෙරේ. තනි පුද්ගල හෝ සාමුහික පදනමක් මත සමූහයේ සියලුම නිරාවරණ සඳහා හානිකරණ තක්සේරු කිරීම් කලින් කළ පවත්වනු ලබයි.

**බැංකුවේ වෙන්කිරීම් ආවරණය**




| දෙසැම්බර් 31 දිනට | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| අක්‍රීය ණය (%) | 3.3 | 2.5 | 1.9 | 1.9 | 2.4 |
| වෙන්කිරීම් ආවරණ අනුපාතය - බැංකුව (%) | 60.0 | 72.3 | 97.5 | 110.4 | 98.3 |
| වෙන්කිරීම් ආවරණ අනුපාතය ක්ෂේත්‍රය (%) | 52.3 | 57.4 | 69.9 | 71.8 | 62.3 |

| | මාස 3 දක්වා | | මාස 3-12 | | අවු. 1-3 | | අවු.3-5 | | අවු.5ට වැඩි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2019 | 2018 | 2019 | 2018 | 2019 | 2018 | 2019 | 2018 | 2019 | 2018 |
| ණය සහ ලැබීම්වල වයස විශ්ලේෂණය (%) | 20.0 | 18.8 | 24.2 | 30.6 | 9.3 | 8.2 | 13.1 | 9.4 | 33.3 | 33.0 |

# අවදානම් කළමනාකරණය

## ණය අවදානම් කාර්යසාධන සමාලෝචනය

ශුද්ධ ණය සහ අත්තිකාරම් 2019 අවසානයේදී වාර්ෂිකව 3.5 කින් ශ්‍රීලංරු. බිලියන 1,310.2 දක්වා සුළු වශයෙන් වැඩි වී ඇති අතර එය වාර්තාකරණ කාලසීමාව අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ මුළු වත්කම්වලින් 70%ක් නියෝජනය කරයි. ණය කළඹ තුළ වත්කම්වල ගුණාත්මකභාවය 3.3%ක අක්‍රිය ණය අනුපාතයක් සමඟ වසර අවසානය වන විට තරමක් පිරිහීමට ලක් වූ නමුත් 4.6%ක් වන ක්ෂේත්‍රයේ සාමාන්‍යට වඩා මෙය තවදුරටත් යහපත් අගයකි. වසරේ වැඩි කොටසක් තුළ පැවති අහිතකර ආර්ථික තත්ත්වයන් ද ණය කලඹ තුළ අඩු වර්ධනයට දායක වූ අතර එය අර්ධ වශයෙන් අක්‍රීය ණය අනුපාතය තුළ වැඩිවීමකට හේතු විය.

**ආයතනික ගනුදෙනුකරුවන්ගේ අවදානම් පැතිකඩ**




| ණය | ආයතනික ගනුදෙනුකරුවන් ගණන | |
|---|---|---|
| | 2019 දෙසැම්බර් 31 | 2018 දෙසැම්බර් 31 |
| AAA | – | 1 |
| AA | 11 | 11 |
| A | 50 | 68 |
| BBB | 75 | 71 |
| BB | 84 | 88 |
| B | 70 | 61 |
| CCC | 36 | 38 |
| CC | 20 | 21 |
| C | 17 | 21 |

## ණය සංක්‍රමණ අවදානම

සංක්‍රමණ අවදානම යනු ණය වටිනාකම පහත වැටීමට හේතුවන කාලසීමාවක් පුරා ණය ගැණුම්කරුවෙකුගේ ණය ශ්‍රේණිගතකරණයේ පිරිහීම හේතු කොට ගෙන සිදුවන ණය අවදානමකි. ගනුදෙනුකරුගේ කළඹ ශ්‍රේණිගතකරණයේ පහළ ශ්‍රේණිගතකරණය මගින් මෙය පිළිබිඹු කරයි.

ආයතනික ගනුදෙනුකරුගේ කළඹේ සංක්‍රමණය බැංකුව සමීපව නිරීක්ෂණය කරයි. පසුගිය වසර තුන තුළ පහළට ශ්‍රේණිගතකළ ආයතනික ගනුදෙනුකරුවන්ගේ ගණන පහත වගුව තුළ දැක්වේ.

| වසර | සංක්‍රාන්තියේදී ගනුදෙනුකරුවන් ගණන | පහළට ශ්‍රේණිගත කළ ගනුදෙනුකරුවන් ගණන |
|---|---|---|
| 2017 | 346 | 16 |
| 2018 | 322 | 19 |
| 2019 | 318 | 20 |

## පැහැරහැරීමේ අවදානම

පැහැරහැරීමේ අවදානම යනු ණය ගිවිසුමක් මත ණය ගැණුම්කරු හෝ ඇපකරු විසින් ගිවිසුම් ගත බැඳීම් ඉටු නොකිරීම තුළින් ඇති වියහැකි අලාභයයි.

දැඩි ණය ඇගයීම්, පශ්චාත් ණය බෙදාහැරීමේ නියාමනය සහ ඉහළ අයකිරීමේ අනුපාතයක් තුළින් යහපත් ගුණාත්මක කළඹක් බැංකුව පවත්වා ගෙන ඇත. 2019 දෙසැම්බර් 31 දිනට බැංකුවේ අක්‍රීය ණය අනුපාතය (NPL) 3.3% ක් වූ අතර එය 4.7%ක් වන ක්ෂේත්‍රයේ සාමාන්‍යයට වඩා පහළ මට්ටමක විය.

## පැහැරහැරීමේ ණය කළමනාකරණය

අක්‍රීය ණය/යල්පැනීම් විශ්ලේෂණ, ශ්‍රේණිගතකරණ සංක්‍රමණය විශ්ලේෂණය වැනි අවදානම් කළමනාකරණ මෙවලම් භාවිතා කරමින් අඛණ්ඩ පදනමක් මත අපගේ සියලුම ණය නිරාවරණ අපි සමීපව නියාමනය කරමු. අලාභ පිළිබඳ අවදානම වැඩි වී ඇති ණය නිරාවරණ මුල් අවධියේදී හඳුනා ගැනීමට ක්‍රියාවලි ක්‍රියාත්මක කර ඇත. එකී නිරාවරණ සාමාන්‍යයෙන් පරීක්ෂා කිරීමේ ලැයිස්තුගත කරන අතර අයකරගැනීම උපරිම කිරීම සඳහා ඵලදායි ආකාරයෙන් කළමනාකරණය කෙරේ.

**ණය සහ අත්තිකාරම්වල නිෂ්පාදනය අනුව හානිකරණය - 2019**



## සංකේන්ද්‍රණ අවදානම

සංකේන්ද්‍රණ අවදානම යනු තනි පුද්ගල ඇපකරුවන්, කර්මාන්ත අංශය හෝ භූගෝලය කලාපවලට බැංකුවේ ණය සහ අත්තිකාරම් අසමානව බෙදීයාම හේතු කොට ගෙන ඇතිවන අවදානමයි. රජයට අයත් බැංකුවක් වශයෙන්, මහජන බැංකුව රජයට අයත් ව්‍යවසාය, රජයේ සංවර්ධන වැඩසටහන හා බැඳුණු උකස් සහ නිවාස පහසුකම් සඳහා නිරාවරණ බැංකුව අත්කරගෙන ඇත.

### විශාල නිරාවරණ සඳහා සංකේන්ද්‍රණය (2019 දෙසැම්බර් 31 දිනට ශ්‍රීලංරුම් 100)

| | කර්මාන්ත ක්ෂේත්‍රයේ ගණන | ගනුදෙනුකරුවන්ගේ ගණන | සෘජු නිරාවරණය රු.බි. | වක්‍ර නිරාවරණය රු.බි. | මුළු ගණන රු.බි. | මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස සෘජු නිරාවරණය |
|---|---|---|---|---|---|---|
| SOE සහිත | 19 | 280 | 736,777 | 276,879 | 1,013,657 | 53.24 |
| SOE රහිත | 18 | 245 | 157,319 | 51,936 | 209,255 | 11.37 |

### 2019 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ඉහලම ගනුදෙනුකරුවන් 20 හි තත්ත්වය

| | ඉහළ 3 (%) | ඉහළ 5 (%) | ඉහළ 10 (%) | ඉහළ 20 (%) |
|---|---|---|---|---|
| SOE ඇතුළුව | | | | |
| 2018 | 49 | 56 | 67 | 78 |
| 2019 | 58 | 64 | 73 | 82 |
| SOE ඉවත්කර | | | | |
| 2018 | 15 | 23 | 38 | 54 |
| 2019 | 13 | 20 | 32 | 47 |

### සංකේන්ද්‍රණ අවදානම කළමනාකරණය

තනි ණයගැණුම්කරුවෙකුගේ සීමාව සහ Herfindahl-Hirschman දර්ශකය (HHI) නියාමන සහ පාලන සංකේන්ද්‍රණ මිනුම් කිරීමට යොදා ගනී. රු.මි. 100ට ඉහළ සියලුම නිරාවරණ (සීමාවට ඉහළ හෝ කැපී පෙනෙන) සඳහා HHI ගණනය කරන අතර (සෘජු සහ අසම්භාව්‍ය) ඇපකරුගේ නම සහ අංශ පදනම මත පදනම් වී ගණනය කෙරේ. බැංකුවේ කළඹ කර්මාන්ත ක්ෂේත්‍ර 16කට බෙදනු ලබයි. සංකේන්ද්‍රණයේ එක් එක් මට්ටම සඳහා ඉවසුම් මට්ටම් පහතින් දැක්වේ.

| මිටරය | අඩු සංකේන්ද්‍රණය | මධ්‍යම සංකේන්ද්‍රණය | ඉහළ සංකේන්ද්‍රණය |
|---|---|---|---|
| HHI | <0.15 | 0.15 - 0.25 | >0.25 |

### 2019 මූල්‍ය වර්ෂය සඳහා බැංකුවේ කාර්තුමය තත්ත්වය

| | 2019 මාර්තු 31 | 2019 ජූනි 30 | 2019 සැප්තැම්බර් 31 | 2019 දෙසැම්බර් 31 |
|---|---|---|---|---|
| නම සංකේන්ද්‍රණය (SOE සහිත) | 0.10 | 0.12 | 0.13 | 0.13 |
| නම සංකේන්ද්‍රණය (SOE රහිත) | 0.02 | 0.02 | 0.01 | 0.02 |
| අංශය සංකේන්ද්‍රණය (SOE සහිත) | 0.19 | 0.21 | 0.21 | 0.21 |
| අංශය සංකේන්ද්‍රණය (SOE රහිත) | 0.13 | 0.13 | 0.13 | 0.11 |

# අවදානම් කළමනාකරණය

### නිෂ්පාදනය අනුව කළඹ සංකේන්ද්‍රණය - 2019




### භූගෝලීය සංකේන්ද්‍රණය - 2019




### අංශය අනුව කළඹ සංකේන්ද්‍රණය - 2019




### SOEs ඇතුළු විශාල නිරාවරණවල සංකේන්ද්‍රණය (ශ්‍රීලංරු මිලියන 100ට වැඩි පහසුකම් - 2019




### SOEs ඇතුළු නොවූ විශාල නිරාවරණවල සංකේන්ද්‍රණය (ශ්‍රීලංරු මිලියන 100ට වැඩි පහසුකම් - 2019



## ණය අවදානම් පීඩන පරීක්ෂණය

බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා මට්ටම් මත බලපාන සමහර සිදුවීම් තීරණය කිරීමට ණය අවදානම් පීඩන පරීක්ෂණය පවත්වනු ලැබේ. මෙම වාර්තාව සමාලෝචනය සඳහා BIRMC වෙත ඉදිරිපත් කෙරේ.

| | | | |
|---|---|---|---|
| අක්‍රීය ණයවල වැඩිවීම | කම්පනයේ විශාලත්වය - 5% | කම්පනයේ විශාලත්වය 10% | කම්පනයේ විශාලත්වය 20% |
| සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය | 10.58% | 10.48% | 10.28% |
| සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය | 14.56% | 14.46% | 14.26% |
| අක්‍රීය ණය වර්ගීකරණ තුළ අහිතකර වෙනස්වීම් | කම්පනයේ විශාලත්වය 50% | කම්පනයේ විශාලත්වය 80% | කම්පනයේ විශාලත්වය 100% |
| සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය | 10.39% | 10.22% | 10.10% |
| සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය | 14.37% | 14.20% | 14.08% |
| බැංකුව විසින් දරන ඇපවල FSV හි වැටීම | කම්පනයේ විශාලත්වය 5% | කම්පනයේ විශාලත්වය 10% | කම්පනයේ විශාලත්වය 15% |
| සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය | 10.57% | 10.45% | 10.34% |
| සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය | 14.55% | 14.43% | 14.32% |
| සක්‍රීය ණය අක්‍රීය ණය වෙත ගලායාම | කම්පනයේ විශාලත්වය 1% | කම්පනයේ විශාලත්වය 2% | කම්පනයේ විශාලත්වය 3% |
| සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය | 10.16% | 9.63% | 9.10% |
| සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය | 14.13% | 13.61% | 13.08% |
| විශාල ණයගැණුම්කරුවන් විසින් ගෙවීම පැහැර හැරීම | කම්පනයේ විශාලත්වය 5% | කම්පනයේ විශාලත්වය 7.5% | කම්පනයේ විශාලත්වය10% |
| සංශෝධිත පළමු පෙළ ප්‍රාග්ධන අනුපාතය | 10.40% | 10.26% | 10.12% |
| සංශෝධිත මුළු ප්‍රාග්ධන අනුපාතය | 14.38% | 14.24% | 14.10% |

## වෙළෙඳපොල අවදානම

බැංකුවේ වෙළෙඳපොල අවදානම් නිරාවරණය කෙරෙහි බලපෑමක් ඇති වෙළෙඳපොල අවදානම යනු පොළී අනුපාත, හුවමාරු අනුපාත සහ ස්කන්ධ සහ වෙළෙඳ ද්‍රව්‍ය මිළ ගණන් වැනි වෙළෙඳපොල මෙහෙයවන විචල්‍යතා වල චලනය හේතු කොට ගෙන ඇති වියහැකි අලාභයයි.

බැංකුව එහි උකස් කළඹ තුළින් රත්‍රන් මිලගණන් සඳහා වෙළෙඳ සහ වෙළෙඳ නොවන කළඹවල සහ නිරාවරණය තුළ ඇතිවන පොළී අනුපාත අවදානම තුළින් ප්‍රධාන වශයෙන් වෙළෙඳපොල අවදානමට නිරාවරණය වේ. බැංකුවේ හිමිකාර වෙළෙඳාම සහ විදේශ ව්‍යවහාර මුදලින් නම්කළ ගනුදෙනු හේතු කොට ගෙන විදේශ විනිමය අවදානමට මධ්‍යස්ථව නිරාවරණය වේ. ස්කන්ධ අවදානමට නිරාවරණය සාපේක්ෂව අඩු වෙළෙඳ කළඹ හේතු කොට ගෙන සීමා වේ.

## වෙළෙඳපොල අවදානම කළමනාකරණයේ පරමාර්ථ

- පෙර නිශ්චිත අවදානම් රුචිය තුළ ව්‍යාපාර ඒකකවල අවදානම ප්‍රදාන සම්බන්ධතා ප්‍රශස්ථ කිරීම
- පිළිගතනොහැකි අලාභවල නිරාවරණ වැලැක්වීම
- බැංකුවේ සියලුම මෙහෙයුම් පෙර නිශ්චිත අවදානම් රුචිය තුළ බව සහතික කිරීම

## මහජන බැංකුවේ වෙළෙඳපොල අවදානම නිරාවරණය

| | 2019 | | 2018 | |
|---|---|---|---|---|
| | වෙළෙඳ කළඹ රු. මි. | වෙළෙඳ නොවන කළඹ රු. මි. | වෙළෙඳ කළඹ රු. මි. | වෙළෙඳ නොවන කළඹ රු. මි. |
| | HFT | HTM | HFT | HTM |
| වත්කම් | | | | |
| භාණ්ඩාගාර බිල්පත් | 48,381 | 67,807 | 79,198 | 169,781 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 5,495 | 133,843 | 126 | 111,155 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | – | 6,463 | – | 3,703 |
| ශ්‍රී ලංකා රජයේ බැඳුම්කර | – | 7,689 | – | 7,689 |
| වෙනත් ආයෝජන | 177 | 18,065 | 191 | 18,421 |
| වගකීම් | | | | |
| ණයකර | 12,534 | | 22,714 | |

# අවදානම් කළමනාකරණය

## වෙළෙඳපොල අවදානම් කළමනාකරණය පාලනය

අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේදී, ප්‍රතිපත්ති සහ අවදානම් රුචි සීමා සකස් කරමින් සහ වෙළෙඳපොල අවදානම කළමනාකරණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ලබාදෙමින් බැංකුවේ වෙළෙඳපොල අවදානම් නිරාවරණ සඳහා BIRMC වගකීමට බැඳී සිටී.

විධායක මට්ටමේදී, වත්කම් සහ වගකීම් කමිටුව (ALCO) වෙළෙඳපොල අවදානම කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම සහ පෙර නිශ්චිත අවදානම් රුචිය තුළ වෙළෙඳපොල අවදානම් නිරාවරණ පවත්වාගැනීම සඳහා වගකීමට බැඳී සිටී. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙළෙඳපොල අවදානම තක්සේරු කිරීම, නියාමනය සහ වාර්තා කිරීම ඇතුළුව දෛනික අවදානම් කළමනාකරණ කටයුතු සඳහා වගකීමට බැඳී සිටී.

භාණ්ඩාගාර ඉදිරි කාර්යාල සහ භාණ්ඩාගාර පසු කාර්යාලවල කාර්යයන්ගෙන් ස්වාධීනව බැංකුවේ භාණ්ඩාගාර ගනුදෙනු මැනීමට සහ නියාමනයට භාණ්ඩාගාර මධ්‍ය කාර්යාලය (TMO) ස්ථාපිත කරන ලදී. මණ්ඩලය විසින් නියම කර ඇති අවදානම් සීමාවන්ට අනුකූල වීම (TMO) සහතික කරයි.

## වෙළෙඳපොල අවදානම් කළමනාකරණය සඳහා ආයතනික ව්‍යුහය




## වෙළෙඳපොල අවදානම් කළමනාකරණය

වෙළෙඳපොල අවදානම ප්‍රතිපත්ති, අවදානම් ඇගයීමේ ක්‍රියාමාර්ග සහ අවදානම් සීමා තුළින් කළමනාකරණය කෙරේ.

### ප්‍රතිපත්ති

බැංකුවේ වෙළෙඳපොල අවදානම කළමනාකරණ රාමුවට වත්කම් වගකීම් කළමනාකරණ ප්‍රතිපත්තිය, භාණ්ඩාගාර කළමනාකරණ ප්‍රතිපත්තිය, විදේශ විනිමය අවදානම් ප්‍රතිපත්තිය සහ පීඩන පරීක්ෂණය පිළිබඳ ප්‍රතිපත්තිය ඇතුළත් වේ. මෙම කළමනාකරණ ප්‍රතිපත්ති සියලුම වෙළෙඳපොලට අදාළ අවදානම් හඳුනාගැනීම, තක්සේරු කිරීම, අවම කිරීම, නියාමනය සහ වාර්තා කිරීම සඳහා මාර්ගෝපදේශ ලබා දේ.

### අවදානම තක්සේරු කිරීම

අවදානමේදී වටිනාකම, පරතර කාලසීමාව, සංවේදීතා විශ්ලේෂණ සහ පීඩන පරීක්ෂණ වෙළෙඳපොල අවදානම තක්සේරු කිරීම සඳහා යොදාගනු ලබන මෙවලම් වේ. ඇගයීම් අනුපාත සහ ක්‍රමවේද ස්වාධීන සත්‍යාපනය කිරීමකට යටත් වේ.

### වෙළෙඳපොල අවදානම් සීමා

අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් පසු සීමා තක්සේරු කර ALCO වෙත නිර්දේශ කෙරේ. විවෘත තත්ත්ව සීමා, ඇපකාර සීමා සහ වෙළෙඳ සීමා අනුමත වෙළෙඳපොල අවදානම් සීමා මත පදනම් වී නිශ්චය කෙරේ. TMO සීමා අනුව කාර්යසාධනය නියාමනය කරන අතර දෙසතියකට වරක් ALCO වෙත වාර්තා කරයි. නිෂ්පාදනය, අංශය, ණය ශ්‍රේණිගතකරණ, සහ භූ ප්‍රදේශය මත පදනම් වී සීමා නියාමනය කෙරේ. මෙම සීමා ALCO විසින් විධිමත්ව සමාලෝචනය කරන අතර සිදුවියහැකි වෙළෙඳපොල ගතිකතා මත පදනම් වී අවශ්‍යනම් වඩා පටු සන්නාමවලට සමාලෝචනය කෙරේ.

### කාර්ය සිදුකරණ ස්ථාන

බැංකුවේ වෙළෙඳපොල අවදානම් නිරාවරණ අවදානම් රුචි ප්‍රකාශනය මගින් නිශ්චය කරන මට්ටම්වල ඇති බව සහතික කිරීම සඳහා, විශේෂ කළමනකරණ කාර්යයන් ඇතිකරන අවදානම් සීමා විශේෂයෙන් විස්තර කෙරේ.

## වෙළෙඳපොල අවදානම් සමාලෝචනය

වෙළෙඳපොල අවදානමට දායක වන විවිධ අංග කළමනාකරණය කිරීමට ක්‍රියාත්මක දැඩි ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සහතික කිරීම මගින් බැංකුවට එහි වෙළෙඳපොල අවදානම විධිමත්ව කළමනාකරණය කර අවම කිරීමට දායක වී ඇත. බැංකුවේ භාණ්ඩාගාරය වෘත්තිමය ආකාරයකින් සමස්ථ වෙළෙඳපොල අවදානම කළමනාකරණය කරමින් 2019 වසර තුළ ක්‍රියාත්මක අනුමත සීමා සමඟ අනුකූල වී ඇත.

## පොළී අනුපාත අවදානම (IRR)

බැංකුවේ ශුද්ධ පොළී ආදායම වෙළෙඳපොල පොළී අනුපාතවල උච්ඡාවචනවලින් දැඩි ලෙස බලපෑමට ලක්වන විට බැංකුව පොළී අනුපාත අවදානමට නිරාවරණය වේ. පාදක වූ පොළී ඉපයීම් වත්කම්, පොළිය දරන වගකීම් සහ ශේෂ පත්‍රයෙන් බැහැර අයිතම කෙරෙහි සිදුවියහැකි බලපෑමක් මින් ඇත.

පොළී අනුපාත අවදානමේ වර්ගීකරණ පහත දැක්වේ.

- ප්‍රතිමිලකරණ අවදානම - වෙනස්වන කල්පිරීම් සහිත බැංකුවේ වත්කම් සහ වගකීම්වල ප්‍රතිමිලකරණ කාලවල වෙනස්වීම් තුළින් ඇතිවේ
- පදනම් අවදානම - බැංකු කළඹේ සහ අරමුදල්වල ගම්‍යමාන පිරිවැය මත තත්‍ය පොළී ආන්තිකය සහ අපේක්ෂිත පොළී ආන්තිකය අතර වෙනසින් ඇති වේ.
- එලදායී වක්‍රීය අවදානම - බැංකුවේ ඉපයීම්/වත්කම් වටිනාකම් මත සෘණාත්මක බලපෑමක් ඇති එලදා වක්‍රය තුළ විතැන්වීමෙන් ඇතිවේ

එක් වසරක සීමාව තුළ අවදානමේ ඉපයීම් (1%ක ශුද්ධ බලපෑම)

| | මාස 1 දක්වා | මාස 1-3 | මාස 3-6 | මාස 6-12 |
|---|---|---|---|---|
| ශුද්ධ වත්කම් (රු.මි.) | (114,672) | (58,907) | (84,253) | (438,922) |
| 1%ක වෙනස සඳහා අලාභය (රු.මි.) | (47) | (98) | (316) | (3,292) |

## පොළී අනුපාත අවදානම කළමනාකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය පොළී අනුපාත අවදානම සඳහා අවදානම් රුචිය අනුමත කරන අතර අවදානමට වටිනාකම (VaR) සහ අවදානමේ දී ඉපයීම් (EAR) සඳහා සමස්ථ සීමා සකස් කරයි.

වෙළෙඳපොල අවදානම් ප්‍රතිපත්තිය බැංකුකරණ සහ වෙළෙඳ කළඹ තුළ සියලුම පොළී අනුපාත අවදානම් තත්ත්වයන් හඳුනාගැනීම, මැනීම සහ වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සපයයි. අවදානම් රුචිය තුළ පොළී අනුපාත අවදානම් කළමනාකරණය සඳහා භාණ්ඩාගාරය වගකීමට බැඳී සිටින අතර පොළී අනුපාත අවදානම් නියාමනය සඳහා මධ්‍යම කාර්යාලය වගකීමට බැඳී සිටී.

පොළී අනුපාත අවදානම මැනීම සඳහා යොදාගනු ලබන ශිල්පවලට කාලසීමා පරතර විශ්ලේෂණ. අවදානමට වටිනාකම සහ අවදානමේ දී ඉපයීම් ඇතුළත් වේ. කාලසීමා පරතර සහ පොළී අනුපාත අවදානම වෙත සමස්ථ නිරාවරණය නිශ්චය කර ගැනීම සඳහා අනුපාත සංවේදී වත්කම් සහ වගකීම් ඒවායේ කල්පිරෙන කාලය මත පදනම් වී බාණ්ඩ කරනු ලබයි.

බැංකුවේ වත්කම් සහ වගකීම් කළඹ ප්‍රතිමිලකරණය සහ වෙළෙඳපොල පොළී අනුපාතවල කල්පිරීම්වල නොගැලපීම් සහ ප්‍රවණතා අඛණ්ඩව නියාමනය සඳහා ALCO වගකීමට බැඳී සිටී. වෙනස්වන ආර්ථික දර්ශක හේතු කොට ගෙන බැංකුවේ ඉපයීම් සහ ප්‍රාග්ධනය මත සිදුවියහැකි බලපෑම මැනීම සඳහා බැංකුකරණ සහ වෙළෙඳ කළඹේ IRR නිරාවරණ මත කලින් කල පීඩන පරීක්ෂණය පවත්වනු ලබයි.

නිරාවරණ තනි පුද්ගල වශයෙන් ශ්‍රී ලංකා රුපියලින් අගය කරන අතර සියලුම ව්‍යවහාර මුදල්වල එකතුව එක් එක් ව්‍යාහාර මුදල සඳහා එක් එක් කල්පිරීමේ සන්නාමවල ශුද්ධ එකතුව ගණනය කිරීමෙන් පසු එකතු කරන ලබයි. මුළු තැන්පතු වගකීම්වලින් 25% ඉක්මවන ව්‍යවහාර මුදල් වෙන වෙනම වාර්තා කෙරේ.

පොළී අනුපාත අවදානම මාසිකව ඇගයීමට ලක්කර නියාමනය කර වත්කම් සහ වගකීම් කමිටුවේදී සාකච්ඡා කෙරේ.

## 2018 සහ 2019 සඳහා වත්කම් සහ වගකීම් කල්පිරීමේ නොගැලපීම්

| | මාස 1 දක්වා රු. මි. | මාස 1-3 රු. මි. | මාස 3-6 රු. මි. | මාස 6-12 රු. මි. | මාස 1-3 රු. මි. | මාස 3-5 රු. මි. | අවුරුදු 5ට වැඩි රු. මි. |
|---|---|---|---|---|---|---|---|
| 2019 | | | | | | | |
| අනුපාත සංවේදී වත්කම් | 182,444 | 201,114 | 242,899 | 327,666 | 150,614 | 186,259 | 582,411 |
| අනුපාත සංවේදී වගකීම් | 297,116 | 260,021 | 327,152 | 766,588 | 17,384 | 6,521 | 198,625 |
| කාලසීමා පරතර | (114,671) | (58,907) | (84,253) | (438,922) | 133,230 | 179,738 | 383,786 |
| සමුච්ඡිත පරතරය | (114,671) | (173,578) | (257,832) | (696,754) | (563,524) | (383,786) | 0 |
| 2018 | | | | | | | |
| අනුපාත සංවේදී වත්කම් | 195,846 | 292,603 | 181,154 | 213,097 | 130,789 | 178,116 | 543,098 |
| අනුපාත සංවේදී වගකීම් | 333,603 | 241,207 | 254,921 | 695,843 | 11,522 | 7,697 | 189,910 |
| කාලසීමා පරතර | (137,757) | 51,396 | (73,767) | (482,746) | 119,267 | 170,419 | 353,188 |
| සමුච්ඡිත පරතරය | (137,757) | (86,361) | (160,127) | (642,874) | (523,606) | (353,187) | 0 |

# අවදානම් කළමනාකරණය

**කාලසීමා පරතර විශ්ලේෂණය භාවිතයෙන් 1%ක අහිතකර පොළී අනුපාත වෙනස හේතු කොට ගෙන ස්කන්ධය මත බලපෑම**




## IRR පීඩන පරීක්ෂණය

| | කම්පනයේ විශාලත්වය - 0.25% | කම්පනයේ විශාලත්වය - 0.50% | කම්පනයේ විශාලත්වය - 1.00% |
|---|---|---|---|
| 2019 | | | |
| ඉපයීම් මත බලපෑම (රු.මි.) | 1,992 | 3,982 | 7,970 |
| සංශෝධිත මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (%) | 14.39 | 14.11 | 13.57 |
| 2018 | | | |
| ඉපයීම් මත බලපෑම (රු.මි.) | 2,005 | 4,010 | 8,019 |
| සංශෝධිත මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (%) | 14.17 | 13.87 | 13.28 |

## පොළී අනුපාත අවදානම් සමාලෝචනය

පොළී අනුපාත අවදානම යනු පොළී අනුපාතවල අහිතකර චලනයන් වෙත බැංකුවේ මූල්‍ය තත්ත්වයේ නිරාවරණයයි. මෙම අවදානම බැංකු ව්‍යාපාරයේ අත්‍යවශ්‍ය කොටසක් වන බව සහ ලාභදායිතාවයේ සහ කොටස්හිමි වටිනාකම සඳහා වැදගත් මූලාශ්‍රයක් වන බව අපි පිළිගනිමු. කෙසේවෙතත්, පොළී අනුපාත අවදානමේ අසාමාන්‍ය මට්ටම් බැංකුවේ ඉපයීම් සහ ප්‍රාග්ධන පදනමට සැලකියයුතු තර්ජනයක් ඇති කරයි. එබැවින් පොළී අනුපාත අවදානම කළමනාකරණය කිරීම ඕනෑම බැංකුවක ස්ථාවරතත්වය සඳහා තිරණාත්මක වේ.

මේනිසා, පොළී අනුපාත නිරාවරණ හඳුනාගැනීම, නියාමනය, පාලනය සහ වාර්තා කිරීම සඳහා ප්‍රමාණවත් පියවර බැංකුව විසින් රැගෙන ඇත. බැංකුව රජයේ සුරැකුම්පත්වලින් සැලකියයුතු කළඹක් දරන අතර එයට අදාළ අවදානමේ ප්‍රමාණය එහි මිලගණන් වෙළෙඳපොල තුළ පොළී අනුපාත වෙනස්වීම්වලට සංවේදී වන ආකාරය මත රඳා පවතී.

වෙළෙඳපොල නිවැරදි කියවීම සහ ඒ අනුව කළඹ කළමනාකරණය එකී කළඹට අදාළ පොළී අනුපාත අවදානම කළමනාකරණය කර අවම කිරීමට බැංකුවට හැකියාව ඇති කරයි. ප්‍රතිමිලකරණ අවදානම තුළින් ඇතිවන පොළී අනුපාත අවදානම වත්කම් සහ වගකීම්වල නොගැලපීම් කළමනාකරණය කරමින් අවම කෙරේ. සියලුම අභ්‍යන්තර සහ නියාමන අවදානම් අවම කිරීමේ වැඩසටහන්වලට අනුකූල බව සහතික කිරීමට නියාමනය ක්‍රියාත්මකව පවතින අතර ඒ තුළින් විචක්ෂණ ආකාරයකින් පොළී අනුපාත අවදානම කළමනාකරණය කෙරේ.

## විනිමය හුවමාරු අවදානම

විනිමය හුවමාරු අනුපාතය (FOREX) යනු විනිමය හුවමාරු අනුපාතවල අහිතකර උච්චාවචනයන්ගෙන් බැංකුවේ ඉපයීම් සහ/හෝ ප්‍රාග්ධනයට ඇතිවිය හැකි බලපෑමයි. FOREX  අවදානම වන බැංකුවේ නිරාවරණ ආනයන/අපනයන ගනුදෙනු සහ ප්‍රේෂණ වැනි විදේශ ව්‍යවහාර මුදලින් නම්කල හිමිකාර වෙළෙඳාමෙන් ඇති වේ.

## විනිමය හුවමාරු අවදානම කළමනාකරණය

දැඩි නියාමන රාමුවකින් විදේශ විනිමය ගනුදෙනු පාලනය කරයි. අනුමත යාන්ත්‍රණය සහ සීමාවන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරයි. තනි පුද්ගල ව්‍යවහාර මුදල් නිරාවරණ සහ එම නිරාවරණ සඳහා විවෘත තත්ත්වයන් මත ALCO විසින් නියම කරන  නියාමන නියමයන් සහ සීමා තුළ දැඩි පරිමා සීමාවන් නිශ්චය කරයි. බැංකුවේ අවදානම් රුචිය තුළ FOREX කල්පිරීමේ පරතරවලින් ඇතිවන අවදානම කළමනාකරණය කර ගැනීමට ඉදිරි කල්පිරීම් පරතර සීමා ඇත. FOREX අවදානම සමස්ථ කළමනාකරණය භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව වගකීමට බැඳී සිටී. ඉදිරි, මධ්‍ය. සහ පසු කාර්යාල කාර්යයන් අතර පැහැදිලිව රාජකාරි බෙදාහැරීම මගින් ඵලදායි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයක් සහතික කරයි. මධ්‍ය කාර්යාලය විවෘත තත්ත්වය, වත්කම් වගකීම් කල්පිරීම් සහ මුදල් නිරාවරණ, මුළු නිවාරණ ස්වාධිනව නියාමනය කරයි.

FOREX අවදානම සඳහා නිරාවරණ කළඹ මත අවදානමට අනුව වටිනාකම සහ පීඩන පරීක්ෂාවන් බැංකුව විසින් පවත්වයි. එයට සමගාමීව, අවදානමට අනුව වටිනාකම ගණනය කිරීම් බැංකුවේ භාණ්ඩාගාර කළමනාකරණ ක්‍රමය ( පිනකල් මත පදනම් වී) සහ ජාත්‍යන්තරව පිළිගත් බ්ලූම්බර්ග් ක්‍රමය විසින් පවත්වනු ලබයි. බැංකුවේ ලාභදායිතාවට සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා මටට්ටම්වලට වියහැකි බලපෑම පීඩන පරීක්ෂණය තුළින් අගයනු ලබයි.

## 2019 දෙසැම්බර් 31 දිනට තත්ත්වය:

| ව්‍යවහාර මුදල | ශුද්ධ විවෘත තත්ත්වය | සමස්ථ නිරාවරණ (රු.මි.) |
|---|---|---|
| එක්සත් ජනපද ඩොලර් | 610 | 117,403 |
| යුරෝ | 67 | 9,387 |
| මහ බ්‍රිතාන්‍ය පවුම් | 58 | 3,027 |
| ජපාන යෙන් | (323) | 80 |
| සිංගප්පූරු ඩොලර් | 42 | 59 |
| වෙනත් | – | 1,930 |
| කොටස්හිමියන්ගේ අරමුදල්වල ප්‍රතිශතයක් ලෙස ශුද්ධ | | 0.16% |

## විනිමය අනුපාත අවදානම් පීඩන පරීක්ෂණය

| | කම්පනයේ විශාලත්වය - 5% | කම්පනයේ විශාලත්වය - 10% | කම්පනයේ විශාලත්වය - 15% |
|---|---|---|---|
| 2019 | | | |
| ඉපයීම් මත බලපෑම (රු.මි.) | 137 | 273 | 410 |
| සංශෝධිත මුළු CAR (%) | 14.64 | 14.62 | 14.60 |
| 2018 | | | |
| ඉපයීම් මත බලපෑම (රු.මි.) | 137 | 275 | 412 |
| සංශෝධිත මුළු CAR (%) | 14.45 | 14.43 | 14.41 |

## හුවමාරු අවදානම සමාලෝචනය

විනිමය හුවමාරු අනුපාතය යනු මුල්‍ය ගනුදෙනුවක් දේශිය ව්‍යවහාර මුදල නොවන ව්‍යවහාර මුදලකින් නම් කරනු ලබන අවස්ථාවක පවත්නා මූල්‍යමය අවදානමකි. විනිමය හුවමාරු අවදානම නියාමනය කර කළමනාකරණය කිරීමට  බැංකුව FX ගනුදෙනු සම්බන්ධයෙන් සීමාවන් කිහිපයක් පනවා ඇති අතර ඒවායින් කිහිපයක් නියාමන මාර්ගෝපදේශවලට අනුකූල වේ. භාණ්ඩාගාර කාර්ය මණ්ඩලය විසින් නියමකළ සීමාවන්ට දැඩි අනුකූලතාව සහතික කරමින් FX නිරාවරණය සෑම අවස්ථාවකදිම නියමිත අවස්ථාවන් තුළ මනාව පවත්වා ගැනිම මගින් විනිමය හුවමාරු අවදානම විචක්ෂණශීලීව කළමනාකරණය කර ගැනීමට බැංකුවට හැකි වී ඇත.

## ස්කන්ධ මිල අවදානම

ස්කන්ධ මිලගණන්වල උච්ඡාවචනයන් හේතු කොට ගෙන ඇපයක් හෝ කළඹක වටිනාකම පහත වැටීමක් නිසා ස්කන්ධ මිල අවදානම ඇති වේ. බැංකුවේ ස්කන්ධ මිල අවදානම් නිරාවරණය පරිපාලිත සමාගම්වල බැංකුවේ ක්‍රමෝපායික ආයෝජන රහිත එහි විකිණීමට තබා ඇති කළඹ තුළින් ඇති වේ. බැංකුවේ ස්කන්ධ අවදානම් නිරාවරණය ස්කන්ධ කොටස්වල අඩු ආයෝජන නිසා සාපේක්ෂව සීමා කෙරේ.

## ස්කන්ධ අවදානම සමාලෝචනය

අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව ආයෝජනවලට අදාළ ප්‍රතිපත්ති සකස් කරන අතර නිශ්චිත අවදානම් රුචිය තුළ ආයෝජන කළමනාකරණය කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ආයෝජන බැංකුකරණ ප්‍රතිපත්ති අත්පොත පරිමාව සහ නැවතුම් අලාභ සීමා ඇතුළුව ස්කන්ධ අවදානම කළමනාකරණය සඳහා ක්‍රියාපටිපාටි, මෙවලම් සහ ශිල්ප පැහැදිලි කරයි. වෙළෙඳ ස්කන්ධ සඳහා අනුමත උපරිම නිරාවරණය රු.බි. 1.0කි. කමිටුව කොටස් වෙළෙඳපොල මිලගණන්වල චලනයක්, ආයතනවල කාර්යසාධණය සහ සාර්ව ආර්ථික කොන්දේසි විධිමත්ව නියාමනය කරයි.

**2019 තුළ මාසය අවසානයේ FX NOP සහ දෛනික VAR**



# අවදානම් කළමනාකරණය

බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වෙළෙඳපොල අවදානම් කාර්යය මගින් යෝජිත ස්කන්ධ ගනුදෙනු, හානිකරණ තක්සේරු කිරීම් සහ සීමාවට අනුව නිරාවරණ ස්වාධීනව සමාලෝචනය කරයි. එමෙන්ම වෙළෙඳ නොවන ස්කන්ධ අවදානම් රාමුව තුළ ස්වාධීන පාලනයක් දෙපාර්තමේන්තුව පවත්වනු ලබයි.

## ස්කන්ධ අවදානම පිළිබඳ පීඩන පරීක්ෂණය

| | කම්පනයේ විශාලත්වය - 5% | කම්පනයේ විශාලත්වය - 10% | කම්පනයේ විශාලත්වය - 20% |
|---|---|---|---|
| ස්කන්ධ කළඹ තුළ උපරිම MV | 47 | 95 | 189 |
| ක්‍රමෝපායික ස්කන්ධවල FV | 42 | 84 | 169 |
| මුළු බලපෑම | 89 | 179 | 358 |

## ස්කන්ධ මිල අවදානම සමාලෝචනය

ස්කන්ධ වෙළෙඳපොල ඉහළින් උච්චාවචනයට පත්වියහැකි වුවද, බැංකුවේ ස්කන්ධ කළඹ එහි සමස්ථ වත්කම් කළඹට සාපේක්ෂව නොවැදගත්වන අතර ඒ අනුව ස්කන්ධ කළඹ තුළින් ඇතිවන අවදානම ඉතා සුළුය. රට/ලෝකය/ ස්කන්ධ වෙළෙඳපොල කෙරෙහි වෙළෙඳපොල අවබෝධය පිළිබඳ ආර්ථික කොන්දේසි අඛණ්ඩ පසුවිපරම ස්කන්ධ වෙළෙඳපොල නිවැරදිව කියවීමට සහ ක්‍රමෝපායික ස්කන්ධ ආයෝජන තීරණ ගැනීමට IBU ට සහය වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියමකළ සීමාවන්ට දැඩි අනුකූලතාව සහතික කිරීම සමඟ මෙය ස්කන්ධ වෙළෙඳපොල කාර්යක්ෂමව සැහැල්ලුකර කළමනාකරණය කර ගැනීමට බැංකුවට හැකියාව ලබා දී ඇත.

## වෙළෙඳ ද්‍රව්‍ය අවදානම

මහජන බැංකුව අනාවෘත ඇප තබාගන්නා එහි උකස් කළඹ තුළින් වෙළෙඳ ද්‍රව්‍ය අවදානමට නිරාවරණය වේ. රත්‍රන් මිල ගණන්වල උච්ඡාවචනයන් මගින් රත්‍රන්වලට බලපෑම් සිදු කරයි. බැංකුව උකස් වෙළෙඳපොල තුළ ඉහළ වෙළෙඳපොල කොටසක් දරාගනී.

## වෙළෙඳ ද්‍රව්‍ය අවදානම කළමනාකරණය

වෙළෙඳ ද්‍රව්‍ය කළමනාකරණය කිරීමට ඉතා පරීක්ෂාකාරී ක්‍රියාවලියක් ක්‍රියාත්මකව පවතී. පෙර විසඳීම මිණුම් වලට උකස් භාණ්ඩවල රන් අන්තර්ගතය තීරණය කිරීම. ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි සම්ප්‍රජන්‍ය පැවැත්වීම, විචක්ෂණ වටිනාකමට ණය අනුපාත පවත්වා ගැනීම, රත්‍රන් මිල ගණන් අඛණ්ඩව තක්සේරු කිරීම සහ තරඟකරුවන්ගේ පිරිනැමීම් සහ භාණ්ඩ සොරකම් කිරීමෙන් ඇතිවන අලාභයන්ට අනුව රක්ෂණ ආවරණයක් ලබාගැනීම ඇතුළත්ය.

පශ්චාත් විසඳුම් මිණුම් වලට විධිමත්ව උකස්කළ භාණ්ඩ පිළිබඳ ස්වාධීන ඇගයීම් පැවැත්වීම, 5%ක සාම්පල්වල දෛනික සත්‍යාපනය කිරීම, සහ මුදා නොගත් භාණ්ඩ කලින් කළ වෙන්දේසි කිරීම ඇතුළත්ය.

## වෙළෙඳ ද්‍රව්‍ය අවදානම සමාලෝචනය

බැංකුව දැනට වෙළෙඳ ද්‍රව්‍ය වෙළෙඳාම තුළ නිරත නොවන අතර බැංකුවේ උකස් ව්‍යාපාරයට අදාළවන වෙළෙඳ ද්‍රව්‍ය අවදානමට පමණක් නිරාවරණය වේ. බැංකුව උකස් කටයුතුවල පුරෝගාමියෙක් වන අතර පහසුවෙන් අලෙවිකළ හැකියයි සලකනු ලබන රත්‍රන් මගින් එහි නිරාවරණයට සහය වේ. අවදානම අවම කිරීම සඳහා නියාමකයින් විසින් 70%ට වඩා ඉහල LTV සඳහා 20%ක අවදානම් බර පවරනු ලැබ ඇති අතර බැංකුව සෑම අවස්ථාවකදීම පහසු මට්ටමක LTV අනුපාතය මගින් උකස්වලට ආවේනික අවදානම කළමනාකරණය කරමින් අවම කිරීමට බැංකුව විසින් ක්‍රියාමාර්ග ගෙන ඇත. ඊට අමතරව, රත්‍රන්වල වෙළෙඳපොල මිල ගණන් කලින් කල ඇගයීම් කර විශ්ලේෂණය කරන අතර තරඟකරුවන්ගේ නිෂ්පාදන ලක්ෂණ සමඟ ALCO විසින් නියාමනය කරනු ලබයි.

රත්‍රන්වල නිරවද්‍යතාව ඇගයීම සඳහා බැංකුවල උකස් මධ්‍යස්ථාන තුළ ඉතා නවීකරණ උපකරණ බැංකුව සතු වේ. බැංකුවේ උකස් කටයුතු මෙහෙයවන කාර්ය මණ්ඩලය මනාව පළපුරුදු සහ ප්‍රවීනත්වය ඇති අය වුවත්, උකස් කටයුතු සහ ඒ මත සංකේන්ද්‍රණය වන අවදානම් ක්ෂේත්‍රවලට අදාළ නව තක්ෂණය පිළිබඳ ඔවුන්ගේ දැනුම යාවත් කිරීමට එකී සේවකයින් වෙත කලින් කල පුහුණුව ලබා දේ. උකස් කළඹ සඳහා රක්ෂණ ආවරණය ක්‍රියාත්මකව පවතී. වෙළෙඳපොල රත්‍රන් වටිනාකම සමඟ හානිකරණ වෙන්කිරීම් සිදුකරන අතර පැහැර හැර අත්තිකාරම් අයකර ගැනීමට විධිමත් වෙන්දේසි පවත්වනු ලබයි. තවද, බැංකුව විසින් ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ මූල්‍ය බර පහසු කිරීමට මාසික පදනමක්



මත ආපසු ගෙවීමට පහසුකම් සලසා ඇති අතර මෙය අපගේ ස්වයං බැංකුකරණ ඒකක හරහා ද සිදුකළ හැකිය. මෙම සියලුම ක්‍රියාමාර්ග උකස් කටයුතු සමඟ බැඳුණු එහි වෙළෙඳ ද්‍රව්‍ය අවදානම විචක්ෂණව කළමනාකරණය කර අවම කිරීමට බැංකුව ශක්තිමත් කර ඇත.

## ද්‍රවශීලතා අවදානම

පිළිගත නොහැකි අලාභ දැරීමක් නොමැතිව මතුවන පරිදි සහ අවස්ථාවේදි බැංකුවට එහි ගිවිසුම්ගත බැඳීම් සපුරාලීමට ඇති නොහැකියාව හේතු කොට ගෙන ද්‍රවශීලතා අවදානම ඇතිවේ. ප්‍රාග්ධන අලාභයක් නොමැතිව සහ/හෝ ක්‍රියාවලිය තුළ ආදායම නොමැතිව සුරැකුම්පතක් හෝ ද‍ැඩි වත්කමක් මුදල් බවට පරිවර්තනය කිරීමට ඇති නොහැකියාව හේතු කොට ගෙන මෙය සාමාන්‍යයෙන් සිදුවේ.

## ද්‍රවශීලතා අවදානම කළමනාකරණයේ පරමාර්ථ

- බැංකුවට එහි අරමුදල් බැඳීම් ගෙවීමට සිදුවන අවස්ථාවේදි එය සපුරාලීමට බැංකුව ශක්තිමත් කිරීම
- ද්‍රවශීලතා පීඩනයන්ට ඔරොත්තුදීම සහ
- එහි අවදානම් රුචිය තුළ ද්‍රවශීලතා සහ අරමුදල් අවදානම් කළමනාකරණය කිරීම

## ද්‍රවශීලතා අවදානම කළමනාකරණය

නියමිත අවස්ථාවට බැංකුවට එහි ගිවිසුම්ගත බැඳීම් සපුරාලීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතාව පවත්වා ගනු ලබන බව සහතික කිරීමට මනාම සකස්කළ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ වැඩරාමුවක් බැංකුව සතු වේ. ALCO ද්‍රවශීලතා අවදානම් පාලනයකර කළමනාකරණය කරන අතර අභ්‍යන්තර ද්‍රවශීල ඉලක්ක සහ නියාමන ද්‍රවශීල අවශ්‍යතාවන්ට අනුකූලතාව සහතික කිරීමට බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය අඛණ්ඩව නියාමනය කරයි. නියමිත අවදානම් සීමා තුළ බැංකුවේ අරමුදල් සහ ද්‍රවශීලතා තත්ත්වයන්ගේ දෛනික කළමනාකරණය සඳහා භාණ්ඩාගාර ප්‍රධානී වගකීමට බැඳී සිටී. මධ්‍යම කාර්යාලය විසින් ස්වාධීනව බැංකුවේ ද්‍රවශීලකා මට්ටම් අඛණ්ඩව නියමනය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය. BIRMC සහ ALCO ප්‍රධාන ද්‍රවශීලතා දර්ශක නිශ්චිත පරාමිති තුළ පවතින බව සහතික කිරීමට ඒවායේ කාර්යසාධනය විධිමත්ව සමාලෝචනය කරයි.

## ද්‍රවශීලතා අවදානම කළමනාකරණ රාමුව

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රධාන අංග පහතින් දැක්වේඨ

## ද්‍රවශීලතාව මැනීම

ප්‍රවාහ ප්‍රවේශය සහ කොටස් ප්‍රවේශය යන දෙක ද්‍රවශීලතාව මැනීම සඳහා බැංකුව විසින් යොදා ගනී. ප්‍රවාහ ප්‍රවේශය වත්කම් සහ වගකීම්වල කල්පිරීම මත පදනම් වී විවිධ කාල සීමාවන් හී මුදල් ගලාඒම සහ ගලායාම්වල නොගැලපීම් විශ්ලේෂණය කරයි. කොටස් ප්‍රවේශය ද්‍රවශීලතාව මැනීම සඳහා ප්‍රධාන අනුපාත භාවිතා කරයි. මෙම අනුපාතවලට තැන්පතුවලට ණය අනුපාතය. බැඳීම් අනුපාතය (අයිරාවල භාවිතා නොකළ කොටස/භාවිතා නොකළ අන්තර් බැංකු මාර්ග), ව්‍යවස්ථාපිත ද්‍රවශීල අනුපාත සහ සම්පිච්ත නොගැලපීම් ඇතුළත්ය.

## විවිධාංගීකරණය කළ අරමුදල් පදනම

බැංකුව වෙළෙඳපොල කොන්දේසි, නියාමන ප්‍රතිෂ්ඨාවන්, සහ පොළී අනුපාත චලනයන්ගේ ප්‍රවණතාවන් මත රැඳෙමින් විවිධ මූලාශ්‍රයන්ගෙන් ද්‍රවශීලතා ලබාගනී. තැන්පතුවල බැංකුවේ මුළු අරමුදල් පදනමෙන් 79.6%ක් වන විශාලතම අරමුදල් මූලාශය සමන්විත වන අතර ඉන්පසුව අනෙකුත් ණයගැනීම් (15.3%) සහ කොටස්හිමියන්ගේ අරමුදල් (5.1%) පවතී. බැංකුවට ඉතුරුම්වලට සාපේක්ෂව ඉහළ කොටසක් ඇති අතර එය අර්ධ - ස්ථාවර මූලාශ්‍රයක් ලෙස සලකනු ලබයි.

## සම්භාව්‍ය අරමුදල් සැලැස්ම

බැංකුවේ විස්තීර්ණ සම්භාව්‍යතා අරමුදල් සැලැස්ම (CFP) මගින් පීඩන කොන්දේසි තුළ ද්‍රවශීල අවශ්‍යතාවන් කළමණාකරණය කෙරෙහි මඟපෙන්වීම් ලබා දේ. මේ තුළින් කොටස්හිමියන්ගේ බැඳියාවන් ආරක්ෂා කිරීමට සහ ද්‍රවශීල අර්බුද අවස්ථාවකදි වෙළෙඳපොල විශ්වාසය පවත්වා ගනී. මෙම සැලැස්මට සක්‍රියකරණය සඳහා විශේෂ පූර්ණ ස්ථාන සහ ALCO කණ්ඩායම සහ අලෙවිකරණ සහ පර්යේෂණ ප්‍රධානී සමන්විත වන CFP කණ්ඩායමේ වගකීම් ඇතුළත් වේ. පහත සඳහන් සිදුවීම්වල CFP සක්‍රිය කරනු ලැබේ.

- ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය මාසයක් තුළ 20%ට පහළ වැටීම.
- අන්තර් බැංකු ඇමතුම් මුදල් අනුපාත අඛණ්ඩව හත්වැනි දිනට 25% කින් වැඩිවීම.
- අක්‍රිය ණය අනුපාතය 50%ට වඩා වැඩිවීම.
- අපේක්ෂිත තැන්පතු ඉවත්කරගැනීම් විශාලවීම.
- තැන්පතු අනුපාතයට ඒකාබද්ධ ණය දින 15ක කාලයක් 105% ඉක්මවීම
- වෙළෙඳපොල සහභාගිවන්නන් විසින් ඉවත්කර ගන්නා ඇමතුම් පහසුකම් හෝ බැංකුවේ ණය ගැනීම් සඳහා වෙළෙඳපොල අනුපාතයට වැඩි වාරිකයක් පැනවීම.
- ණය ශ්‍රේණිගතකරණය අංක දෙකට වැඩිපුර පහත වැටීමග

| ප්‍රධාන දර්ශක | 2019 දෙසැම්බර් 31 දිනය තත්ත්වය |
|---|---|
| තැන්පතුවලට ණය අනුපාතය (රු.) | |
| ශ්‍රී ලංකා රුපියල් | 75.7% |
| විදේශීය ව්‍යවහාර මුදල් | 272.4% |
| බැඳීම් අනුපාතය | |
| ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් | 21.7% |
| DBU | 29.5% |
| OBU | 34.6% |

# අවදානම් කළමනාකරණය

**තැන්පතු අනුපාතයට ණය සහ අත්තිකාරම් - 2019**




**තැනපතු ප්‍රභේදනය -2019 දෙසැම්බර් 31**




**තැන්පතු සංකේන්ද්‍රණය - 2019 දෙසැම්බර් 31**




**අරමුදල් විවිධාංගීකරණය - 2019**




## ද්‍රවශීල වත්කම් පීඩන පරීක්ෂණය

| DBU | 2019 දෙසැම්බර් 31 දිනය ශේෂය | සිදුවීම 1 | සිදුවීම 2 | සිදුවීම 3 |
|---|---|---|---|---|
| කම්පනයේ විශාලත්වය | | 5% | 10% | 15% |
| ද්‍රවශීල වත්කම් (රු.බි.) | 446,351 | 446,351 | 446,351 | 446,351 |
| මුළු වගකීම් :(රු.බි.) | 1,511,155 | 1,511,155 | 1,511,155 | 1,511,155 |
| වගකීම්වල වැටීම (රු.බි.) | | 75,558 | 151,116 | 226,673 |
| සංශෝධිත ද්‍රවශීල වගකීම් (රු.බි.) | | 1,435,597 | 1,360,040 | 1,284,482 |
| සංශෝධිත ද්‍රවශීල වත්කම් (රු.බි.) | | 370,793 | 295,236 | 219,678 |
| කම්පනයෙන් පසු ද්‍රවශීල වත්කම් අනුපාතය | 29.54% | 25.83% | 21.71% | 17.10% |

| OBU | 2019 දෙසැම්බර් 31 දිනය ශේෂය | සිදුවීම 1 | සිදුවීම 2 | සිදුවීම 3 |
|---|---|---|---|---|
| කම්පනයේ විශාලත්වය | | 5% | 10% | 15% |
| ද්‍රවශීල වත්කම් (ඇ.ඩො. '000) | 504,026 | 504,026 | 504,026 | 504,026 |
| මුළු වගකීම් (ඇ.ඩො. '000) | 1,456,229 | 1,456,229 | 1,456,229 | 1,456,229 |
| වගකීම්වල වැටීම (ඇ.ඩො. '000) | | 72,811 | 145,623 | 218,434 |
| සංශෝධිත ද්‍රවශීල වගකීම් (ඇ.ඩො. '000) | | 1,383,418 | 1,310,606 | 1,237,795 |
| සංශෝධිත ද්‍රවශීල වත්කම් (ඇ.ඩො. '000) | | 431,215 | 358,403 | 285,592 |
| කම්පනයෙන් පසු ද්‍රවශීල වත්කම් අනුපාතය | 34.61% | 31.17% | 27.35% | 23.07% |

## ද්‍රවශීල වත්කම් සමාලෝචනය

DBU සහ OBU ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාත පහසු මට්ටම්වල ඇති අතර එය 20%ක අවශ්‍ය අනුපාතයට වඩා ඉහළ අගයක් ගනී. සියලුම ව්‍යවහාර මුදල් සහ දේශිය මුදල් සඳහා ද්‍රවශීලතා ආවරණ අනුපාත වසර පුරාම අවශ්‍ය නියාමන අනුපාතවලට වඩා ඉහළින් පැවතුණි.

## මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු අභ්‍යන්තර ක්‍රියාවලි, සේවකයින් සහ පද්ධති ප්‍රමාණවත් නොවීම හෝ අසාර්ථකවීම තුළින් ඇතිවන හෝ ස්වභාවික ආපදා, සමාජ හෝ දේශපාලන සිදුවීම් වැනි බාහිර සිදුවීම් තුළින් ඇතිවන සෘජු හෝ වක්‍ර අලාභයයි. බාසල් II නිර්වචනයට අනුව, මෙහෙයුම් අවදානමට ක්‍රමෝපායික සහ කීර්තිනාම අවදානම හැර නෛතික අවදානම ඇතුළත්ය. ව්‍යාපාර කටයුතු, නිෂ්පාදන සහන ක්‍රියාවලිවල ස්වභාවික චර්යාව තුළ මෙහෙයුම් අවදානම් පවතී.

බැංකුව නිරාවරණය කරන මෙහෙයුම් අවදානම් වර්ගවලට තාක්ෂණික අවදානම, සේවක අවදානම සහ නෛතික අවදානම ඇතුළත්ය.

## මෙහෙයුම් අවදානම් කළමනාකරණයේ පරමාර්ථ

- මෙහෙයුම් දුර්වලතවයන්ගෙන් අලාභ අවම කිරීම සහ ඒ තුළින් සිදුවියහැකි විශාල අවදානම් අලාභ වැළැක්වීම.
- බැංකුව තුළ අවදානම් පිරිවැය ඵලදායි ලෙස කළමනාකරණය කිරීමට විවිධ අංශ සහ ව්‍යාපාර ඒකකවල මෙහෙයුම් අවදානම පිළිබඳ පොදු අවබෝධයක් සංවර්ධනය කිරීම.
- වැදගත් සහ විපත්තිකාර අවදානම්වලට ඵලදායි ලෙස ප්‍රතිචාර දැක්වීමට අභ්‍යන්තර හැකියා ගොඩ නගා ඉහළ නැංවීම.
- අභ්‍යන්තර මූලාශ්‍ර වඩා යහපත් ලෙස කළමනාකරණය තුළින් පිරිවැය ඉතිරි කිරීම සහ බැංකුවේ මෙහෙයුම් ඵලදායි ආකාරයෙන් පාලනය කිරීම.

## මෙහෙයුම් අවදානම් කළමනාකරණය

බාසල් II යෝජනාව පරිදි, මෙහෙයුම් අවදානම් පුළුල් ක්ෂේත්‍ර හතකට වර්ගීකරණය කරනු ලැබ ඇත. බැංකුවේ මෙහෙයුම් අවදානම කළමනාකරණ රාමුව මෙහෙයුම් අවදානම් නිරාවරණය කළමනාකරණය කිරීමට ප්‍රතිපත්ති, ව්‍යුහ සහ ක්‍රියාවලි පැහැදිලිව දක්වයි. ප්‍රතිපත්ති සකස් කිරීමට BIRMC විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහයවන අතර බැංකුව තුළ ශක්තිමත් අවදානම කළමනාකරණ රාමුව සහතික කරයි. මෙහෙයුම් අවදානම් ආරම්භ වන ස්ථානයේදී හඳුනාගනු ලබන ආරක්ෂාව පිළිබඳ පළමු මාර්ගය වන්නේ ශාඛා සහ ව්‍යාපාර ඒකක වේ. ඔවුන් මෙහෙයුම් අලාභ සිදුවීම් අවදානම කළමනාකරණ අංශයට වාර්තා කරන අතර එම අංශය දත්ත පදනමක් පවත්වා ගනී. බැංකුව තුළ මෙහෙයුම් අවදානම් මැනීමට, තක්සේරු කිරීමට සහ වාර්තා කිරීමට ව්‍යුහගත යාන්ත්‍රණ ස්ථාපිත කොට ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය වෙත සහතිකයක් ලබාදීම සඳහා ජාලය පුරා සමස්ථ මෙහෙයුම් අවදානම කළමනාකරණ ක්‍රියාවලිය අභ්‍යන්තර විගණනය කලින් කල සමාලෝචනය කරයි.

# අවදානම් කළමනාකරණය

**මෙහෙයුම් අවදානම් කළමනාකරණ කාර්යයන් පිළිබඳ පාලන ව්‍යුහය**




### මෙහෙයුම් අවදානම හඳුනා ගැනීම සහ ඇගයීම

මෙහෙයුම් අවදානම් දෙපාර්තමේන්තුව මෙහෙයුම් අවදානම් සිදුවිය හැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීමට ව්‍යාපාර ඒකක සමඟ කටයුතු කරයි. සියලුම කාර්ය මණ්ඩලය මෙහෙයුම් අවදානම් නිරාවරණ පිළිබඳ පුහුණු කරන අතර මෙම අවදානම් හඳුනා ගැනීම සහ ඇගයීම සඳහා සක්‍රීයව නිරත වේ.

නිශ්චිත මෙහෙයුම් අවදානම් ප්‍රමිතිවලට අනුව නිරාවරණ ඇගයීම සඳහා ශාඛා ජාලය සහ ප්‍රධාන ව්‍යාපාර ඒකක විසින් අවදානම් හා පාලන ස්වයං ඇගයීම් (RCSA) පවත්වනු ලබයි. ව්‍යාපාර ඒකක විසින් වාර්තා කරන අලාභ සිදුවීම් සහ ආසන්න අතෑරුම්ලට අමතරව, RCSA හි ප්‍රධාන සොයාගැනීම් අවදානම් කළමනාකරණය තුළ වියහැකි පරතර හඳුනාගෙන ඒ සඳහා කාර්යය සැලසුම්වලට මාර්ගයක් සොයා ගනී. නව නිෂ්පාදන, ක්‍රියාවලි සහ කටයුතු මත මෙහෙයුම් අවදානම් ඉදිරියට යන පදනමක් මත ඇගයීම් සිදු කරයි.

### සීමා සහ ඉවසුම් මට්ටම්

මෙහෙයුම් අවදානම් දර්ශක සඳහා විශේෂ සීමා සහ ඉවසුම් මට්ටම් බැංකුවේ අවදානම් රුචි ප්‍රකාශනය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරනු ලබයි. මෙයට අභ්‍යන්තර සහ බාහිර අලාභ සිදුවීම් සංඛ්‍යාව, මෙහෙයුම් වියදම්වල ප්‍රතිශතයක් ලෙස මෙහෙයුම් අලාභවල මුළු වටිනාකම සහ තෘප්තියට වඩා අඩුවෙන් ශ්‍රේණිගතකළ ශාඛා විගණනයේ ප්‍රතිශතය ඇතුළත්ය. BIRMC සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විධිමත් වාර්තාකරණය අවශ්‍ය අවස්ථාවේදී නිවැරදි ක්‍රියාමාර්ග සහතික කරයි.

### මෙහෙයුම් අවදානම අවම කිරීම

බැංකුව තුළ යහපත් මෙහෙයුම් පරිසරයන් පවත්වා ගැනීම සඳහා අවදානම් අවම කිරීමේ ප්‍රතිපත්ති සහ වැඩසටහන් යොදා ගෙන ඇත. මෙයට පහත දෑ ඇතුළත් වේ:

- මෙහෙයුම් අවදානම් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි පිළිබඳ විස්තීර්ණ රාමුව
- ව්‍යාපාර අඛණ්ඩතාව සහතික කිරීමට ආපදා පිළියම් සැලසුම් සහ අර්බුද කළමනාකරණ ක්‍රියාපටිපාටි
- රාජකාරි බෙදීම
- ස්වභාවික ආපදා හෝ ගිනි හෝ උකස්කළ රත්‍රන් භාණ්ඩ සොරකම් කිරීම හේතු කොට ගෙන භෞතික වත්කම්වලට ඇතිවන අලාභ සඳහා රක්ෂණය තුළින් අවදානම මාරු කිරීම
- තෝරාගැනීම සහ නියාමනය සඳහා දැඩි නිර්ණායක යොදා ගැනීම
- සේවක මණ්ඩලයට අඛණ්ඩව පුහුණුව ලබාදීම මගින් අවදානම දැනුවත් සංස්කෘතියක් නිර්මාණය කිරීම.
- දියත් කිරීමට පෙර නව නිෂ්පාදන සහ සේවා පිළිබඳ මෙහෙයුම් අවදානමේ වියහැකි බලපෑම් පිළිබඳ විශ්ලේෂණයක් පැවැත්වීම.
- බාසල් II මාර්ගෝපදේශවලට අනුකූලවන මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රමය

## අවදානම වාර්තා කිරීම

මෙහෙයුම් අවදානම් සිදුවීම්, අලාභ සහ ආසන්න අතැරුම් පිළිබඳ දත්ත පදනමක් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගනු ලබයි. මෙයට මූලික හේතුව, ප්‍රවණතා සහ අවදානම් වාරගණන ක්‍රමානුකූලව හඳුනා ගැනීමට පහසුව ඇති කරයි. සැලකියයුතු අලාභ සිදුවීම්, මතුවන ගැටළු, අවදානම් පාලනය, අවදානම් නියාමනය සහ සමාලෝචනය පිළිබඳ කාර්තුමය වාර්තා සකස් කරනු ලබයි.  මෙම තොරතුරු අවදානම් කමිටු වාර්තාවට ඇතුලත් කරන අතර එය BIRMC වෙත ඉදිරිපත් කෙරේ. එහි වියහැකි බලපෑම සහ වාරගණන මත පදනම් වී, පාලන දුර්වලතා මෙහෙයුම් අවදානම් කමිටුව වෙත වාර්තා කරන අතර, BIRMC වෙත ඉදිරිපත් කරයි.

**මෙහෙයුම් අලාභ**




**සිදුවීම් අනුව මෙහෙයුම් අලාභ (ගණන) - 2019**




**සිදුවීම් අනුව මෙහෙයුම් අලාභ (වටිනාකම ) - 2019**



# අවදානම් කළමනාකරණය

| අලාභ සිදුවීම | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | මුළු ගණනින් ප්‍රතිශතය | වටිනාකම රු. | මුළු වටිනාකමින් ප්‍රතිශතය | සංඛ්‍යාව | මුළු ගණනින් ප්‍රතිශතය | වටිනාකම රු. | මුළු වටිනාකමින් ප්‍රතිශතය |
| අභ්‍යන්තර වංචා | 1 | 0.2 | 5.0 | 5.9 | 6 | 1.2 | 10 | 5.9 |
| බාහිර වංචා | 311 | 66.6 | 53.0 | 62.6 | 289 | 60.1 | 105 | 61.5 |
| රැකියා නියුක්ති පරිචය සහ සේවා ස්ථාන ආරක්ෂාව | 0 | 0.0 | 0.0 | 0.0 | 0 | 0.0 | 0 | 0.0 |
| සේවාදායක, නිෂ්පාදන සහ ව්‍යාපාර පරිචය | 2 | 0.4 | 0.7 | 0.8 | 2 | 0.4 | 3 | 1.8 |
| භෞතික වත්කම්වලට අලාභ | 20 | 4.3 | 2.0 | 2.4 | 77 | 16.0 | 21 | 12.3 |
| ව්‍යාපාර බාධාවන් සහ පද්ධති දුර්වලතා | 12 | 2.6 | 1.0 | 1.2 | 4 | 0.8 | 0.6 | 0.4 |
| ක්‍රියාත්මක කිරීම, බෙදාදීම සහ ක්‍රියාවලි කළමනාකරණය | 121 | 25.9 | 23.0 | 27.2 | 103 | 21.4 | 31 | 18.2 |
| මුළු ගණන | 467 | 100.0 | 84.7 | 100.0 | 481 | 100.0 | 170.6 | 100.0 |

## මෙහෙයුම් අවදානම සමාලෝචනය

සිදුවීම් සහ වටිනාකම යන දෙවර්ගය අනුව බාසල් II අලාභ සිදුවීම් වර්ගය යටතේ පසුගිය වසර දෙක තුළ මෙහෙයුම් අලාභවල සැසැඳීමක් ඉහත වගුවලින් පෙන්නුම් කෙරේ. බාහිර වංචාවන්ගෙන් වාර්තාකළ අලාභ සිදුවීම් මෙහෙයුම් අලාභවල සැලකියයුතු මූලාශ්‍රය වන අතර එය මූලික වශයෙන් උකස්කළ ව්‍යාජ භාණ්ඩවලින් සමන්විත වේ.

කෙසේවෙතත්, දැඩි අවදානම් ඇගයීම්, අඛණ්ඩව දැනුවත් කිරීමේ පුහුණු, වැනි මෙහෙයුම් අවදානම අවම කිරීමට සිදුකළ විශාල උත්සාහයන්ගේ ප්‍රතිඵලයක් ලෙස, පසුගිය වසර පහ තුළ බැංකුවේ සමස්ථ මෙහෙයුම් අලාභ රු.මි. 99.8 දක්වා විශාල වශයෙන් අඩුකරගෙන ඇති අතර එය මුල් වසරවල රු.මි. 150ට ඉහළින් පැවතිණ.

සමස්ථයත් ලෙස බැංකුවේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ කාර්යසාධනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කළ අවම සීමාවන් තුළ පැවතුණි.

## තාක්ෂණික අවදානම

බැංකුවේ මෙහෙයුම් තොරතුරු තාක්ෂණය මත ඉහළින් රඳා පවත්නා බැවින් බැංකුව තාක්ෂණික අවදානමට නෛසර්ගිකව නිරාවරණය වේ. මෙම අවදානම්වලට තොරතුරුවලට කාවැදීම සහ සොරකම් කිරීම වැනි සයිබර් අවදානම, පද්ධති බිඳවැටීම් සහ දෝෂ, තාක්ෂණය යල්පැනීම, සහ ව්‍යාපාර පරිමාවන්ට සහයවීම සඳහා ප්‍රමාණවත් නොවන යටිතල පහසුකම් ඇතුළත් වේ.

මෙහෙයුම් කාර්යක්ෂමතාව, වේගය, පිරිවැය ඉතුරුම් සහ නිරවද්‍යතාව අත්කර ගැනීමට තාක්ෂණය ප්‍රධාන තරඟකාරී වාසියකි. අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ (IT) කමිටුව බැංකුවේ IT කළමනාකරණ රාමුව පාලනය කරන අතර (IT) ක්‍රමෝපායන්, ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි නිර්දේශ කරයි. මෙම කමිටුව බැංකුව තුළ පද්ධති ඒකාබද්ධ කිරීමේ අවශ්‍යාව තීරණය කරන අතර උසස් මෘදුකාංග සහ දෘඩාංග භාවිතා කරයි.

අවදානම් දෙපාර්තමේන්තුව සහ IT දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන IT අවදානම් දර්ශක විධිමත්ම නියාමනය කරන අතර, එය බැංකුව තුළ තොරතුරු පද්ධතිවල ශක්තිමත්භාවය නිශ්චය කර ගැනීමට අත්‍යවශ්‍යය. අනුරූප අවදානම් සීමා සුදුසු නිවැරදි ක්‍රියාමාර්ග සඳහා සෑජු කළමනාකරණ අවධානය සඳහා අර්ථ දක්වා ඇත.

## බැංකුවේ තොරතුරු තාක්ෂණ (IT) අවදානම් දර්ශක

| වර්ගය | පද්ධති | මුළු වැඩකරන කාලය සම සීමාවන්ගේ ප්‍රතිශතයක් ලෙස ලබාගැනීමේ හැකියාව | | තත්‍ය ලබාගැනීමේ |
|---|---|---|---|---|
| ඉතා වැදගත් (මාර්ගගත තත්‍යකාලින පද්ධති) | – මධ්‍යම ATM ස්විචය<br>– NOVUS ස්විචය<br>– මධ්‍ය බැංකුකරණ පද්ධතිය/SIBS අතුරු මුහුණත<br>– SWIFT<br>– ණය/හරපත් කළමනාකරණ පද්ධතිය | >99.9%<br>99.9%-97.5%<br><97.5 | අඩු අවදානම<br>මධ්‍ය අවදානම<br>ඉහළ අවදානම | 99.87% |
| සාමාන්‍ය වැදගත් | – ප්‍රතිරූප ග්‍රහනය සහ ඉදිරිපත් කිරීම් ක්‍රමය<br>– වෙබ් ප්‍රේෂණ ක්‍රමය<br>– පිනකල් භාණ්ඩාගාරය<br>– ATM (තනි පුද්ගල)<br>– වේගවත් බැංකුකරණය<br>– අභ්‍යන්තර බැංකුකරණ ක්‍රමය<br>– ජංගම බැංකුකරණ ක්‍රමය<br>– SLIPS පද්ධතිය | >97.5%<br>97.5%-95%<br><95% | අඩු අවදානම<br>මධ්‍ය අවදානම<br>ඉහළ අවදානම | 99.06% |
| අඩු වැදගත් | – IHRM පද්ධතිය | >90%<br>90%-87%<br><87% | අඩු අවදානම<br>මධ්‍ය අවදානම<br>ඉහළ අවදානම | 99.98% |

### තොරතුරු තාක්ෂණ (IT) අවදානම අවම කිරීම

- බැංකුව මනාව ස්ථාපිත IT පාලන ව්‍යුහයක් පවත්වා ගනී.
- දත්ත අහිමිවීමේ අවදානම වැලැක්වීමට, මාර්ගගත තත්‍ය කාලීන ප්‍රත්‍යුක්තිය, අවදානම් පිළියම් පද්ධති සහ වෙබ් උපස්ථ පද්ධතියක් බැංකුවෙන් බැහැර ස්ථානයක පවත්වා ගනී.
- පරිශීලක පිවිසුම සත්‍යාපනය සඳහා මුරපද සහ පිවිසුම් පාලන සහ තොරතුරුවල පිවිසුම් මට්ටමේදී අවශ්‍ය වලංගුතාව සහ හරිවැරදි බැලීම සක්‍රීය කරණය කිරීම
- සර්වර් කාමර සහ යූපීඑස් කාමරවල ගිනි ආරක්ෂණය සහ දුම් සේවීමේ උපකරණ
- අඛණ්ඩ මෙහෙයුම් සඳහා ආපදා පිළියම් සැලැස්ම
- තොරතුරු ආරක්ෂන නිලධාරියාගේ තත්ත්වය සෘජුවම නියෝජ්‍ය සාමාණ්‍යාධිකාරී වෙත වාර්තා කිරීම සඳහා IT දෙපාර්තමේන්තුවෙන් වෙන්කරන ලදී.
- බැංකුවේ සමස්ථ තොරතුරු තාක්ෂණ පද්ධති සඳහා ප්‍රමිතිකරණය පිළිබඳ ජාත්‍යන්තර ආයතනයෙන් තොරතුරු ආරක්ෂණ කළමනාකරණ පද්ධති (ISMS) සඳහා ලොව ඉහළම පිළිගැනීම වන ISO/IEC 27001:2013 සහතිකය ලබා ගැනිම.

### තොරතුරු තාක්ෂණ (IT) සමාලෝචනය

තොරතුරු තාක්ෂණ (IT) අවදානම විචක්ෂණශීලීව කළමනාකරණය සඳහා යාවත්කාලීන ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි වරින් වර සහතික කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ තොරතුරු ආරක්ෂක ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවල පැවැත්ම.

තොරතුරු ආරක්ෂණ මෙහෙයුම් කමිටුව (ISOC) සහ තොරතුරු ආරක්ෂණ නියාමන කමිටුව (ISOSC) තුළින් තොරතුරු තාක්ෂණ (IT) අවදානම් ඇගයීම් කලින් කල පැවැත්වීම සහ සොයා ගැනීම් පිළිබඳ පසු විපරම් අඛණ්ඩ පදනමක් මත ඉතා කාර්යක්ෂම සහ ඵලදායී ආකාරයෙන් තොරතුරු තාක්ෂණ (IT) අවදානම් කළමනාකරණ කාර්යය ශක්තිමත් කර ඇත.

සියලුම වැදගත් පද්ධතිවල පරිශීලක පිවිසුම් වරප්‍රසාද පිළිබඳ සවිස්තර සමාලෝචන ආශ්‍රිත අවදානම අවම කිරීම සඳහා විධිමත් අයුරින් පවත්වනු ලබයි. වැදගත් බැංකුකරණ පද්ධති පිළිබඳ උවදුරට ලක්වීමේ ඇගයීම (VA) සහ විනිවිදයාමේ පරීක්ෂණ (VAPT) සිදු කිරීමට බාහිර ආරක්ෂණ උපදේශකයින්ගේ සහභාගීත්වය ක්‍රියාත්මකව පවතී. තවද, ඇන්ටි වයිරස්/මල්වෙයා ආරක්ෂාව පිළිබඳ අඛණ්ඩව යාවත් කිරීම සහතික කරනු ලැබ ඇත.

අභ්‍යන්තර විගණනයේ IS විගණන කණ්ඩායම සහ විගණකාධිපති විසින් පත්කරන ලද බාහිර විගණකවරුන් විසින් සිදුකරන බැංකුවේ අභ්‍යන්තර IT/IS කළමනාකරණයේ සඵලත්වය පිළිබඳ කලින් කල සමාලෝචනවලින් තොරතුරු තාක්ෂණ (IT) අවදානම විචක්ෂණ ආකාරයෙක් බැංකුව විසින් කළමනාකරණය කරන බව සහතික කරයි.

### සේවක අවදානම

සේවක අවදානම යනු ප්‍රමාණවත් නොවන මානව සම්පත්, නුසුදුසු සේවක කටයුතු, සහ සේවකයින්ට අදාළ රෙගුලාසිවලට බැංකව අනුකූල නොවීම හේතු කොට ගෙන ඇතිවන අලාභයන්ය. මානව සම්පත්වලට අදාළ අවදානම කළමනාකරණය කිරීම සහ සේවක ප්‍රතිපත්ති, ඵලදායි බඳවාග ැනීමේ ව්‍යවහාර සහ සේවක වටිනාකම් කොටස වැඩි කිරීම කෙරෙහි අඛණ්ඩ අවධානය තුල ඒකාකාරීබව සහතික කිරීම සඳහා විස්තරාත්මක මානව සම්පත් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ස්ථාපිත කර ඇත.

පුහුණු දක්ෂ කාර්ය මණ්ඩලයේ පිරිවැටුම දක්ෂතාව සහ ඵලදායිතාව තුළ පිරිහීමකට හේතු වන අතර එය බැංකුවේ තරඟකාරීත්වය කෙරෙහි බලපානු ලබයි. ඉතා සුදුසුකම් සහිත, දක්ෂ පුද්ගලයින් බඳවාගැනීම සහ අගනා ප්‍රතිඵල ලබාදෙන සේවා පරිසරයක් තුළින් ඉහල කාර්යසාධන සේවකයින් රඳවා ගැනීම අභියෝගයකි.

# අවදානම් කළමනාකරණය

**සේවකයින් ගණන සහ සේවක පිරිවැටුම**




| දෙසැම්බර් 31 දිනට | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| සේවකයින් ගණන | 7,836 | 8,093 | 8,454 | 8,249 | 8,368 |
| සේවක පිරිවැටුම (%) | 3.5 | 4.5 | 3.7 | 4.5 | 5.2 |

## සේවක අවදානම සමාලෝචනය

ඕනැම ව්‍යාපාරයක් තුළ සේවකයින් වඩාත් වැදගත් වත්කම වන අතර, ඔවුන් වඩාත් උවදුරට පත්වන වත්කමකි. එබැවින් සේවක අවදානම් කලින් අපේක්ෂා කිරීම සහ කාර්යක්ෂමව කළමනාකරණය කිරීම බැංකුවේ සාර්ථකත්වය සඳහා ඉහළ වැදගත්කමකි. ව්‍යාපාරය කරගෙන යාමට විශේෂ දක්ෂතා අවශ්‍යවන ප්‍රධාන කාර්යාත්මක ක්ෂේත්‍ර සඳහා ශක්තිමත් අනුප්‍රාප්ත සැලැස්මක් ක්‍රියාත්මකව පවත්නා බව සහතික කිරීම තුළින් එකී පුද්ගලයින් ඉල්ලා අස්වීම/ විශ්‍රාම ගැනීම/ස්ථාන මාරුවීම වැනි අවස්ථාවකදී බැංකුවට වියහැකි ප්‍රතිෂ්ඨාපන පිරිවැය අවම කර ඇත. අඛණ්ඩ පදනමක් මත මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මකව තිබීම තුළින් කාර්ය මණ්ඩලයේ දැනුම/දක්ෂතාව නොමැතිකම හේතුවෙන් ව්‍යාපාරයට ඇතිවන අවදානම් අවම කරමින් කාර්ය මණ්ඩලයේ යාවත්කළ දැනුම/දක්ෂතාව සහතික කරයි. තවද, වැඩවලට බාධා අඩුකිරීම, මූල්‍ය දුෂ්කරතාවන්ගෙන් සේවකයින් සහ ඔවුන්ගේ පවුල් ආරක්ෂා කිරීම යනාදිය සේවක අවදානම් කළමනාකරණය කිරීමේදී ඉතා වැදගත් ලෙස සලකනු ලබයි. බැංකුව තුළ ක්‍රියාක්මක අනුමත සේවක ස්ථාන මාරු ප්‍රතිපත්තියක් බැංකුවට ඇති අතර සේවකයින් ඉහළ මට්ටමින් තෘප්තිමත් බව සේවක පිරිවැය අනුපාතය අවම මට්ටමක බව සහතික කරමින් සේවකයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා සුභසාධන ක්‍රියාමාර්ග බොහොමයක් කාර්ය මණ්ඩලයේ ප්‍රතිලාභය පිණිස ක්‍රියාත්මකව පවතී. මෙම සියලුම ක්‍රියාමාර්ග/අංග සේවක අවදානම විචක්ෂණ ආකාරයෙන් කළමනාකරණයකර ගැනීමට බැංකුව ශක්තිමත් කර ඇත.

## නෛතික අවදානම

නෛතික අවදානම යනු පිළිගත් රෙගුලාසිවලට අනුකූල නොවීම හේතුවෙන් දරනු ලබන දඩමුදල්, දණ්ඩන, කීර්තිනාමය අහිමිවීම වැනි අවදානමය. ගිවිසුම් හෝ ලේඛණ ක්‍රියාත්මක නොවීම හේතු කොට ගෙන ඉපයීම්වලට ඇතිවන අලාභය නෛතික අවදානමේ කොටසක් සාදනු ඇත.

නෛතික අවදානම බැංකුවේ නීති දෙපාර්තමේන්තුව විසින් කළමනාකරණය කරයි. සේවාදායකයින් සමඟ ගිවිසුම්වලට ඇතුළත් වීමේදී විධිමත් අභ්‍යන්තර ක්‍රියාපටිපාටි අනුගමනය කෙරේ. සියලුම නෛතික බැඳුම් ගිවිසුම් බැංකුවේ අනුකූලතා සහ නීති අංශය විසින් නියමිත පරිදි අත්සන් කර ඇති බව සහතික කිරීම සඳහා ව්‍යාපාර ඒකක වගකීමට බැඳී සිටී.

## කීර්තිනාම අවදානම

කීර්තිනාම අවදානම යනු ආයතනික සන්නාමයට අහිතකර ලෙස බලපාන සිදුවීමකින් හෝ අවස්ථාවකින් ඇතිවන වක්‍ර අලාභයයි. බැංකුව පිළිබඳ සෘණාත්මක හැඟීම හෝ ප්‍රසිද්ධිය පිරිවැය සහිත නඩුකිම, ආදායම අඩුවීම සහ ගනුදෙනුකාර පදනම අඩුවීම සඳහා හේතු වේ.

මහජන බැංකුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ රාජ්‍ය බැංකුවක් ලෙස දශක පහකට අධික කාලයක් පුරා නිර්දෝෂී කීර්තිනාමයක් පවත්වා ගෙන ඇත. එමනිසා, කීර්තිනාමය කෙරෙහි සෘණාත්මක බලපෑම අඩුය. බැංකුවේ අවංකකම පිළිබිඹු කරන යහපත් කීර්තානිමය, සේවකයින්ගේ දක්ෂතාව, සහ උසස් නිෂ්පාදන ගුණාත්මකභාවය ගනුදෙනුකරුවන්ගේ විශ්වාසය සඳහා පදනම සකස් කරයි.

පූර්ව අවවාද දර්ශක තුළින් බැංකුව කීර්තිනාම අවදානම නියාමනය කරයි. ගනුදෙනුකාර මැසිවිලි නිරාකරණ ඒකකය කාර්යක්ෂමව සහ ඵලදායීව ගනුදෙනුකරුවන්ගේ සියලුම පැමිණිලි ආමන්ත්‍රණය කරයි. ගනුදෙකරුවන්ට ඔවන්ගේ පැමිණිලි ඉදිරිපත් කිරීමට බැංකුවේ වෙබ් අඩවිය, මුහුණු පොත, ඇමතුම් මධ්‍යස්ථානය, විද්‍යුත් ලිපිනය සහ තැපැල් ලිපිනය වැනි ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

කීර්තිනාම අවදානම ICAAP මාර්ගෝපදේශ මත පදනම් වී බැංකුව විසින් සංවර්ධනය කළ විස්තරාත්මක ලකුණු කාඩ්පතක් මගින් තක්සේරු කෙරේ.

## අනුකූලතා අවදානම

අනුකූලතා අවදානම යනු මූල්‍යමය අලාභ සහ කීර්තිනාම අලාභවලට හේතුවන පිළිගත් නීති, රෙගුලාසි, ආචාර ධර්ම සංග්‍රහ සහ මනා ව්‍යහාර පිළිබඳ ප්‍රමිතිවලට අනුකූල නොවීම හේතුවෙන් ඇතිවන අවදානමය. බැංකුවේ කීර්තිනාමය පවත්වාගෙන ඉහළ නැංවීම සඳහා අනුකූලතාවය සහය වේ.

බැංකුවේ සේවකයින් අදාළ නීති සහ රෙගුලාසි සහ මනා ව්‍යහාරවලට අනුකූල බව සහතික කිරීම සඳහා බැංකුව විසින් අනුකූලතා කාර්යයන් ස්ථාපිත කර ඇති අතර, අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි, සහ පාලන රාමුවක් ක්‍රියාත්මක කර ඇත.

## අනුකූලතා අවදානම කළමනාකරණයේ පරමාර්ථ

- බැංකුවේ කීර්තිනාමය සහ සන්නාමය ඉහල නැංවීම
- ගනුදෙනුකාර විශ්වාසය සහ භාරය වැඩි කිරීම
- බැංකුවේ පහසු සහ කාර්යක්ෂම මෙහෙයුම් ඇති කිරීම
- සේවක අවංකකම ඉදිරියට ගෙන යාම
- ඉහළම තත්ත්වයේ නිෂ්පාදන සහ සේවා ලබාදීම
- බැංකුවේ ශක්තිය සහ ස්ථාවරත්වය වැඩි කිරීම
- බැංකුවේ තිරසාරභාවය ශක්තිමත් කිරීම

## අනුකූලතා අවදානම් පාලනය

අධ්‍යක්ෂ මණ්ඩලය

↓

BIRMC

↓

**නියෝජ්‍ය සාමාණ්‍යාධිකාරී - අනුකූලතාව**

අදාළ බාහිර රෙගුලාසි සහ අභ්‍යන්තර මාර්ගෝපදේශ සමඟ අනුකූලතාව සහතික කිරීමේ ඉහලම වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයට තම අනුකූලතා කාර්යයන්හි දී BAC සහ BIRMC විසින් විධිමත් පරිදි සහය වේ. BIRMC වෙත සෘජුවම වාර්තාකරන විශේෂ අනුකූලතා නිලධාරී විසින් බැංකුව සම්පූර්ණයෙන් අනුකූල බව සහතික කරයි. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ අභ්‍යන්තර විගණන කාර්යය හැර. අනුකූලතා ඒකකය බැංකුවේ අනුකූලතාව පිළිබඳ සමස්ත මට්ටම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහතිකය ලබා දේ.

අනුකූලතා අවදානම ලකුණු පහක ශ්‍රේණිගතකරණ පරිමාණයේ ලකුණු කාඩ්පතක් තුළින් ඇගයීමට ලක් කරන අතර ඒ තුළින් අභ්‍යන්තර මනා පරිචයන් සහ බාහිර රෙගුලාසිවලට බැංකුවේ අනුකූලතාව ශ්‍රේණිගත කරයි. මෙම ලකුණු කාඩ්පත BIRMC වෙත ඉදිරිපත් කෙරේ.

විශේෂ අනුකූලතා නිලධාරී බැංකුවේ අනුකූලතා තත්ත්වය පාලනය කරන අතර බැංකුවේ අනුකූලතාව විධිමත්ව ඇගයීමට ලක්කර BIRMC සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත එහි තත්ත්වය වාර්තා කරනු ලබයි.

අනුකූලතා දෙපාර්තමේන්තුවට පවරනු ලබන රාජකාරි අනිවාර්ය අනුකූලතා කාර්යයන් සහ සහයෝගී අනුකූලතා කාර්යයන් වශයෙන් දෙවර්ගයකි.

### අනිවාර්ය අනුකූලතා කාර්යයන්

- නියාමන අවශ්‍යතාවන්ට අනුකූල නොවීමේ අවදානම ඉවත් කිරීමට හෝ අවම කිරීමට අනුකූලතා ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි සංවර්ධනය කිරීම සහ කීර්තිනාම අවදානමෙන් බැංකුව ආරක්ෂා කිරීම.
- මනා පරිචයන් පැහැදිලිව දක්වමින් සියලුම සේවකයින් සඳහා ආචාරධර්ම/සදාචාර සංග්‍රහයක් සංවර්ධනය කිරීම සහ සෑම මට්ටමකදීම අනුකූලතාව නියාමනය සහ සහතික කිරීම.
- බැංකුවේ සියලුම දෙපාර්තමේන්තු විසින් පිළිපැදියයුතු ඔබගේ ගනුදෙනුකරු හඳුනාගන්න (KYC) රෙගුලාසිය හා බැඳුණු මුදල් විශුද්ධිකරණයට විරුද්ධ ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීම.
- පැහැදිලි සහ කාලීන සන්නිවේදනය සහ අන්‍යෝන්‍ය අවබෝධය මත පදනම් වි නියාමකයින් සමඟ විධිමත් සම්බන්ධතා සහ මනා සේවක සම්බන්ධතා පවත්වා ගැනීම.
- බැංකුව තුළ අනුකූලතා සංස්කෘතියක් පෝෂණය කිරීම.
- බැංකුවට අදාල නව නියාමන සහ රෙගුලාසි සංවර්ධනයන් පිළිබඳ අවධානයෙන් සිටීම සහ ඒවා ඵලදායිව ක්‍රියාත්මක කිරීම.
- අනුකූලතා ගැටළු ඇතිකරන කළමනාකරණයට නියාමන සංවර්ධනයන්, නීතියේ වෙනස්වීම් සහ වෙනත් අදාළ සංවර්ධනයන් ඉස්මතු කරමින් වාර්තා ඉදිරිපත් කිරීම.
- අනුකූලතාවයේ යම් කඩකිරීම් ඉස්මතු කිරීම සහ පිළිගතහැකි කාලරාමුවක් තුළ එය ආමන්ත්‍රණය කර නිවැරදි කිරීම සඳහා කළමනාකරණය සමඟ කටයුතු කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් සහ මාර්ගෝපදේශවලට අනුව සහ නීතියෙන් දක්වා ඇති ආකාරයට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අනුකූලතාව පිළිබඳ වාර්තා මාසිකව ඉදිරිපත් කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (BIRMC) සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) වෙත කාර්තුමය අනුකූලතා වාර්තා සකස් කරඉදිරිපත් කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාසික අනුකූලතා වාර්තා ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ උපදෙස් මත පදනම් වී ගනුදෙනුකාර ප්‍රඥාප්තියක් ස්ථාපිත කිරීම.
- බලපත්‍රලාභි වාණිජ බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් මත පදනම් වි ආයතනික පාලනය පිළිබඳ මනා පරිච සංග්‍රහය සකස් කිරීම සහ එහි අනුකූලතාව ක්‍රියාත්මක කර නියාමනය කිරීම.
- මුදල් විශුද්ධිකරණය වැලැක්වීමට මූල්‍ය බුද්ධි ඒකකය වෙත ගනුදෙනු නියාමනය සහ සැකසහිත ගනුදෙනු වාර්තා කිරීම සඳහා ක්‍රම සහ පාලනයන් ස්ථාපිත කිරීම.
- මුදල් විශුද්ධිකරණයට විරුද්ධවීම ඇතුළුව අනුකූලතාව පිළිබඳ සේවකයින් පුහුණු කිරීම සහ ශාඛා ජාලය හරහා පුහුණුව ඇති කිරීමට ඉ-ඉගෙනුම් මොඩියුලයක් සංවර්ධනය කිරීම.
- තොරතුරු දැනුම්දීමේ ප්‍රතිපත්තියක් සහ චර්යාධර්ම සංග්‍රහයක් සංවර්ධනය කිරීම ඇතුළුව අනුකූලතා අවදානම සහ කීර්තිනාම අවදානම අවම කිරීමට ප්‍රතිපත්ති සකස්කර ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කිරීම.
- ගනුදෙනුකරුවන්ගේ යාවත්කළ ණය විස්තර පවත්වා ගැනීමට ණය තොරතුරු කාර්යාංශය සමඟ සම්බන්ධවීම.

### සහයෝගී අනුකූලතා කාර්යයන්

- නියාමන, කීර්තිනාම, සහ සදාචාර කරුණුවලට අදාළ කළමනාකරණය සහ කාර්ය මණ්ඩලයට උපදේශන සේවා ලබාදීම.
- සාර්ථක හැකියාකරුවෙක් ලෙස අනුකූලතාව ප්‍රවර්ධනය කිරීම.
- දේශීය නියාමන අවශ්‍යතා සමඟ අනුකූලතාව, අභ්‍යන්තර අනුකූලතාව සහ සදාචාර ප්‍රමිති සමඟ අනුකූලතාව සහතික කිරීමට නව නිෂ්පාදන සහ ක්‍රම පිළිබඳ උපදෙස් ලබා දෙමින් යෙදවුම් ලබාදීම.
- අභ්‍යන්තර සහ බාහිර රෙගුලාසිවලට අනුකූලතාව තක්සේරු කිරීමට විධිමත් අන්තරයන් තුළ තක්සේරු කිරීම් සිදු කිරීම සහ සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර සහ බාහිර කමිටුවලට අදාළ අනුකූලතා කාර්යයන් නියෝජනය කිරීම.
- කළමනාකරණය සහ කාර්ය මණ්ඩලයට අනුකූලතාව පිළිබඳ ප්‍රතිපත්ති පැහැදිලිව සන්නිවේදනය කිරීම.
- අනුකූලතා ගැටළු ආමන්ත්‍රණය කිරීමට බැංකුවේ අභ්‍යන්තර සහ බාහිර විගණන කාර්යය සමඟ සම්බන්ධවීම.
- විගණනය මගින් හඳුනාගන්නා අනුකූලතා ගැටළු පිළිබඳ පසුවිපරම් කිරීම.
- විගණකවරු හා සම්බන්ධ වි අවදානම පදනම් තක්සේරු කිරීම මත සසම්භාවී අනුකූලතා විගණනයක් පැවැත්වීම.

# අවදානම් කළමනාකරණය

## අනුකූලතා වාර්තාකරණය

අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් මාසික අනුකූලතා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ. මෙයට ව්‍යවස්ථාපිත සහ අනිවාර්ය අවශ්‍යතා පිළිබඳ දෙපාර්තමේන්තු සහ ශාඛාවල ප්‍රධානීන්ගෙන් සංඥාවන්, අනුකූල නොවීමේ සිදුවීම්, නෛතික අවස්ථාව පිළිබඳ සේවක පුහුණුව, මූල්‍ය බුද්ධි ඒකකය විසින් ගොනුකළ සැකසහිත ගනුදෙනු වාර්තා, ශාඛා තක්සේරු කිරීම්, සමාලෝචන සහ දෙපාර්තමේන්තු තක්සේරු කිරීම් ඇතුළත් වේ. නියමිත කාර්තුව තුළ යම් විශේෂ අනුකූලතාවට අදාළ කරුණු පිළිබඳ BIRMC සහ BAC වෙත කාර්තුමය වාර්තා ඉදිරිපත් කෙරේ.

## මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී අරමුදල්කරණය වැළැක්වීම

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදී අරමුදල්කරණය පිළිබඳ ඉහලයන තත්ත්වය වැළැක්වීම පිණිස බැංකුව සෑම උත්සාහයක්ම ගනු ලබයි. මුදල් විශුද්ධිකරණය, ඔබගේ ගනුදෙනුකරු හඳුනා ගැනීමේ සංකල්පය, ව්‍යුහගත වැඩසටහන් තුළින් ගනුදෙනුකරුගේ නිසි පැවැත්ම පිළිබඳ සංකල්පය, ඉ-ඉගෙනුම් මොඩියුල පිළිබඳ සෑම සේවකයෙක්ම පුහුණු කෙරේ. පොදුවේ විශාල සහ සැකසහිත ගනුදෙනු විශ්ලේෂණය කර ඇගයීමටට ලක්කර මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරනු ලබයි.

## අනුකූලතා අවදානම් සමාලෝචනය

ශාඛා මට්ටමේ අනුකූලතා තක්සේරු කිරීම් ප්‍රාදේශීය අනුකූලතා නිලධාරීන් විසින් පවත්වනු ලබන අතර තෝරාගත් ශාඛාවන්වලදී අනුකූලතා දෙපාර්තමේන්තුව විසින් සමාලෝචන පවත්වනු ලබයි. ප්‍රධාන කාර්යාලයේ දෙපාර්තමේන්තු සහ අනෙකුත් ඒකකවල අනුකූලතා තක්සේරු කිරීම් මාසික පදනමක් මත පවත්වනු ලබයි.

## ක්‍රමෝපායික අවදානම

ක්‍රමෝපායික අවදානම යනු අහිතකර ව්‍යාපාර තීරණ, අභියෝගාත්මක ව්‍යාපාර පරිසරය සහ මෙහෙයුම් පරිසරය තුළ වෙනස්වීම් හේතු කොට ගෙන ඉපයීමට සහ ස්වශක්තතාවට ඇතිවන අලාභයි.

බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය සහ විධායක කළමනාකරණය විසින් අනුමත කරන ලද ක්‍රමෝපායික සැලැස්ම තුළින් එහි ක්‍රමෝපායික අවදානම් කළමනාකරණය කරයි. ව්‍යාපාර ඒකක සමඟ විවිධ මට්ටමේ සාකච්ඡා තුළ පුළුල් පාර්ශ්වකාර සහභාගිත්වය තුළින් ක්‍රමෝපායික සැලැස්ම සකස් කරනු ලබයි. අවදානම වැදගත්වන අවස්ථාවකදී, බැංකුවේ ඉපයීම්වලට සිදුවන බලපෑම වැළැක්වීමට හෝ අවම කිරීමට කළමනාකරණ කාර්යයන් කිහිපයක් සංවර්ධනය කෙරේ. ALCO සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සතිපතා පදනමක් මත ව්‍යාපාර කාර්යසාධනය සොයා ලබනු ලබයි. එක් එක් ව්‍යාපාර ඒකකය සඳහා අයවැයගත ඉලක්කවලට අනුව සැබෑ කාර්යසාධනය නියාමනය කරන අතර ව්‍යාපාර පරිසරය තුළ යම් වෙනස්වීම්වලට ගැලපීම සඳහා ක්‍රමෝපායයන් නැවත සකස් කෙරේ.

බැංකුවේ ප්‍රමාණය. සංකීර්ණතාව සහ මෙහෙයුම්වල විදග්ධතාව, පාරිසරික විශ්ලේෂණ මෙන්ම ගනුදෙනුකරුගේ පැතිකඩ ඇතුළු සාධක ගණනාවක් පිළිබඳ සැලකිල්ලට ගනිමින් ක්‍රමෝපායික අවදානම ලකුණු කාඩ්පතක් භාවිතා කරමින් තක්සේරු කෙරේ. මෙම ලකුණු කාඩ්පත ක්‍රමෝපායික අවදානම අවම කිරීමට සිදුකළයුතු වැඩි දියුණු කිරීම් මතුකර දැක්වීමට යොදා ගනු ලබයි.

## සමූහයේ අවදානම් කළමනාකරණය

බැංකුවේ ප්‍රධාන පරිපාලිත සමාගම් වන පීපල්ස් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී, පිපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී, සහ පිපල්ස් ඉන්සුවරන්ස් පීඑල්සී විසින් අවදානම් නිරාවරණ හඳුනාගැනීම, තක්සේරු කිරීම සහ නියාමනය කිරීම සඳහා අවදානම් කළමනාකරණ රාමුවලට ව්‍යුහගත කෙරේ. මහජන බැංකුව එහි සඳහන් ව්‍යුහ සහ යාන්ත්‍රණ තුළින් සමූහ ආයතනයේ අවදානම් කළමනාකරණ අංශ පාලනය කෙරේ:

- සමූහයේ අවදානම් රුචිය සහ ක්‍රමෝපාය බැංකු මට්ටමින් සකස් කරන අතර වාර්තාකරණ ව්‍යුහ සහ ක්‍රියාවලි සහ සීමාවන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබයි.
- ප්‍රධාන අවදානම් දර්ශක, ඉහළයන මට්ටම්, සීමාවන් එක් එක් සමූහයේ ආයතනවලට නියම කර ඇති අතර ක්ෂේත්‍රයේ ඉම් ලකුණු සමඟ කලින් කල සමාලෝචනය කෙරේ.
- මහජන බැංකුවේ විගණන කමිටුව සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් කලින් කල පරිපාලිත සමාගම්වල අභ්‍යන්තර පාලන යාන්ත්‍රණවල ප්‍රමාණත්වය සමාලෝචනය කර සහතික කරයි.
- සමහර අවස්ථාවලදී, මහජන බැංකුව පරිපාලිත සමාගම්වලට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා අධ්‍යක්ෂවරු නම් කරයි.
- මහජන බැංකුවේ BIRMC විසින කලින් කල පරිපාලන සමාගම්වල අවදානම් පැතිකඩ සමාලෝචනය කරයි.
- බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට සමූහ සමාගම්වල පවත්වනු ලබන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට පිවිසීම ඇත.

2019 දී අවදානම් පිළිබඳ ප්‍රධාන වර්ගීකරණ සඳහා සමූහයේ අවදානම් ශ්‍රේණිගතකරණ

| | ණය අවදානම | වෙළෙඳපොල අවදානම | මෙහෙයුම් අවදානම | අනුකූලතා අවදානම | ක්‍රමෝපායික අවදානම | කීර්තිනාම අවදානම |
|---|---|---|---|---|---|---|
| මහජන බැංකුව | අවම | අවම | අවම | අවම | අවම | අවම |
| පීපල්ස් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී, | මධ්‍යම | අවම | අවම | අවම | මධ්‍යම | අවම |
| පිපල්ස් ඉන්සුවරන්ස් පීඑල්සී | මධ්‍යම | අවම | අවම | අවම | මධ්‍යම | අවම |




## පීපල්ස් වින්

ආයතනික සේවාදයකයින් සඳහා විශේෂයෙන් නිර්මාණය කළ, මෙම මොඩියුලය අන්තර්ජාල බැංකුකරණ බිහිදොරෙන් සහ ජංගම ඇප් එකකින් ලබාගත හැකිය. 2018 ජූලි එය දියත් කිරීමේ සිට, ගනුදෙනුකරුවන් 3,500 කට වැඩිපුර ඩිජිටල් බැංකුකරණයේ ප්‍රතිලාභ සහ පහසුව ලබාගෙන ඇත.



# කාර්යසාධන වාර්තා

140 පාරිභෝගික බැංකුකරණය
144 ව්‍යවසාය බැංකුකරණය
146 ආයතනික බැංකුකරණය
148 භාණ්ඩාගාර ඒකකය
150 විදේශ ගනුදෙනුකාර සේවා සහ ජාත්‍යන්තර බැංකුකරණය

# පාරිභෝගික බැංකුකරණය

පාරිභෝගික බැංකුකරණය ජීවිතයේ සෑම අවස්ථාවකදීම ශ්‍රී ලංකාව පුරා මිලියන 14කට වැඩි පුද්ගලයින් වෙත සේවය සලසයි. ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ ජීවිතයේ සෑම අදියරකදිම ඔවුන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීමට අපි බැංකුකරණ විසඳුම් ලබා දෙමු. අපගේ බැංකුකරණ නිෂ්පාදන පරාශය තැන්පතු, උකස්කරණය, පුද්ගල ණය සහ ණයපත් සහිත සේවය ලබාදෙමින් ගනුදෙනුකරුවන්ට මානව ස්පර්ශකයක් සහිතව ලබාදෙන්නෙමු.

පාරිභෝගික බැංකුකරණය ආසන්න වශයෙන් බැංකුවේ මුළු තැන්පතුවලින් 88.7%ක් සඳහා සහ බැංකුවේ මුළු ණය සහ අත්තිකාරම්වලින් 35.5%ක් සඳහා දායක වේ. බැංකුවේ ක්‍රමෝපායික වැඩසටහනට සහ මූල්‍ය අන්තර්කරණය ඉදිරියට ගෙන යාමේ රජයේ දැක්ම හා අපි සමීපව බැඳී සිටින අතර, අපගේ ගනුදෙනුකාර සහ ප්‍රජා කේන්ද්‍රීය ප්‍රවේශය සහ ශ්‍රී ලංකාව තුළ විශාලතම ශාඛා ජාලය තුළින් ඔවුන්ගේ ජීවිත ඉහළ නංවමු. වසර පුරා, ඩිජිටල්කරණය. පිරිවැය කාර්යක්ෂමතා සහ ක්‍රියාවලි සරලකරණය තුළින් ඵලදායිතාව සහ සේවාදායක අත්දැකීම වර්ධනය කිරීම අපි තවදුරටත් සිදු කරමු.

පුළුල් ගනුදෙනුකාර පදනමකට සේවය කිරීම සඳහා දිවයින පුරා සම්පූර්ණයෙන් සම්බන්ධිත ශාඛා විවෘත කිරීම, ස්වයං බැංකුකරණ ඒකක (SBUs), කුටි සහ ඒටීඑම් යන්ත්‍ර ස්ථාපිත කිරීම මගින් අපගේ ළඟාවීම අපි වැඩි කරමු. විශේෂයෙන්, වසර තුළ ප්‍රධාන නගර ආවරණය කරමින් සහ සතියක දින 7 පුරාම දිනයක පැය 24 තුළ කාර්යක්ෂම සහ බාධාරහිත සේවයක් අපගේ ගනුදෙනුකරුවන් වෙත පිරිනමමින් අපි ස්වයං බැංකුකරණ ඒකක 29ක් ස්ථාපිත කළෙමු. එක වහලක් යට දී පහසුවෙන් මුදල් ලබාගැනීම, මුදල් තැන්පත් කිරීම, උපයෝගිතා බිල්පත් ගෙවීම සහ උකස් නිදහස් කර ගැනීම සඳහා ගනුදෙනුකරුවන්ට හැකියාව ලබා දී ඇත.

අපගේ වේගවත් බැංකුකරණ ආදර්ශය තුළින්, ගනුදෙනුකරුවන්ට ලියකියවිලි වල කරදරය නොමැතිව ආසන්න වශයෙන් මිනිත්තු 10ක කෙටි කාලයකින් ජංගම සහ ඉතුරුම් ගිණුම් විවෘත කිරීමට, සහ මුදල් තැන්පත් කිරීමට හැකිය. 2019 මූල්‍ය වර්ෂය අවසානයේදී, ගනුදෙනුකරුවන් 568,495ක් වේගවත් බැංකුකරණ ආදර්ශය තුළින් අත්කර ගනු ලැබීය.

ගනුදෙනුකාර සේවය පෙරනොවූ විරූ ඉහළ මට්ටමක් දක්වා අරගෙන යමින්, පාරිභෝගික ණය උත්පාදන ක්‍රමය (RLOS) පාරිභෝගික ගනුදෙනුකරුවන් සඳහාණය අනුමත කිරීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කිරීම අපි ආරම්භ කළෙමු. මෙය කාලීන පියවරක් වන අතර, ඒ තුළින් වේගයෙන් සහ කාර්යක්ෂමව පුද්ගල ණය ලබාගැනීමට ගනුදෙනුකරුවන්ට ඉඩ ලබා දේ. මෙම ක්‍රමයෙන් අපහසු කඩදාසි වැඩ ඉවත් කරමින් ඩිජිටල් අවකාශයක් හරහා ණය මුදල සහ වෙනත් ප්‍රතිමාන මත රැඳෙමින්, ණය අනුමත කිරීම/ලබාදීම ඉහල පහසුව, වේගවත් ලබාදීම සහ වර්ධිත කාර්යක්ෂමතාව අපගේ ගනුදෙනුකරුවන් වෙත ලබා දෙමින් පැයක සිට දින හතක කාසිමාවක් තුළ ආරම්භ කිරීම. ඉදිරිපත් කිරීම, නිර්දේශ කිරීම සහ අනුමත ක්‍රියාවලිය සඳහා පහසුකම් සලසා ඇත.

අපගේ කළඹ තුළ ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා, එක් එක් නිෂ්පාදන වර්ගය සඳහා නිෂ්පාදන කළමනාකාරවරු පත්කර ඇති අතර අපගේ ණය ඇගයීම් ක්‍රියාවලිය ශක්තිමත් කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2019 දෙසැම්බර් 31 දිනට 1.5%ක අවම අක්‍රීය ණය අනුපාතයක් සාර්ථකව පවත්වා ගැනීමට අපි සමත් වී ඇත.

## ක්‍රමෝපායික ප්‍රමුඛතා

| ක්‍රමෝපායික ප්‍රමුඛතා | 2019 දී ප්‍රගතිය |
|---|---|
| පාරිභෝගික ණය අනුමත ක්‍රියාවලිය (RLOS) ස්වයංක්‍රීය කිරීමට පාරිභෝගික ණය උත්පාදන ක්‍රමය දියත් කිරීම | ශාඛා 37ක් තුළ RLOS දියත් කරන ලදි |
| CASA තැන්පතු කළඹ වැඩිවීම | CASA කළඹ වාර්ෂිකව 5%කට වඩා වැඩිවීම |
| නව ගනුදෙනුකරුවන් අත්කර ගැනීම්වල වැඩිවීම | නව ගනුදෙනුකරුවන් 67,349ක් 2019 දි අත්කර ගැනීම |
| යහපත් ගුණාත්මක කළඹක් පවත්වා ගැනීම | NPL 1.5%ක අවමයක පැවතීම |

**නිෂ්පාදන සංයුතිය**



## නිෂ්පාදන කළඹ

### ණය නිෂ්පාදන

- වෘත්තිකයින් සඳහා ණය
  පීපල්ස් ප්‍රොෆෙෂනල් ලෝන් (People's professional loans)
- රථවාහන ණය
  පීපල්ස් ඔටෝ (People's Auto)
- අධ්‍යාපනික ණය
  පීපල්ස් විස්ඩම් (People's Wisdom)
- රාජ්‍ය සේවක නිවාස ණය
  People's Bank JAYA NIVASA Housing Loans
- ගුරුවරුන් සඳහා ණය යෝජනා ක්‍රමය
  *ගුරුසෙත* (Gurusetha)
- හෙදියන් සඳහා ණය යෝජනා ක්‍රමය
  *සුව සෙවන* (Suwa Sevana)
- පාරිභෝගික ණය
  *පහසු* (Pahasu)
- හමුදා සඳහා ණය යෝජනා ක්‍රමය
  *දැයවිරු ප්‍රනාම* (Deyaviru Pranama)
- උකස් ණය

### ඉතුරුම් නිෂ්පාදන

- බාලවයස්කාර
  *ඉසුරු උදාන* (Isuru Udana)
  *සිසු උදාන* (Sisu Udana)
- තරුණ ඉතුරුම්
  යස් (Yes)
- කාන්තා ඉතුරුම්
  *වනිතා වාසනා* (Vanitha Vasana)
- වෙනත් ඉතුරුම්
  *ජන ජය* (Jana Jaya)
  ISA
  *පරිනත* (Parinatha)
  හාර්වෙස්ට් (Harvest)
  මුදරබා (Mudarabah)
- ස්ථිර තැන්පතු ඉල්ලුම්
- ඉතුරුම් තැන්පතු
- විදේශ ව්‍යහාර මුදල් තැන්පතු

### මාර්ග නිෂ්පාදන

- හරපත් සහ ණයපත්
- මුදල් තැන්පතු යන්ත්‍ර, ස්වයං සේවා කුටි, පීපල්ස් නෙට් සහ පීපල්ස් මොබයිල් බැන්කින්
- පාසැල් මුදල් තැන්පතු යන්ත්‍ර

## උකස් ණය

ශ්‍රී ලංකාව තුළ උකස් ණය ව්‍යාපාරයේ පුරෝගාමීන් වන අපි අඛණ්ඩව ඉහළම වෙළෙඳපොල කොටස දරාගෙන සිටිමු. අපගේ උකස් ණය කළඹ 2019 දෙසැම්බර් 31දිනට රු.බි. 162, 58ක් විය. උකස් ණය අංශයේ ආදායම සඳහා බැංකුවේ ආදායම සඳහා ඉහළින් දායක වේ. දැඩි නියාමනය සහ ණය ඇගයීම තුළින්, අපි අක්‍රීය ණය අනුපාතය ඉතා අඩු මට්ටමක සාර්ථකව පවත්වා ගෙන ඇත.

**උකස් ණය කළඹ තුළ වර්ධනය**



# පාරිභෝගික බැංකුකරණය

## අඩු පිරිවැය තැන්පතු

යම් තැනැත්තෙකුගේ සමස්ථ ජීවන රටාව ආවරණය කරමින් අපි නිෂ්පාදන ලබා දෙමු. ශ්‍රී ලංකාව තුළ බැංකු ක්ෂේත්‍රයේ දෙවන විශාලතම තැන්පතු පදනම අප සතුවන අතර එය 2019 දෙසැම්බර් 31 දිනට අඩු පිරිවැය තැන්පතුවලින් රු.බි. 566.3ක් විය. වසර පුරා, තැන්පතු පදනම වැඩි කිරීමට තැන්පතු සේවයේ යෙදවීමේ වැඩසටහන් කිහිපයක් ආරම්භ කරන ලදී. ජාතියේ අනාගතය වන ළමුන් කෙරෙහි අපි විශේෂ අවධානය යොමු කරමු. වසර තුළ ළමුන් අතර ඉතුරුම් පුරුද්ද ප්‍රවර්ධනය කිරීම සඳහා පාසැල් බැංකු ඒකක අටක් ආරම්භ කරන ලදී. කාසි තැන්පත් කිරීම, සිසු උදාන ගිණුම්වලට මුදල් තැන්පත් කිරීම සහ ශේෂය දැනගැනීම වැනි සේවා රාශියක් විශේෂයෙන් අදාළ පාසලේ වර්ණ සමඟ නිර්මාණය කළ සිසුන්ගේ විස්තර සහිත ඔවුන් අතැති NFC කාඩ්පත භාවිතා කරමින් සිදු කිරීමට පහසුකම් සකසා ඇත. සිසුවෙක් විසින් එක් එක් තැන්පතුව සිදුකරන අවස්ථාවේදී කෙටි පණිවිඩයක් තුළින් දෙමව්පියන් වෙත එය දැනුම් දෙනු ලබයි.

වැඩිකළ ගනුදෙනුකාර පහසුව ලබාදෙමින්, වසර තුළ ගනුදෙනුකරුගේ නිවසට විත් ගනුදෙනුකාර තැන්පත් එකතු කිරීමට අතින් දරන යන්ත්‍ර 850ක් පමණ දියත් කරන ලදී. අපගේ කෙටිකාලින තැන්පතු පදනම වැඩි කිරීමට රන් ඔඩපන ණය අපි ආරම්භ කළෙමු.  තැන්පතු පදනම සඳහා බාහිර ශාඛා තවදුරටත් ප්‍රධාන දායකයා ලෙස රැඳී පවතී. තැන්පතුවලින් වැඩි කොටසක් 2019 දි බස්නාහිර පළාතින් බැහැරව සේවයේ යොදවා ඇත යන කාරණය මෙයින් පෙන්නුම් කරයි.

සිසු උදාන ගිණුම් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පාසැල් ළමුන් වෙත ඩිජිටල්කරණය සමීප කරවීම පිණිස එහි විශාල ඩිජිටල්කරණ ව්‍යාපෘතියේ කොටසක් ලෙස ස්වයං බැංකුකරණ ඒකකයක ආදර්ශයක් වන පාසැල් මුදල් තැන්පතු යන්ත්‍ර (SCDM) හඳුන්වා දෙමින් තවත් එක් වැදගත් සන්ධිස්ථානයක් කරා බැංකුව පැමිණ ඇත. කාඩ්පතක් සමඟ ගනුදෙනු කිරීමේ පහසුකම බැංකුව පුළුල් කර ඇත.

**අඩු පිරිවැය තැන්පතු කළඹ තුළ වර්ධනය**




**2019 සඳහා තැන්පතු සේවයේ යෙදවීම - පළාත් අනුව**




## පුද්ගල ණය

බැංකුකරණ ක්ෂේත්‍රය තුළ විශාලතම ණය සහ අත්තිකාරම් කළඹ සහිත වෙළෙඳපොල නායකයා අපි වෙමු. අපගේ පුද්ගල ණය කළඹ 2019 දෙසැම්බර් 31 දිනට රු.බි. 302.2 දක්වා වැඩිවී ඇත. පුද්ගල ණය නිෂ්පාදන බැංකුවේ ආදායමට සැලකියයුතු දායකත්වයක් සිදු කරයි. ආයතන, වෘත්තිකයින්, ගුරුවරුන්, හෙදියන්, හමුදා, රජයේ සේවකයින් සහ වෙනත් අය වැනි විවිධ ගනුදෙනුකාර අංශවලට ලබාදීම සඳහා නිෂ්පාදන රාශියක් අපි පිරිනමමු. දැඩි නියාමනය සහ ණය ඇගයීම තුළින්, පාරිභෝගික බැංකු ක්ෂේත්‍රය තුළ 1.5%ක අවම අක්‍රීය ණය අනුපාතයක් අපි සාර්ථකව පවත්වා ගනිමු.

**පුද්ගල ණය සංයුතිය - 2019**



## ණය පත්

විසා සහ මාස්ටර් කාඩ් යන දෙවර්ගයට අයත් සන්නාමයේ ණය කාඩ් නිකුත් කිරීමට අපට බලපත්‍රය ඇත. අපගේ කළඹට විසා ක්ලැසික්, ගෝල්ඩ්, ප්ලැටිනම් සහ සිග්නේච සහ මාස්ටර් කාඩ් ගොල්ඩ් සහ වර්ල්ඩ් ඇතුළත්ය.

අපගේ ණයකාඩ් මෙහෙයුම් කාර්යක්ෂමව නිකුත් කිරීමට සහ ක්‍රියාවලිය සඳහා නවින පන්නයේ පද්ධතියක් අප සතුය. අපගේ සියලුම ණය කාඩ් වංචාව අවම කිරීම සඳහා ණය කාඩ්පත හරහා සිදුකරන සෑම මිලදී ගැනිමකටම අමතර ආරක්ෂාව ලබාදිම ශක්තිමත් කරන NFC (ආසන්න ක්ෂේත්‍ර සන්නිවේදනය) තාක්ෂණයෙන් යුක්ත වේ. එමෙන්ම, ජාත්‍යන්තර රෙගුලාසිවලට අනුව, සියලූම කාඩ් EMV (ඉලෙක්ට්‍රොනික චුම්භක සත්‍යාපනය) සවිගන්වා ඇත.

ප්‍රධාන ණය කාඩ් පහසුකම ප්ලැටිනම්, විසා සිග්නෙච සහ මාස්ටර් වර්ල්ඩ් ලෙස වර්ග තුනකින් සමන්විත වේ.  මෙම ප්‍රධාන ණය කාඩ්වලට සංචාරක රක්ෂණය සහ නවාතැන් වැනි ප්‍රතිලාභ කිහිපයක් ඇත.

කාඩ්පත් හිමියන් වෙත ආකර්ශණීය උත්සව කාල සහ වසර පුරා ප්‍රවර්ධන දියත්කරමින්, දිරිදිමනා සහ අනෙකුත් වරප්‍රසාද පිරිනමමින් අපි තවදුරටත් වර්ධනය වෙමු. වසර තුළ, අපි පුළුල් වශයෙන් වෙළෙඳුන් දරන POS යන්ත්‍ර සේවයේ යොදවා ඇත.





ධර්මරාජ පසලේ පාසැල් බැංකුකරණ ඒකකය විවෘත කිරීම

## අනාගත අවධානය

- වැඩිපුර ගනුදෙනුකරුවන්ට ගුණාත්මක පුද්ගල ණය ලබාගැනීමට හැකිවිම සඳහා දිවයින පුරා ශාඛා 100කට RLOS පද්ධති දියත් කිරීම
- සියලුම ශාඛාවලට වේගවත් බැංකුකරණ ආදර්ශ දියත් කිරීම
- ගනුදෙනුකරුවන් සඳහා විශේෂ ජංගම ගිණුමක් වන  "පිපලස් පවර්" දියත් කිරීම
- සන්නාම නිෂ්පාදන  දියත් කරමින් අඩු පිරිවැය තැන්පතු පදනම වැඩි කිරීම
- පාසල් 100ක් දක්වා පාසල් මුදල් තැන්පතු යන්ත්‍ර ව්‍යාපෘතිය පුළුල් කිරීම
- දිවයින පුරා SBUs කුටිවල මුදල් තැන්පතු කරමින් උකස් භාණ්ඩ මුදාගැනිමට පහසුකම් සැලසීම
- පාරිභෝගික ගනුදෙනුකාර පදනම වැඩිකිරීම

# ව්‍යවසාය බැංකුකරණය



මහජන බැංකුවේ ව්‍යවසාය බැංකුකරණය ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයේ එංජිම ලෙස සලකන සියලුම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) සහ වාණිජ ව්‍යාපාරවලට සේවය කරයි. අනුග්‍රහක අරමුදල් මාර්ගවලට පිවිසීම ලබා ගැනීමට ශ්‍රී ලංකා රජය සහ ගෝලීය ආධාර ආයතන සමඟ අපි කටයුතු කරමු.

මෙයට අපගේ ප්‍රවේශය දෙයාකරය. ඉන් එකකට අපගේ ජාතිය තුළ සියලුම ව්‍යාපාරවල අවශ්‍යතාවන් සපුරාලීමට විශේෂයෙන් සකස්කළ කාලීන ණය වෙළෙඳ සහ ක්‍රියාකාරී ප්‍රාග්ධන පහසුකම්, මුදල් ආන්තික ණය වැනි සම්ප්‍රදායික ණය නිෂ්පාදන ඇතුළත් වන අතර අනිකට අනුග්‍රහක අරමුදල් මාර්ග තුළින් සංවර්ධන බැංකුකරණය පිළිබඳ සංකල්පය ප්‍රවර්ධනය කරන විශේෂ අරමුදල් මාර්ග ඇතුළත්ය. මෙම මාර්ග දෙක සංයෝග කරමින්, නියමිත පරිදි සකස් කළ ඉහළම මට්ටමේ බැංකුකරණ විසඳුමක් එක් එක් සේවාදායකයාට ලබාදීමට පුද්ගලගතකරන අසමසම වටිනාකම් කොටසක් අපි පිරිනමමු.

2019 දෙසැම්බර් අවසානයට, ව්‍යවසාය බැංකුකරණ ණය කළඹ රු. 38,521කට වැඩි පහසුකම් ඇතුළත් කරමින් රු.බි. 218ක් විය.

අපගේ ණය පිරිසැකසුම් යාන්ත්‍රණය අපගේ සේවාදායකයින්ට පුද්ගලගත සහ කාර්යක්ෂම සේවාවක් පිරිනැමීමට ප්‍රාදේශීය ණය ඒකක (RCUs) 24ක් සමඟ විමධ්‍යගත කරන ලදී. බැංකුවේ දිගුකාලීන අංශයේ විවිධාංගීකරණ ක්‍රමෝපාය හා බැඳුණු RCU ආදර්ශය ව්‍යාපාර උත්පාදන කටයුතු පිළිබඳ පමණක් අවධානය යොමු කිරීමට අපගේ ශාඛාවල ණය නියමයන් සැහැල්ලු කර ඇත. මින් අධ්‍යාපනය, මූල්‍ය සේවා, සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය වැනි වෙනත් ක්ෂේත්‍රවල ව්‍යාපාර ආරම්භ කිරීමට මඟ පාදා ඇත. කෙසේවෙතත්, මෙම අංශ කරා අපගේ නිරාවරණ වැඩි කිරීම සඳහා තෝරාගත් ණය ප්‍රවේශයක් අපි අඛණ්ඩව පවත්වා ගනිමු.

සමාලෝචිත වසර තුළ, කාන්තා ව්‍යවසායකත්වයට සහයවෙමින් කාන්තාවන් සවිබල ගැන්වීමට ප්‍රමුඛතාව ලබාදෙන ලදී. කාන්තාවන් ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් ආසන්න වශයෙන් 57%කට දායක වන අතර ඔවුන් ග්‍රාමීය ආර්ථිකයන්ට සැලකියයුතු දායකත්වයක් සිදු කරයි. ආසියානු සංවර්ධන බැංකුවේ Wifi ණය යෝජනා ක්‍රමය යටතේ, ස්ථානය සහ අනෙකුත් කොන්දේසි මත පදනම් වී ණය වටිනාකමින් 35% දක්වා ප්‍රදාන ලබාදෙමින් කාන්තාවන් මෙහෙයවන ව්‍යවසායන් වෙත මූල්‍යමය සහය ලබාදෙන ලදී. මොනරාගල, අනුරාධපුර සහ යාපනය පවත්වන ලද ඒන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ප්‍රදර්ශන තුල සහභාගි වෙමින් මූල්‍ය විනය සහ "ඒන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත හැකි මූල්‍ය සහ මූල්‍ය නොවන යෝජනා ක්‍රම වැනි ක්ෂේත්‍ර පිළිබඳව අපි ගනුදෙනුකරුවන් දැනුවත් කළෙමු. අනෙකුත් මූල්‍ය ආයතනවලින් පහසුකම් ලබාගැනීමට නොහැකි බොහෝ ගනුදෙනුකරුවන් වෙත වසර තුළ පහසුකම් සපයන ලදී.

අපගේ ප්‍රාදේශීය ශාඛා තුළින් සංචාරක කර්මාන්තය තුළ ව්‍යවසායයින්ට සහය වෙමින් සංචාරක කර්මාන්තය නගා සිටුවීම සඳහා අපි සැලකියයුතු දායකත්වයක් සිදුකලෙමු. වසර තුළ මෙම අංශයට සැලකියයුතු බලපෑමක් සිදුවුවත්, 2019 දි පාස්තු ඉරිදා ප්‍රහාරවලින් පසු සංචාරක කර්මාන්තය සහ අනෙකුත් ආශ්‍රිත කර්මාන්ත තුළ පීඩාවට පත් ගනුදෙනුකරුවන් වෙත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දෙන ලද ණය විලම්භන කාලය පුළුල් කරමින් කළඹ තුළ ගුණාත්මකභාවය පවත්වා ගනු ලැබීය. එමෙන්ම අපි උවදුරට පත් කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමට විචක්ෂණශීලී ක්‍රියාමාර්ග රැගෙන ඇත. වසර තුළ අභියෝගාත්මක ආර්ථික කොන්දේසි හමුවේ වුවත්, දැඩි ණය ඇගයීම් ක්‍රියාවලියක් අනුගමනය කරමින්, සම්බන්ධතා කළමනාකරුවන් හරහා ශක්තිමත් ගනුදෙනුකාර සම්බන්ධතා පෝෂණය කරමින් සහ මූල්‍ය උපදේශන සහ ගනුදෙනුකාර අධ්‍යාපන සේවාන් ලබාදෙමින්, අක්‍රීය ණය අනුපාතය (NPL) ඉහළ අනුපාතයකින් පවත්වා ගනු ලැබිය. වසර තුළ, අපගේ ගනුදෙනුකරුවන් සවිබල ගැන්වීමට දිවයිනේ ස්ථාන කිහිපයකදී ගනුදෙනුකාර අධ්‍යාපනික සම්මන්ත්‍රණ කිහිපයක් පවත්වන ලදී.

## ජාතික ආර්ථික සංවර්ධනයට අපගේ දායකත්වය

| ව්‍යවසාය බැංකුකරණය | 2019 | 2018 | 2017 |
|---|---|---|---|
| අත්තිකාරම් (රු.මි.) (සමුච්චිත) | 205,483 | 195,992 | 172,778 |
| අක්‍රීය ණය (රු.මි.) (සමුච්චිත) | 13,098 | 7,815 | 5,911 |

## ක්‍රමෝපායික ප්‍රමුඛතා

| ක්‍රමෝපායික ප්‍රමුඛතා | 2019 ප්‍රගතිය |
|---|---|
| ව්‍යවසාය සංවර්ධනය | ව්‍යවසායකත්වයට සහයවීම සඳහා 49,451කට ණය, අත්තිකාරම් සහ වෙළෙඳ පහසුකම් ලබාදිම |
| මූල්‍ය අන්තර්කරණය ප්‍රවර්ධනය කිරිම | උතුරු සහ නැගෙනහිර පළාත්වල ලබාදුන් ණය මුදල රු.මි. 2,875.97 |
| කාන්තා ව්‍යවසායකත්වයට සහයවිම | Wifi ණය යෝජනා ක්‍රමය යටතේ රු.මි. 18.1 ක් වටිනා ණය 13ක් ලබාදීම |
| පාරිසරික තිරසාරත්වයට සහයවීම | සූර්ය බලශක්ති යෝජනා ක්‍රමය යටතේ සූර්ය බලශක්ති ණය 124 ක් ලබාදිම |
| ගනුදෙනුකාර අත්දැකිම ඉහළ නැංවිම | RCUs ස්ථාපිත කිරීම මගින් ගනුදෙනුකාර සම්බන්ධතා කළමනාකරණය ශක්තිමත් කිරීම |
| යහපත් ගුණාත්මක කළඹක් පවත්වා ගැනීම | අහිතකර මෙහෙයුම් පරිසරය හේතු කොට ගෙන ගනුදෙනුකරුවන් මුහුණපාන අභියෝග හමුවේවුවත්, ක්ෂේත්‍රයේ සාමාන්‍යයට වඩා පහළ යහපත් මට්ටමක් පවත්වා ගැනීම |

## ප්‍රතිමූල්‍ය ණය

මෙම පහසුකම් වසර 10ක් දක්වා දීර්ඝකල පහසු කාලසීමාවක් සහිත අඩු පොළී අනුපාතයක් දරයි. වසර තුළ, ගනුදෙනුකරුවන් 1,105ක් සවිබල ගැන්වීමට රු.බි. 4.86ක් වටිනා ප්‍රතිමූල්‍ය ණය පහසුකම් ලබාදි ඇත. ණයවල ඉහළම ගණන බස්නාහිර පළාතට ලබා දෙන ලදී.

## පොළී සහන ණය

මෙම වර්ගය යටතේ ප්‍රධාන නිෂ්පාදනය වන්නේ ව්‍යවසායකයින්ගේ ආයෝජන සහ පුළුල්කිරීම උත්තේජනය කිරීමට රජය විසින් ආරම්භ කරන ලද එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමයයි. රජයේ ජාතික සංවර්ධන න්‍යාය පත්‍රයට හවුල්කරුවෙක්විම සඳහා අපගේ බැඳිම තුළ, මෙම යෝජනා ක්‍රමයේ ප්‍රධාන ණය ලබාදෙන්නා බවට අප පත්විය. රු.මි. 700 දක්වා පුළුල්වන උපරිම ණය මුදලක් සහ වසර හතක කාලසීමාවක් සමඟ මෙම වැඩසටහන යටතේ පිරිනමන ලද ණය යෝජනා ක්‍රම 20කට වැඩි ප්‍රමාණයක් තුළ අපි සක්‍රීයව සහභාගිවූයෙමු. 2019 දෙසැම්බර් අවසානයේදී, මෙම යෝජනා ක්‍රමය යටතේ රු.බි.7.76ක මුළු වටිනාකමක් සමඟ පහසුකම් 15,893කට වඩා අපි ලබාදි ඇත.




## ණය සුරැකුම් යෝජනා ක්‍රමය

මෙම පහසුකම් ඇප රහිතව ලබාදෙන අතර, ණය මුදලෙන් 60%ක් දක්වා රජය විසින් දෙනු ලැබේ. නව විස්තීර්ණ ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ 2019 දි රු.මි. 461ක ණය පහසුකම් බෙදාහැරීම තුළින් වී වගාව සහ කෙටිකාලීන වගාවන්හී නිරත ක්ෂුද්‍ර සහ සුළු පරිමාණයේ ගොවීන්ගේ සමාජ-ආර්ථික තත්ත්වයන් නගා සිටුවීම අරමුණු විය.

## අනාගත අවධානය

- ව්‍යවසාය සංවර්ධනය, මූල්‍ය අන්තර්කරණය ඉදිරියට ගෙනයාම, උපදේශණ ලබාදිම සහ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවිම
- නිවසේ වර්ධනය කළ තිරසාර වර්ධන ක්‍රමෝපායන් සහ ස්වයංපෝෂිතභාවය සහ අපනයන අරමුණුකළ ආර්ථිකය සංවර්ධනය
- පුනර්ජනනිය බලශක්ති භාවිතයට සහයවිම
- නව්‍යකරණය සහ තාක්ෂණය තුළින් ණය යෝජනා ක්‍රමවලට සහයවීම
- ආහාර සුරක්ෂිතතාවය සහයවීම
- ප්‍රාදේශිය ණය ඒකක (RCU) ශක්තිමත් කිරිම සහ ශක්තිමත් ගනුදෙනුකාර සම්බන්ධතා ගොඩ නැගීම
- යහපත් ලාභදායී ණය කළඹක් පවත්වා ගැනිම
- පීඩාවට පත් ව්‍යාපාර පනගැන්විම සහ අක්‍රීය ණය කළඹ අඩු කිරීම
- දීර්ඝ කාලීන ව්‍යාපාර සංවර්ධනය සඳහා ගනුදෙනුකාර සම්බන්ධතා ශක්තිමත් කිරීම

# ආයතනික බැංකුකරණය



ආයතනික බැංකුකරණය දේශීය, ජාත්‍යන්තර සහ අක්වෙරළ ආයතන, ආයෝජන මණ්ඩලය ආයතන සහ රජයට අයත් ව්‍යාවසාය (SOEs) ඇතුළුව මධ්‍ය සහ විශාල පරිමාණයේ ආයතනවලින් සමන්විත විවිධ සේවාදායක පදනමකට සේවය සලයසි. අපි කාරක ප්‍රාග්ධනය සහ වෙළෙඳ මූල්‍ය, ව්‍යාපාර අරමුදල්කරණය, සහ මුදල් කළමනාකරන පහසුකම් දක්වා පුළුල් වෙමින් අපගේ සේවා දායකයින්ට මුළු වටිනාකම් කොටසක් පිරිනමමු. ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික සහ යටිතලපහසුකම් සංවර්ධනය පිළිබඳ ජාතික බැඳියාවන්ට සහයවෙමින් අප තවදුරත් ප්‍රමුඛස්ථානය ගෙන සිටිමු.

ආනයන, අපනයන සහ ප්‍රේෂණ පහත වැටීම සහ ආයෝජන පරිසරය තුළ විශ්වාසය බිඳවැටීම දක්නට ලද වසර තුළ අභියෝගාත්මක පරිසරය හමුවේවුවත්, බැංකුවේ මෙහෙයුම් ලාභයට 42,4%ක් සහ ආයතනික බැංකුකරණය මුළු ණය සහ අත්තිකාරම්වලින් 45.9%කට දායක විය. විවිධ කර්මාන්ත කෙරෙහි අපගේ ප්‍රවීනත්වය, පුළුල් පළපුරුද්ද, සහ ශක්තිමත් දේශීය සහ ජාත්‍යන්තර ජාලවල වාසිය ලබා ගනිමින්, 2019 මූල්‍ය වර්ෂය තුළ බැංකුවේ ශුද්ධ පොළී ආදායමෙන් 15.8%කට සහ බැංකුවේ අරමුදල් නොවන ආදායමට 24.7%කින් දායක වී ඇත. අහිතකර බාහිර පරිසරය හේතු කොටගෙන අක්‍රිය ණය අනුපාතය 3.3%ක පවත්වා ගත් අතර එම අනුපාතය විචක්ෂණ අවදානම් කළමනාකරණ ව්‍යවහාර යොදා ගැනිම නිසා තවමත් ක්ෂේත්‍රයේ සාමාන්‍යයට වඩා පහළින් පවතී.

විශේෂ සම්බන්ධතා කළමනාකරුවන් සහ ක්ෂේත්‍රයේ විශේෂඥයින් සමඟ ආයතනික බැංකුකරණය අවශ්‍ය සියලූම දෑ සහිත ඒකකයක් බවට පත්කරමින් වර්ධනය අත්කර ගැනීමට සහ කාර්යක්ෂමතාව වැඩි කිරීමට අපි තවදුරටත් පදනම දමමු. ණය අනුමත කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට අපගේ ක්‍රියාවලි සරලකරමින් අපි අපගේ සේවාදායකයින්ට මුළු වටිනාකම් කොටසක් පිරිනමමු. ආයතනික සේවා දායකයින්ට ඔවුන්ගේ කාර්යාලය සහ ලෝකයේ ඔවුන් සිටින ඕනැම ස්ථානයක සිට ඔවුන්ගේ සියලුම ගනුදෙනු කරගෙන යාමට ඔවුන්ට හැකියාව ඇති කරමින්, බැංකුවේ ඩිජිටල්කරණ වැඩසටහන යටතේ, ආයතනික අන්තර්ජාල බැංකුකරණය සහ ජංගම බැංකුකරණ අවකාශය දියත් කරන ලදී. එමෙන්ම වේගවත් බෙදාහැරීම සහ වැඩිකළ කාර්යක්ෂමතාව ඇති කරමින් ණය උත්පාදනයේ සිට බෙදාහැරීම දක්වා සියලූම ක්‍රියාවලි ඩිජිටල්කරණය කිරීමේ ක්‍රියාවලියක අපි නිරත වී සිටිමු.

අපගේ සේවාදායකයින්ට සුවිශේෂී සේවාවක් පිරිනැමීම සඳහා අපගේ සේවකයින් ශක්තිමත් කරමින් සහතික කිරීමේ සහ පුහුණු වැඩසටහන් තුළින් අපි අඛණ්ඩව ඔවුන්ගේ දක්ෂතා වැඩි කරමින් සිටිමු.






| මූලික කාර්යසාධන දර්ශක | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| ශුද්ධ ආදායම (රු.මි.) | 12,465 | 12,339 | 9,022 | 8,752 | 13,283 |
| බදු පසු ශුද්ධ ලාභය (රු.මි.) | 3,142 | 4,082 | 4,013 | 4,367 | 5,894 |
| වත්කම් (රු.බි) | 613,818 | 574,903 | 372,251 | 402,397 | 370,212 |
| අත්තිකාරම් (රු.බි) | 606,422 | 564,799 | 354,524 | 359,879 | 325,978 |
| තැන්පතු (රු.බි) | 109,845 | 156,831 | 162,130 | 172,925 | 70,804 |
| උක්ව ණය අනුපාතය | 3.3 | 2.5 | 1.5 | 1.4 | 1.6 |
| ණය ලබාදීම (රු.බි.) | 464,876 | 425,033 | 247,493 | 296,567 | 282,512 |

**අංශයේ නිරාවරණය**







| ප්‍රතිශතය | 2019 % | 2018 % |
|---|---|---|
| රජය සහ රජයට අයත් ව්‍යවසාය (SOEs) | 77 | 75 |
| පුද්ගලික අංශය | 23 | 25 |

## ක්‍රමෝපායික ප්‍රමුඛතා

| ක්‍රමෝපායික ප්‍රමුඛතාව | 2019 දී ප්‍රගතිය |
|---|---|
| සියලුම ආයතනික ගනුදෙනුකරුවන් වෙත වටිනාකම පදනම් විසඳුම් රාශියක් පිරිනමමින් ඉහළම ආයතනික බැංකුකරණ විසඳුම් සපයන්නා වීම | ආයතනික බැංකුකරණය ආනයන සහ අපනයන මූල්‍යකරණය. ව්‍යාපෘති මූල්‍යකරණය, ස්කන්ධ මූල්‍යකරණය, සම්මේලන ණය පහසුකම් සහ මුදල් කළමනාකරණ පහසුකම් ඇතුළුව වටිනාකම පදනම් විසඳුම් රාශියක් පිරිනමයි. |
| වෙළෙඳ සහ කාරක ප්‍රාග්ධන අරමුදල්කරණය තවදුරටත් විවිධාංගීකරණය කිරීම | 2019 වසර සඳහා මෙහෙයු වූ වෙළෙඳ සහ කාරක ප්‍රාග්ධන මූල්‍යකරණයේ වටිනාකම රු.බිලියන 116.6කි |
| අක්වෙරළට ගමන් කරන ශ්‍රී ලාංකික සමාගම් සඳහා සම්මේලන ණය සහ ව්‍යාපෘති අරමුදල්කරණය කෙරෙහි අවධානය | අක්වෙරළට ගමන් කරන ශ්‍රී ලාංකික සමාගම් සඳහා වසර තුළ ඇ.ඩො මිලියන 25 ක්වන සම්මේලන ණය පිරිනමන ලදී. |
| බැංකුව වෙත ආයතනික බැංකුකරණයේ දායකත්වය වැඩි කිරීම | 2019 සඳහා ආයතනික බැංකුකරණය බැංකුවේ මුළු ණය සහ අත්තිකාරම්වලින් 45.9%ක් සහ බැංකුවේ මෙහෙයුම් ලාභය සඳහා 42.4%ක් දායකවෙමින් බැංකුවේ කාර්යසාධනයට සැලකියයුතු දායකයෙකි. |

## අනාගත අවධානය

- අපගේ ඩිජිටල් අවකාශය, නිෂ්පාදන පරාසය සහ අපගේ සේවකයින්ගේ ප්‍රවීනත්වයේ වාසිය ලබාගනිමින් විස්තීර්ණ මූල්‍ය විසඳුම් රාශියක් අඛණ්ඩව ලබාදීම. ක්ෂේත්‍රයේ විශේෂඥයින් සංවර්ධනය සහ අඛණ්ඩව අපගේ සේවකයින්ගේ දක්ෂතා ඔප්නැංවීම.
- කාන්තා ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කරන පුද්ගලික අංශය සහ පුනර්ජනනීය ව්‍යාපාර වැනි තිරසාර ව්‍යාපාර ඇතුළු විවිධ කර්මාන්ත සඳහා අපගේ ණය කළඹ විවිධාංගීකරණය කිරීම.
- මුදල් කළමනාකරණය, රැස්කිරීම සහ ගෙවීම් සඳහා විස්තීර්ණ ගනුදෙනු බැංකුකරණ විසඳුමක් වේ.
- අපගේ දිවයින පුරා ශාඛා ජාලය භාවිතා කරමින්, වටිනාකම් දාමය හරහා මූල්‍ය විසඳුම් පුළුල් කරමින් සැපයුම් දාම මූල්‍යකරණය දියත් කිරීම.
- වෙළෙඳ සහ කාරක ප්‍රාග්ධන මූල්‍යකරණය සහ ගාස්තු පදනම් ආදායම වැඩි කරමින් බැංකුවේ ලාභයට සිදුකරන දායකත්වය වැඩි කිරීම.

# භාණ්ඩාගාර ඒකකය

බැංකුවේ ප්‍රධාන අංශයක් ලෙස සැලකෙන භාණ්ඩාගාර ඒකකය මූල්‍යකරණය සහ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සඳහා සහ අරමුදල් භාවිතය ප්‍රශස්ථ කිරීම සඳහා වගකීමට බැඳී සිටී. බැංකුවේ ආයෝජන කළඹ, විනිමය හුවමාරුව සහ මුදල් උපකරණවල වෙළෙඳපොළ අවදානම කළමනාකරණය කිරීමේදී වැදගත් කාර්යභාරයක් අපි ඉටු කරමු. බැංකුවේ සමස්ත විනිමය හුවමාරු ආදායම, වෙළෙඳ ආදායම සහ උපලබ්ධි/උපලබ්ධි නොවූ ඉපයීම් අත්කර ගැනීම සඳහා  භාණ්ඩාගාර ඒකකය වගකීමට බැඳී සිටී.

2012 දී මෙහෙයුම් ආරම්භ කළ අපගේ ආයෝජන බැංකුකරණ ඒකකය වසර හතක් වැනි කෙටි කාලයක් තුළ ශ්‍රී ලංකාවේ ඉහළම ආයෝජන බැංකු තුනෙන් එකක් බවට පත්ව ඇත.

අපගේ ප්‍රධාන කාර්යයන්ට පහත  දෑ ඇතුළත් වේ:

- විදේශීය ව්‍යවහාර මුදල් ඒකකය - විදේශීය ව්‍යවහාර මුදල් (FX) ආයතනික ගනුදෙනු, FX අන්තර් බැංකු ගනුදෙනු. FX ද්‍රවශීලතාව කළමනාකරණය, FX  මුදල් වෙළෙඳපොල ගනුදෙනු, සහ විදේශීය ව්‍යවහාර මුදල් ස්ථාවර තැන්පතු සඳහා අනුපාත දැක්වීම ශ්‍රී ලංකා සංවර්ධන බැංකුව නම්කළ එක්සත් ජනපද ඩොලර්වලින් ගනුදෙනු සිදු කිරීම
- මුදල් වෙළෙඳපොල ඒකකය - බැංකුවේ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය කළමනාකරණය, ශ්‍රී ලංකා රුපියලේ ද්‍රවශීලතාව, ප්‍රති මිලදීගැනීම් සහ ප්‍රති හැරවුම් ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනු සහ දේශීය ව්‍යවහාර මුදල් ස්ථාවර තැන්පතු සඳහා අනුපාත දැක්වීම කළමනාකරණය
- ප්‍රාථමික වෙළෙඳ ඒකකය - ප්‍රාග්ධන ඉපයීම් ලබා ගැනීමට භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල වෙළෙඳාම සහ ශ්‍රී ලංකා රුපියලෙන් නම්කළ රජයේ සුරැකුම්පත් කළඹ කළමනාකරණය
- ආයෝජන බැංකුකරණ ඒකකය - බැංකුවේ ස්කන්ධ කළඹ කළමනාකරණය, IPO's ඇතුළු  කෙටි සහ දිගුකාලීන ආයතනික උපකරණ ව්‍යුහගතකරණය සහ ස්ථාපනය, ස්කන්ධ සහ ණය IPO's කළමනාකරණය, භාරකාර සහ ස්ථාපන නියෝජිත සේවා ලබාදීම

## අපගේ ශක්තිමත් මෙහෙයුම්

විදේශීය බැංකුවලින් රැස් කිරීමේදී අපි අඛණ්ඩව මිනුම් ලකුණු නියම කරමු. ශ්‍රී ලංකා මූල්‍ය සේවා ක්ෂේත්‍රය තුළ ප්‍රමුඛ සංවර්ධනය තුළ, 2019 දී විදේශීය බැංකුවක සමඟ ඇ.එ.ඩො 200ක වසර 8ක ද්විපාර්ශවික මූල්‍යකරණ පහසුකමක් අපි අත්සන් කළෙමු. මෙය මේ දක්වා ශ්‍රී ලංකාවේ යම් වාණිජ බැංකුවක් විසින් රැකගත් විශාලතම සහ දීර්ඝ කාලීන ද්විපාර්ශවික මූල්‍යකරණ පහසුකම වේ. මෙම හවුල්කාරත්වය අපගේ බැංකුව, අපගේ පාලන ව්‍යුහය, ප්‍රවීනත්වය සහ යටිතල පහසුකම් සංවර්ධනය, විදුලිය, බලශක්තිය වැනි සංකීර්ණ සහ ජාතික වශයෙන් වැදගත් ව්‍යාපාතිවලට මූල්‍යකරණයට අදාළ නිර්දෝෂී ගමන් මඟ කෙරෙහි තබන ලද විශ්වාසය පැහැදිලිව පිළිබිඹු කිරීමකි.

සෑම අවස්ථාවකම සුහද ද්විපාර්ශවික සම්බන්ධතා සහ ඉහළ මට්ටමේ සහභාගිත්වය පවත්වා ගනිමින් ලෝකය පුරා විශේෂයෙන් ගල්ෆ් කලාපය, ජපානය, චීනය. තායිවානය, ඉන්දියාව සහ උතුරු ඇමෙරිකාව තුළ අපගේ විදේශීය බැංකුකරණ හවුල්කරුවන් සමඟ අපි අඛණ්ඩව ශක්තිමත් සම්බන්ධතා ගොඩ නගමු. බැංකුව වෙත සැලකියයුතු කෙටි සහ දිගුකාලීන විදේශීය ව්‍යවහාර මුදල් මූල්‍යකරණය ආරක්ෂා කර ගැනීමේදී අපි සාර්ථක වී ඇත. වසර 225ක් පැරණි උතුරු ඇමෙරිකානු බැංකුවක් මේ දක්වා දකුණු ආසියානු කලාපය තුළ තම පළමු ගනුදෙනුව මෑත කාලිනව මහජන බැංකුව සමඟ පවත්වනු ලැබීම විශේෂයෙන් සඳහන් කිරීම වැදගත්ය.

අපගේ ආයෝජන බැංකුකරණ යාන්ත්‍රණය විසින් 2019 නොවැම්බර් හි පුද්ගලික ස්ථාපනයක් තුළින් ඉතා ආකර්ෂණීය මට්ටම්වලට පස් අවුරුදු සහ අට අවුරුදු ලැයිස්තුගත නොකළ ද්විතියික ණයකර නිකුත් කරමින් බැංකුවේ මුළු ප්‍රාග්ධනය රු.බි. 10කින් සාර්ථකව වැඩි කර ගනු ලැබිය. මෙම ණයකර නිකුතුව එහි ආරම්භක දිනයේදීම වසාදමන ලද අතර, එය අප බැංකුව කෙරෙහි ආයෝජක විශ්වාසය පිළිබඳ ශක්තිමත් සාක්ෂියකි. ආයෝජන බැංකුකරණ ඒකකය ඉහත කී ණයකර නිකුතුව සඳහා නිකුතුවේ කළමනාකරු ලෙස කටයුතු කරන ලදී.

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් සමඟ ශක්තිමත්ව පවත්නා අපගේ පාලනය, අනුකූලතාවය සහ අවදානම් කළමනාකරණ අංශය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් ස්වාධීනව කළමනාකරණය කරන ඉදිරි කාර්යාලය, මධ්‍යම කාර්යාලය සහ පසු කාර්යාලය ලෙස ස්වාධීන අංශ තුනකට කොටස් කරන ලදී.

මෙහෙයුම් වැඩිදියුණු කිරීම් කිහිපයක් 2019 දී සිදුකළ අතර ඒවායින් බොහෝමයක් භාණ්ඩාගාර පද්ධතිය යාවත් කිරීම හා සම්බන්ධ වේ. ආයෝජන බැංකුකරණ ඒකකය භාණ්ඩාගාර පද්ධතියට ඒකාබද්ධ කළ අතර මාර්ගගත සීමා නියාමන ආදර්ශය වැනි නව අගය එකතුකළ ලක්ෂණ ගණනාවක් සමඟ යාවත් කරන ලදී.

## කාර්යසාධනය

එක්සත් ජනපද ඩොලර් හුවමාරු අනුපාතය තුළ අඩුම උච්චාවචනය සහ ශ්‍රී ලංකා රුපියල් පොළි අනුපාතවල ඉහළ ගිය උච්චාවචනය හේතු කොට ගෙන, 2018 වසරට සාපේක්ෂව, මෙහෙයුම් පරිසරය අඩුවෙන් උපකාරී වසරක් විය. කෙසේවෙතත්. බැංකුවේ ආදායමට සැලකියයුතු දායකත්වයක් සිදුකරමින් සහ ද්‍රවශීලතා තත්ත්වය ඵලදායී ආකාරයෙන් කළමනාකරණය කරගනිමින් අපි සාර්ථකව අපගේ මූලික කාර්ය සාධන දර්ශක අත්කර ගතිමු.




| මූලික කාර්යසාධන දර්ශක | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| ශුද්ධ ආදායම (රු.මි.) | 10,728 | 11,417 | 9,100 | 10,121 | 8,371 |
| බදු පසු ශුද්ධ ලාභය (රු.මි.) | 7,547 | 8,125 | 8,089 | 5,796 | 3,418 |
| වත්කම් (රු.මි.) | 563,980 | 512,031 | 446,219 | 388,746 | 446,650 |

## අනාගත අවධානය

- පවත්නා කටයුතු ඒකාබද්ධ කිරීම
- අරමුදල් කළමනාකරණ සේවා ආරම්භ කිරීම

# විදේශීය ගනුදෙනුකාර සේවා සහ ජාත්‍යන්තර බැංකුකරණය

විදේශීය ගනුදෙනුකාර සේවාව (OCS) ප්‍රේෂණය සහ විදේශ ව්‍යවහාර මුදල් රට තුළට පැමිණවීම ඇතිකරමින් විදේශ ව්‍යවහාර මුදල් (FX) ගිණුම්, FX ආශ්‍රිත ගනුදෙනු වල නිරත වන අතර ජාත්‍යන්තර බැංකුකරණය වෙළෙඳ ගනුදෙනු, ඇප සහ අනෙකුත් ජාත්‍යන්තර බැංකුකරණයට අදාළ කටයුතුවල නිරත වේ.

## විදේශීය ගනුදෙනුකාර සේවාව

බැංකුවේ රටතුළට ලබාඑන ප්‍රේෂණ මෙහෙයවීම තුළ දශක තුනකට වැඩි ප්‍රවීනත්වය සමඟ, අපි විදේශයන්හි ජිවත්වන සහ වැඩකරන ශ්‍රී ලාංකිකයින් දහස් ගණනක වඩාත් විශ්වාසී බැංකුකරණ හවුල්කරු වෙමු. අපගේ ඩිජිටල් ප්‍රවීනත්වයේ වාසිය ලබා ගනිමින්, අපගේ අනුරූප නියෝජිතයින් හරහා අපගේ මහජන ප්‍රේෂණ වෙබ් නිෂ්පාදන තුළින් වේගවත් සහ පහසුවෙන් රටතුළට ගලාඑන ප්‍රේෂණ සඳහා අපි පහසුකම් සලසමු.

අපගේ ප්‍රවීනත්වය, විශ්වාසී සහ කාර්යක්ෂම සේවාව තුළින් රටතුළට ගලාඑන ප්‍රේෂණ වෙළෙඳපොල තුළ සැලකියයුතු වෙළෙඳපොල කොටසක් රැක ගැනීමට අපට හැකි වී ඇත. ලොව පුරා විශාල ගෝලීය හවුල්කාර ජාල සමඟ ශක්තිමත් සම්බන්ධතා පෝෂණය කිරීම අපි අඛණ්ඩව සිදුකර ඇත. හුවමාරු සමාගම් කිහිපයක් සමඟ නව සම්බන්ධතා ඇතිව 2019 වසර තුළ නව හවුල්කරුවන් සම්බන්ධ කර ගනු ලැබීය.

නිෂ්පාදන දැනුම සහ සේවාවල තත්ත්වය ඉහළ නැංවීම පිණිස සේවක පුහුණුව තුළ ආයෝජන සිදුකරන ලදී. වසර තුළ OCS විසින් ඉදිරි පෙළ සේවකයින් සඳහා සේවාස්ථ පුහුණු සැසි සහ පුහුණු සැසි පවත්වන ලදී.

## ජාත්‍යන්තර බැංකුකරණය

ජාතීන් 110ක් තුළ 1,000කට වැඩි අපගේ දේශීය අනුරූපක ජාලය තුළින් අපගේ ගෝලීය ගනුදෙනුවලට සහය වේ. අක්වෙරළ ගනුදෙනු, ණය සහ අත්තිකාරම් ඇතුළුව සම්පූර්ණ වෙළෙඳ නිෂ්පාදන රාශියක් තුළ අපි නිරත වෙමු.

වසර ගණනාවක් පුරා අපගේ ප්‍රවීනත්වය මත හිඳිමින්, විදේශීය ආයෝජකයින් සඳහා සහ ආයෝජන මණ්ඩලය (BOI) සමඟ ලියාපදිංචි වී ඇති දේශීය අපනයනකරුවන් සඳහා පළමු ඇමතුම් ස්ථානය අපි වෙමු.

2011 දී ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) වෙළෙඳ මූල්‍ය වැඩසටහන (TFP) හා හවුල්වෙමින්, වෙළෙඳාමට සහයවීමට ඇප සුරක්ෂිත කරමින් අපගේ සේවාදායකයින්ට ආකර්ෂණීය මිලගණන් අපි සාර්ථකව ලබා දී ඇත. ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ඇප මත හිඳිමින්, ශ්‍රී ලංකාවට අරමුදල් පහසුකම් ලබා නොමැති විදේශීය බැංකු ග්‍රහනය කර ගැනිමට අපට හැකි වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, අරමුදල් පහසුකම්වල පිරිනැමුම් අනුපාත වඩා තරගකාරී බවට පත්ව ඇත.

ආසියානු සංවර්ධන බැංකුව සමඟ සිදුකළ ගනුදෙනු සංඛ්‍යාව සලකා බලමින්, 2019 සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ වෙළෙඳ මූල්‍ය පිළිබඳ ප්‍රමුඛ හවුල්කරු ලෙස අපව නම්කරන ලදී.

සමාලෝචිත වසර තුළ, වෙළෙඳ ඇපසුරුකුම් 2,970ක් නිකුත් කරන ලදී.

අප විසින් පිරිනමන ආනයන/අපනයන සේවාවන් හී ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව සහතික කරන අපගේ වෙළෙඳ සේවා නිෂ්පාදනවල තත්ත්වය පිළිගැනීම තුළ, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් SLS ISO 9001:2015 පිළිගැනිම අප වෙත ප්‍රදානය කරන ලදී.

ඉදිරි පෙළ සේවකයින් සඳහා සේවාස්ථ පුහුණු සැසි සහ පුහුණු සැසිවලදී වෙළෙඳ නිෂ්පාදන දැනුම සහ සේවා තත්ත්වය වැඩි කිරීමට ශාඛා සේවකයින් සඳහා පවත්වන ලද පුහුණුව වසර තුළදී අන්තර්ජාතික අංශය විසින් පවත්වන ලදී.

## වැදගත් සිදුවීම්

- ආනයන මූල්‍යකරණය 2018 දී පැවති රු.මි. 5,286 ට සාපේක්ෂව 2019 දී රු.මි. 5,765 දක්වා 9%කින් වර්ධනය විය
- අපනයන මූල්‍යකරණය 2018 දී පැවති රු.මි. 997 සිට 2019 දී රු.මි. 527 දක්වා 47%ක අඩුවීමක් වාර්තා කරන ලදී.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් SLS ISO 9001:2015 පිළිගැනිම ප්‍රදානය කරන ලදී.
- 2019 සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ වෙළෙඳ මූල්‍ය වැඩසටහනේ ප්‍රමුඛ හවුල්කරුවීම

## කාර්යසාධනය - ජාත්‍යන්තර බැංකුකරණය

| මූලික කාර්යසාධන දර්ශක | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| ආනයන මූල්‍යකරණය (ඇ.ඩො මිලියන) | 5,765 | 5,286 | 4,392 | 3,440 | 830 |
| අපනයන මූල්‍යකරණය (ඇ.ඩො මිලියන) | 527 | 997 | 596 | 487 | 108 |
| අපනයන පිරිවැටුම (ඇ.ඩො මිලියන) | 76 | 83 | 53 | 32 | 26 |
| ගාස්තු සහ කොමිස් ආදායම (ඇ.ඩො මිලියන) | 17 | 18 | 16 | 15 | 16 |
| සාමාන්‍ය ණයවර ලිපි පිරිසැකසුම් කාලය (පැය) | 4 | 4 | 4 | 4 | 5 |
| වෙළෙඳ ඇපසුරැකුම්වල ගණන | 2,970 | 2,939 | 3,167 | 3,141 | 2,865 |
| රටතුළට ගලාඑන ප්‍රේෂණ (ඇ.ඩො මිලියන) | 2,419 | 2,565 | 1,622 | 1,013 | 609 |
| රටතුළින් ගලායන ප්‍රේෂණ (ඇ.ඩො මිලියන) | 5,659 | 4,642 | 3,378 | 3,098 | 1,294 |




## අනාගත අවධානය

- වෙළෙඳ පිරිවැටුම වැඩිකර ගැනීමට අපගේ විස්තීර්ණ අනුරූපක බැංකුකරණ ජාලය මත වාසිය ලබාගැනීම
- ප්‍රේෂණවලට පහසුකම් ඇති කිරීමට අපගේ ගෝලීය හවුල්කාර ජාලය පුළුල් කිරීම.
- වැඩිපුර වෙළෙඳ ගනුදෙනු සහ වෙළෙඳ මූල්‍යකරණය ප්‍රවර්ධනය කිරීමට සේවක ජාල අතර අඛණ්ඩව වෙළෙඳ නිෂ්පාදන දැනුම වේගවත් කිරීම.
- ගනුදෙනුකරුවන්ට වෙළෙඳ සේවා වටිනාකම් කොටස තවදුරටත් වැඩි කිරීම සඳහා ඩිජිටල් විසඳුම් ප්‍රවර්ධනය කිරීම




## පීපල්ස් වෙබ්

අපගේ අන්තර්ජාල බැංකුකරණ බිහිදොර 2018 මැයි මස දියත් කරන ලද අතර එය පීපල්ස් වෙබ් මොබයිල් ඇප් හා සමපාත වේ. 350,000කට වැඩි ගනුදෙනුකරුවන් පහසුව සහ උපරිම ආරක්ෂාව සමඟ ඔහුන්ගේ බැංකු ගනුදෙනු සිදුකර ගැනීමට මෙම බිහිදොර භාවිතා කරනු ලබයි.

# යහපාලන වාර්තා

153 ආයතනික යහපාලනය

172 අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු වාර්තා

177 මූල්‍ය වාර්තාකරණය කෙරෙහි අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

179 අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

# ආයතනික යහපාලනය

ආයතනික යහපාලනය යනු බැංකුව මෙහෙයවනු ලබන සහ පාලනය කරනු ලබන රාමුවයි. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ පාලනය සඳහා වගකීමට බැඳී සිටී. ආයතනික යහපාලනය සඳහා බැංකුවේ ප්‍රවේශය වන්නේ එහි පාර්ශ්වකරුවන් සහ පුළුල් සමාජය සඳහා තිරසාර හුවමාරු වටිනාකම් නිර්මාණය කරමින් එහි දිගු සහ කෙටිකාලීන පරමාර්ථ අත්කර ගැනීම සඳහා ක්‍රමෝපායික තිරණ ගැනීම ප්‍රවර්ධනය කිරීමයි.

GRI 102-18, 102- 22

## මහජන බැංකුවේ ආයතනික යහපාලන රාමුව

**පාලන ව්‍යුහය**

| චර්යා ධර්ම සංග්‍රහය | අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය | ප්‍රතිපත්ති ආකෘතිය |
|---|---|---|

**නියාමන අවශ්‍යතා**

- 1961 අංක 29 දරණ මහජන බැංකු පනත හා සංශෝධන
- 1988 අංක 38 දරණ මහජන බැංකු පනත හා හා සංශෝධන
- ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශ
- 1953 අංක 23 දරණ හුවමාරු පාලන පනත
- 2006 අංක 6 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත
- 2006 අංක 5 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත

**ස්වේච්ඡා කේතය**

- ආයතනික පාලනය පිළිබඳ යහ භාවිතා සංග්‍රහය
- ගෝලීය වාර්තාකරණ ප්‍රවේශ සම්මතයන්
- එක්සත් ජාතීන්ගේ තිරසාරත්ව සංවර්ධන අරමුණු (SDG's)
- ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ කවුන්සිලය මගින් නිකුත් කරන ලද ඒකාබද්ධ වාර්තාකරණ රාමුව (IIRC)

**සහතිකය**

## යහපාලන ව්‍යුහය

බැංකුවේ ආයතනික යහපාලන ව්‍යුහය ස්ථර කිහිපයකින් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ ක්‍රමෝපායික මෙහෙයවීම, මූල්‍ය ඉලක්ක, සම්පත් වෙන්කිරීම සහ අවදානම් රුචිය පිළිබඳ පාලනය ලබා දී විධායක කළමනාකාරිත්වය සමඟ සාකච්ඡා සිදු කරයි. සියලුම පාර්ශ්වකරුවන් සඳහා හුවමාරු වටිනාකම නිර්මාණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා  කළමනාකරණය වගකීමට බැඳී සිටී.

**අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු**

- අධ්‍යක්ෂ  මණ්ඩල නාමයෝජනා කමිටුව (BNC)
- අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව (BHRRC)
- අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව (BITC)
- අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව (BIBC)
- අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව (BECC)
- අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව : (BIRMC)
- අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC)
- අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රමෝපායික සැලසුම් සමාලෝචන කමිටුව (BSPRC)

**කොටස්හිමියන්**
**(ශ්‍රී ලංකා රජය සහ සමූපකාර සමිති)**

**අධ්‍යක්ෂ මණ්ඩලය** — **අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්**

**ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී**

**ආයතනික කළමනාකාරිත්වය** — **කළමනාකරණ කමිටු**

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණය)**

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී** (අනුකූලතා)

**ප්‍රධාන අභ්‍යන්තර විගණක**

## 2019 සඳහා ප්‍රමුඛ අවධානය:

- සියළු ගනුදෙනුකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස, සතියේ දවස් 7ම පැය 24 පුරාම බැංකු සේවා ලබාදෙමින් ගනුදෙනුකරුවන් වෙත ළඟාවීම ව්‍යාප්ත කිරීම උදෙසා ක්ෂේත්‍රයේ විප්ලවීය ස්වයං බැංකුකරණ ඒකක සංකල්පය ස්ථාපනය/ක්‍රියාවට නැංවීම.
- අවශ්‍ය අවස්ථාවන්හිදී බැංකුවේ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි, ප්‍රධාන ප්‍රමිතීන් සමාලෝචනය කර අනුමත කොට, ඒවා බැංකුවේ ක්‍රමෝපායික සැලසුම සමග පෙළ ගැස්වීම.
- ප්‍රගතිගාමී ක්‍රමෝපායෙහි කොටසක් වශයෙන්, එහි ව්‍යාපාර කටයුතු කාර්යක්ෂමව, නවතාවයෙන් යුතුව සහ උසස් තාක්ෂණික තත්ත්වයන් යටතේ සිදුකිරීම කෙරෙහි අවධානය
- වර්තමාන වේගයෙන් වර්ධනය වන ලෝකය තුළ ලබාගතහැකි ලක්ෂණ සහ සේවා සමඟ උසස් ඉලෙක්ට්‍රොනික සේවා වැනල වලින් සමන්විත අතිශය සුරක්ෂිත තාක්ෂණික වටපිටාවක් නිර්මාණය කිරීම.
- ඉහළ මට්ටමේ ගනුදෙනුකාර සේවා තත්ත්වයක් (CSQ) පවත්වා ගෙනයාම.

## සහතිකය

විගණකාධිපතිවරයා විසින්, පිළිවෙලින් පිටු අංක 183 සිට 184 සහ 177 සිට 178 දක්වා ඉදිරිපත් කරනු ලැබ ඇති බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ අභ්‍යන්තර පාලන සම්බන්ධ අධ්‍යක්ෂ වරුන්ගේ ප්‍රකාශය සඳහා සහතිකයක් සපයනු ලබයි. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත ආයතනික යහපාලන සම්බන්ධයෙන් නිකුත් කරනු ලැබ ඇති, 2007 අංක 11 දරන බැංකු පනතෙහි නියෝගය කෙරෙහි වන අනුකූලතා මට්ටම පිළිබඳවද සහතිකයක් ලබාදෙයි.

▼ GRI 102-22, 102 -23, 102-24

## ආයතනික යහපාලන සඳහා වන යහ ක්‍රියාකාරකම් සංග්‍රහය වෙත අනුකූලතාවය

### අධ්‍යක්ෂ මණ්ඩලය (ප්‍රතිපත්තිය අ.1)

මුදල් අමාත්‍ය මගින් මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අධ්‍යක්ෂවරුන් පත් කෙරේ. වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය සභාපති, සහ විධායක නොවන අධ්‍යක්ෂ වරුන්ගෙන් සමන්විත වේ. සියළුම අධ්‍යක්ෂ වරුන් ගෞරවනීය රාජ්‍ය හා පෞද්ගලික අංශ වෘත්තිකයින් වෙති. වර්තමාන සභාපතිවරයා, විශේෂයෙන් මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 30 කට අධික පළපුරුද්දක් සහිත පරිණත වෘත්තීයවේදියෙකි. විධායක නොවන අධ්‍යක්ෂ වරුන්ගේ පුළුල් පරාසයක පැතිරුණු නිපුණතාවයන් සහ පළපුරුද්ද බැංකුවේ අවදානම් කළමනාකරණ හා පාලන ක්‍රියාවලිය පොහොසත් කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ සම්පූර්ණ විස්තර පිටු අංක 26 සහ 27 හි ඉදිරිපත් කෙරේ.

▼ GRI 102-33

### නිතිපතා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම (ප්‍රතිපත්තිය අ.1.1)

අධ්‍යක්ෂ මණ්ඩලය අවම වශයෙන් සෑම මසකටම එක් වරක් රැස්වන අතර අවශ්‍ය අවස්ථාවන්හිදී අමතර රැස්වීම් කැඳවනු ලබයි. 2019 වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය 10 වරක් පමණක් රැස්වූ අතර, සෑම රැස්වීමක්ම ඉහළ පැමිණීමකින්, සක්‍රීය සහභාගීත්වයකින්, අර්ථාන්විත හා විවෘත සංවාදයන්ගෙන් සමන්විත විය.

අධ්‍යක්ෂවරුන්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ තමන් සාමාජිකත්වය දරන කමිටු වල රැස්වීම් වෙත සහභාගී වීම අවශ්‍ය වේ. නොපැමිණීමේ අවස්ථාවක් වී නම් එයට පෙර යොදාගත් ව්‍යාපාරික, පෞද්ගලික වගකීම් හෝ අසනීප තත්ත්වයන් හේතු විය හැක.

එයට අමතරව, න්‍යාය පත්‍රයේ අතුළත් විශේෂිත අයිතමයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ආරාධනා මත, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කණ්ඩායම සහ බැංකුවේ උපදේශකයින් හට සහභාගී විය හැක. තවද, බැංකුවේ ක්‍රමෝපාය සම්බන්ධ කරුණු පිළිබඳ විධිමත් පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩලය සහ අනුකමිටු වෙත ඉදිරිපත් කිරීමට අවසරය ආයතනික කළමනාකාරීත්ව කණ්ඩායම සහ/හෝ බාහිර විශේෂඥයින් වෙත හිමි වේ.

2019 වසරේදී එක් එක් අධ්‍යක්ෂ වරයාගේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ අදාළ කමිටු රැස්වීම් වෙත පැමිණීම පහත වගුවෙහි දැක්වේ:

| අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම | අධ්‍යක්ෂ මණ්ඩල විධායක කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩල නාම යෝජනා කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව | අධ්‍යක්ෂ මණ්ඩල උපායමාර්ගික සැලසුම් සමාලෝචන කමිටුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| සුජාතා කුරේ මහත්මිය | ස්වාධීන විධායක නොවන | 1/1 | | 1/1 | | | | | | |
| හේමසිරි ප්‍රනාන්දු මයා | ස්වාධීන නොවන විධායක නොවන | 9/4 | | 3/1 | | | 1/0 | | | |
| කේ ඩී එන් රංජිත් අශෝක මයා | ස්වාධීන නොවන විධායක නොවන | 11/11 | 4/4 | | 4/3 | | 2/2 | 4/4 | | |
| කේ එස් ගුණතිලක මයා | ස්වාධීන විධායක නොවන | 1/1 | | | | | | | | |
| ඩී විදානගමාච්චි මයා | ස්වාධීන විධායක නොවන | 1/1 | | | | | | | | |
| ඒ එච් විජේසිරි අබවත්ත මයා | ස්වාධීන විධායක නොවන | 1/1 | | 1/1 | | | | | | |
| ජයම්පති මොල්ලිගොඩ මයා | ස්වාධීන විධායක නොවන | 1/1 | | | | | | | | |
| දමිත රත්නායක මිය | ස්වාධීන නොවන විධායක නොවන | 1/1 | | | | | | | | |
| කේ වී ඩී එන් නානායක්කාර මයා | ස්වාධීන විධායක නොවන | 10/10 | | 2/2 | | | 2/2 | | | 2/2 |
| ඒ එම් පී එම් බී අතපත්තු මයා | ස්වාධීන නොවන විධායක නොවන | 10/10 | 4/4 | | 4/4 | | | 4/4 | | 2/2 |
| නිලංක මෙවන් පීරිස් මයා | ස්වාධීන විධායක නොවන | 10/10 | | | 4/2 | 15/15 | | | 11/11 | |
| ආචාර්ය අමින්ද එම් පෙරේරා | ස්වාධීන විධායක නොවන | 8/8 | | | | 15/15 | | 4/4 | 11/11 | |
| නියෝමාල් පෙරේරා මයා | ස්වාධීන විධායක නොවන | 7/7 | 4/0 | | | | | | | 2/2 |
| ලහිරු පත්මලාල් මයා | ස්වාධීන විධායක නොවන | 8/8 | | 2/2 | | 15/15 | | 4/4 | 11/11 | |
| එම් එස් ඒ මුතුමාල මයා | ස්වාධීන විධායක නොවන | 5/5 | | | 4/2 | | 1/1 | | | |

## අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය (ප්‍රතිපත්තිය අ.1.2)

බැංකුවට නායකත්වය, අධීක්ෂණය, පාලනය, සංවර්ධනය ලබාදීමට සහ බැංකුවේ දිගු කාලීන සාර්ථකත්වය සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී. එමෙන්ම ඔවුන් අදාළ නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව කොටස් හිමිකරුවන් වෙත වටිනාකම් නිර්මාණය කිරීම ද සිදුකරයි. බැංකුව තුළ නිවැරදි සංස්කෘතියක් පෝෂණය කිරීම, වටිනාකම් ඇති කිරීම සහ සදාචාර ප්‍රවර්ධනය කිරීම සඳහා ද අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමට බැඳී සිටී.

කාලීන වැදගත්කම පවත්වාගෙන යාම සඳහා නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කෙරෙන, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වෙන්කෙරුණු කරුණු වලින් සමන්විත විධිමත් කාර්ය සටහනක් පවතී.

| යහපාලනය | ක්‍රමෝපාය හා දිශානතීන් | අවදානම් කළමනාකරණය වගකීම සහ පාලනය |
|---|---|---|
| • යහපාලන සැකසුම් සමාලෝචනය<br>• අධ්‍යක්ෂ මණ්ඩලය සහ අනු කමිටු සාමාජිකයන් සඳහා විමර්ශන කොන්දේසි | • ක්‍රමෝපාය සහ වාර්ෂික අයවැය අනුමත කිරීම.<br>• කටයුතු අත්පත් කරගැනීමේ සහ බැහැර කිරීමේ සඳහා අනුමැතිය ලබාදීම<br>• අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය සහ අවදානම් දරාගැනීමේ සූදානම තහවුරු කිරීම. | • මූල්‍ය ප්‍රකාශ, වෙළඳපොල වෙත වෙනත් යාවත්කාලීනයන් සහ ලාභාංශ සඳහා වන නිර්දේශ අනුමත කිරීම.<br>• අධිකාරීත්ව සීමාවන්, මූල්‍ය හා භාණ්ඩාගාර ප්‍රතිපත්ති අනුමත කිරීම.<br>• අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ සමාලෝචනය.<br>• සෞඛ්‍ය හා ආරක්ෂණ ප්‍රතිපත්ති අනුමත කිරීම. |

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වගකීම් වලින් සමහරක් අනු කමිටු වෙත පවරනු ලැබ ඇත. එක් එක් කමිටුවට පවරන ලද කාර්යයන්හි විෂය පථය සහ වසර තුළ අත්කර ගත් ප්‍රගතිය පිළිබඳව මෙම වාර්තාවේ පිටුව 172 සිට 176 දක්වා ඉදිරිපත් කෙරේ.

බැංකුවේ අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන පද්ධතීන්ගේ ඵලදායීතාවය නියාමනය කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත පවරනු ලැබ ඇත. බැංකුවේ ''අවදානම ඉවසීම'' සම්බන්ධයෙන් නිර්ණය කිරීමේ පරම වගකීම අධ්‍යක්ෂ මණ්ඩල රඳවාගනී. අවදානම් කළමනාකරණ වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරන අතර එයට හඳුනාගත් අවදානම් සහ අවිනිශ්චිතතාවයන් නියාමනය, පාලනය සහ වාර්තාකිරීම ඇතුළත් වේ. එයට අමතරව, අවදානම් කළමනාකරණයට අදාළව අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව සහ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි සභාපතිවරයා විසින් යොමුකළ වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය සමාලෝචනය කරයි.

## ව්‍යාපාරයට අදාළ වන පරිදි දේශීය නීතිරීති වෙත අනුකූලතාවය සහ ස්වාධීන වෘත්තීය උපදෙස් ලබාගැනීමේ ක්‍රියාපටිපාටිය (ප්‍රතිපත්තිය අ.1.3)

බැංකුව විසින් සිදුකරනු ලබන විවිධ ව්‍යාපාරික කටයුතුවලට අදාළ වන, දේශීය නීතිරීති වලට අනුව අධ්‍යක්ෂ මණ්ඩලය සාමූහිකවද, තනි පුද්ගලයින් වශයෙන්ද කටයුතු කිරීම අපේක්ෂා කෙරේ. එමනිසා, අදාල සියලුම නිති සහ රෙගුලාසි සමඟ අනුකූලතාව පවත්වා ගැනීමට අදාළ සියලුම ක්‍රියාපටිපාටි සහ පාලනයන් ක්‍රියාත්මකව ඇති බව සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටී.

සමහර කරුණු සම්බන්ධව වරින් වර ස්වාධීන විනිශ්චය ලබාගැනීමේ අවශ්‍යතාව අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගනී. ඒ අනුව, ඔහුගේ/ඇයගේ රාජකාරි සහ වගකීම් මුදාහැරීමට අදාළ යම් කරුණු පිළිබඳ බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීය උපදෙස් (නීති, ගිණුම්කරණ හා මූල්‍ය උපදෙස් ඇතුළුව එයට සීමා නොවී) ලබාගැනීමේ හැකියාව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සතු වේ.

## සමාගම් ලේකම් (ප්‍රතිපත්තිය අ.1.4)

- සෑම අධ්‍යක්ෂ වරයකුටම ලේකම්වරයා හමුවිය හැකි වේ. සියලුම එකඟ වූ ක්‍රියාපටිපාටීන් සහ අදාළ නීතිරීති හා රෙගුලාසි නිසි පරිදි අනුගමනය කරන බව තහවුරු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා වගකීමට බැඳී සිටී. ඊට අමතරව අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වරයා විසින් සියළුම කමිටුවල ලේකම් ධූරය දරමින් සියළුම රැස්වීම් වලට අදාළ වාර්තා පවත්වාගෙන යනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාට අදාළ සෙසු වගකීම්වලට පහත දෑ ඇතුළත් වේ
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා අනු කමිටු රැස්වීම් පැවැත්වීමට අදාළ කරුණු සම්බන්ධීකරණය කිරීම.
- සියළු කටයුතු මහජන බැංකු පනත සහ අදාළ නීතිරීති වලට අනුකූලව සිදුකිරීම.
- අදාළ නීතිකරණ සහ මනා පරිචයන්ට අනුකූලව, සිය කාර්යභාරයන් සහ වගකීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ට සහයවීම ඇතුළුව, ආයතනික යහපාලන පිළිබඳ මනා පරිචයන් යොදා ගැනීම සඳහා පහසුකම් සැකසීම.
- විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ කළමනාකාරීත්වය අතර සන්නිවේදන සම්බන්ධීකාරක වශයෙන් කටයුතු කිරීම.
- නියාමන අවශ්‍යතාවයන්ට අනුව සම්බන්ධිත පාර්ශ්ව සහ සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ආශ්‍රිත යෝග්‍ය හෙළිදරව් කිරීම් තහවුරු කිරීම.
- මහජන බැංකුව සියළුම අදාළ නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කරන බවට තහවුරු කිරීමේදී, මහජන බැංකු පනත සහ අනෙකුත් නෛතික තත්ත්වයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමග සහයෝගිත්වයෙන් නීති උපදෙස් පැතීම.

## අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීන විනිශ්චය (ප්‍රතිපත්තිය අ.1.5)

අධ්‍යක්ෂවරුන් විසින් බැංකුවේ තීරණ සම්බන්ධයෙන් ස්වාධීන විනිශ්චයක් ලබාදීම අවශ්‍ය වේ. පළපුරුදු වෘත්තිකයින් වශයෙන්, ඔවුන්ගේ කාර්යභාරයන් සෙසු අයගේ කවර හෝ බලපෑමකින් තොරව ඉටු කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ උනන්දු උපකාර දායකත්වය ප්‍රවර්ධනය කරයි.

## අධ්‍යක්ෂවරුන් ප්‍රමාණවත් කාලයක් සහ ප්‍රයත්නයක් වෙනුවෙන් කැපවීම (ප්‍රතිපත්තිය අ.1.6)

අධ්‍යක්ෂවරුන් විසින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සමාලෝචනය සඳහා රැස්වීමට පෙර ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් වැය කළ යුතු වන අතර, අමතර තොරතුරු සහ පැහැදිලි කිරීම් ඉල්ලා සිටිමින් අදාළ ගැටළු සම්බන්ධ පසු විපරම් සිදුකිරීම අවශ්‍ය වේ.

එමෙන්ම, සියළුම රැස්වීම් වලදී, අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් සතුටුදායක අයුරින් ඉටු කිරීමට ප්‍රමාණවත් කාලයක් වැය කිරීමද අධ්‍යක්ෂවරුන්ගෙන් බලාපොරොත්තු වේ.

## අධ්‍යක්ෂවරුන් සඳහා පුහුණුව (ප්‍රතිපත්තිය අ.1.7)

අඛණ්ඩ සංවර්ධනය සඳහා අදාළ පුහුණු ලබාගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හිමිකම ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය/කමිටු වෙත අධ්‍යක්ෂවරුන්ගේ දායකත්වය තහවුරු කිරීම පිණිස, බැංකුව විසින් මෙහෙයුම් සිදුකරනු ලබන වෙළෙඳපොල සම්බන්ධයෙන් සිය දැනුම, නිපුණත්වය හා අවබෝධය වර්ධනය කිරීම උදෙසා අධ්‍යක්ෂවරුන් වෙත පුහුණුව සහ යාවත්කාලීන ලබාදෙනු ලැබේ. මෙයට බැංකුවේ මෙහෙයුම්, ආයතනික යහපාලන, නෛතික හා නියාමන සංවර්ධනයන් පිළිබඳ ජ්‍යේෂ්ඨ විධායකයින්ගේ හෝ උපදේශකවරුන්ගේ ලිඛිත වාර්තා සහ ඉදිරිපත් කිරීම් ඇතුලත් වේ.

## සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී (ප්‍රතිපත්තිය අ.2)

සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී (CEO)/සාමාන්‍යාධිකාරී (GM) මහජන බැංකුවේ නායකත්වය සඳහා සහ අවංකකම සහ විශ්වාසනීයත්වය සම්බන්ධ ඉහළම සම්මතයන් ප්‍රවර්ධනය කිරීම කෙරෙහි සාමූහිකව වගකීමට බැඳී සිටින අතරම, සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී අතර වගවීම සහ වගකීම පිළිබඳ පැහැදිලි සහ බලාත්මක වෙන් කිරීමක් පවතී. බලසමතුලනය සහ කිසිදු පුද්ගලයකු තීරණ හා පාලන බලය අනිසි ලෙස භාවිතයෙන් වැළැක්වීම තහවුරු කිරීම එහි අරමුණයි.

එලදායී මෙහෙයුම් සහ එහි නෛතික හා නියාමන වගකීම් සම්පූර්ණයෙන් මුදාහරින බව තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නායකත්වය දීම, මෙහෙයවීම සහ කළමනාකරණය සඳහා සභාපතිවරයා වගකීමට බැඳී සිටී. ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීගේ මූලික වගකීම වනුයේ බැංකුවේ දෛනික මෙහෙයුම් කටයුතු කළමනාකරණය කිරීමයි.

## සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී ධූරයන් ඒකාබද්ධ කරමින් එක් පුද්ගලයකු වෙත පැවරීමේ තීරණය සාධාරණීකරණය කිරීම සහ විශේෂ කොට දැක්වීම (ප්‍රතිපත්තිය අ.2.1)

එක් පුද්ගලයකු වටා තීරණ ගැනීම සම්බන්ධ අසීමිත බලයක් කේන්ද්‍රගතවීම වලක්වමින් සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී යන ධූරයන් පැහැදිලිව බෙදා වෙන් කොට ඇත.

සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා පිළිබඳ මෙම වාර්තාවේ පිටු අංක 26 සහ 30 හි විස්තර කරනු ලැබ ඇත.

GRI 102-23

## සභාපතිවරයාගේ කාර්යභාරය (ප්‍රතිපත්තිය අ.3)

ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා සහ කළමනාකාරීත්වය විසින්, අධ්‍යක්ෂ මණ්ඩලය එකඟත්වය පළ කරන ලද ක්‍රමෝපායන් සහ ප්‍රතිපත්තීන් එලදායක ලෙස ක්‍රියාවට නංවනු ලබන බවට තහවුරු කිරීම සභාපතිවරයාගේ වගකීම වේ. එමෙන්ම සභාපති යහපාලන ව්‍යවහාර යොදා ගැනීම සඳහා නායකත්වය සපයන අතර, කොටස් හිමියන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ එලදායි සන්නිවේදනය සහතික කිරීමට පාලනය ලබා දේ.

## අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාම (ප්‍රතිපත්තිය අ.3.1)

අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නායකත්වය ලබාදීම පමණක් නොව, බැංකුවේ සහ එහි පාර්ශ්වකරුවන්ගේ පරම අභිමතය සුරැකීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය අධීක්ෂණයද සභාපතිවරයාගේ වගකීම වේ. ඒ අනුව, සභාපතිවරයා පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් වගකීමේ බැඳේ:

- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් එලදායී අයුරින් සැලසුම්කර පවත්වනු ලබන බවට තහවුරු කිරීම.
- එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා න්‍යාය පත්‍රය සැකසීම සහ අධ්‍යක්ෂවරුන් විවිධ අනුකමිටු සාමාජිකයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා පිළිබඳව දැනුවත් වීම.
- අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත නිවැරදි කාලීන හා පැහැදිලි තොරතුරු ලැබෙන බවට තහවුරු කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා නිවැරදිව ලේඛණගත කොට අධ්‍යක්ෂවරුන් අතර බෙදාහැරෙන බවට තහවුරු කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නායකත්වය සහ පාලනය සපයමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ තනි අධ්‍යක්ෂවරුන් සඳහා කාලින ආකාරයෙන් ගැටළු සාකච්ඡා කිරීම සඳහා උපකාරී වටපිටාව නිර්මාණය කිරීම.
- විනිවිද සංස්කෘතියක් ප්‍රවර්ධනය සහ අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ කරුණු සම්බන්ධයෙන් උපකාරී සහ යහපත් අදහස් හුවමාරු කරගැනීමට නිරතවීම සඳහා විධායක නොවන අධ්‍යක්ෂවරුන් දිරි ගැන්වීම සහ ඒ තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ එලදායි ක්‍රියාකාරීත්වයට දායක වීම.
- සමූහයේ ක්‍රමෝපායන් සහ ප්‍රතිපත්ති සැකසීමේදී සහ නිර්ණය කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය සමස්තයක් වශයෙන් පරිපූර්ණ කාර්යභාරයක් ඉටුකරන බවට සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ බැංකුවේ පරම අභිමතය අනුව ගනු ලබන බවට සහ අධ්‍යක්ෂ මණ්ඩලයෙ එකඟත්වය තහවුරු කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ එලදායීතාවය තවදුරටත් වර්ධනය කිරීම සඳහා අර්ථවත් ප්‍රතිචාර ඇති කිරීමට ස්වයං තක්සේරුකරණය සඳහා නායකත්වය ලබාදීම.

## මූල්‍යමය විචක්ෂණභාවය (ප්‍රතිපත්තිය අ.4)

අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රමාණවත් මූල්‍ය විචක්ෂණභාවයෙන් යුතු සාමාජිකයන්ගෙන් සැදුම්ලත් වේ. මෙහිදී මූල්‍යමය කරුණු සම්බන්ධයෙන් මාර්ගෝපදේශකත්වය සපයනු ලබන ජ්‍යේෂ්ඨ වරලත් ගණකාධිකාරීවරුන් සහ වරලත් කළමනාකරණ ගණකාධිකාරීවරයකු සහභාගී වේ. මෙයට අමතරව සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ප්‍රමාණවත් මූල්‍ය විචක්ෂණභාවය සහිත පරිණත වෘත්තිකයින් වේ.

## අධ්‍යක්ෂ මණ්ඩල සමතුලනය (ප්‍රතිපත්තිය අ.5)

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් 8ක් සමඟ මනා සමතුලනයකින් යුක්ත වන අතර එයින් 7 දෙනෙක් ස්වාධීන නිලය තුළ කටයුතු කරයි. මෙය සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් එක්ව නිකුත් කරන ලද ආයතනික යහපාලන සඳහා වන යහ ක්‍රියාකාරකම් සංග්‍රහය විසින් දක්වා ඇති අවමයට ඉහළ අගයකි.

සියළුම ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් කළමනාකරණය පිළිබඳ ස්වාධීන වන අතර වැදගත් මැදිහත් වීමක් තිබියහැකි හෝ නිදහස් හෝ ස්වාධීන විනිශ්චයක් ක්‍රියාත්මක කිරීම සමඟ වැදගත් මැදිහත් වීම සාධාරණව ගම්‍යමාන වියහැකි යම් ව්‍යාපාරික හෝ වෙනත් සබඳතාවයකින් තොර වේ.

සෑම විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විසින් විශේෂ නිර්ණායකවලට අනුව ස්වාධීන බව/ස්වාධීන නොවන බව සම්බන්ධ අත්සන් තබන ලද ප්‍රකාශයක් ඉදිරිපත් කරන අතර ස්වාධීනත්වය නිර්ණය කිරීම උදෙසා නිර්ණායකවලට අනුකූලතාවය සහතික කිරීම සඳහා ඇගයුමට ලක් කෙරේ.

සමාලෝචනයට ලක් වූ වසර තුළ, විකල්ප අධ්‍යක්ෂවරුන් පත් කිරීම අවශ්‍ය වන ආකාරයේ කිසිදු තත්ත්වයක් උද්ගත නොවීය. තවද සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී ධුරයන් බෙදා වෙන්කිරීම හේතුවෙන් ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයකු පත් කිරීමේ අවශ්‍යතාවයද උද්ගත නොවීය.

## තොරතුරු සැපයීම (ප්‍රතිපත්තිය අ.6)

සියළුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත ප්‍රමාණවත් දැනුම්දීමක් සමගින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා දින නියම කරගනු ලැබේ. එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල හෝ කමිටු රැස්වීමකට පෙර, න්‍යායපත්‍රය, අන්තර්ගතය සහ කළමනාකරණ ඉදිරිපත්කිරීම් ඇතුළු අදාළ සියලුම පත්‍රිකා රැස්වීමට වැඩකරන දින හතකට පෙර අධ්‍යක්ෂවරුන් වෙත ලැබීමට සලස්වනු ලබන බවට අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් තහවුරු කෙරේ. රැස්වීම් වලට සහභාගී විය නොහැකි අධ්‍යක්ෂවරුන් සඳහා ලේඛණගත වාර්තා ඔස්සේ ඔවුන් යාවත්කාලීන කරමින් ඊළඟ රැස්වීමේදී අදාළ කරුණු සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකෙරේ. දෙන ලද මාසයක් සඳහා මාසික ගිණුම් වාර්තා පිළියෙල කොට එක් එක් අංශයේ/පර්පාලිතයේ මූලික කාර්යසාධන දර්ශක සමගින් අධ්‍යක්ෂවරුන් අතර බෙදා හැරේ. සපයන ලද තොරතුරු ප්‍රමාණවත් නොවන බවට හෝ අපැහැදිලි බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගනු ලැබුවහොත්, වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් ඉල්ලා සිටීමේ හැකියාව ඔවුන් සතු වේ. වැඩිදුර අවශ්‍ය බව කල්පනා කරන්නේනම්, අදාළ කළමනාකරණ කාර්ය මණ්ඩලය කැඳවනු ලැබිය හැකිය.

▼ GRI 102-24

## අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කිරීම් (ප්‍රතිපත්තිය අ.7 සහ අ.8)

මහජන බැංකු පනත අනුව, විෂය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් 10ක උපරිමයක් දක්වා පත් කරනු ලබන අතර ඔවුන්ගෙන් දෙදෙනෙකු සමූපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කෙරේ. වසර 3 ක් සඳහා පත්කිරීම් සිදුකෙරෙන අතර, 2007 අංක 11 දරන බැංකුකරණ පනතෙහි නියෝගය අනුව, වසර නවයක උපරිම කාලසීමාවකට හෝ වයස අවුරුදු 70 යන දෙකෙන් කලින් එළඹෙන දිනයට යටත් වේ.

අධ්‍යක්ෂ ධුරයන් සඳහා වන සියළුම පත්කිරීම් යෝග්‍යතා හා නිශ්චිත ක්‍රියාපටිපාටිය යටතේ වන බව ඇගයුම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

## අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධනය ඇගයුම (ප්‍රතිපත්තිය අ.9)

සංග්‍රහයේ අධ්‍යක්ෂ මණ්ඩල කාර්යසාධන ඇගයුම් පිරික්සුම් ලැයිස්තුව තුළ දක්වා ඇති සියලුම නිර්ණායකයන් ඇතුළත්කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සෑම සාමාජිකයකු විසින් වසර සඳහා ඔහුගේ/ඇයගේ කාර්යසාධනය සහ සමස්තයක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්සාධනය පිළිබඳ ස්වයං ඇගයුමක් සිදුකරනු ලබයි. අදාළ ප්‍රතිචාරයන් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා විසින් එක්රැස් කොට සාරාංශගත වාර්තාවක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාරදෙනු ලැබේ.

## අධ්‍යක්ෂවරුන් සම්බන්ධ තොරතුරු අනාවරණය (ප්‍රතිපත්තිය අ.10)

අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් සංග්‍රහය තුළ දක්වා ඇති තොරතුරු පහත පරිදි මෙම වාර්ෂික වාර්තාවේ අනාවරණය කෙරේ:

- පිටු අංක 26 සිට 27 දක්වා නම, සුදුසුකම්, කෙටි විස්තරයක් සහ විශේෂඥතාවයේ ස්වභාවය
- පිටු අංක 154 හි 2019 වසර තුළ පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල සහ කමිටු රැස්වීම් සහ පැමිණීම්
- පිටු අංක 153 හි අධ්‍යක්ෂවරයා සභාපති හෝ සාමාජිකයකු වශයෙන් සේවය කරන කමිටු වල නම්
- පිටු අංක 265 සිට 269 දක්වා සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු

## ප්‍රධාන විධායක නිලධාරීවරයා සම්බන්ධ ඇගයුම (ප්‍රතිපත්තිය අ.11)

ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා සම්බන්ධ ඇගයුම අධ්‍යක්ෂ මණ්ඩලයේ වැදගත්ම වගකීම් වලින් එකකි. මෙමගින් ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයාගේ බැංකුවේ නායකත්වය සහ කාර්යසාධනය පිළිබඳ ඵලදායී සංවාදයක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා හට විධිමත් අවස්ථාවක් උදා වේ. ක්‍රමෝපායික සැලසුම්කරණය සහ කාර්යසාධන කළමනාකරණය යටතේ සකස් කළ ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා සඳහා මූලික කාර්යසාධන දර්ශක මණ්ඩලයක් විසින් මාසිකව සමාලෝචනය කර එම සමාලෝචනය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සමාලෝචනය සඳහා ඉදිරිපත් කරයි. මෙම ඉලක්ක අධ්‍යක්ෂ මණ්ඩලය මගින් තහවුරු කොට, වාර්ෂික ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී ඇගයුම් ක්‍රියාවලියෙහි පදනම වශයෙන් යොදාගැනේ.

ගතයුතු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් සමඟ කවර හෝ අහිතකර විචලනයක් සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් අදාළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීවරයා වගකීමෙන් බැඳී සිටී.

# ආයතනික යහපාලනය

## අධ්‍යක්ෂවරුන්ගේ සහ විධායකයින්ගේ පාරිශ්‍රමික ක්‍රියාපටිපාටිය (ප්‍රතිපත්තිය ආ.1,ආ.1.1, ආ.2,ආ.3)

මුදල් අමාත්‍යාංශය මගින් සකසනු ලබන මාර්ගෝපදේශයන්ට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික තීරණය කරනු ලබයි. කිසිදු අධ්‍යක්ෂවරයකු ස්වකීය ඔහුගේ/ඇයගේ පාරිශ්‍රමික තීරණය කිරීම සඳහා සහභාගී නොවේ. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව මගින් බැංකුවේ පාරිශ්‍රමික ප්‍රතිපත්ති හා සාමූහික එකඟතාවකට අනුව ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකාරිත්වයට අදාළ පාරිශ්‍රමික පිළිබඳ නිර්දේශයන් ඉදිරිපත් කෙරේ. බැංකුවේ විශිෂ්ට කාර්යසාධනයක් සහිත, සුදුසුකම් ලත් සහ පළපුරුදු සේවකයින් ආකර්ශනය, රඳවාගැනීම සහ දිරිමත් කිරීමට හැකි වන අයුරින් පාරිශ්‍රමික සකසනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සාමූහික එකඟතාවය යටතේ සිය පාරිශ්‍රමික සම්බන්ධ අනුමැතිය සඳහා අවසාන බලධාරියා වන මුදල් අමාත්‍යවරයා වෙත අදාළ ඉදිරිපත් කෙරේ.

සිය කාර්යභාරයන් ඉටු කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව මගින් අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවන්හිදී බැංකුවට පිටතින් වෘත්තීය උපදෙස් පතනු ලැබේ. පාරිශ්‍රමික ප්‍රතිපත්ති ප්‍රකාශය සහ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවෙහි සාමාජිකයින්ගේ නම් හෙළිදරව් කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව පිටු අංක 173 හි ඉදිරිපත් කෙරේ. අධ්‍යක්ෂවරුන් වෙත ගෙවනු ලබන මුළු පාරිශ්‍රමික පිටු අංක 212 හි දැක්වේ.

## කොටස් හිමිකරුවන් සමග සබඳතා (ප්‍රතිපත්තිය ඈ.1,ඈ.2)

ශ්‍රී ලංකා රජය ප්‍රධාන කොටස් හිමිකරු වන රාජ්‍ය බැංකුවක් වශයෙන්, මහජන බැංකුව සෘජුවම මුදල් අමාත්‍යාංශ විෂය පථය යටතට පත් වේ. රටේ සමාජ-ආර්ථික සංවර්ධනය සමඟ පෙළ ගැසීම සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය මුදල් අමාත්‍යංශය සමඟ සම්බන්ධ වේ.

වාර්ෂික වාර්තාව ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ යන භාෂාවන්ගෙන් මුද්‍රණය කෙරෙන අතර, මුදල් අමත්‍යාංශය හරහා පාර්ලිමේන්තුව වෙත සංසරණය කෙරේ. අමාත්‍යංශයට අදාළ කරුණු සඳහා බැංකුව මුදල් අමාත්‍යංශය සමඟ සම්බන්ධ වේ.

## ප්‍රධාන සහ වැදගත් ගනුදෙනු (ප්‍රතිපත්තිය ඈ.3)

පිටු අංක 265 සිට 269 දක්වා සම්බන්ධිත පාර්ශ්ව අනාවරණ යටතේ, මූල්‍ය ප්‍රකාශයන්ට සටහන් 46 හි හෙළිදරව් කරන ලද කරුණු හැරුණු විට, බැංකුවේ හෝ සමූහයේ ශුද්ධ වත්කම් පදනම වෙනස්වීමකට භාජනය වන ආකාරයේ කිසිදු ගනුදෙනුවක් නොවීය.

## මූල්‍ය වාර්තාකරණය (ප්‍රතිපත්ති ඈ.1)

මෙම වාර්ෂික වාර්තාව මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය සහ ඉදිරි අවස්ථාවන් පිළිබඳ සමතුලිත විග්‍රහයක් ඉදිරිපත් කෙරේ. අවබෝධය සහ පැහැදිලි බව වැඩි කිරීම සඳහා, තොරතුරු ඉදිරිපත් කිරීමේදී ප්‍රකාශනාත්මක හා දෘෂ්‍ය සංරචකයන් ද්විත්වයම යොදා ගැනුනි. මෙම වාර්තාව තුළ අපගේ කාර්යසාධනය සම්බන්ධ සමතුලිත දැක්මක් අපි ලබාදී ඇති අතර, අනෙකුත් සන්නිවේදන මුදල් අමාත්‍යංශය සහ නියාමකයින් ඇතුළුව අදාළ බලධාරීන් වෙත ඉදිරිපත් කර ඇත. වාර්ෂික වාර්තාව තුළ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන්ට සහ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ අතුරු සන්නිවේදන නිකුතුවේදී අනුකූලතාව සහතික කිරීමට බැංකුව සෑම පියවරක්ම ගෙන ඇත.

සංග්‍රහය අනුව අවශ්‍ය පහත දැක්වෙන හෙළිදරව් කිරීම් මෙම වාර්තාවේ ඇතුළත් කෙරේ:

- පිටු අංක 182 හි ඉදිරිපත් කොට ඇති අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශනයෙහි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත් කිරීමේදී අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශයක් ඇතුළත් වේ.
- පිටු අංක 183 සිට 184 දක්වා ස්වාධීන විගණකගේ වර්තාවෙහි ඔවුන්ගේ වගකීම් පිළිබඳ ප්‍රකාශයක් දැක්වේ.
- පිටු අංක 177 සිට 178 දක්වා අභ්‍යන්තර පාලනයන් සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය
- පිටු අංක 40 සිට 58 දක්වා කළමනාකරණ විග්‍රහය
- පිටු අංක 182 හි අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් ප්‍රකාශය තුළ සමාගමෙහි අඛණ්ඩතා පැවැත්ම පිළිබඳ ප්‍රකාශයක් දැක්වේ.
- අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශයන් හි සටහන් 46 හි පිටු අංක 265 සිට 269 දක්වා කොටසෙහි සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු පිළිබඳව හෙළිදරව් කොට ඇත.

## අභ්‍යන්තර පාලන සහ විගණන කමිටුව (ප්‍රතිපත්තිය ඈ.2 සහ ඈ.3)

බැංකුවේ පාර්ශවකාර අභිමතයන් සහ වත්කම් සුරැකීම සඳහා අවශ්‍ය යෝග්‍ය හා ප්‍රමාණවත් අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් හා අභ්‍යන්තර පාලන ක්‍රම සැකසීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් එහි වගකීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමුවේ. එහිදී අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන්ද අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අවදානම් කළමනාකරණය සම්බන්ධ කාර්යභාරයන් ඉටු කිරීමේදී ද අධ්‍යක්ෂ මණ්ඩල වෙත සහාය ලබාදෙයි. මෙම කමිටුවල කාර්යභාරයන් සහ වගකීම් පිළිවෙලින් පිටු අංක 172 සහ 176 හි දැක්වේ.

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්මේන්තුවේ සහාය හිමි වේ. බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ පරිපූර්ණ වාර්තාවක් පිටු අංක 110 සිට 138 දක්වා ඉදිරිපත් කෙරේ. බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය විසින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවට සහය වේ. අභ්‍යන්තර විගණන දෙපාර්මේන්තුව මගින් අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව සහ ඵලදායීතාවය සමාලෝචනය කොට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත අඛණ්ඩ පදනමක් මත වාර්තා කරනු ලැබේ. විගණන කමිටුවෙහි කාර්යභාරයට එබඳු විගණනයන්හි විෂය පථය සහ ප්‍රතිඵල මෙන්ම ඵලදායීතාවය විශ්ලේෂණය කිරීම ඇතුළත්ය. විගණන කමිටුව මගින්, බැංකුවේ බාහිර විගණනය සිදුකරනු ලබන විගණකාධිපතිවරයා සමග සම්බන්ධීකරණය ආශ්‍රිත මූලික කාර්යභාරයද ඉටු කෙරේ.

## ව්‍යාපාර චර්යාවන් සහ ආචාර ධර්ම සංග්‍රහය සහ ආයතනික යහපාලන වාර්තාව (ප්‍රතිපත්තිය ඈ.4, ඈ.5)

බැංකුවට ව්‍යාපාර චර්යාවන් සහ ආචාර ධර්ම සංග්‍රහ දෙකක් පවතින අතර, ඉන් එකක් අධ්‍යක්ෂවරුන් වෙත සහ දෙවැන්න සේවකයින් සඳහා අදාළ වේ. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව අදාළ සංග්‍රහයන් නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කරමින් බැංකුවේ වෙනස්වන මෙහෙයුම්වලට අදාළත්වය හා ප්‍රමාණවත්භාවය තහවුරු කිරීමේ වගකීම උසුලයි. ව්‍යාපාර චර්යාවන් සහ ආචාර ධර්ම සංග්‍රහයන් ආයතනික යහපාලන පිළිබඳ යහ ක්‍රියාකාරකම් සංග්‍රහයේ 1 උපලේඛණයේ අවශ්‍යතාවන්ට අනුකූල වේ.

පිටු අංක 159 සිට 171 දක්වා ඇති මෙම ආයතනික යහපාලන වාර්තාව, ප්‍රතිපත්ති අෑ. 5 හි දක්වා ඇති පරිදි, ආයතනික යහපාලන පිළිබඳ යහ ක්‍රියාකාරකම් සංග්‍රහය සමඟ අනුකූලව ප්‍රමාණය හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවය සමඟ අනුකූල වේ.

## කොටස් හිමිකාර සබඳතා (ප්‍රතිපත්තිය ඉ සහ ඊ)

මහජන බැංකුවේ ප්‍රධාන කොටස් හිමිකරු ශ්‍රී ලංකා රජය වන බැවින්, සංග්‍රහය ආශ්‍රිත විධිවිධාන අදාළ නොවේ.

GRI 102-18, 102-19, 102-32

## තිරසාරත්ව වාර්තාව (ප්‍රතිපත්තිය උ)

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුව සඳහා තිරසාරත්ව ප්‍රතිපත්තියක් අනුමත කොට, එහි දර්ශනය, අරමුණු සහ සමාජ හා පාරිසරික සංවර්ධනය උදෙසා වන ක්‍රමෝපායික ඉලක්ක ක්‍රියාවට නැංවෙන බවට තහවුරු කෙරෙන්නා වූ පාලන ව්‍යුහයක් ස්ථාපනය කරනු ලැබ ඇත.

සංග්‍රහයේ ප්‍රතිපත්ති වලට අනුකූලව බැංකුවේ තිරසාරත්ව ව්‍යාපාරික ව්‍යාපෘතීන් පහත දැක්වේ:

**1 ප්‍රතිපත්තිය –** ආර්ථික තිරසාරත්වය – මූල්‍ය ප්‍රාග්ධනය, පිටු අංක 63 සිට 68

**2 ප්‍රතිපත්තිය –** පරිසරය – ස්වභාවික ප්‍රාග්ධනය – පිටු අංක 106 සිට 109

**3 ප්‍රතිපත්තිය –** ශ්‍රම ක්‍රියාකාරකම් – මානව ප්‍රාග්ධනය – පිටු අංක 78 සිට 88

**4 ප්‍රතිපත්තිය –** සමාජය – සමාජයීය සහ සබඳතා ප්‍රාග්ධනය – පිටු අංක 89 සිට 105

**5 ප්‍රතිපත්තිය –** නිෂ්පාදන වගකීම – සමාජයීය සහ සබඳතා ප්‍රාග්ධනය – ගනුදෙනුකරු – පිටු අංක 89 සිට 95

**6 ප්‍රතිපත්තිය –** පාර්ශ්වකරුවන් හඳුනාගැනීම, සහභාගීත්වය සහ ඵලදායි සන්නිවේදනය – කොටස් හිමිකාර සහභාගීත්වය - පිටු අංක 60 සිට 62

**7 ප්‍රතිපත්තිය –** වාර්තාකරණ ක්‍රියාවලියෙහි කොටසක් වශයෙන් තිරසාර වාර්තාකරණය විධිමත් කිරීම සහ නිරන්තරයෙන් සිදු කිරීම – මෙම වාර්තාව පිළිබඳව පිටු අංක 01 සිට 03 දක්වා

## ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද ආයතනික යහපාලන සම්බන්ධ 2007 අංක 11 දරණ බැංකු පනත් නියෝගය සහ එය වෙත සිදුකරන ලද සංශෝධන වගන්තිය ප්‍රතිපත්තිය අනුකූලතාවය සහ ක්‍රියාවට නැංවීම

| කොටස | ප්‍රතිපත්තිය | අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම | තත්ත්වය |
|---|---|---|---|
| **3. (1)** | **අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්** | | |
| | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත දැක්වෙන ආකාරයෙන් බැංකුවේ සුරක්ෂිතතාව සහ ප්‍රබලත්වය ශක්තිමත් සවිමත් කරනු ලැබ ඇත. | | |
| අ. | උපායමාර්ගික අරමුණු සහ සංස්ථාපිත වටිනාකම් සැකසීම | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද 2016 – 2020 ක්‍රමෝපායික සැලසුම ක්‍රියාත්මක වන අතර ක්‍රමෝපායික පරමාර්ථ ව්‍යාපාර ඒකක ප්‍රධානී සහ මෙහෙයුම් මට්ටමේ කාර්ය මණ්ඩලය දැනුවත් කරනු ලැබ ඇත.<br><br>2016 – 2020 ක්‍රමෝපායික සැලසුමේ මාසික ප්‍රගතිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2019 – 2020 උපාය සැලැස්මේ අදියර 11 යටතේ ක්‍රියාත්මක කළයුතු උපාය ක්‍රියාමාර්ගයන් අනුමත කර ඇත. 2018 අයවැය මූල්‍ය අංශ ප්‍රධානි විසින් ඉදිරිපත් කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1 වැඩසටහනට අනුමැතිය ලබා දී ඇත. | අනුකූල විය |
| ආ. | අවදානම් ප්‍රතිපත්තිය සහ කළමනාකරණය ඇතුළු සමස්ත ව්‍යාපාර ක්‍රමෝපාය අනුමත කිරීම | බැංකුවේ ක්‍රමෝපායික සැලසුමට අරමුණු සමස්ත ව්‍යාපාර ක්‍රමෝපාය ඇතුළත් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය යාන්ත්‍රණ ක්‍රියාවේ යොදවා ඇති අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සමාලෝචනය කර ඇත.<br><br>2019 සිට 2023 දක්වා මීළඟ වසර තුනක කාලසීමාව සඳහා මිනුම්කරණය කළ හැකි ඉලක්ක යෝජිත මුදල් ප්‍රකාශන යටතේ බැංකුවේ 2019 ICAAP වාර්තාව තුළ වල  ඇතුළත් කරනු ලැබ ඇත. | අනුකූල විය |
| ඇ. | අවදානම් කළමනාකරණය | අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින් ප්‍රධාන අවදානම් නිලධාරියාගේ සහ අදාළ ප්‍රධාන කළමනාකරණ ක්‍රියාකාරකම් වල සහායෙන් යුතුව බැංකුවේ සියළුම අවදානම් ඇගයුම සඳහා මූලිකව ක්‍රියාකරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ නව ක්‍රමෝපායන්, අදාළ නව ක්‍රමෝපායෙන් තුළින් පැනනගින අවදානම් සහ අදාළ අවදානම් අවම කරගැනීම සඳහා වන මාර්ගයන් පිළිබඳ සාකච්ඡා කරනු ලබන ක්‍රියාවලියක් ඇරඹීමට බැංකුවට සිදු වනු ඇත. | අනුකූල විය |
| ඈ. | සියළුම පාර්ශ්වකරුවන් සමග අදහස් හුවමාරු කරගැනීම | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියළුම පර්ශ්වකරුවන් සමග ඵලදායී ද්විපාර්ශ්වීය සන්නිවේදන ප්‍රතිපත්තියක් අනුමත කොට ක්‍රියාවේ යොවනු ලැබ ඇත. | අනුකූල විය |

# ආයතනික යහපාලනය

| කොටස | ප්‍රතිපත්තිය | අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම | තත්ත්වය |
|---|---|---|---|
| ඉ. | අභ්‍යන්තර පාලන පද්ධතිය කළමනාකරණ තොරතුරු පද්ධති | මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය සහ සැකැස්ම ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩලය හට මූල්‍ය තොරතුරු සහ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ නිරවද්‍යතාවය හඳුනාගත හැකි වන ආකාරයේ වාර්ෂික අධ්‍යක්ෂ මණ්ඩල යාන්ත්‍රණයක් බැංකුවේ පවතී. එමෙන්ම අභ්‍යන්තර විගණන අංශය මෙම ක්‍රියාවලියට වටිනාකම් එකතු කරයි. අභ්‍යන්තර විගණන අංශය අදාළ දෙපාර්තමේන්තු අංශ ප්‍රධානීන්ගේ සහයෝගයෙන් අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචන ක්‍රියාවලියේ නිරත වී සිටී.<br><br>මූලික පියවර ලෙස, IAD විසින් අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සමාලෝචනය කර ඇති මූල්‍ය නොවන කළමනාකරණ තොරුතුරු පද්ධති වාර්තා හඳුනාගෙන ඇති අතර ඔවුන් බැංකුවේ කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි නිරවද්‍යතාවය සහ ප්‍රමාණාත්මක බව සම්බන්ධයෙන් සෑහීමකට පත්වන බව තහවුරු කොට ඇත. තවද, අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි විසින් වාර්තාව අනුව අදාළ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට කළමනාකාරිත්වය විසින් නිසි පියවර ගනිමින් සිටින බව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දන්වනු ලැබ ඇත. | අනුකූල විය |
| ඊ. | ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය | 2010 අංක 3 දරන බැංකුකරණ පනතෙහි නිර්ණනය අනුව සහ 2015.12.02. දින නිකුත් කරන ලද බැංකු අධීක්ෂණ අංශ මාර්ගෝපදේශ අංක 02/17/550/0002/003 හි නිර්වචනය කොට ඇති අයුරින්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය වශයෙන් ප්‍ර.වි.නි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් සහ සහකාර සාමාන්‍යාධිකාරීවරුන් නිර්වචනය කොට ඇත.<br><br>අධ්‍යක්ෂ මණ්ඩලය ඉහළ සඳහන් බැංකු පනත් නියෝග තීරණයට අනුව, පහත වර්ග ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය වශයෙන් නිර්වචනය කොට ඇත. මෙය ප්‍ර.වි.නි,/සාමාන්‍යාධිකාරී, ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්, සහකාර සාමාන්‍යාධිකාරීවරුන් , CRO/ DGM(RM), HOF, CIA, අනුකූලතා නිලධාරී, භාණ්ඩාගාර ප්‍රධානී, නීති ප්‍රධානී, IT ප්‍රධානී, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, උපදේශකයින් ලෙස සේවය කරන නිලධාරී, අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ බැංකුවේ උපදේශක සහ බැංකු පනත් නියෝගයේ 3(I)(i)(ඊ) වගන්තියේ නිර්වචනය යටතේ අයත්වන වෙනත් නිලධාරීන්ගෙන් සමන්විත වේ. | අනුකූල විය |
| උ. | අධ්‍යක්ෂ වරුන්ගේ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ අධිකාරීත්ව වපසරිය සහ ප්‍රධාන වගකීම් නිර්වචනය | ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සහ අධ්‍යක්ෂවරුන් අතර අධිකාරීත්වය සහ වගකීම් සම්බන්ධ පැහැදිලි වෙන් කිරීමක් පවතී. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් බැංකුවේ ක්‍රමෝපායික තීරණ ගැනීම කෙරෙහි වගකීම උසුලයි. ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණ ක්‍රියාවේ යෙදවීම සහ මෙහෙයුම් සඳහා වගකිව යුතු වේ.<br><br>මහජන බැංකු පනත මගින් ප්‍ර.වි.නි ද ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ අධිකාරීත්ව වපසරිය සහ ප්‍රධාන වගකීම් නිර්වචනය කරනු ලැබ ඇත.<br><br>ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ ප්‍රධාන වගකීම් සම්පූර්ණයෙන්ම මෙහෙයුම් මත පදනම් වන අතර ඒවා ඔවුන්ගේ කාර්ය විස්තරයන්හි විශේෂිතව දක්වා ඇත.<br><br>ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ අධිකාරීත්වය පැවරුම් වගකීම් සීමා යටතේ දක්වා ඇත. | අනුකූල විය |
| ඌ. | ප්‍රධාන කළමනාකරණ වෘත්තිකයින් විසින් බැංකුවේ කටයුතු අධීක්ෂණය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය මගින් බැංකුවේ කටයුතු අධීක්ෂණය යෝග්‍ය පරිදි සිදු කරනු ලැබ ඇත. | අනුකූල විය |
| එ. | ස්වකීය පාලන ක්‍රියාකාරකම් වල ඵලදායීත්වය ඇගයීම | | |
| | (i) අධ්‍යක්ෂවරුන් ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය තෝරාගැනීම, නම්කිරීම සහ පත් කිරීම | 1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි 8 වැනි වගන්තියෙහි දැක්වෙන පරිදි අධ්‍යක්ෂවරුන් තෝරාගැනීම සහ පත්කිරීම අමාත්‍යවරයා විසින් සිදුකරනු ලබන අතර ඉන් දෙදෙනෙකු නම් කිරීම සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් සිදුකෙරේ. | අනුකූල විය |
| | (ii) බැඳියා පිළිගැටුම් කළමනාකරණය සහ | 1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි 11 වැනි වගන්තියෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ බැඳියා පිළිග ැටුම පිළිබඳව විස්තර කෙරේ. එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2011 සැප්තැම්බර් මස අනුමත කරන ලද යහ ක්‍රියාකාරකම් සංග්‍රහයේ 2.13. ජී වගන්තිය මගින් අධ්‍යක්ෂ මණ්ඩල සාමජිකයින්ගේ බැඳියා පිළිගැටුම සාකච්ඡාවට භාජනය කෙරේ. | අනුකූල විය |
| | (iii) දුර්වලතා තීරණය කිරීම සහ අවශ්‍ය විට වෙනස්වීම් ක්‍රියාත්මක කිරීම | බැංකුව මගින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේම පාලන ක්‍රියාකාරකම් ඇගයීමද ඇතුළත් ස්වයං ඇගයුම් ක්‍රියාවලිය අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ක්‍රියාවට නංවනු ලැබ ඇත. එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2011 සැප්තැම්බර් මස අනුමත කරන ලද යහ ක්‍රියාකාරකම් සංග්‍රහයේ 2.23. ජී වගන්තිය මගින් ස්වයං ඇගයුම් ක්‍රියාවලිය පිළිබඳ සාකච්ඡා කෙරේ.<br><br>වසර 2019 සඳහා ස්වයං ඇගයුම් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් එකතු කරගෙන ඇත. දුර්වල ක්ෂේත්‍ර සමාලෝචනය කර සාකච්ඡා කිරීමට සහ අවශ්‍යනම් වෙනස් කිරීම් නිර්දේශ කිරමට ඒවායේ සාරාංශයක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාරදිය යුතුය. | අනුකූල විය |

| කොටස | ප්‍රතිපත්තිය | අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම | තත්ත්වය |
|---|---|---|---|
| ඒ. | ප්‍රධාන කළමනාකරණ වෘත්තිකයින් අනුප්‍රාප්තික සැලසුම | ප්‍ර.වි.නි සහ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත අනුප්‍රාප්තික සැලසුමක් ක්‍රියාවේ යොදවා ඇත. | අනුකූල විය |
| ඔ. | ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සමග නිරන්තර රැස්වීම් | ක්‍රියාකාරී අංශයන් සම්බන්ධ කරුණු පැහැදිලි කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන්හිදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය කැඳවනු ලැබේ. | අනුකූල විය |
| ඕ. | නියාමන වටපිටාව සහ නියාමන අධිකාරිය සමග ඵලදායී සබඳතාවක් පවත්වාගෙන යාම | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියාමන පරිසරය සහ බැංකුව නියාමකයින් සමඟ සම්බන්ධතා පවත්වා ගන්නේය යන්න අවබෝධ කර ගැනීමට පියවර ගෙන ක්‍රියාවලි ක්‍රියාවට නංවා ඇත.<br>අධ්‍යක්ෂවරුන් වශයෙන් පත්කරන ලද අවස්ථාවේදී, සමාගම් ලේකම්වරයා විසින් ඔවුන් වෙත සාංගමික පාලනය සම්බන්ධ යහ ක්‍රියාකාරකම් සංග්‍රහය සහ දැනට සේවයේ යෙදෙන අධ්‍යක්ෂවරුන් ආදී තොරතුරු ලබාදෙනු ලැබේ.<br>2018.09.30. දිනට ශ්‍රී.ලං.ම.බැ ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තාව දැනගැනීම සහ අවශ්‍ය පියවර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට භාරදෙනු ලැබ ඇත.<br>ශ්‍රී.ලං.ම.බැ රැස්වීමේ වෙත ප්‍ර.වි.නි සහභාගී වීම මගින් ද තවදුරටත් නියාමන අධිකාරිය සමග පවත්වන ලද සබඳතාවය තහවුරු වේ. | අනුකූල විය |
| ක. | බාහිර විගණකවරුන් යොදාගැනීම | මහජන බැංකු පනතෙහි 34 වැනි වගන්තියෙන් දැක්වෙන පරිදි බැංකුවේ විගණකවරයා විගණකාධිපති වේ. ආයතනික යහපාලනය සම්බන්ධ යහ ක්‍රියාකාරකම් සංග්‍රහයේ 6.1 (2) වගන්තිය ප්‍රකාරව, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව (BAC) බාහිර විගණකවරුන් පත්කිරීම නිර්දේශකර සහ ඔවුන්ගේ කාර්යයන් අධීක්ෂණය කරයි. | අනුකූල විය |
| 3.1 (ii) | සභාපති සහ ප්‍ර.වි.නි පත්කිරීම සහ ඔවුන්ගේ ක්‍රියාකාරකම් සහ වගකීම් දක්වමින් අනුමත කිරීම | මහජන බැංකු පනතෙහි 10 වැනි වගන්තියෙහි දැක්වෙන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතුරින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා පත්කිරීම, අමාත්‍යවරයා විසින් සිදුකරනු ලැබේ.<br>ආයතනික යහපාලනය සම්බන්ධ යහ ක්‍රියාකාරකම් සංග්‍රහයේ වගන්ති 2.22 සහ 2.23 මගින් සභාපතිවරයාගේ බලතල සහ කාර්යභාරයන් පිළිබඳ නිර්වචනය කෙරේ.<br>බැංකුවේ ආයතනික යහපාලනය සම්බන්ධ යහ ක්‍රියාකාරකම් සංග්‍රහයේ වගන්ති 3.9 උපලේඛණය III මගින් ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරීවරයාගේ කාර්යභාරයන්, රාජකාරී සහ වගකීම් පිළිබඳව නිර්වචනය කෙරේ. | අනුකූල විය |
| 3.1 (iii) | විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් | 2019 දී බැංකුව මගින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 10 ක් පවත්වන ලදී. අධ්‍යක්ෂවරු නොමැති වීම නිසා පෙබරවාරි, නොවැම්බර් සහ දෙසැම්බර් යන මාසවල රැස්වීම් පවත්වා නොමැත. 2019 දී චක්‍රලේඛණ යෝජනා කිසිවක් සම්මත නොවීය. | අනුකූල විය |
| 3.1 (iv) | අධ්‍යක්ෂවරුන් හට න්‍යායපත්‍රය වෙත යෝජනා ඇතුළත් කිරීමේ කටයුතු සැලසීම | ව්‍යවහාරයක් ලෙස, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන් කරුණු සහ යෝජනා න්‍යාය පත්‍රයට ඇතුළත් කරයි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රයට කරුණු සහ යෝජනා ඇතුළත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත ලද ක්‍රියාපටිපාටියක් පවතී. | අනුකූල විය |
| 3.1 (v) | රැස්වීම පිළිබඳ නිවේදන | ආයතනික යහපාලනය සම්බන්ධ මනා පරිච සංග්‍රහයේ (ඇමුණුම (iv) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලේකම්වරයාගේ කාර්යභාරයට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව ලේකම්වරයා විසින් එක් එක් වසර සඳහා විධිමත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සම්බන්ධ දින දර්ශනයක් සැකසීම සඳහා වගකීමේ විධිවිධානය ඇතුළත්ය.<br>තවද, සාමාන්‍ය ක්‍රමය අනුව, සෑම අධ්‍යක්ෂවරයකුටම විධිමත් රැස්වීම් වෙත සහභාගී වීමේ අවස්ථාව ලබාදෙමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවම වශයෙන් දින 7 කට පෙර දැනුම්දීමක් සිදු කෙරේ. | අනුකූල විය |
| 3.1 (vi) | අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් ඉදිරිපත්කළ අධ්‍යක්ෂ මණ්ඩල පැමිණීමේ කාර්ය සටහනට අනුව, හේමසිරි ප්‍රනාන්දු මහතා හැර සියළුම අධ්‍යක්ෂවරුන් 2019 වසර තුළ පවත්වන ලද අවශ්‍ය රැස්වීම්වල තුනෙන් දෙකකට සහභාගී වී ඇත. | අනුකූල විය |
| 3.1 (vii) | සමාගම් ලේකම්වරයා පත්කිරීම සහ වගකීම් පැවරීම | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.08.08 දින සිට බලපැවැත්වෙන පරිදි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා ලෙස රොහාන් පතිරගේ මහතා පත් කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයා 1988 අංක 30 දරන බැංකුකරණ පනතෙහි 43 වැනි වගන්තියෙහි විධිවිධාන සපුරාලන්නා වූ නීතිඥවරයෙකි. එමෙන්ම 2018 දී අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් තනතුරට අමතරව ඔහු ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී – මානව සම්පත සහ නිති ලෙසද අධ්‍යක්ෂ මණ්ඩල විසින් පත්කර ඇත.<br>ඉහත තනතුරු දෙක සඳහා වෙනම තනතුරු දෙකක් තිබිය යුතු බවට ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය 2019.4.1 දින සිට අධ්‍යක්ෂ මණ්ඩලයේ වැඩබලන ලේකම් ලෙස සහකාර අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ශ්‍යාමා විජේකෝන් මහත්මිය පත්කිරීමට තීරණය කර ඇත. ඇය නීතිඥවරියක් වන අතර, 1988 අංක 30 දරන බැංකුකරණ පනතෙහි 43 වැනි වගන්තියෙහි විධිවිධාන සපුරාලයි. | අනුකූල විය |
| 3.1 (viii) | සමාගම් ලේකම්වරයාගේ උපදෙස් සහ සේවාවන් වෙත අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රවේශය | ආයතනික යහපාලනය සම්බන්ධ මනා පරිච සංග්‍රහයේ වගන්ති 2.25 හි මේ සම්බන්ධ විධිවිධානයක් පවතී. | අනුකූල විය |

# ආයතනික යහපාලනය

| කොටස | ප්‍රතිපත්තිය | අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම | තත්ත්වය |
|---|---|---|---|
| 3.1 (ix) | අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා පවත්වාගෙන යාම | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනික යහපාලනය සම්බන්ධ මනා පරිච සංග්‍රහයේ (වෙළුම 1.2) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ලේකම්වරයාගේ කාර්යභාරයන් (ඇමුණුම (iv) යටතේ මේ සම්බන්ධ විධිවිධානයක් ඇතුළත්ය. | අනුකූල විය |
| 3.1 (x) | වාර්තා ප්‍රමාණවත් විස්තර සහිත වීම සහ නියාමන සහ අධීක්ෂණ අධිකාරීන් වෙත විමර්ශන ලේඛණ වශයෙන් සැළකිය හැකි වීම | අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවන් තුළ සාමාජිකයින්ගේ ඒක පුද්ගල අදහස්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසන් තීරණය වැනි කරුණු සහ ඔවුන් විසින් ප්‍රකාශ කෙරෙන දත්ත, වාර්තා සහ තීරණ වලට එළඹීමේදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් භාවිත කරනු ලබන තොරතුරු ආදිය ඇතුළත් වේ. | අනුකූල විය |
| 3.1 (xi) | ස්වාධීන වෘත්තීය උපදෙස් ලබාගැනීම සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ හැකියාව | යෝග්‍ය අවස්ථාවන්හිදී බැංකුවේ වියදම මත, ස්වාධීන වෘත්තීය උපදෙස් ලබාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්තියක් පවතී. | අනුකූල විය |
| 3.1 (xii) | බැඳියා පිළිගැටුම සම්බන්ධයෙන් කටයුතු කිරීම<br><br>GRI 102-25 | 1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි වගන්ති 11 මගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ බැඳියා පිළිගැටුම සම්බන්ධයෙන් සාකච්ඡා කෙරේ. අධ්‍යක්ෂවරුන්ට ඔහු/ඇය හෝ ඔහුගේ හෝ ඇයගේ සමීප සම්බන්ධයක් ඇති හෝ ඔහුට හෝ ඇයට සැලකියයුතු සම්බන්ධයක් ඇති කාරණාවකදී ඔහු ඡන්දය දීමෙන් වැලකී සිටීම සහ ගණපූරණයකදී ගණනය නොකර සිටීම තුළින් මෙම ක්‍රියාපටිපටිය මගින් තවදුරටත් තහවුරු කරයි.<br><br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ මනා පරිච සංග්‍රහයේ වගන්ති 2.13 හිද මේ සම්බන්ධ විධිවිධානයක් පවතී. | අනුකූල විය |
| 3.1 (xiii) | අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සඳහා වෙන් කරන ලද කරුණු සම්බන්ධ නිල කාර්ය සටහන | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ මනා පරිච සංග්‍රහයේ අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි වගන්ති 2.28 හි අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් කරන ලද බලතල පිළිබඳව නිර්වචනය කෙරේ. | අනුකූල විය |
| 3.1 (xiv) | ද්‍රවශීලතා ගැටළු පවතී නම් මහ බැංකුව වෙත දැනුම්දීම | 2019 වසර තුළදී එවැනි අවස්ථාවක් උද්ගතව නැත. | අනුකූල විය |
| 3.1 (xv) | ප්‍රාග්ධන ප්‍රමාවත්භාවය | මුදල් මණ්ඩලය විසින් ඉල්ලා සිටින ලද මට්ටම් දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුව වෙත ප්‍රාග්ධනය සපයනු ලැබ ඇත. අනුකූලතා නිලධාරී විසින් ඉදිරිපත් කරන මාසික අනුකූලතා සහතිකය තුළින් මෙය ආමන්ත්‍රණය කොට ඇත. | අනුකූල විය |
| 3.1 (xvi) | වාර්ෂික වාර්තාව තුළ ආයතනික පාලන වාර්තාව ප්‍රකාශයට පත්කිරීම | මෙම නියෝගයෙහි වගන්ති 3 ප්‍රකාර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය සාංගමික පාලන වාර්තාව 2019 වාර්ෂික වාර්තාවේ පිටු අංක 159 සිට 171 දක්වා ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත | අනුකූල විය |
| 3.1 (xvii) | අධ්‍යක්ෂවරුන්ගේ ස්වයං ඇගයුම | අධ්‍යක්ෂවරුන් සඳහා වන ස්වයං ඇගයුම් සැලසුමක් බැංකුවෙහි පවත්නා අතර සමාගම් ලේකම්වරයා විසින් වාර්ෂිකව සියළුම අධ්‍යක්ෂවරුන් වෙතින් ඇගයුම් අයදුම්පත් ලබාගනී. | අනුකූල විය |
| **3.(2)** | **අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය** | | |
| 3.(2) (i) | අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව | අධ්‍යක්ෂවරුන් නොමැතිවීම හේතු කොට ගෙන 2019 පෙබරවාරි, මාර්තු, නොවැම්බර් සහ දෙසැම්බර් හැරුණු විට 2019 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් හතකට (7) නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත විය. | අනුකූල නොවිය |
| 3. (2) (ii) (අ) සහ (ආ) | අධ්‍යක්ෂවරයකුගේ සේවා කාලසීමාව | වසර 2019 තුළදී කිසිදු අධ්‍යක්ෂවරයකු වසර නවයක සේවා කාලය ඉක්මවා ගොස් නොමැත.<br><br>සියළුම අධ්‍යක්ෂවරුන් 2018 සහ 2019 කාලසීමාව සඳහා විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරන ලදී. | අනුකූල විය |
| 3. (2) (iii) | අධ්‍යක්ෂ මණ්ඩල සමතුලනය | බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයෙහි කිසිදු විධායක අධ්‍යක්ෂවරයකු නොමැත. | අනුකූල විය |
| 3. (2) (iv) | ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු | වර්තමාන වසර තුළදී නියෝගයට අනුකූලවීවම සඳහා ප්‍රමාණවත් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය. | අනුකූල විය |
| 3. (2) (v) | විකල්ප ස්වාධින අධ්‍යක්ෂවරුන් | මහජන බැංකු පනතෙහි විකල්ප අධ්‍යක්ෂවරුන් පත්කිරීම සඳහා ප්‍රතිපාදන නොමැති අතර එබඳු තත්ත්වයක් උද්ගත නොවීය. | අනුකූල විය |
| 3. (2) (vi) | විධායන නොවන අධ්‍යක්ෂවරුන් සඳහා නිර්ණායක | 1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි වගන්ති 8 යටතේ මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කිරීම් සිදුකෙරේ. | අනුකූල විය |
| 3. (2) (vii) | ගණපූරණයෙන් හරි අඩකට වඩා විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වීම | බැංකුවේ සියළුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අතර බැංකුවේ මනා පරිච සංග්‍රහය අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ ව්‍යවස්ථාපිත ගනපූර්ණය පහකි. 2019 දී සියළුම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී අවශ්‍ය ගණපූරණයට අනුකූලතාවය දක්වා ඇත. | අනුකූල විය |

| කොටස | ප්‍රතිපත්තිය | අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම | තත්ත්වය |
|---|---|---|---|
| 3. (2) (viii) | සන්නිවේදනය තුළ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් හඳුනාගෙන අධ්‍යක්ෂවරුන්ගේ කාණ්ඩයන් වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කිරීම | සභාපති, විධායක අධ්‍යක්ෂවරුන්, විධායක නොවන අධ්‍යක්ෂවරුන් සහ ස්වාධීන විධායක අධ්‍යක්ෂවරුන්ගේ නම් ඇතුළුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය, 2019 වාර්ෂික වාර්තාවේ පිටු අංක 154 හි හෙළිදරව් කොට ඇත. | අනුකූල විය |
| 3. (2) (ix) | අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කිරීම් සඳහා නිල හා විනිවිද ක්‍රියාපටිපාටිය | 1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි වගන්ති 8 යටතේ මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්කිරීම් සිදුකෙරේ. | අනුකූල විය |
| 3. (2) (x) | තාවකාලික පුරප්පාඩු සපුරාලමින් අධ්‍යක්ෂ වරුන් යළි පත්කිරීම | විෂය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කරනු ලබන බැවින් එවැනි තත්ත්වයක් උද්ගතනොවීය. | අනුකූල විය |
| 3. (2) (xi) | අධ්‍යක්ෂවරයකු ඉවත් කිරීම හෝ ඉල්ලා අස්වීම පිළිබඳ හේතු දැන්වීම | මහජන බැංකු පනතෙහි වගන්ති 8 හි විධිවිධාන අනුව, විෂය භාර අමාත්‍යවරයා වෙත ලිපියක් භාරදීමෙන් ඉල්ලා අස්වීම සිදුකිරීමට අධ්‍යක්ෂවරයකුට හැකි වේ. තවද, අමාත්‍යවරයා හට ගැසට් නිවේදනයක් නිකුත් කරමින් අධ්‍යක්ෂවරයකු ඉවත් කිරීමේ හැකියාවද පවතී.<br>අධ්‍යක්ෂවරුන්ගේ ඉල්ලා අස්වීම සහ එයට හේතු නිසි පරිදි ශ්‍රී.ලං.ම.බැ වෙත දැන්විය යුතු වේ. | අනුකූල විය |
| 3. (2) (xii) | කිසියම් බැංකුවක අධ්‍යක්ෂවරුන් හෝ සේවකයින් තවත් බැංකුවක අධ්‍යක්ෂවරයකු බවට පත්වීමේ තහනම | මහජන බැංකුවේ මනා පරිච සංග්‍රහයෙහි වගන්ති 2.1 හි ද මේ සම්බන්ධ විධිවිධානයක් පවතී. | අනුකූල විය |
| **3. (3)** | **අධ්‍යක්ෂවරුන්ගේ හැකියාව හා යෝග්‍යතාවය ඇගයීමේ නිර්ණායකය** | | |
| 3. (3) (i) | අධ්‍යක්ෂවරයකුගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතු වේ. | වසර 2019 තුළදී කිසිදු අධ්‍යක්ෂවරයකු වයස අවුරුදු 70 ට ළඟා නොවීය. | අනුකූල විය |
| 3. (3) (ii) | අධ්‍යක්ෂවරුන්, සමාගම් 20 කට වැඩි සංඛ්‍යාවක සහ විශේෂිත ව්‍යාපාර ආයතන වශයෙන් වර්ගීකරණය වන සමාගම් 10 කට වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂවරුන් වශයෙන් කටයුතු නොකළ යුතුය. | වසර තුළදී කිසිදු අධ්‍යක්ෂවරයකු, පරිපාලිතයන් සහ ආශ්‍රිත සමාගම්ද ඇතුළුව, සමාගම්/ආයතන 20 කට වැඩි සංඛ්‍යාවක අධ්‍යක්ෂවරයකු නොවීය. | අනුකූල විය |
| **3. (4)** | **අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පවරන ලද කළමනාකරණ ක්‍රියාකාරකම්** | | |
| 3. (4) (i) | බලය පැවරීම අවබෝධතා සහ අධ්‍යයන පැවරුම් කටයුතු | මහජන බැංකු පනතෙහි වගන්ති 32 ප්‍රකාර සිය බලතල බැංකුවේ ඕනෑම නිලධාරියකු වෙත පැවරීමේ සහ අවස්ථානුකූලව එය පාර්ශ්වීය වශයෙන් හෝ සම්පූර්ණයෙන්ම අවලංගු කිරීමේ බලතල අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. | අනුකූල විය |
| 3. (4) (ii) | බලය පැවරීමේ ප්‍රමාණය අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වයට බාධාවක් නොවිය යුතු වේ. | | අනුකූල විය |
| 3. (4) (iii) | බැංකුවේ මෙහෙයුම් සමග අදාළත්වය තහවුරු කිරීම සඳහා බලය පැවරුම් කටයුතු සමාලෝචනය | පවරන ලද බලතල බැංකුවේ අවශ්‍යතාවන්ට අදාළව පවත්නා බව සහතික කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරන්තරයෙන් සමාලෝචනය කෙරේ. | අනුකූල විය |
| **3. (5)** | **සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරිවරයා** | | |
| 3. (5) (i) | බලය පැවරීම භූමිකාව බෙදා වෙන්කිරීම | සභාපති සහ ප්‍ර.වි.නි. ගේ කාර්යභාරයන් අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරන පුද්ගලයින් දෙදෙනෙක් විසින් සිදුකරයි අනුකූල විය. | අනුකූල විය |
| 3. (5) (ii) | විධායක නොවන සභාපති සහ ජ්‍යේෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරු පත් කිරීම | සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන බැවින් ජ්‍යේෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයෙක් පත්කිරීමේ අවශ්‍යතාවන් පැන නැගුනේ නැත. | අනුකූල විය |

# ආයතනික යහපාලනය

| කොටස | ප්‍රතිපත්තිය | අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම | තත්ත්වය |
|---|---|---|---|
| 3. (5) (iii) | සභාපති සහ ප්‍ර.වි.නි ගේ අනන්‍යතාවය සහ අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින් සමග ඇති සබඳතාවක් අනාවරණය කිරීම | මේ සම්බන්ධයෙන් ක්‍රියාවලියක් බැංකුව සතු වේ. 2019 වසර සඳහා ප්‍රකාශනය පරිදි, සභාපති සහ ප්‍ර.වි.නි සහ අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින් අතර කිසිදු මූල්‍යමය, ව්‍යාපාරික, පවුලේ හෝ වෙනත් වැදගත්/අදාළ සබඳතාවයක් නොමැත. | අනුකූල විය |
| 3. (5) (iv) | සභාපතිවරයා විසින් අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත නායකත්වය | මෙම අවශ්‍යතාවය කෙරෙහි අනුකූල වන අධ්‍යක්‍ෂ මණ්ඩලය සඳහා වන ස්වයං ඇගයුම් සැලසුමක් අධ්‍යක්‍ෂ මණ්ඩලය සතු වේ. | අනුකූල විය |
| 3. (5) (v) | න්‍යාය පත්‍රය පිළිබඳ වගකීම සභාපතිවරයා දරන නමුත් සමාගම් ලේකම්වරයා වෙත පැවරිය හැකි වේ. | සභාපතිවරයා සමග උපදේශකත්වයෙන් අධ්‍යක්‍ෂ මණ්ඩල ලේකම්වරයා විසින් අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය සකසනු ලැබේ. | අනුකූල විය |
| 3. (5) (vi) | අධ්‍යක්‍ෂවරුන් නිසි පරිදි දැනුවත් කොට ප්‍රමාණවත් තොරතුරු සපයා ඇති බවට තහවුරු කිරීම | අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් වල මතු වන කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්‍ෂවරුන් නිසි පරිදි දැනුවත් කොට ඇති බවට සභාපතිවරයා තහවුරු කරයි. කියවා බැලීමට ප්‍රමාණවත් කාලයක් ලබාදෙමින් අධ්‍යක්‍ෂවරුන් වෙත න්‍යාය පත්‍රය සහ අදාළ පත්‍රිකා ලබාදෙනු ලැබේ.<br>පසුගිය මස අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේ වාර්තා අධ්‍යක්‍ෂවරුන් අතර බෙදාහරින අතර වලංගු කිරීම/අනුමැතිය සඳහා ඉන්පසු එළඹෙන රැස්වීමේදී සභාගත කෙරේ. | අනුකූල විය |
| 3. (5) (vii) | සියළුම අධ්‍යක්‍ෂවරුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය සහ බැංකුවේ අභිමතයන් කෙරෙහි පෙරමුණ ගෙන කටයුතු කිරීම දිරිමත් කිරීම | මෙම අවශ්‍යතාවය කෙරෙහි අනුකූල වන අධ්‍යක්‍ෂ මණ්ඩලය සඳහා වන ස්වයං ඇගයුම් සැලසුමක් අධ්‍යක්‍ෂ මණ්ඩලය සතු වේ. | අනුකූල විය |
| 3. (5) (viii) | සියළුම විධායක නොවන අධ්‍යක්‍ෂවරුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය සහ විධායක නොවන සහ විධායක අධ්‍යක්‍ෂවරුන් අතර සබඳතා දිරිමත් කිරීම | ස්වයං ඇගයුම් ක්‍රියාවලිය මගින් විධායක නොවන අධ්‍යක්‍ෂවරුන්ගේ දායකත්වය ආවරණ කරයි. අනුකූල විය. | අනුකූල විය |
| 3. (5) (ix) | ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සහ විධායක වගකීම් සෘජු අධීක්ෂණයෙන් වැළකීම | සභාපතිවරයා ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සහ විධායක රාජකාරි සම්බන්ධයෙන් අධීක්ෂණය සඳහා සෘජුව සහභාගී නොවේ. | අනුකූල විය |
| 3. (5) (x) | කොටස් හිමිකරුවන් සමග ඵලදායී අදහස් හුවමාරුව | බැංකුවේ ප්‍රධාන කොටස් හිමිකරු වන ශ්‍රී ලංකා රජය සමග අධ්‍යක්‍ෂ මණ්ඩලය ඵලදායී සන්නිවේදනය පවත්වා ගනී. | අනුකූල විය |
| 3. (5) (xi) | ප්‍ර.වි.නි දෛනික මෙහෙයුම් සම්බන්ධ ප්‍රමුඛ විධායක වශයෙන් කටයුතු කිරීම | ප්‍ර.වි.නි ගේ ක්‍රියාකාරකම් සහ වගකීම අනුව, ඔහු බැංකුවේ මෙහෙයුම් සහ ව්‍යාපාර කටයුතු වල දෛනික කළමනාකරණය භාර ප්‍රමුඛ විධායක නිලධාරියා වේ. | අනුකූල විය |
| | **අධ්‍යක්‍ෂ මණ්ඩලය පත්කල කමිටු** | | |
| 3. (6) (i) | අධ්‍යක්‍ෂ මණ්ඩල කමිටු ස්ථාපනය, ඔවුන්ගේ ක්‍රියාකාරකම් සහ වාර්තාකරණය | බැංකුව මගින් අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුව, අධ්‍යක්‍ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව, අධ්‍යක්‍ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව සහ අධ්‍යක්‍ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව නමින් කමිටු හතරක් පිහිටුවා ඇත. ශ්‍රී.ලං.ම.බැ නියෝග අවම අවශ්‍යතා අනුව පිහිටුවන ලද ඉහත කමිටු වලට, අමතරව බැංකුව මගින් අධ්‍යක්‍ෂ මණ්ඩල අනු කමිටු හතරක්ද පිහිටුවා ඇත. මෙම කමිටුවල වාර්තා අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සමාලෝචනය සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර සභාගත කෙරේ.<br>2019 වාර්ෂික වාර්තාවේ 172 සිට 176 දක්වා පිටුවල එක් එක් අනුකමිටුවල වාර්තා ඇතුළත් වන අතර එකී වාර්තාවලට එම කමිටුවල රාජකාරි, කාර්යභාරයන්, සහ කාර්යසාධනය පිළිබඳ සාරාංශයක් ඇතුළත්ය. | අනුකූල විය |
| **3. (6) (ii)** | **විගණන කමිටුව** | | |
| අ. | කමිටුවේ සභාපතිවරයා ගිණුම්කරණය සහ/හෝ විගණනය තුළ සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ස්වාධීන විධායක නොවන අධ්‍යක්‍ෂවරයකු වීම | නියෝගයේ අවශ්‍යතාව පරිදි මනා පාලනය සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපති ලෙස ගිණුම්කරණය සහ/හෝ විගණනය තුළ සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ස්වාධීන විධායක නොවන අධ්‍යක්‍ෂවරයක් පත් කිරීමට බැංකුව පියවර ගෙන ඇත.<br>එමෙන්ම, වසර පුරා නියෝගයට අනුකූලවීම සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩල විගණන කමිටුවේ සභාපති තනතුරට සුදුසු අනුප්‍රාප්තික සැලැස්මක් ඇති කිරීමට බැංකුව පියවර ගෙන ඇත. | අනුකූල නොවිය |

| කොටස | ප්‍රතිපත්තිය | අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම | තත්ත්වය |
|---|---|---|---|
| ආ. | කමිටුව සම්පූර්ණයෙන්ම විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වීම | කමිටුවේ සියලුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වෙති. | අනුකූල විය |
| ඇ. | විගණන කමිටු කාර්යයන් | | |
| | (i) අදාළ ව්‍යවස්ථාවන්ට අනුකූලව ලබාදිය යුතු විගණන සේවා සඳහා බාහිර විගණක පත් කිරීම; | රටේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන පරිදි විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වේ. එමනිසා, බාහිර විගණකගේ සහභාගිත්වය තුළ ඉටුකිරීමට කාර්යභාරයක් මෙම කමිටුවට නොමැත. | අනුකූල විය |
| | (ii) වරින් වර විසින් විගණකවරුන්ට නිකුත්කරන ශ්‍රී.ලං.ම. බැංකුවේ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම | වරින් වර විගණකවරුන්ට නිකුත්කරන ශ්‍රී.ලං.ම.බැංකුවේ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ කරුණු පිළිබඳ කමිටුව නිර්දේශ කර ඇත. | අනුකූල විය |
| | (iii) අදාළ ගිනුම්කරණ ප්‍රමිති යොදා ගැනීම සහ | අවශ්‍ය අවස්ථාවලදී කමිටුව විසින් අදාළ ගිණුම්කරණ ප්‍රමිති පිළිබඳ සමාලෝචනය කර සාකච්ඡා කර ඇත. | අනුකූල විය |
| | (iv) සේවා කාලය, විගණන ගාස්තු සහ විගණකවරයාගේ ඉල්ලා අස්වීම සහ සේවය තහනම් කිරීම. | රටේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ දැක්වෙන පරිදි විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වේ. | අනුකූල විය |
| ඈ. | බාහිර විගණකගේ ස්වාධීනත්වය, විෂය මූලිකත්වය සහ විගණන ක්‍රියාවලියෙහි ඵලදායීතාව සමාලෝචනය සහ නියාමනය | විගණකාධිපති බැංකුවේ විගණකවන බැවින් මෙය අදාළ නොවේ. | අනුකූල විය |
| ඉ. | බාහිර විගණකවරයකු විසින් විගණන නොවන සේවා සැපයීම | විගණකාධිපති බැංකුවේ විගණකවන බැවින් මෙය අදාළ නොවේ. | අනුකූල විය |
| ඊ. | විගණනයේ විෂයපථය නිර්ණය කිරීම | විගණනය ඇරඹීමට පෙරාතුව, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව බාහිර විගණකවරුන් සමග විගණනයේ ස්වභාවය සහ විෂයපථය සාකච්ඡාකර සමාලෝචනය කර ඇත. | අනුකූල විය |
| උ. | බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය | ප්‍රධාන මූල්‍ය නිලධාරී විසින්, හෙළිදරව් කිරීම උදෙසා පිළියෙල කරන ලද විගණනය කරන ලද කාර්තුමය හා වාර්ෂික මූල්‍ය වාර්තා කමිටුව වෙත ඉදිරිපත් කළ විට, බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියක් කමිටුව සතුව ඇත. | අනුකූල විය |
| ඌ. | අතුරු සහ අවසන් විගණනයන් සම්බන්ධයෙන් බාහිර විගණක සමග සාකච්ඡා කිරීම | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම්වලදී විගණකාධිපතිගේ සමඟ රහසිගත රැස්වීමක් පවත්වා ඇත. | අනුකූල විය |
| එ. | කළමනාකරණ ලිපිය සහ බැංකුවේ ප්‍රතිචාරය සමාලෝචනය | විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් පත්කරන ලද බාහිර විගණක වන අර්නස්ට් ඇන්ඩ් යන්ග් ගේ 2018 කළමනාකරණ ලිපිය විගණන කමිටුව විසින් සමාලෝචනය කර ඇත. | අනුකූල විය |
| ඒ. | අභ්‍යන්තර විගණන කාර්යය සමාලෝචනය | | |
| | (i) අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථය, කාර්යයන් හී ප්‍රමාණත්වය සහ එහි රාජකාරි කරගෙන යාමට අවශ්‍ය බලය පිළිබඳ සෑහීමට පත්වීම; | කමිටුව මගින් අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථය, කාර්යය සාකච්ඡා කර ඇත.<br>තවද, කමිටුව අවස්ථාව අනුව කාර්ය මණ්ඩලය වැනි අභ්‍යන්තර විගණන අංශයේ සම්පත් සමාලෝචනය කර ඇත. | අනුකූල විය |
| | (ii) අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල | අභ්‍යන්තර විගණන අංශය කමිටුව වෙත 2019 කාර්ය සැලැස්ම ඉදිරිපත් කර ඇති අතර BAC විසින් අභ්‍යන්තර විගණනයේ විෂය පථය සහ විගණන සැලැස්මට එකතුකළ යුතු නව අංග පිළිබඳ සාකච්ඡා කර ඇත.<br>බැංකුවේ දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අභ්‍යන්තර විගණන වාර්තාවේ ප්‍රතිඵල කමිටුව සමාලෝචනය කර ඇත.<br>කමිටුව වරින් වර අභ්‍යන්තර විගණන සැලැස්මේ ප්‍රගතිය සමාලෝචනය කර ඇත. | අනුකූල විය |

# ආයතනික යහපාලනය

| කොටස | ප්‍රතිපත්තිය | අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම | තත්ත්වය |
|---|---|---|---|
| | (iii) අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානි සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම හෝ තක්සේරු කිරීම | 2018.01.20 සිට 2019.01.17 දක්වා කාලසීමාව තුළ අභ්‍යන්තර විගණන අංශයේ කාර්යසාධනය ඇගයීම කමිටුවට ඉදිරිපත්කළ අතර කමිටුව අභ්‍යන්තර විගණන අංශයේ කාර්යසාධනය සමාලෝචනය කර තෘප්තිමත් වී ඇත. එමෙන්ම කමිටුව විසින් සහකාර සාමාන්‍යාධිකාරී ශ්‍රේණියේ සිටින සාමාජිකයින් තුන්දෙනෙකුගේ කාර්යසාධනයද සමාලෝචනය කර ඇත. | අනුකූල විය |
| | (iv) ප්‍රධානි සහ ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයේ සහ බාහිර සේවා සපයන්නන්ගේ පත්කිරීම සහ අවසන් කිරීම නිර්දේශ කිරීම | HIA පරිදි 2019 වසර තුළ අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානි සහ ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයේ පත්කිරීමක් හෝ අවසන් කිරීමක් සිදුකර නොමැත.<br><br>2019 වසර තුළ IS විගණන කාර්ය MS. PWC වෙත ලබා දි ඇත. | අනුකූල විය |
| | (v) කමිටුව අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානි සහ ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයේ පත්කිරීම හෝ අවසන් කිරීම ඇගයීමට ලක් කරන අතර එයට ප්‍රධාන අභ්‍යන්තර විගණනය සහ බාහිර සේවා සපයන්නන් ඇතුළත්ය. එමෙන්ම ඉල්ලා අස්වීම සඳහා හේතු ඉදිරිපත් කිරීමට ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහ බාහිර සේවා සපයන්නන් වෙත අවස්ථාවක් ලබා දේ. | HIA පරිදි 2019 වසර තුළ ජ්‍යේෂ්ඨ කාර්ය මණ්ඩලයේ ඉල්ලා අස්වීම් සිදු වි නොමත. | අනුකූල විය |
| | (vi) අභ්‍යන්තර විගණන අංශය එහි විගනන කටයුතුවලින් ස්වාධීන වන අතර එය අපක්ෂපාතිව, කාර්යක්ෂවම සහ නිසි වෘත්තිය ආරක්ෂා සහිතව කටයුතු කරයි. | IAD විසින් බැංකුවේ අභ්‍යන්තර විගණන ප්‍රඥාප්තියේ විධිවිධාන වලට අනුව අභ්‍යන්තර විගණන කටයුතුවල ස්වාධීනත්වය සහතික කර ඇත.<br><br>BAC පරිදි, අභ්‍යන්තර විගණන අංශය අපක්ෂපාතිව, කාර්යක්ෂවම සහ නිසි වෘත්තිය ආරක්ෂා සහිතව කටයුතු කරයි. | අනුකූල විය |
| ඔ. | අභ්‍යන්තර විමර්ශන | HIA අනුව, 2019 වස තුළ අභ්‍යන්තර විමර්ෂණවල ප්‍රධාන සොයාගැනීම් සිදුවි නොමැත. | අනුකූල විය |
| ඕ. | විගණන කමිටු රැස්වීම් වෙත සහභාගීවන්නන් | මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කිසිදු විධායක අධ්‍යක්ෂවරයකු නොමැති බැවින් මෙය අදාළ නොවේ. | අනුකූල විය |
| ක. | ප්‍රකාශිත අධිකාරී බලය, සම්පත් සහ තොරතුරු සඳහා ප්‍රවේශය | අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ ආයතනික පාලනය සම්බන්ධ මනා පරිච සංග්‍රහයේ 6.1 (ඈ) වගන්තිය මගින් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව අයිතීන් පිළිබඳව සාකච්ඡා කෙරෙන අතර කමිටුව එබඳු අධිකාරීත්වයකින් සමන්විත වන බවටද තහවුරු කෙරේ.<br><br>කමිටුව මගින් විගණන කමිටුවෙහි ප්‍රඥප්තිය/TOR සමාලෝචනය කොට එය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරයි.<br><br>කමිටුව මගින් විගණන කමිටුවෙහි TOR සමාලෝචනය කොට එය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරයි. | අනුකූල විය |
| ග. | නිතිපතා පැවැත්වෙන රැස්වීම් | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් 2019 වසර සඳහා රැස්වීම් හතරක් පවත්වනු ලැබ ඇති අතර ඒවායේ වාර්තා සමාගම් ලේකම්වරයා විසින් පවත්වා ගෙන යනු ලබයි. | අනුකූල විය |
| ඩ. | වාර්ෂික වාර්තාවේ අනාවරණය | 2019 වාර්ෂික වාර්තාවේ පිටු අංක 172 හි අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව හෙළිදරව් කොට ඇති අතර, කමිටුවෙහි කාර්යය පිළිබඳ විස්තර, රැස්වීම් සංඛ්‍යාව සහ අදාළ රැස්වීම් සඳහා එක් එක් සාමාජිකයාගේ පැමිණීම ආදී තොරතුරු පිටු අංක 154 හි අනාවරණය කොට ඇත. | අනුකූල විය |
| ච. | රැස්වීම් කාර්යය සටහන් පවත්වාගෙන යාම | අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි ලේකම්වරයා වශයෙන් සමාගම් ලේකම්වරයා පත්කර ඇති අතර ඔහු විසින් රැස්වීම් වාර්තා තබනු ලැබේ. | අනුකූල විය |
| ජ. | තොරතුරු දැනගැනීමේ ප්‍රතිපත්තිය සහ බාහිර විගණක සමඟ සම්බන්ධය | 2013 දී ස්ථාපනය කරන ලද තොරතුරු දැනගැනීමේ ප්‍රතිපත්තිය විගණන කමිටුවේදී එය නැවත සමාලෝචනයට ලක් කර ඇත. | අනුකූල විය |

| කොටස | ප්‍රතිපත්තිය | අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම | තත්ත්වය |
|---|---|---|---|
| | **මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව** | | |
| 3. (6) (iii) (අ) | බැංකුවේ අධ්‍යක්ෂවරුන්, ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්යයමණ්ඩලය අදාළ පාරිශ්‍රමික<br>GRI 102-35, 102-36 | මුදල් අමාත්‍යාංශය මගින් සකසන ලද උපදෙස් මත අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික තීරණය කෙරේ. ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්යයමණ්ඩලයට අදාළ පාරිශ්‍රමික<br>(වැටුප්, දීමනා සහ වෙනත් මූල්‍ය ගෙවීම්) නිර්ණය කිරීම සඳහා කමිටුව මගින් වන්දි/පාරිශ්‍රමික ප්‍රතිපත්තියන් ක්‍රියාවට නංවනු ලැබ ඇත. | අනුකූල විය |
| (ආ) | අධ්‍යක්ෂවරුන්, ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයට අදාළ ඉලක්ක සැකසීම | 2019 වසර සඳහා ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ වෘත්තිකයින්ට (නියෝජ්‍ය හා සහකාර සාමාන්‍යාධිකාරීවරුන්) අදාළ ඉලක්ක සහ අරමුණු 2019 මාර්තු සහ අප්‍රේල් පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට ඉදිරිපත් කර ඇත. කෙසේවුවද ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකරණ වෘත්තිකයින්ගේ ඉලක්ක සහ අරමුණු මනා පාලනය සඳහා කමිටුව විසින් සලකා බැලිය යුතුව ඇත. | අනුකූල විය |
| (ඇ) | ප්‍ර.වි.නි සහ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩල කාර්යසාධනය තක්සේරු කිරීම | ප්‍ර.වි.නි සහ ප්‍රධාන කළමනාකරණ වෘත්තිකයින්ගේ කාර්යසාධනය කාර්තුමය පදනමක් මත අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සමාලෝචනය කරයි. කෙසේවුවද සකසන ලද ඉලක්ක වලට සාපේක්ෂව ප්‍ර.වි.නි සහ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩල කාර්යසාධනය තක්සේරු කිරීම පිළිබඳව සළකා බැලීමට කමිටුවට සිදුවේ. | අනුකූල විය |
| (ඈ) | ප්‍ර.වි.නි ආශ්‍රිත කරුණු සාකච්ඡා කරනු ලබන අවස්ථාවන්හිදී හැරුනු විට, කමිටුවේ සියළුම රැස්වීම් වෙත ප්‍ර.වි.නි සහභාගී වේ | අධ්‍යක්ෂ මණ්ඩල අනුමත මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු ප්‍රඥප්තිය මගින් ප්‍රවිනි ආශ්‍රිත කරුණු සාකච්ඡා කරනු ලබන අවස්ථාවන්හිදී හැරුණු විට, කමිටුවේ සියළුම රැස්වීම් වෙත ප්‍ර.වි.නි සහභාගීවීම වන බව පෙන්වා දේ. | අනුකූල නොවිය |
| | **නාමයෝජනා කමිටුව** | | |
| 3. (6) (iv) (අ) | අධ්‍යක්ෂවරුන්, ප්‍ර.වි.නි සහ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය පත්කිරීම | මහජන බැංකු පනතෙහි විධිවිධාන ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත්කරනු ලැබේ.<br>අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුප්‍රාප්තික සැලසුම් ලේඛණයෙහි නව ප්‍ර.වි.නි තෝරා ගැනීමේ/පත්කිරීමේ ක්‍රියාපටිපාටියක් ඇත.<br>තවද, නාමයෝජනා කමිටුව විසින් බැංකුවේ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය තෝරාගැනීම හා පත්කිරීම ක්‍රියාපටිපාටියක් ක්‍රියාවේ යොදවනු ලැබ ඇත. | අනුකූල විය |
| (ආ) | අධ්‍යක්ෂවරුන් නැවත පත් කිරීම | මහජන බැංකු පනතෙහි විධිවිධාන ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත් කරනු ලැබීම හේතුවෙන් මෙම අවශ්‍යතාවය මතු නොවේ. | අනුකූල විය |
| (ඇ) | ප්‍ර.වි.නි ඇතුළුව ප්‍රධාන කළමනාකාරීත්ව ධූරයන් වෙත පත්කිරීමේදී සුදුසුකම් ලැබීමේ නිර්ණායකය | අධ්‍යක්ෂ මණ්ඩලය මගින්, ප්‍ර.වි.නි, නියෝජ්‍ය හා සහකාර සාමාන්‍යාධිකාරී වැනි (ප්‍රධාන කළමනාකරණ වෘත්තිකයන් වන) ධූරයන්ට පත් කිරීමේදී සළකා බැලීමට නියමිත සුදුසුකම්, පළපුරුද්ද හා ප්‍රධාන ලක්ෂණ ආදිය ඇතුළත් තෝරාගැනීමේ නිර්ණායකයක් අනුමත කරනු ලැබ ඇත.<br>තවද කමිටුව මගින් බැංකුවේ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය පත්කිරීම සම්බන්ධ තෝරාගැනීමේ නිර්ණායකය වෙත අනුමැතිය ලබා දෙන ලදී. | අනුකූල විය |
| (ඈ) | යෝග්‍ය හා නිසි පුද්ගලයින් අධ්‍යක්ෂවරුන් | අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍ර.වි.නි ගේ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ ප්‍රකාශයන් අධ්‍යක්ෂ මණ්ඩලය හරහා ශ්‍රී.ලං.ම.බැ වෙත ඉදිරිපත් කර ඇත.<br>කමිටුවේ අඛණ්ඩතාව තුළින් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශන ඉදිරිපත් කිරමට කමිටුව පියවර ගත යුතුය. | අනුකූල විය |
| (ඉ) | අනුප්‍රාප්තික සැලසුම සහ නව විශේෂඥභාවය | අධ්‍යක්ෂ මණ්ඩලය මුදල් අමාත්‍යංශය විසින් පත්කරනු ලබයි.<br>ප්‍රවිනි සහ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සඳහා අනුප්‍රාප්තික සැලැස්මක් ක්‍රියාත්මකව පවතී. | අනුකූල විය |
| (ඊ) | කමිටු සභාපතිවරයා සහ වඩා යහපත් වන පරිදි අධ්‍යක්ෂවරුන්ගෙන් වැඩි දෙනෙක් ස්වාධීන වීම ප්‍ර.වි.නි ආරාධිතව රැස්වීම් වලට සහභාගී වේ. | කමිටු සභාපතිත්වය ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයකු වන කේ. ඩී. ඩී. රංජිත් අශෝක (2018.11.09 පත්කළ) විසින් දරනු ලැබේ. අනෙකුත් සාමාජිකයින් කේ. ඩී. ඩී. එන් නානායක්කාර මහතා (ස්වාධීන – 2018.02.18 පත්කළ) එම්. එස්. ඩී.මුතුමාල මහතා (ස්වාධීන – 2019.04.04 පත්කළ) වෙති.<br>ප්‍ර.වි.නි ආරාධිතව කමිටු රැස්වීම් වෙත සහභාගී වේ.<br>නියෝගය වෙත අනුකූල වීම සඳහා කමිටුවේ සභාපතිත්වය ස්වාධීන අධ්‍යක්ෂවරයකු විසින් දැරිය ය. | අනුකූල නොවිය |

# ආයතනික යහපාලනය

| කොටස | ප්‍රතිපත්තිය | අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම | තත්ත්වය |
|---|---|---|---|
| **3. (6) (v)** | **ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව/අධ්‍යක්ෂ මණ්ඩල අවදානම් කළමනාකරණ කමිටුව** | | |
| අ. | අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙහි සංයුතිය | කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනකු, ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අවදානම් කළමනාකරණ යන වෘත්තිකයින්ගෙන් සමන්විත වේ. ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ සහකාර සාමාන්‍යාධිකාරී අනුකූලතා ආරාධිතව සහභාගී වේ. | අනුකූල විය |
| ආ. | අවදානම් තක්සේරුකරණය | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින්, කළමනාකරණ තොරතුරු සහ අදාළ අවදානම් දර්ශකයන් ඔස්සේ, මාසික පදනමක් මත ණය, වෙළඳපොල, ක්‍රමෝපායික සහ මෙහෙයුම් වැනි බැංකුවේ අවදානම් තක්සේරුකරණය සඳහා ක්‍රමවේදයක් ක්‍රියාවට නංවනු ලැබ ඇති අතර, එබඳු අවදානම් කාර්තුමය අවදානම් වාර්තාව සහ අවදානම් අනුකෘතික වගුව ඔස්සේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කෙරේ. | අනුකූල විය |
| ඇ. | අවදානම සම්බන්ධව කළමනාකරණ මට්ටමේ කමිටු වල සමාලෝචනය | කමිටුව මගින්, වර්තමාන යොමු නිර්දේශවලට (TOR) සාපේක්ෂව, සියළුම කළමනාකරණ මට්ටමේ කමිටු වල ප්‍රමාණවත්බව සහ ඵලදායීත්වය තක්සේරු කරනු ලැබ ඇත. | අනුකූල විය |
| ඈ. | නිසි මට්ටම් ඉක්මවා යන අවදානම් අවම කරගැනීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග | කමිටුව මගින් විශේෂිත ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමාවන් ඉක්මවා යන ලද අවදානම් දර්ශකයන් සමාලෝචනය කොට ඒ කෙරෙහි සැළකිල්ල යොමු කරනු ලැබ ඇත. | අනුකූල විය |
| ඉ. | රැස්වීම් වාර ගණන | ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින් 2019 දී රැස්වීම් හතරක් (04) පමණක් පවත්වන ලදී. | අනුකූල විය |
| ඊ. | විශේෂිත අවදානම් හඳුනා ගැනීමට අපොහොසත්වීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහි ක්‍රියාමාර්ග | බැංකුව තුළ, අවදානම් හඳුනාගැනීම ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව මගින් සිදුකරනු ලබන අතර, ඒ නිසාවෙන්ම තීරණ ගැනීම සාමූහිකව සිදුකෙරේ. | අනුකූල විය |
| උ. | අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවදානම් තක්සේරුකරණ වාර්තාව | කමිටුව සමාලෝචනය සඳහා අවදානම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරයි.<br><br>කෙසේවෙතත්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් වලංගුභාවය සහ/හෝ විශේෂිත නියෝගයන් අපේක්ෂාවෙන් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාවක් එක් රැස්වීමට සතියක් තුළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. | අනුකූල විය |
| ඌ. | අනුකූලතා කාර්යය | නීති, රෙගුලාසි සහ නියාමන උපදෙස් වෙත බැංකුවේ අනුකූලතාවය ඇගයීම සඳහා කමිටුව විසින් අනුකූලතා කාර්යයක් කමිටුව ස්ථාපිත කර ඇත. ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩල සමාජිකයෙකු වශයෙන් පත් කරන ලද අනුකූලතා නිලධාරියා විසින් අවශ්‍යතා/රෙගුලාසි සම්බන්ධ මාසික වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙතද, අනුකූලතා අවදානම සම්බන්ධ වාර්තාවක් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ද භාරදෙනු ලබයි.<br><br>අනුකූලතා සම්බන්ධ කාර්තුමය වාර්තා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කරයි.<br><br>තවද, 2020 සිට ඉදිරියට අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනුවත්කම සඳහා අනුකූලතා නිලධාරී විසින් මාසිකව අනුකූලතා වාර්තාවක් ඉදිරිපත් කරයි. බැංකුවේ සෑම ව්‍යාපාරික මෙහෙයුම් අංශයක් පුරාම අභ්‍යන්තර පාලනයන් සහ අනුමත ප්‍රතිපත්තීන් සමග බැංකුවේ අනුකූලතාවය තහවුරු කිරීම පිණිස, අනුකූලතා ක්‍රියාකාරකම මගින් වාර්ෂිකව සෑම අංශ ප්‍රධානියකුගෙන්ම තහවුරුවක් ලබා ගැනේ. | අනුකූල විය |
| **3.(7)** | **සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු** | | |
| 3. (7) (i) | බැඳියා පිළිගැටුම වැළැක්වීම<br><br>▼ GRI 102-25 | බැංකුවේ මනා පරිච සංග්‍රහයේ වගන්ති 2.14 හි (2011.09.30. දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද) සම්බන්ධිත පාර්ශ්ව පිළිබඳ සාකච්ඡා කෙරෙන ලේඛණගත සම්බන්ධිත පාර්ශ්ව ප්‍රතිපත්තියක් ඇතුළත් වන අතර, එමගින් බැංකුවේ කවර හෝ ගනුදෙනුවක් අදාළ සම්බන්ධිත පාර්ශවයක් සමග සිදුකිරීමෙන් මතුවිය හැකි බැඳියා පිළිගැටුම් වළක්වා ගන්නා ලෙසට උපදෙස් ලබාදෙනු ලැබේ.<br><br>විගණන කමිටුව මගින් නිර්දේශ කරන ලදුව ශ්‍රීලංමබැ. නිර්දේශ මත පදනම් වී වැඩිදුරට සමාලෝචනය කළ සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියක් මූල්‍ය ප්‍රධානී විසින් ස්ථාපනය කරනු ලැබ ඇත. | අනුකූල විය |
| 3. (7) (ii) | නියෝගය මගින් ආවරණය වන සම්බන්ධිත පාර්ශව ගනුදෙනු | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ මනා පරිච සංග්‍රහයේ වගන්ති 2.14 හි සම්බන්ධිත පාර්ශ්ව පිළිබඳ සාකච්ඡා කෙරෙන ලේඛණගත සම්බන්ධිත පාර්ශ්ව ප්‍රතිපත්තියක් ඇතුළත් වන අතර, එමගින් බැංකුවේ කවර හෝ ගනුදෙනුවක් අදාළ සම්බන්ධිත පාර්ශවයක් සමඟ සිදුකිරීමෙන් මතුවිය හැකි බැඳියා පිළිගැටුම් වළක්වා ගන්නා ලෙසට උපදෙස් ලබාදෙනු ලැබේ. | අනුකූල විය |

| කොටස | ප්‍රතිපත්තිය | අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම | තත්ත්වය |
|---|---|---|---|
| 3. (7) (iii) | තහනම්කළ ගනුදෙනු | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ මනා පරිච සංග්‍රහයේ වගන්ති 2.14 හි සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු වර්ග පිළිබද හඳුනා ගැනෙන ලේඛණගත සම්බන්ධිත පාර්ශ්ව ප්‍රතිපත්තියක් ඇතුළත් වන අතර, එමගින් බැංකුව මගින් කවර එවැනි පාර්ශවයක් වෙත, සමාන ආකාරයේ ගනුදෙනුවකදී බැංකුවේ වෙනත් ගනුදෙනුකරුවකු ලබා නොදෙන ආකාරයේ 'වඩාත් හිතවාදී සැලකීමක්' ලබාදීම සිදු නොකල යුතු බවට ප්‍රකාශ කෙරේ.<br><br>අධ්‍යක්ෂවරු සහ ප්‍රධාන කාර්ය මණ්ඩලයෙන් ලද ප්‍රකාශන සහ තොරතුරු මත පදනම්ව, බැංකුව පද්ධතිය වෙත සම්බන්ධිත පාර්ශ්වයන්ගේ හැඳුනුම්පත් සහ බැංකු උපලබ්ධි සහතික අංක ඇතුළු කිරීමේදී බැංකුව තුළ වළකාලීමේ හෝ හඳුනාගැනීමේ ක්‍රමවේදයක් සකසා ගත යුතු වන අතර බැංකුව මගින් සමාන ආකාරයේ ව්‍යාපාර කටයුත්තකදී බැංකුවේ වෙනත් ගනුදෙනුකරුවන් හට පිරිනමනු ලබන සැළකිල්ලට වඩා "වැඩි හිතවාදී සැළකීමක්" සම්බන්ධිත පාර්ශ්වයන් වෙත ලබානොදෙන බවට තහවුරු කිරීම උදෙසා අදාළ පරිදි අධීක්ෂණය සිදුකළ යුතු වේ. | අනුකූල විය |
| 3. (7) (iv) | අධ්‍යක්ෂවරයකු වෙත හෝ අධ්‍යක්ෂවරයකුගේ සමීප ඥාතියකු වෙත අනුග්‍රහය දැක්වීම | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ මනා පරිච සංග්‍රහයේ වගන්ති 2.14 හි ප්‍රකාරව අධ්‍යක්ෂවරයකු වෙත හෝ අධ්‍යක්ෂවරයකුගේ සමීප ඥාතියකු වෙත සහ ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය වෙත අනුග්‍රහය (සමීප සම්බන්ධතා) දැක්වීම පිළිබඳව සාකච්ඡා කෙරෙන ලියවිල්ලක් ඇති අතර, එවැනි අනුග්‍රහය දැක්වීමක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී අනුමත කිරීම සඳහා, අදාළ අධ්‍යක්ෂවරයා හැර සෙසු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් ඡන්දය භාවිත කළ යුතු අතර මුදල් මණ්ඩලය විසින් කලින් කල තීරණය කරන එකී ආරක්ෂාවක් තුළින් මෙම පහසුකම් ආරක්ෂා වේ. | අනුකූල විය |
| 3. (7) (v) | බැංකුවේ අධ්‍යක්ෂවරුන් වශයෙන් පසුව පත් කෙරෙන පුද්ගලයින්, එම පුද්ගලයින් හා සම්බන්ධ අයවළුන්, හෝ එම පුද්ගලයින්ගේ සමීප ඥාතීන් වෙත දක්වන ලද අනුග්‍රහය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ මනා පරිච සංග්‍රහයේ වගන්ති 2.14 හි 3 :7 (v) කරුණ මගින් ඉල්ලා සිටිනු ලබන ආකාරයේ ලේඛණගත ප්‍රතිපත්තියක් ඇතුළත් වේ. | අනුකූල විය |
| 3. (7) (vi) | බැංකු සේවකයින් හෝ ඔවුන්ගේ සමීප ඥාතීන් වෙත හිතවාදී සැළකිල්ල හෝ අනුග්‍රහය දැක්වීම | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ මනා පරිච සංග්‍රහයේ වගන්ති 2.14 ජී ප්‍රකාරව මේ සම්බන්ධයෙන් බැංකුව සතුව ක්‍රියාවලියක් පවතී. කාර්ය මණ්ඩල ණය පහසුකම් වැනි, බැංකුවේ සියළුම සේවකයින්ට අදාළ වන පොදු සැලසුම් හැරුණු විට, හිතවාදී පදනමක් මත කිසිදු සේවකයකු හට අනුග්‍රහයක් දක්වා නොමැත. | අනුකූල විය |
| 3. (7) (vii) | මුදල් මණ්ඩල අනුමැතිය යටතේ අනුග්‍රහය දැක්වීම් ප්‍රේෂණය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ මනා පරිච සංග්‍රහයේ වගන්ති 2.14 ජී ප්‍රකාරව මේ සම්බන්ධයෙන් බැංකුව සතුව ක්‍රියාවලියක් පවතී. | අනුකූල විය |
| | **අනාවරණය කිරීම්** | | |
| 3. (8) (i) | වාර්ෂික හා කාර්තුමය මූල්‍ය ප්‍රකාශයන් ප්‍රකාශයට පත් කිරීම | බැංකුව මගින් අදාළ පරිදි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම සිදුකෙරේ. කාර්තුමය මූල්‍ය ප්‍රකාශයන් සංක්ෂිප්ත ආකාරයෙන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පුවත්පත් වල පළ කෙරේ. | අනුකූල විය |
| 3. (8) (ii) | වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කිරීම් | | |
| අ. | විශේෂිත හෙළදරව් කිරීම් ඇතුළුව, වාර්ෂික විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයන් අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල කරන ලද බව හැඟවෙන ප්‍රකාශයක් | මෙම කරුණු සම්බන්ධ ප්‍රකාශයක් 2019 වාර්ෂික වාර්තාවේ පිටු අංක 182 හි මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම යටතේ ඇතුළත් වේ. | අනුකූල විය |
| ආ. | බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව | 2019 වාර්ෂික වාර්තාවේ පිටු අංක 177 සිට 178 දක්වා "මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනය සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය" යටතේ හෙළිදරව් කොට ඇත. | අනුකූල විය |
| ඇ. | අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ඵලදායීතාවය පිළිබඳ බාහිර විගණකගේ සහතිකය | 2019 වාර්ෂික වාර්තාවේ පිටු අංක 179 හි "අභ්‍යන්තර පාලනය සම්බන්ධ විගණකාධිපතිවරයාගේ සහතිකත්ව වාර්තාව" යටතේ හෙළිදරව් කොට ඇත. | අනුකූල විය |

# ආයතනික යහපාලනය

| කොටස | ප්‍රතිපත්තිය | අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම | තත්ත්වය |
|---|---|---|---|
| ඈ. | නම, යෝග්‍යතාවය, බැංකුව සමග ගනුදෙනු සහ බැංකුව මගින් ගෙවනු ලබන මුළු ගාස්තු/පාරිශ්‍රමික ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ තොරතුරු | පිටු අංක 26 සිට 27 දක්වා අධ්‍යක්ෂවරුන් හැඳින්වීම යටතේ නම, සුදුසුකම් සහ අත්දැකීම් හෙළිදරව් කොට ඇත.<br>අධ්‍යක්ෂවරුනගේ පාරිශ්‍රමික පිටු අංක 212 හි මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 13 යටතේ හෙළිදරව් කොට ඇත.<br>2019 දී අධ්‍යක්ෂවරු සමඟ පාරිශ්‍රමික සහ ගනුදෙනුවල මුළු වටිනාකම. | අනුකූල විය |

| | රු. '000 |
|---|---|
| කෙටිකාලීන සේවක ප්‍රතිලාභ | 7,952.3 |
| පශ්චාත් රැකියා විශ්‍රාම | – |
| අවසන් කිරීමේ ප්‍රතිලාභ | – |
| කොටස් පදනම් ගෙවීම් | – |
| අනෙකුත් දිගුකාලීන ගෙවීම් | – |
| ණය කාඩ් ඇතුළුව ණය සහ අත්තිකාරම් | 3,771.9 |
| තැන්පතු | 8,077.1 |
| ආයෝජන | – |

| කොටස | ප්‍රතිපත්තිය | අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම | තත්ත්වය |
|---|---|---|---|
| ඉ. | එක් එක් සම්බන්ධිත පාර්ශ්ව කාණ්ඩය වෙත පිරිනමන ලද මුළු අනුග්‍රහය – බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙහි ප්‍රතිශතයක් ලෙස | 2019 දී සම්බන්ධිත පාර්ශ්ව කාණ්ඩය වෙත පිරිනමන ලද මුළු අනුග්‍රහය. | අනුකූල විය |

| | රු. '000 | බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතය |
|---|---|---|
| අධ්‍යක්ෂවරු | 3,772 | 0.005 |
| අධ්‍යක්ෂවරුන්ගේ සමීප පවුලේ සාමාජිකයින් | 2,035 | 0.003 |
| ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය (KMP) | 63,993 | 0.082 |
| ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සමීප පවුලේ සාමාජිකයින් | 2,047 | 0.003 |
| පරිපාලිත සමාගම් | 7,019,920 | 9.007 |
| රජය සහ රජය සම්බන්ධ ආයතන | 763,892,621 | 980.09 |
| බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් හෝ වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකුගේ සමීප පවුලේ සාමාජිකයෙක් සමඟ ඇති සැලකියයුතු සම්බන්ධතාව | – | – |

| කොටස | ප්‍රතිපත්තිය | අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම | තත්ත්වය |
|---|---|---|---|
| ඊ. | KMP සමඟ පාර්ශ්‍රමික සහ ගනුදෙනුවල මුළු වටිනාකම | 2019 දී KMP සමඟ පාර්ශ්‍රමික සහ ගනුදෙනුවල මුළු වටිනාකම | අනුකූල විය |

| | රු. '000 |
|---|---|
| කෙටිකාලින සේවක ප්‍රතිලාභ | 527,047.6 |
| පශ්චාත් රැකියා විශ්‍රාම | 31,683.2 |
| අවසන් කිරීමේ ප්‍රතිලාභ | 18,051.7 |
| කොටස් පදනම් ගෙවීම් | – |
| අනෙකුත් දිගුකාලින ගෙවීම් | – |
| ණය කාඩ් ඇතුළුව ණය සහ අත්තිකාරම් | 63,993.0 |
| තැන්පතු | 353,635.3 |
| ආයෝජන | 1,147.1 |

| කොටස | ප්‍රතිපත්තිය | අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම | තත්ත්වය |
|---|---|---|---|
| උ. | බාහිර විගණකගේ අනුකූලතාවය සම්බන්ධ සහතිකය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනික සාංගමික පාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ තථ්‍ය සොයාගැනීම් වාර්තාව ලබා ගෙන ඇත. විගණකවරුන්ගේ සියළුම සොයාගැනීම් මෙම ආයතනික පාලන වාර්තාවේ ඇතුළත් කොට ඇත. | අනුකූල විය |
| ඌ. | විචක්ෂණශීලී අවශ්‍යතා, රෙගුලාසි, නීති හා අභ්‍යන්තර පාලනයන් වෙත අනුකූලතාව තහවුරු කෙරෙන වාර්තාව | 2019 වාර්ෂික වාර්තාවේ පිටු අංක 182 හි මූල්‍ය වාර්තාකරණය සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම යටතේ හෙළිදරව් කොට ඇත. | අනුකූල විය |
| ස. | අනුකූලතා නොවන වාර්තාව<br>GRI 102 - 34 | ආයතනික පාලන වාර්තාව අනුව, බැංකුවේ අවදානම් කළමනාකරණ පද්ධතීන්හි කිසිදු අධීක්ෂණමය ගැටළුවක් හෝ ශ්‍රී.ලං.ම.බැ අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් පෙන්වා දෙන ලද මෙකී නියෝගයන් කෙරෙහි අනනුකූලාතවක් හෝ නොමැත. | අනුකූල විය |

# අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වාර්තා

## අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාව (BAC)

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳ 2007 බැංකුකරණ පනතෙහි නියෝග අංක 11 හි විධිවිධාන ප්‍රකාරව, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව සංස්ථාපනය කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි කටයුතු කමිටුවෙහි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබන ප්‍රඥප්තිය මත පදනම් වේ.

වසර අවසානය වන විට කමිටුව විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය.

- ඒ එම් පී එම් බී අතපත්තු මයා (සභාපති)
- කේ ඩී එන් රංජිත් අශෝක මයා
- නියෝමාල් ප්‍රනාන්දු මහතා

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි ගණපූරණය සාමාජිකයින් (2) දෙදෙනෙකි.

වැඩබලන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි ලේකම්වරයා වශයෙන් කටයුතු කරයි. ප්‍රධාන අභ්‍යන්තර විගණක, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ) සහ සහකර සාමාන්‍යාධිකාරී (අනුකූලතා) ආරාධිතව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් වලට සහභාගී වේ. රජයේ විගණක අධිකාරී ද ආරාධිතව අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු රැස්වීම් වලට සහභාගී වේ.

අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව නිශ්චිතව පහත දැක්වෙන කාර්යභාරයන් ඉටු කරයි.

- ව්‍යවස්ථාව යටතේ මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා වෙත අනුකූලතාවය තහවුරු කිරීම පිණිස මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම
- අභ්‍යන්තර පාලන පද්ධතිය සහ ව්‍යාපාර අවදානම් කළමනාකරණය පිළිබඳ පරීක්ෂා කිරීම.
- බාහිර හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලීන් සමාලෝචනය කිරීම.
- නීතිරීති හා රෙගුලාසි සහ විශේෂයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් වෙත අනුකූලතාවය අධීක්ෂණය කිරීම සඳහා පවතින ක්‍රියාපටිපාටීන් සමාලෝචනය කිරීම.

සමාලෝචනයට ලක් වන වසර තුළ පහත දැක්වෙන කරුණු කෙරෙහි කමිටුවේ අවධානය යොමු විය.

අ. වසර 2019 සඳහා බැංකුවේ අංශයන්හි අවදානම් පැතිකඩ මත පදනම්ව පිළියෙල කරන ලද වාර්ෂික විගණන සැලසුම අනුමත කරන ලදී.

ආ. 2018 වසර සඳහා 1971 අංක 38 දරන මුදල් පනතෙහි වගන්ති 13 (7) (අ) අනුව නිකුත් කරන ලද විගණකාධිපතිවරයාගේ කළමනාකරණ ලිපිය සහ වාර්තාව හා ඒ අනුව කළමනාකරණ ප්‍රතිචාර සමාලෝචනය කර සාකච්ඡා කරන ලදී.

ඇ. 2019 වසර සඳහා බැංකුවේ කාර්තුමය මූල්‍ය කාර්යසාධනය සමාලෝචනය කොට එය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත භාරදීම සඳහා නිර්දේශ කරන ලදී.

ඈ. 2017/2018 ශ්‍රී.ල.ං.ම.බැ ව්‍යවස්ථාපිත පරීක්ෂණ සහ පසුවිපරම් පරීක්ෂණයන්හිදී මතු කරන ලද ගැටළු සාකච්ඡා සහ සමාලෝචනය කොට නිවැරදි කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කරන ලදී.

ඉ. විගණන වාර්තා සහ අභ්‍යන්තර විගණන අංශයේ කාර්යසාධනය පිළිබඳ නිරන්තර සමාලෝචනය

ඊ. තොරතුරු පද්ධති ක්‍රියාපටිපාටීන් සමාලෝචනය කොට යෝග්‍ය වෙනස්වීම් නිර්දේශ කරන ලද අතර ඒවායේ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නියාමනය කිරීම.

උ. ශාඛා මෙහෙයුම් සහ අක්‍රීය ණයවල හිඟයන් පිළිබඳ මූලික හේතු විශ්ලේෂණය වැනි විශේෂ වාර්තා සමාලෝචනය කිරීම.

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා රැස්වීම් හතරක් (4) ක් පවත්වන ලදී අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් අභ්‍යන්තර විගණන වාර්තා, ඒවායේ හඳුනාගත් ඌනතාවයන් සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්/අංශ ප්‍රධානීන් විසින් දක්වන ලද ප්‍රතිචාරයන් සළකා බලමින් අදාළ ඌනතාවයන් මගහැරවීම සඳහා ගනු ලැබූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් අධීක්ෂණය කෙරිණි. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ රැස්වීම්වල වාර්තා දැනගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි.

2019 වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින්, ශ්‍රී.ලං.ම.බැ ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තා මගින් සහ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා විගණකාධිපති වාර්තාව මගින් මතු කරන ලද කරුණු සම්බන්ධයෙන් කළමනාකාරීත්වය විසින් ගනු ලැබූ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යන ලදී.

විගණන කාර්යය සඳහා විගණකාධිපතිවරයා විසින් ඉල්ලා සිටින ලද සහ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලතාවය දැක්වීම සඳහා අවශ්‍ය වූ සියළුම තොරතුරු සහ ලේඛණ සපයන ලද බවට අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් තහවුරු කරන ලදී. ප්‍රමාණවත් පාලනයන් සහ ක්‍රියාපටිපාටීන් පවතින බවටත්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු ප්‍රඥප්තිය සියළුම වැදගත් කරුණු සහිතව සම්පාදනය කරන ලද බවත්, අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි අදහස වේ.

**සුධර්ෂන් අහංගම**
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

2020 මාර්තු 25 වැනි දින

## අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු (BHRRC) වාර්තාව

### විෂයපථය

මානව සම්පත් (HR) හා පාරිශ්‍රමික ප්‍රතිපත්ති සැකසීම සහ මානව සම්පත් කළමනාකරණය ආශ්‍රිත ක්‍රමෝපායන් බිහිකිරීමේ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වගකීමට බැඳී සිටී. මෙම ප්‍රතිපත්තීන් නිරන්තරයෙන් සමාලෝචනය කෙරෙන බවටත්, සෑම තත්ත්වයකටම අනුකූල වන බවටත් කමිටුව තහවුරු කරයි.

බඳවාගැනීම්, වැටුප් තීරණය කිරීම් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ සම්බන්ධයෙන් කමිටුව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. විධායක ළමනාකාරීත්වයේ සේවා දිගු කිරීම් සළකා බැලීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ අධිකාරී බලතලද කමිටුව සතු වේ. කොන්ත්‍රාත් හා විධායක කළමනාකාරීත්ව සාමාජිකයින්ගේ සේවා ගිවිසුම් සමාලෝචනය කිරීම භාරව කමිටුව කටයුතු කරයි.

### සංයුතිය

අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සහ ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරීවරයා ගෙන් කමිටුව සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවෙහි පෙර සාමාජිකයින් වූයේ:

- නිශ්ශංක නානායක්කාර මයා – සභාපති (2019.02.18 සිට 2019.11.27 දක්වා)
- හේමසිරි ප්‍රනාන්දු මයා – අධ්‍යක්ෂ (2019.01.28 සිට 2019.10.12 දක්වා)
- ලහිරු පත්මලාල් මයා – අධ්‍යක්ෂ (2019.02.07 සිට 2019.12.12 දක්වා)
- රසික ගුණවර්ධන මයා – ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී

අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවෙහි වර්තමාන සාමාජිකයින් වන්නේ:

- සුජීව රාජපක්ෂ මයා – සභාපති
- මලිඳු රණසිංහ මයා – අධ්‍යක්ෂ
- මන්ජුල වෙල්ලාලගේ මයා – අධ්‍යක්ෂ
- එම් ඒ බී සිල්වා මයා – වැඩ බලන ප්‍ර.වි.නි./සාමාන්‍යාධිකාරී

ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) ආරාධිතව රැස්වීම් වලට සහභාගී වන අතර බැංකුවේ ඕනෑම නිලධාරියකුට ආරාධිතව රැස්වීම් වලට සහභාගී විය හැක.

### කමිටු රැස්වීම්

සිය විෂයපථය යටතේ පවතින කරුණු සළකා බැලීම සඳහා කමිටුව මාස දෙකකට වරක් රැස්වන අතර ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවෙහි ගණපූරණය වනුයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු සහ ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරීවරයා වේ.



**ශ්‍යාමා විජේකෝන්**
වැඩබලන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2020 මාර්තු 24

## අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු (BIRMC) වාර්තාව

### විෂයපථය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන ලද පරිදි බැංකුවේ අවදානම් ක්‍රමෝපාය ක්‍රියාවට නැංවීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත පැවරේ. ව්‍යාපාර ඒකකයන්හි කාර්යක්ෂම ක්‍රියාකාරීත්වය උදෙසා අවදානම් කළමනාකරණ ආකෘතීන් අනුමත කිරීමේ සහ අවදානම් අධීක්ෂණය කිරීමේ වගකීම කමිටුව වෙත පිරිනමනු ලැබ ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නියම කරන ලද අවදානම් පරාමිති තුළ බැංකුවේ අවදානම් ආකෘතිය සමාලෝචනය කිරීම සඳහා කමිටුව වගකීමට බැඳී සිටී.

යෝග්‍ය වූ අවදානම් දර්ශකයන් සහ කළමනාකරණ තොරතුරු යොදාගනිමින්, ණය, වෙළඳපොළ, ද්‍රවශීලතා, මෙහෙයුම් හා ක්‍රමෝපායික ආදී සියළුම අවදානම් තක්සේරු කොට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමේ වගකීමද කමිටුව සතු වේ.

තවද කමිටුව මගින් ණය, මූල්‍ය, මෙහෙයුම්, නෛතික/අනුකූලතා අංශයන් ආශ්‍රිතව අවදානම් කළමනාකරණ ක්‍රියාකාරකම් අධීක්ෂණය කරමින් අදාළ අවදානම්වල බලපෑම අවම කිරීම සඳහා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමද සිදුකෙරේ.

### සංයුතිය

කමිටුව අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකු, ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරීවරයාගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙහි සාමාජිකයින් වූයේ:

- ඒ එම් පී එම් බී අතපත්තු මයා – සභාපති (2019.02.04 සිට 2019.12.13 දක්වා)
- කේ ඩී එන් රංජිත් අශෝක මයා – අධ්‍යක්ෂ (2018.11.09 සිට 2019.11.27 දක්වා)
- එම් එස් ඒ මුතුමාල මයා – අධ්‍යක්ෂ (2019.04.04 සිට 2019.11.27 දක්වා)
- රසික ගුණවර්ධන මයා – ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරී

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙහි වර්තමාන සාමාජිකයින්:

- සුදර්ශන් අහංගම මයා – සභාපති
- කේ ඒ විමලේන්තිරරාජා මයා – අධ්‍යක්ෂ
- ඉසුරු බාලපැටබැඳි මයා – අධ්‍යක්ෂ
- එම් ඒ බී සිල්වා මයා – වැඩ බලන ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරී

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ) සහ බැංකුවේ වෙනත් ඕනෑම නිලධාරියකුට ආරාධිතව රැස්වීම් වලට සහභාගී විය හැක.

### කමිටු රැස්වීම්

අවදානම් කළමනාකරණය ආශ්‍රිත කරුණු සළකා බැලීම සඳහා කමිටුව කාර්තුමය වශයෙන් රැස්වන අතර අදාළ නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙහි ගණපූරණය වනුයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු සහ ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරීවරයා වේ.



**ශ්‍යාමා විජේකෝන්**
වැඩබලන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2020 මාර්තු 24

# අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වාර්තා

## අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටු (BECC) වාර්තාව

### විෂයපථය

ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරීවරයාගේ සීමාවන්ට ඉහළින් සහකාර සාමාන්‍යාධිකාරී ශ්‍රේණියෙන් ඉහළ කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත සියළුම ණය යෝජනා අනුමත කිරීමේ අධිකාරී බලතල අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව සතු වේ.

අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුව සතුව ණය ප්‍රතිසාධන යෝජනා සහ එකවර මුදල් පියවීම් සළකා බැලීමේ බලතලද පවතී.

### සංයුතිය

කමිටුව අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු, ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරීවරයා සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ) ගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවෙහි සාමාජිකයින් වූයේ:

- ආචාර්ය අමින්ද එම් පෙරේරා - සභාපති (2019.04.24 සිට 2019.11.27 දක්වා)
- නිලංක එම් පීරිස් මයා – අධ්‍යක්ෂ (28.01.2019 සිට 29.11.2019 දක්වා)
- ලහිරු පත්මලාල්- අධ්‍යක්ෂ (2019.02.07 සිට 2019.12.12 දක්වා)
- රසික ගුණවර්ධන මයා – ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරී

අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවෙහි වර්තමාන සාමාජිකයින්:

- කුමාර් ගුණවර්ධන මයා – සභාපති
- කීර්ති ගුණතිලක මයා – අධ්‍යක්ෂ
- එම් මංජුල වෙල්ලාලගේ මයා – අධ්‍යක්ෂ
- එම් ඒ බී සිල්වා මයා – වැඩ බලන ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරී

බැංකුවේ වෙනත් ඕනෑම නිලධාරියකුට ආරාධිතව රැස්වීම් වලට සහභාගී විය හැක.

### කමිටු රැස්වීම්

කමිටුව අවම වශයෙන් මසකට දෙවරක් රැස්වේ. අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවෙහි ගණපූරණය වනුයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු සමගින් සාමාජිකයින් තිදෙනෙකි.

**ශ්‍යාමා විජේකෝන්**
වැඩබලන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2020 මාර්තු 24

## අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටු (BNC)වාර්තාව

### විෂයපථය

අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුව මගින් ප්‍රධාන වශයෙන් ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකාරීත්ව කාර්යය මණ්ඩල තෝරාගැනීම/පත්කිරීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවේ. ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන කළමනාකාරීත්ව වෘත්තික ධූරයන් වෙත උසස් කිරීම සඳහා කමිටුව විසින් නිර්ණායක සකසනු ලැබේ.

කමිටුව වරින් වර අමතර/නව විශේෂඥ අවශ්‍යතා සහ විශ්‍රාම ලබන ප්‍රධාන කළමනාකාරීත්ව වෘත්තිකයින් වෙනුවෙන් අනුප්‍රාප්තික කාර්යයන් සිදුකිරීම පිළිබඳ සළකා බැලීමේ සහ නිර්දේශ කිරීමේ වගකීමද උසුලයි.

### සංයුතිය

කමිටුව අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවෙහි සාමාජිකයින් වූයේ:

- නිශ්ශංක නානායක්කාර මයා – සභාපති (2019.02.18 සිට 2019.11.27 දක්වා)
- හේමසිරි ප්‍රනාන්දු මයා – අධ්‍යක්ෂ (2019.01.28 සිට 2019.10.12 දක්වා)
- එම් කේ ඩී එන් රංජිත් අශෝක මයා – අධ්‍යක්ෂ (2018.11.09 සිට 2019.11.27 දක්වා)
- එම් එස් ඒ මුතුමාල මයා – අධ්‍යක්ෂ (2019.04.04 සිට 2019.11.27 දක්වා)

ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරීවරයා ආරාධනයෙන් රැස්වීමට සහභාගී වේ.

අධ්‍යක්ෂ මණ්ඩල විධායක ණය කමිටුවෙහි වර්තමාන සාමාජිකයින්:

- සුජීව රාජපක්ෂ මයා – සභාපති
- සුධර්ශන් අහංගම මයා – අධ්‍යක්ෂ
- මලිඳු රණසිංහ මයා – අධ්‍යක්ෂ

වැඩබලන ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරී ආරාධිතව රැස්වීම් වලට සහභාගී වේ.

### කමිටු රැස්වීම්

කමිටුව කාර්තුවකට වරක් රැස්වේ. අධ්‍යක්ෂ මණ්ඩල නාමයෝජනා කමිටුවෙහි ගණපූරණය වනුයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකි.

**ශ්‍යාමා විජේකෝන්**
වැඩබලන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2020 මාර්තු 24

## අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටු (BIBC) වාර්තාව

### විෂයපථය

අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුව පිහිටුවනු ලැබ ඇත්තේ බැංකුවේ ආයෝජන බැංකුකරණ මොඩියුලය සහ ආයෝජන බැංකුකරණ ඒකකයෙහි මෙහෙයුම් නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කිරීම සඳහාය. කොටස් වෙළඳාම් සීමා, නව ආයෝජන සැලසුම් සහ කොටස් තැරැව්කරුවන්, වෙළඳ පදනම් යොදාගැනීම සහ තොරතුරු තාක්ෂණ පද්ධති සඳහා අනුමැතිය ලබාදීමේ බලතල කමිටුව සතු වේ.

### සංයුතිය

කමිටුව අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු, ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරීවරයාගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුවේ සාමාජිකයින් වූයේ:

- කේ ඩී එන් රංජිත් අශෝක මයා – සභාපති (2018.11.09 සිට 2019.11.27 දක්වා)
- ඒ එම් පී එම් බී අතපත්තු මයා - අධ්‍යක්ෂ (2019.02.14 සිට 2019.12.13 දක්වා)
- ආචාර්ය අමින්ද එම් පෙරේරා - අධ්‍යක්ෂ (2019.04.24 සිට 2019.11.27 දක්වා)
- ලහිරු පත්මලාල් – අධ්‍යක්ෂ (2019.02.07 සිට 2019.12.12 දක්වා)
- රසික ගුණවර්ධන මයා – ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරී

අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුවේ සාමාජිකයින් වන්නේ:

- කේ ඒ විමලේන්තිරරාජා මයා – සභාපති
- කුමාර් ගුණවර්ධන මයා – අධ්‍යක්ෂ
- ඉසුරු බාලපැටබැඳි මයා – අධ්‍යක්ෂ
- එම් ඒ බී සිල්වා මයා – වැඩ බලන ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරී

භාණ්ඩාගාර හා ආයෝජන බැංකුකරණ ප්‍රධානි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අවදානම් කළමනාකරණ) බැංකුවේ වෙනත් ඕනෑම නිලධාරියකුට ආරාධිතව රැස්වීම්වලට සහභාගී විය හැක.

### කමිටු රැස්වීම්

කමිටුව එහි විෂය පථය සම්බන්ධ කරුණු පිළිබඳ අවධානය සඳහා කාර්තුවකට වරක් රැස්වේ. අධ්‍යක්ෂ මණ්ඩල ආයෝජන බැංකුකරණ කමිටුවෙහි ගණපූරණය වනුයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු ඇතුළුව සාමාජිකයින් තිදෙනෙකි.

**ශ්‍යාමා විජේකෝන්**
වැඩබලන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2020 මාර්තු 24

## අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටු (BITC) වාර්තාව

### විෂයපථය

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුව තොරතුරු තාක්ෂණ කටයුතු පිළිබඳ විශ්වසනීය මට්ටම් තහවුරු කරමින් තොරතුරු තාක්ෂණ පාලනය පිළිබඳ ඉහළ යන ඉල්ලුම තුළ බැංකුව වෙත සහාය දක්වනු පිණිස පිහිටුවනු ලැබ ඇත.

කමිටුව තොරතුරු තාක්ෂණය සම්බන්ධ සමස්ත ක්‍රමෝපාය සැකසීමේ වගකීම උසුලන අතර එය උද්ගත වන ඉල්ලුම සපුරාලීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නවතම තාක්ෂණයන් සම්බන්ධයෙන් නිර්දේශ සිදු කරයි.

### සංයුතිය

කමිටුව අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුවේ සාමාජිකයන් වූයේ:

- නිලංක එම් පීරිස් මයා – සභාපති (28.01.2019 සිට 29.11.2019 දක්වා)
- ආචාර්ය අමින්ද එම් පෙරේරා – අධ්‍යක්ෂ (2019.04.24 සිට 2019.11.27 දක්වා)
- ලහිරු පත්මලාල් – අධ්‍යක්ෂ (2019.02.07 සිට 2019.12.12 දක්වා)

අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු තාක්ෂණ කමිටුවේ වර්තමාන සාමාජිකයන්:

- කීර්ති ගුණතිලක මයා – සභාපති
- කුමාර් ගුණවර්ධන මයා – අධ්‍යක්ෂ
- මලිඳු රණසිංහ මයා – අධ්‍යක්ෂ

බැංකුවේ වෙනත් ඕනෑම නිලධාරියෙකුට ආරාධිතව රැස්වීම් වලට සහභාගී විය හැක. කමිටුවෙහි ගණපූරණය වනුයේ සාමාජිකයින් දෙදෙනෙකි.

**ශ්‍යාමා විජේකෝන්**
වැඩබලන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2020 මාර්තු 24

# අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු වාර්තා

## අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රමෝපායික සැලසුම් සමාලෝචන කමිටු (BSPRC) වාර්තාව

### විෂයපථය

අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රමෝපායික සැලසුම් සමාලෝචන කමිටුව ස්ථාපනය කරනු ලැබ ඇත්තේ ක්‍රමෝපායික සැලසුමෙහි දැක්වෙන අරමුණුවල නිසි ක්‍රියාත්මකභාවය නිරන්තරයෙන් සමාලෝචනය කරනු පිණිසය. සියළුම ව්‍යාපාර අංශ ප්‍රධානීන්ගේ කාර්යසාධනය සමාලෝචනය කරමින් නිශ්චිත කාලසීමාවක් තුළ ව්‍යාපාරික අරමුණු සපුරාගැනීම සඳහා ඔවුන්ට සහාය වීමේ අධිකාරී බලතල කමිටුව සතු වේ.

### සංයුතිය

කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන අතර අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු, ප්‍ර.වි.නි/සාමාන්‍යාධිකාරීවරයාගෙන් සමන්විත වේ.

අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රමෝපායික සැලසුම් සමාලෝචන කමිටුවේ සාමාජිකයන් වූයේ:

- නිශ්ශංක නානායක්කාර මයා – සභාපති
  (2019.02.18 සිට 2019.11.27 දක්වා)
- ඒ එම් පී එම් බී අතපත්තු මයා – අධ්‍යක්ෂ
  (2019.02.14 සිට 2019.12.13 දක්වා)
- නියෝමාල් ප්‍රනාන්දු මහතා – අධ්‍යක්ෂ
  (2019.01.31 සිට 2019.11.28 දක්වා)
- රසික ගුණවර්ධන මයා – ප්‍රවිනි/සාමාන්‍යාධිකාරි

අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රමෝපායික සැලසුම් සමාලෝචන කමිටුවේ වර්තමාන සාමාජිකයන්ථ

- සුජීව රාජපක්ෂ මයා – සභාපති
- ඉසුරු බාලපටබැඳි මයා – අධ්‍යක්ෂ
- කීර්ති ගුණතිලක මයා – අධ්‍යක්ෂ
- එම් ඒ බී සිල්වා මයා – වැඩ බලන ප්‍රවිනි/සාමාන්‍යාධිකාරි

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ක්‍රමෝපායික සැලසුම් හා කාර්යසාධන කළමනාකරණ) සහ බැංකුවේ වෙනත් ඕනෑම නිලධාරියකුට ආරාධිතව රැස්වීම් වලට සහභාගී විය හැක.

### කමිටු රැස්වීම්

කමිටුව කාර්තුවකට වරක් රැස්වේ. කමිටුවෙහි ගණපූරණය වනුයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු ඇතුළුව සාමාජිකයින් දෙදෙනෙකි.



**ශ්‍යාමා විජෙකෝන්**
වැඩබලන අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2020 මාර්තු 24

# මූල්‍ය වාර්තාකරණය කෙරෙහි අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

## වගකීම

2007 බැංකු පනතෙහි නියෝග අංක 11, වගන්තිය 3(8) (ii) (ඉ) ප්‍රකාරව, අධ්‍යක්ෂවරුන් විසින් මහජන බැංකුවේ ("බැංකුව") මූල්‍ය වාර්තාකරණය ආශ්‍රිතව අභ්‍යන්තර පාලනයන් පිළිබඳ මෙම වාර්තාව ඉදිරිපත් කරනු ලැබේ.

බැංකුවේ ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයෙහි ප්‍රමාණවත්බව සහ ඵලදායීතාවය පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය ("මණ්ඩලය") විසින් දරනු ලැබේ. එබඳු ප්‍රමාණවත්භාවයක් සහ ඵලදායීතාවයක් සම්බන්ධයෙන් සළකා බලන කල, බැංකුකරණ ව්‍යාපාරයේදී කළමනාකරණය කරන ලද පදනමක් මත ප්‍රතිලාභ හා අවදානම සමතුලනය අවශ්‍ය වන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනාගනු ලබන අතර, ඒ නිසාම අභ්‍යන්තර පාලන ක්‍රම මූලිකව බැංකුවේ අවදානම් දරා ගැනීමේ සූදානම ආශ්‍රිත සීමාවන් හෝ දර්ශකයන්ගෙන් කවර හෝ අපගමනයන් වෙතොත් ඒවා විශේෂ කොට දැක්විය හැකි පරිදි සකස් කරනු ලබයි.

මෙම තත්ත්වය තුළ, මූල්‍ය තොරතුරු සහ වාර්තා හෝ මූල්‍ය අලාභ හෝ වංචා ආශ්‍රිත ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් සම්බන්ධයෙන්, අභ්‍යන්තර පාලන පද්ධතිය මගින් සපයනු ලැබිය හැක්කේ, සාධාරණ සහතිකයක් වන නමුත් පූර්ණ සහතිකයක් නොවේ.

අධ්‍යක්ෂ මණ්ඩලය මගින්, බැංකුව මුහුණදෙන සැළකිය යුතු අවදානම් හඳුනාගැනීම, තක්සේරුකරණය සහ කළමනාකරණය සඳහා අඛණ්ඩව ක්‍රියාත්මක වන ක්‍රියාවලියක් ස්ථාපනය කරනු ලැබ ඇති අතර, මෙම ක්‍රියාවලිය මගින් ව්‍යාපාරික වටපිටාව හෝ නියාමන උපදේශයන්හි වෙනස්වීමක් සිදු වූ වහාම මූල්‍යමය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතිය වෙත අදාළ වැඩිදියුණු කිරීම් සිදුකෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම ක්‍රියාවලිය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරනු ලැබ ඇති "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සම්බන්ධයෙන් බැංකුවල අධ්‍යක්ෂවරුන් වෙත් මාර්ගෝපදේශ" වලට අනුකූලව නිරන්තරයෙන් සමාලෝචනයට ලක් කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, අදාළ මාර්ගෝපදේශයන්හි අභ්‍යන්තර පාලන පද්ධතිය තක්සේරු කිරීම සඳහා වන ප්‍රතිපත්ති වලට අනුව මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලනය තක්සේරු කරන ලදී.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ දැනට ක්‍රියාත්මක අභ්‍යන්තර පාලන පද්ධතිය මූල්‍ය වාර්තාකරණයෙහි විශ්වසනීයබව පිළිබඳ සාධාරණ සහතිකයක් ලබාදීමට තරම් ප්‍රබල හා ප්‍රමාණවත් බවත්, බාහිර අරමුණු වෙනුවෙන් පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශයන් අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා නියාමන අවශ්‍යතා වලට අනුකූල වන බවත් අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවදානම හා පාලනය සම්බන්ධ ස්වකීය ප්‍රතිපත්ති හා ක්‍රියාපාටීන් ක්‍රියාත්මක කිරීමේදී, කළමනාකාරිත්වය මගින් අදාළ අවදානම් හඳුනාගැනීම හා මුහුණ පෑ අවදානම් තක්සේරුව, සහ අදාළ අවදානම් අවම කිරීම හා පාලනය කිරීම සඳහා යෝග්‍ය වන අභ්‍යන්තර පාලනයන් සැකසීම, මෙහෙයවීම සහ අධීක්ෂණය යන අංශයන්ගෙන් අධ්‍යක්ෂමණ්ඩලය වෙත සහාය දෙනු ලබයි.

## මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැකසුම සහ ඵලදායීතාවය සමාලෝචනය කිරීමේදී, යොදාගැනීම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාවලීන්හි ප්‍රධාන ගති ලක්ෂණ

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියේ ප්‍රමාණවත්බව සහ සුපිළිපන් බව සමාලෝචනය කිරීමේදී යොදාගත් ප්‍රධාන ක්‍රියාවලීන් වෙත පහත දැක්වෙන කරුණු ඇතුළත් වේ:

- බැංකුවේ දෛනික මෙහෙයුම් කටයුතු වල ඵලදායීතාවය සහ බැංකුවේ මෙහෙයුම්වල සංස්ථාපිත අරමුණු, ක්‍රමෝපායන් සහ වාර්ෂික අයවැය කෙරෙහි මෙන්ම අනුමත ප්‍රතිපත්ති හා ව්‍යාපාරික නියෝගයන් කෙරෙහි අනුකූලතාවය තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දැක්වීම උදෙසා මණ්ඩලය විසින් විවිධ කමිටු ස්ථාපනය කෙරිණි.
- බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය මගින්, නියැදි හා ආවර්තිත ක්‍රියාපටිපාටීන් භාවිත කරමින් අඛණ්ඩවම අභ්‍යන්තර පාලන පද්ධතීන්හි ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටීන් කෙරෙහි අනුකූලතාව සහ ඵලදායීත්වය පරීක්ෂා කරනු ලබන අතර, අනනුකූලතාවය සම්බන්ධ කවර හෝ සැළකිය යුතු සොයාගැනීමක් විශේෂ කොට දක්වනු ලැබේ. ස්වාධීන හා විෂයමූලික වාර්තාවක් ලබාදීමේ අරමුණින් යුතුව, ඇගයීමට ලක්වන අවදානමෙහි මට්ටම අනුව වාර ගණන තීරණය කරමින්, සියළුම ඒකකයන් සහ ශාඛාවන් ආශ්‍රිතව අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදුකෙරේ. වාර්ෂික විගණන සැලසුම අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් සමාලෝචනය කොට අනුමත කෙරේ. අභ්‍යන්තර විගණන අංශයේ සොයාගැනීම් සමාලෝචනය සඳහා ඔවුන්ගේ නිරන්තර රැස්වීම් වලදී අධ්‍යක්ෂ මණ්ඩලය විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.
- අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින්, අභ්‍යන්තර විගණන අංශය, නියාමන අධිකාරීන් සහ කළමනාකාරිත්වය විසින් හඳුනාගනු ලබන අභ්‍යන්තර පාලන ගැටළු සමාලෝචනය කොට, අවදානම් කළමනාකරණ හා අභ්‍යන්තර පාලන පද්ධතීන්හි ප්‍රමාණවත්භාවය සහ ඵලදායීතාවය තක්සේරු කරනු ලැබේ. ඔවුන් විසින් විගණනයන්හි විෂයපථය හා තත්ත්වය සම්බන්ධ නිශ්චිත අවධානයකින් යුතුව අභ්‍යන්තර විගණන ක්‍රියාකාරකම් සමාලෝචනයද සිදුකෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවෙහි වාර්තා ආවර්තිත පදනමක් මත බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සභාගත කෙරේ. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් සිදුකරන ලද ක්‍රියාකාරකම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටු වාර්තාවේ ඉදිරිපත් කෙරේ. (පිටු අංක 172 බලන්න)
- අභ්‍යන්තර පාලන පද්ධතිය ඇගයුමට ලක් කිරීමේදී බැංකුවේ හඳුනාගත් නිලධාරීන් විසින් අඛණ්ඩවම, බැංකුවේ මූල්‍ය ප්‍රකාශයන්හි වැදගත් ගිණුම් සහ හෙළිදරව් කිරීම් වලට සම්බන්ධ සියළුම ක්‍රියාපටිපාටීන් සහ පාලනයන් විශ්ලේෂණය හා යාවත්කාලීන කිරීම සිදු කරන ලදී. බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය මගින් අඛණ්ඩ පදනමක් මත මෙම ක්‍රියාපටිපාටීන් හා පාලනයන්ගේ සැකසුම හා ඵලදායීතාවය සම්බන්ධ යෝග්‍යතාවය නිර්ණය කරන ලදී .

# මූල්‍ය වාර්තාකරණය කෙරෙහි අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය

- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS සහ SLFRS අනුගමනය කිරීමේදී, හඳුනාගැනීම, මිනුම්කරණය, වර්ගීකරණය සහ හෙළිදරව් කිරීම සම්බන්ධ අවශ්‍යතා වෙත අනුගත වීම සඳහා අදාළ ක්‍රියාවලීන් වෙත ප්‍රගතිගාමී වැඩිදියුණු කිරීම් සිදුකෙරෙමින් පවතින අතරතුර, ණය හා අත්තිකාරම් හානිකරණය, ක්‍රෙඩිට් කාඩ්පත් මෙහෙයුම්, කළමනාකරණ තොරතුරු පද්ධතිය සහ අවදානම් කළමනාරණය හා සම්බන්ධිත පාර්ශ්වයන් ආශ්‍රිත මූල්‍ය ප්‍රකාශයන්හි හෙළිදරව් කිරීම් සම්බන්ධ ක්‍රියාවලීන් තවදුරටත් ශක්තිමත් කිරීම සිදුකෙරේ. මෙම ඇගයුම සඳහා බැංකුවේ පරිපාලිතයන් ඇතුළත් නොවීය.
- අධ්‍යක්ෂ  මණ්ඩලය විසින්, 2018 දී  ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති – SLFRS  9 “මූල්‍යමය උපකරණ” ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබීය. අවශ්‍ය ආදර්ශ ක්‍රියාත්මන කරන ලද අතර ක්‍රියාවලි සහ පාලනයන් සැලසුම් කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය තවදුරටත් කළමනාකරණ තොරතුරු පිළිබඳ ක්‍රියාවලි සහ SLFRS 9 අනුව වලංගුභාවය සහ අනුකූලතාවය සඳහා අවශ්‍ය වාර්තා පාලනයන් ශක්තිමත් කරන ලදී.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 2019 ජනවාරි 1 දින සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති – SLFRS  16 “කල්බදු” ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබීය.
- සම්පූර්ණ ශාඛා ජාලය ආවරණය කරමින් පරිගණක සහය විගණන ශිල්ප/මෙවලම් භාවිතා කරමින් බැංකුවේ සමහර තෝරාගත් ක්‍රියාවලි පිළිබඳ දත්ත විශ්ලේෂණයක් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් කරගෙන යන ලදී. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් හඳුනාගත් සැලකියයුතු සියලූම සොයා ගැනීම් ඔවුන්ගේ කාලීන රැස්වීම්වලදී සමාලෝචනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.
- 2018 මූල්‍ය වර්ෂයේ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් බාහිර විගණකවරුන් විසින් දක්වන ලද අදහස් සැළකිල්ලට ගනිමින් අදාළ අවස්ථාවන්හිදී ඒවා යොදාගැනීමට පියවර ගැනුනි. එළඹෙන වසරේදී සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු හඳුනාගැනීම ආශ්‍රිත පාලන ලේඛණගත කිරීම් වැඩිදියුණු කිරීමට අවශ්‍ය නිසි පියවර ගන්නා ලදී.

## තහවුරු කිරීම

ඉහත දක්වන ලද ක්‍රියාවලීන් මත පදනම්ව, බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රමය තුළින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ විශ්වසනීයත්වය සහ බාහිර අරමුණු වෙනුවෙන් පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට හා ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවලට අනුකූල වන බවට සාධාරණ සහතිකයක් ලබාදීමට සැලසුම් කර ඇති බවත් අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

## බාහිර විගණකවරුන් විසින් සිදු කරන ලද ප්‍රකාශය සම්බන්ධ සමාලෝචනය

බාහිර විගණකවරුන් විසින් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන වාර්ෂික වාර්තාවේ ඇතුළත් ඉහත දැක්වෙන අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සමාලෝචනයට ලක් කොට, බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි සැකසුම සහ ඵලදායීත්වය සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් භාවිත කරන ලද ක්‍රියාවලිය සම්බන්ධයෙන්, ඔවුන්ගේ අවබෝධය අනුව ප්‍රකාශය අනුකූල නොවන බවට විශ්වාස කිරීමට හේතු වන අකාරයේ කිසිදු කරුණක් ඔවුන්ගේ අවධානයට ලක් නොවූ බව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන ලදී.

මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන ආශ්‍රිත බාහිර විගණකවරුන්ගේ සහතික වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 177 සහ 178 පිටුවල ඉදිරිපත් කෙරේ.

අධ්‍යක්ෂ  මණ්ඩලය වෙනුවෙන්,



**සුදර්ශන් අහංගම**
සභාපති
අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව

2020 මාර්තු 25

# අභ්‍යන්තර පාලනය පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | BAF/BAF/D/PB/IC/2019 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 13 May 2020 |

## මහජන බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන විගණකාධිපතිවරයාගේ සහතික කිරීමේ වාර්තාව

### හැඳින්වීම

මෙම වාර්තාවෙන් ඉදිරිපත් කරනු ලබන්නේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවේ ඇතුලත් වන මහජන බැංකුවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය ("ප්‍රකාශනය") පිළිබඳ තහවුරුවකි.

### කළමණාකාරිත්වයේ වගකීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් 2007 අංක 11 දරන බැංකු පනත් විධානයේ 3 (8) (ii) (ආ) වගන්තියට අනුකූලව නිකුත් කරන ලද "අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වන මාර්ගෝපදේශ" ප්‍රකාරව ප්‍රකාශනය පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරිත්වය වගකීමට බැඳී සිටී.

### මාගේ වගකීම සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිති 3050 ට (සංශෝධිත) අනුකූලතාව

මගේ වගකිම් වන්නේ අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඔවුන් සඳහා පිළියෙල කරන ලද ලේඛනගත කිරීම මගින් ප්‍රකාශනය සනාථ වන්නේ ද සහ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනයේදී අධ්‍යක්ෂවරුන් උපයෝගී කරගෙන ඇති ක්‍රියාවලිය එමගින් උචිත පරිදි පිළිබිඹු වන්නේ ද යන කරුණු තක්සේරු කිරීමයි.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය සම්බන්ධයෙන් බැංකුව සඳහා වන තහවුරු වාර්තාව තහවුරු කිරීමේ කාර්යයන් පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රමිති (SLSAE) 3050 (සංශෝධිත)ට අනුකූලව මම මගේ කාර්යය සිදු කළෙමි.

කලමනාකාරිත්වය සියලූම වැදගත් අංශයන් හි අභ්‍යන්තර පාලනය පිළිබඳ ප්‍රකාශනය සකස් කර ඇතිද යන්න පිළිබඳ සීමිත සහතිකයක් ලබාග ැනිමට මා විසින් ක්‍රියාපටිපාටි සැලසුම්කර ඉටුකළයුතු බව මෙම ප්‍රමිතියෙන් අවශ්‍ය වේ. මෙම සහභාගිත්වයේ අරමුණ සඳහා, යම් වාර්තා යාවත් කිරීම හෝ නැවත නිකුත් කිරිම මෙන්ම මෙම සහභාගිත්වය තුළ, මූල්‍ය තොරතුරු පිළිබඳ විගණනයක් හෝ සමාලෝචනයක් සඳහා මා වගකීමට බැඳී නොමැත.

### ඉටු කරන ලද කාර්යය සාරාංශය

මගේ කාර්යය සිදුකරනු ලැබ ඇත්තේ අධ්‍යක්ෂවරුන් විසින් හෝ ඔවුන් සඳහා පිළියෙල කරන ලද ලේඛනගත කිරීම මගින් ප්‍රකාශනය සනාථ වන්නේ ද සහ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනයේදී අධ්‍යක්ෂවරුන් උපයෝගී කරගෙන ඇති ක්‍රියාවලිය එමගින් උචිත පරිදි පිළිබිඹු වන්නේ ද යන කරුණු තක්සේරු කිරීම සඳහාය.

ඉටු කරන ලද ක්‍රියාපටිපාටීන්, නියැදි පදනම මත ලබාගත් බැංකු කාර්ය මණ්ඩල විමසීම් හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදාගනු ලැබූ ක්‍රියාවලීන් සඳහා උපකාරී වන ලිපි ලේඛනවල පැවත්ම මත මූලික වශයෙන් සීමා වේ.

ප්‍රකාශනයෙන් සියළුම අවදානම් හා පාලනයන් අනාවරණය වන්නේදැයි මවිසින් සලකා බැලීම හෝ බැංකුවේ අවදානම් සහ පාලන ක්‍රියාපටිපාටිය පිළිබඳ මතයක් පළකිරීම හෝ SLSAE 3050 (සංශෝධිත) අනුව අවශ්‍ය නොවේ. එසේම වාර්ෂික වාර්තාවේ අනාවරණය වන කිසියම් සැලකිය යුතු ගැටළුවල වැදගත් අභ්‍යන්තර පාලන පැතිකඩ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විස්තර කරනු ලබන ක්‍රියාවලීන්ගෙන් ඇත්ත වශයෙන්ම ගැටළුවලට පිළියම් යෙදෙන්නේ ද යන්න මා විසින් සලකා බැලීමත් SLSAE 3050 (සංශෝධිත) අනුව අවශ්‍ය නොවේ.

ප්‍රකාශනය සකස් කර ඇති සිදුවීම හෝ ගනුදෙනුව සම්බන්ධයෙන් බංකුවේ ස්වභාවය පිළිබඳ මගේ අවබෝධය සම්බන්ධයෙන් මගේ විනිශ්චය තෝරාගත් ක්‍රියාපටිපාටිය මත රැඳී පවතී.

මම ලබාගත් සාක්ෂි මාගේ නිගමනය සඳහා පදනමක් ලබාදිමට ප්‍රමාණවත් සහ සුදුසු බව මම විශ්වාස කරමි.

### නිගමනය

අනුගමනය කරන ලද ක්‍රියාපටිපාටි පදනම් කරගෙන, වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශනය, බැංකුවේ මූල්‍ය වාර්තාකරණය සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතියේ සැකැස්ම හා ඵලදායීත්වය සමාලෝචනයෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලය අනුගමනය කර ඇති ක්‍රියාවලිය සම්බන්ධයෙන් මගේ අවබෝධයට අනුකූල නොවන බවට විශ්වාස කිරීමට හේතු කිසිවක් අපගේ අවධානයට ලක් වී නොමැත.

**ඩබ් පී සී වික්‍රමරත්න**
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

★

**This Annual Report is Carbon Neutral**

Produced by VisageSpice (Pvt) Limited, a carbon neutral company that offsets its direct and indirect GHG emissions through verified sources.

GSARN©
www.gsarn.org

Global Standard Annual Report Number©
LKA8355PEBXX1900000E106

SMART MEDIA
The ANNUAL REPORT Company

www.VisageSpice.com

PARTNER Carbonfree® Carbonfund.org

www.carbonfund.org

www.peoplesbank.lk